

අනුරාධපුර පුරාජෛවවිවිධත්වය සහ වර්තමාන ජෛවවිවිධත්වය



EM 0001ENV



අනුරාධපුර පුරාජෛවවිවිධත්වය සහ වර්තමාන ජෛවවිවිධත්වය

කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි[1]
ගාමිණී අදිකාරී[2]

2014

ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

1. සත්තව පුරාවිද්‍යා විශේෂඥ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
කැලණිය විශ්ව විද්‍යාලය, කොළඹ 07.
උරග හා උභයජීවී විද්‍යාඥ, වනජීවී උරුමභාර පුද්ගලික සමාගම, කොළඹ 02.
2. මහාචාර්ය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
කැලණිය විශ්ව විද්‍යාලය, කොළඹ 07. අධ්‍යක්ෂ, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07.
සභාපති, ජෛවවිවිධත්ව උපදේශක කමිටුව, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය.

අනුරාධපුර පුරාජෛවවිවිධත්වය සහ වර්තමාන ජෛවවිවිධත්වය

ප්‍රථම මුද්‍රණය 2014 දෙසැම්බර්
© පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

මෙහි ඇතුළත් කිසිදු කරුණක්, ජායාරූපයක් හෝ රූපණයක් කර්තෘවරුන්ගේ ලිඛිත අවසරයක් නොමැතිව උපටුගැනීම, පළකිරීම හෝ ප්‍රසිද්ධ කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.

ISBN 978 - 955 - 0033 - 59 - 1

කර්තෘවරු	:	කැළුම් නලින්ද මනමේන්ද්‍ර ආරච්චි සහ මහාචාර්ය ගාමිණී අදිකාරි
රූපණ	:	කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි / කේ.එච්. සොනාලි රංගිකා ප්‍රේමරත්න / සම්පත් ගුණතිලක / සාරානාත් ධනංජය සේනාපති
පිටු සැකසුම හා මුද්‍රණය	:	සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම 20, සාන්ත බස්තියම කන්ද, කොළඹ 12.
සෝදුපත් පිරික්සීම සහ භාෂා අධීක්ෂණය	:	නඳුන් අමන්ද මනමේන්ද්‍ර-ආරච්චි
පරිඝණක අක්ෂර සංයෝජනය සහ ග්‍රන්ථයේ මූලික සැලැස්ම	:	කේ.එච්. සොනාලි රංගිකා ප්‍රේමරත්න
සම්බන්ධීකරණය	:	හසුලා වික්‍රමසිංහ (ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය)
ප්‍රකාශනය	:	ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, සම්පත්පාය, බත්තරමුල්ල
පිටකවරය සහ පසුකවරය	:	පිටකවරයේ ප්‍රධාන තේමාව 'අනුරාධපුර පුරාජෛවවිවිධත්වය සහ වර්තමාන ජෛවවිවිධත්වය'. ජේතවනාරාම භූමි දර්ශනය සහ අනුරාධපුර යුගයේ සත්ත්ව කැටයම්. මිහින්තලයේ කළු දිය පොකුණ (ජායාරූප කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

පිදුම

සියවස් ගණනක් පුරාවට

සියලු සිදුවීම්

නිහඬව දරාගත්

උතුරුමැද මහා තැනිතලාවට

පෙරවදන

ලොව බොහෝ මුල් නාගරික සමාජ බිහිවී ඇත්තේ වියළි තැනිතලා බිම්වල ය. ධාන්‍ය වගාකිරීම සඳහා වඩාත් සුදුසුම දේශගුණික තත්ත්වයන් ඇත්තේ වියළි බිම්වල වීම එයට හේතු වන්නට ඇතැයි සිතිය හැකි ය. වසරේ මාස කිහිපයකට පමණක් සීමා වන වැසි සහිත දේශගුණය ධාන්‍ය වගාව සඳහා වඩාත් යෝග්‍ය වේ. එමෙන්ම කුළු හරකුන්, ගෝනුන්, මුවන් හා වල් ඌරන් ආදි කුර සහිත සතුන් බහුලව ගැවසෙන මෙවැනි බිම් පෙදෙස්වල යැපීම් ධාරිතාවය ඉහළ අගයක පැවතීමද මීට තවත් හේතුවක් විය. ඕනෑම පෙදෙසක මිරිදිය සහ දඩයම සඳහා සතුන් ඇත්නම් එතැන ප්‍රාග් ඓතිහාසික මානවයින් වාසය කොට ඇත. ඉන් අනතුරුව භූමිය කළමනාකරණය කරමින් සංවිධානාත්මක පරිපාලනයක් සහිත නාගරික සමාජ බිහිවන්නේ මේ පසුබිම තුළ ය. අනුරාධපුරය යනු මේ ලක්ෂණ සියල්ලන්ගෙන්ම අංග සම්පූර්ණ ඉතා සරුසාරවත් කලාපයකි.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය ලියැවී ඇති පැරණි මූලාශ්‍රවලින් ද, ගවේෂණ හා කැණීම් මඟින් අනාවරණය කරගත් සාධක අනුව ද අපගේ පුරාණතම නාගරික සමාජය බිහිවූයේ අනුරාධපුරයෙන් බව ප්‍රකාශ කිරීම වඩාත්ම නිවැරදි යැයි හැඟේ. රක්තවර්ණ පසින් හෙබි මෝසම් වනාන්තරවලින් ආවරණය වී ඇති භූමියත් යෝධ වැව්වලින් සමන්විත වියළි දේශගුණයක් දරන අනුරාධපුරය අතීතයේ ජීවත් වූවන්ගේ මෙන්ම අපගේ ද සිත් නිරන්තරයෙන්ම ඇඳ බැඳ තබාගනියි. ලාංකිකයින් බොහෝ දෙනෙකු අනුරාධපුරය ඇතුළු උතුරු මැද පළාතට ඇලුම් කරනුයේ සංස්කෘතිකමය වශයෙන් ඇති දැඩි සබඳතාවය නිසාම නොව, පරම්පරානුගත හෙවත් ජානවලටම කිඳා බැස ඇති කැමැත්ත නිසා ය. අදින් වසර දෙලක්ෂයකට හෝ තුන්ලක්ෂයකට පෙරාතුව අප මේ ලොව බිහිවූයේද අප්‍රිකාවේ නැගෙනහිර පෙදෙසේ පිහිටි සැවානා බිම්වලදී ය. ඒ අනුව සරලව අර්ථදක්වනුයේ නම් නූතන මිනිසා සම්භවය වූයේ වියළි තැනිතලා බිම්වල ය.

දශක තුනකට අධික කාලයක සිටම අප දෙපළ විසින් පරිසර විද්‍යාත්මක, සත්ත්ව විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක පර්යේෂණවල නිරතව ලැබූ අත්දැකීම් අතිමහත් ය. අසූව දශකය අගභාගයේදී අප අනුරාධපුර ඇතුල් නුවර කැණීම්වලට සහභාගී වෙමින් මෙම අපූර්වතම වියළි පරිසරයේ පහස වින්දෙමු. ඉතිහාසය ගවේෂණය කළෙමු. කැණීම්වලින් ලද පුරාවස්තූන් අර්ථකථනය කරමින් ඉතිහාසය ගොඩනැගීමට දායක වුණෙමු. මෙහි ජීවත් වූ පැරැණිනන්ගේ වූ සිතුම් පැතුම්, දඩයම්, වත් පිළිවෙත්, කෘෂිකර්මාන්තය, වාරි කටයුතු, කුඹල් කර්මාන්තය, ලෝහ භාවිතය, සොහොන් තැනීම, වෙද හෙදකම් ආදි කටයුතු පිළිබඳ සෙවීමේ කුතුහලයෙන් යුක්ත වීමු. ලොව අන් සියලුම ජනයා මෙන් අනුරාධපුරයේ ජීවත් වූ මුල් පදිංචිකරුවන් ද තම ජීවිතයේ අවශ්‍යතාවයන් අවට වූ ස්වාභාවික පරිසරයෙන් සපුරාගත්තා සේම, ඔවුන් එම පරිසරය සමඟ දැඩි ලෙස, නොබිඳෙන අයුරින් බද්ධ වී ඇත.

මෙම ග්‍රන්ථයෙන් අනුරාධපුරය පිළිබඳ ලිවීමට අදහස් කළේ එහි මෙරට පුරාණතම ජනාවාස සාධක ගැබ්ව ඇති බැවිනි. ඔවුන් මානව රූප, සත්ත්ව රූප, ලියවැල් ආදිය තම කැටයම්වලට හා චිත්‍රවලට යොදන ලද්දේ හුදෙක්ම තමා අවට වූ පරිසරය හා බද්ධ වීමේ ප්‍රතිඵලයකින් බැව් නොරහසකි. පැරැන්නන් විසින් ඉදිබුවන්, දියබරියන්, මැඩියන්, මසුන්, කක්කුට්ටන් ආදි ජලචර සතුන් ලෝකඩයෙන් නිමවා පොකුණු පත්ලේ තැන්පත් කරන ලද්දේ තම අවට ස්වාභාවික පරිසරය හා බැඳුණු විශ්වාසයන් හුවාදක්වමිනි. ඔවුන්ගේ සමස්ත මානව කෘතිවලින් කියාපානුයේ අනුරාධපුර පෙදෙසේ මීට වසර දෙදහසකට හෝ ඊටත් ප්‍රථම කාලයේ ජීවත් වූවන් පරිසරය හා බැඳුණු ආකාරයයි.

ග්‍රන්ථයේ තේමාව වී ඇත්තේ 'අනුරාධපුර පෙදෙසේ වර්තමාන හා පුරාණ ජෛවවිවිධත්වය' යි. ජනාවාස බිහිවීමටත්, නාගරික සමාජ හා කෘෂිකර්මාන්තය ඇති වීමටත් පරිසරය බලපානු ඇත. මෙම ග්‍රන්ථය පර්යේෂණ, නිරීක්ෂණ හා නිගමනවලින් යුත් ශාස්ත්‍රීය කර්තව්‍යයක් ලෙස හැඳින්විය හැකි අතර වසර 30 කට වැඩි කාලයක ක්ෂේත්‍ර අත්දැකීම් හා න්‍යායාත්මක දැනුම මෙහි අන්තර්ගත වේ. මෙය පාඨක ඔබ වෙතට පත්කිරීම තුළින් අප බලාපොරොත්තු වනුයේ අනුරාධපුරයේ වර්තමාන හා පුරාණ ජෛවවිවිධත්වය නමැති නව මානය වෙතට ඔබගේ අවධානය යොමු කිරීමට ය.

කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි

සත්තව පුරාවිද්‍යා විශේෂඥ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
කැලණිය විශ්ව විද්‍යාලය, කොළඹ 07.
උරඟ හා උභයජීවී විද්‍යාඥ, වනජීවී උරුමභාර පුද්ගලික සමාගම, කොළඹ 02.

මහාචාර්ය ගාමිණි අදිකාරි

මහාචාර්ය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය,
කැලණිය විශ්ව විද්‍යාලය, කොළඹ 07.
අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ 07.
සභාපති, ජෛවවිවිධත්ව උපදේශක කමිටුව, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය,

2014 දෙසැම්බර් 04

ස්තුතිය

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට පරිසර විද්‍යාව හඳුන්වාදුන් ආචාර්ය සිරාන් දැරණියගලට අප ප්‍රථමයෙන් ස්තුතිවන්ත වෙමු. මෙහි ප්‍රථම කර්තෘට දශක තුනකට අධික කාලයක සිටම සත්ත්ව පුරාවිද්‍යාව, ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව හා පාෂාණීභූත විද්‍යාව අධ්‍යයනය කිරීමට මාර්ගෝපදේශකත්වය සැපයූයේ එතුමා ය.

1996 දී අප අතරින් වියෝ වූ සත්ත්ව පුරාවිද්‍යාඥ පුංචි බණ්ඩා කරුණාරත්න මහතා අප දෙපළගේම සත්ත්ව පුරාවිද්‍යා ගුරුවරයා විය. ඔහුට අපගේ හද බැඳි ප්‍රණාමය පුදමු.

මෙම කෘතිය සම්පාදනය කිරීමේදී පුරාවස්තූන් පරීක්ෂා කිරීම සඳහා කෞතුකාගාර පහසුකම් ලබාදුන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න, ආචාර්ය පියතිස්ස සේනානායක, කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ සිරිනිමල් ලක්දුසිංහ මහතා හා ආචාර්ය නන්දා වික්‍රමසිංහ, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අභයගිරි ව්‍යාපෘති අධ්‍යක්ෂ මහාචාර්ය ටී.ජී. කුලතුංග ට අපගේ ස්තුතිය පිරිනැමේ.

පුරාවිද්‍යාව සම්බන්ධ නව මානයන් ඔස්සේ දැනුම ලබාදීම, පුස්තකාල පරිහරණයට අවස්ථාව සලසාදීම හා කලාව ඇතුළු විෂයානුබද්ධ නව චින්තන අදහස් වෙනුවෙන් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (කැලණිය විශ්ව විද්‍යාලය) අධ්‍යක්ෂ මහාචාර්ය ජගත් වීරසිංහට අපගේ හෘදයාංගම ස්තුතිය පිරිනැමේ.

රන්මසු උයනේ ශිලාමය රූපසටහනෙහි ස්පර්ශ ලාංඡන පිටපත අධ්‍යයනය කිරීමටද, පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් සොහොන් කැණීම් පිළිබඳ තොරතුරු ලබාදීමෙන්ද දැක්වූ සහයෝගයට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්ය රාජ් සෝමදේව ට ස්තුතිවන්ත වෙමු.

මෙම ශාස්ත්‍රීය කර්තව්‍යය උසස් තත්වයෙන් සාර්ථකව නිම කිරීමට නොපැකිලිව සහයෝගය දක්වමින් ආයතනික සහාය නොමඳව දැක්වූ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් බී.එම්.යූ.ඩී. බස්නායක, අතිරේක ලේකම් (ස්වභාවික සම්පත්) එන්.කේ.ජී.කේ. නැම්මවත්ත, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂිකා ආර්.එච්.එම්.පී. අබේකෝන් හා ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ හිටපු අධ්‍යක්ෂ ගාමිණී ගමගේ යන මහත්ම මහත්මීන්ට අපගේ විශේෂ ස්තුතිය පිරිනැමේ. එමෙන්ම මෙම කටයුත්ත ආරම්භයේ සිටම සියලු බාධක හමුවේ නොසැලී අප සමඟ මිත්‍රශීලීව සම්බන්ධීකාරක කටයුතු සිදුකළ එම අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ හසුලා වික්‍රමසිංහ මහත්මියටද, පුරාජෛවවිවිධත්ව උපදේශක කමිටුවේ සාමාජික සියලුම මහත්ම මහත්මීන්ටද හද පිරි ස්තුතිය පිරිනැමේ.

මෙහි අන්තර්ගත ශාස්ත්‍රීය කරුණු ගොනු කර ගැනීම සඳහා සහයෝගය දැක්වූ පිරිස අතිමහත් ය. ඒ අතරින් රජරට විශ්ව විද්‍යාලයේ ආචාර්ය තුසිත මෙන්දිස්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය මාධව මීගස්කුඹුර, කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සරත් කොටගම හා මහාචාර්ය දේවක වීරකෝන්, අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති තිස්ස බණ්ඩාර, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය අර්ජුන තන්තිලගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රංජිත් බණ්ඩාර දිසානායක හා ධනංජය ගම්ලත් යන මහත්වරුන්ට සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාල කාර්ය මණ්ඩලයට අපගේ ස්තුතිය පිරිනැමේ.

ගස් කොළන් හා සත්ත්ව කාණ්ඩ පිළිබඳ පරිච්ඡේද සකස් කිරීමේදී තම විශේෂඥ සහාය නොමසුරුව ලබාදුන් වනජීවී උරුමභාර පුද්ගලික සමාගමේ මත්ස්‍ය විද්‍යාඥ රොහාන් පෙතියාගොඩ, කීට විද්‍යාඥ ආචාර්ය ජෝර්ජ් වැන් ඩර් පූටන්, පරිසර සංරක්ෂණ අන්තර්ජාතික සංගමයේ සම්පත් ගුණතිලක, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශයේ රන්ජීවී ඈපා, ශ්‍රී ලංකා සමනල සංරක්ෂණ සංගමයේ සමනලුන් පිළිබඳ විශේෂඥ හිමේෂ් ජයසිංහ, ගස් කොළන් පිළිබඳ විශේෂඥ නලින්ද පීරිස්, ආචාර්ය සුරංජන් ප්‍රනාන්දු හා මහින්ද ගුණවර්ධන, මෘද්වංගීන් පිළිබඳ විශේෂඥ මහේෂ් ප්‍රියදර්ශන, උරග හා උභයජීවී විශේෂඥ සමීර කරුණාරත්න, පක්ෂීන් පිළිබඳ විශේෂඥ කසුන් දයානන්ද සහ නන් අයුරින් සහාය වූ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඉන්දික විතානගේ,

ප්‍රසන්න රණබාහු, ශ්‍රී ලංකා පක්ෂී අධ්‍යයන කවයේ ඉන්ද්‍රික කග්ගොඩ ආරච්චි, උපුල් වික්‍රමසිංහ හා චිත්තක කළුතොට යන මහත්වරුන්ට ස්තුතිය පිරිනමමු.

මෙම ග්‍රන්ථයෙහි ශාස්ත්‍රීය තොරතුරු අතරට ඡායාරූප දායකත්වය ලබාදුන් පිරිස බොහෝ ය. ඒ අතරින් විමුක්ති වීරතුංග, නදීක හපුආරච්චි, ආචාර්ය මාධව මීගස්කුඹුර, ආචාර්ය රුචිර සෝමවීර, උරඟ හා උභයජීවී විද්‍යාඥ ඇන්ඩ්‍රියාස් නොලට් හා ඉන්ද්‍රනීල් දාස්, ආචාර්ය ඇන්ස්ලම් ද සිල්වා, ආචාර්ය ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්, රංජිත් බණ්ඩාර දිසානායක, සමන් ලියනගේ, ඩිනාල් සමරසිංහ, සමීර කරුණාරත්න, සුපුන් වෙල්ලපුල්ලි-ආරච්චි, දුෂාන්ත් කණ්ඩම්බි, මාධව බොතේජු, රජරට විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය තිලංක සිරිවර්ධන, පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ මනෝජ් ප්‍රසන්න, අයි. එස්. මදනායක, හිමේෂ් ජයසිංහ, සරත් එස්. රාජපක්ෂ, ජයම්පත් සේනානායක, සොනාලි රංගිකා ප්‍රේමරත්න සහ තම මිරිදිය මත්ස්‍ය සිතුවම් අප වෙත ලබා දුන් සම්පත් ගුණතිලක, මයෝසීන සතුන් චිත්‍රයට නැගූ සාරානාත් ධනංජය සේනාපති, පරිසර සංරක්ෂණ අන්තර්ජාතික සංගමයේ නාලින් පෙරේරා යන මහත්ම මහත්මීන්ට තුති පුදමු.

ක්ෂේත්‍ර අධ්‍යයනවලදීත්, කෞතුකාගාර පර්යේෂණවලදීත් අප වෙත සහාය දැක්වීම වෙනුවෙන් අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දත්ත හා විශ්ලේෂණ අංශයේ ස්ථානභාර නිලධාරී ඒ.ඒ. විජයරත්න, ගාමිණී සමරනායක, තුසිත වගලවත්ත, කැණීම් හා කෞතුකාගාර අංශයේ ජූඩ් පෙරේරා, මධ්‍යම සංස්කෘතික අරමුදලේ ජේතවනාරාම ව්‍යාපෘතියේ සහකාර අධ්‍යක්ෂ ජයන්ත රත්නායක, නාලක ප්‍රදීප් ධර්මකීර්ති, එම ව්‍යාපෘතියේ හා අභයගිරිය ව්‍යාපෘති කෞතුකාගාර අංශයේ සියලුම මහත්ම මහත්මීන්ටද, අසූව දශකයේ අග භාගයේ සිටම අප හා පුරාවිද්‍යා කැණීම්වල නිරත වූ ඇල්ෆ්‍රඩ් මෙල්, බී.එච්. අනුර ශාන්ත, පී.ජී. ගුණදාස, ආර්.එම්. උදේනි කුසුම් යන මහත්ම මහත්මීන්ටද අපගේ ස්තුතිය පිදිය යුතු වේ.

ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවලදී අප වෙත නිරන්තර සහයෝගය දැක්වූ නීතීඥ ප්‍රදීප් ජයතුංග හා චූලානි ජයතුංග, නීතීඥ ආනන්දලාල් නානායක්කාර, ස්වභාවවේදී දිනේශ් ගබඩාගේ යන මහත්ම මහත්මීන්ටත් ස්තුතිවන්ත වෙමු.

මෙම ග්‍රන්ථයේ මුද්‍රණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් සීමාසහිත එම්.ඩී. ගුණරත්න මුද්‍රණ (පුද්ගලික) සමාගමේ කාර්ය මණ්ඩලයට හා පිටු මනා ලෙස සිත්ගන්නා සුලු අයුරින් සකස්කර දුන් එම ආයතනයේ ජනක කිත්සිරි මහතාට ස්තුතිය පුද කරමු.

වසර කිහිපයක සිටම අප විසින් අනුරාධපුරයේ සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයන හා පර්යේෂණවලදී එම කාලය පුරාවට හිතවත්ව හිඳ නවාතැන්, ආහාරපාන ඇතුළු සියලු පහසුකම් ලබා දෙමින්, සිදුවූ අපහසුතාවයන් දයාබරත්වයෙන් ඉවසූ අනුරාධපුර සුජානගරයේ පදිංචි මංගලිකා ජයසිංහ මහත්මිය ඇතුළු එම පවුලේ සියලුම දෙනාටත්, පී. ජයපාල මහතා ඇතුළු පවුලේ සැමටත් තුති පුදනුයේ හදබැතියෙනි.

නිදහස් පුවත්පත් ලේඛක නදුන් අමන්ද මනමේන්ද්‍ර-ආරච්චි මහතා සමස්ත ග්‍රන්ථයේ භාෂා පිළිබඳ දැඩි ලෙස සැලකිලිමත් වෙමින් මෙම කර්තව්‍යයට උරදුන්නේ ඔහුගේ වෘත්තීය කටයුතු අතරමැද ය. ඔහු ඉතාම සංයමයකින් හා කැපවීමකින් ඉතා ඉක්මනින් එය නිමකර දීම වෙනුවෙන් අපගේ අවංක ස්තුතිය ඔහුට පුදමු.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සොනාලි රංගිකා ප්‍රේමරත්න මෙනවිය මේ වෙනුවෙන් දැක්වූ සහයෝගය අතිශය අගය කළ යුතුව ඇත. මේ ග්‍රන්ථය ආරම්භයේ සිට අවසානය දක්වා සියලු ශාස්ත්‍රීය කටයුතුවලදී ඇය සහාය වූවා ය. එමෙන්ම සමස්ත ග්‍රන්ථයම පරිගණක අක්ෂර සංයෝජනය කරමින්ද, විද්‍යාත්මක නම්වල සෝදුපත් පිරික්සීමෙන්ද, පක්ෂී රූපසටහන් ඇඳීමෙන්ද සහාය වූ අතර සමස්ත ග්‍රන්ථයෙහිම පිටු සකස්විය යුතු ආකාරය සැලසුම් කරන ලද්දේ ඇය විසිනි.

අවසාන වශයෙන්, අනුරාධපුර ගම්වැසි සියලු දෙනාට ස්තුතිවන්ත වනුයේ වසර කිහිපයක් පුරාවට අපවෙත දැක්වූ නිහතමානීත්වය වෙනුවෙනි.

කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි සහ මහාචාර්ය ගාමිණී අදිකාරි

ගරු පරිසර අමාත්‍යතුමාගේ පණිවිඩය

පුරාවිද්‍යාඥයින්ගේ සහ ඉතිහාසඥයින්ගේ සොයාගැනීම්වලට අනුව අප රට මිනිසුන්ගේ පහස ලබා ඇත්තේ අදින් වසර 1,25,000 කට පමණ පෙරදී ය. එසේ වුවද පුරාවිද්‍යාඥයින්ගේ මතය වනුයේ මීට වසර ලක්ෂ පහකට පමණ පෙර සිටම මානව පහස අප දිවයින ලැබූ බව ය.

අනුරාධපුර යුගය ශ්‍රී ලාංකීය ප්‍රෞඪ ඉතිහාසයේ ආරම්භය සනිටුහන් කරනු ඇත. අනුරාධපුර ඇතුල් නුවර සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කැණීම්වලට අනුව බවහෝග වගා කළ, මැටි වළංවල ආහාර පිසූ තාක්ෂණමය අතින් දියුණු ජන කොටසක් ක්‍රි.පූ. 900 දී අනුරාධපුරයේ වාසය කොට ඇත. ක්‍රි.පූ. 3 වන සියවසේදී මහින්දාගමනයත් සමඟ බුදුදහම මෙරටට හඳුන්වාදීමෙන් අනතුරුව ඇති වූ ආගමික, ආර්ථික හා සමාජීය විපර්යාස වර්තමාන ජන සමාජය කරා අඛණ්ඩව පැවත ආ බව නොරහසකි. අනුරාධපුරය කේන්ද්‍ර කොට ගෙන සිදු වූ මෙම වෙනස්කම් පරිසරයට කොතරම් බලපෑවේද යත් එහි වූ යෝධ වැව්, අහස උසට තැනූ විශාල ස්ථූප, ආරාම සංකීර්ණ ආදියෙන් අපට වැටහෙනු ඇත.

ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුවද පුරාජෛවවිද්‍යාත්මකව මෙම භූමියේ වූ වටිනාකම සුළුවෙන් පහදාදිය නොහැකි ය. අනුරාධපුරය අසල ශ්‍රී ලංකාවේ වයඹ ප්‍රදේශයේ අදින් වසර මිලියන 150 ක් පමණ පැරණි ජුරාසික යුගයට අයත් පාංශු ස්ථර මෙන්ම අදින් වසර මිලියන 25 ක් පමණ පැරණි මයෝසීන යුගයට අයත් පාංශු ස්ථර ද මෙහි අන්තර්ගත ය. අප අමාත්‍යාංශය මඟින් එළි දක්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ පැරණිතම ශිෂ්ටාචාරය වන අනුරාධපුරය ආශ්‍රිත පුරාජෛවවිවිධත්වයත්, වර්තමාන පරිසරයත් සහ එහි ජීවත් වූ පැරන්නන් එම පරිසරය සමඟ සිදු කළ ගනුදෙනු පිළිබඳව ය. අප රජයේ ප්‍රධාන ක්‍රියාකාරී සැලැස්ම වන මහින්ද චින්තනය තුළින් දැක්වෙන පරිදි සංස්කෘතිය සහ පරිසරය රැක ගැනීම සඳහාත් එය ජනතාවට අවබෝධ කරදීම සඳහාත් මෙම ග්‍රන්ථය මනා පිටිවහලක් වනු නියත ය.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය මඟින් එළිදක්වනු ලබන මෙම ග්‍රන්ථය තුළින් ජනතාව අනුරාධපුරය ආශ්‍රිත වර්තමාන ජෛවවිවිධත්වය සහ පුරාණ ජෛවවිවිධත්වය අවබෝධ කර ගැනීම තුළින් එය මතු පරම්පරාව උදෙසා රැක ගැනීමට පෙළඹෙනු ඇතැයි මා විශ්වාස කරමි.

සුසිල් ප්‍රේමජයන්ත

ගරු අමාත්‍ය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

ගරු ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාව යනු පුරාජෛවවිද්‍යාත්මකවත්, සංස්කෘතිකමය වශයෙනුත්, ජෛවවිද්‍යාත්මකවත් ඉහළ විවිධත්වයකින් යුත් රටකි. සමකය ආසන්නව පිහිටි අප දිවයින තුළ පැතිර ඇති ජීවීන් බහුතරයක් මෙරටට ආවේණික වීමත්, ජාන විවිධත්වය සහ නිකේතන විවිධත්වයද ඉහළ අගයක පැවතීම යන හේතූන් මත ලොව ජෛවවිවිධත්ව උණුසුම් කලාප අතරට ශ්‍රී ලංකාවද අයත් වීම ආඩම්බරයට කරුණකි.

කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි මහතා සහ මහාචාර්ය ගාමිණි අදිකාරි දෙපළ අප අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ ආරාධනය මත රචනා කළ මෙම ග්‍රන්ථය මගින් ශ්‍රී ලංකාවේ පැරණිතම ශිෂ්ටාචාරය වූ අනුරාධපුර යුගයේ ප්‍රාග් ඓතිහාසික යුගය, එම පෙදෙසේ පදිංචි වූ මුල්ම කෘෂිකාර්මික ජන කොටස් එහි ගල්වල නෙළා ඇති ගල් කැටයම්, සංස්කෘතිය හා වර්තමාන පරිසරය යන කරුණු පිළිබඳ සාකච්ඡා කොට ඇත. සාමාන්‍ය ජනතාවට පහසුවෙන් කියවා තේරුම් ගැනීමට හැකි වන පරිදි සම්පාදනය කොට ඇති මෙම ග්‍රන්ථය මඟින් දැනට ශේෂ වී ඇති අනුරාධපුර යුගයේ එම කලා කෘතීන් ඇතුළු අනෙකුත් සංස්කෘතික අංගෝපාංගයන් මෙන්ම වර්තමාන පරිසරයද ආරක්ෂා කර ගැනීමට දායක වනු ඇත.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ මෙහෙවර සහ දැක්ම යටතේ එළි දක්වන ලද හරිත ලංකා වැඩසටහනෙහි ශාක සහ සතුන් ආරක්ෂා කර ගැනීම යන මෙහෙවර ක්‍රියාත්මක කරමින් අප අමාත්‍යාංශයේම ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක ප්‍රතිඵලයක් ලෙස සම්පාදිත මෙම ග්‍රන්ථය තුළින් අප රටෙහි පුරාණ සහ වර්තමාන ජෛවවිවිධත්වය පිළිබඳ වර්තමාන මෙන්ම මතු පරපුරට මනා දැනුමක් ලබාගත හැකිවනවා මෙන්ම එය රැක ගැනීමට දායක වනු ඇත.

බී.එම්.යූ.ඩී. බස්නායක

ගරු ලේකම්, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

ජෛවවිවිධත්ව අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය

අනුරාධපුර පුරාණ රාජධානිය ශ්‍රී ලාංකීය ප්‍රෞඪ ඉතිහාසයේ ආරම්භය ලෙස සැලකේ. පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සමගින් කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි සහ මහාචාර්ය ගාමිණි අදිකාරි විසින් රචිත මෙම ග්‍රන්ථය මඟින් අනුරාධපුර රාජධානියේ පුරාජෛවවිවිධත්වයත්, වර්තමාන ජෛවවිවිධත්වය පිළිබඳ කරුණු මනා ලෙස ගොනු කොට ඇත. එය මෙම විෂයට අදාළව ජනතාව දැනුවත් කිරීමටත්, අවසානයේ එම උරුමය ආරක්ෂා කර ගැනීමට ශ්‍රී ලාංකික ජනතාව පෙළඹවීමටත් උත්සාහ දරා ඇත.

පුරාජෛවවිවිධත්වයටත්, වර්තමාන ජෛවවිවිධත්වයටත් අදාළව චිත්‍ර සහ ඡායාරූප ඇතුළත් කොට සැකසුණු මෙම මාහැඟි ග්‍රන්ථය අනුරාධපුරය පිළිබඳ සිංහල බසින් ලියවුණු ශ්‍රේෂ්ඨ කෘතියක් වේ. ඉහත කර්තෘන් දෙපළ වසර 30 ක තම ක්ෂේත්‍ර අත්දැකීම් හා මූලාශ්‍ර පදනම් කොට ගෙන ලියවුණු මෙම ග්‍රන්ථය මෙරට පුරාජෛවවිවිධත්ව විෂයට අදාළව ලියැවුණු ප්‍රථම කෘතිය වේ. ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයේ හසුලා වික්‍රමසිංහ මහත්මිය මෙම කර්තව්‍යය සඳහා සම්බන්ධීකරණ කටයුතු සිදුකරමින් එයට මනා දායකත්වයක් දැරුවාය.

මෙම ග්‍රන්ථය මඟින් අනුරාධපුර ප්‍රදේශයේ පුරාජෛවවිවිධත්වය, වර්තමාන ජෛවවිවිධත්වය, පැරණි මානව ක්‍රියාකාරකම් පිළිබඳ තතු පෙළගස්වා ඇති අතර ඒ තුළින් අපගේ එම උරුමය මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීමට සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන බව මාගේ විශ්වාසයයි.

ආර්.එච්.එම්.පී. අබේකෝන්

අධ්‍යක්ෂ, ජෛවවිවිධත්ව

ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

පටුන

පිදුම

පෙරවදන

ස්තුතිය

ගරු පරිසර අමාත්‍යතුමාගේ පණිවිඩය

ගරු ලේකම්තුමාගේ පණිවිඩය

ජෛවවිවිධත්ව අධ්‍යක්ෂතුමියගේ පණිවිඩය

පටුන 13

හැඳින්වීම 15

අනුරාධපුර දිස්ත්‍රික්කයේ භෞතික හා ජෛවවිද්‍යාත්මක පරිසරය 21

උෂ්ණත්වය හා වර්ෂාපතනය 23

ස්වාභාවික ජලවහන පද්ධතිය 23

ජනගහනය 26

අනුරාධපුරය ආශ්‍රිත ෆොසිල කලාප 27

ජුරාසික යුගය 27

මයෝසීන යුගය 32

අනුරාධපුර පෙදෙසේ ශාක හා සත්ත්ව සන්තතිය 37

වන ආවරණය 37

ශාක සන්තතිය 40

සත්ත්ව සන්තතිය 83

සමනලයින් 84

ගොළුබෙල්ලන් 96

මිරිදිය මත්ස්‍යයින් 103

උභයජීවීන් 111

සිවුපා උරගයින් 119

සර්පයින් 129

කුරුල්ලන් 142

ක්ෂීරපායීන් 165

රිටිගල කඳුවැටිය හා එහි ජෛවවිවිධත්වය 181

රිටිගල දැඩි ස්වාභාවික රක්ෂිතය තුළ පිහිටි ස්වාභාවික ගහ කොළ වර්ග 183

රිටිගල කඳුවැටියේ ආවේණික ගස් වැල් සහ සතුන් 187

අනුරාධපුරයේ මුල් පදිංචිකරුවන් 189

නූතන මිනිසා ශ්‍රී ලංකාවට පැමිණීම 189

ප්‍රාග් ඓතිහාසික යුගය 190

ආචාර්ය සිරාන් උපේන්ද්‍ර දැරණියගල 207

පූර්ව ඓතිහාසික යකඩ යුගය හා මුල් ගොවියෝ 209

නවශිලා යුගය/තාම්‍රශිලා යුගය (Neolithic/Chalcolithic period) 211

පූර්ව ඓතිහාසික යකඩ යුගයේ සොහොන් 214
මහාචාර්ය රොබින් කොනිංග්හැම් 222
ලක්ෂපති විදානලාගේ ඇල්ෆ්‍රඩ් ද මෙල් 226
සත්ත්ව ගෘහස්තකරණය හා විදේශීය සතුන් 227
සමාලෝචනය 228
අනුරාධපුරයේ ගල් කැටයම්වල වූ සත්ත්ව රූප 231
රන්මසු උයනේ ශිලාමය රූප සටහන 232
මහා විහාර පරිශ්‍රයේ වූ කොරවක් ගල් කැටයම 238
ජේතවනාරාම පොකුණෙන් ලද සත්ත්ව රූප 245
ගල් කැටයම්වලින් නිරූපිත ක්ෂීරපායී සත්ත්ව රූප 252
සිංහයා 252
අශ්වයා 261
ගවයා 264
අලි ඇතුන් 266
සුනඛයා 272
නාගයා 274
අනුරාධපුර යුගයේ කැටයම් අතර වූ පක්ෂීන් 278
හංසයා 278
මොනරා 279
කපුටා 280
අනෙකුත් පක්ෂී රූප 280
මත්ස්‍ය රූප 281
සංඛය 283
මකර රූප 285
ජේතවනාරාමයෙන් හමුවූ පුරුෂ ලිංගය 286
ජේතවනාරාම ස්ථූපයෙන් ලද සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා 287
අනුරාධපුරයේ ගුහා චිත්‍ර 291
පරිශීලනය කළ ශාස්ත්‍රීය ලිපි හා ග්‍රන්ථ නාමාවලිය 293

හැඳින්වීම

මෙම ග්‍රන්ථයෙන් අපි මූලික වශයෙන්ම පුරාජෛවවිවිධත්වය (Palaeobiodiversity) යන විෂය ක්ෂේත්‍රය හඳුන්වාදීමට බලාපොරොත්තු වෙමු. පාඨකයින්ගේ දැනගැනීම පිණිස පුරාජෛවවිවිධත්වය යනු කුමක්ද යන්න ප්‍රථමයෙන් සාකච්ඡා කිරීම සුදුසු යැයි සිතමු. ශ්‍රී ලංකාවට නව විෂයයක් වූ මෙය මෙරට ස්ථාපිත කිරීමට මූලික වූයේ පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලයයි. එම ලේකම් කාර්යාලය සතුන්, ගස්කොළං හා උන් ජීවත් වන නිකේතන හා පරිසර ආරක්ෂා කිරීමට වඩාත් වෙහෙසෙන අතර ඒ පිළිබඳ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවලදී අවබෝධ වූ අයුරින්, වර්තමානයේ ජීවත් වන ජීවීන් හා උන් ජීවත් වන වාසස්ථාන පමණක් නොව පුරාණයේ පැවති ජෛවවිවිධත්වය ද අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාවය ඇති බැව් විද්‍යා ප්‍රජාවට අවබෝධ කර දෙන ලදී. මෙම නව විෂයය මෙරට ස්ථාපිත කිරීමේ අරමුණින් ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය මගින් 2007 දී පුරාජෛවවිවිධත්ව උපදේශක කමිටුව පිහිටුවීය. මෙම කමිටුව වනජීවී, පුරාවිද්‍යාව, කෞතුකාගාර, භූ විද්‍යාව ඇතුළු විෂය ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ විශේෂඥ දැනුමක් ඇති විශ්වවිද්‍යාල ආචාර්යවරුන් මෙන්ම රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගෙන්ද සැදුම් ලද්දකි. මෙම කමිටුවේ මූලික පරමාර්ථය වනුයේ පුරාජෛවවිවිධත්වය කේන්ද්‍රගත වූ ස්ථාන හඳුනාගැනීම, ඒවා වාර්තා කිරීම, අධ්‍යයනය කිරීම, ඒ ආශ්‍රිත මූලාශ්‍ර ගොනු කිරීම හා ඒ තුළින් ජනතාවට මෙම විෂය කරුණු පිළිබඳව අවබෝධයක් ලබාදීම හා එම ජෛවවිවිධත්ව කලාප සංරක්ෂණය කිරීම වේ.

පුරාජෛවවිවිධත්වය යනු කවරක්ද? 'පුරාජෛවවිවිධත්වය' යන වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම එය බහුවිෂයමය ක්ෂේත්‍රයක් පුරා පැතිර ඇති බැව් හැඟේ. එය පුරාණයේ පැවති ජෛවවිවිධත්වය යනුවෙන් ඉතා සරලව අර්ථකථනය කළ හැකි ය. එම විෂයයට මානවයා හා ඔහුගේ ක්‍රියාකාරකම් ද ඇතුළත්වීම තුළින් මෙහි ක්ෂේත්‍ර පරාසය බොහෝ පුළුල් වපසරියක් දක්වා විහිදී ඇති බැව් දැක්විය යුතු ය. එය එසේ වුවද මෙම විෂයය යටතේ අධ්‍යයනය කරනු ලබන විෂය ක්ෂේත්‍ර පහත අයුරින් පෙළගැස්විය හැකි ය. පුරාණ භූ යුග, පාෂාණීභූත විද්‍යාව, පුරාණ දේශගුණය, භූ විද්‍යාව, ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම්, පුරාණ මානව විශේෂ හා ඔවුන්ගේ පරිණාමය, භෞතික මානව විද්‍යාව, මානව සංස්කෘතිය හා එහි විකාශනය, පුරාණ ජනයාගේ දඩයම් ක්‍රමෝපායයන්, පැරණි මානවයින් විසින් දඩයම් කොට ආහාරයට ගෙන ඉවතලන ලද සත්ත්ව අවශේෂ පිළිබඳව අධ්‍යයනය කරන සත්ත්ව පුරාවිද්‍යාව, පරිසරය හා බැඳුණු පුරාණ ඇදහිලි, අභිචාරී සිරිත්, පැරණි කෘෂිකාර්මික පළපුරුදු, ගුහා චිත්‍ර ඇතුළු ගස් කොළන් හා සතුන් ඇතුළත් පුරාණ මානව කෘති, ගල් කැටයම්වල වූ සත්ත්ව හා ශාක රූප, වෙරළබඩ පෙදෙස්වල තැන්පත්ව ඇති බෙලිකටු නිධි, පුරාණ මානව ජනාවාස, සත්ත්ව හා ශාක ගෘහාස්තකරණය, සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා, සතුන් හා මිනිසුන් භූ දර්ශනයට දක්වන සබඳතා ඇතුළු විෂය ක්ෂේත්‍ර පුරාජෛවවිවිධත්වය යටතේ විස්තර කෙරේ. අප විසින් සම්පාදනය කරනු ලබන මෙම ග්‍රන්ථය ශ්‍රී ලංකාවේ පැරණි නාගරික සමාජයක් කේන්ද්‍ර කොටගත් පුරාජෛවවිවිධත්වය පිළිබඳ ලියැවුණු ප්‍රථම සවිස්තරාත්මක කෘතිය ලෙස සඳහන් කළ හැකි ය.

අනුරාධපුරය ප්‍රදේශය ආශ්‍රිත කලාපයේ වර්තමාන පාරිසරික තොරතුරු, පුරාණ පරිසරය, ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරිත්වයන්, පුරාණ මානවයා එම භූ දර්ශනය සමඟ පැවති අන්‍යෝන්‍ය සහ සම්බන්ධතාවය ආදී තොරතුරු ගෙනහැර දැක්වීම මේ කෘතියේ මූලික අරමුණ වේ.

අනුරාධපුර ඇතුල් නුවර කළ පුරාවිද්‍යාත්මක කැණීම් මගින් පැහැදිලි වනුයේ මෙම ප්‍රදේශයේ මුල්ම පදිංචිකරුවන් බලංගොඩ මානවයා හෙවත් ශිලා යුගයේ විසූ ප්‍රාග් ඓතිහාසික මානවයින් බවයි. ඔවුන් දඩයමින්, ආහාර එකතු කිරීමෙන් හා මසුන් බෑමෙන් දිවිපෙවෙත ගෙවූ මෙරට විසූ මුල්ම මිනිසුන් වේ. පුරාවිද්‍යාත්මක කාලනීර්ණයන්ට අනුව මෙම මානවයින් අනුරාධපුර ප්‍රදේශයට පදිංචියට පැමිණ ඇත්තේ අදින් වසර 5850 කට පමණ පෙරදීය. එනමුත්, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව සලකා බැලූ කල මෙම කලාපයේ විසූ මුල්ම මුතුන්මිත්තන්ගේ කාලවකවානු මීටත් වඩා ඈතට දිවෙන බව නොරහසකි. එය අවම තරමින් අදින් වසර 1,25,000 ක් ඉක්මවනු ඇත. ඉන් අනතුරුව යකඩ භාවිතා කළ මුල්ම මිනිසුන් අනුරාධපුර ප්‍රදේශයේ අදින් වසර 2,900 කට පමණ ප්‍රථම පදිංචි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම කලාපයේ එවකට පැවති පරිසරය කෘෂිකර්මාන්තය ඇතුළු තවත් බොහෝ මානව ක්‍රියාකාරීත්වයන්ට නතුවෙමින් වෙනස්වීම්වලට භාජනය වී ඇති බව පුරාවිද්‍යාඥයින් සහ පරිසර විද්‍යාඥයින් අනාවරණය කොටගෙන ඇත. තෙත් කලාපීය වැසි වනාන්තරවලට සාපේක්ෂව ජෛවවිවිධත්වය අවම මට්ටමක පැවතිය ද වියළි කලාපීය වෘක්ෂලතාවලින් සමන්විත අනුරාධපුර ප්‍රදේශයේ ජෛවවිවිධත්වය ද ඉහළ අගයක පවතී. ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ බුදුදහම මෙරටට හඳුන්වාදීමත් සමග ඇතිවුණු සමාජ, සංස්කෘතික හා ආර්ථික විපර්යාසයන් අනුරාධපුර භූ දර්ශනය කෙරෙහි සෘජුවම බලපා ඇති බව නොරහසකි. සංඝාරාම සංකීර්ණ හා යෝධ ස්ථූප ඉදිකිරීම (රූපය 1, 2 සහ 3), ස්වාභාවික ජලය රැස්වන පතහා වෙනුවට වැව් තැනීම (රූපය 4), ස්වාභාවික වගුරු කුඹුරු බවට පරිවර්තනය කිරීම (රූපය 5), කැලෑ කපා හෙළා හේන් වගා කිරීම (රූපය 6) ආදී හේතු ස්වාභාවික භූ දර්ශනය වෙනස්වීමට බලපෑ සාධක අතර විශේෂයෙන් සඳහන් කළ හැකි ය.



රූපය 01. අනුරාධපුර යුගයට අයත් සංඝාරාම නටබුන්. රිටිගල (ඡායාරූපය: විමුක්ති විරතුංග)




රූපය 02. සංඝාරාම නටබුන්. කළුදිය පොකුණ, මිහින්තලය (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූපය 03. කණ්ඨක චෛත්‍යය. මිහින්තලය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 04. ස්වාභාවිකව ජලය රැස්වන පතහා. හොරොව්පොතාන (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 05. ස්වාභාවික වගුරු කුඹුරු බවට පරිවර්තනය වීම. තන්තිරිමලය (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 06. කැලෑ කපා කොටා හේන් වගා ඇතිවීම. අළුත්ගම ගම්බිරිගස්වැව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


අනුරාධපුර ප්‍රදේශය ආශ්‍රිත කැණීම් හා ගවේෂණ මඟින් ශිලා මෙවලම්, වළං කැබලි, යබොර, යකඩ, පබළු, පුරාණ කාසි, ගල් කැටයම්, ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ තතු මෙන්ම අනෙකුත් මානව කෘති හා මිනිසුන් ආහාරයට ගෙන ඉවතලූ සත්ත්ව අවශේෂ හා එකල ජීවත් වූ සතුන්ගේ සැකිලි කොටස් පුරාවිද්‍යාඥයින් විසින් අනාවරණය කොටගෙන ඇත (රූපය 7). එම සාධක පාදක කොටගනිමින් පුරාජෛවවිවිධත්වය අර්ථකථනය කිරීමට ද, පුරාණ පාරිසරික ඉතිහාසය ගොඩනැගීමට ද අනුරාධපුරය ආශ්‍රිත පෙදෙස කදිම තෝතැන්නක් යැයි අපි සිතමු. අනුරාධපුර ප්‍රදේශයේ පුරාජෛවවිවිධත්වය හඳුන්වාදීමේ අරමුණ සාක්ෂාත් කරගැනීම පිණිස මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමට යෙදෙනමුත් ඉතා අපහසුවෙන් වුවද මෙහිදී අප විසින් තෝරා ගන්නා ලද්දේ වඩාත් ප්‍රචලිත උදාහරණ හා කරුණු කාරණා පමණක් බැව් සඳහන් කිරීමට කැමැත්තෙමු.

බ්‍රිතාන්‍ය ආධිපත්‍යය යටතේ ශ්‍රී ලංකාවේ උතුරුමැද පළාතේ ආණ්ඩුවේ ඒජන්තවරයෙකු වශයෙන් 19 වන ශතවර්ෂය අවසාන සමයේ දී හය වසරකට ආසන්න කාලයක් සේවය කළ ලංකා සිවිල් සේවයේ ආර්.ඩබ්ලිව්. අයිවර්ස් මහතා විසින් 1899 දී සම්පාදිත *Manual of the North Central Province, Ceylon* නමැති කෘතිය අප මෙහිදී පාඨක ඔබගේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමු (එම ග්‍රන්ථය 2005 දී *'එදා වැව් බැඳි රාජ්ජේ හෙවත් ලංකා සිවිල් සේවයේ ආර්. ඩබ්ලිව්. අයිවර්ස්ගේ උතුරුමැද පළාත් අත් පොත'* යනුවෙන් එම්.යූ.ඒ. තෙන්නකෝන් හා වර්ෂා තෙන්නකෝන් විසින් සිංහල බසට පරිවර්තනය කොට ඇත). ඉතා සිත්ගන්නාසුලු බසකින් උතුරුමැද පළාතේ ස්වාභාවික ලක්ෂණ හා භූ විෂමතා, වැසියන්, දේශගුණය, ඇදහිලි, වාරි කටයුතු, කෘෂිකර්මාන්තය, පුරාවිද්‍යාව, වෘක්ෂලතා, කැලෑ හා සතුන් ආදිය පිළිබඳව විස්තර කොට ඇති එය අනුරාධපුරය පිළිබඳව ලියැවුණු අග්‍රගණ්‍ය කෘතියක් ලෙස දැක්විය හැකිය (අයිවර්ස්, 1899).




අනුරාධපුර දිස්ත්‍රික්කයේ භෞතික හා ජෛවවිද්‍යාත්මක පරිසරය

අනුරාධපුර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ උතුරු අර්ධයේ මධ්‍යයෙහි පිහිටා ඇත. දේශගුණික වශයෙන් ශ්‍රී ලංකාවෙන් 3/4 ක කොටසක් පමණ ආවරණය වන වියළි හා අර්ධ ශුෂ්ක පෙදෙස්වලින් මායිම්ව ඇති අනුරාධපුර දිස්ත්‍රික්කය රිටිගල හා මිහින්තලය වැනි හුදෙකලා කඳු සහ පර්වත කිහිපයක් හැරුණු විට සමතල භූමියක පිහිටයි (රූපය 8). මෙම දිස්ත්‍රික්කයට මායිම්ව ඇති සමස්ත දිස්ත්‍රික්ක සංඛ්‍යාව හතකි. එනම් උතුරින් වව්නියාව ද, ඊසාන හා නැගෙනහිර දෙසින් ත්‍රිකුණාමලය ද, ගිනිකොන දෙසින් පොළොන්නරුව ද, දකුණු හා නිරිතදිග පෙදෙසින් මාතලේ හා කුරුණෑගල ද, බටහිරින් පුත්තලම ද, වයඹ දෙසින් මන්නාරම ද යන දිස්ත්‍රික්කවලින් මායිම්ව ඇත (රූපය 9).




රූපය 08. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප හා අනුරාධපුරයේ පිහිටීම (මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2007 දී ප්‍රකාශිත *The National Atlas of Sri Lanka* දෙවන මුද්‍රණය ඇසුරෙන් සකස් කරන ලදී)



අනුරාධපුර ප්‍රදේශය පිහිටා ඇත්තේ දළ වශයෙන් මුහුදු මට්ටමේ සිට උස උපරිමව මීටර් 100 ක් පමණ වූ පහත්ම තැන්න තුළ ය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විද්‍යාත්මක කලාප අනුව සලකා බලන කල එය විජයානු සංකීර්ණය (Vijayan Complex) තුළ පිහිටයි (රූපය 10). බටහිරින් මයෝසීන (Miocene) තැන්පතු ද, නිරිතදිගට වන්නට ජුරාසික (Jurassic) තැන්පතු ද පිහිටීම තුළින් මෙම කලාපයේ භූ විද්‍යාත්මක වැදගත්කම තවදුරටත් ඉහළ ගොස් ඇත. මීට අමතරව අනුරාධපුරයේ නැගෙනහිර කලාපය කඳුකර කාණ්ඩයට (Highland group) අයත් වේ. මෙම කලාපයේ ප්‍රධාන පස් වර්ගය වනුයේ රතුවන් දුඹුරු පස් හා ඒවායේ දියබස්නා සබැඳියන් (reddish brown earths and their drainage associates) ය. මීට අමතරව මල්වතු ඔය හා ඒ ආශ්‍රිත පිටාර කලාපයේ දියළු පස් (Aluvial soils) තැන්පතු දැකිය හැකි ය (Cooray, 1984; Vidanapatirana, 2012) (රූපය 11).

රූපය 09. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටීම හා මාධ්‍යව ඇති අනෙකුත් දිස්ත්‍රික්ක (මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2007 දී ප්‍රකාශිත ***The National Atlas of Sri Lanka*** දෙවන මුද්‍රණය ඇසුරෙන් සකස් කරන ලදී)



රූපය 10. විජයානු සංකීර්ණය තුළ පිහිටි අනුරාධපුරයේ ග්‍රැනයිට් පාෂාණ සුලබව හමුවේ. අනුරාධපුර දීඝපාෂාණයේ එක් කෙළවරක පිහිටි වෙස්සගිරිය (ඡායාරූපය: කැප්ම මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 11. මල්වතු ඔය හා ඒ ආශ්‍රිත පිටාර කලාපයේ තැන්පත්ව ඇති දියළු පස්. මල්වතු ඔය, අළුත්ගම (ගම්බිරිගස්වැව ආසන්නව) (ඡායාරූපයෘ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


උෂ්ණත්වය හා වර්ෂාපතනය

වසර මුළුල්ලේ පවතින සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 25.0-27.5 ක් පමණ වේ. උතුරුමැද පළාතේ පිහිටි අනුරාධපුරයට ප්‍රධාන වශයෙන්ම වර්ෂාව ලැබෙනුයේ දෙසැම්බර් හා පෙබරවාරි යන මාස අතර ඇද හැලෙන ඊසානදිග මෝසම් වැස්සෙනි. එයින් මිලිමීටර් 250-500 ක වර්ෂාපතනයක් ලැබේ. මීට අමතරව මැයි හා සැප්තැම්බර් මාස අතර ඇද හැලෙන නිරිතදිග මෝසම් වැසි මඟින් ලැබෙනුයේ මිලිමීටර් 250 ටත් අඩු වර්ෂාපතනයකි. කෙසේ වුවද වසර මුළුල්ලේම ඇද හැලෙන වර්ෂාපතනය සමස්තයක් වශයෙන් සලකා බැලූ කල මිලිමීටර් 1000-1500 ත් අතර අගයක පිහිටයි. සැප්තැම්බර් හා ඔක්තෝබර් මාස අතර අනුරාධපුර ප්‍රදේශය හරහා හමන වියළි සුළං මඟින් දැඩි පීඩා ගෙන දීම හේතුවෙන් තවදුරටත් පසේ වූ ජලය වියළී යාමෙන් දැඩි නියඟ ස්වරූපයක් පරිසරයට එක්වේ. මෙහිදී සදාහරිතභාවය රැකගන්නා ඇතැම් ගස් කොළන් හැරුණු විට අනෙකුත් ගස්, ලඳු කැලෑ හා තෘණ බිම් දැඩි වියළීමට ලක්වේ.

ස්වාභාවික ජලවහන පද්ධතිය

වර්තමානයේ වූ ජලවහන පද්ධතිය පිළිබඳව සාකච්ඡා කිරීමට පෙරාතුව අනුරාධපුර දිස්ත්‍රික්කය හා ඊට බටහිරින් පිහිටි පුත්තලම හා වයඹ දෙසින් පිහිටි මන්නාරම යන දිස්ත්‍රික්ක හරහා ගලා යන ජල පද්ධතිය පිළිබඳව කරන ලද පර්යේෂණ මේ පරිච්ඡේදය පෝෂණය කිරීමෙහිලා ඉතා වැදගත් වන බව හැඟේ. පාෂාණිභූත විද්‍යාඥයෙකු, සත්ත්ව විද්‍යාඥයෙකු හා ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාඥයෙකු වූ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රථම ලාංකික අධ්‍යක්ෂ ධුරය හෙබවූ නැසීගිය

ආචාර්ය පී.ඊ.පී. දැරණියගලගේ පර්යේෂණ ප්‍රතිඵල අපට ඉතා වැදගත් වේ. එතුමා විසින් 1958 දී ප්‍රකාශිත *The Pleistocene of Ceylon* නම් ග්‍රන්ථයේ ඉතා වැදගත් අනාවරණයන් පිළිබඳව කරුණු දක්වා ඇත. ප්ලයිස්ටොසීනයේ (Pleistocene) ග්ලැසියර හා අන්තර් ග්ලැසියර අවධිවලදී මුහුදු ජල මට්ටමේ සිදු වූ උස් පහත්වීම් පිළිබඳව පර්යේෂණ කළ දැරණියගල අනුරාධපුර, පුත්තලම හා මන්නාරම යන පෙදෙස් හරහා ගලා යන අරුවි ආරු, කල් ආරු, මෝදරගම් ඔය, කලා ඔය, මී ඔය අලළා සිදුකළ අනාවරණ මෙම පරිච්ඡේදයේදී සාකච්ඡා කිරීම උචිත වේ. එහිදී දැරණියගල මන්නාරම හා පුත්තලම අතර (ඉහත ජල පද්ධති ඉන්දියානු සාගරයට යොමු වනුයේ මන්නාරම හා පුත්තලම අතර ශ්‍රී ලංකාවේ වයඹදිග පෙදෙසිනි) මුහුදු පත්ල දැඩි පරීක්ෂාවට භාජනය කළ අතර එහිදී එතුමා අපූර්වතම සොයාගැනීමක් කිරීමට සමත් විය. එම කලාපයේ මුහුදු පත්ලේ සමෝච්ඡ රේඛා පිහිටීම සලකා බැලූ කල ඉහත දක්වන ලද අරුවි ආරු, කල් ආරු, මෝදරගම් ඔය, කලා ඔය, මී ඔය එකම ගංගාවක අතු ගංගා බැව් දැරණියගල විසින් අනාවරණය කරන ලදී. අන්තර් ග්ලැසියර අවධිවල මුහුදු ජල මට්ටම පහත පැවති අවධියක එම 'මහ ගංගාව' සක්‍රියව පැවත ඇත (Deraniyagala, 1958). වර්තමානයේ මුහුදු ජල මට්ටම එම ප්‍රාග් ඓතිහාසික අවධියට වඩා උස්ව ඇති නිසා අද එම ගංගාවේ පහත් පෙදෙස් ජලයෙන් යට වී ඇතුවා සේම අද අපි එම ගංගාවේ ශාඛාවලට වෙන වෙන නම් භාවිතා කරන්නෙමු. 1990 දී 'ශ්‍රී ලංකාවේ පරිසර විද්‍යාව හා භූමි දර්ශන කළමනාකරණය' යන මැයෙන් කොළඹ දී පවත්වන ලද ජාත්‍යන්තර සමුළුවට පරිසර විද්‍යාඥයෙකු හා මත්ස්‍ය විද්‍යාඥයෙකු වන ආචාර්ය F. රනිල් සේනානායක විසින් ඉදිරිපත් කරන ලද ශාස්ත්‍රීය ලිපියකින් ඉහත දක්වන ලද මහ ගංගාව පිළිබඳව විශේෂ අවධානයට ලක්කෙරිණි. එහිදී ආචාර්ය දැරණියගලට කරන ලද උපහාරයක් ලෙස එම ප්‍රාග් ඓතිහාසික මහ ගඟට 'දැරණියගල ඔය' යනුවෙන් නම් තැබිණි. (Senanayake, 1993).




රූපය 12. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ස්වාභාවික ජලවහන රටාව (මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2007 දී ප්‍රකාශිත ***The National Atlas of Sri Lanka*** දෙවන මුද්‍රණය ඇසුරෙන් සකස් කරන ලදී)

වියළි තැනිතලා බිම් පෙදෙසක පිහිටි අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇළ හා ඔය ප්‍රධාන වශයෙන් සක්‍රිය වනුයේ ඊසානදිග මෝසමත් සමග ඇද හැලෙන වැසි දියෙනි. එසේ වුවද මල්වතු ඔයේ හා යාන් ඔයේ ජලය වසර මුළුල්ලේම පාහේ පවතින බව අපි දනිමු. ඊසානදිග මෝසමට පෙර වූ දැඩි වියළි මාස කිහිපය තුළ එහි ජල ධාරිතාවය බොහෝ දුරට අඩු වේ. රජ දවස ඉදිකරන ලද ඉතා සංකීර්ණ වැව් පද්ධතියත් සමඟ දැඩි ලෙස බද්ධ වී ඇති මෙම ස්වාභාවික ජලවහන පද්ධතිය ඈත අතීතයේ පැවති ස්වාභාවික තත්ත්වයන්ගෙන් යම් පමණකට වෙනස් වන්නට ඇතැයි අපට අනුමාන කළ හැකි ය (රූපය 12).

තෙත්, අන්තර් හා වියළි යන දේශගුණික කලාප වශයෙන් සලකා බැලූ කල තෙත් කලාපයේ වූ වැසි වනාන්තර ආවරණය කරමින් පිහිටා ඇති කඳු පන්තිවලින් ආරම්භ වන මහවැලි, කැලණි, කළු, ගිං හා වලවේ ඇතුළු ගංගා වසර මුළුල්ලේම පාහේ මනා ධාරිතාවයකින් යුක්තව ජලය මුදා හරී. එයට හේතු වනුයේ නිරිතදිග මෝසම් වැසි මඟින් තෙත් කලාපයට ලැබෙන ඉහළ වර්ෂාපතනයත්, එම ජලය තෙත් කලාපයේ පිහිටි කඳු හා ඒ ආශ්‍රිත කලාපය ආවරණය කරමින් පවතින වැසි වනාන්තරවලින් වසර මුළුල්ලේම ඒකාකාරී ලෙස ක්‍රම ක්‍රමයෙන් මුදා හැරීමත් ය. ඉහත දැක්වූ අයුරින් වියළි කලාපය තුළ පිහිටි ජලවහන පද්ධතිය ඊසානදිග මෝසම් වැසි සමඟ පමණක් ප්‍රධාන වශයෙන් සක්‍රිය වීමට හේතු වනුයේ තෙත් කලාපය තුළ පිහිටි ජලය මුදා හැරීමේ යාන්ත්‍රණයට සමාන යාන්ත්‍රණයක් එහි නොමැතිකම නිසා ය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයෙන් විශාල වපසරියක් පෝෂණය කරනු ලබන්නේ ද තෙත් කලාපයෙන් උපත ලද මහවැලි ගංගාව ය. දිවයිනෙන් හතරෙන් තුන් කොටසක් පමණ නියෝජනය කරනු ලබන වියළි කලාපයෙන් ආරම්භ වන ගංගා හා ඔය සියල්ලම වසරේ යම් කාලයක් සම්පූර්ණයෙන්ම පාහේ සිඳී පවතිනුයේ එම පද්ධති පෝෂණය කිරීමට තෙත් කලාපයේ වූ ඉහත විස්තර කරන ලද පාරිසරික තත්ත්වයන් නොමැති වීම හේතුවෙනි.

අප මෙතැන් සිට අවධානය යොමුකරනුයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වූ ස්වාභාවික ජලවහන පද්ධතිය පිළිබඳව ය. දිස්ත්‍රික්කයේ ඊසාන දෙසින් මා ඔය ගලා බසියි. මා ඔය පදවිය වැව නිර්මාණය කරමින් අනතුරුව ශ්‍රී ලංකාවේ ඊසානදිග පෙදෙසේ වූ කෝකිලායි කලපුවට යොමුවේ. සීගිරිය රක්ෂිතයෙන් ආරම්භව හුරුළු වැව පෝෂණය කරමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගිනිකොන, නැගෙනහිර හා ඊසානදිග යන පෙදෙස් ආවරණය කොට යාන් ඔය ඊසාන දෙසට ගලා බසියි. යාන් ඔය යනු අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්වාභාවික ජලවහන පද්ධතියේ ප්‍රධානතම නියෝජනයකි. එමෙන්ම යාන් ඔයේ අතු ගංගාවකින් වාහල්කඩ වැව ද පෝෂණය වනු ඇත. කලා ඔය අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු හා නිරිතදිග පෙදෙස් හරහා දිස්ත්‍රික් මායිමට සමාන්තරව ගලා බසියි. කලා ඔය මින්නේරිය-ගිරිතලේ පෙදෙසිනුත්, සීගිරිය පෙදෙසිනුත් ආරම්භව කලා වැව පෝෂණය කරයි. එහි තවත් ශාඛාවක් කහල්ල-පල්ලෙකැලේ අභය භූමියෙන් ආරම්භව ප්‍රධාන ඔය පද්ධතියට එකතු වේ. කලා ඔයෙන් ප්‍රධාන වශයෙන් රාජාංගනය ජලාශය පෝෂණය වුව ද ඊට අමතරව කලා වැව හා බළලු වැව ද පෝෂණය වේ. අවසානයේ මෙම ඔය විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ දකුණු මායිම දෙසින් පොම්පරිප්පු හා වනාතවිල්ලුව යන පෙදෙස් අතරින් වයඹදිග ශ්‍රී ලංකාවෙන් ඉන්දියානු සාගරයට පිවිසේ. මෝදරගම් ආරු ඔය නුවර වැවට බටහිරින් ආරම්භව අනුරාධපුර දිස්ත්‍රික්කයේ වයඹ දෙසින් ගලා බැස මුහුදට එක්වේ. මල්වතු ඔය යනු අනුරාධපුර දිස්ත්‍රික්කයේ මධ්‍ය කලාපය නියෝජනය කරන ස්වාභාවික ජලවහන පද්ධතියේ කොඳු නාරටිය ලෙස හැඳින්විය හැකි ය. මෙම දිස්ත්‍රික්කයේ ගිනිකොන දෙසට වන්නට පිහිටි රිටිගල දැඩි රක්ෂිතය ඇතුළු එම කලාපයෙන් උපත ලබා නව්චඳුව වැව පෝෂණය කරමින් මල්වතු ඔය වයඹ දෙසට ගලා යයි. මිහින්තලය හා මහකනදරාව අභය භූමි ආශ්‍රයෙන් ආරම්භව මහකනදරාව වැව

පෝෂණය කරමින් දිවෙන ජල පද්ධතිය දිස්ත්‍රික්කයේ වයඹ දෙසින් මල්වතු ඔයට එක්වේ. මෙම සමස්ත පද්ධතිය අවසානයේදී මල්වතු ඔය අරුවිආරු ගඟ ලෙස මන්නාරම හා ඊට දකුණින් පිහිටි සිලාවතුරෙයි අතරින් වයඹදිග ශ්‍රී ලංකාවෙන් ඉන්දියානු සාගරයට එක් වේ (රූපය 13).



රූපය 13. අනුරාධපුර දිස්ත්‍රික්කය ආශ්‍රිත ස්වාභාවික ජලවහන පද්ධතිය (මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2007 දී ප්‍රකාශිත ***The National Atlas of Sri Lanka*** දෙවන මුද්‍රණය ඇසුරෙන් සකස් කරන ලදී)

ජනගහනය

දොළොස්වන ශතවර්ෂයෙන් පසු අනුරාධපුරය නටබුන් වූ රාජධානියක් බවට පත්වූ අතර ඉන් අනතුරුව එළැඹි කාලපරිච්ඡේදය තුළ එය ක්‍රමයෙන් ජනශූන්‍ය කලාපයක් බවට පත්විය. දාහත්වන ශතවර්ෂයේදී රොබට් නොක්ස් විසින් රචිත '*An historical relation of the Island Ceylon*' නම් ග්‍රන්ථයේ අනුරාධපුරය හඳුන්වන්නේ 'පදිංචිය අතින් අතිශයින්ම පහත් මට්ටමක වූ පෙදෙසක්' ලෙසට ය (Knox, 1681). දහනවවන ශතවර්ෂයේදී ජෝන් ඩේවි තම '*Account of the Interior of Ceylon*' නම් කෘතියේ සඳහන් කරනුයේ අනුරාධපුරය යනු 'කුඩා සාමාන්‍ය ගමක්'ලෙස ය (Davy,1821). 1871 දී අනුරාධපුරයේ ජනගහනය 63,743 ක් වූ අතර ජනගහනයේ ගහන ඝනත්වය වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 09 දෙනෙකි (එනම් වර්ග සැතපුමකට 23 දෙනෙකි). වසර සියයකට පසුව එනම් 1971 දී එහි ජනගහනය 3,88,770 ක් වූ අතර ගහන ඝනත්වය වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 53 දෙනෙකි (එනම් වර්ග සැතපුමකට 138 දෙනෙකි). එය 1979 දී 4,67,000 දක්වා වර්ධනය විය. එම වර්ධනයට ප්‍රධානතම හේතුව වූයේ කෘෂිකර්මාන්තයේ වූ පිබිදීම මත මේ කලාපයේ පිහිටු වූ ජනපදවලට පිටත ප්‍රදේශවලින් පැමිණ පදිංචි වූවන් ය. මෙම සංක්‍රමණයන්ගේ ඉහළම අගයක් පෙන්නුම් කරන්නේ 1964-1973 අතර කාල වකවානුව තුළදීය (De Silva, 1981). යම් කලාපයක පරිසර විද්‍යාත්මක අධ්‍යයනයකදී ජනගහනය හා ගහන ඝනත්වය අතිශයින්ම වැදගත් වේ. ඒ, එය ඍජුවම භූමියේ සිදුකරනු ලබන වෙනස්කම්වලටත්

ඒ තුළින් සිදුවන පාරිසරික වෙනස්කම්වලටත් බලපාන නිසා පමණක්ම නොව මිනිසා පරිසරය තුළ අන් සියලුම ජීවීන්ට වඩා 'වැදගත්' සාධකයක් වන නිසාය. මිනිසා විසින් භූමිය මෙන්ම 'පරිසරය පරිභෝජනය' කරන රටාව තුළ එහි අනාගතය රඳා පවතිනු ඇත. ක්‍රිස්තු පූර්ව සමයේ සිට මේ දක්වා අනුරාධපුරයේ ජීවත් වූ ජනයා කෘෂිකර්මාන්තයටත්, ඊට අදාළ වාරි කර්මාන්තයටත් මෙහි වූ භූමිය දැඩි ලෙස වෙනස්වීම්වලට භාජනය කර ඇත. ඒ හේතුවෙන් වර්තමානයේ සමස්ත උතුරුමැද පළාතෙහිම ඇත්තේ මිනිසාගේ පරිභෝජනයෙන් අනතුරුව නැවත ඇති වූ වනාන්තර හෙවත් ද්විතියික වනාන්තර වේ. මේ කලාපයේ අප දකින වර්තමාන භූමි දර්ශනය ද මිනිසුන් විසින් අතිශයින්ම වෙනස් කිරීම්වලට භාජනය කරනු ලැබ නැවත ගොඩනැගුණු තත්ත්වයකි. එම නිසා මෙම පරිසර විද්‍යාත්මක අධ්‍යයනය තුළ ජනගහනය හා මානව ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනය කිරීම අතිශය වැදගත් වේ.

අනුරාධපුරය ආශ්‍රිත ෆොසිල කලාප

අනුරාධපුරය පිහිටා ඇති උතුරුමැද පළාතට බටහිරින් මායිම්ව පිහිටි වයඹ පළාතේ ශ්‍රී ලංකාවෙන් වාර්තාවන පුරාණතම ෆොසිල තැන්පතු පිහිටා ඇත. උතුරුමැද හෝ අනුරාධපුරය ලෙස අප බෙදා ඇති පරිපාලන පෙදෙස් පසෙකලා සලකා බැලූ කල අනුරාධපුරයට ඉතාමත් ආසන්නයේ ඊට බටහිරින් හා වයඹ දිගින් මයෝසීන හා ජුරාසික යුගයන්ට අයත් අවසාදිත තැන්පතු ස්ථර අතර එම යුගයන් නියෝජන කරන ෆොසිල මනාව සුරක්ෂිතව ඇත. පුරාජෛවවිවිධත්ව විෂය ක්ෂේත්‍රයේ ඉතා වැදගත් අංගයක් වන ෆොසිල නිධි අනුරාධපුරය ආශ්‍රිතව පිහිටා තිබීම තුළින් මේ කලාපය පිළිබඳ සිදුකෙරෙන අපගේ සාකච්ඡාව කෙතරම් පුළුල් විෂය පරාසයක් කරා දිවයන්නේ ද යන්න ඔබට පැහැදිලිව වැටහෙනු ඇත.

ජුරාසික යුගය

බහුසෛලික ජීවීන්ගේ ෆොසිල හමුවන ශ්‍රී ලංකාවේ පැරණිතම යුගය (period) ලෙස හැඳින්විය හැක්කේ ජුරාසික (Jurrasic) යුගයයි. ජුරාසික යුගය පැවතියේ භූ ඉතිහාසයේ අදින් වසර මිලියන 213 සිට අදින් වසර මිලියන 144 ක් දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ය. ජුරාසික යුගයට පෙර පැවති ට්‍රයාසික (Triassic) යුගය අදින් වසර මිලියන 248 කට පෙර ආරම්භව ජුරාසික යුගයේ ආරම්භයත් සමග (අදින් වසර මිලියන 213 කට පෙර) නිම විය. ජුරාසික යුගයට පසුව පැවතියේ ක්‍රෙටේසියස් (Cretaceous) යුගයයි. එය ජුරාසික යුගයේ නිමවීමත් සමඟ (අදින් වසර මිලියන 144 කට පෙර) ආරම්භව මිලියන 65 ක් දක්වා පැවතිණ. භූ යුග වර්ගීකරණය තුළ ට්‍රයාසික, ජුරාසික හා ක්‍රෙටේසියස් යන යුග තුන එක්කොට මෙසොසොයික (Mesozoic) යන මහ යුගය (era) (අදින් වසර මිලියන 248-65) නිර්මාණය වේ.

ජුරාසික යුගය වන විට ප්‍රධාන පෘෂ්ඨවංශී (Vertebrate) සත්ත්ව කාණ්ඩවල කාටිලේජීය මසුන් (Chondrichthyes), අස්ථික මසුන් (Osteichthyes), උභයජීවීන් (Amphibia), උරගුන් (Reptilia) හා ක්ෂීරපායීන් (Mammalia) පරිණාමය වී තිබුණි. ජුරාසික යුගයේ අවසාන කාලපරිච්ඡේදයේදී පිහාටු සහිත Archaeopteryx පරිණාමය වීම තුළින් මුල්ම පක්ෂීන්ගේ සාධක මේ යුගයේදී පහළ විය. එම නිසා ජුරාසික යුගය තවත් පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩයක් පරිණාමය වීම පිළිබඳ ඉතාමත් වැදගත් වේ (Carroll, 1988).

ශ්‍රී ලංකාවේ ඉහළ ජුරාසික (upper Jurassic) යුගයට අයත් අවසාදිත තැන්පතු අවම තරමින් ආකාර තුනක් (faults) ලෙස ශ්‍රී ලංකාවේ වයඹදිග පෙදෙසේ ප්‍රාග් කේම්බ්‍රීය (Pre-Cambrian) සම්භවයක් ඇති විජයානු සංකීර්ණයේ (Vijayan complex) වූ සානු තුළ තැන්පත්ව ඇත. මෙම ජුරාසික තැන්පතු සානු තුන අතරින් පුත්තලම අනුරාධපුර මාර්ගයේ කිලෝමීටර් 14 (සැතපුම් 8) ක්

පමණ ගිය තැන පිහිටි තබ්බෝව වැවේ බටහිර පෙදෙසේදී මේ අවසාදිත පොළොව මතුපිට පිහිටා ඇත (රූපය 14). අනෙකුත් ජුරාසික තැන්පතු වන තබ්බෝවට දකුණින් පිහිටි ආඬිගම (තබ්බෝව සිට කිලෝමීටර් 32) හා පල්ලම (තබ්බෝව සිට කිලෝමීටර් 43) නූතන පාංශු තැන්පතු මඟින් මුළුමනින්ම පාහේ ආවරණය වී ඇත. ඉන්දියානු අර්ධද්වීපයේ නැගෙනහිර පෙදෙසේ කිලෝමීටර් 3218 ක කලාපයක ශ්‍රී ලංකාවේ ජුරාසික තැන්පතුවලට සමගාමී, එනම් බොහෝවිට එකම කාලපරිච්ඡේදයකට අයත් ජුරාසික අවසාදිත තැන්පත්ව ඇත. ඉන්දියාවේ ගොන්ඩ්වානා පද්ධතියට (Gondwana system) අයත් මෙම තැන්පතු ඉතා ඝනකමට තැන්පත්ව ඇත. මේ තැන්පතු පැලියොසොයික (Paleozoic) මහ යුගයට අයත් අවසාන යුගය එනම්, පර්මියන් (Permian) (අදින් වසර මිලියන 286 සිට 248 දක්වා පැවති යුගය) යුගයේ සිට ක්‍රෙටේසියස් යුගය දක්වා පැතිරුණු කාලපරිච්ඡේදයකට අයත් වේ. මෙම තැන්පතු ගොන්ඩ්වානාලන්තය (Gondwanaland) නමින් හැඳින්වෙන ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, දකුණු ඇමරිකාව, අප්‍රිකාව හා මැඩගස්කරය ආදි කලාප එක්ව සෑදුණු පුරාණ යෝධ ගොඩබිමේ මායිම්වල තැන්පත්ව ඇත (Cooray, 1984).

තබ්බෝව තැන්පතු: තබ්බෝව තැන්පතු පිළිබඳ වාර්තා කොට ඇත්තේ 1925 දී ඊ.ජේ. වේලන්ඩ් විසිනි (Wayland, 1925). පුත්තලම-අනුරාධපුර මාර්ගයේ 8 වන සැතපුම් කණුව අසල විශාල වැලිගල් (sandstone) මාර්ගයේ දෙපස පොළොව මතුපිටට නිරාවරණය වී ඇත. මේ වැලිගල්වල පැතිරීම දළ වශයෙන් කිලෝමීටර 2.5 (සැතපුම් 1 1/2) ක් පමණ වන අතර එය 7 1/2 හා 9 වන සැතපුම් කණු අතර දිගු පැතිරීමක් පිහිටයි. ජලය අඩු වියළි කාලයේ මෙම වැලිගල් වැවේ වාන් දොරටු අසල හා වැව් බැම්මේ විශාල ගල් (boulders) ආකාරයෙන් දැකිය හැකි ය (රූපය 14). අප විසින් අනාවරණය කරන ලද ශාක ෆොසිල සියල්ලම පාහේ හමුවූයේ මේ වාන් දොරටු අසල වූ විශේෂයෙන්ම අළු, කහ හෝ දුඹුරු පැහැති අවසාදිත තැන්පතු අතර තිබී ය. තබ්බෝව තැන්පතුවේ මතුපිට පැතිරීම වර්ග සැතපුම් 2 ක් හෝ 3 ක් පමණ වේ. මේවා තෝනිගල සංකීර්ණයේ (Thonigala Complex) වූ ග්‍රැනයිට් (granites) හා නයිසස් (gneisses) සමඟ පිහිටා ඇත.

තබ්බෝව ෆොසිල: අප නිරත වූ තබ්බෝව ගවේෂණවලදී තබ්බෝව ජුරාසික ෆොසිල හමුවූයේ වැලිගල් අතර වූ මඩගල් (mud stones) තැන්පතු හා තුනී වැලිගල් (siltstone) තැන්පතු අතර දී ය. එම ෆොසිල මේ මඩගල් හා තුනී වැලිගල් අතර මනාව සුරක්ෂිතව ඇත. එම තැන්පතු තැන්පත්ව ඇති තිරස් සටහන් අනුව ආයුධයක් මඟින් එල්ල කරනු ලබන පහරින් එම ගල් පතුරු වශයෙන් වෙන් වෙයි. මෙම ෆොසිල ශාක පත්‍ර හා කුඩා අතු රිකිලි වශයෙන් එම අවසාදිත තුළ සලකුණු (impressions) ලෙස සුරක්ෂිතව ඇත. මෙහි තැන්පත්ව ඇති ෆොසිල ශාක අතර කොනිෆරස් ගස් (Coniferous trees), සයිකේඩ් (Cycade) හා පර්ණාංග (Pteridophyta) විශේෂයෙන් සඳහන් කළ හැකි ය. මෙම ගවේෂණයේදී පර්ණාංග ෆොසිල රැසක් අනාවරණය කරගැනීමට හැකි වූයේ තබ්බෝව තැන්පතුවලිනි. මේ අතරින් තබ්බෝවෙන් හමුවන සයිකේඩොෆයිටා (Cycadophyta) ශාකයක් වන *Ptilophyllum* ඉහළ ගොන්ඩ්වානා කාලවකවානුවට අයත් සුවිශේෂී ශාක විශේෂයක් වේ. තබ්බෝවෙන් හමුවන ඇතැම් ශාක විශේෂ ඉන්දියාවේ දමෝදා (Damodar) හි පිහිටි රජ්මහල් (Rajmahal) තැන්පතු හා මදුරාසි ද්‍රෝණියේ තැන්පතුවලින් හමුවන ෆොසිලවලට ඉතාම සමානතා දක්වයි. මේ අනුව තබ්බෝවෙන් හමුවන ජුරාසික යුගයට අයත් ශාක ෆොසිල මත පදනම්වල එම තැන්පතු ඉහළ ගොන්ඩ්වානා පද්ධතිය තුළ ඉහළ ජුරාසික යුගයට අයත් වන බව සඳහන් කළ හැකි ය (Cooray, 1984).

තබ්බෝව අවසාදිත තැන්පතු පිළිබඳ අදහස් දක්වන භූ විද්‍යාඥයින් පවසනුයේ ඒවා ජලය මඟින් සිදුව ඇති තැන්පත්වීම්වල ආකාරයක් දක්වන බවයි. නොගැඹුරු ජල තැන්පතුවක් ලෙස දැක්විය හැකි මේ අවසාදිත තැන්පතු නොගැඹුරු මිරිදිය හෝ කලපු ඩෙල්ටා තැන්පතුවක් වීමට බොහෝ ඉඩකඩ




රූපය 14. තඹබෝව වැවේ ජුරාසික තැන්පතුව (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ඇත. විටින් විට ඇති වූ මුහුදු මට්ටමේ වෙනස්වීම් මත ගලා ආ මුහුදු ජලය නිසා මේ තැන්පතුවේ ඉතා තුනී හුණු ස්ථරයක් ද තැන්පත්ව ඇත. මේ විශාල තැන්පතුවේ බර හේතුවෙන් ඒවා එකිනෙකට සුසංගත වී ඇති අතර ඒවා වැලි සමඟ ද පෑහී ඇත.

ජුරාසික තැන්පතු තැන්පත්ව ඇති ද්‍රෝණි තඹබෝව, ආඩිගම හා පල්ලම මෙන්ම ඉන්දියාවේ නැගෙනහිර වෙරළ තීරයේ ද දැකගත හැකි බව අපි ඉහත දී සාකච්ඡා කළෙමු. දෙරට අතර වූ මේ තැන්පතු දළ වශයෙන් පිහිටා ඇත්තේ උතුරු-දකුණු දිශානුගතව ය. ඉතිරි තැන්පතු ඇති ද්‍රෝණි වර්තමාන තැන්පතු මඟින් ආවරණය වී සැඟව පවතී. 1963 හා 1964 කාලවකවානුවල මන්නාරම ප්‍රදේශයේ පොළොව විද කළ පර්යේෂණ මඟින් තහවුරු වූයේ එහි වූ මයෝසීන තැන්පතුවලට පහළින්, එනම් පොළොව මතුපිට සිට අඩි 200-250 ට ගැඹුරින් තඹබෝව තැන්පතුවලට සමාන තැන්පතු හමුවී ඇති බව ය (Cooray, 1984).

තඹබෝව තැන්පතුවල ෆොසිල වූ ශාකයන්ගේ සලකුණු හිඟකම නිසාත්, ගල් අඟුරු මුලුමනින්ම පාහේ නොදැරීම නිසාත් හෝ අඩුම තරමින් කාබොනේසියස් (carbonaceous) තැන්පතු නොදැරීමත් නිසා පැහැදිලි වනුයේ මේ කලාපයේ එකල පැවත ඇත්තේ ඉතා සුලු ශාක ප්‍රමාණයක් පමණක් බව ය. එහි බොහෝ විට අර්ධ ශුෂ්ක දේශගුණික තත්ත්වයක් පැවතුණා විය හැකි ය. ජලය මඟින් ප්‍රවාහණය වී ඩෙල්ටාවල තැන්පත් වූ මේ ශාක කොටස් බොහෝ දුරට ඒ අසල වූ කඳු අතර ශීත දේශගුණයක් යටතේ වැවුණු ශාකයන්ට අයත් විය හැකි ය. මේ ද්‍රව්‍යයන් එම කඳු අතරදී හායනයට ලක්ව ජලය මඟින් ගසාගෙන විත් තැන්පත්ව ඇත. රළු වැලි හා සියුම් වැලි වැනි වෙනස් ආකාරවල වූ වැලි, කෝණික හැඩැති තිරුවානා හා ෆෙල්ඩ්ස්පා (feldspar) ආදි මේ සෑම තැන්පතුවකින්ම කියාපානුයේ විටින් විට

වෙනස් පාරිසරික තත්ත්වයන් යටතේ මේ තැන්පත්වීම සිදුව ඇති බව ය. රළු වැලි තැන්පතු ගංවතුර හා වේගවත්ව ජලය ගැලූ ගංගාවල ක්‍රියාකාරිත්වය නිසා ඇති වූ තැන්පතු වීමට ඉඩකඩ ඇති අතර මෙහි වූ මැටි තැන්පතු සෙමෙන් සහ කලබලයෙන් තොරව ගැලූ ගංගාවල ක්‍රියාකාරිත්වයන් නිසා ඇති වූ තැන්පතු විය හැකි ය. පිටාර ගංගා ජලය විසින් රැගෙන ආ ශාක කොටස් මේ සමඟ ගසාගෙන ආ රළු වැලිවල ක්‍රියාකාරිත්වයේ හේතුවෙන් විනාශ වන්නට ඇත. එසේ නොවේනම් ජලය වේගයෙන් නොගැලූ සන්සුන් කාලපරිච්ඡේදවල, රළු වැලි ජලය මඟින් ප්‍රවාහනය නොවූ, සීත දේශගුණයක් පැවති කාලයන්හි කඳු අතර වැවුණු සයිකේඩ් හා පර්ණාංග ශාකවල පත්‍ර කොටස් ජලයේ පාවී පැමිණ මෘදු මැටි අතර



රූපය 15. ***Cladophlebis zeylanica*** (වම), ***Nilssonia fissa*** (මැද) සහ ***Taeniopteris spatulata*** (දකුණ).
තඹබෝව තැන්පතුවෙනි. **(scale bar = 10 mm)**





රූපය 16. ***Otozamites*** ගණයට අයත් ෆොසිල.
තඹබෝව තැන්පතුවෙනි. **(scale bar = 10 mm)**

සුරක්ෂිත වන්නට ඇත. ගොන්ඩ්වානා පද්ධතියට අයත් අවසාදිත විශාල ගංගාවල ක්‍රියාකාරිත්වය මඟින් ගොන්ඩ්වානා මහාද්වීපයේ වූ විශාල ඩෙල්ටා, මුහුදු බොකු හා වෙරළ තීර කලාප, රට තුළ වූ ද්‍රෝණි හා වැව් තුළ තැන්පත්ව ඇත. තබ්බෝව තැන්පතුව මේ අතරින් බොහෝවිට ඩෙල්ටා තැන්පතුවක් හෝ ද්‍රෝණි තැන්පතුවක් විය හැකි ය. එම තැන්පතු යම් හේතුවක් නිසා සිදුවූ සෝදාපාළුව හේතුවෙන් ප්‍රාග් කේම්බ්‍රීය පාදමක් මතට පතිතව ඇත (Cooray, 1984).

ආඬිගම හා පල්ලම තැන්පතු: ආඬිගම ජුරාසික තැන්පතුව කොළඹ-පුත්තලම මාර්ගයේ සැතපුම් 63½ කණුවේ පිහිටි කිරියංකාලි ග්‍රාමයේ සිට සැතපුම් 8 ක් නැගෙනහිර දෙසට ගියකල ආඬිගම නම් ග්‍රාමයේදී හමුවේ. 1966 සහ 1969 දී පොළොව විද කළ පර්යේෂණ හා ළිං බිත්ති අධ්‍යයනයෙන් කළ පර්යේෂණ ප්‍රතිඵල මෙම ජුරාසික තැන්පතුව පිළිබඳ ශාස්ත්‍රීය දත්ත ගොනු කිරීම සඳහා උපකාරී විය. පොළොව විද කළ පර්යේෂණවලදී පොළොව මට්ටමේ සිට අඩි 1000 කට වැඩි ප්‍රමාණයක් ඉක්මවා එම විදීම් සිදුකොට ඇත. එහි ප්‍රතිඵල අනුව ආඬිගම ද්‍රෝණිය වර්ග සැතපුම් 13 ක බිම් ප්‍රදේශයක් පුරා පැතිර ඇති බවත්, එය ආඬිගම සිට සැතපුම් 7 ක් දකුණෙන් පිහිටි පල්ලම ග්‍රාමය දක්වා දිවෙන බවත් අනාවරණය විය. මෙම සමස්ත ද්‍රෝණිය කිලෝමීටර් 20 ක් පමණ දිගින් යුක්ත වන අතර එහි සෘනකම නැගෙනහිරින් මීටර් 90 ක් ද, බටහිරින් මීටර් 1200 ක් ද ආකාරයෙන් වූ වෙනස්කම් සහිත බවත් අනාවරණය වී ඇත. ශාකවල වූ බීජානුධානී (spores), පරාග (pollen), සුරක්ෂිතව ඇති පිටත ශාක ආවරණ කොටස් (cuticles) හා අනෙකුත් ශාක කොටස් අනුව සනාථ වන්නේ මෙම ආඬිගම-පල්ලම තැන්පතුව මධ්‍යම හා පහළ ජුරාසික තැන්පතු හෙවත් ඉහළ ගොන්ඩ්වානා අවධියට අයත් වන බවය. ඒ අනුව පැහැදිලි වනුයේ ආඬිගම තැන්පතුවද තබ්බෝව තැන්පතුව මෙන් දකුණු ඉන්දියාවේ ඉහළ ගොන්ඩ්වානා තැන්පතුවට අයත් බව ය. මන්නාරම ප්‍රදේශයේ පොළව විද සිදුකළ පර්යේෂණයට අනුව පැහැදිලි වනුයේ එහි වූ මයෝසීන හුණුගල් තැන්පතුවට පහළින් එනම්, අඩි 250 ක් ගැඹුරින් තබ්බෝව තැන්පතුව දිවෙන බව ය. ශ්‍රී ලංකාවේ වයඹදිග ප්‍රදේශයේ පිහිටි ජුරාසික තැන්පතු මයෝසීන හා චාතුර්ථික (Quaternary) තැන්පතු මඟින් ආවරණය වී ඇති බව මේ අනුව සනාථ වේ (Cooray, 1984).

ශ්‍රී ලංකාවේ ජුරාසික තැන්පතු අතරින් සුලබව හමුව ඇති ශාක විශේෂ පහත දක්වා ඇත (Cooray, 1984; Deraniyagala, 1939(a); Deraniyagala, 1940(a); Deraniyagala, 1940(b); Deraniyagala, 1955(a); Sitholey, 1944; මනමේන්ද්‍ර-ආරච්චි, 2012).


Pteridophyta- *Cladophlebis zeylanica* (රූපය 15), *Cladophlebis reversa*, *Cladophlebis denticulata*, *Cladophlebis* cf. *browniana*, *Cladophlebis* sp., *Sphenopteris wadiai*, *Coniopteris hymenophylloides*, Fern-like fragments.

Cycadophyta- *Taeniopteris spatulata* (රූපය 15), *Nilssonia fissa* (රූපය 15), *Nilssonia schaumburgensis*, *Anomozamites* (*nilssonia*) sp., *Ptilophyllum* sp., *Otozamites* sp. (රූපය 16)

Coniferales- *Elaochadus plana*, *Elaochadus* sp., *Araucarites cutchensis*, *Brachyphyllum mamillare*, *Desmiophyllum* (?*Podozamites*) sp.

මයෝසීන යුගය


භූ ඉතිහාසය තුළ මයෝසීන යුගය මැතකාලීන යුගයක් ලෙස සැලකේ. එම යුගය අදින් වසර මිලියන 23.0 කට ප්‍රථම ආරම්භව අදින් වසර මිලියන 5.3 කට ප්‍රථම නිමාවට පත් විය. මයෝසීන යුගයට පෙර පැවතියේ ඔලිගොසීන (Oligocene) යුගය (මිලියන 33.9-23.0) වන අතර ඊට වහාම පසුකාලීන යුගය වූයේ ප්ලයෝසීන (Pliocene) යුගයයි (මිලියන 5.3-2.5). එතෙක් ශ්‍රී ලංකාව ඉන්දියානු අර්ධද්වීපයේ කොටසක්ව පැවති අතර මයෝසීනයේදී කලාප දෙකක් ලෙස වෙන් විය. එම වෙන්වීමට හේතු වූයේ ඉන්දියානු භූ තලයේ ගිනිකොනදිග කොටස සාගර ජලයෙන් යටවීම ය. මෙය භූ ඉතිහාසයේ ඉන්දියානු භූ තලයත්, ශ්‍රී ලංකානු දූපතත් භෞතික වශයෙන් වෙන් වූ ප්‍රථම අවස්ථාව ලෙස සැලකේ (Madduma Bandara, 1989).



රූපය 17. වයඹදිග පළාතේ පුත්තලමට උතුරින් වූ අරුවක්කාලු පෙදෙස. මෙම භූමි හරස්කඩෙහි මතුපිට වූ රතුවන් පාංශු ස්ථරය යටින් පිහිටා ඇති කහවන් ස්ථරය මයෝසීන යුගයට අයත් වේ. (ඡායාරූපය: මනෝජ් ප්‍රසන්න)

ශ්‍රී ලංකාවේ මයෝසීන තැන්පතු පිහිටා ඇත්තේ දිවයින තුළ බොහෝ දුරස්ථ ස්ථාන දෙකක ය. එක් තැන්පතුවක් ශ්‍රී ලංකාවේ වයඹදිග හා යාපනය අර්ධද්වීපයේත්, අනෙක් තැන්පතුව දිවයිනේ ගිනිකොන දෙස පිහිටි මිනිහාගල්කන්ද යන ස්ථානයේත් පිහිටා ඇත. මිනිහාගල්කන්ද යාල ජාතික

වනෝද්‍යානයේ අංක 2 දරන කලාපය තුළ පිහිටයි. මේ අතරින් මෙම ග්‍රන්ථයේ සාකච්ඡාවට බඳුන්වන අනුරාධපුරයට ආසන්නතම මයෝසීන තැන්පතුව පිහිටා ඇත්තේ වයඹදිග පළාතේ වූ පුත්තලම නගරයේ සිට කිලෝමීටර් 25 ක් උතුරට වන්නට පිහිටි අරුවක්කාලු නම් ප්‍රදේශයේ ය (රූපය 17). අරුවක්කාලු දක්වා ව්‍යාප්තව ඇත්තේ යාපනය අර්ධද්වීපයේ තැන්පත්ව ඇති 'යාපන හුණුගල්' (Jaffna limestone) තැන්පතුවේම කොටසක් ය (Deraniyagala, 1935; Deraniyagala, 1937(a); Deraniyagala, 1937(b); Deraniyagala, 1960; Deraniyagala, 1967; Deraniyagala, 1968; Deraniyagala, 1969; Cooray, 1984; Goonatilake, 2001; Epa *et al.*, 2011). අරුවක්කාලු මයෝසීන තැන්පතුව දශක කිහිපයක සිටම ශ්‍රී ලංකාවේ සිමෙන්ති නිෂ්පාදනය සඳහා උපයෝජනය කර ගැනේ. වර්තමානයේ මෙහි සිමෙන්ති නිෂ්පාදන ක්‍රියාවලිය සිදුකරනුයේ හොල්සිම් සමාගම විසිනි.



රූපය 18. මෘද්වංගී ෆොසිල. ගැස්ට්‍රොපෝඩාවන් හා දෙපියන් බෙල්ලන් (පහළ දකුණුපස රූපය)
(ඡායාරූපයෘ මාධව මීගස්කුඹුර)

ශ්‍රී ලංකාවේ සමස්ත මයෝසීන තැන්පතුව සමුද්‍ර ජීවී ෆොසිලයන්ගෙන් සමන්විත වේ. එම ෆොසිල නියෝජනය කරනු ලබන සත්ත්ව කාණ්ඩ අතර ෆොරමිනිෆෙරාවන් (foraminifers), මෘද්වංගීන් (molluscs) (රූපය 18), ඉකිරියන් හා පසැඟිල්ලන් ආදි සතුන් අයත් වන එකයිනොඩොමෙටාවන් (echinoids) හා කොරල් (corals) ආදි සතුන් අයත් වන අපෘෂ්ඨවංශීන් සඳහන් කළ හැකි ය. ඊට අමතරව මෝරුන් හා මඩුවන් ආදි කාටිලේජීය මසුන් (cartilaginous fish = chondrichthyes), අස්ථික මසුන් (bony fish = Osteichthyes) (රූපය 19), ඉබ්බන් හා කැස්බෑවුන් අයත් වන කීලෝනියාවන් (Chelonian) මෙන්ම



රූපය 19. ***Diodon*** ගනයට අයත් අස්ථික මත්ස්‍යයෙකුගේ දත් (ඡායාරූපයඃ සොනාලි රංගිකා ප්‍රේමරත්න)

ඩොල්ෆිනයින්, මුහුදු උෟරන් හා තල්මසුන් ආදි සතුන් අයත් වන ක්ෂීරපායීන්ගේ (mammalia) ෆොසිල ද හමුවන අතර එම විශේෂ මයෝසීන තැන්පතුවලින් වාර්තාවන පෘෂ්ඨවංශී සතුන් වේ (රූපය 20). තවද ඉතා සුලු ප්‍රතිශතයක් වූ ශාක විශේෂ අතර මුහුදු ඇල්ගී සඳහන් කල හැකි ය (Cooray, 1984; Deraniyagala, 1935; Deraniyagala, 1937(a); Deraniyagala, 1937(b); Deraniyagala, 1960; Deraniyagala, 1967; Deraniyagala, 1968; Deraniyagala, 1969; Goonatilake, 2001; Epa *et al.*, 2011).

ශ්‍රී ලංකාවේ මයෝසීන ෆොසිල ජීවීන් පිළිබඳව ගැඹුරින් පර්යේෂණ කල ආචාර්ය පී.ඊ.පී. දැරණියගල අරුවක්කාලු තැන්පතුවට ඉංග්‍රීසි බසින් 'Malu member' ලෙස ද, මිනිහාගල්කන්දට 'Minihagala' ලෙස ද නම් තබන ලදී. මෑතකාලීනව අරුවක්කාලු තැන්පතුවේ වූ ෆොරමිනිෆෙරාවන් හෙවත් ක්ෂුද්‍ර ජලජවාසී සත්ත්ව කාණ්ඩයකගේ ෆොසිල පිළිබඳව සිදු කරන ලද පර්යේෂණවලට අනුව එම තැන්පතුව මයෝසීන යුගයේ බර්ඩිගාලියන් (Burdigalian) අවධියට අයත් බැව් අනාවරණය කරගන්නා ලදී (Epa *et al.*, 2011).

මයෝසීනය අවධීන් හයකින් සමන්විත වේ. එනම් ඇක්‍යුටේනියන් (අදින් වසර මිලියන 23.03-20.44 දක්වා වූ සමය) (Aquitanian), බර්ඩිගාලියන් (මිලියන 20.44-15.97 දක්වා වූ සමය) (Burdigalian), ලැන්ගියන් (මිලියන 15.97-13.82 දක්වා වූ සමය) (Langhian), සෙරාවාලියන් (මිලියන 13.82-11.62 දක්වා වූ සමය) (Serravallian), ටෝර්ටෝනියන් (මිලියන 11.62-7.246 දක්වා වූ සමය) (Tortonian), හා මෙසිනියන් (මිලියන 7.246-5.333 දක්වා වූ සමය) (Messinian) යනාදී වශයෙනි. මේ අතරින් අරුවක්කලුහි පිහිටි මයෝසීන තැන්පතු අතර වූ ෆොරමිනිෆෙරාවන්ගේ ෆොසිල හමුවන ස්තරය බර්ඩිගාලියන් අවධියට අයත් බැව් මෑතකදී කල පර්යේෂණවලින් හෙළිවිය (Epa *et al.*, 2011).



රූපය 20. මයෝසීන අවධියේ ශ්‍රී ලංකාව අවට මුහුදේ ජීවත් වූ උරග හා ක්ෂීරපායී සතුන්. ***Miotestudo ibba*** (ඉහළ පෙළ වම), ***Miocaretta lankae*** (ඉහළ පෙළ මැද), ***Miodugong brevicranius*** (ඉහළ පෙළ දකුණ), ***Miotursiops mulla*** (පහළ පෙළ වම), ***Mioceta bigelowi*** (පහළ පෙළ දකුණ) (පී.ඊ.පී. දැරණියගල විසින් අඳින ලද රේඛා චිත්‍ර ඇසුරින් සාරනාත් ධනංජය සේනාපති විසින් අඳින ලදී)

පහත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ මයෝසීන අවසාදිත අතරින් අනාවරණය කරගන්නා ලද ෆොසිල සතුන් සහ ශාක ය. මෙම ලැයිස්තුව ආචාර්ය පී.ඊ.පී. දැරණියගල විසින් රචිත ශාස්ත්‍රීය ලිපි හා පී.ජී. කුරේ විසින් 1984 දී රචිත *The Geology of Sri Lanka (Ceylon)* ග්‍රන්ථය ඇසුරෙන් සකස් කරන ලදී (Deraniyagala, 1937(a); Deraniyagala, 1937(b); Deraniyagala, 1961; Deraniyagala, 1969(a); Deraniyagala, 1969(b) හා Cooray, 1984).

මෙම මයෝසීන ජීවී ලැයිස්තුව සම්පාදනය කර ගැනීමේදී ප්‍රකාශයට පත්නොකළ ප්‍රාරම්භක පර්යේෂණ වාර්තාවක කරුණු අප වෙත ලබා දුන් මයෝසීන ෆොසිල පිළිබඳ විශේෂඥයෙකු වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශයේ රන්ජීව් ඈපා මහතා දක්වන ලද සහයෝගය අගය කොට සලකමු.

Calcareous Algae: *Lithothamnium* sp., *Lithophyllum* sp.

Bryozoa: *Cheilostome*

Porifera (Hyalospongia): *Pheronema* sp.

Protozoa (Foraminifera): *Archaias malabaricus*, *Alveolinella* (Flosculinella) sp., *Amphistegina* sp., *Austrotrillina* sp., *Borelis* sp., *Carpentaria* sp., *Eponides* sp., *Flosculinella* sp., *Gypsina* sp., Miliolidae, *Nephrolepidina* sp., *Operculina* sp., *Quinqueloculina* sp., *Rotalina* sp., *Sorites* sp., *Spiroclypeus orbitoideus*, *Spiroclypeus* sp. (?) cf. *S. pleurocentralis*, *Textularia* sp., *Triloculina* sp.

Cnidaria (Anthozoa): 'Montlivaltia' brevis'=*Stylophyllopsis brevis*, *Flabellum* sp., *Hydnophora plana*, *Porites* sp., *Solenastrea* sp., *Staminocoenia plana*

Arthropoda (Crustacea): *Oxystomata* sp., *Leucosia unidentata lanke*

Mollusca (Gastropoda) (රූපය 18): *Tectus loryi*, '*Euspirocrommium oweni*'= *Pachycrommium oweni*, *Ptychocerithium archiaci*, '*Xenophora*' sp., *Cypraea* (*Lynsina*) *jenkinsi*, '*Callistocypraea* (*Miolyncina*) *prunum*' = *Cypraea prunum*, *Conus* (*Lithoconus*) *subbrevis*, *Conus* (*Lithoconus*) *litteratus*, *Agaronia pupa*, *Pachycrommium oweni*, *Ptychocerithium pseudocorrugatum*, *Natica rostalina*, *Cypraea prunum*, '*Phalium* (*Semicassis*) *booleyi*' = *Semicassis*, *Olivancillaria* (*Anazola*) *nebulosa* var. *pupa*, *Strombus spinosus minihagali*

Bivalvia (රූපය 18): '*Antigona puerpera*'= *Periglypta puerperal* var. *granosa*, '*Ostrea* (*Lopha*) *virleti*'= *Hyotissa virleti*, *Ostrea vespertina*, ? *Discors triforme*, *Arca granosa*, *Amusium subcorneum*, *Anadara peethensis*, *Atrina* (*Atrina* ?) *pachyostraca*, *Chlamys* sp., *Macrocallista* (*Costacallista*) *pseudoumbonella*, *Macrocallista* (*Costacallista*) *pseudo umbonella*, *Mimachlamys senatoria*, *Spondylus* aff.? *tallavignesi*, *Spondylus waylandi*, *Trachycardium picteti*, *Venericardia sowerbyi*

Echinodermata -

(Regularia): *Minicidaris*, *Strongylocentrotus minihagali*

(Irregularia): *Clypeaster* (*Paleanthus*) *depressus*, *Clypeaster annandalei caviventer*, *Clypeaster* sp., *Lovenia minihagali*

Vertebrata -

Chondrichthyes: *Isurus glaucus*, *Glyphis minor*, *Galeocerdeo articus*, *Galeocerdo cuvieri*, *Hemipristis serra*, *Galeolamna gangetica*, *Galeolamna brachyura*, *Galeolamna minor*, *Miosynechodus mora*, *Myliobatis sinhaleyus*, *Acetobatis sinhaleyus*, *Trigon sinhaleyus*

Actinopterigii: *Labrodon angustidentatus*, *Labrodon sinhaleyus*, *Diodon sinhaleyus* (රූපය 19), *Chrysophrys miolankae*, *Scarus* sp., *Callyodon* sp.

Reptile: *Geomyda striata*, *Miotestudo ibba* (රූපය 20), *Miocaretta lankae* (රූපය 20)

Mammalia: *Miodugong brevicranius* (රූපය 20), *Miotursiops mulla* (රූපය 20), *Mioceta bigelowi* (රූපය 20), *Mioceta magna*

අනුරාධපුර පෙදෙසේ ශාක හා සත්ත්ව සන්තතිය

වන ආවරණය

අනුරාධපුර පෙදෙස ප්‍රධාන වශයෙන්ම සමන්විත වන්නේ මෝසම් වනාන්තර (Monsoonal Forest) හෙවත් වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (Dry Mixed Evergreen Forest) වලිනි (රූපය 21). මේ වනාන්තර වර්ගය දිවයිනේ වියළි කලාපයේ පුළුල් ලෙස පැතිර ඇත. මෙම වනාන්තරවල වියළි සමයේදී ජලය වාෂ්පීකරණය අවම කිරීම සඳහා ශාක පත්‍ර හැලී යන පතනශීලී ගස් කොළන් බහුලව තිබුණ ද සදාහරිත ලක්ෂණ පවත්වාගෙන යන ගස් විශේෂ ද වේ. මේ නිසාම මෙම වනාන්තර අර්ධ සදාහරිත වනාන්තර (Semi Evergreen Forest) යනුවෙන් ද හැඳින්වේ. මෙම වනාන්තරවලට මූලික වශයෙන්ම පතිතවන්නේ ඊසානදිග මෝසම් වැසි ය (Northeast Monsoon Rains) (Ashton *et al.*, 1997).



රූපය 21. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (ඡායාරූපයෑ විමුක්ති වීරතුංග)

2007 දී ප්‍රකාශිත ජාතික සිතියම් පොතට (*The National Atlas of Sri Lanka, second edition,* 2007) අනුව අනුරාධපුර පෙදෙසේ වනාන්තර ආකාර දෙකක් පවතී. එනම්, නිවර්තන මෝසම් වනාන්තර (Tropical Monsoon Forest) හා නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (Tropical Dry Mixed Evergreen Forest)

ලෙසිනි. ඉහත ඡේදයේ ඇෂ්ටන් ඇතුළු පිරිස මෝසම් වනාන්තර, වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර හා අර්ධ සදාහරිත වනාන්තර යන තුන් ආකාරයේම වනාන්තරවලින් එක් වනාන්තර ආකාරයක් පෙන්නුම් කරන බැව් සඳහන් කර ඇත. ජාතික සිතියම් පොතට අනුව නිවර්තන මෝසම් වනාන්තර අනුරාධපුර පෙදෙසේ පැතිර ඇති අතර ඒවා අතීතයේදී කපා හෙළා නැවත ඇති වුණු ද්විතියික වන වැස්මක් ලෙස දක්වා ඇත. එයට හේතු වනුයේ ඓතිහාසික සමයේදී මෙන්ම අදින් වසර 800 කට පමණ පෙර සිටම මෙම වනාන්තර දැඩි ලෙස වගාවන්ට නතුවීම ය. ඉහත දක්වන ලද විස්තරය පිළිබඳව ඉතා සරලව දක්වතොත් අනුරාධපුර හා පොළොන්නරු යන යුගවලින් අනතුරුව මෙම වනාන්තර බොහෝ සේ විනාශයට ලක්වූ අතර වර්තමානයේ මෙහි පවතිනුයේ ද්විතියික වන වැස්මකි.

මෙම කලාපයට වසරේ මාස 3-6 පමණ කාලයක් පැහැදිලි වියළි කාලපරිච්ඡේදයක් පවතී. එහිදී මැයි හා අගෝස්තු යන කාලසීමාව විශේෂයෙන් සඳහන් කළ හැකිය. සිතියම් පොතට අනුව නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර යාපන අර්ධද්වීපයේ හැරුණු විට සමස්ත වියළි කලාපය පුරාම පැතිර ඇත. මෙම වනාන්තර ආකාරය කිසිවිටෙකත් මුහුදු මට්ටමේ සිට උස මීටර් 300 නොඉක්මවයි. එසේ වුවද වියළි කලාපයේ වූ උසම කන්ද වන මුහුදු මට්ටමේ සිට උස මීටර් 766 ක් (මෙය ජාතික සිතියම් පොතේ [2007] වූ සිතියම්වල උස මීටර් 572 ක් ලෙස ද දක්වා ඇත) උසැති රිටිගල කන්දේ මෙම නිවර්තන වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර පැතිර ඇත. රිටිගල යනු වියළි කලාපයේ පිහිටි ඉතාමත් සුවිශේෂී වූ ජෛවවිවිධත්වයෙන් අනූන පෙදෙසක් ලෙස හැඳින්විය හැකි ය (රිටිගල පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මෙම ග්‍රන්ථයේ පසු ඡේදයක දක්වා ඇත) (Ashton *et al*., 1997; *The National Atlas of Sri Lanka,* 2007).

ඇෂ්ටන් ඇතුළු පිරිස 1997 දී රචිත *A field guide to the common trees and shrubs of Sri Lanka* යන ග්‍රන්ථයට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා පැතිර ඇති වනාන්තර ආකාරය මෝසම් වනාන්තර ලෙස දැක්විය හැකි ය. ඒ අනුව මෙම ග්‍රන්ථයේ දී අපි අනුරාධපුර ප්‍රදේශය වසා පැතිර ඇති වනාන්තර ආකාරය මෝසම් වනාන්තර ලෙස දැක්වීමට කැමැත්තෙමු. එම වනාන්තරවල වියන ස්ථරය (Canopy) බිම් මට්ටමේ සිට උස මීටර් 20-25 ත් අතර පිහිටයි. උප වියන ස්ථරය (Sub-canopy) මීටර් 10-15 ත් අතර පිහිටයි. යටි වගාව (Under-growth) විශාල පරාසයක විවිධත්වයක් දරන පඳුරු හා වැල් විශේෂවලින් බෙහෙවින් පොහොසත් ය.

ඉහත විස්තර කළ අන්දමට මෙම වනාන්තරවල පිහිටි පතනශීලී ගස් වනුයේ බුරුත (*Chloroxylon swietenia*), මිල්ල (*Vitex altissima*), හල්මිල්ල (*Berrya cordifolia*) හා ඇහැළ (*Cassia fistula*) ආදියයි. මෙහි සදාහරිතභාවය රැකගන්නා ගස් අතර පළු (*Manilkara hexandra*), කළුවර (*Diospyros ebenum*), කුණුමැල්ල (*D. ovalifolia*), වෑවරණ (*Alseodaphne semecarpifolia*), වීර (*Drypetes sepiaria*) හා වැලිවැන්න (*Dimorphocalyx glabellus*) විශේෂයෙන් සඳහන් කළ හැකි ය. ලඳු කැලෑවල වැවෙන කටු සහිත පඳුරු අතර හීන් කරඹ (*Carissa spinarum*), කුකුරුමාන්න (*Catunaresam spinosa*) අන්දරකර (*Canthium coromandelicum*) ආදිය ඉතා සුලබ ය. මෙම වනාන්තරවලට අයත් වන ගස්වැල් හා සතුන් ගත් කල තෙත් කලාපයේ වූ වැසි වනාන්තරවලට සාපේක්ෂව ආවේණික ප්‍රතිශතය ඉතා අඩු මට්ටමක පවතී. එසේ වුවද මෙරට වසන 4,000 ක් පමණ වූ අලි ඇතුන්ගේ නිවහන වී ඇත්තේ මෙම වනාන්තර ආකාරය වේ.

දමන තෘණබිම් (Damana Grasslands) ලෙස හැඳින්වෙන පරිසර පද්ධතිය විල්පත්තුව ජාතික වනෝද්‍යානය ආශ්‍රිතව සුලබය. දමන තෘණබිම් යනු තැන තැන ගස් පවතින තෘණබිම් ය. වර්ෂාපතනය, උෂ්ණත්වය හා පසේ සංයුතිය අනුව දමන තෘණබිම්වල පැතිරීම සිදුවේ. දමන තෘණබිම් අතර වැවෙන


ගස් වැල් වනුයේ මයිල (*Bauhinia racemosa*), කහපෙතන් (*Bauhinia tomentosa*), දිවුල් (*Limonia acidissima*), මසං (*Mauritiana*), හීන් එරමිණියා ආදිය ය. මෙහි *Cymbopogon nardus*, *Imperata cylindrica*, *Themeda tremula*, *T. triandra* යන තෘණ විශේෂ ද, *Aristida*, *Brachiaria*, *Eragrostis*, *Ischemum* යන තෘණ ගණ ද දැකිය හැකි ය. කහපෙතන් ගින්නට මනාව ඔරොත්තු දෙන ගස් විශේෂයක් ලෙස හඳුන්වාදිය හැකි ය. මෙම තෘණ පරිසරයේ ඝනාවාසී කුහුඹුවන්ගේ හා කෘමි විශේෂයන්ගේ ගහන ඝනත්වය ඉතා ඉහළ තලයක පවතින අතර වේ හුඹස් ද වඩාත් සුලබ වේ.

අනුරාධපුර ප්‍රදේශයේ වූ තවත් පරිසර පද්ධතියක් ලෙස විල්ලු (Villus) හඳුන්වාදිය හැකි ය (රූපය 22). විල්පත්තුව ජාතික වනෝද්‍යානය තුළ කලා ඔයේ පිටාර තැනිවල විල්ලු දැකිය හැකි ය. විල්ලු ජලචර පක්ෂීන් ඇතුළු පක්ෂී විශේෂ රැසකට නිවහන් සපයයි. මෙහි ජලයේ මසුන්, ඉස්සන් හා කකුළුවන් බහුලව ජීවත් වේ. විල්ලුවල වැවෙන තෘණ අතර *Iseilema taxum* හා *Paspalidium flavum* යන විශේෂ ද වැල් අතර වේවැල් (*Calamus* spp.), නේබැද්ද (*Vitex leucoxylon*) සහ බක්මී (*Nauclea*) යන ගස් ද වේ.



රූපය 22. විල්ලු පරිසරය. විල්පත්තු ජාතික වනෝද්‍යානය (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

අනුරාධපුර දිස්ත්‍රික්කය ආශ්‍රිතව දැනට ස්වාභාවික වන ආවරණය අභය භූමි, වනෝද්‍යාන හා දැඩි රක්ෂිත පෙදෙස්වල බොහෝ දුරට සුරක්ෂිතව ඇත. දිස්ත්‍රික්කය පුරාම විසිරී ඇති ඓතිහාසික යුගයට අයත් නටබුන් සමඟ වූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රයන් තුළ ද මෙම වනාන්තර ශේෂව පැවතීම සතුටට කරුණකි. එම නිසා ඉහත විස්තර කරන ලද වනාන්තර ආකාර අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවමත් ඉතිරිව පවතී (රූපය 23).




රූපය 23. අනුරාධපුර දිස්ත්‍රික්කයේ දැඩි රක්ෂිත කලාප, වනෝද්‍යාන සහ අභයභූමි (මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2007 දී ප්‍රකාශිත ***The National Atlas of Sri Lanka*** දෙවන මුද්‍රණය ඇසුරෙන් සකස් කරන ලදී)

ශාක සන්තතිය

ශතවර්ෂ විස්සක් හෝ ඊට වැඩි කලක සිට පැවත එන වගුරු, වැව් හා පොකුණුවල ඉතා ස්ථාවර වූ පරිසරයක් මේ වන විට අනුරාධපුර පෙදෙසේ පවතී. ස්වාභාවික වගුරු විශාල වශයෙන් කුඹුරු බවට පරිවර්තනය කොට ඇති බැවින් මෙම කලාපයේ එකල්හි පැවති ජලජ හා තෙත් වගුරු පරිසරය කොතරම්දයත් අනුමාන කළ හැකි ය. වසරේ මාස තුනකදී ලැබෙන ඊසානදිග මෝසම් වර්ෂාව හැරුණු විට ඉතිරි මාස කිහිපය තුළ අතිශය වියළි තත්ත්වයක් පැවතුණ ද ජලජ ශාක ප්‍රජාවන් අඛණ්ඩව පැවත එන බව සඳහන් කළ හැකි ය. ඓතිහාසික සමයේ සිට කෘෂිකර්මාන්තය මූලික කොටගෙන තැනුණු වැව් මෙන්ම, උද්‍යාන අලංකරණය හා පානීය ජල අවශ්‍යතාවය සඳහා තැනුණු පොකුණු ද මෙම කලාපය තුළ ඉතා සුලබ ය. මිනිසා විසින් තැනුණු එවැනි ජලජ පරිසරයන් මෙන්ම ගංගා හා ඒ ආශ්‍රිතව පිහිටි වගුරුවල ඉතා පොහොසත් ජලජ ශාක ප්‍රජාවක් දැකිය හැකි ය (රූපය 24 සහ 25).

අනුරාධපුරය ආශ්‍රිතව දැකගත හැකි සුලබ ජලජ ශාක අතර නෙළුම් (*Nelumbo* sp.) (රූපය 26), ඕලු (*Nymphaea pubescens*) (රූපය 27), නිල් මානෙල් (*Nymphaea nouchali*) (රූපය 28), කුමුදු විශේෂ (*Nymphoides indica* සහ *Nymphoides hydrophylla*) (රූපය 29), කෙකටිය (*Aponogeton natans*) (රූපය 30), කංකුන් (*Ipomoea aquatica*), බුදුරැස් පාසි විශේෂ (*Limnophila* spp.) (රූපය 31), ජබර (*Monochoria vaginalis*), ජපන් ජබර (*Eichhornia crassipes*) (ආක්‍රමණශීලී ශාකයකි). (රූපය 32), (සිංහල නමක් නැත) ජබර විශේෂයකි (*Limnophyton obtusifolium*) (රූපය 33), සැල්වීනියා (*Salvinia molesta*) (ආක්‍රමණශීලී



රූපය 24. වැව්වල නොගැඹුරු කලාපය ඉතා පොහොසත් ජලජ ශාක ප්‍රජාව. අභය වැව, ඇතුළත රූප දිය පාසි (*Azolla* spp.) (වම), දිය පන්සි (*Lemna perpusilla*) (දකුණ) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ශාකයකි) (රූපය 34), පන් (*Fimbristylis* sp.) (රූපය 35), දිය ඇඹිලිය (*Marsilea quadrifolia*) (රූපය 36), දිය හවරිය (*Blyxa* spp.), දිය සර්ප (*Hydrilla verticillata*), දිය කොළපත් (*Ottelia alismoides*), දිය ගෝවා (*Pistia stratiotes*) (රූපය 37), (සිංහල නමක් නැත) *Trapa bispinosa*, දිය කුඩළු (*Hydrocera triflora*), හීන් දිය තණ (*Potamogeton* spp.), දිය පන්සි (*Lemna perpusilla*), දිය පාසි (*Azolla* spp.) (රූපය 24) හැඳින්විය හැකි ය. මේවායින් බොහෝමයක් වැව්, පොකුණු හා වගුරු ආදි නිශ්චල ජලයේ වැවේ. මේ අතරින් නිල් මානෙල් ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස නම්කොට ඇත.

අතුඩියන් විශේෂ (*Cryptocoryne* spp.) ගලායන, නොගැඹුරු ජලයේ පත්ලේ පලසක් මෙන් ඇහිරී වැඩේ (රූපය 38). මල්වතු ඔයේ ගඟබඩ වනයෙන් සෙවන ලැබෙන නොගැඹුරු තැන්හි අතුඩියන් විශේෂ ඉතා සුලබව දැකිය හැකි ය (රූපය 39). දිය නිදිකුම්බා (*Neptunia oleracea*) ජලය මත හා

ඒ ආශ්‍රිත ඉවුරුවල වැවෙන වැල් විශේෂයකි (රූපය 40). වැව් ඉවුරු හා වගුරු ආශ්‍රිතව සුලබ ය. අනෙකුත් ජලජ ශාක ප්‍රජා ආශ්‍රිතව දිය නිදිකුම්බා පහසුවෙන් වැඩේ.




රූපය 25. නොගැඹුරු වැව්වල සමස්ත ජල පෘෂ්ඨයේම විශේෂ ගණනාවකින් සැදුම් ලත් ජලජ ශාක ප්‍රජාවක් දැකිය හැකි ය. විශේෂයෙන්ම සියලුම වැව්වල තාවුලු කලාපය නොගැඹුරු බැවින් එහි ද ජලජ ශාක ප්‍රජාව ඉතා පොහොසත් වේ. ගම්බිරිගස්වැව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 26. ඓතිහාසික සමයේදී ගොඩනගන ලද සංඝාවාස ආශ්‍රිතව ඇති පොකුණුවල ඉතා පොහොසත් ජලජ ශාක ප්‍රජාවක් දැකිය හැකිය. තන්තිරිමලේ. මෙහි බහුලව දැකිය හැක්කේ නෙළුම් (*Nelumbo* sp.) ශාකයයි. (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 27. අනුරාධපුරය ආශ්‍රිත සෑම ජලජ වාසස්ථානයකම ඉතා සුලබ ජලජ පැලෑටියකි ඕලු (*Nymphaea pubescens*) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 28. නිල් මානෙල් (*Nymphaea nouchali*)
(ඡායාරූපය: සම්පත් ගුණතිලක)



රූපය 29. වැව්වල නොගැඹුරු කලාපයේ සුලබව දැකිය හැකි කුමුදු (*Nymphoides hudropylla*). අනුරාධපුර අභය වැව
(ඇතුළත රූපය මල්) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 30. නොගැඹුරු ජලයේ සුලබව දැකිය හැකි කෙකටිය (*Aponogeton natans*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 31. බුදුරැස් පාසි (*Limnophila* spp.) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 32. ජපන් ජබර (*Eichhornia crassipes*) (ඇතුළත මල්) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 33. ජබර විශේෂයකි (*Limnophyton obtusifolium*) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 34. සැල්වීනියා (*Salvinia molesta*) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 35. පන් (*Fimbristylis* sp.) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 36. දිය ඇඹිලිය (*Marsilea quadrifolia*) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 37. දිය ගෝවා (***Pistia stratiotes***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 38. අතුඩියන් විශේෂ (***Cryptocoryne* spp.**)
මල්වතු ඔය, ගම්බිරිගස්වැව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 39. ගලායන, නොගැඹුරු ජලයේ ජල පත්ලේ පලසක් මෙන් ඇතිරී වැඩෙන අතුඩියන් විශේෂ (***Cryptocoryne* spp.**)
මල්වතු ඔය, ගම්බිරිගස්වැව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 40. දිය නිදිකුම්බා (***Neptunia oleracea***) (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


එකල පැවති ස්වාභාවික ශාක ප්‍රජාව කපා හෙළා වර්තමානයේ මෙහි ඇති ද්විතියික වන වැස්ම ද (රූපය 41), ඊට අමතරව විශාල වශයෙන් පැතිර ඇති පඳුරු වනාන්තර හා තෘණ බිම් ද මානව ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල ලෙස දැක්විය හැකි ය. අනුරාධපුර පෙදෙසේ භූ දර්ශනයේ වූ විශේෂ ලක්ෂණ අතර යෝධ පාෂාණමය පිහිටීම් සුලබ ය. පූජා නගරය හරහා දිවෙන දීඝ පාෂාණය ලෙස හඳුන්වන ශිලාමය නෙරීමත්, මිහින්තලය, වෙස්සගිරිය හා තන්තිරිමලය ආශ්‍රිතව දැකිය හැකි දෘඪ පාෂාණමය පිහිටීම් අතර වූ ශාක ප්‍රජාව ද විශේෂත්වයක් දරනු ඇත. මෙහි වූ ශාක ප්‍රජාවේ ශුෂ්කමය ලක්ෂණ දරන ශාක මෙන්ම එවැනි වාසස්ථානයන්ටම සීමා වූ ශාක ද බොහෝ සේ දැකිය හැකි ය (රූපය 42).

අනුරාධපුර පෙදෙසේ දැකිය හැකි පඳුරු, ගස් හා වැල් අතර දේශීය මෙන්ම විදේශයන්ගෙන් ගෙනෙන ලද විශේෂ ද බොහෝ සේ පවතී. දැව අවශ්‍යතාවයන්, ආහාර අවශ්‍යතාවයන් ඇතුළු තවත්



රූපය 41. විශාල ගස් කපා හෙළා කරනු ලබන හේන් වගාව, ආදි මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පඳුරු සහිත මෙවැනි ලඳු කැලෑ මෙම කලාපයේ සුලබ ය. (ඡායාරූපයඃ විමුක්ති වීරතුංග)

බොහෝ අවශ්‍යතාවයන් සඳහා මෙම විදේශීය ශාක හඳුන්වා දී ඇත. මීට අමතරව උද්‍යාන අලංකරණය පිණිස හඳුන්වා දුන් ශාක ද බොහෝ ය. වර්තමාන ශාක ප්‍රජාව මේ සියලුම විශේෂ මගින් සැදුම් ලද්දක් වුවද අප මෙහිදී දේශීය තුරුලතා පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වන්නේ ඒවා මේ කලාපයේ මුල් උරුමකරුවන් වීම නිසා ය. නමුත් විදේශයන්ගෙන් හඳුන්වා දුන් බොහොමයක් පඳුරු හා ගස් පිළිබඳව ද මෙහිදී සඳහන් කිරීමට යෙදුණේ ඒවා ද මෙහි වූ පරිසරයේ කොටස්කරුවන් බවට පත් වී ඇති බැවිනි. විසිතුරු හා ආක්‍රමණශීලී ශාක පිළිබඳ විස්තර ඇතුළත් කිරීම සීමා කරන ලද්දේ මෙම පරිච්ඡේදය අනවශ්‍ය ලෙස දීර්ඝ වන හෙයිනි.



රූපය 42. අනුරාධපුර පෙදෙස පුරා පැතිර ඇති මෙවැනි යෝධ පාෂාණමය පිහිටීම් අතර ඉතා පොහොසත් වන ආවරණයක් පවතී. මෙවැනි පරිසරයන්ටම අනුවර්තනය වූ ශුෂ්කරූපී ශාක ඇතුළු තවත් ශාක විශේෂ ගණනාවක්ම මෙම පරිසරයට අයත් වී ඇත (ඡායාරූපයඃ විමුක්ති වීරතුංග)

වසර 2300 ක පමණ බෞද්ධාගමික පසුබිමක් යටතේ පෝෂණය වුණු අනුරාධපුරයේ බෝ ගස් (*Ficus religiosa*) ඉතා සුලබ ය (රූපය 43). ඓතිහාසික සමයේදී බුදු දහම හඳුන්වාදීමත් සමඟ බෝ ගස ඉන්දියාවෙන් මෙරටට හඳුන්වාදුන් ගසක් වන්නට ඇති බව ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාඥ ආචාර්ය සිරාන් දැරණියගලගේ මතය වේ (Deraniyagala, 1992). බෝ ගස බොහෝ ඵල දරන බැවිනුත්, බෝ ඇට පක්ෂීන් බොහෝමයකගේ ආහාරය වන බැවිනුත් එම ගස දිවයින පුරා ශීඝ්‍රයෙන් පැතිරුණා විය හැකි ය. ඊට අමතරව මෙහි වූ ස්වාභාවික පරිසරයේ ඉතා සුලබ ගස් අතර *Ficus* ගණයට අයත් නුග හෙවත් ඇසටු ආදි ගස් දැක්විය හැකි ය. මෙම වියළි පෙදෙසේ මිනිසුන් ඇතුළු බොහෝ සතුනට සිසිල හා සෙවන ගෙනදෙන්නේ මෙවැනි යෝධ වෘක්ෂයන් ය. ඒ අතර මහ නුග (*Ficus benghalensis*),



රූපය 43. බෝ (***Ficus religiosa***) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

වල් අරළු (*Ficus mollis*) (රූපය 44), කොට දිඹුල (*Ficus hispida*), පණු නුග (*Ficus microcarpa*) (රූපය 45), අට්ටිකා (*Ficus racemosa*) (රූපය 46), නුග (*Ficus virens*) සඳහන් කළ හැකි ය. මේ අතරින් වල් අරළු ගස් බහුලව වැඩෙනුයේ ගල් කුළු හා ගල් තලා ආශ්‍රිතව ය. මිහින්තලය පෙදෙසේ වූ ගල් තලා මත වල් අරළු බහුල ය. මෙම ගසේ කඳ අළු පැහැ වන අතර ශාක පත්‍ර පළලින් යුක්ත ය. ඉහත දක්වන ලද යෝධ නුග විශේෂ සතුන්ට සෙවන සලසන අතරම බොහෝ පක්ෂීන්ට කැදලි තැනීම හා රාත්‍රිය ගතකිරීමට සුදුසු වාසස්ථාන සපයයි. ඊට අමතරව මෙහි වූ ඉදුණු ඵල පක්ෂීන් බොහෝමයකගේ ආහාරයක් වේ.



රූපය 44. වල් අරළු (*Ficus mollis*) (ඇතුළත රූපය පත්‍ර) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 45. පණු නුග (*Ficus microcarpa*) (ඇතුළත රූපය පත්‍ර) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 46. අට්ටිකා (*Ficus racemosa*) (ඇතුළත රූපය ඵල) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මල්වතු ඔය දෙපස වූ ගඟබඩ වනාන්තරවල ඉතා සුලබ ගසකි, කුඹුක් (*Terminalia arjuna*) (රූපය 47). මීට අමතරව වැව් තාවුලු කලාපයේත්, කුඹුරු අද්දර හා වගුරු ආශ්‍රිතවත් කුඹුක් ගස් බහුල ය. අනුරාධපුරය ප්‍රදේශයේ වූ වඩාත් උස් ගස් අතර ප්‍රමුඛත්වය දරන වෘක්ෂ විශේෂ කිහිපයක් අතරින් කුඹුක් ප්‍රධාන



රූපය 47. ඇළ, දොළ, ගංගා ඉවුරු හා වැව් ආශ්‍රිතව ඉතා සුලබ ගසකි කුඹුක් (*Terminalia arjuna*) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 48. මල්වතු ඔය දෙපස සහ අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව කිතුල් (*Cariota urens*) ගස් දුලබ නොවේ (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 49. කළුවැල් (*Derris parviflora*) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

වශයෙන් සඳහන් කළ හැකි ය. කිතුල් (*Caryota urens*) අනුරාධපුරයේ සුලබ නොවුවද මල්වතු ඔය දෙපස ඇතැම් තැන්හි දැකිය හැකි ය (රූපය 48). ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපයේ ගෙවතු ආශ්‍රිතවත්, සිංහරාජ, කන්එළිය, දෙදියාගල, රූනකන්ද ආදි වැසි වනාන්තර ආශ්‍රිතවත් කිතුල් ගස සුලබ ය. උගුඩුවන් හා කළවැද්දන් ආදි ක්ෂීරපායී සතුන් සහ පක්ෂී විශේෂ බොහෝමයක්ම ඉදුණු කිතුල් ඵල කෑමට ගිජු බවක් දක්වයි.

අනුරාධපුරය පෙදෙසේ වූ කැලෑවල සුලබ වැල්, පඳුරු හා ගස් විශේෂ විශාල ප්‍රමාණයක් මෙහි විස්තර කළ හැකි ය. බොකළවැල් (*Derris scandens*) හා කළවැල් (*Derris parviflora*) මෙම කලාපයේ සුලබව දැකිය හැකි වැල් විශේෂයන් ය (රූපය 49). මේ අතරින් කළවැල් ශ්‍රී ලංකාවට ආවේණික වේ. ගැමියන් විසින් මසුන් අල්ලා ගැනීම සඳහා මෙම වැල් උපයෝගී කරගනේ. මෙහිදී කළවැල් තළා දියකඩිතිවලට එක් කරන අතර එම වැල්වල වූ රසායනයන් හේතුවෙන් මසුන් මත් වී ජල පෘෂ්ඨයේ පාවේ. ඊට අමතරව ගැමියන් මෙම වැල්පටවල් හේන්වල හා ගෙවතුවල ඉනි වැට සකස් කිරීම ආදි කටයුතුවලදී කොහු ලණු වෙනුවට යොදා ගනී. නියඟලා (*Glorisa superba*) මෙම වියළි පෙදෙසේ සුලබ වැල් විශේෂයකි (රූපය 50). විෂ සහිත වන නියඟලා අල මනුෂ්‍ය ජීවිතවලට හානි ගෙනදීමට තරම් සමත් වේ. මෙහි Choline, Colcnicine සහ Calicilic acide ආදි විෂ රසායනයන් අඩංගු වීම එයට හේතු වේ. එම විෂ ශරීරගත වීම තුළින් හිරිවැටීම, මුඛය වටා රත් වෙන්නාක් මෙන් දැනීම, උගුර පිළිස්සීම, වමනය හා පාචනය වැනි ලක්ෂණ ඇති වේ. හීන් කරඹ (*Carissa spinarum*) මෙම වියළි පෙදෙසේ දැකිය හැකි කාෂ්ඨීය වැලකි. හීන් කරඹ ඵලය මිනිසුන් මෙන්ම පක්ෂීන් ද ආහාරයට ගනී. මෙම කලාපයේ වූ පඳුරු අතර බෝකෑර (*Ochna obtusata*) සාමාන්‍යයෙන් මීටර් 4 ක් පමණ උස් වේ. ඊට වඩා උස් වූ කල කුඩා ගසක් ලෙස ද සඳහන් කළ හැකි ය (රූපය 51). එහි මලෙහි පෙති කහ පැහැති වන අතර මධ්‍යය රත් පැහැති ය. මල්කෑර ඖෂධීය පැළෑටියක් ලෙස ද භාවිත වේ. කොරකහ (*Memecylon umbellatum*) වර්ණවත් නිල් පැහැති මල් පිපෙන, මීටර් 4 ක් හෝ ඊට වඩා උස් වන පඳුරක් ලෙස වැව් ඉවුරුවල සුලබව වැවේ (රූපය 52). මෙහි ඵලය ආහාරයට ගත හැකි අතර මුල් දේශීය ඖෂධ සඳහා ද යොදා ගනේ. කොරකහ ඉපල් ආධාරයෙන් සාදා ගන්නා ඉදල් කමත හා ගෙමිදුල් අතුගෑමට ගැමියන් විසින් භාවිත කෙරේ.



රූපය 50. නියඟලා (***Glorisa superba***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 51. බෝකෑර (***Ochna obtusata***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 52. කොරකහ (***Memecylon umbellatum***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

අනුරාධපුර පෙදෙසේ බොහෝ සුලබ ගසකි, කටු අන්දර (*Dichrostachys cinerea*) (රූපය 53). වැව් බැම්, ලඳු කැලෑ හා මංපෙත් දෙපස බහුලව දැකිය හැකි කටු අන්දර කුඩා පත්‍ර හා රෝස, සුදු සහ කහ පැහැයෙන් යුත් මල් දරයි. මේ ගස මීටර් 10 ක් පමණ උසැති ය. කඳෙහි සහ අතුවල කටු දරයි. මාදං (*Syzygium cumini*) මීටර් 20 ක් පමණ උස් වන අතර කුඩා කල පඳුරක් ලෙස ද, උස් වූ කල ගසක් ලෙස ද සැලකේ (රූපය 54). මෙහි දම් පැහැ ඉදුණු ඵල මිනිසුන්ගේ ප්‍රියතම පලතුරක් වන අතර බොහෝ පක්ෂීන්ගේ ද ආහාරයක් වේ. ඊට අමතරව මාදං ඖෂධීය පැලෑටියක් ලෙස ද භාවිත වේ. සුදු පැහැ ඵල හටගන්නා හීන් කටුපිල (*Flueggea leucopyrus*) ලඳු කැලෑ හා වැව් ඉවුරුවල වැවේ (රූපය 55). ඖෂධ පැළෑටියක් වන මෙම පඳුර පිළිකා මර්දනයට සුදුසු යැයි විශ්වාසයක් ඇති නිසා තම්බා බීමට ගනියි. ඇත් තෝර (*Cassia alata*) බහුලවම දැකගත හැක්කේ යම් පමණකට දිය සීරාව ඇති වැව් හා පොකුණු ඉවුරුවල මෙන්ම, වගුරු ආශ්‍රිතව ය (රූපය 56). වසර පුරාම පාහේ කහ පැහැති මල් දරන ඇත් තෝර ඇතැම් සමනල පිළවුන්ගේ පෝෂක ශාකය ද වේ. අඬනහිරියා (*Crotalaria* sp.) වැව් ඉවුරු අසල බොහෝ සුලබ ශාකයකි (රූපය 57). ඊට අමතරව ලඳු කැලෑ හා මංපෙත් දෙපස ද ඉතා බහුලව දැකගත හැකි ය. කහ සහ තැඹිලි පැහැයට හුරු මල් හටගන්නා අතර ඉන් අනතුරුව සිලින්ඩරාකාර හැඩයකින් යුතුව පහතට යොමුව ඇති කරල් පොකුරු වශයෙන් හටගනියි. අනුරාධපුරය ප්‍රදේශයේ සුලබව දැකිය හැකි මීටර් 10 ක් පමණ උස් වන තවත් ශාක විශේෂයකි, ගං සූරිය (*Thespesia populnea*) (රූපය 58). කහ පැහැති මල් දරන මෙම ශාකයේ පත්‍ර දළ වශයෙන් හදවතක හැඩය ගනියි. මෙම ගසේ කොටස් ඖෂධීය වටිනාකමකින් යුක්ත ය. වෙලංගිරිය (*Capparis zeylanica*) මීටර් 2 ක් පමණ උස් වන පඳුරකි (රූපය 59). මෙම කලාපයේ වූ ලඳු කැලෑ හා මහ කැලෑ ආශ්‍රිතව වැවේ. මල් සුදු සහ කහ පැහැ වන අතර පරවීමේදී වයලට් වර්ණයෙන් යුක්ත වේ. පූර්ණ ශාකය දේශීය ඖෂධ සඳහා යොදා ගනියි. වෙලංගිරිය ඵලය පලතුරක් ලෙස ද ආහාරයට ගත හැකි ය. තම්මැන්න (*Mischodon zeylanicus*) මීටර් 15 ක් පමණ



රූපය 53. කටු අන්දර (***Dichrostachys cinerea***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 54. මාදං (***Syzygium cumini***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 55. හීන් කටුපිල (***Flueggea leucopyrus***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

උසැති ගසකි (රූපය 60). ගස කුඩා කල පඳුරක් ලෙස ද සැලකිය හැකි ය. ළා කහ පැහැයට හුරු කොළ පැහැති හෝ රෝස පැහැති මල් හටගනියි. දලු රත් පැහැති ය. මිහින්තලය හා රිටිගල ආදි ගල් පර්වත සමඟ වූ වනාන්තර කලාපවල තම්මැන්න බහුලව දැකිය හැකි ය. වෙලං (*Pterospermum suberifolium*) මීටර් 25 ක් පමණ උස් වන දැවැන්ත ගසකි (රූපය 61). කහ පැහැයට හුරු සුදු පැහැති මල් හටගනියි. එහි ඵල ආවරණය ඝනකමින් යුක්ත අතර ඒවා දඬුලේනුන්ගේ ආහාරයක් ද වේ. මෙම ගසේ කොටස් දේශීය ඖෂධ සඳහා යොදා ගැනේ. පුවඟු (*Aglaia elaeagnoidea*) මීටර් 10 ක්



රූපය 56. ඇත් තෝර (***Cassia alata***) (ඇතුළත රූපය මල්) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

පමණ උසැති අනුරාධපුර කලාපයේ සුලබ ගසකි (රූපය 62). මල් කහ පැහැයෙන් ද, ඵලය ළා තැඹිලි පැහැයෙන් ද යුක්ත ය. මෙම ශාකයේ බොහෝ කොටස් දේශීය වෙදකමට යොදා ගැනේ. පුවඟු ගස් විශේෂයෙන් පූජා නගරය ආශ්‍රිතව පහසුවෙන් දැකබලාගත හැකි ය. ලඳු කැලෑ ආශ්‍රිතව සුලබ ගසක් ලෙස කහකෝන (*Cassia spectabilis*) හැඳින්විය හැකි ය (රූපය 63). කහකෝන වර්ණවත් කහ පැහැති මල් දරන ශාකයකි. මෙරටට හඳුන්වාදුන් ශාකයක් ලෙස පිළිගැනේ. ඌරුකොස්ස (*Xanthium indicum*) වැව් ඉවුරුවල වඩාත් සුලබ පැළෑටියකි (රූපය 64). මීටරයක් පමණ උසැති මෙම පඳුරුවල හටගන්නා බීජ කෙඳි දරන නිසා ගවයන් සහ එළුවන් ආදි සතුන්ගේ ලොම්වලත්, මිනිසුන්ගේ ඇඳුම්වලත් ඇලීමෙන්



රූපය 57. අඬනහිරියා (***Crotalaria* sp.**) (ඇතුළත රූපය මල්) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 58. ගං සූරිය (***Thespesia populnea***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 59. වෙලංගිරිය (*Capparis zeylanica*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 60. තම්මැන්න (*Mischodon zeylanicus*) මල් සහ දලු (ඡායාරූපය: විමුක්ති වීරතුංග හා සම්පත් ගුණතිලක)



රූපය 61. වෙලං (*Pterospermum suberifolium*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 62. පුවඟු (*Aglaia elaeagnoidea*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 63. කහකෝන (*Cassia spectabilis*) (ඇතුළත රූපය මල්) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 64. ඌරුකොස්ස (*Xanthium indicum*) (ඇතුළත රූපය මල්) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

පැළෑටියේ බීජ ව්‍යාප්තිය සිදුවේ. වැව් ඉවුරුවල වැවේ. එබැවින් මෝසම් සමයේ වැව් ජලයෙන් පිරීයාමත් සමඟ ඌරුකොස්ස පඳුරු මුලුමනින්ම පාහේ ජලයෙන් යට වේ. එසේ වුවද ඉන් අනතුරුව එළඹෙන වියළි සමයේදී වැව් ජල මට්ටම පහත බැසීමත් සමඟ නැවතත් මෙම පැළෑටි දලුලා වැඩේ. වල් කෝපි (*Psilanthus wightianus*) මෙම වියළි පරිසරයේ සුලබ නොවුව ද මිහින්තලය හා රිටිගල

ආශ්‍රිත කැලෑ පෙදෙස්වලින් වාර්තා වේ (රූපය 65). සුදු පැහැති මල් බොහෝ සේ හටගන්නා බැවින් වල් කෝපි ලඳු කැලෑවලට හා වනයට බොහෝ විචිත්‍රත්වයක් එක් කරයි.




රූපය 65. වල් කෝපි (***Psilanthus wightianus***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 66. මයිල (***Bauhinia racemosa***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

මෙහි වූ මෝසම් වනාන්තරවල නොවරදින ස්ථිර පදිංචිකරුවන් ලෙස සැලකිය හැකි ගස් බොහෝ ය. ඒ අතරින් මයිල (*Bauhinia racemosa*) මීටර් 4 ක් පමණ උස්වන ගසකි (රූපය 66). මෙය මේ කලාපයේ වූ ලඳු කැලෑ අතර ඉතා සුලබ ගසක් ලෙස හැඳින්විය හැකි ය. කහ පැහැයට හුරු සුදු පැහැ මල් හටගනී. කහ පෙතන් (*Bauhinia tomentosa*) හා කොබෝ ලීල (*Bauhinia variegata*) ද මීටර් 4 ක් පමණ උස් වන මයිල කුලයටම අයත් මෙහි සුලබ ගස් වේ (රූපය 67). කොබෝ ලීල මෙරටට හඳුන්වා දුන් ශාකයකි. එය බහුලවම දැකිය හැක්කේ මානව වාසස්ථාන අසල ය. රණවරා (*Cassia auriculata*) මීටර් 3 ක් පමණ උසැති පඳුරකි (රූපය 68). වර්ණවත් කහ පැහැයෙන් යුත් රණවරා මල් වසර පුරාම පාහේ දැකිය හැකි ය. වියළාගත් රණවරා මල් තම්බා බීමට ගන්නා අතර ගසේ ඇතැම් කොටස් දේශීය ඖෂධ සඳහා ද යොදා ගනියි. අනුරාධපුරය පූජා නගරය හා මිහින්තලය ආශ්‍රිතව ඉතා සුලබ රණවරා ගස් ඊට පරිබාහිර කලාපයන්හි ද බොහෝ සෙයින් දැකිය හැකි ය. රණවරා ගණයටම අයත් ඇහැළ (*Cassia fistula*)



රූපය 67. කහ පෙනන් (***Bauhinia tomentosa***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

මීටර් 15 ක් පමණ උසැති ගසකි (රූපය 69). වසරේ වැඩි කාලයක් දැකිය හැකි ඇහැළ මල් රන්වන් කහ පැහැයෙන් යුක්ත ය. රතු වා (*Cassia roxburghii*) මීටර් 5 සිට මීටර් 20 දක්වා උසැති ගසක් ලෙස හැඳින්විය හැකි ය. ඉහත දක්වන ලද ඇහැළ හා රතු වා අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව ඉතා සුලබ ය.

මෙම පරිසරයෙන් වාර්තා වන අනෙකුත් ගස් අතර දිවුල් (*Limonia acidissima*) (රූපය 70), කොහොඹ (*Azadirachta indica*) (රූපය 71), කොට්ටම්බ (*Terminalia catappa*), අන්දර (*Pithcellobium dulce*), මී (*Madhuca longifolia*) (රූපය 72), කෝන් (*Schleichera oleosa*) (රූපය 73), මොර (*Dimocarpus longan*), වල් මොර (*Glenniea unijuga*), පළු (*Manilkara hexandra*) (රූපය 74), වීර (*Drypetes sepiaria*) (රූපය 75), සියඹලා (*Tamarinbus indica*) (රූපය 76), කිරිකෝන් (*Walsura trifoliolata*) (රූපය 77), මඩු (*Cycas nathorstii*) (රූපය 78) ආදි ගස් විශේෂයෙන්ම දැක්විය හැකි ය. මේ අතරින් වල් මොර ශ්‍රී ලංකාවට ආවේණික විශේෂයක් වේ. තල් (*Borassus flabellifer*) ගස අනුරාධපුරයට වියළි කලාපීය පෙනුම ලබාදෙන ඉතා සුලබ ගසකි (රූපය 79). මීටර් 20 ක් පමණ උස්ව වැඩෙන තල් ගස බොහෝවිට දැකිය හැක්කේ වඩාත්ම වියළි බිම් පෙදෙස්වල ය. ඉදුණු තල් ගෙඩි යුෂයෙන් ගැමියෝ ප්‍රණීත පානයන් සකස් කර ගනිති. එම ගෙඩි හැළි වඳුරන්ගේ හා රිළවුන්ගේ ආහාරයේ කොටසක් ද වේ. ඊට අමතරව ඉදුණු තල් ගෙඩි කෑමට අලි ඇතුන් බොහෝ ප්‍රිය කරති (සම්පත් ගුණතිලක හා නලින්ද පීරිස් සමඟ කළ සාකච්ඡා ඇසුරෙනි, 2013). ගැමියෝ තල් ගසේ බඩයෙන් පිටි ද, ළපටි තල් පැළවලින් කොට්ටකිලංගු ද, තල් මලෙන් රා ද නිපදවා ගනිති. ඊට අමතරව තල් රා මඟින් හකුරු ද, වියළා සකස් කරගන්නා ලද තල් කොළවලින් වට්ටි, පෙට්ටි ආදිය ද ගැමියන් විසින් තනාගැනේ. ඉඳි (*Phoenix pusilla*) අනුරාධපුර ආශ්‍රිත කලාපයේ වඩාත් සුලබ නොවුව ද කුඹුරු අද්දර හා ලඳු කැලෑවල දැකිය හැකි තාල වර්ගයේ ගසකි (රූපය 80). වැව් බැම්මට ඔබ්බෙන් වූ කට්ටකාඩුව ලෙස හඳුන්වනු ලබන කලාපයේ ඉඳි බොහෝ විට දැකිය හැකි ය. ඉඳි ඵල ආහාරයට ගත හැකි අතර ඒවා දේශීය ඖෂධ සඳහා ද උපයෝගී කරගනේ. ගැමියෝ ඉඳි කොළ මඟින් තොප්පි සහ එදිනෙදා අවශ්‍යතා සඳහා පැදුරු මෙන්ම කුඩා බහාලන ද වියා ගනිති.



රූපය 68. රණවරා (***Cassia auriculata***)
(ඡායාරූපය: සම්පත් ගුණතිලක)

රූපය 69. ඇහැළ (***Cassia fistula***) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය. 70. දිවුල් (***Limonia acidissima***) ගස සහ ඵලය (ඡායාරූප: විමුක්ති වීරතුංග, කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 71. කොහොඹ (***Azadirachta indica***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 72. මී (*Madhuca longifolia*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 73. කෝන් (*Schleichera oleosa*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 74. පළු (*Manilkara hexandra*) ගස සහ ඵල
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි, විමුක්ති විරතුංග)

රූපය 75. වීර (*Drypetes sepiari*) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 76. සියඹලා (*Tamarindus indica*) ගස සහ ඵල
(ඡායාරූප: කැලුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 77. කිරිකෝන් (*Walsura trifoliolata*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 78. මඩු (*Cycas nathorstii*) ගස සහ ඵලය (ඡායාරූප: විමුක්ති වීරතුංග සහ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 79. තල් (***Borassus flabellifer***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 80. ඉඳි (***Phoenix pusilla***) ගස සහ ඵල
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

වඩාත් සුලබ නොවුව ද අනුරාධපුරයේ වූ වියළි වනාන්තර අතර කළුවර (*Diospyros ebenum*) (රූපය 81), කළු හබරලිය (*Diospyros ferrea*) (රූපය 82), කළු වැල්ල (*Diospyros racemosa*), කුණුමැල්ල (*Diospyros ovalifolia*), තිඹිරි (*Diospyros malabarica*) (රූපය 83) හා එළ තිඹිරි හෙවත් කළු කඩුකම්බේරිය (*Diospyros oocarpa*) (රූපය 84) දැකිය හැකි ය. තිඹිරි මීටර් 14 ක් පමණ උසැති කහ පැහැති මල් හටගන්නා ගසකි. මෝසම් වනාන්තරවල වියන දක්වා වැඩෙන මෙම ගසෙහි පත්‍ර කෙළවර සිහින් හා දිගු තුඩකින් යුක්ත ය. එළ තිඹිරි හෙවත් කළු කඩුකම්බේරිය ද මීටර් 30 ක් පමණ උස් වන, වනයේ වියන ස්ථරය දක්වා දිවෙන ගසකි. කහ පැහැයට හුරු මල් හටගන්නා අතර ඵලය කළු පැහැයට හුරු ය. මිහින්තලය ආශ්‍රිත කලාපයේ විශාල වනාන්තර ආශ්‍රිතව ද එළ තිඹිරි ගස් දැකගත හැකි ය. මේ අතරින් කළුවර අනෙකුත් විශේෂයන්ට වඩා තරමක් දුර්ලභ ය.



රූපය 81. කළුවර (***Diospyros ebenum***) ගස සහ මල්
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 82. කළු හබරලිය (***Diospyros ferrea***)
(ඡායාරූපය: සම්පත් ගුණතිලක)







රූපය 83. තිඹිරි (*Diospyros malabarica*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 84. එළ තිඹිරි හෙවත් කළු කුඩුකම්බෙරිය (*Diospyros oocarpa*) ගස සහ දලු
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)







රූපය 85. ගොඩ කදුරු (*Strychnos nux-vomica*) ගස, ළා දලු සහ ඵල (ඡායාරූප: සම්පත් ගුණතිලක, කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ගල් සියඹලා (*Dialium ovoideum*), හුළං හික් (*Chukrasia tabularis*), කටු නෙළු (*Barleria mysorensis*) ආදි ගස් බොහෝවිට රක්ෂිත කලාපවලට සීමා වී ඇත. මේ අතරින් ගල් සියඹලා ශ්‍රී ලංකාවට ආවේණික විශේෂයකි.

ගොඩ කදුරු (*Strychnos nux-vomica*) මෙම කලාපයේ වූ ශාක ප්‍රජාවේ සුලබ වේ (රූපය 85). මීටර් 20 ක් පමණ උසට වැඩේ. ඵලය තැඹිලි පැහැති ය. බීජ අධික තිත්ත රසයකින් යුක්ත ය. බීජවල Strychnine සහ Brucine අඩංගු වන නිසා විෂ සහිත ය. එම විෂ ශරීරගත වීමෙන් ගෙලේ මස් පිඬු පෙරළීම ආදි රෝග ලක්ෂණ ඇති වේ. ඉඟිනි (*Strychnos potatorum*) අනුරාධපුරය ආශ්‍රිතව දැකිය හැකි විශාල ගසකි. එහි බීජ ගලගා පානීය ජලයට හෝ ළිංවලට එක්කිරීම ගැමියන්ගේ පුරුද්දකි. ඉන් ජලය වඩාත් පැහැදිලි වන බව ඔවුන්ගේ විශ්වාසයකි. ඊට අමතරව ඉඟිනි බීජ දේශීය වෙදකම සඳහා ද යොදාගනියි.




රූපය 86. මිල්ල (***Vitex altissima***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

මිල්ල (*Vitex altissima*) (රූපය 86), බුරුත (*Chloroxylon swietenia*), හල්මිල්ල (*Berrya cordifolia*), රුක්අත්තන (*Alstoniascholaris*), නා (*Mesua ferrea*), වල් ඉද්ද (*Walidda antidysenterica*), මකුළු (*Hydnocarpus venenata*), එළමිදෙල්ල (*Barringtonia acutangula*), ඇටඹ (*Mangifera zeylanica*) ආදිය අනුරාධපුරය ආශ්‍රිතව පැතිර ඇති මෝසම් වනාන්තරවල නිශ්චිතවම දැකිය හැකි වෘක්ෂයන් වේ. මේ අතරින් ඇටඹ, මකුළු හා වල් ඉද්ද අප රටට ආවේණික විශේෂයන් ය. මකුළු බීජ හා එළමිදෙල්ල ගෙඩි හා පොතු තළා ඇළ දොළවලට දැමීමෙන් මාළුන් විෂ කවා අල්ලා ගැනීම ගැමියන්ගේ පුරුද්දකි. ඇටඹ තෙත් කලාපීය වැසි වනාන්තරවල සුලබ විශේෂයක් වන අතර එය අන්තර් කලාපයේ ඇතැම් පෙදෙස්වල ද පැතිර ඇත. ඇටඹ ඵලය ගැමියන්ගේ හා බොහෝ වනගත ක්ෂීරපායීන්ගේ ප්‍රණීත ආහාරයකි.

අනුරාධපුරයේ වූ ශාක ප්‍රජාවේ හඳුන්වාදුන් ගස් බොහෝ වේ. මේ අතරින් පාර මාර (*Samanea saman*) මඟ දෙපස වවා ඇත්තේ විශේෂයෙන්ම සෙවන සැලසීමේ අරමුණෙනි. තේක්ක (*Tectona grandis*) ආදි ගස් දැවමය අවශ්‍යතාවයන් සඳහා ද, මීට අමතරව ඉපිල් ඉපිල් (*Leucaena leucocephala*) සත්ත්ව ආහාරයක් ලෙස ද, අඹ (*Mangifera indica*), කොස් (*Artocarpus heterophyllus*), මුරුංගා (*Moringa oleifera*), කතුරු මුරුංගා (*Sesbania grandiflora*) ආදි ගස් මිනිසුන්ගේ ආහාර අවශ්‍යතාවයන්



රූපය 87. කනේරු (***Thevetia peruviana***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 88. වතුසුද්ද (***Tabernaemontana divaricata***)
(ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සඳහා ද හඳුන්වා දී ඇත. අනුරාධපුර පරිසරය අලංකාර කරන විචිත්‍ර වර්ණ හා වර්ණ රටා සහිත මල් පිපෙන ගස් අතර මැයි (*Delonix regia*), කනේරු (*Thevetia peruviana*) (රූපය 87), වතුසුද්ද (*Tabernaemontana divaricata*) (රූපය 88), සුදු අරලිය (*Plumeria obtusa*) (රූපය 89), අරලිය (*Plumeria rubra*) මෙහිලා සඳහන් කළ හැකි ය. මේ අතරින් කහ කනේරු ශාකයේ Cardiac glycoside Thevetin හා Cerebin ආදි විෂ අඩංගු වේ. මෙම විෂ ශරීරගත වීමෙන් වමනය, පාචනය, බඩරුදාව හා කරකැවිල්ල ඇති වේ. මේ ගස් බොහෝමයක් අනුරාධපුර ප්‍රදේශය පුරා විසිරී ඇති බෞද්ධ නටබුන් හා සිද්ධස්ථාන ආශ්‍රිත පරිසරය අලංකාර කරයි (රූපය 90).



රූපය 89. සුදු අරලිය (***Plumeria obtusa***) ගස සහ මල් (ඡායාරූපඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 90. අනුරාධපුර පුරාණ නටබුන් ආශ්‍රිත භූ දර්ශනයේ සුලබ ගසක් ලෙස සුදු අරලිය (*Plumeria obtusa*) හැඳින්විය හැකි ය. අරලිය මෙරටට විදේශීයව හඳුන්වාදුන් ශාකයක් වුවද අද වන විට එය ලාංකිකයින්ට බෙහෙවින් සමීප වෘක්ෂයක් ලෙස හැඳින්වීම නිවැරදි ය. මෙහි දිස්වනුයේ මිහින්තලයේ කළුගලින් නිර්මිත දිගු පියගැට පෙළයි. මෙම පියගැට පෙළන්, ඊට දෙපසින් වූ සුදු අරලිය ගසින් සැදි භූමි දර්ශනයත් මෙහි වන්දනා කරන බැතිමතුන්ගේ මනකයේ සදා රැඳී පවතිනු ඇත. (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මීටර් 30 ක් පමණ උසට වැඩෙන සල් (*Couroupita guianensis*) අනුරාධපුර පෙදෙසේ බෞද්ධ සිද්ධස්ථානවලත්, ගෙවතු හා මඟ දෙපසත් බොහෝ විට දැකිය හැකි ය (රූපය 91). මෙය දකුණු ඇමරිකාවෙන් මෙරටට හඳුන්වාදුන් ගසකි. සුදු හා රෝස පැහැයෙන් යුක්ත සල් මල සංකීර්ණ හැඩයකින් යුක්ත ය. පත්‍ර දිගටි හැඩැති ය. දුඹුරු පැහැයෙන් යුත් සල් ගෙඩි විශාල, වටකුරු හැඩයෙන් යුක්ත වේ. සල් ගෙඩි පුරාණ කාලතුවක්කු උණ්ඩ හැඩැති නිසා ඉංග්‍රීසි බසින් මෙම ගස හඳුන්වනු ලබන්නේ Cannon ball tree යනුවෙනි. සල් ගස වර්තමානයේ ශ්‍රී ලංකාවේ පහතරට පෙදෙසේ බහුලව ව්‍යාප්තව ඇති අතර බොහෝ බෞද්ධ සිද්ධස්ථානවල ද ඉතා සුලබ ය. බුද්ධ චරිතය හා සබැඳි කතාවන්ට අනුව මහාමායා දේවිය සිදුහත් කුමරුන් බිහිකරනුයේ උතුරු ඉන්දියාවේ වූ සල් වනයක ය. මේ නිසා ශ්‍රී ලාංකේය බෞද්ධයන් සල් ගසට වැඳුම් පිදුම් කිරීමට පෙළඹී ඇත. එමෙන්ම මෑත කාලයේ අඳින ලද විහාර සිතුවම්වල ද මහාමායා දේවිය සිදුහත් කුමරුන් බිහිකරන දර්ශනයෙහි පසුබිමේ මෙම හඳුන්වාදුන් සල් ගස චිත්‍රයට නඟා ඇත. නමුත් සිදුහත් කුමාරොත්පත්ති කතා පුවතට අයත් වනුයේ දකුණු ඇමරිකානු සල් ගස නොවේ. එය ශ්‍රී ලංකාවේ හොර කුලයට අයත් (Dipterocarpaceae) ගසක් වන ඉන්දියාවේ හා නේපාලයේ ව්‍යාප්තව ඇති එරට වැසියන් 'සාලා' හෝ 'ශාලා' යනුවෙන් හඳුන්වනු ලබන, උද්භිද



රූපය 91. සල් (*Couroupita guianensis*)
(ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

විද්‍යාත්මකව *Shorea robusta* නමැති ගස් විශේෂයයි. එම ගස් ශීත හා වියළි පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙන අතර එක් යායට විශාල පෙදෙසක් පුරා පැතිර පවතී. දකුණු ඇමරිකානු සල් ගස ශ්‍රී ලංකාවටත්, ආසියාවටත් හඳුන්වාදෙනු ලැබුයේ දළ වශයෙන් මීට අවුරුදු 500 කට පමණ පෙර යුරෝපීයයන් විසිනි. එබැවින් එම ගස සිදුහත් කුමාරොත්පත්තියට සම්බන්ධ කොට වැඳුම් පිදුම් කිරීම ශ්‍රී ලාංකේය බෞද්ධයින්ගේ වැරදි වැටහීමක් බව මෙහිදී දක්වනු කැමැත්තෙමු.



රූපය 92. මිහින්තලය කළුදිය පොකුණ (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 93. කිරලාගල, හොරොව්පොතාන (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 94. තන්තිරිමලේ (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 95. ගඟබඩ වනාන්තර. මල්වතු ඔය, අළුත්ගම (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අනුරාධපුරය, මිහින්තලය (රූපය 92), කිරලාගල (රූපය 93), තන්තිරිමලේ (රූපය 94), හොරොව්පතාන ඇතුළු ඓතිහාසික යුගයට අයත් නටබුන් සහ මානව ජනාවාස ආශ්‍රිතව කොහොඹ, දිවුල් හා රණවරා යන ගස් විශේෂ සුලභව දැකිය හැකි ය. මෙම විශේෂ මහා වනාන්තර මැද නටබුන් වූ මානව ජනාවාසවල පවා එක ලෙස පිහිටයි. මේ ගස් පුරාණ මානව ජනාවාසයක් පැවති බවට දර්ශක විශේෂයන් ලෙස දැක්වීමට හැකි පමණටම නටබුන් අතර ව්‍යාප්තව ඇත (සම්පත් ගුණතිලක සමඟ කළ සාකච්ඡා ඇසුරෙනි, 2013).

ගඟබඩ ශාක ප්‍රජාවේ අනිවාර්ය ගස් අතර කුඹුක්, තිඹිරි, මකුළු, මී, ඇටඹ, මාදං, එළ මිදෙල්ල ආදි විශේෂ සඳහන් කළ හැකි ය (රූපය 95). මෙම ගස් බොහෝ උසින් යුතුව වර්ධනය වී ගඟට මනා ආවරණයක් ද ගෙන දේ. මල්වතු ඔයේ


බොහෝ ස්ථානවල මෙම ගස් විශේෂ එක්ව පවතින අවස්ථා පහසුවෙන් දැකගත හැකි ය (නලින්ද පීරිස් සමඟ කළ සාකච්ඡා ඇසුරෙනි, 2013).

අනුරාධපුරය ඇතුළු මෙම සමස්ත කලාපයේ භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණයකි විශාල පර්වත, කළුගල් සහ ගල් තලා පිහිටීම. මෙම ගල් ආශ්‍රිත පරිසරය බොහෝ දුරට වියළි පාරිසරික තත්ත්වයක් දරයි. ඒ හා බැඳුණු ශුෂ්කරූපී ලක්ෂණ දරන ශාක ද බොහෝ ය. මෙම ශුෂ්කරූපී පරිසරයන්ට මනා උදාහරණ ලෙස තන්තිරිමලය රජ මහා විහාර පරිශ්‍රය ආශ්‍රිත ගල් තලාවත් (රූපය 96), මිහින්තලයේ නයිපෙණ පොකුණට ඉහළින් පිහිටි ගල් තලාවත් විශේෂයෙන් සඳහන් කළ හැකි ය (රූපය 97). වසරේ වැඩි කාලයක් පවතින අධික ශුෂ්ක තත්ත්වයන් හේතු කොටගෙන එම පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන දළුක් (*Euphorbia antiquerum*) (රූපය 98) සහ පතොක් (*Cereus peruvianus*) (රූපය 99) ආදි ශුෂ්ක ශාක වැඩිවශයෙන් මෙම ගල් තලා ආශ්‍රිතව වැවේ. කටු පතොක් *(Opuntia monacantha)* මෙරටට විදේශීයව හඳුන්වා දුන් ශුෂ්කරූපී ලක්ෂණ දරන ශාකයකි (රූපය 100). ජලයට ආසන්න පරිසරවල මෙන්ම ගල් තලාවල ද පඳුරු වශයෙන් වැවේ. බොල්හිඳ (*Cyanotis* sp.) ගණකමැති මාංශලමය පත්‍ර දරන පොළොවේ ඇලී වැඩෙන කුඩා වැලකි (රූපය 101). බොල්හිඳ බොහෝ විට දැකිය හැක්කේ වියළි ගල් තලා මත අනෙකුත් ශුෂ්කරූපී ශාක සමගිනි. අනුරාධපුර පෙදෙසේ වූ බොහෝ ගල් තලා මත බොල්හිඳ ඉතා සුලබ ය. හීරැස්ස (*Cissus quadrangularis*) ශුෂ්කරූපී ලක්ෂණ දරන ඖෂධීය පැළැටියකි. එය



රූපය 96. තන්තිරිමලේ ගල් තලා මත වූ ශුෂ්කරූපී පරිසරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

රූපය 97. මිහින්තලේ නයිපෙණ පොකුණට ඉහළින් පිහිටි ගල් තලාවේ වූ ශුෂ්ක පරිසරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 98. දළුක් (*Euphorbia antiquerum*) ගස සහ දළු
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 99. පතොක් (*Cereus peruvianus*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 100. කටු පතොක් (*Opuntia monacantha*) ගස සහ මල (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි, මාධව මීගස්කුඹුර)



රූපය 101. බොල්හිඳ (*Cyanotis sp.*) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



ගල් තලාවල, දළුක් පඳුරු මත මෙන්ම ලඳු කැලෑ ආශ්‍රිතව ද දැකිය හැකි ය. එහි දණ්ඩ දළ වශයෙන් චතුරස්‍රාකාර හැඩයක් ගන්නා අතර බෙහෙවින් මාංශලමය ස්වරූපයක් දරයි. පත්‍ර හදවතක හැඩැති ය. එහි ඵල ක්‍රිම්සන් හා කොළ පැහැයෙන් යුක්ත ය (රූපය 102).

මෙම කලාපයේ රළු කඳන් සහිත විශාල ගස් ඇති බැවින් ඒ මත වැවෙන අපිශාක (Epiphytes) බොහෝ ය. එම අපිශාක අතර උඩවැඩියා විශේෂයන් කිහිපයකි. වියළි පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙන මෙම උඩවැඩියා වීර, පළු, කෝං, මී, පාර මාර ආදි ගස් මත විශාල වශයෙන් වැඩී ඇත. මෙහි වූ උඩවැඩියා අතර අනුරාධපුර ඕකිඩ් (*Vanda tessellata*) විශේෂයෙන් සඳහන් කළ හැකි ය (රූපය 103) (Fernando *et al.*, 2003). දුඹුරු සුදු සහ නිල් පැහැයෙන් වර්ණවත් වන මේ උඩවැඩියා මල වියළි පරිසරයේ වූ ගස් මත පිහිටි කැපී පෙනෙන පැළැටියක් ලෙස සඳහන් කළ හැකි ය.

රූපය 102. හීරස්ස (*Cissus quadrangularis*) වැල සහ ඵල
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 103. අනුරාධපුර ඕකිඩ් (*Vanda tessellata*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 104. අගමුල නැති වැල (*Cuscuta* sp.) සහ මල්
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 105. ගස් බැවිල (*Sida acuta*) පැළෑටිය සහ මල
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අනුරාධපුර ප්‍රදේශයේ දැකිය හැකි අනෙකුත් අපිශාක අතර පර්ණාංගවලට ද විශේෂ තැනක් හිමි වේ. ඊට අමතරව පඳුරු මත වැඩෙන පරපෝෂී අගමුල නැති වැල (*Cuscuta* sp.) මඟ දෙපස හා කුඹුරු අද්දර සුලබව දැකිය හැකි ය (රූපය 104). කහ පැහැයට හුරු මෙම වැලෙහි කුඩා සුදු පැහැති මල් හටගනියි.

අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා මහා වනාන්තරවල, ගොවි බිම්වල, ගෙවතු ආශ්‍රිතව සහ මග දෙපස පුළුල් විවිධත්වයකින් යුත් වන පැළෑටි විශේෂ රාශියක් දැකිය හැකි ය. මේවායින් රැසක්ම දේශීය ශාක වන අතර ඒවා දේශීය වෙදකම සඳහා ද යොදා ගැනේ. සිත් ගන්නාසුලු පුෂ්ප සහ ඵල හටගන්නා මේ පැළෑටි කුඩා පඳුරු හෝ වැල් වශයෙන් පිහිටයි. මේවායින් රැසක්ම විදේශයන්ගෙන් ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් පැළෑටි ලෙස උද්භිද විද්‍යාඥයින් විසින් ප්‍රකාශ කොට තිබුණ ද ඇතැම් විශේෂ පිළිබඳව සලකා බැලූ කල ඔවුන්ගේ මතය

වනුයේ ඒවා බොහෝ විට දේශීය පැළැටි වන්නට ඉඩ ඇති බව ය. පහත විස්තර කෙරෙනුයේ එම සමස්ත වන පැළැටිවලින් නෝරාගත් කිහිපයක් පමණි.



රූපය 106. *Peperomia pellucida*
(ඡායාරූපය: කැපී මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 107. *Rivina humilis* (ඡායාරූපය:
කැපී මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 108. නිදිකුම්බා (*Mimosa pudica*)
(ඡායාරූපය: කැපී මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 109. වැල් නිදිකුම්බා (*Mimosa invisa*)
(ඡායාරූපය: කැපී මනමේන්ද්‍ර-ආරච්චි)

ගස් බැවිල (*Sida acuta*) ළා කහ පැහැති පුෂ්පයන් හා දැති සහිත දිගටි පත්‍ර දරන ඖෂධීය ගුණයකින් යුත් පැළෑටියකි (රූපය 105). හදවතක හැඩැති කුඩා මාංශලමය පත්‍ර හා බීජ සමූහයක් සහිත දිගටි ඵල දරන *Peperomia pellucida* යනුවෙන් විද්‍යාත්මකව හඳුන්වන පැළෑටිය තෙතමනය ඇති තුරු සෙවනේ වැඩේ (රූපය 106). එළිමහන් ස්ථානවල පඳුරු ලෙස වැවෙන අඩි දෙකක් පමණ උස් වූ උද්භිද විද්‍යාත්මකව *Rivina humilis* යනුවෙන් හඳුන්වනු ලබන වන පැළෑටියේ තැඹිලි සහ රත් පැහැයෙන් යුත් කුඩා ඵල පොකුරු වශයෙන් දැකිය හැකි ය (රූපය 107). මෙම පැළෑටි මග දෙපස ඉතා සුලබ ය. ලඳු කැලෑ හා තෘණ බිම් අතර ඉතා සුලබව වැවෙන වන වැල් විශේෂයකි, නිදිකුම්බා (*Mimosa pudica*) (රූපය 108). මෙම වැලෙහි කුඩා කටු දරන අතර එහි පුෂ්පය රෝස පැහැයෙන් යුක්ත ය. මංපෙත් හා මාර්ග දෙපස ඉතා සුලබ වේ. නිදිකුම්බා මෙන්ම වැල් නිදිකුම්බා ද (*Mimosa invisa*) මෙරටට හඳුන්වාදුන් ආක්‍රමණශීලී වැල් විශේෂයකි. වැල් නිදිකුම්බා කුඹුරු ආසන්නයේ හා ලඳු කැලෑවල වැවෙන අතර එය මීටරයක් පමණ උස්ව පැතිරේ. පත්‍ර වඩාත් ළා කොළ පැහැති ය. පුෂ්ප ළා රෝස සහ රත් පැහැයෙන් යුක්ත වේ (රූපය 109).

හීන් ඇපල (*Urena sinuata*) ලා රෝස පැහැති පුෂ්පයන්ගෙන් යුත් බෙදුණු පත්‍ර ඇති කුඩා පඳුරකි (රූපය 110). කුඹුරු අද්දර පිහිටි තෙත් ඇළ කණ්ඩිවලත්, මග දෙපසත් දැකිය හැකි ය. ගැටතුඹ (*Leucas zeylanica*) සිහින්, දිගු තුඩැති පත්‍ර දරන සුදු පැහැති මල් හටගන්නා වන පැළෑටියකි (රූපය 111). ගැටතුඹ ගැමියෝ ඖෂධ පැළෑටියක් ලෙස භාවිත කරති. ගස් තලා (*Ocimum gratissimum*) ද මදුරු තලා මෙන් සුවඳක් වහනය වන පැළෑටියකි (රූපය 112). එහි නටුවක බීජ විශාල වශයෙන් පිහිටයි. මග දෙපස සුලබව දැකිය හැකි ය. ඒකාවේරිය (*Rauvolfia serpentina*) ශාකයට බොහෝ සමාන උද්භිද විද්‍යාත්මකව *Rauvolfia tetraphylla* නමින් හැඳින්වෙන රත් පැහැයට හුරු ඵල දරන මෙම පඳුර ඖෂධීය ගුණයකින් යුක්ත ය (රූපය 113). ඉහත විස්තර කරන ලද වන පැළෑටි මෙන් සුලබ නොවුව ද මෙම පඳුරු ලඳු කැලෑ ආශ්‍රිතව දැකිය හැකි ය.

තිත්බටු (*Solanum violaceum*) මෙම වියළි පෙදෙසේ ලඳු කැලෑ හා මග දෙපස සුලබ ය (රූපය 114). මීටර 1 ක් හෝ 1 1/2 පමණ උස්ව වැඩෙන තිත්බටු පඳුරෙහි ඵල පොකුරු වශයෙන් හටගන්නා අතර මල සුදු සහ කහ පැහැයෙන් යුක්ත ය. තිත්බටු ගැමියන්ගේ ප්‍රණීත ආහාරයකි. උද්භිද විද්‍යාත්මකව *Solanum seaforthianum* යනුවෙන් හඳුන්වනු ලබන වැල් බටු විශේෂයක් මෙම ප්‍රදේශයේ ලඳු කැලෑ ආශ්‍රිතව දැකිය හැකි ය (රූපය 115). එහි පුෂ්පය ළා දම් හා කහ පැහැති ය. තුන්පත් කුරුඳු (*Plelospermium alatun*) ලඳු කැලෑ ආශ්‍රිතව වැවෙන සුලබ නොවන පැළෑටියකි (රූපය 116). එහි පෙති පහකින් සමන්විත සුදු පැහැති පුෂ්ප හටගන්නා අතර බොහෝ දුරට වැලකට සමාන වේ. සාමාන්‍ය වහරේදී 'කොකිස් අච්චුව' යනුවෙන් හඳුන්වනු ලබන අනෝදා (*Abutilon indicum*) පඳුරු විශේෂයකි (රූපය 117). එහි වූ ඵලයේ හැඩය නිසා මේ නම ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය. කහ පැහැති පුෂ්ප හටගන්නා මෙම වැල් ලඳු කැලෑ ආශ්‍රිතවත්, ගෙවතුවල වැටවලත් දැකිය හැකි ය.

ගල් කුම (*Lepisanthes senegalensis*) මෝසම් වනාන්තරවල මීටර් 10 ක් පමණ උස්ව වැඩෙන උප වියන ස්ථරය දක්වා දිවෙන ගසකි (රූපය 118). සුදු පැහැති මල් හටගන්නා මෙම ගස් අනුරාධපුර කලාපයේ වූ අභයභූමි ඇතුළු මහා වනාන්තර ආශ්‍රිතව වැවේ. ඇල්බීසියා (*Albiza* sp.) විශේෂ කිහිපයක් මෙරටට හඳුන්වා දී ඇත්තේ බොහෝ විට දැව අවශ්‍යතාවය සඳහා ය. මේ අතරින් අනුරාධපුරයේ වූ එක් ඇල්බීසියා විශේෂයක් දැක්වීමට කැමැත්තෙමු. පූජා නගරය ආශ්‍රිතව දැකිය හැකි මෙම ගස් විශේෂය පළල් කරලින් යුක්ත ය (රූපය 119). දොඹ (*Calophyllum inophyllum*) මීටර් 20 ක් පමණ උස්ව වැඩෙන පළල් හා ඉලිප්සාකාර හැඩැති පත්‍රවලින් යුක්ත ගසකි. දොඹ ඵලයෙන් ලබාගන්නා තෙල් චිත්‍ර



රූපය 110. හීන් ඇපල (*Urena sinuata*) පඳුර සහ මල
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 111. ගැටතුඹ (*Leucas zeylanica*) පඳුර සහ මල
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 112. ගස් තලා (*Ocimum gratissimum*) පඳුර
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 113. *Rauvolfia tetraphylla* පඳුර සහ ඵල
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ඇඳීම සඳහාත්, පහන් දැල්වීම සඳහාත් භාවිත කෙරේ. ගසෙහි සියලුම කොටස් ඖෂධීය ගුණයෙන් අනූන ය. මෙම පෙදෙසෙහි දොඹ එතරම් සුලබ නොවුවද වනාන්තරවල දැකගත හැකි ය (රූපය 120). අසෝක (*Sarac asoca*) මීටර් 4 ක් පමණ උසැති ළා තැඹිලි හා දීප්තිමත් රත් පැහැයෙන් යුත් මල් හටගන්නා කුඩා ගසකි (රූපය 121). මෙම ගස් ජලයට මදක් ආසන්නයේ හා ගෙවතුවල පැතිර පවතී. අසෝක මල්වලට ප්‍රමාණයෙන් විශාල සමනලුන් බොහෝ ආකර්ෂණය වේ. ගසේ සමහර කොටස් දේශීය ඖෂධ සඳහා යොදා ගනී.

වරා (*Calotropis gigantea*) අනුරාධපුරයේ ඉතා සුලබ ය (රූපය 122). මග දෙපස මෙන්ම වැව් බැම්වල හා ලඳු කැලෑවල වැවෙන වරා පඳුරුවල ළා දම් හෝ සුදු පැහැති මල් හටගනියි. ශ්‍රී ලංකාවේ සුලබ ශාකයක් වන මෙය ගැමියන් විසින් ඖෂධ සඳහා ද භාවිත කෙරේ. වරා ශාකයේ සෑම කොටසක්ම විෂැති ය. ශාක පත්‍රවල ප්‍රධාන වශයෙන් විෂ අඩංගු වේ. එම විෂ නම් Uscharin, Calotoxin, Calotropin, Calactin ආදිය වේ. මහගැට කුළු හෙවත් පූදං (*Benkara malabarica*) ලඳු කැලෑ ආශ්‍රිතව වැවෙන වැලක හැඩැති පඳුරකි (රූපය 123). එය මෝසම් වනාන්තරවල යටි වගාවේ මීටර් 3 ක් පමණ උස්ව වැඩේ. පූදං මල් ළා කොළ මිශ්‍ර කහ පැහැති ය. මිහින්තලය රක්ෂිතය තුළ මග දෙපස පූදං සුලබ ය.



රූපය 114. තිත්බටු (***Solanum violaceum***)
ඵල සහ මල් (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 115. ***Solanum seaforthianum*** මල්
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 116. තුන්පත් කුරුඳු (***Plelospermium alatun***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 117. අනෝදා (***Abutilon indicum***) ඵලය හා මල
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 118. ගල් කුම (***Lepisanthes senegalensis***) ගස සහ දළු (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 119. ඇල්බීසියා (***Albiza sp.***) ගස සහ ඵල (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 120. දොඹ (***Calophyllum inophyllum***) ගස සහ දළු (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 121. අසෝක (***Sarac asoca***) (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

කටු ඉකිලිය හෙවත් නීරමුල්ලිය (*Hygrophila schulli*) ඖෂධීය ගුණැති පැළෑටියකි (රූපය 124). ගැමියෝ මෙහි පත්‍රවලින් මැල්ලුම් පිස ආහාරයට ගනිති. මෙම ශාකය මෝසම් වැසි සමග ඇති වන තාවකාලික ජල තටාක, කුඹුරු අද්දර, වැව් තාවුලු කලාපය ආදි දිය සීරාව ඇති තැන්හි වැවේ. කිරිඳි (*Coix* sp.) කුඹුරු මායිමේ වැවෙන පැළෑටියකි (රූපය 125). කිරිඳි බීජ පරෙවියන්ට ආහාර ලෙස ද,

පළඳනා සෑදීම සඳහා ද ග්‍රාමීයව යොදා ගනියි. ඔලිඳ (*Abrus precatorius*) ගෘහාශ්‍රිත පරිසරය හා ලඳු කැලෑ ආශ්‍රිතව වැවෙන වැල් විශේෂයකි (රූපය 126). රතු සහ කළු පැහැයෙන් යුත් බීජ දරන දිගු කරල් පොකුරු වශයෙන් හටගනියි. ඔලිඳ බීජ හපා ගිලීමෙන් එහි වූ විෂ ශරීරගතවීම හේතුවෙන් කුඩා දරුවන්ගේ මරණ පවා වාර්තා වී ඇත. මීට අමතරව ඉන්දියානුවන් විසින් මෙම බීජවල විෂ ආධාරයෙන් අයාලේ යන හරකුන් විෂ කැවීම සිදුකෙරේ. තව ද ඊතල තුඩු විෂ පෙවීම සඳහා ද ඔලිඳ බීජ යොදා ගනියි.

තද නිල් පැහැති පුෂ්ප දරන නිල් කටරොළු (*Clitoria tematea*) මෙම ප්‍රදේශයේ ඉතා සුලබ වැල් විශේෂයකි. ලඳු කැලෑවල හා ගෙවතු ආශ්‍රිතව බහුල ය (රූපය 127). රසතුල්කොළ (*Ipomoea sepiaria*) පොළොවේ සහ කුඩා පඳුරු මත දිවෙන වැල් විශේෂයකි (රූපය 128). කුඹුරු ආශ්‍රිතව හා මග දෙපස සුලබව වැවේ. සුදු හා රෝස පැහැති මල් හටගනියි. පුරුක් (*Asystasia gangetica*) බිම් මට්ටමේ දිවෙන




රූපය 122. වරා (***Calotropis gigantea***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 123. මහගැට කුළු හෙවත් පූදං (***Benkara malabarica***) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සුදු, කහ හා රෝස පැහැති පුෂ්ප හටගන්නා වැලකි. අනුරාධපුර පෙදෙසේ මග දෙපස, කුඹුරු හා වැව් තාවලු ප්‍රදේශවල පුරුක් සුලබ ය (රූපය 129). වල් පිච්ච (*Jasminum angustifolium*) මෙම කලාපයේ බහුලව දැකිය නොහැකි වැල් විශේෂයකි (රූපය 130). අනෙකුත් මිශ්‍ර ශාක ආශ්‍රිතව වල් පිච්ච පවතී. මෙරටට විදේශීයව හඳුන්වාදුන් වැල් අතර නියමිත සිංහල නමක් නොමැති උද්භිද විද්‍යාත්මකව *Passiflora foetida* යනුවෙන් හඳුන්වන වැල මෙම කලාපයේ ඉතා සුලබ ය (රූපය 131). එහි සුදු පැහැති පෙති දරන මධ්‍යයෙහි රෝස පැහැයෙන් යුතු වටකුරු මල් හටගනියි. දම් පැහැති මල් හටගන්නා *Thunbergia erecta* යනුවෙන් උද්භිද විද්‍යාත්මකව හඳුන්වන වැල් විශේෂය ද මෙම ප්‍රදේශයේ මානව ජනාවාස අතර බහුල ය. ආකර්ෂණීය මල් හටගන්නා බැවින් ගෙවතු අලංකරණය පිණිස පිටරටින් හඳුන්වාදුන් පැළෑටියක් ලෙස මෙය හැඳින්විය හැකි ය (රූපය 132). ඇත් හොඬ (*Heliotropium indicum*) දිය සීරාව ඇති



රූපය 124. කටු ඉකිලිය හෙවත් තීරමුල්ලිය (***Hygrophila schulli***) පඳුරු සහ මල් (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

තැන්වල සුලබ ය. එහි හටගන්නා කුඩා දම් පැහැ මල්වලට සමනලුන් ආකර්ෂණය වේ (රූපය 133). බලු නකුට (*Stachytarpheta urticaefolia*) කුඩා පඳුරකි (රූපය 134). දිගු නටුවේ ළා නිල් සහ දම් පැහැයට හුරු මල් හටගනියි. මග දෙපස ඉතා සුලබ වන අතර මෙම මල්වලට ඇතැම් සමනල් විශේෂ ආකර්ෂණය වේ.

විදේශයන්ගෙන් හඳුන්වා දුන් ශාක රැසක් වර්තමානය වන විට ගෘහාශ්‍රිතව මෙන්ම ලඳු කැලෑ ආශ්‍රිත පරිසරයේ ද වඩාත් පුළුල් ලෙස පැතිර ඇත. ඒ අතරින් *Calliandra surinamensis* යනුවෙන් උද්භිද විද්‍යාත්මකව හඳුන්වනු ලබන කෙදි සහිත පුෂ්පයන්ගෙන් යුත් ගස මෙම කලාපය තුළ වඩාත් සුලබ ය



රූපය 125. කිරිදි (*Coix* sp.) පඳුරු සහ බීජ
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 126. ඔලිඳ (*Abrus precatorius*) කරල් සහ මල්
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 127. නිල් කටරොළු
(*Clitoria tematea*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 128. රසකුල්කොළ
(*Ipomoea sepiaria*)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

(රූපය 135). මොනර මල් (*Caesalpinia pulcherrima*) මග දෙපස හා ලඳු කැලෑවල සුලබ ය (රූපය 136). මෙහි වූ රත් සහ කහ පැහැති මල් වසර මුළුල්ලේම පාහේ පවතී. උද්භිද විද්‍යාත්මකව *Quisqualis indica* යනුවෙන් හඳුන්වනු ලබන ශාකය ද ලඳු කැලෑ හා මානව වාසස්ථාන අසල බහුල ය (රූපය 137). රෝස සහ සුදු පැහැයෙන් යුත් මල් හටගන්නා අතර මෙම විශේෂය ද විදේශයෙන් හඳුන්වා දුන්නකි. වල් අබ හෙවත් රන් මානිස්ස (*Cleome viscosa*) කුඩා පඳුරු සමග වැවෙන පැළෑටියකි (රූපය 138). අඩි දෙකක් පමණ උසැති මෙම පඳුරුවල දිගු කරල් හා කහ පැහැති මල් හටගනියි. දිය සීරාව ඇති තැන්වල බහුලව වැවෙන මෙය මංපෙත් දෙපස ද ඉතා සුලබ ය. ගිරාපළා (*Commelina diffusa*) දියසීරාව ඇති තැන්වල පමණක් වැවෙන කුඩා පැළෑටියකි. කුඹුරු, ලියැදි සහ දොළවල ජලයට ඉතා ආසන්නයේ වැවේ. ළා නිල් පැහැති මල් හටගනියි (රූපය 139).

පාවට්ටා, ආඩතෝඩ හෙවත් අගල් ආධාර (*Pavetta indica*) යනුවෙන් හැඳින්වෙන ශාකය අනුරාධපුර ප්‍රදේශයේ බෙහෙවින් සුලබ ය (රූපය 140). මෙය කුඩා කල පඳුරක් ලෙස ද, හොඳින් වැඩුණු කල ගසක් ලෙස ද හැඳින්විය හැකි ය. මල්, කොළ පැහැයට හුරු සුදු පැහැති ය. මෙම ශාකය ගැමියන් විසින් වැට මායිම්වල වවන අතර වනාන්තරවල යටි වගාවේ ද බහුලව දැකිය හැකි ය. ශාකයේ සෑම කොටසක්ම පාහේ ඖෂධීය ගුණයකින් යුක්ත ය. සෙම්ප්‍රතිශ්‍යාව ආදී

රෝග වැළඳුණු කල මෙම ශාකයේ දලු, කොළ, මල්, පොතු හා මුල් තම්බා පානය කිරීම ගැමි සිරිත ය. හෙන්දිරික්කා (*Mirabilis jalapa*) යනු ගැමි නිවෙස්වල වවනු ලබන සුලබ පැළෑටියකි (රූපය 141). සුදු, කහ, දම් ආදි වර්ණ කිහිපයකින් මල් දරන මෙම පැළෑටිවල මල් පිපෙනුයේ සවස 4 ට පමණ ය. ඉංග්‍රීසි



රූපය 129. පුරුක් (***Asystasia gangetica***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 130. වල් පිච්ච (***Jasminum angustifolium***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 131. ***Passiflora foetida***
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 132. ***Thunbergia erecta***
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 133. ඇත් හොඬ (***Heliotropium indicum***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 134. බලුනකුට (***Stachytarpheta urticaefolia***)
පඳුරු සහ මල් (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



බසින් මෙම පැළෑටියට four O' clock flower යනුවෙන් හඳුන්වනු ලබන්නේ එම නිසා ය. කළු පැහැති ගම්මිරිස් ඇට වැනි මේවායේ බීජ විෂැතිය. Poisonous alkaloid සහ Trigonelline අඩංගුවීම එම විෂ දැරීමට හේතු වී ඇත. එම නිසා හෙන්දිරික්කා බීජ ශරීරගත වීමෙන් අධික වමනය ඇති වේ.

රූපය 135. ***Calliandra surinamensis***
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 136. මොණර මල් (***Caesalpinia pulcherrima***)
ගස සහ මල් (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 137. ***Quisqualis indica***
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 138. වල් අබ (***Cleome viscosa***) පඳුරු සහ මල්
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 139. ගිරාපළා (***Commelina diffusa***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 140. පාවට්ටා (***Pavetta indica***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 141. හෙන්දිරික්කා (***Mirabilis jalapa***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සත්ත්ව සන්තතිය

අනුරාධපුරය පුරා පැතිර පවත්නා මෝසම් වනාන්තර බොහෝ සත්ත්ව විශේෂවලට ජීවත් වීමට අවශ්‍ය පරිසරයන් නිර්මාණය කොට ඇත. තෙත් කලාපීය වැසි වනාන්තරවලට සාපේක්ෂව මෙම වියළි කලාපීය තැනිතලා බිමේ ආවේණික සතුන්ගේ ප්‍රතිශතය අඩු මට්ටමක පැවතුණ ද මේ වියළි තැනිතලාවටම පමණක් ආවේණික සත්ත්ව විශේෂ ද නැතුවා නොවේ. වයඹදිග ශ්‍රී ලංකාවේ වූ අර්ධ ශුෂ්ක කලාපයට මායිම්ව පිහිටන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ශුෂ්ක පාරිසරික තත්ත්වයන් දරන කලාප බොහෝ ය. එමෙන්ම සමස්ත කලාපය පුරාම පැතිර ඇති ගල් තලා හා ගිරි ශිඛර ආශ්‍රිතව ද පිහිටා ඇත්තේ ශුෂ්ක ලක්ෂණ දරන වාසස්ථානයන් ය. එම නිසා එහි වූ ශුෂ්ක පරිසරයට අනුවර්තන දක්වන ජීවීන් එනම්, සර්පයින්, කටුස්සන්, සුහුණන්, කුරුල්ලන් ආදි සතුන් මෙහි වාසය කරනු ඇත. සියවස් කිහිපයක සිටම මානව පහස ලැබූ මෙම කලාපයේ වනාන්තර කපා හෙළා නැවත ඇතිවුණු ද්විතියික වන වැස්මක් තුළ යහතින් දිවි ගෙවන අලි ඇතුන්, වඳුරන් හා රිළවුන් වේ. මේ වන සතුන් මානව වාසස්ථාන අසල බහුලව ගැවසෙනුයේ මිනිසුන් විසින් වවනු ලබන බවබෝගවලට වඩාත් රුචිකත්වයක් දක්වන හෙයිනි. විල්පත්තු අභය භූමිය මෙම කලාපයේ වසන සතුන්ට ජීවත් වීමට ආරක්ෂා සහිත කලාපයක් ලෙස සඳහන් කළ හැකි ය.

අදින් වසර 6,000 කට පමණ ප්‍රථම මෙහි විසුවෝ ශිලා යුගයට අයත් බලංගොඩ මානවයෝ වෙති. ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාස හා විශාල ක්ෂීරපායීන් අතර දැඩි සබඳතාවයක් පවතී. කුළු හරකුන්, ගෝනුන්, තිත් මුවන් හා වල් ඌරන් ගහන මෙම පෙදෙස මෙරට ඉහළතම 'යැපීම් ධාරිතාවය' (carrying capacity) දරන පෙදෙසක් ලෙස සඳහන් කළ හැකි ය. එම ප්‍රාග් ඓතිහාසික මානව කණ්ඩායම් මෙහි 'විසුම් බල ප්‍රදේශ' (site territory) වෙන් කොට ජීවත් වන්නට ඇත. ඔවුන් එම මොහොතේ ගත කරන 'විසුම් පොළේ' සිට තමා වටා වූ 'දඩයම් බල ප්‍රදේශය' (site catchment) ආත්මාර්ථකාමීව ආරක්ෂා කරන්නට ඇත. ආහාරයට ගත හැකි විශාල ක්ෂීරපායීන් බහුලව ගැවසෙන මෙවැනි බිම්වලට ප්‍රාග් ඓතිහාසික මානවයින් වඩාත් ඇලුම් කරන අතර මෙම වියළි බිමේ මුල්ම දඩයක්කරුවන් වූයේ බලංගොඩ මානවයා ය.

ක්‍රිස්තු පූර්ව 700 දී පමණ වැව් ඉදිවීමත් සමඟ මෙහි වූ භූමිදර්ශනයට එක් වූ නව අංගය නිසා මෙම කලාපයේ එතෙක් ජීවත් වූ සතුනට විශේෂයෙන්ම විශාල ක්ෂීරපායීන්ට නව පාරිසරික තත්ත්වයන්ට මුහුණදීමට සිදුවිය. ඒ අනුව විශාල ක්ෂීරපායීන්හට වසරේ දැඩි නියඟයකට මුහුණදීමේ අවදානම නැතිවූ බව සඳහන් කළ හැකි ය.

අනුරාධපුර භූ දර්ශනයේ වූ අතිශයින්ම වැදගත් පාරිසරික තත්ත්වයන් දරන රිටිගල කඳුවැටියේ ජීවී ප්‍රජාව තෙත් කලාපයට ඥාතීත්වයක් දක්වන බව පෙනේ. කඳුවැටියේ පහළ පෙදෙස් වියළි කලාපීය ලක්ෂණ දරන අතර කඳු මුදුන්වල ජීවීන්ගේ පැතිරීම ඊට හාත්පසින් වෙනස් වේ.


මෙම ප්‍රදේශයේ වැඩිවන ජනගහනය නිසා ඇති ඇතිවන නාගරීකරණය ස්වාභාවික පරිසරයට පීඩනයක් ගෙනදී ඇති බව පෙනේ. එමෙන්ම දශක කිහිපයක සිටම භාවිතයට එක් වූ කෘෂි රසායනයන් හේතුවෙන් ජලචර ජීවීන්ට හානිකර තත්වයක් ඇති වූවාට සැකයක් නොමැත. එතෙක් ගැමියන්ගේ ආහාර වේලට එක් වුණු දේශීය මසුන් වෙනුවට අද ඔවුන් ආහාරයට ගනුයේ විදේශීය රටවලින් වැව්වලට හඳුන්වාදුන් මසුන් ය. මෙම භූමි දර්ශනය තුළ වර්තමානයේ විදේශීය රටවලින් හඳුන්වාදුන් සතුන් මෙන්ම ගහකොළ ද බොහෝ ය.

මෙම පරිච්ඡේදයේ අප විසින් විශේෂ අවධානය යොමු කරනුයේ සමනලුන් හා මෘද්වංගීන් යන අපෘෂ්ඨවංශී කාණ්ඩ දෙක සහ මිරිදිය මසුන්, උභය ජීවීන්, උරඟුන්, පක්ෂීන් හා ක්ෂීරපායීන් යන පෘෂ්ඨවංශී කාණ්ඩ පිළිබඳව ය.

සමනලයින්

අනුරාධපුරය ඇතුළු සමස්ත උතුරුමැද පළාතම සමනලයින්ගෙන් පොහොසත් ය. ලඳු කැලෑ, වැව් ඉවුරු, වන මංපෙත්, මහ කැලෑ ඇතුළු තැන්හි උන් බහුල ය. වසරේ මාස නවයක් පමණ දැඩි සූර්යාලෝකය ලැබෙන මෙම වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර කලාපය සමනලයින්ට වාසය කිරීම සඳහා බොහෝ නිකේතන සපයයි. තවද සමනලයින්ට පෝෂණය වීමට අවශ්‍ය මධු පිරි මලින් ද, දළඹුවන්ට ආහාර සඳහා පෝෂක ශාක ආදි සියලුම අවශ්‍යතාවන් අතින් ද මෙම පෙදෙස බෙහෙවින් පොහොසත් ය. වැසි සමයේ දී හොඳින් හිරු පෑයූ දිනෙක උදය කාලයේ මෙම සමස්ත කලාපය පුරාම සමනලයින් ඉතා සුලබ වේ. එමගින් මෙම වියළි බිමට වඩාත් විචිත්‍රත්වයක් ගෙන දෙන බව නොරහසකි.

ශ්‍රී ලංකාවේ සමනලයින් පිළිබඳ විශේෂඥයෙකු වන ආචාර්ය ජෝර්ජ් වැන් ඩර් පූර්ටන් විසින් 2012 දී රචිත ලිපියක සඳහන් කොට ඇත්තේ මෙරට සමනල් විශේෂ 245 ක් වාසය කරන බවත් ඉන් විශේෂ 26 ක් දිවයිනට ආවේණික වන බවත් ය. එම සමනලයින් කුල 6 කට අයත් වේ. එනම් දිගුපෙද කුලය (Papilionidae) (විශේෂ 15 ක් අයත් වේ), ස්වේතපිය කුලය (Pieridae) (විශේෂ 28), කෙටි පා කුලය (Nymphalidae) (විශේෂ 68), විවරපිය කුලය (Riodinidae) (විශේෂ 1), නීල ලෝහිත කුලය (Lycaenidae) (විශේෂ 84) සහ දිගුතළ කුලය (Hesperiidae) (විශේෂ 49) වේ (van der Poorten, 2012). ඒ අතරින් විශේෂ බහුතරයක් නියෝජනය කරනුයේ කෙටි පා හා නීලලෝහිත යන සමනල කුල ය. පරිසරයේ වඩාත් සුලබව දැකගත හැකි කහ හා සුදු පැහැයට හුරු සමනලයින් බහුතරයක් අයත් වන්නේ ස්වේතපිය කුලයට ය.



රූපය 142. පිළිල-රිසියා (***Delias eucharis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 144. පිළිල-රිසියා (***Delias eucharis***) දළඹු අවස්ථාවක්
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 143. පිළිල විශේෂයක් (උප කුලය: ***Loranthaceae***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

පිළිල-රිසියා (*Delias eucharis*) (රූපය 142) ගස් මත වැවෙන පරපෝෂී ශාකයක් වන පිළිල (Loranthaceae කුලයේ) පැළෑටිවල (රූපය 143) බිත්තර තැන්පත් කරයි. පිළිල-රිසි දළඹුවා කහ පැහැයට හුරු අතර ශරීරයේ කුඩා සුදු පැහැ පුල්ලි මෙන්ම රෝම දැකිය හැකි ය (රූපය 144). උන් කුඩා කල 7-8 බැගින් හෝ ඇතැම් විට 30-40 බැගින් වූ පොකුරු ලෙස පිළිල පත්‍ර යටි පැත්තේ වාසය කරයි. ඇත් තෝර, ඇහැළ ආදි රනිල කාණ්ඩයේ ශාක මත බිත්තර දමන කහ පැහැයට හුරු කහවන් පිමිසැරියා (*Catopsilia pomona*) (රූපය 145), ලපවන් පිමිසැරියා (*Catopsilia pyranthe*) (රූපය 146), තෙතිත් තෘණ-පීතයා (*Eurema blanda*) (රූපය 147) හා දෙතිත් තෘණ-පීතයා (*Eurema hecabe*) (රූපය 148) ආදි සමනලයින් අයත් වන්නේ ස්වේතපිය කුලයට ය. ඊට අමතරව ලපසැරියා වා පත්‍ර මත ද තම බිත්තර තැන්පත් කරයි. මෙම සැරියන් සහ පීතයන් දවස මුලුල්ලේම පාහේ ක්‍රියාශීලීව පියාඹන බැවින් පරිසරයට බොහෝ විචිත්‍රත්වයක් ගෙන දේ. විශේෂයෙන්ම ලඳු කැලෑ ආශ්‍රිතව මෙම සමනලයින් නිතරම පාහේ ගැවසේ.



රූපය 145. කහවන් පිමිසැරියා (***Catopsilia pomona***)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)



රූපය 146. ලපවන් පිමිසැරියා (***Catopsilia pyranthe***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)



රූපය 147. තෙතිත් තෘණ-පීතයා (***Eurema blanda***)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)



රූපය 148. දෙතිත් තෘණ-පීතයා (***Eurema hecabe***)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)




රූපය 149. නිල් පැපිලියා (***Papilio polymnestor***)
(ඡායාරූපයඃ ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)




රූපය 150. ශ්‍රී ලංකා සියොත්වැන්නා
(***Troides darsius***)
(ඡායාරූපයඃ ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)

ශ්‍රී ලංකාවේ ප්‍රමාණයෙන් විශාල සමනලයින් අයත් වන්නේ දිගුපෙඳ කුලයට ය. මෙම කුලයේ නිල් පැපිලියා (*Papilio polymnestor*) (රූපය 149), හා ශ්‍රී ලංකා සියොත්වැන්නා (*Troides darsius*) (රූපය 150) මෙරටට ආවේණික සමනලුන් වේ. දිලිරත් සෙව්වන්දියා (*Pachliopta hector*) (රූපය 151), සුලබ සෙව්වන්දියා (*Pachliopta aristolochiae*) (රූපය 152), මෙන්ම කළු-සුදු හා ක්‍රිම්සන් යන වර්ණවලින් යුත් රටා ඇති සුලබ පැපිලියා (*Papilio polytes*) (රූපය 153) අනුරාධපුර පෙදෙසේ වූ මහා කැලෑ හා ලඳු කැලෑ ආශ්‍රිතව පහසුවෙන් දැකබලා ගත හැකි ය. මේ අතරින් නිල් පැපිලියා හා ශ්‍රී ලංකා සියොත්වැන්නා පොළොවේ සිට වඩාත් ඉහළින් වූ තුරු මුදුන් අතරින් වේගයෙන් පියාඹන සමනලයින් වේ. ශ්‍රී ලංකා සියොත්වැන්නාගේ පෝෂක ශාකය වනුයේ මෙම ප්‍රදේශයේ සුලබ සප්සඳ වැල් (*Aristolochia indica*) ය. වගුරු ආශ්‍රිතව වැවෙන වෙල් ආත්තා (*Annona glabra*) (රූපය 154) ශාක මත බිත්තර දමන පෙදෙනි ජවසැරියා (*Graphium agamemnon*) (රූපය 155) ඉතා කඩිසර හා කලබලකාරී ලෙස සංචරණය කරන සමනලයෙකි. මෙම විශේෂය වඩාත්ම දැකිය හැක්කේ වගුරු ආශ්‍රිතව වුවද ඊට පරිබාහිර වාසස්ථානවල ද සංචරණය කරනු ඇත. මනා තුරු වියන ඇති ගස් අතර මෙන්ම සෙවනැති ලඳු කැලෑ අතර ගැවසෙන නිල් ජවසැරියා (*Graphium sarpedon*) (රූපය 156), රැවටිලි පැපිලියා (*Papilio clytia*) (රූපය 157), මයුර පැපිලියා (*Papilio crino*) (රූපය 158) හා පැඟිරි පැපිලියා (*Papilio demoleus*) (රූපය 159) යන විශේෂ ඉතා විචිත්‍රවත් වර්ණ රටා දරන මධ්‍යම ප්‍රමාණයේ සමනලයින් වේ. මොවුන් එක් තැනක වැඩි වේලාවක් නොරැඳී කලබලකාරී ලෙස සැරිසරන්නන් ය.



රූපය 151. දිලිරත් සෙව්වන්දියා (***Pachliopta hector***)
(ඡායාරූපයඃ ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)




රූපය 152. සුලබ සෙව්වන්දියා
(***Pachliopta aristolochiae***) (ඡායාරූපයඃ ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)



රූපය 153. සුලබ පැපිලියා (***Papilio polytes***)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)




රූපය 154. වෙල් ආත්තා (***Annona glabra***)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 155. පෙඳුනි ජවසැරියා (***Graphium agamemnon***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)



රූපය 156. නිල් ජවසැරියා (***Graphium sarpedon***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)



රූපය 157. රැවටිලි පැපිලියා (***Papilio clytia***)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)




රූපය 158. මයුර පැපිලියා (***Papilio crino***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)



රූපය 159. පැහිරි පැපිලියා (***Papilio demoleus***)
(ඡායාරූපය: හිමේෂ ජයසිංහ)


මේ අතරින් නිල් ජවසැරියා, උල් කෙන්ද (*Polyalthia korinti*) ශාකයේ බිත්තර තැන්පත් කරයි.

වැව් ඉවුරුවල වූ මල් පිපෙන පඳුරු අතර සුලබව ගැවසෙන සමනලයින් අතරින් නීල ගෝමරා (*Tirumala limniace*) (රූපය 160), කාක-නීල ගෝමරා (*Tirumala septentrionis*) (රූපය 161), පළිඟු ගෝමරා (*Parantica aglea*) (රූපය 162), පහන් ගෝමරා (*Danaus chrysippus*) (රූපය 163), අග්නි ගෝමරා (*Danaus genutia*) (රූපය 164), සුලබ කාකයා (*Euploea core*) (රූපය 165), රජ කාකයා (*Euploea klugii*) (රූපය 166) හා දෙඉරි කාකයා (*Euploea sylvester*) (රූපය 167) මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. මෙම සමනල විශේෂ දවස පුරාම පාහේ මල් ඇති පඳුරු අතර දැකිය හැකි ය. උන්ගේ පියාඹීම වේගවත් නොවේ. පහන් ගෝමරා අනුරාධපුර ප්‍රදේශයේ ඉතාමත් සුලබ ශාකයක් වන වරා (*Calotropis gigantea*) පත්‍රවල බිත්තර තැන්පත් කරයි. අලු සඳැසියා (*Junonia atlites*) (රූපය 168) වගුරු ආශ්‍රිතව හා වැව් ඉවුරු කලාපයේ සැරිසරන සමනලයෙකි. මයුර සඳැසියා (*Junonia almana*) (රූපය 169) අනුරාධපුරය ප්‍රදේශය පුරා වූ වැව් ඉවුරු, වගුරු හා පොකුණු මෙන්ම කුඹුරු මායිම්වලද දැකගත හැකි සමනල විශේෂයකි. සුලබ ලිහිසැදියා (*Neptis hylas*) (රූපය 170) ගඳපාන (*Lantana* sp.) (රූපය 171) පඳුරු අතර බහුලව දැකගත හැකි ය. උන්ගේ පියාඹීම වාතයේ පාවීමකට වඩාත් සමාන ය. ලැසිසැරියා (*Acraea violae*) තැඹිලි හා කළු පැහැයෙන් විචිත්‍රවත් වූ ප්‍රමාණයෙන් කුඩා සමනලයෙකි. ලැසිසැරියා ගඳපාන පඳුරු ආශ්‍රිතව මෙන්ම වැව් ඉවුරුවල වූ මල් පිපෙන පඳුරු අතර සුලබව ගැවසේ. මෙම සමනලයාගේ පෝෂක ශාකය වනුයේ මේ ප්‍රදේශයේ දුලබ නොවන පඩ වැල් (*Passiflora foetida*) ය. සුලභ තාලරිසියා (*Elymias hypermnestra*) තුරු සෙවනේ ඉඳහිට දැකිය හැකි, සෙමෙන් පියාඹන සමනලයෙකි. අක්කපාන (*Bryophyllum pinnatum*) පත්‍ර (රූපය 172) මත බිත්තර තැන්පත් කරන රතු කෝනංගියා (*Talicada nyseus*) (රූපය 173) සුදු, රතු හා කළු පැහැයන්ගෙන් සමන්විත කුඩා, ඉතා වර්ණවත් සමනලයෙකි. රතු කෝනංගියා කලබලකාරී නොවන, පොළොවට වඩාත් සමීපව සැරිසරන්නෙකි. අක්කපාන පත්‍ර මත තැන්පත් කෙරෙන බිත්තරවලින් බිහිවන දළඹුවාගේ ආහාරය වනුයේ එහි මාංශලමය කොටස් ය. මනහාරී (*Leptosia nina*) (රූපය 174) කළු සහ සුදු පැහැයෙන් රටා ගැන්වී ඇති ප්‍රමාණයෙන් කුඩා



රූපය 160. නීල ගෝමරා (***Tirumala limniace***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)


සමනලයෙකි. අනුරාධපුර ප්‍රදේශයේ බොහෝ තුරු සෙවන ඇති පරිසරවල ද, ගෙවතු ආශ්‍රිතව ද පොළොවේ සිට මීටරයක් පමණ උස් වූ පහත් මට්ටමේ සැරිසරන මනහාරී වඩාත් සුලබ සමනලයෙකි. මෙම සමනලයා බිත්තර තැන්පත් කරනුයේ වල් අබ (*Cleome* sp.) යනුවෙන් හඳුන්වනු ලබන පැළෑටියේ ය. වල් අබ කුඩා පත්‍ර, දිගටි කරල් සහ දම් හෝ සුදු පැහැති මල් දරන පැළෑටියකි (රූපය 175).



රූපය 161. කාක-නීල ගෝමරා (***Tirumala septentrionis***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)



රූපය 162. පළිඟු ගෝමරා (***Parantica aglea***)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)



රූපය 163. පහන් ගෝමරා (***Danaus chrysippus***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)



රූපය 164. අග්නි ගෝමරා (***Danaus genutia***)
(ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්)







රූපය 165. සුලබ කාකයා (***Euploea core***) (ඡායාරූපය: ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්), දකුණුපස අට්ටික්කා (***Ficus racemosa***) ශාකයේ වූ ඉන්දු කාකයාගේ දළඹු අවස්ථාව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 166. රජ කාකයා (*Euploea klugii*)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)




රූපය 167. දෙඉරි කාකයා (*Euploea sylvester*)
(ඡායාරූපය: සරත් එස්. රාජපක්ෂ)



රූපය 168. අලු සඳසියා (*Junonia atlites*)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)



රූපය 169. මයුර සඳසියා (*Junonia almana*)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)



රූපය 170. සුලබ ලිහිසැදියා (*Neptis hylas*)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)



රූපය 171. ගඳපාන (*Lantana* sp.) පඳුරු සහ මල් (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 172. අක්කපාන (***Bryophyllum pinnatum***)
(ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 173. රතු කෝනංගියා (***Talicada nyseus***) ඇතුළත වර්ණ රටාව හා පිටත වර්ණ රටාව (ඡායාරූපඃ ජෝර්ජ් වැන් ඩර් පූර්ටන්, හිමේෂ ජයසිංහ)



රූපය 174. මනහාරි (***Leptosia nina***)
(ඡායාරූපයඃ හිමේෂ ජයසිංහ)



රූපය 175. වල් අබ (***Cleome* sp.**)
(ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 176. සුලබ බාබුල්-නීලයා ***(Azanus jesous)***
(ඡායාරූපයඃ හිමේෂ ජයසිංහ)

නීලලෝහිත කුලයට අයත් වනුයේ ප්‍රමාණයෙන් කුඩා සමනලයින් ය. එසේ වුවද ශ්‍රී ලංකාවේ සමනල් කුල අතරින් විශාලතම කුලය වනුයේ මෙම නීලලෝහිත කුලයයි. මේ කුලයේ සුලබ සමනල විශේෂයකි, සුලබ බාබුල්-නීලයා (*Azanus jesous*) (රූපය 176). උන් ලඳු කැලෑ හා තෘණබිම් අතර වඩාත් සුලබ ය. මොවුන්ගේ තටු දිගහැරිවිට උඩු පෙදෙස දම් මිශ්‍ර ළා නිල් පැහැයෙන් යුක්ත ය. දිගුතළ කුලයට අයත් මධ්‍යම ප්‍රමාණයේ සිරුරු දරන සමනලයින් ද මෙම වියළි පෙදෙසේ වාසය කරයි. උන් කුඩා පඳුරු මත දවස මුලුල්ලේම පාහේ දැකිය හැකි ය. මේ අතරින් විශේෂ රැසක් දැඩි සූර්යාලෝකයට ප්‍රිය කරනු ඇත. අනුරාධපුර පෙදෙසේ වූ විවෘත තෘණබිම් හා ලඳු කැලෑ ආශ්‍රිතව සැරිසරන දිගුතළ කුලයට අයත් සමනල් විශේෂ අතරින් සුලබ බඩිල්ලා (*Hasora chromus*) (රූපය 177) හා තද පැහැ තුහිතයා (*Tagiades litigiosa*) (රූපය 178) සුලබව දැකගත හැකිය.



රූපය 177- සුලබ බඩිල්ලා (*Hasora chromus*)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)



රූපය 178- තද පැහැ තුහිතයා (*Tagiades litigiosa*)
(ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)

තෙත් කලාපයේ සමස්ත සමනල ප්‍රජාවටම පොදු වූ ලක්ෂණයක් ලෙස වර්ෂා සමයන්හි පරිසරයේ සමනලයින් දැක ගැනීම අසීරු ය. එසේ වුවද ඊසානදිග මෝසම් වැසි පතිත වන සමයේ, එනම් ඔක්තෝබර් සිට ජනවාරි මාස අතරතුර මෙම වියළි පෙදෙසේ සමනල ගහනය ඉතා ඉහළ මට්ටමක පවතී. එයට ප්‍රධානම හේතුව වනුයේ එම සමයේ ගස් හා පැලෑටිවල දළු සහ මල් බහුලව හට ගැනීම ය. ආචාර්ය වැන් ඩර් පූර්ටන්ගේ නිරීක්ෂණයන්ට අනුව අනුරාධපුර පෙදෙසේ සමනල ගහනයේ උච්චතම සෘතුව වනුයේ ඔක්තෝබර් සහ නොවැම්බර් යන කාලපරිච්ඡේදයයි. එසේ වුවද පසුගිය වසර දහය තුළ අප විසින් කළ නිරීක්ෂණ අනුව මෙම කලාපයේ සමනල ගහනය ඊට ආසන්න වෙනත් මාස වලදීද ඉහල තත්වයක පැවතුණි. එයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ මෝසම් වැසිවලට අමතරව පතිත වූ තද වැසි බැව් අනුමාන කළ හැකිය. අනුරාධපුර තිසාවැව, බසවක්කුලම වැව හා නුවර වැව ආශ්‍රිතව වසරේ මාස බොහොමයකම තෙත් පරිසර තත්ත්වයන් දරන බැවින් පූජානගරය ඇතුළු තුරු වඳුල හා ලඳු කැලෑවල ඊට යාබද වියළි පෙදෙස්වලට වඩා වැඩි සමනල ගහනයක් වසර පුරාවටම දැකිය හැකිය. ඊසානදිග මෝසම් වැසි සමඟ පරිසරයට නව ජීවයක් ලබා දෙමින් ගස්වැල් මලින්, එලින් හා නව දලුවලින් සංතෘප්ත වන බැවින් සමනලයින්ට සුදුසු ආහාර ද, දළඹුවන්හට පෝෂක ශාක ද බහුල වේ. එබැවින් වැසි පතිත වන සමස්ත මාස සියල්ලෙහිම පාහේ ඉතා සංතෘප්ත සමනල ගහනයක් අනුරාධපුර පෙදෙසේ පවතී.



රූපය 179. ශ්‍රී ලංකා සුදනා
(*Appias galene*) (ඡායාරූපය: හිමේෂ් ජයසිංහ)

ශ්‍රී ලංකාවේ බොහෝ පළාත්වල මෙන්ම අනුරාධපුරයේ ද සමනල සංක්‍රමණ දැකගත හැකි ය. ආචාර්ය වැන් ඩර් පූර්ටන්ගේ නිරීක්ෂණයන්ට අනුව අනුරාධපුර පෙදෙසේ සමනල සංක්‍රමණ සිදුවනුයේ මාර්තු හා අප්‍රේල් මාසයේදී ය. මෙය ඊසානදිග මෝසම් වැසි නිමා වී එළැඹෙන පරිසරාත්මකව වඩාත් පොහොසත් සමයකි. සමස්ත පරිසරයම හරිත පැහැයෙන් යුක්ත වන අතර සියලුම වැව්, පොකුණු, විල්ලු හා වගුරු ජලයෙන් පිරී පවතී. මෙම පාරිසරික තත්ත්වයන් සමනලයින්ටත්, දළඹුවන්ටත් රිසිසේ විසීමට මනා පරිසරයක් සපයයි. මෙහිදී ස්වේතපිය කුලයේ සමනලයින් රංචු වශයෙන් එක් නියමිත දිශාවකට පියාඹයි. කීට විද්‍යාවේදී මෙම සිදුවීම 'සමනල

සංක්‍රමණ' ලෙස හැඳින්වේ. ආචාර්ය වැන් ඩර් පූර්ටන්ගේ අදහස වනුයේ මෙම සංක්‍රමණ ක්‍රියාවලියේ බහුලවම යෙදෙනුයේ ශ්‍රී ලංකාවට ආවේණික සමනලයෙකු වන ශ්‍රී ලංකා සුදනා (*Appias galene*) (රූපය 179) හා කහවන් පිමිසැරියා යන විශේෂ බව ය. අප කළ නිරීක්ෂණයන්ට අනුව සංක්‍රමණය වන එක් සමනල රංචුවක සාමාජිකයින් 7-50 දක්වා සංඛ්‍යාවක් වේ. මෙම සංක්‍රමණ කුමක් අරබයා සිදුවන්නේද යන්න පිළිබඳ කීට විද්‍යාඥයින් අතර මත කිහිපයක් පවතී. වසර 1998 දී *The Butterflies of Ceylon* නම් ග්‍රන්ථය ලියූ බර්නාඩ් ඩ'අබ්රේරා ශ්‍රී ලංකාවේ සමනල සංක්‍රමණ පිළිබඳ කෙටි හැඳින්වීමක් දක්වමින් සඳහන් කොට ඇත්තේ කහවන් පිමිසැරියා මෙම සංක්‍රමණ විශේෂ අතර සිටින බව ය (d' Abrera, 1998). අපගේ නිරීක්ෂණයන්ට අනුව මෙම සමනලයින් රංචු වශයෙන් පියාඹා යන අතරතුර සුදුසු පෝෂක ශාක හමුවූ විට මඳකට ඉන් මිදී එම ශාක පත්‍ර අතර තම බිත්තර තැන්පත් කොට නැවත රංචුවට එක් වේ. මීට අමතරව මෙම සංක්‍රමණ අතරතුරදී මේ සමනලයින් කෘමිභක්ෂක කුරුල්ලන්ට සුලබව ගොදුරු වේ.

අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව අප කළ නිරීක්ෂණවලදී සමනලයින් බහුල ලෙස ගැවසෙන ස්ථාන කිහිපයක් පිළිබඳ සඳහන් කිරීමට කැමැත්තෙමු. මේ අතරින් මිරිසවැටිය දාගැබ අවට පරිශ්‍රයේ වූ උස්



රූපය 180. මිරිසවැටිය පරිශ්‍රයේ වූ උස් තුරු ලතා ඇති මෙම බිම් පෙදෙස සමනලයින්ගෙන් පොහොසත් ය.
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ගස් අතර සෙවනෙහි බොහෝ සමනල විශේෂ සංඛ්‍යාවක් නිරීක්ෂණය කිරීමට අපට හැකි විය (රූපය 180). 2012 ජූනි මසදී මෙම නිරීක්ෂණය සිදුකිරීමට අවස්ථාව ලැබුණු අතර එහිදී අවම තරමින් සමනල විශේෂ 20 කට වැඩි සංඛ්‍යාවක් දැක ගැනීමට හැකි විය. මෙම විශේෂවල සාමාජිකයින් සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගත් බැවින් එය ඉතා විචිත්‍රවත් දර්ශනයක් විය.

මීට අමතරව පූජා නගරයේ කුට්ටම් පොකුණ හා ගෙඩිගේ යන නටබුන් අතර පිහිටි ඇතුල් නුවරට අයත් වන භූමි කොටසක ද සමනලයින් බහුලව වාසය කරයි. ගැමියන් මෙම භූමි ප්‍රදේශය හඳුන්වනුයේ 'බෙල් කොටස' යනුවෙනි (රූපය 181). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් මෙම භූමි පෙදෙසේ හොඳින් වැඩුණු ඉතා උස් ගස් දැකිය හැකි සෙවනැති පෙදෙසකි. මෙහි මනා ලෙස සූර්යාලෝකය ඇති වියළි හා උණුසුම් දිනයන්හි උදය කල විශාල සමනල සංඛ්‍යාවක් දැකිය හැකි ය. ඉහත දක්වන ලද මිරිසවැටිය ආශ්‍රිතව තුරු වදුල අතරත්, මෙම ස්ථානයේත් සුලබ සමනලයින් ලෙස නිල් පැපිලියා, ශ්‍රී ලංකා සියොත්වැන්නා, දිලිරිනි සෙව්වන්දියා, සුලබ සෙව්වන්දියා, සුලබ පැපිලියා, නිල් ජවසැරියා, රැවටිලි පැපිලියා, මයුර පැපිලියා, කහවන් පිමිසැරියා යන විශේෂ සඳහන් කළ හැකි ය.



රූපය 181. අනුරාධපුර පූජා නගරයේ ඇතුල් නුවර පිහිටි මෙම පෙදෙසෙහි උස් ගස්, වැල් සහ පඳුරු බොහෝ ය. මෙහි සමනල විවිධත්වය ඉතා පොහොසත් ය. ගැමියන් 'බෙල් කොටස' යනුවෙන් හඳුන්වනු ලබන මෙම ප්‍රදේශය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු ය (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මිහින්තලය පරිශ්‍රයේ වූ කණ්ඨක චෛත්‍යය ආශ්‍රිත කලාපය ද සමනලයින්ගෙන් ඉතා පොහොසත් ය. උස් තුරු මුදුන්වලින් හා ගල් ගුහාවලින් යුත් ස්වාභාවික සෞන්දර්යයෙන් අනූන මෙම බිම් පෙදෙස ඉහළ සමනල විවිධත්වයක් දරයි (රූපය 182). මෙහි වූ මංපෙත් දෙපස කාකයින් (*Euploea* spp.) විශාල රංචු දැකිය හැකි ය. උන් මංපෙත් දෙපස වූ පඳුරු හා වැලි සහිත පොළොවේ වසා සිටින අයුරු උණුසුම් උදය කාලයේ දී දැකිය හැකි විසිතුරු දසුනකි (රූපය 183). ඊට අමතරව නිල් ජවසැරියා, රැවටිලි පැපිලියා, මයුර පැපිලියා හා කහවන් පිමිසැරියන් ද මෙහි හමුවන සුලබ සමනලයින් වේ.



රූපය 182. මිහින්තලය පරිශ්‍රයේ උස් තුරු මුදුන්වලින් හා ගල්ගුහාවලින් සැදුම් ලත් මෙම පරිසරයේ සමනලයින් බහුලව වාසය කරයි (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 183. මිහින්තලය පරිශ්‍රයේ කණ්ඨක චෛත්‍ය අසල මංපෙත් දෙපස ජීවත් වන කාකයින් (***Euploea* spp.**). උන් මංපෙත් දෙපස වූ පඳුරු හා වැලි සහිත පොළොවේ වසා සිටින අයුරු (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අනුරාධපුර පෙදෙස ආශ්‍රිතව ගැවසෙන සමනලයින් පිළිබඳ මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට අපි බලාපොරොත්තු නොවෙමු. මක් නිසාද යත් මේ කලාපය තුළ වසන සමනලයින් පිළිබඳ අප දීර්ඝ වශයෙන් තවදුරටත් පර්යේෂණ සිදුකළ යුතුව ඇති බැවිනි. එසේ වුවද පරිසරයේ වසන අපෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩ අතරින් බොහෝ දෙනෙකුගේ සිත් ගන්නා සමනලයින් පිළිබඳ පරිච්ඡේදයක් මෙම පොතට ඇතුළත් කළ යුතු යැයි අපි සිතුවෙමු. තවත් විශාල විශේෂ සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට හැකි වුවද මෙහිදී විස්තර කරන ලද්දේ වඩාත් සුලබ, බොහෝ ප්‍රචලිත සමනල විශේෂ පිළිබඳ පමණි. 2012 දී කරුණාරත්න ඇතුළු පිරිස මෙම කලාපයට නුදුරු පුත්තලම ප්‍රදේශයේ ගෙවතු ආශ්‍රිතව ජීවත් වන සමනලයින් පිළිබඳ සිදුකළ පර්යේෂණවලදී සමනල් විශේෂ 66 ක් වාර්තා කිරීමට සමත්ව ඇත (Karunarathna *et al*., 2012). මෙම වියළි පෙදෙසේ බොහෝ කෘමි සතුන් වාසය කළ ද උන් පිළිබඳ තොරතුරු දැක්වීම අප විසින් සිතාමතාම සීමා කරන ලද්දේ මෙම කෘතියේ මූලික අන්තර්ගතයට එය බාධාවක් වන බැවිනි. ඉහත දක්වන ලද සමනලයින්ගේ සිංහල නාමයන් අප වෙත ලබාදෙන ලද්දේ සමනලයින් පිළිබඳ පර්යේෂකයෙකු වූ හිමේෂ් ජයසිංහ විසිනි. අනුරාධපුරයේ ජීවත් වන සමනලයින් පිළිබඳ ඉදිරිපත් කරන ලද මෙම පරිච්ඡේදය සම්පාදනය කිරීමේදී ආචාර්ය ජෝර්ජ් වැන් ඩර් පූර්ටන් හා හිමේෂ් ජයසිංහ ලැබූ අත්දැකීම් බෙහෙවින් දායක කරගත් බව සඳහන් කළ යුතුය.

ගොළුබෙල්ලන්

ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වය නියෝජනය කරනු ලබන ඉතා වැදගත් අපෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩයක් ලෙස භෞමික ගොළුබෙල්ලන් (land snails) හඳුන්වාදිය හැකි ය. එම ගොළුබෙල්ලන් අතර සැලකිය යුතු විවිධත්වයක් පවතී. කවච නොදරන හංගොල්ලන් (slugs) හා ගොළුබෙල්ලන් මෙන්ම මුහුදේ වසන දැල්ලන්, බූවල්ලන් ආදි අපෘෂ්ඨවංශීන්හට සත්ත්ව විද්‍යාවේදී පොදුවේ මොලස්කාවන් (mollusca) යනුවෙන් හැඳින්වේ. ඉන් භෞමික හා ජලජ පරිසරවාසී හංගොල්ලන් හා ගොළුබෙල්ලන් ගැස්ට්‍රොපෝඩාවන් ලෙස හඳුන්වනු ලබයි. පැහැදිලි හිසකින් ද, පළල් පේශීමය පාදයකින් ද අන්තරංග ගොනුවකින් ද සමන්විත භෞමික ගැස්ට්‍රොපෝඩාවන් විශේෂ 253 ක් ජීවත් වන අතර ඉන් විශේෂ 205 ක් ශ්‍රී ලංකාවට ආවේණික වේ (Ranawana & Priyadarshana, 2012). එය එසේ වුවද තවමත් විද්‍යාත්මකව නම් නොකරන ලද විශේෂ සැලකිය යුතු සංඛ්‍යාවක් මෙහි වසන බව ඒ පිළිබඳ පර්යේෂණවල නිරත විද්වතුන්ගේ මතයයි. පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ ගැස්ට්‍රොපෝඩාවන් පිළිබඳ පර්යේෂණවල නිරත වූ ෆ්‍රෙඩ් නැග්ස් හා ඩිනසාර්ඩ් රහීම් ඇතුළු කණ්ඩායම ශ්‍රී ලංකාවේ මොලස්කාවන් පිළිබඳ සිදුකරන ලද පර්යේෂණ මඟින් මෙම නවතම තොරතුරු අනාවරණය කොටගෙන ඇත. මොලස්කාවන් අතරින් අප මෙහිදී විශේෂයෙන්ම සාකච්ඡා කරනුයේ කැල්සියම්වලින් සෑදුණු කවච දරන අනුරාධපුර පෙදෙස ආශ්‍රිතව වසන ගොළුබෙල්ලන් පිළිබඳව ය (Naggs *et al.*, 2005; Raheem & Naggs, 2006).

අප බොහෝ දෙනෙකු සිතනුයේ ගොළුබෙල්ලන් යනු ශාකවලට දැඩි ලෙස හානි පමුණුවන කරදරකාරී සත්ත්ව කාණ්ඩයක් බව ය. අපගේ බෝගවලට වඩාත්ම හානි පමුණුවනුයේ දේශීය ගොළුබෙල්ලන් නොව අහම්බෙන් මෙන් විදේශයන්ගෙන් මෙරටට පැමිණි නොඑසේ නම් අප නොදැනුවත්වම හඳුන්වාදුන් හංගොල්ලන් හා ගොළුබෙල්ලන් ය. විදේශයන්ගෙන් හඳුන්වාදුන් මෙම ගොළුබෙල්ලන් අප පරිසරය තුළ නොසිතූ ලෙස රිසිසේ බෝවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අද උන් 'පළිබෝධක මොලස්කාවන්' ලෙස සඳහන් කිරීමට තරම් විශාල හා බරපතළ පාරිසරික ප්‍රශ්නයක් වී ඇත. පොදුවේ සලකා බැලූ කල ඇතැම් මොලස්කාවන් මාංශ භක්ෂකයින් වේ. උන් පරිසරයේ ජීවත් වන තවත් අපෘෂ්ඨවංශීන් ගොදුරු කර ගනියි. එමෙන්ම තවත් විශේෂ ගස් මත හා ගල් මත වැවෙන පුස් හා ලයිකන වර්ග ද, බහුතරයක් මියගිය හා දිරා යන ශාක කොටස් මත ද යැපේ. එම නිසා උන් ප්‍රාථමික වියෝජකයින් ලෙස පිළිගැනේ.

වර්තමානයේ ජීවත්වන ඇතැමුන් මුහුදු බෙල්ලන් හා භෞමිකව වසන ගොළුබෙල්ලන් තම ආහාරයට එක් කර ගනියි. මෙම සතුන් ඉහළ ප්‍රෝටීන ප්‍රභවයන් වන බැවින් බොහෝ ජනකොටස් අතර බෙල්ලන් ඉතා ප්‍රණීත ආහාරයක් වේ. එය ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ම පැවත ආ ආහාර පුරුද්දක් බැව් පුරාවිද්‍යාඥයින් හා සත්ත්ව පුරාවිද්‍යාඥයින් මේ වන විටත් පැහැදිලි ලෙස හඳුනාගෙන ඇත. බුලත්සිංහල ෆාහියන් ලෙන, කුරුවිට බටදොඹ ලෙන, කිතුල්ගල බෙලි ලෙන, අත්තනගොඩ අළු ලෙන, අලවල පොත්ගුල් ලෙන, සීගිරිය අසල පිහිටි පොතාන හා අලිගල ආදි ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථානවල කළ කැණීම් මඟින් ගස් ගොළුබෙල්ලන්ට හා දිය ගොළුබෙල්ලන්ට අයත් කවච දහස් සංඛ්‍යාත ප්‍රමාණයක් සොයාගෙන ඇත. අප රට විසූ ප්‍රාග් ඓතිහාසික මානවයා හෙවත් බලංගොඩ මානවයා අදින් වසර 48,000 ක පමණ ඉහත සිටම ගොළුබෙල්ලන් තම ආහාරයට එක්කොට ගෙන ඇති බව ඉතා පැහැදිලි ය. එසේ ආහාරයට ගෙන ඇත්තේ පහතරට තෙත් කලාපීය වැසි වනාන්තර ආශ්‍රිතව වාසය කරන *Oligospira* හා *Acavus* යන ගණයන්ට අයත් ගස් ගොළුබෙල්ලන් හා එම පරිසරයේ ඇළ දොළවල ජීවත් වන *Paludomus* යන ගණයට අයත් දිය ගොළුබෙල්ලන් ය. අප මෙහිදී බලාපොරොත්තු වන්නේ මෙම මෘද්වංගී සත්ත්ව කාණ්ඩය ජෛවවිවිධත්වයේ කොටස්කරුවන් සේම උන් මනුෂ්‍ය ජීවිතයට කෙතරම් සමීප ද යන්න පෙන්වාදීමට ය (Deraniyagala, 1992; Perera, 2010; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).

ශ්‍රී ලංකාවේ ජීවත්වන බොහෝමයක් ගොළුබෙලි විශේෂ ඔවුනටම සුවිශේෂී වූ පරිසරයන්ට හා නිකේතනවලට සීමා වී ඇත. මෙරට වාර්තා වන ගොළුබෙල්ලන්ගෙන් බහුතරය ව්‍යාප්තව ඇත්තේ නිරිතදිග හා බස්නාහිර පෙදෙස්වල පැතිර ඇති තෙත් කලාපීය වැසි වනාන්තරවල ය. එසේ වුවද ඇතැම් විශේෂ අනුරාධපුරය වැනි වියළි කලාපීය තැනිතලා පෙදෙස්වල පැතිර ජීවත් වේ. වියළි කලාපීය පරිසරයේ වසන ගොළුබෙල්ලන් වැසි නොලැබෙන සමයේ තරමක් අක්‍රියව ජීවත් වුවද ඊසානදිග මෝසමත් සමඟ උන් ක්‍රියාශීලී වේ. වැසි සමයේදී මෙම ගොළුබෙල්ලන් ගස් කඳන්, ගල් හා ශාක පත්‍ර අතර ගමන් කරනු දැකිය හැකි ය. වැසි නොලැබෙන වියළි සමයේ උන් දිරායන කොළ රොඩු වැනි තෙත් වාසස්ථානවල දිවි ගෙවයි. අනුරාධපුරය හා ඒ ආශ්‍රිත කලාපයේ වාසය කරන ගොළුබෙල්ලන් අතරින් පහත දැක්වෙන විශේෂ පිළිබඳ ඔබගේ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වෙමු. එනම්, *Beddomea trifasciatus* (රූපය 184), *Rhachistia pulcher*, *Rhachistia adumbratus* (රූපය 185), *Rachis punctatus* (රූපය 186), *Mirus panos*, *Macrachlamys vlipensa*, *Cryptozona semirugata* (රූපය 187), *Cryptozona bistrialis*, *Aulopoma* var. *hofmeisteri*, *Aulopoma grande* (රූපය 188),



රූපය 184. ***Beddomea trifasciatus*** (උපරිම උස මිලිමීටර් 28.61) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 185. ***Rhachistia adumbratus*** (උපරිම උස මිලිමීටර් 16.94) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 186. ***Rachis punctatus*** (උපරිම උස මිලිමීටර් 17.98) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 187. ***Cryptozona semirugata*** (උපරිම විශ්කම්භය මිලිමීටර් 32.98) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 188. ***Aulopoma grande*** (උපරිම විශ්කම්භය මිලිමීටර් 21.80) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 189. ***Euplecta* spp.** (උපරිම විශ්කම්භය මිලිමීටර් 18.19) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 190. ***Cyclophorus involvulus*** (උපරිම විශ්කම්භය මිලිමීටර් 28.81) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 191. ***Trachia vittata*** (උපරිම විශ්කම්භය මිලිමීටර් 24.67) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

Indoartemon layardianus, *Micraulax coeloconus*, *Pterocyclus troscheli*, *Glessula veruina*, *Theobaldius* spp., *Euplecta* spp. (රූපය 189), *Cyclophorus involvulus* (රූපය 190), *Trachia vittata* (රූපය 191) ආදි විශේෂ අප විසින් මෙම පෙදෙස ආශ්‍රිතව කෙරුණු ගවේෂණවලදී නිරීක්ෂණය කෙරිණි (මීට අමතරව ශ්‍රී ලංකාවේ මොලස්කාවන් පිළිබඳ පර්යේෂකයෙකු වන මහේෂ් ප්‍රියදර්ශන සමඟ කළ සාකච්ඡා තුළින් ලබාගත් දත්තයන් ද මේ සඳහා උපකාර කරගැනිණි). අනුරාධපුර පෙදෙසේ ජීවත් වන ගොඩ ගොළුබෙල්ලන් දැඩි වියළි සමයන්හි පවා තම ජීවිතය රැක ගැනීමට අනුවර්තනය වූවන් වේ. ස්වාභාවික පරිසරයේදී ගොළුබෙල්ලන්ගේ ගහනය පාලනය වීම සඳහා ඇටි කුකුළන් (*Centropus sinensis*), මුගටීන් හා හෝතඹුවන් (*Herpestes* spp.) ගේ ආහාර රටා උපකාරී වනු ඇත. ඊට අමතරව කබරගොයින් (*Varanus salvator*) සහ තලගොයින් ද (*Varanus bengalensis*) ගොළුබෙල්ලන් තම ආහාරයට එක් කර ගැනීමෙන් ගොළුබෙලි ගහනය පාලනය කිරීමට උදව් වේ. හේන් වගාව සඳහා ලඳු කැලෑ ගිනි තැබීමෙන් අනතුරුව මියගිය ගොළුබෙල්ලන්ගේ කවච අප නිරීක්ෂණය කර ඇත. විශේෂයෙන්ම *Cryptozona semirugata*, *Aulopoma* var. *hofmeisteri*, *Theobaldius* spp. හා *Micraulax* spp. යන ගොළුබෙලි විශේෂ

මේ අතර වේ. වියළි සමයේදී හේන් ගිනිතබන විට ගොළුබෙල්ලන් මුලුමනින්ම පාහේ මියගිය ද ඊළඟ මෝසම් වැස්සත් සමඟ ඉන් පෙර ජීවත් වූ ගොළුබෙලි විශේෂ නැවතත් එහි දැකිය හැකි ය. ඒ අනුව පැහැදිලි වනුයේ අනුරාධපුරය වැනි වියළි පෙදෙස්වල වුවද ස්වාභාවික පරිසරයේ ඉතා පොහොසත් ගොළුබෙලි ගහනයක් ජීවත් වන බව ය. පුරාණයේ සිටම සාම්ප්‍රදායික ගොවිතැනෙහි නිරත වූ අපේ මුතුන්මිත්තන් මෙම ගොළුබෙල්ලන් පිළිබඳ දැන සිටින්නට ඇත. ඒ, වර්ෂාව ඇතුළු කාලගුණික විපර්යාසයන් මෙම ගොළුබෙල්ලන්ගෙන් දැන හැඳිනගන්නට ඇති බව අනුමාන කළ හැකි බැවිනි. මක්නිසාද යත් ගොළුබෙල්ලන් යනු පරිසරය තුළ සිදුවන වෙනස්වීම් අපට දැනුම් දෙන දර්ශක ජීවීන් (bio-indicator species) වන බැවිනි.

ඊට අමතරව අනුරාධපුර ඇතුල් නුවර කළ පුරාවිද්‍යාත්මක කැණීම් මඟින් ද ක්‍රි.පූ. 900 පමණ සිට වාර්තාවන සංස්කෘතික සන්දර්භවලින් වර්තමානයේ ජීවත් වන ගොඩ ගොළුබෙලි විශේෂ හමුවී ඇත. බොහෝ සේ තුනී කවච දරන *Rhachistia pulcher*, *Beddomea trifasciatus* ආදි විශේෂ එම සන්දර්භ අතර මනාව සුරක්ෂිත නොවුවද බෙල්ලන්ගේ කවච කැබලි හමුවේ. එසේ වුවද *Cryptozona semirugata* කවච එම පුරාණ සන්දර්භ අතර සුලබ වේ. මෙම සාධක අනුව පැහැදිලි වනුයේ අදින් වසර 3000 කට පමණ පෙර අනුරාධපුර පෙදෙසේ ජීවත් වූ ගොඩ ගොළුබෙල්ලන් වර්තමානය දක්වා ඒ ආකාරයෙන්ම පැවත එන බව ය.

ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපීය වැසි වනාන්තරවාසී *Acavus* ගණයට අයත් ගස් ගොළුබෙලි විශේෂ 3 ක් වාසය කරන අතර විශේෂ සියල්ලම පාහේ මෙරටට ආවේණික වේ. මෙම ගස් ගොළුබෙල්ලන් තෙත් කලාපීය දර්ශක ජීවී විශේෂ ලෙස හැඳින්වීමට තරම් තෙත් පරිසරයන්ට වඩාත් සංවේදීතාවයක් දක්වයි. අනෙකුත් ගොළුබෙලි විශේෂයන්ට සාපේක්ෂව විශාල බිත්තර මඟින් තම වර්ගයා බෝකරන අතර එම බිත්තර වැසි වනයේ තෙත් කොළරොඩු අතර සඟවා එයට ආරක්ෂාව ලබාදේ. මෙම ගස් ගොළුබෙල්ලන් වියළි පාරිසරික තත්ත්වයන් යටතේ කිසිවිටෙකත් ජීවත් නොවනුයේ උන් තෙත් පරිසරයන්ට එතරම් ම අනුවර්තනය වී ඇති බැවිනි. එසේ වුවද *Acavus phoenix* නම් විශේෂයේ උප විශේෂයක් ලෙස ගැනෙන *Acavus phoenix castaneus* (රූපය 192) අනුරාධපුර දිස්ත්‍රික්කයේ රිටිගල වනාන්තරයේ වාසය කිරීම ඉතා සුවිශේෂී කරුණක් ලෙස මෙහිලා සඳහන් කළ යුතුව ඇත. මෙම ගස් ගොළුබෙල්ලා රිටිගල වනයේ තෙත් පාරිසරික තත්ත්වයන් යටතේ ජීවත් වන අතර එය මෙරට සත්ත්ව ව්‍යාප්තිය නම් විෂයය තුළ ඉතා සුවිශේෂී සාධකයක් ලෙස දැක්විය හැකි ය. මෙම ගස් ගොළුබෙල්ලන් වියළි කලාපය තුළ වාර්තා වන එකම ස්ථානය රිටිගල වේ. රිටිගල යනු වියළි කලාපය තුළ පිහිටි තෙත් කලාපීය ලක්ෂණ පෙන්වන දූපතක් ලෙස හැඳින්වීමට තරම් ශාකවලත්, සතුන්ගේත් විශේෂතා පෙන්වන ප්‍රදේශයක් ලෙස දැක්විය හැකි ය.



රූපය 192. ***Acavus phoenix castaneus***
(ඡායාරූපය: මහේෂ් ප්‍රියදර්ශන)

ජලජ පරිසරයන්ගෙන් අනූන අනුරාධපුර පෙදෙසේ මිරිදිය ගොළුබෙල්ලන් (freshwater snails) පොහොසත් ගහනයක් වෙසේ. වැව් හා වගුරුවල කොතරම් ගොළුබෙල්ලන් වාසය කරනු ඇතැයි දැක ගැනීමට වියළි සමයේ සිඳෙමින් පවතින ජලාශවල ජල මායිම් නිරීක්ෂණය කිරීමෙන් වැටහේ. එහි මියගිය දිය ගොළුබෙල්ලන්ගේ කවච විශාල ප්‍රමාණයක් දැකිය හැකි ය. වැව්, පොකුණු, වගුරු, ඔය,

ඇළ වේලි හා කුඹුරුවල අප කළ නිරීක්ෂණයන්ට අනුව පහත දැක්වෙන දිය ගොළුබෙල්ලන් මෙම කලාපයේ වාසය කරන බැව් අනාවරණය කරගැනීමට හැකි විය. එනම්, *Paludomus torrenticolus*, *Paludomus chilinoides*, *Bellamya ceylonica* (රූපය 193), *Bellamya ceylonica ecarinata* (රූපය 194), *Thiara scabra*, *Melanoides tuberculata* (රූපය 195), *Bithynia stenothyroides*, *Bithynia inconspicua*,



රූපය 193. ***Bellamya ceylonica*** (උපරිම උස මිලිමීටර් 27.27) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 194. ***Bellamya ceylonica ecarinata*** (උපරිම උස මිලිමීටර් 19.88) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 195. ***Melanoides tuberculata*** (උපරිම උස මිලිමීටර් 26.07) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 196. ***Indoplanorbis exustus*** (උපරිම විශ්කම්භය මිලිමීටර් 16.95) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 197. ***Pila globosa*** (උපරිම උස මිලිමීටර් 47.32) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 198. ***Lymnaea pinguis*** (උපරිම උස මිලිමීටර් 25.83) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 199. *Planorbis elegantulus* (උපරිම විශ්කම්භය මිලිමීටර් 6.78) (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 200. *Lamellidens marginalis* (උපරිම පළල මිලිමීටර් 32.79) (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 201. දිය ගොළුබෙල්ලන් වැඩිවශයෙන් ජීවත් වනුයේ ජලජ ශාකයන්ගෙන් අනූන, නොගැඹුරු දිය ඇති මෙවැනි වැව් තාවලුවල ය. බුලංකුළම වැව් තාවල්ල, අනුරාධපුරය (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

Gyraulus saigonensis, *Indoplanorbis exustus* (රූපය 196), *Mysorella costigera*, *Pila globosa* (රූපය 197), *Pila layardi*, *Lymnaea pinguis* (රූපය 198), *Planorbis elegantulus* (රූපය 199) හා *Faunus ater* යන ගොළුබෙලි විශේෂ ද, මීට අමතරව *Lamellidens marginalis* (රූපය 200), *Lamellidens marginalis lamellatus*, *Parreysia corrugata* හා *Polymesoda zeylonica* යන දෙපියන් බෙලි විශේෂ ද මෙහි මිරිදියෙහි වාසය කරයි. ඉහත විශේෂවලට අමතරව තවත් වාර්තා නොවූ බෙල්ලන් මෙම කලාපයේ ඇති බව අපගේ අනුමානය යි. අප විසින් මේ කලාපයේ සිදුකළ දිය ගොළුබෙලි අධ්‍යයනවලදී 1974 දී ෆර්ඩිනෑන්ඩ් ස්ටාර්මුල්නර් හා ගර්හාර්ඩ් හාඩ්ල් යන දිය ගොළුබෙල්ලන් පිළිබඳ විශේෂඥයින් විසින් ශ්‍රී ලංකාවේ එවකට පැවැත්වූ පර්යේෂණ තොරතුරු ද ආධාර කර ගතිමු (Starmuhlner, 1974; Hadl, 1974; Fernando & Weerawardhena, 2002).

ඉහත දිය ගොළුබෙල්ලන් අතරින් *Paludomus* ගණයට අයත් විශේෂ ගලා යන ජලයේ ජීවත් වේ. මෙහි වූ සෑම වැවකම තාවලු පෙදෙසේ වූ රොන් මඩ අතර සහ මල්වතු ඔයේදී දිය ගොළුබෙල්ලන් බහුලව දැකිය හැකි ය (රූපය 201). මේ අතරින් *Pila globosa* නමැති ප්‍රමාණයෙන් විශාල වටකුරු හැඩයෙන් යුත් පිධානයක් හෙවත් දොරටුවක් ආකාර අවයවයක් දරන ගොළුබෙල්ලා සඳහන් කළ හැකි ය.

අනුරාධපුර ප්‍රදේශයේ වූ වැව්, වගුරු හා කුඹුරු ආශ්‍රිතව වෙසෙන දෙපියන් බෙල්ලන් (විශේෂයෙන්ම *Lamellidens marginalis*) ආහාරයට ගන්නා පක්ෂියෙකි විවර තුඩුවා (*Anastomus oscitans*). මෙම පරිසරවල වසන දෙපියන් බෙල්ලන් විවර තුඩුවාගේ ප්‍රධාන ආහාරය වන අතර දවස පුරාම පාහේ උන් බෙල්ලන් දඩයමේ යෙදේ. මේ අනුව සලකා බැලූ කල විවරතුඩුවා දෙපියන් බෙලි ගහනය සමතුලිතව පවත්වාගෙන යාම සඳහා උපකාර වේ.

මිරිදිය මත්ස්‍යයින්

වසර 2500 කට අධික කාලයක් උතුරුමැද පළාත ඇතුළු වියළි කලාපයේ බොහෝ පෙදෙස් ජනාවාස වී තිබුණේ කෘෂිකර්මාන්තය මූලික කොටගත් ජන සමාජයකිනි. සුලු වශයෙන් ආරම්භව මහා පරිමාණව ව්‍යාප්ත වූ වාරි කර්මාන්තය හේතුවෙන් උතුරුමැද පළාතේ වූ ස්වාභාවික ජල පද්ධතිය ශීඝ්‍රයෙන් වෙනස්වීම්වලට භාජනය විය. ඊසානදිග මෝසමෙන් පතිත වන වැසි දිය එකතු වී ඇතිවුණු තාවකාලික "පතස්" වෙනුවට බැම්මක් ඉදිකිරීම මගින් එතැන කුඩා ප්‍රාථමික ජලාශයක් ද ඉන් අනතුරුව එය විශාල ජලාශයක් වී පසු කලෙක වැවක් ලෙස ද ස්ථාපිත විය (රූප 202, 203, 204). ආර්.එල්. බ්‍රෝහියර් විසින් ශ්‍රී ලංකාවේ අනුරාධපුරය ඇතුළු උතුරුමැද කලාපයේත්, සමස්ත වියළි කලාපයේත්



රූපය 202. පළඟස්වැව, අනුරාධපුරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 203. පෙරිමියන්කුලම වැව, අනුරාධපුරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 204. බසවක්කුලම හෙවත් අභය වැව, අනුරාධපුරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ලොකු, කුඩා වැව් 11,200 ක් පමණ වාර්තා කිරීම තුළින් අපගේ රජදරුවන් කොතරම් වැව් ප්‍රමාණයක් ඉදිකළේ ද යන්න සනාථ වේ (Brohier, 1979). මීට සමගාමීව ඉදිවුණු ඇළ වේලිවලින් සැදුම්ලත් ජලවහන පද්ධතිය නිසා තවදුරටත් මේ කලාපයේ ජල පෘෂ්ඨය පුළුල් විය. ස්වාභාවික තත්ත්වයන් යටතේ විශ්ලේෂණය කොට සලකා බලන කල අප්‍රිකාවේ ස්වාභාවික ජලාශ මෙන් ශ්‍රී ලංකාවේ ගැඹුරු ස්වාභාවික ජලාශ නොතිබිණි. නමුත් අද වන විට ඓතිහාසික සමයේ ඉදිවුණු ගැඹුරු වැව් මේ වියළි කලාපය සතු ය. අදින් වසර 2000 කටත් පෙර සිටම සිදුවූ මේ විපර්යාසය හේතුකොටගෙන උතුරුමැද පළාතේ (මේ හා සමාන තවත් වියළි කලාපීය පෙදෙස්වල) වූ ජලජ පාරිසරික තත්ත්වයන්ට හුරුවීමට මසුනට සිදුවිය. නමුත් අප මෙම කෘතියෙන් එම ජීවීන්ගේ ජීව විද්‍යාව පිළිබඳ දීර්ඝව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු නොවෙමු. ඉහත මානව ක්‍රියාකාරීත්වය මත ඇති වූ නව ජලජ පරිසරය තුළ මසුන්ට රිසිසේ බෝවීමට ඉඩකඩ ලැබීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇති කරුණකි. ඓතිහාසික යුගයේ සිටම උතුරුමැද පළාතේ ජනතාව තම සත්ත්ව ප්‍රෝටීන අවශ්‍යතා සපුරා ගැනීමට තෝරාගත් මාර්ග අතර වැව් මසුන් ද වූ බව නොරහසකි. මෙහි විසූ ආදි ජනයා මිරිදිය මසුන් ආහාරයට ගත් බව අනුරාධපුර ඇතුල් නුවර කළ පුරාවිද්‍යා කැණීම් මගින් ලද මත්ස්‍ය අවශේෂ සාක්ෂි දරනු ඇත (Young *et al*., 2006). නොගැඹුරු වැව් හා පොකුණුවල ඇතිවුණු ජලජ ශාක ප්‍රජාව නිසා මසුන්ට තව දුරටත් අභිජනන කටයුතු පවත්වාගෙන යාමට පිටිවහලක් ලැබිණි. කෘෂිකර්මාන්තය වෙනුවෙන් ගොඩනැඟුණු මේ විශාල හා කුඩා වැව් මෙන්ම උද්‍යාන අලංකාරය සඳහා සහ පානීය ජලය ගබඩා කිරීම ආදි අවශ්‍යතාවන් බොහොමයක් නිසා ඉදිවුණු පොකුණු ද හේතුවෙන් ජනතාවට මසුන් දඩයම් කිරීමට ඇති ඉඩකඩ මෙන්ම මසුන්හට බෝවීමට ඇති ඉඩකඩ ද බෙහෙවින් පුළුල් විය (රූපය 205). මේ ජල පද්ධතිය තුළ මත්ස්‍ය ගහනය පොහොසත් වීමේ අතුරු ප්‍රතිඵලය වනුයේ මසුන් ආහාරයට ගන්නා ක්ෂීරපායීන්, පක්ෂීන් ඇතුළු අනෙකුත් සතුන්ගේ ගහනය ද ඉහළ යාම ය. මේ සමස්ත ක්‍රියාවලිය තුළ වූ සිදුවීම්වල අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ ඉතා පොහොසත් ජෛවවිවිධත්වයෙන් යුත් ජලය පරිසරයක් බිහිවීම ය.



රූපය 205. තන්තිරිමලය ගල් තලාවේ වූ පොකුණක් (ඡායාරූපයඃ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අප මේ පරිච්ඡේදයෙන් අනුරාධපුරයේ වසන සුලබ මිරිදිය මසුන් පිළිබඳ සාකච්ඡා කරන අතර එහිදී මිරිදිය මත්ස්‍ය විවිධත්වය වෙත විශේෂ අවධානය යොමු කෙරේ. අනුරාධපුර ප්‍රදේශයේ වාර්තා වන, ආහාරයට ගනු ලබන මිරිදිය මසුන් අතර මඩ ආඳා (*Anguilla bicolour*) (රූපය 206), වයිරන් ආඳා (*Anguilla nebulosa*) (රූපය 207), හිරි කනයා (*Labeo dussumieri*) (රූපය 208), තඹලයා (*Labeo lankae*) (රූපය 209), මස් පෙතියා (*Systomus spilurus*) (රූපය 210), දම් කොළ පෙතියා (*Dawkinsia singhala*) (රූපය 211), ඉරි අංකුට්ටා (*Mystus vittatus*) (රූපය 212), කොකුස්සා (*Ompok bimaculatus*) (රූපය 213), මහ වලයා (*Wallago attu*) (රූපය 214), මඟුරා (*Clarias brachysoma*) (රූපය 215), හුංගා (*Heteropneustes fossilis*) (රූපය 216), කහ කොරළියා (*Pseudetroplus maculatus*) (රූපය 217), ගං කොරළියා (*Etroplus suratensis*) (රූපය 218), කාවයියා (*Anabus testudineus*) (රූපය 219),



රූපය 206. මඩ ආඳා (***Anguilla bicolour***) (උපරිම දිග මිලිමීටර් 400-500 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 207. වයිරන් ආඳා (***Anguilla nebulosa***) (උපරිම දිග මිලිමීටර් 1200 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 208. හිරි කනයා (***Labeo dussumieri***) (උපරිම දිග මිලිමීටර් 400 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)




රූපය 209. තඹලයා (***Labeo lankae***) (උපරිම දිග මිලිමීටර් 200-300 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 210. මස් පෙතියා (***Systomus spilurus***) (උපරිම දිග මිලිමීටර් 300 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)




රූපය 211. දම් කොළ පෙතියා (***Dawkinsia singhala***) (උපරිම දිග මිලිමීටර් 100-120 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 212. ඉරි අංකුට්ටා (***Mystus vittatus***) (උපරිම දිග මිලිමීටර් 100 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)




රූපය 213. කොකුස්සා (***Ompok bimaculatus***) (උපරිම දිග මිලිමීටර් 400 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)




රූපය 214. මහ වලයා (***Wallago attu***) (උපරිම දිග මිලිමීටර් 400 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 215. මගුරා (***Clarias brachysoma***) (උපරිම දිග මිලිමීටර් 500 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 216. හුංගා (***Heteropneustes fossilis***) (උපරිම දිග මිලිමීටර් 200-300 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 217. කහ කොරළියා (***Pseudetroplus maculatus***) (උපරිම දිග මිලිමීටර් 70 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 218. ගං කොරළියා (***Etroplus suratensis***) (උපරිම දිග මිලිමීටර් 200 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 219. කාවයියා (***Anabus testudineus***) (උපරිම දිග මිලිමීටර් 150 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)

ලූලා (*Channa striata*) (රූපය 220), ගං තෙලියා (*Mastacembelus armatus*) (රූපය 221), බලි වැලිගොව්වා (*Awaous melanocephalus*) (රූපය 222), මහ වැලිගොව්වා (*Glossogobius giuris*) (රූපය 223) යන විශේෂ මෙහි වූ ජලජ පරිසරය තුළ සුලබව ජීවත් වේ. මෙම මසුන් අතීතයේ ජීවත් වූවන්ගේ මෙන්ම වර්තමාන ගැමියන්ගේ ප්‍රණීත සත්ත්ව ආහාරයන් වේ. මීට අමතරව අනුරාධපුරයේ දියකඩිතිවල සහ වැව්වල සුලබව ජීවත්වන කුඩා මසුන් විශේෂ ගණනාවක් දැකිය හැකි ය. ඔවුන් බොහෝ දුරට නොඟුරු දියකඩිතිවල ද, ජලජ ශාක සහිත වගුරු ආශ්‍රිතව ද ඉතා සුලබ ය. එම මත්ස්‍ය විශේෂ නම් තල් කඩයා (*Pseudosphromenus cupanus*) (රූපය 224), සොරයා (*Amblypharyngodon melettinus*) (රූපය 225), දම් කොළ සාලයා (*Devario malabaricus*) (රූපය 226), රැවුල් දණ්ඩියා (*Esomus thermoicos*) (රූපය 227), ගල් පාඩියා (*Garra ceylonensis*) (රූපය 228), ඉපිල් කඩයා (*Puntius bimaculatus*) (රූපය 229), කර ඇදයින් (*Chela* spp.), කොට පෙතියා (*Puntius thermalis*) (රූපය 230), තිත් පෙතියා (*Pethia melanomaculata*) (රූපය 231), බණ්ඩි තිත්තයා (*Puntius vittatus*) (රූපය 232), දණ්ඩීන් (*Rasbora* spp.) (රූපය 233), පුල්ලි ඇහිරාවා (*Lepidocephalichthys thermalis*) (රූපය 234), උඩ හඳයා (*Aplocheilus parvus*) (රූපය 235) ආදිය වේ. ගල් පාඩියා වේගයෙන් ජලය ගලා යන ඇළ හා ඔයවල මෙන්ම පිටවාන ආදි තැන්වල ද ජීවත් වේ (රූපය 236). ගල් පාඩියාගේ ශරීරය වේගවත් ජලයේ ජීවත් වීමට අනුවර්තනය වී ඇත. එම මූලික අනුවර්තන අතර හිසෙහි යටි පැත්තේ චූෂකරයක් ලෙස ක්‍රියා කරන මුඛය ද, උපස්ථර ග්‍රහණය කළ හැකි පුළුල්, වටකුරු හා ශක්තිමත් ළය හා ශ්‍රෝණි වරල් ද සඳහන් කළ හැකි ය. මෙම කුඩා මිරිදිය මසුන් අතරින් පුල්ලි ඇහිරාවා වඩාත් නම්‍යශීලී, දිගටි සිරුරක් දරයි. සිරුරේ තැන තැන දුඹුරු පැහැ පුල්ලි දරන අතර ශරීරයේ පසුබිම් වර්ණය ළා කහ පැහැයට හුරු ය.




රූපය 220. ලූලා (***Channa striata***) (උපරිම දිග මිලිමීටර් 400-700 ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)



රූපය 221. ගං තෙලියා (***Mastacembelus armatus***) (උපරිම දිග මිලිමීටර් 600-750 ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)

සෙමෙන් ගලන ජලය ඇති වැලි සහිත පත්ලේ මෙම ඇහිරාවන් ජීවත් වේ. උඩ හඳයා කුමුදු ආදි ජලජ පැළෑටි ඇති නොගැඹුරු ජලයේ ජල පෘෂ්ඨයට ප්‍රිය කරයි (රූපය 237). බොහෝ වැව්වල නොගැඹුරු තාවලු පෙදෙසේ උඩ හඳයන් වාසය කරයි. උන් හිස මත ළා කහ පැහැ පුල්ලියකින් ද, ළා කොළ හෝ ඔලිව් පැහැති සිරුරකින් ද සමන්විත ය. ශරීර පාර්ශ්වයේ කහ හෝ නිල් පුල්ලි ඇත (Pethiyagoda *et al*., 2008(a); Pethiyagoda *et al*., 2008(b); Pethiyagoda *et al*., 2008(c)).




රූපය 222. බලි වැලිගොව්වා (***Awaous melanocephalus***) (උපරිම දිග මිලිමීටර් 120-150 ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)



රූපය 223. මහ වැලිගොව්වා (***Glossogobius giuris***) (උපරිම දිග මිලිමීටර් 200 ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)




රූපය 224. තල් කඩයා (***Pseudosphromenus cupanus***) (උපරිම දිග මිලිමීටර් 40 ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)



රූපය 225. සොරයා (***Amblypharyngodon melettinus***) (උපරිම දිග මිලිමීටර් 80ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)



රූපය 226. දම් කොළ සාලයා (***Devario malabaricus***) (උපරිම දිග මිලිමීටර් 80-120 ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)



රූපය 227. රුවුල් දණ්ඩියා (***Esomus thermoicos***) (උපරිම දිග මිලිමීටර් 60-100 ක් පමණ වේ). (චිත්‍රයඃ සම්පත් ගුණතිලක)


මේ මසුන් අතරින් *Labeo lankae* නමින් හැඳින්වෙන තඹලයා 1950 දශකයේ අනුරාධපුරය හා රඹෑව යන පෙදෙස්වල සුලබ මිරිදිය මත්ස්‍ය විශේෂයකි (Deraniyagala, 1952). නමුත් ඉන් අනතුරුව ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් පිළිබඳව පුළුල් ලෙස ගවේෂණවල යෙදුණු මත්ස්‍ය විද්‍යාඥයින්හට මෙම තඹල විශේෂය හමුවී නොමැත (Pethiyagoda, 1991). පසුගිය දශක දෙක තුළ අප විසින් කරන ලද ගවේෂණවලදී ද මේ තඹලයා මෙම කලාපයෙන් හමුනොවීමෙන්ම උන් කෙතරම් දුර්ලභ ද යන්න සනාථ වේ. වැව් ආශ්‍රිතව රංචු වශයෙන් ජීවත් වන සුලබ මත්ස්‍ය විශේෂයකි දම් කොළ පෙතියා. මිලිමීටර් 100-120 ක් පමණ දික්ව වැඩෙන දම්කොළ පෙතියා ශ්‍රී ලංකාවට ආවේණික වේ. පිරිමි සතුන්ගේ පෘෂ්ඨීය වරලේ



රූපය 228. ගල් පාඩියා (*Garra ceylonensis*) (උපරිම දිග මිලිමීටර් 80-150 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 229. ඉඹිල් කඩයා (*Puntius bimaculatus*) (උපරිම දිග මිලිමීටර් 40-70 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 230. කොට පෙතියා (*Puntius thermalis*) (උපරිම දිග මිලිමීටර් 80-150 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 231. තිත් පෙතියා (*Pethia melanomaculata*) (උපරිම දිග මිලිමීටර් 50 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 232. බණ්ඩි තිත්තයා (*Puntius vittatus*) (උපරිම දිග මිලිමීටර් 30-40 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)




රූපය 233. දණ්ඩින් (*Rasbora* dandia.) (උපරිම දිග මිලිමීටර් 150 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)




රූපය 234. පුල්ලි ඇහිරාවා (*Lepidocephalichthys thermalis*) (උපරිම දිග මිලිමීටර් 50 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 235. උඩ හඳයා (*Aplocheilus parvus*) (උපරිම දිග මිලිමීටර් 20-40ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 236. ගල් පාඩියා (*Garra ceylonensis*) මෙවැනි වේගවත් ජලයේ වාසය කළ හැකි මත්ස්‍යයෙකි. මල්වතුඔය, අනුරාධපුරය. (ඡායාරූපයෘ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 237. උඩ හඳයා (*Aplocheilus parvus*) කුමුදු ආදී ජලජ ශාක ඇති මෙවැනි නොගැඹුරු ජලයේ වාසය කරනු ඇත. ගල්කුලම වැව, අනුරාධපුරය. (ඡායාරූපයෘ කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

දිගටි සූත්‍රිකා පිහිටයි. මෙම මත්ස්‍යයා ගලා නොයන ජලය ඇති වැව්වල මෙන්ම ගලන ජලයේ ද එක ලෙස ජීවත් වේ. මීට අමතරව ඉරි අංකුට්ටා ද ජලජ පැළෑටි ගහන දියකඩිතිවල සුලබව හමුවේ. අංකුට්ටන් බොහෝ දුරට නිශාචර මත්ස්‍යයින් වන අතර දිවා කල ජල පත්ලේ හෝ ඉවුරුවල වූ ගස් මුල් හා ගල් අතර සැඟව ජීවත් වේ. මගුරා නිශාචර, මෙරටට ආවේණික මිරිදිය මත්ස්‍යයෙකි. මිලිමීටර් 500 ක් පමණ දික්ව වැඩෙන මගුරා දුඹුරු පැහැයට හුරු ය. මගුරන්ගේත්, හුංගන්ගේත්, අංකුට්ටන්ගේත් සඟල වරල් ලෙස ගැනෙන ළය වරලේ කණ්ඨකයක් දරයි. එම කණ්ඨකයේ ශරීරය දෙසට යොමු වුණු සියුම් දැති පිහිටයි. එය මිනිසුන්ගේ ශරීරයේ ඇනුණු විට දැඩි වේදනාවක් හා කොරවීමක් ඇති වන්නේ ඒවායේ ස්නායුක විෂ ඇති බැවිනි. වියළි කලාපයේ ජනතාවගේ මත්ස්‍ය ආහාරයේ ප්‍රචලිත විශේෂයකි, ලූලා. ලූල් පැටවුන් කුඩා කල රතු පැහැති ය. පැටවුන් මව්පියන්ට ඉතා සමීපව ඔවුන්ගේ ආරක්ෂාව යටතේ වැඩේ. ලූලන්ගේ අභිජනනය සිදුවනුයේ ඊසානදිග මෝසමත් සමඟ ලැබෙන නැවුම් ජලයේ ය. උන් ඒ සඳහා වඩාත් ප්‍රිය කරනුයේ ජලජ පැළෑටි ගහන වැව්වලට ය. දණ්ඩීන් විශාල රංචු වශයෙන් ගංගා හා වැව්වල ජීවත් වේ. ප්‍රමාණයෙන් කුඩා වුවද මිනිසුන් ඔවුන් ද තම ආහාරයට එක් කරගැනීමට මැළි නොවෙති. මෙම කලාපයට බලපාන අධික වියළි හෝ නියං සමයේදී මඩ තුළ සැඟවී ඊළඟ වර්ෂාව ඇරඹෙන තෙක් දිවි රැකගැනීමේ හැකියාව මගුරාටත්, හුංගාටත් විශේෂයෙන්ම කාවයියාටත් ඇත. මේ මසුන් තිදෙනාම වාතයේ වූ ඔක්සිජන් සෘජුවම ශ්වසනය කිරීමේ හැකියාව පරිණාමීයව උරුම කොටගෙන ඇති නිසා වියළි කාලය තරණය කිරීමට සමත් වේ.

මීට ශතවර්ෂ හයකයට පමණ පෙර සිට වැඩි ඵලදාවක් ඇති, ප්‍රමාණයෙන් විශාල විදේශීය මසුන් ආහාර අවශ්‍යතාවන් පිරිමැසීම පිණිස ශ්‍රී ලංකාවේ ජලාශවලට හඳුන්වා දී ඇත. ග්‍රාමීය ජනතාවට අඩු වියදමකින් සහ වඩා පහසුවෙන් ප්‍රෝටීන අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා මෙලෙස විදේශීය මසුන් මෙරට මිරිදිය ජලයට හඳුන්වා දුනි. මේ අතරින් අනුරාධපුරය ද ඇතුළු සමස්ත වියළි කලාපයේ වඩාත්ම ප්‍රචලිත වූයේ අප්‍රිකාවෙන් මෙරටට හඳුන්වාදුන්, ජපන් කොරළි හෝ ජපන් බට්ටන් යනුවෙන් ගැමියන් හඳුන්වන තිලාපීන් ය. තිලාපීන් ඉතා ඉක්මනින් බෝවන මත්ස්‍ය විශේෂයන් ය. උන්ගේ බිත්තර වැඩිහිටියන් විසින් ආරක්ෂා කිරීමත්, ඉන් අනතුරුව එයින් බිහිවන පැටවුන් ද වැඩිහිටියන් විසින් රැකබලා ගැනීමත් නිසා තිලාපීන්ගේ ගහනය අනෙක් මිරිදිය මත්ස්‍ය විශේෂ අභිබවා ඉහළ ගොස් ඇත. පහත දක්වා ඇත්තේ අනුරාධපුරය හා ඒ ආශ්‍රිත වැව්වල හමුවන විදේශීය රටවලින් හඳුන්වා දුන් මිරිදිය මසුන් වේ. එනම් කාප් (*Carassius auratus*) (රූපය 238), රිදී කාපයා (*Hypothalmichthys molitrix*) (රූපය 239), මිරිගල් (*Cirrhinus mrigala*) (රූපය 240), කැට්ලා (*Catla catla*) (රූපය 241), හිස ලොකු කාපයා (*Aristichthys nobilis*) (රූපය 242), තිලාපියා හෙවත් ජපන්බට්ටා (*Oreochromis mossambicus*) (රූපය 243), තිලාපියා හෙවත් ජපන් බට්ටා (*Oreochromis niloticus*) (රූපය 244), රොහු (*Labeo rohita*) (රූපය 245) ආදි මසුන් වේ (ගුණතිලක, 2007).



රූපය 238. කාප් (***Carassius auratus***) (උපරිම දිග මිලිමීටර් 600-700 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)



රූපය 239. රිදී කාපයා (***Hypothalmichthys molitrix***) (උපරිම දිග මිලිමීටර් 1050 ක් පමණ වේ). (චිත්‍රයෘ සම්පත් ගුණතිලක)

ඉහත දක්වා ඇති මසුන් ප්‍රධාන වශයෙන්ම නැගෙනහිර ආසියාව, යුරෝපය, චීනය, ඉන්දියාව, අග්නිදිග ආසියාව හා අප්‍රිකාව ආදී රටවල් හා කලාපවලින් හඳුන්වා දුන් මසුන් ය. ඓතිහාසික සමයේදී මෙන් නොව, අද සමස්ත වියළි කලාපයේ ජීවත්වන ජනතාව අතර වඩාත්ම ප්‍රචලිතව ඇත්තේ හඳුන්වා දුන් මසුන් වේ. ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන් බොහොමයක් ප්‍රමාණයෙන් කුඩා වීම නිසා මේ හඳුන්වා දුන්



රූපය 240. මිරිගල් (***Cirrhinus mrigala***) (උපරිම දිග මිලිමීටර් 400 ක් පමණ වේ). (චිත්‍රය: සම්පත් ගුණතිලක)



රූපය 241. කැට්ලා (***Catla catla***) (උපරිම දිග මිලිමීටර් 600 ක් පමණ වේ). (චිත්‍රය: සම්පත් ගුණතිලක)



රූපය 242. හිස ලොකු කාපයා (***Aristichthys nobilis***) (උපරිම දිග මිලිමීටර් 600-1120 ක් පමණ වේ). (චිත්‍රය: සම්පත් ගුණතිලක)



රූපය 243. තිලාපියා හෙවත් ජපන් බට්ටා (***Oreochromis mossambicus***) (උපරිම දිග මිලිමීටර් 350 ක් පමණ වේ). (චිත්‍රය: සම්පත් ගුණතිලක)



රූපය 244. තිලාපියා හෙවත් ජපන් බට්ටා (***Oreochromis niloticus***) (උපරිම දිග මිලිමීටර් 400 ක් පමණ වේ). (චිත්‍රය: සම්පත් ගුණතිලක)



රූපය 245. රොහු (***Labeo rohita***) (උපරිම දිග මිලිමීටර් 1000-2000ක් පමණ වේ). (චිත්‍රය: සම්පත් ගුණතිලක)

ප්‍රමාණයෙන් විශාල මසුන් වඩාත් ප්‍රචලිත වීමට හේතු විය. අනුරාධපුර මිරිදිය මසුන් පිළිබඳ ලියැවුණු මෙම පරිච්ඡේදය සම්පාදනය කිරීමේදී IUCN ආයතනයේ සම්පත් ගුණතිලක දැක්වූ දායකත්වය බෙහෙවින් අගය කරමු.

උභයජීවීන්

අද වන විට ශ්‍රී ලංකාවේ වාර්තාගත මුළු උභයජීවී විශේෂ සංඛ්‍යාව 120 ක් පමණ වේ. එයට මැඩියන්, ගෙම්බන් හා පාද රහිත සර්ප හෝ ගැඩවිලි පණු ආකාර දරන හිරිදණ්ඩන් ආදින්ගේ නියෝජනයක් ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ තෙත් කලාපය උභයජීවී විවිධත්වය අතින් දකුණු ආසියාවේ අතිශයම වැදගත් කලාපයක් ලෙස හැඳින්විය හැකි ය. මෙරටට ආවේණික උභයජීවීන්ගෙන් බහුතරයක් නිරිතදිග ප්‍රදේශයේ, මධ්‍යම කඳුකරයේ හා නකල්ස් කඳුකරය ඇතුළු තෙත් කලාපයේ පැතිර ඇති වැසිවනාන්තරවල ජීවත් වේ. වියළි කලාපයේ ජීවත් වන උභයජීවීන්ගෙන් සමහරක් දකුණු ඉන්දියාවේ ද වෙසේ(Dutta&Manamendra-Arachchi,1996;Manamendra-Arachchi&Pethiyagoda,1998;Manamendra-Arachchi & Pethiyagoda, 2005; Meegaskumbura & Manamendra-Arachchi, 2005; මනමේන්ද්‍ර-ආරච්චි සහ පෙතියාගොඩ, 2006; Pethiyagoda *et al.*, 2006; Meegaskumbura *et al.*, 2007; Meegaskumbura *et al.*, 2009; Meegaskumbura *et al.*, 2010). අනුරාධපුරය හා ඒ ආශ්‍රිත ගඟබඩ ශාක ප්‍රජාවේත්, කුඹුරු අසලත් පඳුරු මැඩියන් හා ගස් මැඩියන් සඳහා බොහෝ වාසස්ථාන ඇත. ඊට අමතරව මනා තුරු සෙවනැති ගෙවතුවලද පඳුරු මැඩියන් හා ගස් මැඩියන් විශේෂයෙන්ම ඊසානදිග මෝසම් සමයේදී සුලභව දැකගත හැකි ය. එමෙන්ම වැව්, පොකුණු, වගුරු, ඇළ, ඔය, වේලි ඇතුළු සියලුම ජලජ පරිසර ආශ්‍රිතව දිය මැඩියන් වාසය කරයි. ගෙවතු, ලඳු කැලෑ, තණ පිට්ටනි හා වැව් ඉවුරු වැනි තැන්හි ගොඩබිම ජීවිතයට වඩාත් අනුවර්තනය වී ඇති ගෙඹි විශේෂ ද වෙසේ. අනුරාධපුර ප්‍රදේශය කේන්ද්‍ර කොටගෙන අප කළ ගවේෂණවලදී හමුවූ උභයජීවීන්ගෙන් රැසකට වියළි පරිසරයට ඔරොත්තු දීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට පමණක් සීමා වූ මැඩි විශේෂ වාර්තා වන්නේ සුළු ප්‍රමාණයකි. එම නිසා මෙම කලාපයේ වූ බහුතරයක් මැඩියන් තෙත් කලාපයේ ද ජීවත් වේ. පහත සඳහන් වන්නේ අනුරාධපුර ප්‍රදේශය ආශ්‍රිතව වාර්තා වන උභයජීවීන් ය. ඒ අතරින් අතුකෝරාළගේ ගෙම්බා (*Duttaphrynus atukoralei*) (රූපය 246), ගෙයි ගෙම්බා (*Duttaphrynus melanostictus*) (රූපය 247), ශ්නයිඩර්ගේ ගෙම්බා (*Duttaphrynus scaber*) (රූපය 248), විසිතුරු රතු මැඩියා (*Kaloula taprobanica*) (රූපය 249), විසිතුරු මුව පටු මැඩියා (*Microhyla ornata*) (රූපය 250), රතු මුව පටු මැඩියා (*Microhyla rubra*) (රූපය 251), බඩ සුදු මොට හොඹු මැඩියා (*Ramanella variegata*) (රූපය 252), බැලූන් මැඩියා (*Uperodon systoma*) (රූපය 253), උත්පතන මැඩියා (*Euphlyctis cyanophyctis*) (රූපය 254), සයැඟිලි පලා මැඩියා (*Euphlyctis hexadactylus*) (රූපය 255 සහ 256), වෙල් මැඩියා (*Zacherina cf. syhadrensis*) (රූපය 257), ජ'ඩන්ගේ දිය මැඩියා (*Hoplobatrachus crassus*) (රූපය 258), ලංකා දිය මැඩියා (*Rana gracilis*) (රූපය 260), තුන්හිවි වැලි දිය මැඩියා (*Sphaerotheca breviceps*) (රූපය 261), ලපවන් වැලි දිය මැඩියා (*Sphaerotheca rolandae*) (රූපය 262), රජරට පඳුරු මැඩියා (*Pseudophilautus regius*) (රූපය 263), සුලබ පහිඹු ගස් මැඩියා (*Polypedates cruciger*) (රූපය 265), පුල්ලි ගස් මැඩියා (*Polypedates maculatus*) (රූපය 266) අනුරාධපුරය ආශ්‍රිත පරිසරයන්හි සුලබව ජීවත් වේ.

හිරිදණ්ඩන් යනු ලොව ජීවත්වන උභයජීවීන් අතර අපූර්වතම ශාරීරික ලක්ෂණ දරන සත්ත්ව කාණ්ඩයකි. ඉහත විස්තර කළ අන්දමට උන් විශාල හා පෘෂ්ඨීමත් ගැඩවිලි පණුවෙකුට පෙනුමෙන් වඩාත් සමාන වේ. එසේ වුවද හිසෙහි පිහිටි ලක්ෂණ අනුව හිරිදණ්ඩා සර්පයෙකුට ද බොහෝ සෙයින් සමාන වේ. හිරිදණ්ඩන් පළල් මුඛයක්, සියුම් දත්, සිරුර පුරාම පැතිරෙන වල හෙවත් මාංශලමය වළලු, කෙටි වල්ගයක් හා එහි කෙළවර ගුද විවරයක් දරන දිගටි සත්ත්ව කොට්ඨාසයකි. මිලිමීටර් 300 ක් පමණ දික්ව වැඩෙන හිරිදණ්ඩන් තෙත් පොළොවේ ගුහා හාරා ඒවා තුළ ජීවත් වේ. අධික වැසි දිනයන්හි හෝ තෙත් රාත්‍රී දිනවලදී පොළොව මතුපිටට පැමිණේ. ජලයට ආසන්නයේ තෙත් පොළොවේ බිත්තර

තැන්පත් කරන අතර ඉන් බිහිවන දිගටි ඉස්ගෙඩියන් ජලයේ පිහිනා වැඩේ. *Ichthyophis* යන ගණයට අයත් වන හිරිදණ්ඩන් විශේෂ 3 ක් අප රට වෙසේ. ශ්‍රී ලංකාවට ආවේණික මෙම විශේෂ 3 ම වාර්තා වන්නේ තෙත් කලාපයෙන් පමණි. හිරිදණ්ඩන් නියම වැසි වනාන්තරවාසීන් වේ. මේ අපූර්වතම සතුන් අනුවර්තනය වී ඇත්තේ තෙත් පොළොවේ ජීවත් වීමට ය. පසුගිය දශක 3 ක කාලයක් තුළ අප විසින් කරන ලද පර්යේෂණයන්ට අනුව වියළි කලාපයෙන් මේ හිරිදණ්ඩන් වාර්තා වී නොමැත. රිටිගල කඳුවැටියේ තෙත් කලාපයේ ජීවත්වන ඇතැම් ජීවීන් වාර්තා වුවද හිරිදණ්ඩන් මේ වන තෙක් වාර්තා නොවීම තුළින් සනාථ වනුයේ උන් කිසිම අයුරකින් වියළි පරිසරයන් යටතේ ජීවත්වීමට අනුවර්තනය වී නොමැති බව ය. අප මෙහිදී ඔබගේ අවධානය මෙම සත්ත්ව කාණ්ඩය වෙතට යොමු කරවූයේ මොවුන් කිසිවිටෙකත් අනුරාධපුරය වැනි වියළි කලාපීය පරිසරයන්ට අනුවර්තනය වී නොමැති බැව් දැක්වීමට ය. ශ්‍රී ලංකාව තුළ සත්ත්ව ව්‍යාප්තිය දෙස බැලූ කල ආවේණික සතුන්ගෙන් බහුතරය තෙත් කලාපයට පමණක් සීමාවීම තුළින් හැඟෙනුයේ වියළි කලාපයට දීර්ඝ ඉතිහාසයක් ඇති බව ය. මිරිදිය කකුළුවන්, මිරිදිය කුණිස්සන්, මිරිදිය මසුන්, හිරිදණ්ඩන්, උරගුන් හා පඳුරු මැඩියන්ගේ DNA අනුසාරයෙන් කළ පර්යේෂණ අනුව මෙරට තෙත් කලාපයේත් වියළි කලාපයේත් සතුන්ගේ පැවැත්මේ ඉතිහාසය පිළිබඳ කරුණු අනාවරණය වී ඇත. මෙම නවීනතම පර්යේෂණය අනුව සනාථ වී ඇත්තේ තෙත් කලාපීය සම්භවයක් දරන සතුන් වියළි කලාපයට සංක්‍රමණය වීම වසර මිලියන කිහිපයකට ඉහතදීම නතරව ඇති බව ය (Bossuyt *et al*., 2004; Meegaskumbura *et al*., 2002).



රූපය 246. අතුකෝරාළගේ ගෙම්බා (***Duttaphrynus atukoralei***). දිග මිලිමීටර් 20-35 පමණ
(ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)



රූපය 247. ගේ ගෙම්බා (***Duttaphrynus melanotictus***). දිග මිලිමීටර් 50-100 පමණ
(ඡායාරූපය: වනජීවී උරුම භාරය)

අතුකෝරාළගේ ගෙම්බා ප්‍රමාණයෙන් ඉතා කුඩා මිලිමීටර් 35 ක් පමණ උපරිමව විශාල වන කුඩා ප්‍රමාණයේ ගෙම්බෙකි. දිවා කල තෙත් සහ අඳුරු ස්ථානවල සැඟවී වාසය කරයි. සවස් යාමයේ එළිමහන් ස්ථානවලට පැමිණේ. රාත්‍රි කාලයේ ගෙවතු, පිට්ටනි, වැව් ඉවුරු හා මග දෙපස දැකිය හැකි ය. අභිජනනය සඳහා සුදානම් වන පිරිමි සතුන් සමූහ වශයෙන් කුඹුරු හා වගුරු වැනි ස්ථානවලට එක්රොක් වී පොළොව මට්ටමේ සිට සෙන්ටිමීටර් 30-45 ක් පමණ වූ පඳුරු මතට නැඟ එකවිට හඬ නඟයි. මෙවැනි මොහොතක එම ප්‍රදේශයේ ජීවත් වන පිරිමි සතුන් දහස් ගණනකගේ හඬ එකවර ඇසිය හැකි ය.

ගේ ගෙම්බා ශ්‍රී ලංකාවේ වාසය කරන සුලබතම උභය ජීවියෙකි. මනුෂ්‍ය වාසස්ථානවල බහුලව ගැවසේ. සිරුර පුරාම පාහේ රළු බිබිළි දරන ගේ ගෙම්බා කෙටි ගාත්‍රා සහිත ස්ථූල සත්ත්වයෙකි.

බොහෝ විට නිවෙස් තුළ හා ඒ අසල ස්ථිරවම පදිංචි වී සිටින ගෙයි ගෙම්බා රාත්‍රී කාලයේ කුඩා සතුන් දඩයම් කරයි. සවස් යාමයේ සැඟව ඇති ස්ථානවලින් නික්ම මුළු රාත්‍රියේම පාහේ ක්‍රියාශීලීව හිඳ උදය කාලයේ නැවතත් තම සුපුරුදු තැන්වල සැඟවේ. බොහෝ විට නිශ්චල ජලයේ හෝ ඉතා සෙමින් ගලන දියකඩිතිවල උන් බිත්තර තැන්පත් කරයි. කළු පැහැති එම බිත්තර පාරදෘෂ්‍ය ජෙලිමය වැල් තුළ ගිලී පවතී. ගෙයි ගෙම්බන් මිනිසුන්හට හානිකර නොවුවද උන්ගේ සිරුර මතුපිට වූ ග්‍රන්ථීන්ගෙන් පිටවන ශ්‍රාවයන් සුනඛයින් හා ඇතැම් සර්පයින්හට විෂැති ය. අත්දැකීම් නොමැති වීමෙන් ඇතැම් සුනඛයින් මෙම ගෙම්බන් ආහාරයට ගැනීමට උත්සාහ දරයි. එවිට ගෙම්බාගේ විෂ හේතුවෙන් සුනඛයින් බොහෝ වේලාවක් යන තුරු කේයය පිටකරයි.



රූපය 248. ශ්නයිඩර්ගේ ගෙම්බා (***Duttaphrynus scaber***). දිග මිලිමීටර් 20-35 ක් පමණ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)




රූපය 249. විසිතුරු රතු මැඩියා (***Kaloula taprobanica***). දිග මිලිමීටර් 45-55 ක් පමණ (ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)

ශ්නයිඩර්ගේ ගෙම්බා වැව් හා ජල පද්ධති ආශ්‍රිතව ජීවත් වේ. දිවා කල ගල් හා ගස් කඳන් අතර වූ තෙතමනය ඇති තැන්වල සැඟවී සිටියි. රාත්‍රී කාලයේ ක්‍රියාශීලී වන මෙම ගෙම්බා, ගේ ගෙම්බා තරම් පරිසරයේ සුලබ නොවේ.

විසිතුරු රතු මැඩියා ස්ථූල සිරුරක් ඇත්තෙකි. රතු, තැඹිලි හා කළු යන වර්ණවලින් සිරුර රටා ගැන්වී ඇත. වියළි සමයේදී පසු ගාත්‍රා මඟින් බුරුල් වැලි හෝ පස් සහිත පොළොව හාරා ඒ තුළ වාසය කරයි. ළිං කණින අවස්ථාවලදී පොළොව මට්ටමේ සිට අඩි 10-12 පමණ යට කුඩා කුහර තුළ සිටියදී හමුවී ඇත. ඊට අමතරව වඩාත් සෙවනැති හා දිරායන කොළරොඩු අතරේ හෝ තෙතමනය සහිත බුරුල් පස් ඇති ස්ථානවල දිවා කල සැඟවී සිටියි. නිවෙස් තුළ හා ගෙවතුවල තෙත් ස්ථානයන්හි මෙම මැඩියා ස්ථිර පදිංචිකරුවෙකු ලෙස ජීවත් වේ. සතුරන් හමුවේ හෝ යම් බාධාවක් වූ කල පෙනහලු තුළට වාතය පුම්බා ශරීරය ප්‍රමාණයෙන් විශාල කොට ගෙන තමා ප්‍රමාණයෙන් විශාල සත්ත්වයෙකු බව පෙන්වයි.



රූපය 250. විසිතුරු මුව පටු මැඩියා (***Microhyla ornata***). දිග මිලිමීටර් 15-25 ක් පමණ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)




රූපය 251. රතු මුව පටු මැඩියා (***Microhyla rubra***). දිග මිලිමීටර් 20-30 ක් පමණ (ඡායාරූපය: සමන් ලියනගේ)

විසිතුරු මුව පටු මැඩියා ප්‍රධාන වශයෙන් ව්‍යාප්තව ඇත්තේ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ය. අනුරාධපුරයේ අප කළ පර්යේෂණවලදී මේ මැඩියන් දිවා කල දිරා යන කොළරොඩු, ගස් කඳන් හා ගල් යට වැනි තෙතමනය සහිත ස්ථානවල වසන බව නිරීක්ෂණය කළ හැකි විය. රාත්‍රි කාලයේ දිය කඩිති අසල එළිමහන් තණ බිම්වල සැරිසරයි.

රතු මුව පටු මැඩියා ළා දුඹුරු, රතුවන් දුඹුරු, සුදු හා රෝස වර්ණ සහ කළු වර්ණයෙන් රටා ගැන්වී ඇත. කෙටි ගාත්‍රා සහිත ස්ථූල සිරුරකින් යුතු ය. රාත්‍රි කාලයේ දිය කඩිති අසල එළිමහන් ස්ථානවල වාසය කරයි.

බඩ සුදු මොට හොඹු මැඩියාගේ සිරුර කළු, අඳුරු දුඹුරු හා සුදු යන වර්ණයන්ගෙන් විචිත්‍රවත් වී ඇත. තෙතමනය හා දිය සීරාව ඇති තැන්වල ජීවත් වේ. එසේ වුවද රාත්‍රි කල රළු පොතු සහිත ගස් කඳන් හා රළු බිත්ති මත ගමන් කරයි. දිවා කල ගස් බෙන, ගස් කඳන් හා ගල් යට සැඟවී ජීවත් වේ. අනුරාධපුර පෙදෙසේ නිවෙස්වල නාන කාමර හා ජල ටැංකි අසල මෙම මැඩියන් සුලබව ගැවසේ.



රූපය 252. බඩ සුදු මොට හොඹු මැඩියා (***Ramanella variegata***). දිග මිලිමීටර් 25-35 ක් පමණ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූපය 253. බැලූන් මැඩියා (***Uperodon systoma***). දිග මිලිමීටර් 45-65 ක් පමණ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

බැලූන් මැඩියා ස්ථූල සිරුරකට හිමිකම් කියයි. ශරීර වර්ණය තද දුඹුරු හෝ ඔලිව් පැහැති අතර බඩවත සුදු පැහැති ය. අනුරාධපුරය ආදී වියළි පෙදෙස්වල වාසය කරන මෙම මැඩියා තම ශක්තිමත් පසු ගාත්‍රා ආධාරයෙන් පොළොව හාරා ඒ තුළ ජීවත් වේ. බොහෝ විට මෙම ප්‍රදේශයේ වූ වැලි අධික පසේ වාසය කරයි. මෝසම් වර්ෂා සමඟ ඇති වන තාවකාලික දිය කඩිති වෙත ඇදී එන වැඩිහිටි සතුන් එහිදී අභිජනනය කොට ජලයේ බිත්තර තැන්පත් කරයි. වැසි සමයේ පිරිමි සතුන්ගේ කයෝර හඬ සෑම දියකඩිත්තකින්ම පාහේ ඇසිය හැකි ය. බොහෝ විට මෙම මැඩියන් තම බිත්තර තැන්පත් කරනුයේ කාබනික ද්‍රව්‍යයන්ගෙන් පොහොසත් දිය කඩිතිවල ය. මනුෂ්‍ය වාසස්ථානවල බැලූන් මැඩියා සුලභව හමුවේ.



රූපය 254. උත්පතන මැඩියා (***Euphlyctis cyanophyctis***). දිග මිලිමීටර් 35-65 ක් පමණ (ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)


උත්පතන මැඩියාගේ ශරීරයේ උඩු පෙදෙස දුඹුරු හෝ ඔලිව් මිශ්‍ර දුඹුරු පැහැ වන අතර එහි කළු හෝ තද දුඹුරු පැහැයෙන් යුත් තිත් හෝ පැල්ලම් සහිත වර්ණ රටා දැකිය හැකි ය. පාදය පසුපස තද දුඹුරු පැහැ තීරයකි. පූර්ණ වශයෙන් ජලජ ජීවිතයට මනාව අනුවර්තනය වූවෙකි. ජලජ පැළෑටි බහුල

පොකුණු හෝ වැව්වල ගාත්‍රා යුගල් විහිදා ගනිමින් එහි පා වෙමින් ජීවත් වේ (රූපය 259) . යම් බාධාවක් වූ කල ජලජ පෘෂ්ඨය මතින් පැන ගොස් සැඟවේ. දිවා කල මෙන්ම රාත්‍රි කාලයේ ද එක ලෙස ක්‍රියාශීලී වේ. ගලා නොයන ජලයට වඩාත් ප්‍රිය කරයි.

සයැඟිලි පලා මැඩියාගේ ශරීරය මතුපිට වර්ණය තද කොළ පැහැයේ සිට මඩ පැහැය දක්වා වෙනස් වේ. ජලජ ජීවිතයට මනා ලෙස අනුවර්තනය වී ඇති මෙම පලා මැඩියා නිතරම පාහේ ජලයේ පාවෙමින් පසුවේ. අනුරාධපුර ප්‍රදේශයේ ගංගා, වැව්, පොකුණු හා ළිංවල වඩාත්ම සුලබ වේ (රූපය 259). ගාත්‍රා විහිදාගෙන ජලයේ පාවෙමින් ජීවත් වන අතර බාධාවන් හමුවේ දිය යට කිමිදී වෙනත් තැනකින් මතු වේ. මෙම මැඩියන් සමූහ වශයෙන් වාසය කරයි.



රූපය 255. සයැඟිලි පලා මැඩියා (***Euphlyctis hexadactylus***). දිග මිලිමීටර් 60-120 ක් පමණ (ඡායාරූපය: සමන් ලියනගේ)



රූපය 256. ජලයේ පාවෙන සයැඟිලි පලා මැඩියා (***Euphlyctis hexadactylus***). (ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)

වෙල් මැඩියා අනුරාධපුර ප්‍රදේශයේ වෙසෙන සුලබතම මැඩියා වේ. ජලයට බොහෝ සමීපව ජීවත් වන අතර දිය ගොඩ දෙකෙහිම වාසය කරයි. ගාත්‍රා විදහාගෙන ජලයේ පාවුවද තැතිගැනුණු විට කිමිදී නොපෙනී යයි. රාත්‍රි කාලයේ තෙත් තණ පිට්ටනිවල සමූහ වශයෙන් දැකිය හැකි ය. වැසි සමයේ වගුරු, කුඹුරු, ළිං හා පොකුණුවලින් අභිජනනය සඳහා සූදානම් වූ පිරිමි සතුන්ගේ හඬ ඇසිය හැකි ය. පිරිමි සතුන් බොහෝමයකගේ හඬ එකවර ඇසීම නිසා වර්ෂා සමයේදී උන්ගේ වාසස්ථානවලින් මහත් ඝෝෂාවක් ඇසේ.

ජ'ඩන්ගේ දිය මැඩියා මෙම කලාපයේ වෙසෙන ප්‍රමාණයෙන් විශාලතම උභයජීවියා වේ. දිගින් මිලිමීටර් 130 ක් පමණ වන මෙම මැඩියා බොහෝ දුරට ස්ථූල සිරුරකට හිමිකම් කියයි. ඕලු, නෙළුම්,



රූපය 257. වෙල් මැඩියා (***Zacherina*** cf. ***syhadrensis***). දිග මිලිමීටර් 20-50 ක් පමණ (ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)



රූපය 258. ජ'ඩන්ගේ දිය මැඩියා (***Hoplobatrachus crassus***). දිග මිලිමීටර් 60-130 ක් පමණ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



මානෙල් ආදි පාවෙන ජලජ ශාක ඇති විවෘත ජලාශවලට වඩාත් ප්‍රිය කරයි. දිවා කල පූර්ණකාලීනව ජලජ ජීවිතයක් ගතකළද රාත්‍රියේ ගොඩබිමට පැමිණේ. වර්ෂාව සහිත දිනයන්හි තමා ජීවත් වන දියකඩිත්තේ සිට බොහෝ දුර ගොඩබිමින් ගමන් කරයි. වැසි රහිත වියළි කාලවලදී බුරුල් ගල්, ගස් කඳන් හා දිරා යන කොළරොඩු අතර සැඟවී වසයි. වගුරු, වැව්, පොකුණු හා එවැනි වෙනත් ජලාශවල මෙම දිය මැඩියා බහුලව වාසය කරයි.

රූපය 259. උත්පතන මැඩියා (***Euphlyctis cyanophyctis***) සහ සයැඟිලි පලා මැඩියා (***Euphlyctis hexadactylus***) බහුලව වාසය කරනුයේ මෙවැනි ජලජ ශාකයන්ගෙන් ගහන විවෘත ජලයේය. (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූපය 260. ලංකා දිය මැඩියා (***Rana gracilis***). දිග මිලිමීටර් 30-70 ක් පමණ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූපය 261. තුන්හිවි වැලි දිය මැඩියා (***Sphaerotheca breviceps***). දිග මිලිමීටර් 40-60 ක් පමණ (ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)

ලංකා දිය මැඩියා ශ්‍රී ලංකාවට ආවේණික වේ. ශරීරයේ පෘෂ්ඨීය පැත්ත රෝස පැහැයට හුරු ළා දුඹුරු පැහැති ය. ශරීර පාර්ශ්වයේ තද දුඹුරු පුළුල් තීරයක් ද, ඊට ඉහළින් හා පහළින් රන්වන් පැහැයෙන් යුත් තීර දෙකක් ද පිහිටයි. පොළොවේ මෙන්ම ගස් මත ද වාසය කරයි. බොහෝ විට මෝසම් වැසි සමඟ ගෙවතු හා නිවෙස්වලට ද පැමිණේ. වැසි සමයේ දී වගුරු, වැව් හා පොකුණු ආශ්‍රිත ශාක ප්‍රජාවේ සුලබව දැකිය හැකි ය. ඊට අමතරව වියළි කාලවලදී රාත්‍රියේ දියකඩිති අසල වූ තෙත් තෘණ ගස් අතර ද වාසය කරයි.


තුන්හිවි වැලි දිය මැඩියා සහ ලපවන් වැලි දිය මැඩියා කෙටි ගාත්‍රා සහිත ස්ථූල සිරුරු දරන්නන් වේ. සිරුරේ හැඩය බොහෝ දුරට ගෝලාකාර ය. ශරීරයේ පෘෂ්ඨීය වර්ණය ළා දුඹුරු පැහැයේ සිට කහ පැහැති වන අතර එහි බොහෝ දුරට ද්විපාර්ශ්වික සමමිතිකව පිහිටන තද දුඹුරු පැහැ තීර ඇත.

බුරුල් පස් තුළ සැඟවී ජීවත් වන මෙම මැඩියන් මෝසම් වර්ෂාව සමග අභිජනනය සඳහා පොළොව මතුපිටට පැමිණේ. වැසි සමයේ රාත්‍රියේ අනුරාධපුරය වැනි වියළි පෙදෙස්වල සුලබ ය. පසු ගාත්‍රයේ පතුලේ පිහිටි ශක්තිමත් ගැටිත්ත නිසා මෙම මැඩියන්ට පහසුවෙන් බුරුල් පස හැරීමේ හැකියාව ඇත.

රජරට පඳුරු මැඩියා උතුරුමැද පළාතේ වාර්තා වන එකම පඳුරු මැඩි විශේෂය ලෙස හැඳින්විය හැකි ය. මෙම මැඩියා පොළොන්නරුවේ අංගම්මැඩිල්ල ප්‍රදේශයෙන් මුලින්ම වාර්තා වුවද පසුකාලීනව කරන



රූපය 262. ලපවන් වැලි දිය මැඩියා (***Sphaerotheca rolandae***). දිග මිලිමීටර් 30-45 ක් පමණ (ඡායාරූපය: සමන් ලියනගේ)



රූපය 263. රජරට පඳුරු මැඩියා (***Pseudophilautus regius***). දිග මිලිමීටර් 18-22 ක් පමණ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූපය 264. රජරට පඳුරු මැඩියා (***Pseudophilautus regius***) වාසය කරනුයේ මෙවැනි පඳුරු සහිත වඩාත් සෙවනැති තැන්වලය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 265. සුලබ පහිඹු ගස් මැඩියා (***Polypedates cruciger***). දිග මිලිමීටර් 50-90 ක් පමණ (ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)



රූපය 266. පුල්ලි ගස් මැඩියා (***Polypedates maculatus***). දිග මිලිමීටර් 35-70 ක් පමණ (ඡායාරූපය: ඩිනාල් සමරසිංහ)

ලද පර්යේෂණවලින් සනාථ වූයේ අනුරාධපුර ප්‍රදේශයේ ගෙවතු ආශ්‍රිතව ද ජීවත් වන බව ය. මෙම පඳුරු මැඩියා අභිජනනය සඳහා ජලාශ වෙත කිසිවිටෙකත් ගමන් නොකරයි. වැඩිහිටි සතුන් තෙත් පොළොවේ හාරන ලද කුඩා වළක් තුළ බිත්තර තැන්පත් කරන අතර ඉස්ගෙඩියන් එම බිත්තර තුළම විකසනය වේ. බිත්තරය තුළින් බිහිවනුයේ ඉතා කුඩා මැඩි පැටවෙකි. බිත්තර තැන්පත් කිරීමට වඩාත් සෙවනැති, තෙත් පරිසරයක් අවශ්‍ය බැවින් අභිජනනය ක්‍රියාවලිය සිදුකරනුයේ ඊසානදිග මෝසම් වර්ෂාවත් සමගිනි. ඊසානදිග මෝසමත් සමඟ පතිත වන ප්‍රථම වැසි දිනයන්හි පිරිමි මැඩියන්ගේ හඬ අනුරාධපුරයේ තුරු සෙවනැති ගෙවතු ආශ්‍රිතව ද, කුඹුරු ආශ්‍රිතව ද ඇසිය හැකි ය (රූපය 264). ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වයේ විශාලතම නියෝජනය දරන පඳුරු මැඩියන් සියල්ලම පාහේ අප දිවයිනට ආවේණික වේ. මෙම පඳුරු මැඩියන් මූලික වශයෙන් ව්‍යාප්තව ඇත්තේ ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ය.

සුලබ පහිඹු ගස් මැඩියා මානව ජනාවාස ආශ්‍රිතව ඉතාමත් කලාතුරකින් වාර්තා වේ. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේත්, අන්තර් කලාපයේත් පැතිර ඇති මෙම ගස් මැඩියා අනුරාධපුරය වැනි වියළි කලාපීය පෙදෙසකින් වාර්තා වන්නේ ඉතාම කලාතුරකිනි. දිවා කල බොහෝවිට නිවෙස් තුළ සෙවනැති තැන්හි බිත්තිවලත්, නාන කාමර ආදියේත් ගතකරන අතර සවස් යාමයේ ඉන් බැහැරව ගොස් ඊළඟ දිනයේ උදයේදී නැවතත් එම වාසස්ථානයටම පැමිණේ. තම බිත්තර, මෙථුන ක්‍රියාවලියේදී තනනු ලබන පෙණ කැදැල්ලක් තුළ තැන්පත් කරයි. ශ්‍රී ලංකාවට ආවේණික මෙම ගස් මැඩියා අනුරාධපුරය වැනි වියළි ප්‍රදේශයක වාර්තා වනුයේ මනා තුරු සෙවනකින් හෙබි තෙත් පරිසරවලින් පමණි.

පුල්ලි ගස් මැඩියා ගෙවතු ආශ්‍රිතව ඉතා සුලබ ය. අනුරාධපුර ප්‍රදේශයේ ගෙවතු හා නිවෙස් තුළ, කෙසෙල් පඳුරු ආශ්‍රිතව ද ජීවත් වේ. මෙථුන ක්‍රියාවලියේදී තනනු ලබන පෙණ කැදැල්ල තුළ ගැහැනු සත්ත්වයා තම සංසේචිත බිත්තර තැන්පත් කරයි. දින කිහිපයකින් බිත්තර පුපුරා බිහිවන ඉතා කුඩා ඉස්ගෙඩියන් ජලයේ පිහිනා ජීවත්වෙමින් විකසනය වේ. මේ ගස් මැඩියා ද ශ්‍රී ලංකාවේ වසන අනෙකුත් ගස් මැඩියන් මෙන් තම පෙණ කැදැල්ල දිය කඩිත්තකට ඉහළින් තනයි. එසේ කරනුයේ එම කැදැල්ලෙන් බිහිවන ඉස්ගෙඩියන්ට සෘජුවම ජලයට පතිත වීම පහසු වීමට ය. සුදු හෝ ළා කහ පැහැයට හුරු මෙම කැදලි ළිං, පොකුණු හා අනෙකුත් දියකඩිති මතදී දැකගත හැකි ය.

උභයජීවීන් පිළිබඳව වූ මෙම පරිච්ඡේදය සකස් කිරීමේදී උභයජීවී හා මසුන් පිළිබඳ විද්වත් දෙපළක් වූ රොහාන් පෙතියාගොඩ හා ආචාර්ය මාධව මීගස්කුඹුර දැක්වූ සහයෝගය අතිමහත් ය.

සිවුපා උරගයින්


මෙම කලාපයේ සුලබව වාසය කරනුයේ වියළි තැනිතලා බිම්වලට අනුවර්තනයක් දක්වන උරගුන් ය. සහස්‍ර තුනක පමණ සිට සිදුවූ මානව ක්‍රියාකාරකම් කොතෙක් වුවද තව දුරටත් ඉතිරිව ඇති හෝ ප්‍රකෘති තත්ත්වයට පැමිණ ඇති නිකේතන තුළ උන් යහතින් ජීවත් වේ. මෙම කලාපයේ වසන උරගුන්ට මානව ක්‍රියාකාරකම් මත සිදු වූ පාරිසරික වෙනස්වීම් දරාගැනීමේ හැකියාව තෙත් කලාපීය ජීවීන්ට වඩා වැඩිවශයෙන් පවතින බව පෙනේ. එම නිසාම අනුරාධපුරය හා ඒ අවට ප්‍රදේශයේ අපගේ අධ්‍යයනයට ලක්වූ වපසරිය තුළ සැලකිය යුතු උරග විශේෂ සංඛ්‍යාවක් වාර්තා කිරීමට හැකි විය.

තන්තිරිමලය, මිහින්තලය, රිටිගල හා අනුරාධපුර පූජා නගරය තුළ වූ නටබුන් පිහිටි පෙදෙස්වල මෙන්ම ඒ ආශ්‍රිත ගෙවතුවල උරගුන් සුලබ ය. තුරුවාසී, භෞමික සහ පාංශුවාසී මෙන්ම ජලචර උරගුන්ට ද ඉතා හිතකර තත්ත්වයන් අනුරාධපුර පෙදෙස ආශ්‍රිතව පවතියි. ගල් ගොඩැලි හා පර්වතයන්ගෙන් සමන්විත වූ ශුෂ්ක කලාපීය තත්ත්වයන් යටතේ වාසය කරන උරගුන් ද මෙහි වේ. දශක තුනකට ආසන්න කාලයක් තුළ මෙම ප්‍රදේශයේ කළ ගවේෂණවල ප්‍රතිඵල හා අත්දැකීම් මේ පරිච්ඡේදය සැකසීමේදී පාදක කරගත්තෙමු. ඒ අතරම ඊට පරිබාහිරව, මෑතකාලීනව ප්‍රකාශිත මූලාශ්‍ර තොරතුරු ද විමර්ශනයට ලක්කළෙමු. එම මූලාශ්‍ර නම්, Deraniyagala,1939(b); Deraniyagala 1953(a); Deraniyagala 1955(b); Erdelen, 1978; Erdelen, 1984; Erdelen, 1998; Manamendra-Arachchi & Liyanage, 1994; Manamendra-Arachchi, 1997; Manamendra-Arachchi, 1998; Bahir & Silva, 2005; Bahir & Maduwage, 2005; Batuwita & Bahir, 2005; Das & de Silva, 2005; Wickramasinghe & Munindradasa, 2007; Manamendra-Arachchi *et al.*, 2007; Wickramasinghe *et al.*, 2011; Amarasinghe *et al.*, 2014 (a); Amarasinghe *et al.*, 2014 (b); Samarasinghe, 2014 ආදී ලෙස දැක්විය හැකි ය.

අධ්‍යයන කලාපය තුළ වාර්තා වූ සිවුපා උරගුන් අතර හැල කිඹුලා (*Crocodylus palustris*), ගල් ඉබ්බා (*Melanochelys trijuga*), කිරි ඉබ්බා (*Lissemys ceylonensis*), තරු ඉබ්බා (*Geochelone elegans*), පලා කටුස්සා (*Calotes calotes*), තොල විසිතුරු කටුස්සා (*Calotes ceylonensis*), සිව්රු හඬලන කටුස්සා (*Calotes liolepis*), ගරා කටුස්සා (*Calotes versicolor*), කළු හෝ අඳුරු තැලි කටුස්සා (*Otocryptis nigristigma*), වැලි කටුස්සා (*Sitana ponticeriana*), බෝදිලිමා (*Chamaeleo zeylanicus*), කුඩා දිවාසැරි හූනා (*Cnemaspis podihuna*), කුමාරසිංහගේ දිවාසැරි හූනා (*Cnemaspis kumarasinghei*), රිටිගල දිවාසැරි හූනා (*Cnemaspis retigalensis*), පුල්ලි වක්නිය හූනා (*Geckoella triedra*), යක් හූනා (*Geckoella yakhuna*), පුල්ලි ගේ හූනා (*Hemidactylus parvimaculatus*), හැලි හූනා (*Hemidactylus depressus*), සුලබ ගෙවල් හූනා (*Hemidactylus frenatus*), කිඹුල් හූනා (*Hemidactylus leschenaultii*), නුඔස් හූනා (*Hemidactylus lankae*), චතුරාංගුලි හූනා (*Gehyra mutilata*), හේලිගේ රුක්හීරළුවා (*Dasia halianus*), තිත් හීරළු හිකනලා (*Lygosoma punctatus*), මෝර හිස් සර්ප හීරළුවා (*Nessia hickanala*), සුලබ හිකනලා (*Eutropis carinata*), පිංගු හිකනලා (*Eutropis macularia*), පුල්ලි හිකනලා (*Eutropis madarazi*), තම්මැන්නා හිකනලා (*Eutropis tammanna*), සුලබ ලක්හීරළුවා (*Lankascincus fallax*), තලගොයා (*Varanus bengalensis*), කබරගොයා (*Varanus salvator*) යන විශේෂ සඳහන් කළ හැකි ය.

අනුරාධපුරය හා ඒ අවට පෙදෙසේ වූ වැව් හා වගුරු ආශ්‍රිතව වෙසෙන විශාලතම සිවුපා උරගයා ලෙස හැල කිඹුලා (රූපය 267) හැඳින්විය හැකි ය. මෙහි වූ බොහෝ වැව් හා පොකුණුවල කිඹුලන් ජීවත් වුවද මිනිසුන් එම වැව්වලින් එදිනෙදා ජල අවශ්‍යතාවයන් සපුරාගැනීමටද පසුබට නොවේ. කිඹුලන් උග්‍ර මාංශ භක්ෂකයින් වන බැවින් මෙම තත්ත්වය ජනතාවට බොහෝ සේ හානිදායක වන බව කිවයුතුම ය. යාන් ඔය සහ මල්වතු ඔය ඇතුළු අනුරාධපුර ප්‍රදේශයේ කිඹුලන් පිළිබඳ පර්යේෂණවල

යෙදෙන සුප්‍රසිද්ධ උරග හා උභයජීවී විද්‍යාඥයෙකු වන ඇන්ස්ලම් ද සිල්වා මෙහි ජීවත් වන කිඹුලන් සහ උන්ගෙන් මිනිසුන්හට වන හානි පිළිබඳ බොහෝ තොරතුරු රැස්කොටගෙන ඇත. ඔහු සමඟ කළ සාකච්ඡාවලදී වැදගත් තොරතුරු රැසක් අනාවරණය කොටගැනීමට හැකිවිය. කිඹුලන් ගංගා සහ ඔය ඉවුරුවල ලැඟීම් සඳහා බෙන තනනු ඇත (රූපය 268). මේ වන විට එම බෙන 200 ක් පමණ නිරීක්ෂණය කොට ඇති ඇන්ස්ලම් ද සිල්වා පවසනුයේ මේවා ඉවුරු කණ්ඩියේ සිට සෘජුවම ඉදිරියට හාරා ඇති බව ය. එසේ වුවද ශ්‍රී ලංකාවේ කිඹුලන් පිළිබඳ විශේෂඥයෙකු වූ නැසීගිය ආචාර්ය පී.ඊ.පී. දැරණියගල ඔහුගේ වාර්තාවල සඳහන් කොට ඇත්තේ හැල කිඹුලා තම බෙන 'U' අකුරේ හැඩයට හාරන බවයි. දැරණියගලගේ නිරීක්ෂණයන්ට අනුව එම බෙන වැඩිවශයෙන් තනනුයේ ඉවුරුවල වූ කුඹුක් මුල් අතර ය (Deraniyagala, 1953(a)). එසේ වුවද ඇන්ස්ලම් ද සිල්වාට මේ වන තෙක් දැරණියගල දක්වන අන්දමේ U හැඩැති කිඹුල් බෙන හමුවී නැති බව ඔහු පවසයි. කිඹුලන් විසින් මෙම බෙන, ලැඟීම සඳහා යොදා ගනු ලබන අතර එහි හුදෙකලා කිඹුලන් ද, වැඩිහිටියන් කිහිපදෙනෙකු ද, වැඩිහිටි සතුන් හා පැටවුන් සිටි අවස්ථා ද වූ බව ඇන්ස්ලම් ද සිල්වා වැඩි දුරටත් පවසයි. ඊට අමතරව බෙන විවරය අසල බිත්තර කැදැල්ල තනා බෙනය තුළ ලැග හිඳ එය රකින අවස්ථා ද වූ බව ඔහු පවසයි. යාන් ඔය ඇතුළු අනුරාධපුර ප්‍රදේශයේ හැල කිඹුලන් මිනිසුන්ට පහරදීමේ අවස්ථා හා මිනිස් මරණයන් සිදු වූ අවස්ථා ද විරල නොවන බවත්, මිනිසුන් දඩයම් කිරීමේදී කිඹුලන් ඉතා සූක්ෂමව, බොහෝ කාලයක් නිරීක්ෂණය කිරීමෙන් හා ඉතා ඉවසීමෙන් එය කරන බවත් ඔහුගේ මතය වේ (ඇන්ස්ලම් ද සිල්වා සමඟ කළ සාකච්ඡා ඇසුරෙනි, 2013). හැල කිඹුලන් උපරිමව මීටර් 5.5 ක් (අඩි 18) වැඩුණ ද ශ්‍රී ලංකාවේ කිඹුලන් මීටර් 4 ක් පමණ (අඩි 13) උපරිමව වැඩෙන බැව් වාර්තා කොට ඇත (Deraniyagala, 1953(a)).



රූපය 267. හැල කිඹුලා (***Crocodylus palustris***) (උපරිම දිග මීටර් 5.5 ක් පමණ වේ) (ඡායාරූප: ඇන්ස්ලම් ද සිල්වා)



රූපය 268. නැල කිඹුලා (***Crocodylus palustris***) ගේ බෙන, යාන් ඔය (ඡායාරූප: ඇන්ස්ලම් ද සිල්වා)

කබරගොයින් සඳහා අනගි පරිසරයක් මෙම සමස්ත කලාපයේම දැකිය හැකි ය. වැව්, ඔය, වගුරු හා පොකුණුවල කබරගොයින් බහුල ය. වැඩිහිටි කබරගොයින් ජලයේ හා ගොඩබිම වාසය කරයි. උන් ප්‍රධාන වශයෙන් මළකුණු මත යැපුණ ද කෘමීන්, කකුළුවන්, මසුන්, සර්පයින්, පක්ෂීන් හා උන්ගේ බිත්තර, ඉබ්බන්ගේ, කිඹුලන්ගේ බිත්තර මෙන්ම හික් මීයන් ද තම ආහාරයට එක් කර ගනියි. පැටවුන් බොහෝවිට ගස් මත හා බෙන තුළ වාසය කරයි. ඒ, වැඩිහිටි සතුන්ගෙන් හා අනෙකුත් විලෝපීයයන්ගෙන් ආරක්ෂා වීමට ය. කබරගොයින් කලාතුරකින් කිඹුලන්ගේ බිත්තර ද ආහාරයට ගැනීමට ගොස් උන්ගේ ගොදුරු බවට පත් වන අවස්ථා ද ඇත. උන් තැතිගැන්වුණු විට තම උගුර ප්‍රදේශය පුම්බා පිඹීමක් සිදුකරන අතර සන දාරයක් සහිත වල්ගයෙන් පහර දීමට ද පෙළඹේ (රූපය 269).



රූපය 269. කබරගොයා (***Varanus salvator***) (උපරිම දිග මීටර් 3.2 ක් පමණ වේ) (ඡායාරූපය: සමීර කරුණාරත්න)

ජලජ පරිසරයේ වසන අනෙක් සිවුපා උරගුන් වන්නේ ගල් ඉබ්බා හා කිරි ඉබ්බා ය. මිරිදියේ වසන ඉබ්බන් අතීතයේ සිටම මිනිසුන්ගේ ප්‍රණීත ආහාරයක් වී ඇති බව අනුරාධපුර ඇතුල් නුවර කළ කැණීම් මගින් තහවුරු වී ඇත (Chandraratne, 1997; Young *et al.*, 2006). මේ අතරින් ගල් ඉබ්බා ජලයේ වාසය කළ ද වැසි සහිත දිනයන්හි ගොඩබිම ගමන් කරනු නිරීක්ෂණය කළ හැකි ය. නොඑසේ නම් අධික නියං සමයේදී තමන් වෙසෙන දිය කඩිත්ත සිඳී යන විට වෙනත් දිය කඩිති සොයා බොහෝ දුර ගමන් කරනු දැකගත හැකි ය. කෙසේ වුවද දිවා කාලය උන් ජලයේම හෝ ජලය ආසන්නයේ ගතකරයි. ආචාර්ය දැරණියගල 1939 දී කළ පර්යේෂණයන්ට අනුව මෙරට ගල් ඉබ් උප විශේෂ දෙකක් වාසය කරන බැව් විද්‍යාත්මකව සනාථ කොට ඇත. එනම් ගල් ඉබ්බා (*Melanochelys trijuga thermalis*) (රූපය 270) හා පාකර්ගේ ගල් ඉබ්බා (*Melanochelys trijuga parkeri*) (රූපය 271) ය. මේ අතරින් ගල් ඉබ්බා ශ්‍රී ලංකාව පුරා පුළුල් ව්‍යාප්තියක් දරන අතර පාකර්ගේ ගල් ඉබ්බා වියළි කලාපයෙන් පමණක් වාර්තා වේ. ගල් ඉබ්බා ප්‍රමාණයෙන් කුඩා (පිට කටුවේ දිග මිලිමීටර් 236-292, පළල 166-216, උස 78-120) වන අතර පාකර්ගේ ගල් ඉබ්බා ප්‍රමාණයෙන් ඉතා විශාල වේ (පිට කටුවේ දිග මිලිමීටර් 321-383, පළල 230-266, උස 126-160) (Deraniyagala, 1939 (b)). පාකර්ගේ ගල් ඉබ්බා වාර්තා වනුයේ ආනමඩුව, විල්පත්තුව, පොළොන්නරුව, නිකවැරටිය හා මරිච්චුකට්ඩි යන වියළි කලාපීය ප්‍රදේශවලින් ය. අනුරාධපුර ප්‍රදේශයෙන් ද ප්‍රමාණයෙන් ඉතා විශාල ගල් ඉබ්බන් වාර්තා වේ. ආචාර්ය දැරණියගලට අනුව උන් පාකර්ගේ ගල් ඉබ්බා ලෙස හැඳින්විය හැකි ය.



රූපය 270. ගල් ඉබ්බා (***Melanochelys trijuga thermalis***)
(ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 271. පාකර්ගේ ගල් ඉබ්බා (***Melanochelys trijuga parkeri***)
(ඡායාරූපය: රුචිර සෝමවීර)

ශ්‍රී ලංකා කිරි ඉබ්බා (රූපය 272) පූර්ණකාලීන ජලචර ජීවිතයට අනුවර්තනය වූවෙකි. උන්ගේ පිට කටුව වටා වූ පටක වඩාත් මෘදු වන අතර ඉතා ඉක්මනින් විජලනය වන සුලු ය. මේ හේතුව නිසාම දිවා කල උන් කිසි විටෙකත් ගොඩබිමට පැමිණීමට උත්සාහ නොදරයි. එසේ වුවද සෙවනැති දියකඩිතිවල ඉහළට එසවී ඇති ගල් හෝ ගස් කඳන් මත ලැග හිරු එළියෙන් තම ශරීරය උණුසුම් කරගන්නා අවස්ථා දැකිය හැකි ය. ඊට අමතරව අධික වැසි දිනයන්හිදී කලාතුරකින් ගොඩබිම සැරිසරයි. වැව් ආශ්‍රිතව භාවිත කරන මත්ස්‍ය දැල්වලට (gill nets) පැටලීම හේතුවෙන් ජලය තුළ හුස්ම සිරවීමෙන් මිය යයි. තවද මස් පිණිස අධික ලෙස උපයෝජනය කිරීම හේතුවෙන් ඉබ්බන්ගේ පැවැත්ම තර්ජනයට ලක් වී ඇත. කිරි ඉබ්බා ශ්‍රී ලංකාවට ආවේණික විශේෂයකි.



රූපය 272. ශ්‍රී ලංකා කිරි ඉබ්බා (***Lissemys ceylonensis***)
(ඡායාරූපය: රුචිර සෝමවීර)

තරු ඉබ්බා (රූප 273, 274) වියළි පරිසරයට ප්‍රියකරන පූර්ණකාලීන භෞමික වාසියෙකි. ශාක කොටස් මත යැපෙන මේ ඉබ්බන් අධ්‍යයන කලාපය තුළ සුලබව හමුවේ. තරු ඉබ්බන් කලක් මස් පිණිස නොමැරුව ද වර්තමානයේ ගැමියන් මෙම සත්ත්ව මාංශය ආහාරයට එක් කර ගැනීමට නොපසුබට වේ. තවද තම බෝගවලට හානි කරන බැවින් ගොවීන් උන් විනාශ කිරීමට පෙළඹේ. විශේෂයෙන්ම එළවළු බෝග කඳින්ම කා දමන නිසා ගොවීන් උන් වළලා හෝ පුළුස්සා විනාශ කිරීම හේතුවෙන් ද සෙමෙන් ගමන් කිරීමේ පුරුද්ද නිසා මාර්ග අනතුරුවලට ලක්වීම හේතුවෙන් ද වර්තමානයේ ඇතැම් පෙදෙස්වල තරු ඉබ්බන්ගේ ගහනය ක්‍රමයෙන් හීන වී ඇති බව පෙනේ.



රූපය 273. තරු ඉබ්බා (***Geochelone elegans***) වැඩිහිටි සතෙක්. (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 274. තරු ඉබ්බා (***Geochelone elegans***) පැටවෙක් (ඡායාරූපය: රුචිර සෝමවීර)

පලා කටුස්සා (රූපය 275) හා ගරා කටුස්සා (රූපය 276) අනුරාධපුර කලාපයේ ගෙවතුවල ද සුලබව දැක ගැනීමට හැකි ය. උන් වඩාත් ප්‍රිය කරනුයේ මිනිස් වාසස්ථාන අසල ගැවසීමට ය. මේ අතරින් ගරා කටුස්සන් පුරාවිද්‍යා නටබුන් හා ගල් පර්වත අතර සුලබව ජීවත් වේ. තොල විසිතුරු කටුස්සා (රූපය 277) ගඟබඩ වන ආවරණයේ ගස් මත ජීවත් වීමට ප්‍රිය කරයි. තොල් මත වූ කැපී පෙනෙන වර්ණය මේ කටුස්සාට හිමිව ඇති සුවිශේෂී ලක්ෂණයකි. රිටිගල වනයේ වෙසෙන කළු හෝ අඳුරු තැලි කටුස්සා (රූපය 278) බොහෝ දුරට භෞමික ජීවිතයක් ගතකරයි. වනයේ සෙවනැති තැන්හි දිරා යන කොළ රොඩු මත වසයි. පිරිමි කටුස්සාට තල්ලේ සිට ළය තෙක් පැතිර ඇති පැතලි තැල්ලක් හිමි ය. වියළි හා අධික උෂ්ණත්වය සහිත විවෘත වැලිතලාවල වාසය කරන වැලි කටුස්සා අනුරාධපුර දිස්ත්‍රික්කයේ විල්පත්තු ජාතික වනෝද්‍යානය අසල වූ නොච්චියාගම ආශ්‍රිත පෙදෙසේදී අපගේ නිරීක්ෂණයට ලක්විය. වැලි කටුස්සාට (රූපය 279) රත් වූ වැල්ලේ වේගයෙන් දිවීමේ හැකියාව ඇත. මෙහි පහත විස්තර කෙරෙන කළු හෝ අඳුරු තැලි කටුස්සා මෙන්ම මොවුන්ගේ පිරිමි සතුන්හට උගුරු ප්‍රදේශයේ පැතලි තැල්ලක් පිහිටයි. ගස් අතු මත ජීවත්වන, අපූර්වතම හැසිරීම් රටා ඇති බෝදිලිමා (රූපය 280) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයකින්ම වාර්තා වේ. ඉතා සුවිශේෂී ශාරීරික ලක්ෂණවලින් හෙබි බෝදිලිමා වර්ණ රටාවෙන් බොහෝ දුරට ගස් මත ජීවිතයට අනුවර්තනය වී ඇති නිසා දැකගැනීම ඉතා අසීරු ය. යමක් ග්‍රහණය කිරීමට හැකි 'පරිග්‍රාහී වල්ගයක්' සහ එකිනෙකට නිදහස්ව චලනය කළ හැකි ඇස් ඇති බෝදිලිමා කටුසු කුලයට අයත් නොවේ.



රූපය 275. පලා කටුස්සා (***Calotes calotes***) (උපරිම දිග මිලිමීටර් 500-540 ක් පමණ වේ) (ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 276. ගරා කටුස්සා (*Calotes versicolor*) (උපරිම දිග මිලිමීටර් 490 ක් පමණ වේ) (ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 277. නොල විසිතුරු කටුස්සා (*Calotes ceylonensis*) (උපරිම දිග මිලිමීටර් 235-265 ක් පමණ වේ) (ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 278. තැලි කටුස්සා (*Otocryptis nigristigma*) (උපරිම දිග මිලිමීටර් 200-250 ක් පමණ වේ) (ඡායාරූපය: දුෂාන්ත කන්ඩම්බි)



රූපය 279. වැලි කටුස්සා (*Sitana ponticeriana*) (උපරිම දිග මිලිමීටර් 150-180 ක් පමණ වේ) (ඡායාරූපය: රුවිර සෝමවීර)




රූපය 280. බෝදිලිමා (*Chamaeleo zeylanicus*) (උපරිම දිග මිලිමීටර් 370-410 ක් පමණ වේ) (ඡායාරූපය: නදීක හපුආරච්චි)

ගස්වල රළු පොතු අතර, වේ හුඹස්, ගල් බිත්ති, පොළොවේ වූ දිරා යන කොළ රොඩු හා නිවෙස් තුළ ආදී තැන්හි වසන හූනු විශේෂ ගණනාවක්ම වේ. මෙම කලාපයේ හූනන් සඳහා සැලකිය යුතු නිකේතන ඇති බැවින් උන්ගේ ගහනය ද සතුටුදායක අයුරින් ඉහළ තත්ත්වයක පවතී. කුඩා දිවාසැරි හූනා (රූපය 281) මිහින්තලේ පෙදෙසේ වූ ගස් කඳන් අතර වසන ඉතා කඩිසර උරගයෙකු මෙන්ම මෙරට වාසය කරන ප්‍රමාණයෙන් කුඩාම හූනා ද වේ. දිවා කල විශාල ගස් කඳන් අතර පොළොව මට්ටමේ සිට මීටර් 15 ක පමණ උස් කලාපයක් තුළ සැරිසරයි (රූපය 282). ඇතැම් අවස්ථාවලදී ගස් සමීපයේ බිම ද දැකිය හැකි අතර සුළු තැතිගැන්වීමකින් පවා ගසකට නැග කඩිසරව පලා යයි. මෙම කුඩා හූනා සමූහ වශයෙන් ගැවසෙන අතර එකම ස්ථානයේ සාමාජිකයින් 5-15 ක් පමණ වාර්තා වූ අවස්ථා ද වේ. අනෙකුත් දිවාසැරි හූනන්ට වඩා ඉතා මෘදු පෘෂ්ඨ මත මනාව ගමන් කිරීමේ හැකියාව ඇත. මෙම හූනා ශ්‍රී ලංකාවට ආවේණික ය. රිටිගල දිවාසැරි හූනා ද මේ කලාපයේ, විශේෂයෙන්ම රිටිගල පෙදෙස ආශ්‍රිතව ජීවත් වේ. මෙම දිවාසැරි හූනා දිවාචර අතර උන් ගස් කඳන් හා ගල් පෘෂ්ඨ මත දිවා කල කඩිසරව සැරිසරනු දැකිය හැකි අතර ශ්‍රී ලංකාවට ආවේණික වේ (රූපය 283). යක් හූනා පූර්ණ භෞමික වාසියෙකි. කෙටි හා පළල් වල්ගයක් දරන මේ සත්ත්වයා පොළොවේ වූ දිරා යන කොළ රොඩු අතර රාත්‍රී කාලයේ ගැවසේ. යක් හූනා ද වියළි දේශගුණික තත්ත්වයන් යටතේ ජීවත්වන්නෙකි. සිරුර කෙටි, ස්ථූල හැඩයක් දරයි. ශරීර වර්ණ රටාව දිරායන කොළ රොඩුවල වර්ණයට බොහෝ සේ සමාන බැවින් රාත්‍රී කාලයේ දැකබලා ගැනීම තරමක් අපහසු වේ. යක් හූනා වියළි කලාපයට පමණක් සීමා වුවද මෙරටට ආවේණික හූනු විශේෂයකි (රූපය 284). හුඹස් හූනා වේ-හුඹස් ආශ්‍රිතව මෙන්ම ගස් කඳන් හා ගල් පැළුම්වල ද වසයි. කළු හෝ තද දුඹුරු ශරීරය සුදු හෝ ළා කහ පැහැති පුල්ලිවලින් රටා ගැන්වී ඇත. වේ-හුඹස්වල



රූපය 281. කුඩා දිවාසැරි හූනා (***Cnemaspis podihuna***)
(උපරිම දිග මිලිමීටර් 45-55 ක් පමණ වේ)
(ඡායාරූපය: සුපුන් වෙල්ලපුලි-ආරච්චි)



රූපය 282. කුඩා දිවාසැරි හූනා (***Cnemaspis podihuna***)
සුලබව වාසය කරන මිහින්තලය පරිසරය.
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 283. රිටිගල දිවාසැරි හූනා (***Cnemaspis retigalensis***)
(ඡායාරූපය: සුපුන් වෙල්ලපුලි-ආරච්චි)



රූපය 284. යක් හූනා (***Geckoella yakhuna***) (උපරිම දිග මිලිමීටර් 70-80 ක් පමණ වේ) (ඡායාරූපය: දුෂාන්ත කන්ඩම්බි)

වූ විවර අසල රාත්‍රී කාලයේදී දැකගත හැකි ය. බිය වූ විට හුඹස තුළට පලා යයි. අනුරාධපුර ප්‍රදේශයේ වේ-හුඹස් බහුලව ඇති බැවින් හුඹස් හූනා ද එහි සුලබ ය. මෙම හූනු විශේෂය වියළි කලාපයේ හා අන්තර් කලාපයේ ජීවත් වන අතර ශ්‍රී ලංකාවට ආවේණික වේ (රූපය 285). මේ කලාපයේ ඉතා සුලබව වාසය කරන කිඹුල් හූනා විශාල ගස් කඳන්වල වූ රළු පොතු අතර මෙන්ම ගෘහාශ්‍රිතව ද වෙසේ. ඊට අමතරව ගල් කුළු හා ගල් පර්වත බිත්ති අතර ද හමුවේ. සවස් යාමයේ හා රාත්‍රී කාලයේ උන් ඉතා කඩිසරව ඔබ මොබ ගමන් කරයි. පිරිමි සතුන්ට ස්ථූල සිරුරක් තිබේ. අනුරාධපුරය ආශ්‍රිත කලාපයේ උන් ඉතා සුලබ වන අතර එහි විශාල ගහනයක් ද වාසය කරයි (රූපය 286). හැලි හූනා ද රළු පෙනුමක් ඇති, ගස් කඳන් අතර, ගල් පෘෂ්ඨවල මෙන්ම ඇතැම් විට නිවෙස් තුළ ද වාසය කරනු නිරීක්ෂණය කළ හැකි ය. උන් වර්ණය අතින් තමා වසන පරිසරයට අතිශයින් අනුවර්තනය වී ජීවත් වේ. පුල්ලි ගේ හූනා (රූපය 287), සුලබ ගෙවල් හූනා (රූපය 288) හා චතුරාංගුලි හූනා (රූපය 289) නිවෙස් ආශ්‍රිතව ඉතා සුලබ ය. මෙම විශේෂ 3 අතරින් පුල්ලි ගේ හූනා හා සුලබ ගෙවල් හූනා නිවෙස් තුළ මෙන්ම ලඳු කැලෑ හා වනාන්තරවල ද ජීවත් වේ. මේ අතරින් පුල්ලි ගේ හූනා මෙරටට ආවේණික ය. චතුරාංගුලි හූනා බොහෝ සේ මානව වාසස්ථානවලට ප්‍රිය කරයි. උන් දිවා කල ද අනෙක් හූනු විශේෂ දෙකට වඩා ක්‍රියාශීලී වේ. තවත් හූනු විශේෂ කිහිපයක්ම මෙම වියළි පෙදෙසේ ජීවත් වුවද උන් පිළිබඳ මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කර නොමැත. එමෙන්ම මෙම කලාපයේ වෙසෙන විශේෂයෙන්ම දිවාසැරි හූනන් පිළිබඳව තව දුරටත් පර්යේෂණ කළ යුතුව ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමු.



රූපය 285. හුඹස් හූනා (***Hemidactylus lankae***)
(උපරිම දිග මිලිමීටර් 130-150 ක් පමණ වේ)
(ඡායාරූපය: දුෂාන්ත කන්ඩම්බි)



රූපය 287. පුල්ලි ගේ හූනා (***Hemidactylus parvimaculatus***)
(උපරිම දිග මිලිමීටර් 100-115 ක් පමණ වේ)
(ඡායාරූපය: සුපුන් වෙල්ලපුලි-ආරච්චි)



රූපය 286. කිඹුල් හූනා (***Hemidactylus leschenaultii***) (උපරිම දිග මිලිමීටර් 145-175 ක් පමණ වේ) (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 288. සුලබ ගෙවල් හූනා (*Hemidactylus frenatus*)
(උපරිම දිග මිලිමීටර් 95-115 ක් පමණ වේ)
(ඡායාරූපය: සුපුන් වෙල්ලපුලි-ආරච්චි)



රූපය 289. චතුරාංගුලි හූනා (*Gehyra mutilata*)
(උපරිම දිග මිලිමීටර් 100-125 ක් පමණ වේ)
(ඡායාරූපය: සුපුන් වෙල්ලපුලි-ආරච්චි)

අනුරාධපුර කලාපය ආශ්‍රිතව වාසය කරන භෞමික හා රුක්වැසි උරගුන් අතර හේලිගේ රුක්හීරළුවා ගස් හා ගල් බිත්ති මත වසන, බොහෝ දුරට කළු හෝ අඳුරු ඔලිව් පැහැති හා සුදු තීරුවලින් යුත් අලංකාර සිරුරක් ඇත්තෙකි. ශ්‍රී ලංකාවේ ජීවත්වන හීරළුවන් අතරින් රුක් මත ජීවිතයට මනා ලෙස අනුවර්තනය වී ඇති එකම විශේෂය හේලිගේ රුක්හීරළුවා ය. උන් ගස් මත සංචරණය කරනුයේ ඉතාම සෙමින් හා සීරුවට ය. පොළොව මත ඉතාම කලාතුරකින් හමුවේ. මිහින්තලේ පෙදෙසින් හා අනුරාධපුර පූජා නගරයෙන් රුක්හීරළුවන් වාර්තා වී ඇත (රූපය 290). සුලබ හිකනලා නටබුන් අතර ගල් සහිත පරිසරයේ මෙන්ම බිත්ති හා පැළුම් අතරද වාසය කරන පහසුවෙන් දැකබලා ගත හැකි සත්ත්වයෙකි. දිවා කල අධික ලෙස රත් වූ ගල් පෘෂ්ඨ මත උන් අපහසුතාවකින් තොරව සැරිසරයි. හූනන් ආහාර ලෙස අල්ලා ගැනීමට මොවුන් ගස් මත හා ගබඩා ස්ථාන වෙත ද පැමිණේ (රූපය 291). තිත් හීරළු හිකනලා බොහෝ විට පොළොවේ වූ කොළ රොඩු අතර වසන, දිගටි හැඩැති, කඩිසර බවින් යුත්, ඉක්මනින් සැඟවී නොපෙනී යාමේ හැකියාව ඇති උරගයෙකි. කුඩා පැටවුන්ගේ හෝ නොවැඩුණු සතුන්ගේ වලිගය දීප්තිමත් රතු පැහැති ය. (රූපය 292).



රූපය 290. හේලිගේ රුක්හීරළුවා (*Dasia halianus*)
(උපරිම දිග මිලිමීටර් 125-150 ක් පමණ වේ)
(ඡායාරූපය: සමීර කරුණාරත්න)



රූපය 291. සුලබ හිකනලා (*Eutropis carinata*) (උපරිම දිග මිලිමීටර් 290-325 ක් පමණ වේ) (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 292. තිත් හීරළු හිකනලා (*Lygosoma punctatus*) (උපරිම දිග මිලිමීටර් 165-175 ක් පමණ වේ) (ඡායාරූපය: රුචිර සෝමවීර)

තලගොයා මේ කලාපයේ ඉතා සුලබ ව ජීවත්වන උරගයෙකි. ගෘහාශ්‍රිතව මෙන්ම අනෙකුත් සෑම පරිසරයන්හිදී ම උන් හමුවේ. පූජා නගරය තුළ උන්ට හොඳ හැටි ආරක්ෂාව ඇති නිසා මෙහිදී සැලකිය යුතු ගහනයක් දැකිය හැකි ය. තලගොයින් විසින් ගොළුබෙල්ලන් ඇතුළු විශාල පරාසයක අපෘෂ්ඨවංශී මෙන්ම කුඩා පෘෂ්ඨවංශී සතුන් ද තම ආහාරයට එක් කර ගැනේ. ඇතැම් ග්‍රාමීය ජනයා තලගොයින් ආහාර පිණිස දඩයම් කරනු ඇත (රූපය 293). සිව්පා උරගුන් පිළිබඳ මෙහි සඳහන් කළ තොරතුරුවලට අමතරව දැනට කරනු ලබන පර්යේෂණ මත අනාගතයේදී මේ ලැයිස්තුව තවත් පුළුල් වීමට බොහෝ ඉඩකඩ ඇත. විශේෂයෙන්ම හූනන්, හිකනලුන් පිළිබඳ පර්යේෂණ හා ගවේෂණ තවදුරටත් පුළුල්ව සිදුවන බැවින් ඒ පිළිබඳ නව තොරතුරු නුදුරු අනාගතයේදී බලාපොරොත්තු වියහැකි ය.



රූපය 293. තලගොයා (***Varanus bengalensis***) (උපරිම දිග මීටර් 1.6 ක් පමණ වේ) (ඡායාරූපය: රුචිර සෝමවීර)

සිව්පා උරගුන් පිළිබඳ ලියැවුණු මෙම පරිච්ඡේදය සාර්ථක කර ගැනීම සඳහා අප රට ප්‍රවීණ උරග විද්වතුන් වන ආචාර්ය ඇන්ස්ලම් ද සිල්වා, ආචාර්ය රුචිර සෝමවීර, සමීර කරුණාරත්න සහ ඩිනාල් සමරසිංහ යන අය දැක්වූ දායකත්වය අගය කොට සලකමු.

සර්පයින්

ශ්‍රී ලංකාවේ සර්ප විවිධත්වය පිළිබඳ සාකච්ඡා කිරීමේදී උතුරුමැද පළාත අතිශයින්ම වැදගත් වේ. ඒ, එහි උග්‍ර විෂ හෙවත් මාරාන්තික සර්පයින්ගේ ගහන ඝනත්වය ඉහළ අගයක පැවතීමයි. එම නිසා මෙම කලාපයේ වාර්ෂිකව සර්ප දෂ්ඨනවලින් මියයන සංඛ්‍යාව ද ඉතා ඉහළ මට්ටමක පවතී. අනුරාධපුර දිස්ත්‍රික්කය සර්ප දෂ්ඨන අතරින් ඉහළ තලයක පැවතීම නිසා මෙහිදී ඒ පිළිබඳ පුළුල්ව සාකච්ඡා කිරීම අවශ්‍ය යැයි හැඟේ (Deraniyagala, 1955 (e); De Silva, 1980; De Silva, 1981; Kularatne & de Silva, 1996; Das & de Silva, 2005; සෝමවීර, 2006; Manamendra-Arachchi & Pethiyagoda, 2007; Smith *et al.*, 2008; Maduwage *et al.*, 2009). ශතවර්ෂ විස්සකට අධික කාලයක් පුරාම බවබෝග වගාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස උතුරුමැද පළාතේ වූ වියළි තැනිතලා බිම්වල තෘණ බිම් ඇති වී තිබේ. කුරක්කන්, තල, මෙනේරි, ඉරිඟු, වී හා හේන් වගා කොට අතහැර දමන ලද බිම් පෙදෙස් ඉතා කෙටි කලකින් විවෘත තෘණ බිම් හා ලඳු කැලෑ බවට පත්වේ. මේ තෘණ බිම් ඇතුළු ලඳු කැලෑ කෘන්තක මීයන්ට දිවි ගෙවීමට කදිම තෝතැන්නක් බව නොරහසකි. තෙත් කලාපයේ මානව ක්‍රියාකාරිත්වයන්ට ලක්නොවූ වැසි වනාන්තරයක මෙන් නොව අනුරාධපුරය වැනි වියළි කලාපයේ පිහිටි තෘණ බිම් අතර කෘන්තක මීයන්ගේ ගහනය ඉතා අධික ය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය මාධව මීගස්කුඹුර, ආචාර්ය සුයාමා මීගස්කුඹුර හා අප විසින් ශ්‍රී ලංකාවේ තෝරාගත් තෙත්, අතරමැදි හා වියළි යන කලාපවල කළ, මීයන් පිළිබඳ පර්යේෂණවලදී මේ බව තහවුරු විය. මෙම පර්යේෂණ අප විසින් දකුණු ඉන්දියාවේ තමිල්නාඩු හා කර්ණාටක යන ප්‍රාන්තවල ද මෙහෙයවූ අතර ඒ අනුව ශ්‍රී ලංකාවේ මීයන් පිළිබඳ සංසන්දනාත්මකව අර්ථකථනයක් කිරීමට අවස්ථාව ලැබිණි. මෙහිදී කෘන්තක මීයන් පිළිබඳ සාකච්ඡා කරන ලද්දේ සර්පයින් හා සර්පයින්ගේ ගහනය කෙරෙහි උන් ඍජුවම බලපාන නිසා ය. ධාන්‍ය වගා කරනු ලබන කලාපයන්හි සහ තෘණ හා ලඳු කැලෑ පැතිර ඇති කලාපයන්හි කෘන්තක මීයන්ගේ ගහනය නිරන්තරයෙන්ම ඉහළ අගයක පිහිටයි. එම හේතුව නිසාම මෙවැනි කලාපවල උන් ගිල දමමින් ජීවත්වන සර්ප ගහනය ද ඉහළ තලයක පවතී. මේ පිළිබඳ සංක්ෂිප්ත සටහනක් මීළඟ පරිච්ඡේදයේ ඇතුළත් වන බැවින් සමස්ත අනුරාධපුර කලාපය ආවරණය වන පරිදි සර්පයින් පිළිබඳ තොරතුරු අපි මෙතැන් සිට ඉදිරිපත් කරමු.

දශක තුනකට අධික කාලයක් අනුරාධපුර පෙදෙස ආශ්‍රිතව කළ සර්ප විද්‍යාත්මක අධ්‍යයනවලින් හා උක්ත මූලාශ්‍රවලින් පහත දැක්වෙන සර්පයින් මෙම කලාපයෙන් වාර්තා වන බව සඳහන් කළ හැකි ය. එම විශේෂ මෙසේ ය. ඇහැටුල්ලා (*Ahaetulla nasuta*) (රූපය 294), හෙනකඳයා (*Ahaetulla pulverulenta*) (රූපය 295), අහරකුක්කා (*Amphiesma stolatum*) (රූපය 296), දිය වර්ණයා (*Atretium schistosum*) (රූපය 297), කහ මාපිලා (*Boiga beddomei*) (රූපය 298), නිදි මාපිලා (*Boiga ceylonensis*) (රූපය 299), ලේ මාපිලා/නාග මාපිලා (*Boiga forsteni*) (රූපය 300), රෑන් මාපිලා (*Boiga trigonata*) (රූපය 301), කුණුදිය කළුවා (*Cerberus rynchops*) (රූපය 302), පොල්මල් කරවලා (*Chrysopelea ornata*) (රූපය 303), දඟර දණ්ඩා (*Chrysopelea taprobanica*) (රූපය 304), කටකළුවා (*Coelognathus helena*) (රූපය 305), පඳුරු හාල්දණ්ඩා (*Dendrelaphis bifrenalis*) (රූපය 306), තුරු හාල්දණ්ඩා (*Dendrelaphis tristis*) (රූපය 307), ගැට කරවලා (*Dryocalamus nympha*) (රූපය 308), පලාබරියා (*Macropisthodon plumbicolor*) (රූපය 309), පන්බරියා (*Liopeltis calamaria*) (රූපය 310), අළු රදනකයා (*Lycodon aulicus*) (රූපය 311), මල් රදනකයා (*Lycodon osmanhilli*) (රූපය 312), කබර රදනකයා (*Lycodon striatus*) (රූපය 313), අරණි දත් කැටියා (*Oligodon arnensis*) (රූපය 314), පුල්ලි දත් කැටියා (*Oligodon sublineatus*) (රූපය 315), වයිරි දත් කැටියා (*Oligodon taeniolatus*) (රූපය 316),

ගැරඬියා (*Ptyas mucosa*) (රූපය 317), දූතිගෝමරයා (*Sibynophis subpunctatus*) (රූපය 318), දිය බරියා (*Xenochrophis* cf. *asperrimus*) (රූපය 319), දිය නයා (*Xenochrophis piscator*) (රූපය 320), දෙපත් නයා (*Cylindrophis maculatus*) (රූපය 321), තෙල් කරවලා (*Bungarus caeruleus*) (රූපය 322), දෙපත් කළුවා (*Calliophis melanurus*), නයා (*Naja naja*) (රූපය 323), පිඹුරා (*Python molurus*) (රූපය 324),



රූපය 294. ඇහැටුල්ලා (***Ahaetulla nasuta***) (උපරිම දිග මිලිමීටර් 1000-1500 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)




රූපය 295. හෙනකඳයා (***Ahaetulla pulverulenta***) (උපරිම දිග මිලිමීටර් 800-1300 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 296. අහරකුක්කා (***Amphiesma stolatum***) (උපරිම දිග මිලිමීටර් 300-500 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 297. දිය වර්ණයා (***Atretium schistosum***) (උපරිම දිග මිලිමීටර් 300-500 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 298. කහ මාපිලා (***Boiga beddomei***) (උපරිම දිග මිලිමීටර් 500-800 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 299. නිදි මාපිලා (***Boiga ceylonensis***) (උපරිම දිග මිලිමීටර් 1000-1200 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)

දුඹුටු කණුඋල්ලා (*Ramphotyphlops braminus*), උල් තුඩුල්ලා (*Rhinophis oxyrhynchus*) (රූපය 325), තිත් පොළඟා (*Daboia russelii*) (රූපය 326), කුණකටුවා/පොළොං තෙලිස්සා (*Hypnale hypnale*) (රූපය 327), පලා පොළඟා (*Trimeresurus trigonocephalus*) (රූපය 328), වැලි පිඹුරා (*Gongylophis conicus*) (රූපය 329) ආදි වශයෙන් දැක්විය හැකි ය.





රූපය 300. ලේ මාපිලා (වම)/නාග මාපිලා (දකුණ) (***Boiga forsteni***) (උපරිම දිග මිලිමීටර් 1500-2000 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 301. රෑන් මාපිලා (***Boiga trigonata***) (උපරිම දිග මිලිමීටර් 400-700 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 302. කුණුදිය කළුවා (***Cerberus rynchops***) (උපරිම දිග මිලිමීටර් 600-1000 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 303. පොල්මල් කරවලා (***Chrysopelea ornata***) (උපරිම දිග මිලිමීටර් 800-1200 ක් පමණ) (ඇතුළත රූපය හිස). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 304. දඟර දණ්ඩා (***Chrysopelea taprobanica***) (උපරිම දිග මිලිමීටර් 600-900 ක් පමණ) (ඇතුළත රූපය හිස). (ඡායාරූපය: රුචිර සෝමවීර)

ඇහැටුල්ලා හා හෙනකඳයා (රූප 294-295) අඩි 4-5 ක් පමණ උසැති, පඳුරු මත වාසය කරන, සුළු විෂැති දිවාචර සර්පයින් ය. මේ අතරින් හෙනකඳයා වියළී ගිය ඉපල් මත වාසය කරන නිසාත්, උගේ සිරුර වර්ණය අනුව ඊටම අනුවර්තනය වී ඇති නිසාත් හඳුනාගැනීම තරමක් දුෂ්කර ය. උඩු හනුවේ පසුපසට වන්නට විෂ දළ දැරුව ද මේ සර්පයින් දෂ්ඨ කිරීමට පෙළඹෙන්නේ කලාතුරකිනි. නමුත් ඉන් සිදුවන හානිය සැලකිය යුතු නොවේ. මෙම කලාපයෙන් වාර්තා වන කහ මාපිලා, නිදි මාපිලා, ලේ මාපිලා හෙවත් නාග මාපිලා හා රෑන් මාපිලා (රූප 298-301) නිශාචරව දිවි ගෙවන සුළු විෂැති සර්පයින්






රූපය 305. කටකළුවා (***Coelognathus helena***) (උපරිම දිග මිලිමීටර් 500-700 ක් පමණ). (ඡායාරූප: රුචිර සෝමවීර)



රූපය 306. පඳුරු හාල්දණ්ඩා (***Dendrelaphis bifrenalis***) (උපරිම දිග මිලිමීටර් 700-900 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 307. තුරු හාල්දණ්ඩා (***Dendrelaphis tristis***) (උපරිම දිග මිලිමීටර් 700-900 ක් පමණ) (ඇතුළත රූපය හිස). (ඡායාරූපය: රුචිර සෝමවීර)

වේ. උන් දිවා කල ගස් බෙන හෝ බුරුල් ගස් පොතු අතර සැඟවී ජීවත්ව, රාත්‍රියේ පඳුරු මත හා ගස් මත වසන කටුස්සන්, හූනන්, කුඩා මීයන් හා කුරුල්ලන් දඩයමේ යෙදේ. වනබද නිවෙස් තුළටද රාත්‍රියේදී මාපිලුන් ඇදී එන්නේ ඒවායේ වසන කටුස්සන් හා හූනන් ගිල දැමීම සඳහා ය. පොල්මල් කරවලා හා දඟර දණ්ඩා (රූප 303-304) ඉතා උස් තුරු කරටිවල වසන, සුළු විෂැති සර්පයින් ය. දඟර දණ්ඩා ඇතැම් අවස්ථාවල බිම් මට්ටමට පැමිණෙන අතර ගල් පර්වත තුළ ද බහුලව හමුවේ. ඒ, බොහෝ විට අභිජනන සමයේ විය හැකි ය.



රූපය 308. ගැට කරවලා (***Dryocalamus nympha***) (උපරිම දිග මිලිමීටර් 300-450 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)





රූපය 310. පන්බරියා (***Liopeltis calamaria***) (උපරිම දිග මිලිමීටර් 200-350 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 309. පලාබරියා (***Macropisthodon plumbicolor***) (උපරිම දිග මිලිමීටර් 400-600 ක් පමණ). (ඉහළ හා පහළ රූප) (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 311. අළු රදනකයා (***Lycodon aulicus***) (උපරිම දිග මිලිමීටර් 300-700 ක් පමණ) (ඇතුළත රූපය හිස). (ඡායාරූපය: රුවිර සෝමවීර)




රූපය 312. මල් රදනකයා (***Lycodon osmanhilli***) (උපරිම දිග මිලිමීටර් 500 ක් පමණ) (ඇතුළත රූපය හිස). (ඡායාරූපය: රුවිර සෝමවීර)

කුණුදිය කළුවා (රූපය 302) ජලජවාසී සර්පයෙකි. ප්‍රධාන වශයෙන් මිරිදියෙහි වාසය කළද කලාතුරකින් කරදියේ ද හමුවේ. ඊට අමතරව කලපු ජලයේ ද වාසය කරයි. ප්‍රධාන වශයෙන් නිශාචර සර්පයෙකු වුවද දිවා කාලයේ ද ඔබ මොබ සැරිසරයි. මෙම මිරිදිය සර්පයා සුළු විෂ දූරුවද මිනිසුන් සපා කෑමට පෙළඹෙන්නේ ඉතාමත්ම කලාතුරකිනි. සපා කෑමෙන් අනතුරුව පැය හෝ දින කිහිපයක්

පැවතිය හැකි ඉදිමුමක් සහ සුළු වේදනාවක් ඇති වේ. ප්‍රධාන වශයෙන් මසුන් මත යැපෙන අතර ගෙම්බන්, ඉස්සන් හා කකුළුවන් ආදි සතුන් ද ගොදුරු කර ගැනීමට පෙළඹේ.

අළු රදනකයා, මල් රදනකයා, කබර රදනකයා, අරණි දත් කැටියා, පුල්ලි දත් කැටියා, වයිරි දත් කැටියා හා දැනි ගෝමරයා (රූප 311-316, 318) විශේෂයෙන්ම ගෘහාශ්‍රිතව වසන නිර්විෂැති සර්පයින් ය.




රූපය 313. කබර රදනකයා (***Lycodon striatus***) (උපරිම දිග මිලිමීටර් 250-450 ක් පමණ). (ඇතුළත රූපය හිස)
(ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 314. අරණි දත් කැටියා (***Oligodon arnensis***) (උපරිම දිග මිලිමීටර් 400-600 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 315. පුල්ලි දත් කැටියා (***Oligodon sublineatus***) (උපරිම දිග මිලිමීටර් 200-300 ක් පමණ).
(ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 316. වයිරි දත් කැටියා (***Oligodon taeniolatus***) (උපරිම දිග මිලිමීටර් 300-450 ක් පමණ).
(ඡායාරූපය: රුවිර සෝමවීර)





රූපය 317. ගැරඬියා (***Ptyas mucosa***) (උපරිම දිග මිලිමීටර් 1500-2500 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 318. දූනිගෝමරයා (***Sibynophis subpunctatus***) (උපරිම දිග මිලිමීටර් 200-350 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 319. දිය බරියා (***Xenochrophis asperrimus***) (උපරිම දිග මිලිමීටර් 400-700 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 320. දිය නයා (***Xenochrophis cf. piscator***) (උපරිම දිග මිලිමීටර් 400-600 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 321. දෙපත් නයා (***Cylindrophis maculatus***) (උපරිම දිග මිලිමීටර් 300-650 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)

උන් බොහෝ විට රාත්‍රී කාලයේ නිවෙස් තුළට ද පැමිණෙන්නේ භූනන් ගිල දැමීමට ය. එහිදී මිනිසා අතින් නිකරුණේ මරුමුවට පත්වේ.

කටකළුවා (රූපය 305) නිර්විෂ සර්පයෙකි. මුඛය තුළ වූ කළු පැහැති වර්ණය නිසා එම නම ලැබී ඇත. බිය වූ කල ශරීරයේ ඉදිරි පෙදෙස දඟර ආකාරයට හැඩ කොට ඔසවා පහරදීමට උත්සාහ කරයි. එබැවින් ගැමියන් විෂ සහිත සර්පයෙකු යැයි වරදවා වටහාගැනීමේ හේතුවෙන් මරා දමනු ඇත. කටකළුවන් බහුලව බිම වාසය කරන අතර පඳුරු මත ද හමුවේ.

දෙපත් නයා (රූපය 321) දුඹුරු, කළු හා සුදු වර්ණවලින් යුත් සිරුරක් ඇති නිර්විෂ සර්පයෙකි. ගල් යට, හියුමස් පස් සහිත පොළොවේ හා දිරා යන කඳන් යට වාසය කරයි. මේ සර්පයා බිය වූ විට වල්ගය ඔසවා විලෝපීයයන් මුලාවට පත්කොට පොළොව තුළට හෝ ආරක්ෂිත තැනකට රිංගා ගනියි. මේ කලාපයේ වූ සියලුම ජල පද්ධතිවල දිය බරියා හා දිය නයා (රූප 319, 320) හමුවේ. මෙහි වූ ජලජ පැළෑටි ගහන පොකුණුවල මේ ජලචර සර්පයින්ට ජීවත්වීමට සුදුසු නිකේතන ඇත. බොහෝ විට මසුන් හා මැඩියන්, මැඩි බිත්තර මත යැපෙන මෙම දිය සර්පයින් නිර්විෂැති වේ.

පලා පොළඟා (රූපය 328) අනුරාධපුර කලාපයේ ගඟබඩ වන ප්‍රජාවේ ද, රිටිගල වනයේ ද හමුවේ. තෙත් හා ශීත නිකේතනවලට වඩාත්ම ප්‍රියකරන බව පෙනේ. පූජා නගරය අවට පෙදෙසේ ඉතා දුලබ ය. මඳ විෂැති පළා පොළඟා දිවා කල පඳුරු මත නිසොල්මන්ව සිටිනමුත් සවස් යාමයේ සිට ක්‍රියාකාරී වේ.

රාත්‍රියේදී ගසකින් ඇත වූ තවත් ගසකට මාරුවීමේදී බිමට පැමිණිය ද පලා පොළඟා රුක්වැසි සර්පයෙකි. දිවා කල දෂ්ඨ කිරීමට නොපෙළඹුණ ද රාත්‍රියේ තුරු මත හිඳ දෂ්ඨ කිරීමට උත්සාහ කරනු ඇත. මාරාන්තික නොවුවද මේ දෂ්ඨනයන් වේදනාකාරී අත්දැකීම් ගෙනදේ.

අනුරාධපුර දිස්ත්‍රික්කය උග්‍ර හෙවත් මාරාන්තික සර්පයින් බොහෝ වාසය කරන පෙදෙසක් බව ඉහත සඳහන් කළෙමු. පසුගිය දශක තුන ඇතුළත මේ ප්‍රදේශයේ සර්ප දෂ්ඨන හා ඉන් ඇති වූ මරණ වාර්තා පිළිබඳ සලකා බලන කල මෙම කලාපයේ ජනතාව ධාන්‍ය වගාව ආරම්භ කළ ඓතිහාසික සමයේ සිටම මාරාන්තික සර්පයින්ගෙන් පීඩා විඳි බව උපකල්පනය කළ හැකි ය. පැරැන්නන් තම ගෙවත්ත හා ගෘහය තුළට සර්පයින්ගේ පැමිණීම අවම කරගත හැකි ක්‍රමවේදයන් වඩා ප්‍රායෝගිකව ක්‍රියාවේ යොදවා ඇති බව අප කළ අධ්‍යයනයන්ගෙන් පෙනී ගොස් තිබේ. වර්තමානයේ නගරයෙන් ඈත ග්‍රාමීය පෙදෙස්වල කරන ලද නිරීක්ෂණවලදී එහි වැසියන් දැනුවත්ව හෝ නොදැනුවත්ව සර්පයින්ගේ පැමිණීම වළක්වා ගැනීමට භාවිත කරන උපක්‍රම රැසක් හඳුනාගත හැකි විය. කටු මැටියෙන් තනන ලද නිවෙස්වල වහලය සෙවිලි කර ඇත්තේ පොල් අතු, පිදුරු හෝ වියළී ගිය තල් කොළවලිනි. නිවසේ සිට අඩි 10 ක් හෝ 15 ක් ඈතට විහිදෙන බිම් තීරයක් දිනපතා මනාව අතුගා පිරිසිදු කරන අතර නිවසේ පොළොව බොහෝ විට ගොම ආලේප කරනු ඇත. නිවසේ වහළ දෙසට යොමු වී ඇති ගස් හා අතු කපා දැමීමෙන් ගස් මතින් සර්පයන් වහලය ඔස්සේ පැමිණීම වළක්වා ගැනීමට කටයුතු කර ඇත. මීට අමතරව වැසිකිළිය නිවසින් තරමක් ඈතින් තැනීමටත්, ගවයින්, එළුවන් හෝ කුකුළන් ඇති කරන ස්ථාන නිවසින් මඳක් ඈත්ව ස්ථානගත කිරීමටත් මෙම ගැමියන් පුරුදුව ඇත. පුරාණ ගැමි පුරුදුවලට අනුව ධාන්‍ය ගබඩාව හෙවත් වී බිස්ස නිවසින් පිටත පිහිටීම මේ අතර සඳහන් කළ හැකි විශේෂිත කරුණකි. ගැමියන්ගේ මෙම පුරුදු පුහුණු සර්පයින්ගේ පැමිණීම වළක්වා ගැනීමට ඉවහල් වූයේ කෙසේද යන්න අප ඉතා සැකෙවින් විමසා බලමු. නිවෙස්වල බිමට ගොම ආලේප කිරීමෙන් බොහෝ සතුන් විකර්ෂණය වන බව නොරහසකි. වියළි කලාපයේ වසන ඇතැම් ගොවියෝ තම ලියැදි වටා මෙන්ම හේන් වැට වටා දිය කරන ලද ගොම (දියර ගොම) ඉසීමෙන් වල් අලින්ගේ පැමිණීමට බාධා ඇති කරති. එයට හේතු වන්නේ වල් අලින් ගොම ප්‍රතික්ෂේප කරන බැවිනි. මීට අමතරව නිවෙස වටා ගෙමිදුල ඉතා ක්‍රමවත්ව අතුගා පිරිසිදුව තැබීමෙන් සර්පයින්ට පැමිණීමට හෝ නිවසට ඇතුළුවීමට බාධා ඇති වේ. හොඳින් අතුගාන ලද පොළොව හරහා බඩ ගා යාමට සර්පයින් නොපෙළඹෙන්නේ උන් විලෝපීයයන්ට ගොදුරු වීමේ අවදානම වැඩිවීම හේතුවෙනි. ග්‍රාමීය වැසිකිළි බිත්තියෙහි මීයන් ගුල් තනන නිසා උන් ගිල දැමීමට පැමිණෙන සර්පයින්ගෙන් ආරක්ෂා වියයුතුය. එම නිසා වැසිකිළිය නිවසට ඈතින් තැනීමෙන් ඔවුන් සර්පයින්ගෙන් මිදීම සඳහා ආරක්ෂක පියවරක් ගෙන ඇත. සතුන්ට ලබා දෙන ආහාරයේ ඉතිරි වූ දෑ කෑම සඳහා මීයන් පැමිණෙන බැවින් එම සතුන් ඇති කරන ස්ථානයන් නිවසට ඈතින් පිහිටුවීමෙන් සර්පයින් තම ගෙතුළට පැමිණීම තවදුරටත් වළක්වා ඇත. කෘන්තක මීයන් විසින් බහුලව විනාශ කරන ඔවුන්ගේ ප්‍රධාන ආහාරයක් ලෙස ධාන්‍ය වර්ග හැඳින්වීමට පුළුවන. වී බිස්ස නිවසින් බාහිරව ඉදිකිරීමෙන් නිවස තුළට මීයන් පැමිණීම වැළැක්වීමට ඔවුන් කටයුතු යොදා ඇති බැව් මනාව පැහැදිලි වේ. මේ සමස්ත ක්‍රියාවලියේදී ගැමියන්, සර්පයින්ගෙන් ගහන වියළි කලාපය තුළ ජීවත් වීමේ ආරක්ෂක විධිවිධාන කොතෙක් යොදා ඇති ද යන්න ඔබට වැටහෙනු ඇත.

සර්පයින් පිළිබඳව ග්‍රාමීය ජනයා දක්වන තවත් වැදගත් ප්‍රතිචාරයක් පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු. බොහෝ ගැමියන් සර්පයෙකුට පහරදී මරණයට පත්කිරීමෙන් අනතුරුව සර්පයාගේ සිරුර කොළ රොඩු හා ලී දඬු දමා පිළිස්සීම සිදුකරයි. ඉන් අනතුරුව පිළිස්සුණු සර්ප සිරුර තරමක් ගැඹුරු වළක් හාරා වළ දමයි. මෙම කටයුත්ත විශ්ලේෂණය කොට බැලූ කල වැටහෙනුයේ කුමක්ද? ගැමියන් තමන් විසින් ඝාතනය කළ සර්ප සිරුර පිළිස්සීමත්, ඉන් අනතුරුව එය වළ දැමීමත්

කරන්නට ඇත්තේ කුමන හේතුවක් නිසාද? සර්ප අභිජනන ක්‍රියාවලියේදී උන් තම විරුද්ධ ලිංගිකයින් ආකර්ෂණය කරගැනීම සඳහා පරිසරයට ෆෙරමෝන (pheromones) නිදහස් කරනු ඇත. මෙය සර්පයින්ට පමණක් සීමාවූවක් නොවන අතර විශාල පරාසයක වූ සතුන් තම විරුද්ධ ලිංගිකයින් ආකර්ෂණය කරගැනීම සඳහා ෆෙරමෝන පරිසරයට මුදාහරී. සර්පයෙකුට පහරදී ඝාතනය කිරීමේදී උගේ සිරුරේ ග්‍රන්ථී තැළී පොඩිවී එම වහනයන් පරිසරයට මුදාහැරීම සිදුවිය හැකි ය. මෙය ඉතා සුලබව සිදුවිය හැකි සරල සිදුවීමකි. නිවෙස් තුළට පැමිණි සර්පයින්හට පහරදී හෝ තළා ඝාතනය කිරීමෙන් අනතුරුව සර්ප සිරුර නිවෙස අසලම දැමූ අවස්ථාවලදී එම විශේෂයටම අයත් තවත් සර්පයින් කිහිපදෙනෙකු ඉතා සුළු කාලයක් තුළ සර්ප සිරුර සමීපයට පැමිණි අවස්ථා අපි හොඳින් දනිමු. එසේනම් ගැමියන් සර්ප සිරුර පිළිස්සීමෙන් හා එය වළදැමීමෙන් එම ස්ථානයට තවත් සර්පයින්ගේ පැමිණීම වළක්වා ඇත. සිරුර වළදැමීමෙන් අත්වන තවත් ප්‍රතිලාභයක් වනුයේ එම සර්පයා උග්‍ර විෂැති සර්පයෙකු නම් උගේ විෂ දළ පා නොගැටීමයි. ගැමියන් මෙම ක්‍රියාවලිය දැන හෝ නොදැන සිදුකරතත් එහි ප්‍රතිඵලය බොහෝ ඵලදායක ය. මියගිය සර්පයාගේ සිරුර පිළිස්සීමත්, වළදැමීමත් යන සමස්ත සිදුවීම තුළ ඇත්තේ අප ගැමියන් සර්පයින්ගෙන් ආරක්ෂා වීමට දරන ලද උත්සාහයන් නොවේද? ගැමියන්ගේ මේ ආකාර පුරුදු තව කොතෙකුත් ඇති බැව් අපට අනුමාන කළ හැකි ය. අනුරාධපුරය ආශ්‍රිත පුරාජෛවවිවිධත්වය පිළිබඳ මෙම සාකච්ඡාවේ මෙවැනි ගැමි පුරුදු සියුම් ලෙස විශ්ලේෂණය කොට ඒවා වාර්තා කිරීම වැදගත් ය. ඔවුන් රාත්‍රියේ ගමන් කිරීමේදී අනුගමනය කරනු ලබන වත් පිළිවෙත් හා හේතු, කුඹුරේ වගා කටයුතු කරන අවස්ථාවලදී සර්පයින් හා අනෙකුත් සතුන් සමඟ දක්වන සහසබඳතාවය අධ්‍යයනය කිරීම ද ඉතා වැදගත් වේ. ගැමියන් නිකරුණේ සතුන් මැරීමට කැමැත්තක් නොදක්වන අතර ඔවුන් හේන් ගිනි තැබීමේදී පවා සතුන්ට ඉන් පලායාමට හැකිවන පරිදි එම කටයුත්ත සිදුකරනු ඇත. පුරාණ ගැමියෝ සතුන්ගේ සිතුම් පැතුම් තේරුම් ගෙන උන්ගේ ජීවිතවලට හානියක් නොවන අයුරින් දිවි ගෙවන්නට ඇත.


වැලි පොළඟා (*Echis carinatus*) (රූපය 330) ශ්‍රී ලංකාවේ වියළි කලාපයට සීමා වී ඇති ලොව වෙසෙන උග්‍රතම විෂැති සර්පයෙකි. වැලි කඳු හා ශුෂ්ක කලාපීය පරිසරයේ හා තල් ගස් ගහන පෙදෙස්වල මෙම සර්පයින් බහුල ය. උන් බොහෝ විට වියළී වැටුණු තල් කොළ යට දිවා කල ගතකරයි. වැලි පොළඟුන්ට වාසය කිරීමට ඉතා උචිත පරිසරයක් තිබුණ ද අද වන තෙක් මෙම සර්ප විශේෂය අනුරාධපුරයෙන් වාර්තා වී නොමැත. එසේ වුවද මෙම කලාපයට මායිම් ව පිහිටි පුත්තලම හා මන්නාරමෙන් වැලි පොළඟුන් වාර්තා වන නිසා අනුරාධපුරය වැනි වියළි පෙදෙසකින් මෙම සර්ප විශේෂය වාර්තා වීමට ඇති ඉඩකඩ බොහෝ ය. ප්‍රධාන වශයෙන් රුධිර වාහිනී පද්ධතියට බලපාන උග්‍ර විෂ මෙම සර්පයා සතු ය. මෙරටින් වාර්තා වී ඇත්තේ වැලි පොළොං දෂ්ටන කිහිපයක් පමණි. දෂ්ටනයකින් අනතුරුව ඉදිමුම, වේදනාව, ඇසිපිය කඩා හැලීම, දැඩි හිසරදය පැවතිය හැකි ය. නමුත් ශ්‍රී ලංකාවෙන් මේ වන තෙක් මරණ වාර්තා වී නොමැත.

අනුරාධපුර යුගයට අයත් ආරෝග්‍ය ශාලාවල සර්ප වෙදකම සිදුකරන්නට ඇතැයි සිතීම අරුමයක් නොවේ. 'ශිලාමය බෙහෙත් ඔරුව' මේ විෂ වෙදකම හා සෘජු සම්බන්ධතාවක් තිබෙන්නට ඇත (රූපය 331). කෙසේ වුවද සර්පයින් පිළිබඳ විශේෂඥයෙකු වන ඇන්ස්ලම් ද සිල්වා මහතා 1980-81 කාලය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ සර්ප දෂ්ටන පිළිබඳ කරන ලද පර්යේෂණ ප්‍රතිඵලවලට අනුව එම දෂ්ටනවලින් මියගියවුන්ගෙන් 44% කට වගකිව යුත්තේ තෙල් කරවලුන් ය. ඊට අමතරව 31.1% කට තිත් පොළඟා ද, 24.0% කට නාගයා ද හේතු වී තිබේ. කුණකටු දෂ්ටනයකින් එක් පුද්ගලයකු මියගොස් ඇත (De Silva, 1981).



රූපය 322. තෙල් කරවලා (***Bungarus caeruleus***) (උපරිම දිග මිලිමීටර් 800-1700 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)





රූපය 323. නයා (***Naja naja***) (උපරිම දිග මිලිමීටර් 1000-1500 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)



රූපය 324. පිඹුරා (***Python molurus***) (උපරිම දිග මිලිමීටර් 3000-6000 ක් පමණ). (ඡායාරූපය: රුචිර සෝමවීර)

මෙම කලාපයේ වී අස්වනු නෙළන සමයේ ලියදිවලට වැටෙන වී කැමට පැමිණෙන කෘන්තක මීයන්ගේ ගහනය ඉහළ යනු ඇත. කෙත්වතුවල මානව ක්‍රියාකාරකම් බහුල වන්නේද මේ අස්වනු නෙළන සමයේදී ය. මෙහිදී ගොවීන්ගේ දෙඅත්වලටත්, දෙපාවලටත් බොහෝ සේ සර්ප දෂ්ටන සිදුවේ. උතුරුමැද පළාතේ සර්ප දෂ්ටනවලින් මියයන්නවුන්ගෙන් බහුතරය ගොවීන් ය. ඔවුන්ට සිදුවන මෙම සර්ප දෂ්ටන ඓතිහාසික සමයේ සිටම සිදුවන්නට ඇතැයි ඉහතදී සඳහන් කළේ මේ හේතුව නිසා ය. කෙත්වතුවල අස්වනු නෙළන කාලයේ සිදුවන සර්ප දෂ්ටනවලින් බහුතරය තිත් පොළඟුන් නිසා සිදුවේ (රූපය 326). අනුරාධපුරය පූජා නගරයේ වී අස්වනු නෙළන කාලසීමාවේ එක් ලියද්දකින් තිත් පොළඟුන් දස දෙනෙකු පමණ හමුවූ අවස්ථා සුලබ ය. තිත් පොළඟුන්ගේ ගහනය මෙතරම් ඉහළ මට්ටමකට පවතින්නට ඇත්තේ ලියැදිවල ධාන්‍ය බහුල වීම හේතුවෙන් කෘන්තක මීයන්ගේ ගහනය වැඩි වූ නිසාවෙනි. මෙම පොළඟා දිවා කල මෙන්ම රාත්‍රි කල ද දෂ්ට කිරීමට පෙළඹේ. උන්ගේ ප්‍රධානතම ආහාරය උණුසුම් රුධිරය දරන කෘන්තක මීයන් ය. මීයන් නිවෙස් අසල බෙහෙවින් වසන නිසා තිත් පොළොඟුන් ද නිවෙස් අසල ඉතා සුලබ ය. ශ්‍රී ලංකාවේ වෙසෙන උග්‍ර විෂ සහිත සර්පයින්ගෙන් ස්ථානීය මරණ ගෙන දෙන සර්පයෙකු වශයෙන් තිත් පොළඟා හැඳින්විය හැකි ය. අනුරාධපුර කලාපයේ විශාල වශයෙන් පැතිර ඇති තෘණ බිම් හා ලඳු කැලෑවල තිත් පොළඟුන් ඉතා සුලබව ජීවත් වේ.

කුණකටුවන් (රූපය 327) ද නිවෙස් ආශ්‍රිතව හා ගොවිපොළවල සුලබව හමුවන උග්‍ර විෂැති සර්පයෙකි. උන් කොළරොඩු සහ පසේ පැහැයට ඉතා සමාන ශරීර වර්ණ රටා දරන බැවින් බොහෝ දෙනෙකුට පෑගීම නිසා පාදයේ පහළ පෙදෙසට දෂ්ටන සිදුවේ. විශාල පරාසයක පෘෂ්ඨවංශී සතුන් ආහාරයට



රූපය 325. උල් නුඹුල්ලා (***Rhinophis oxyrhynchus***) (උපරිම දිග මිලිමීටර් 400-550 ක් පමණ). (ඡායාරූපය: දුමාන්ත කන්ඩම්බි)



රූපය 326. නිත් පොළඟා (***Daboia russelii***) (උපරිම දිග මිලිමීටර් 800-1300 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 327. කුණකටුවා/පොළොං තෙලිස්සා (***Hypnale hypnale***) (උපරිම දිග මිලිමීටර් 230-250 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 328. පලා පොළඟා (***Trimeresurus trigonocephalus***) (උපරිම දිග මිලිමීටර් 600-750 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 329. වැලි පිඹුරා (***Gongylophis conicus***) (උපරිම දිග මිලිමීටර් 400-900 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)



රූපය 330. වැලි පොළඟා (***Echis carinatus***) (උපරිම දිග මිලිමීටර් 300-500 ක් පමණ). (ඡායාරූපය: රුවිර සෝමවීර)

ගන්නා කුණකටුවන් සෙවනැති ගෙමිදුල්වල ද ඉතා සුලබ ය. ස්ථානීය මරණ ගෙනදිය නොහැකි වුවද කුණකටු දෂ්ටනයකින් අනතුරුව වකුගඩු අක්‍රිය වීම හේතුවෙන් මිනිස් ජීවිතවලට බොහෝ හානි සිදුවේ. පොළොං පවුලේ සර්පයින්ගේ විෂෙහි බහුලව අන්තර්ගත වී ඇත්තේ රුධිර වාහිනී පද්ධතියට හානි

ගෙනදෙනු ලබන විෂ බැවින් එම සර්ප දෂ්ටනවලින් අනතුරුව ඇස්, නාසය, මුඛය, මුත්‍ර මාර්ගය හා ගුද මාර්ගය මඟින් රුධිරය වහනය විය හැකි ය.

තෙල් කරවලා (රූපය 322), නාගයා (රූපය 323) හා දෙපත් කළුවා යන සර්පයින්ගේ විෂෙහි ස්නායු පද්ධතියට බලපාන 'ස්නායුක විෂ' පවතී. තෙල් කරවලුන් අනුරාධපුරය කේන්ද්‍ර කොටගත් සමස්ත උතුරුමැද කලාපයේත්, තවත් වියළි කලාපීය නැනිතලා පෙදෙස්වලත් ඉතා සුලබ උග්‍ර විෂැති සර්පයෙකි. උන්ට මේ ප්‍රදේශයේ 'හබරලා' හා 'මගමරුවා' යන නාමයන් ද පටබැඳී ඇත. දිවා කල දෂ්ට කිරීමට උත්සාහ නොකළ ද උන් සවස් යාමයේ සිට දෂ්ට කිරීමට පසුබට නොවේ. තෙල් කරවල් දෂ්ටන බහුලව සිදුවන්නේ මැදියම් රෑයේ ය.



රූපය 331. මිහින්තලයේ පිහිටි අනුරාධපුර යුගයට අයත් ආරෝග්‍ය ශාලාවක නටබුන් සහ බෙහෙත් ඔරුව.
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මිනිසුන් රාත්‍රියේ තද නින්දේ සිටියදී සිදුවූ තෙල් කරවල් දෂ්ටන රැසක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇත. බොහෝ ග්‍රාමීය නිවෙස්වල සිරිතක් ලෙස බිරිඳ හා දරුවන් නිවස තුළ නිදාගන්නා අතර ස්වාමිපුරුෂයා හෝ පියා නිවසින් පිටත විවෘත ඉස්තෝප්පුවේ හෙවත් පිලේ නිදයි. බොහෝවිට මෙම පිරිමින් නිදනුයේ පැදුරක් මත හෝ පිලේ වූ මැස්සක් මත ය. මෙවැනි පුද්ගලයින් තෙල් කරවල් දෂ්ටනවලට ගොදුරු වීමට ඇති අවස්ථාව ඉහළ ය. තෙල් කරවලුන් දිවා කල සෙවනැති තැන්හි කොළරොඩු අතර කාලය ගතකරයි. උන්ගේ ප්‍රධානතම ආහාරය වනුයේ අනෙකුත් සර්පයින් ය. කෙටි විෂ දළ පිහිටන බැවින් තෙල් කරවල් දෂ්ටනයකින් අනතුරුව මිනිස් සිරුරේ සැලකිය යුතු දළ සලකුණු සටහන් නොවේ. එම නිසා රාත්‍රී නින්දේදී මිනිසුන්ට නොදැනෙන ලෙස තෙල් කරවල් දෂ්ටනයක් සිදුවුවහොත් පසු දින දෂ්ටන සලකුණු දැකිය නොහැකි බැවින් රෝගියා සහ ඔහුගේ ඥාතීන් දැඩි අපහසුතාවයකට පත්වේ. කරවල් දෂ්ටන සිදුවූ රෝගීන්ගේ රෝග ලක්ෂණ ලෙස ඇසිපිය හෙළීම අක්‍රමවත් වීම, මුඛයේ මාංශ පේශී මනා ලෙස හැසිරවිය නොහැකි වීම, ශරීරය වකුටුවීම හා ශ්වසන අපහසුතා ආදිය දැක්විය හැකි ය.

හුඹස් හා ගල් කුළු මේ කලාපයේ සුලබ නිසා ඒ ආශ්‍රිතව නාගයින් බහුලව ගැවසේ. නොයෙක් විශ්වාසයන් හේතුවෙන් නාගයින් මැරීමට ජනයා බියක් දක්වන නිසා උන් මේ කලාපයේ නිවෙස් ආශ්‍රිතව ද මිනිසුන් සමගම නොබියව වාසය කරනු ඇත. විශේෂයෙන්ම හිමිදිරියේ හා උදෑසන කාලයේ ක්‍රියාශීලී වන උග්‍ර විෂැති සර්පයෙකි. අනුරාධපුර යුගයේ ගල් කැටයම් වෙත අවධානය යොමු කරන විට එකල්හි පැවති පුරාණ ජන සමාජය තුළ නාගයින්ට සුවිශේෂී ස්ථානයක් හිමිව තිබුණු බව පැහැදිලි වේ. ඒ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු එකතුවක් ඉදිරි පරිච්ඡේදයක දක්වා ඇත.

දෙපත් කළුවා ස්නායුක විෂ සහ දළ දැරුවද ශරීර ප්‍රමාණය, මුඛය හා විෂ දළ කුඩා වීම නිසා මිනිසුන්ට දෂ්ට කිරීමේ හැකියාව නොමැති බැවින් දෂ්ටන හා මරණ මෙතෙක් වාර්තා වී නොමැත.

ධාන්‍ය වගාව, කෘන්තක මීයන්ගේ සැලකිය යුතු ගහනයක් පැවතීම හා උග්‍ර විෂැති සර්පයින්ගේ පැතිරීම අනුරාධපුර පැරණි නාගරික සමාජය තුළ වැදගත් වන්නේ එයින් සිදුවන සර්ප දෂ්ටන හා මරණ සංඛ්‍යාව ද බොහෝ ඈතට දිව ගිය ඉතිහාසයකට නැකම් කියන නිසා ය. මේ පුරාණ නාගරික සමය තුළ සර්ප දෂ්ටනවලින් මිදීම වෙනුවෙන් ඔවුන් බොහෝ සේ සංවිධානාත්මකව සිරිත් විරිත් හා වෛද්‍ය ක්‍රමවේදයන් අනුගමනය කර ඇති බව අනුමාන කළ හැකි ය. පුරාණ දේශීය වෛද්‍ය ක්‍රමය තුළ සර්ප දෂ්ටනයන්ට ප්‍රතිකාර කිරීම සඳහා සකස් වූ විශේෂ ක්‍රමවේදයන් තිබෙන්නට ඇත. මේ මිනිස්-සර්ප ගැටුම පුරාණයේ සිටම පැවතුණු අතර ඒ පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීම මානව විද්‍යා විෂය තුළ සිත්ගන්නාසුලු කටයුත්තක් වනු ඇතැයි අපගේ හැඟීම වේ.


මෙම පරිච්ඡේදය සැකසීමේදී මෙරට සර්පයින් පිළිබඳ විද්වතුන් සහ ප්‍රවීණයන් කිහිප දෙනෙකුගෙන්ම ලැබුණු දායකත්වය අගය කොට සලකමු. ඒ අතරින් ආචාර්ය ඇන්ස්ලම් ද සිල්වා, ආචාර්ය රුචිර සෝමවීර සහ සමීර කරුණාරත්න විශේෂයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමු. මෙහි ඇතුළත් සර්පයින් පිළිබඳ විස්තර සම්පාදනය කිරීමේදී ආචාර්ය රුචිර සෝමවීර විසින් වසර 2006 දී රචිත 'ශ්‍රී ලංකාවේ සර්පයින්'නම් ග්‍රන්ථය මනා පිටිවහලක් විය.

කුරුල්ලන්

වගුරු, වැව්, මඩ තලා, තෘණ බිම්, ලඳු කැලෑ, කුඹුරු, ගංගා, ගඟබඩ වනාන්තර, මෝසම් වනාන්තර හෙවත් වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර, හේන්, ගෙවතු ආදි පුළුල් පරාසයක් තුළ පැතිර ඇති පරිසර පද්ධති ගණනාවකින් අනුරාධපුරය හා ඒ ආශ්‍රිත කලාපය සමන්විත ය. ජල පද්ධතිවලින් අනූන කලාපයක් නිසා ජලචර කුරුල්ලන් සැලකියයුතු ප්‍රතිශතයක් මෙහි වේ. වැව්වල වූ නොගැඹුරු කලාපවලත්, පොකුණුවලත් උන් බහුල ය. ශ්‍රී ලංකාවේ ජෛවවිවිධත්වයේ පැතිරීම අනුව අප රටට ආවේණික ජීවීන්ගෙන් බහුතරය මූලික වශයෙන් ව්‍යාප්තව ඇත්තේ තෙත් කලාපයේ නිසා මෙහි වූ වියළි පාරිසරික තත්ත්වයන් යටතේ ආවේණික කුරුල්ලන් හමුවන්නේ සුළු වශයෙනි. නමුත් මෙහි මෝසම් වන ආවරණය ඉතා පොහොසත් නිසා වනාන්තර ඇසුරේ කුරුල්ලන් රැසක් වාසය කරනු ඇත. මීට අමතරව අගෝස්තු මාසයේ සිට ඊළඟ වසරේ අප්‍රේල් දක්වා උණුසුම සොයා මෙහි පැමිණෙන පර්යටන කුරුල්ලන් (මොවුන් ශ්‍රී ලංකාවට පැමිණෙනුයේ මෙම කාලපරිච්ඡේදයේ පමණක්ම නොවේ) හෙවත් නිහැරියන්ගෙන් ද මෙම ප්‍රදේශය පොහොසත් ය. අනුරාධපුරය කේන්ද්‍ර කොටගත් මේ කලාපයේ කුරුල්ලන් පිළිබඳ 1980 දශකයේ මුල සිටම කළ ගවේෂණවලින් රැස් කරගත් දත්ත මගින් මෙම පරිච්ඡේදයේ තොරතුරු පෙළගස්වා ඇත. සමස්තයක් වශයෙන් ගත් කල අනුරාධපුරය ආශ්‍රිත කලාපය පක්ෂී විවිධත්වය අතින් ඉතා පොහොසත් බව මෙම තොරතුරුවලින් අනාවරණය වේ. මෙම පරිච්ඡේදයේ මූලික වශයෙන් විස්තර කරනු ලබන්නේ මේ ප්‍රදේශයෙන් වාර්තාවන වඩාත් ප්‍රචලිත කුරුල්ලන් පිළිබඳ පමණි.



රූපය 332. ශ්‍රී ලංකා වළි කුකුළා (***Gallus lafayetii***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 333. මොනරා (***Pavo cristatus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

නිල් පිරිවටුවා (*Coturnix chinensis*), බෝල වටුයුරුවා (*Turnix suscitator*), ශ්‍රී ලංකා හබන්-කුකුළා (*Galloperdix bicalcarata*), ශ්‍රී ලංකා වළි කුකුළා (*Gallus lafayetii*) (රූපය 332) සහ මොනරා (*Pavo cristatus*) (රූපය 333) මෙම වියළි පෙදෙස්වල වසන භෞමික කුරුල්ලන් වේ. හබන් කුකුළා හා වළි කුකුළා අප රටට ආවේණික කුරුල්ලන් අතරින් ප්‍රමාණාත්මකව විශාලම දෙදෙනා වේ. වියළි කලාපයේ වළි කුකුළා සුලබ වන අතර උන් තුරු වදුල ඇති ගෙවතු ආශ්‍රිතව ද පහසුවෙන් දැකගත හැකි ය. උදේ කාලයේ පිරිමි සතුන්ගේ හඬ නිරතුරුව ඇසිය හැක්කේ සැලකිය යුතු ගහනයක් මෙහි ජීවත් වන බැවිනි. හබන් කුකුළා වියළි කලාපය තුළ ඉතා විරල වුවද අනුරාධපුරය ආශ්‍රිත මහා වනාන්තරවලත්, මල්වතු ඔය දෙපස වූ ගඟබඩ වනාන්තරවලත් කලාතුරකින් වාර්තා වේ. ලංකාවේ ජීවත් වූ බලංගොඩ මානවයා හෙවත් ශිලා යුගයේ මානවයාගේ පක්ෂී ආහාරයේ ප්‍රධානතම නියෝජනය වනුයේ ශ්‍රී ලංකා වළි කුකුළා ය. එම මානවයා ජීවත් වූ තෙත් කලාපීය ගුහා වාසස්ථානවලින් අදින්

වසර 37,000 කට පෙර සිටම මෙම වළි කුකුළු අස්ථි කොටස් හමුවේ. දකුණු ආසියාවෙන් හමුවන පැරණිතම පක්ෂී අවශේෂ වනුයේ ශ්‍රීපාද අඩවියේ බෑවුමක, මුහුදු මට්ටමේ සිට මීටර් 400 ක් පමණ උසින් පිහිටි කුරුවිට බටදොඹලෙනෙන් වාර්තා වන වළිකුකුළු අස්ථි වේ. මෙකී අවශේෂ එම ගුහාවේ ජීවත් වූ මානවයා තම අවට එකල පැවති වැසි වනාන්තරවලින් දඩයම් කොට ආහාරයට ගෙන ඉවත ලූ අස්ථි කොටස් ය. ප්ලයිස්ටොසීන අවධියේ අවසාන කාලවකවානුවට අයත් වන මෙම අස්ථි, බොහෝ දුරට ෆොසිල තත්ත්වයට පත්වීමට ආසන්නව පවතී. වළි කුකුළාට අමතරව ශ්‍රී ලංකා හබන් කුකුළාගේ ද අස්ථි මෙම ප්‍රාග් ඓතිහාසික වාසස්ථානවලින් හමුවේ (Deraniyagala, 1992; Perera, 2010; ප්‍රේමරත්න, 2011(b); ප්‍රේමරත්න ඇතුළු පිරිස, 2012(a)). මොනරා අනුරාධපුරයෙහි ජීවත් වන භෞමික කුරුල්ලන් අතරින් විශාලතමයා වේ. විවෘත ලඳු කැලෑ හා කුඹුරු ආශ්‍රිතව මොනරුන් බහුල ය. ඔවුන් රංචු වශයෙන් ජීවත් වන අතර එක් රංචුවක් වැඩිහිටි පිරිමි සතෙකුගෙන්, වැඩිහිටි ගැහැනු සතුන් කිහිපදෙනෙකුගෙන් හා පැටවුන්ගෙන් සමන්විත වේ. මොනරුන් උදය කාලයේ දැඩි සූර්යාලෝකය පතිතවන වැව් ඉවුරුවල පහසුවෙන් දැකබලා ගත හැකි ය (de Silva *et al.*, 1996). සීගිරිය අසල පිහිටි පොතාන ප්‍රාග් ඓතිහාසික ගුහාවේ කැණීම් කළ පුරාවිද්‍යාඥයින්හට එහි වූ පහත්ම සංස්කෘතික ස්ථරයෙන් (දහවන ස්ථරයෙන්) මොනරෙකුට අයත් පාදකුර්චය-කුර්චෝපරිය අස්ථියේ කොටසක් හමුවිය (රූපය 334). එය අංගාර 14 කාලනීර්ණ ක්‍රමවේදයට අනුව අදින් වසර 6000 ක් පමණ පැරණි වේ. ඊට අමතරව ජංඝා-පාදකුර්චාස්ථියේ කොටසක් ද හමුවිය. එය හමුවූ ස්ථරය පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක හා නිවැරදි කාලනීර්ණයන් නොමැත (රූපය 335). කෙසේ වුවද ඉහත පාදකුර්චය-කුර්චෝපරිය කොටස අනුව මොනරා පූර්ව ඓතිහාසික හෝ ඓතිහාසික සමයේ ශ්‍රී ලංකාවට හඳුන්වාදුන් කුරුලු විශේෂයක් බව පුරාවිද්‍යාඥයින් මෙතෙක් පිළිගත් මතය බැහැර ව ඇත. ඒ අනුව මොනරා ප්‍රාග් ඓතිහාසික සමයේ සිටම පැවත එන කුරුල්ලෙකු බැව් දැන් පිළිගැනේ (ප්‍රේමරත්න ඇතුළු පිරිස, 2012(a)).




රූපය 334. පොතාන ප්‍රාග් ඓතිහාසික ගුහාවෙන් හමුවුණු මොනරෙකුගේ (***Pavo cristatus***) පාදයට අයත් පාදකුර්චය-කුර්චෝපරියේ (**tarso-metatarsus**) කොටස. දසවන ස්ථරයෙන් හමුවුණු මෙම අස්ථි කොටස අදින් වසර 6000 ක් පැරණි ය (ඡායාරූපය: අයි. එස්. මදනායක).

හීන් තඹ-සේරුවා (*Dendrocygna javanica*) (රූපය 336), මල්-සේරුවා (*Nettapus coromandelianus*), බැමසුදු තාරාවා (*Anas querquedula*) හා පුංචි ගෙඹිතුරුවා (*Tachybaptus ruficollis*) (රූපය 337) යන කුරුල්ලන් විවෘත ජලයේ වසයි. හීන් තඹ සේරුවන් 10 ක් පමණ වූ කුඩා රංචුවල සිට 50 ක් පමණ තෙක් විශාල රංචු වශයෙන් ජලාශ්‍රිතව ගැවසෙන, ජලජ ශාක ගහන වැව් සහ පොකුණු ආශ්‍රිතව සුලබ කුරුල්ලෙකි. ආහාර ගැනීමෙන් අනතුරුව උන් වැව් මැද පිහිටි තණකොළ ගහන කුඩා දූපත් හා ගස් මත ලැග ගිමන් හරියි. මල් සේරුවා




රූපය 335. පොතාන ප්‍රාග් ඓතිහාසික ගුහාවෙන් හමුවුණු මොනරෙකුගේ (***Pavo cristatus***) පාදයට අයත් ජංඝා-පාදකුර්චාස්ථියේ (**tibio-tarsus**) කොටස. (ඡායාරූපය: අයි. එස්. මදනායක).


නිරන්තරයෙන්ම ජෝඩු වශයෙන් හෝ රංචු වශයෙන් ගැවසේ. ඔවුන්ගේ පියෑඹීම වඩා වේගවත් වේ. හීන් තඹසේරුවන් සමඟ විවෘත ජලයේ වෙසෙන උන් අනුරාධපුර කලාපයේ වැව් ආශ්‍රිතව පහසුවෙන් දැකබලා ගත හැකි ය. බසවක්කුලම සහ බුලංකුලම වැවේ වූ නොගැඹුරු තැන්වල මෙම ජලචර කුරුල්ලන්ට ජීවත්වීමට මනා පරිසර ඇත. බැම්මුදු තාරාවා ඉහත කුරුල්ලන් දෙදෙනා මෙන්ම විවෘත ජලයේ වෙසෙන්නෙකි. උන් කලබලකාරී හැසිරීම් නොපෙන්වයි. උදේ කල විවෘත ජලයේ පාවෙන ජලජ පැළෑටි අතර ආහාර සොයමින් කාලය ගතකරයි. පුංචි ගෙඹිතුරුවා හුදෙකලාව මෙන්ම රංචු වශයෙන් ද වාසය කරයි. විවෘත ජලයේ කිමිදී ආහාර සොයන උන් නංවන සිහින් හඬ නිරන්තරයෙන්ම මෙහි වූ වැව් හා පොකුණු ආශ්‍රිතව ඇසිය හැකි ය.



රූපය 336. හීන් තඹ-සේරුවා (***Dendrocygna javanica***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 337. පුංචි ගෙඹිතුරුවා (***Tachybaptus ruficollis***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



බොර ඉසැසි පිරි-කෑරලා (*Dendrocopos nanus*), බොරත් අනු-කෑරලා (*Celeus brachyurus*), හීන් කහගෙලැසි කෑරලා (*Picus chlorolophus*), රත් ගිනිපිට පිළි-කෑරලා (*Dinopium benghalense psarodes*) (රූපය 338) හා ලේපිට මහ-කෑරලා (*Chrysocolaptes lucidus*) අනුරාධපුර පෙදෙසේ ආශ්‍රිතව මහා කැලෑවල ද, මිහින්තලය හා අනුරාධපුය පූජා නගරය ආශ්‍රිතව ද, විශාල ගස් සහිත ගෙවතුවල ද ජීවත් වේ. උන් දවස මුළුල්ලේම පාහේ ක්‍රියාශීලී ය. කෑරලුන් ගස්වල පොතු අතර සැඟවී සිටින අපෘෂ්ඨවංශී සතුන් මෙන්ම දිරාගිය ගස් කඳන් අතර වාසය කරන පිළවුන් ද ආහාරයට ගනියි. මෙම කෑරලුන් බොහෝවිට යුගළ වශයෙන් සැරිසරයි. උන් වඩාත්ම ප්‍රිය කරනුයේ ඝනව ඇහිරුණු විශාල ගස් සහිත කලාපවලට ය.

පොලොස් කොට්ටෝරුවා (*Megalaima zeylanica*) (රූපය 339), රත්මූණත් කොට්ටෝරුවා


රූපය 338. රත් ගිනිපිට පිළි-කෑරලා (***Dinopium benghalense psarodes***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 339. පොලොස් කොට්ටෝරුවා (***Megalaima zeylanica***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 340. රත්ළය කොට්ටෝරුවා (***Megalaima haemacephala***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 341. ශ්‍රී ලංකා අළු-කෑඳැත්තා (***Ocyceros gingalensis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

(*Megalaima rubricapillus*) සහ රත්ළය කොට්ටෝරුවා (*Megalaima haemacephala*) (රූපය 340) අනුරාධපුරය ප්‍රදේශයේ ඉතා සුලබ, තුරු මත වසන කුරුල්ලන් වේ. බෝ, නුග සහ අට්ටික්කා සුලබ මෙම කලාපය තුළ කොට්ටෝරුවන්ට ආහාර අතින් ඉතා පොහොසත් පෙදෙසකි. පොලොස් කොට්ටෝරුවන් නුග සහ බෝ ගස්වල ඉදුණු ඵල කෑමට ප්‍රියතාවක් දක්වන බැවින් උන් එම ගස් අතර නිතර දැකිය හැකි ය. රත්මූණත් කොට්ටෝරුවා හා රත්ළය කොට්ටෝරුවා උස් තුරු මුදුන්වල හිඳ නංවන 'පෝප් ... පෝප් ... පෝප් ...' හඬ දිවා කල නිරන්තරයෙන් ඇසේ. මෙම කුඩා කොට්ටෝරුවන් දෙදෙනා ගස්වල පහත් මට්ටම්වලට පැමිණෙනුයේ ඉතා කලාතුරකිනි. ගස් අතු අතර පිහිටි ස්වාභාවික බෙන හෝ දිරාගිය ගස් කඳන් අතර උන් විසින් තනනු ලබන බෙන තුළ කැදලි තනයි.

මෙරටට ආවේණික කුරුල්ලෙකු වන ශ්‍රී ලංකා අළු-කෑඳැත්තා (*Ocyceros gingalensis*) (රූපය 341) සමස්ත ශ්‍රී ලංකාව පුරාම පැතිර ඇත. අනුරාධපුර කලාපයේ ඉතා සුලබ මෙම කුරුල්ලා ඉදුණු ඵල ඇති සමයේ නුග ගස් අතර සමූහ වශයෙන් ගැවසේ. ඉඳහිට හඬ නඟන අළු කෑඳැත්තන් උස් තුරු ඇති මෙම කලාපයේ සුලබ වීමට එක් හේතුවක් වනුයේ කැදලි තැනීම සඳහා සුදුසු වාසස්ථාන බහුල වීම ය. ජෝඩු වශයෙන් ජීවත් වුවද කුඩා රංචු වශයෙන් ද හමුවේ. පෝරු කෑඳැත්තා (*Anthracoceros coronatus*) (රූපය 342) අළු කෑඳැත්තා තරම් සුලබ නොවේ. මහා වනාන්තර ආශ්‍රිතව සැරිසරන පෝරු කෑඳැත්තා උස් තුරුමුදුන්



රූපය 342. පෝරු කැඳුන්නා (***Anthracoceros coronatus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

අතර වාසය කරයි. පූජා නගරය හා මිහින්තලය ආශ්‍රිතව එතරම් සුලබ නොවේ. එසේ වුවද විල්පත්තුව මායිම් කොටගත් ගම්මානවල පෝරු කැඳැත්තන් වාසය කරයි. ඔවුන් බොහෝ විට 7-8 ක් පමණ වූ රංචු වශයෙන් සැරිසරයි.

මල් පිළිහුඩුවා (*Alcedo atthis*) (රූපය 343), පිටකළු හීන්-පිළිහුඩුවා (*Ceyx erithaca*), මානාතුඩු මහ-පිළිහුඩුවා (*Pelargopsis capensis*) (රූපය 344), ගෙලසුදු මැදි-පිළිහුඩුවා (*Halcyon smyrnensis*) (රූපය 345) හා ගෝමර-පිළිහුඩුවා (*Ceryle rudis*) (රූපය 346) මෙහි වූ වැව්, පොකුණු, වගුරු, ගඟබඩ වනාන්තර ආදි සමස්ත ජලජ ප්‍රජාව ආශ්‍රිත ව සුලබ ය. මේ අතරින් මානාතුඩු මහ පිළිහුඩුවා මෙරට වසන විශාලතම පිළිහුඩුවා ය. බොහෝවිට හුදෙකලාව වසන මෙම කුරුල්ලාගේ හඬ නිසා උන් එම කලාපයේ වසන බව පහසුවෙන් හඳුනාගත හැකි ය. ජලයට ආසන්නයේ වූ පහත් තුරු මත හිඳ,



රූපය 343. මල් පිළිහුඩුවා (***Alcedo atthis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 344. මානාතුඩු මහ-පිළිහුඩුවා (***Pelargopsis capensis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 345. ගෙලසුදු මැදි-පිළිහුඩුවා (***Halcyon smyrnensis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 346. ගෝමර-පිළිහුඩුවා (***Ceryle rudis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 347. නිල්පෙඳ බිඟුහරයා (*Merops philippinus*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 348. තඹලහිස් බිඟුහරයා (*Merops leschenaulti*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

පියාඹා ගොස් මසුන් දඩයම් කරයි. එක් කුරුල්ලෙකු හඬ නැඟූ කල ඊට බොහෝ ඈතින් වූ තවත් කුරුල්ලෙකුගේ හඬ ඇසිය හැකි ය. වැව් ආශ්‍රිතව ජීවත්වන සුලබ පිළිහුඩුවෙකු ලෙස ගෙලසුදු මැදි-පිළිහුඩුවා දැක්විය හැකි ය. උන් ජලයෙන් බොහෝ ඈත නිවෙස් අසල ද රැඳී හිඳිමින් හූනන්, කටුස්සන්, මකුළුවන්, කකුළුවන් සහ මැඩියන් දඩයම් කරයි. එසේ වුවද මසුන් දඩයමට වඩාත් නැඹුරුවක් දක්වයි. ගෝමර පිළිහුඩුවා විවෘත ජලයේ බොහෝ ඉහළ සිට සෘජුවම ජලයට පතිතව කිමිදී මසුන් දඩයම් කරයි. කළු හා සුදු පැහැයෙන් ශරීරය රටා ගැන්වී ඇත.




රූපය 349. වතනිල් මල්කොහා (*Phaenicophaeus viridirostris*)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)

නිල්පෙඳ බිඟුහරයා (*Merops philippinus*) (රූපය 347) ශ්‍රී ලංකාවට සංක්‍රමණය කරන සුලබ කුරුල්ලෙකි. අගෝස්තු හා අප්‍රේල් අතර කාල සීමාවේ වගුරු, විවෘත ලඳු කැලෑ සහ වනාන්තරවල සුලබ ය. බොහෝ විට ගස්වල මිය ගිය අතු මත ලැග හිඳිමින් පියාඹන කෘමි සතුන් දඩයම් කරයි. සවස් කාලයේදී රංචු වශයෙන් පියාඹන අවස්ථා සුලබ ය. දවස මුළුල්ලේම පාහේ මෙම බිඟුහරයාගේ හඬ අනුරාධපුර කලාපය ඇතුළු සමස්ත පෙදෙසේම ඇසිය හැකි ය. තඹලහිස් බිඟුහරයා (*Merops leschenaulti*) (රූපය 348) මෙම කලාපයේ සුලබ ය. නිල්පෙඳ බිඟුහරයා මෙන් ගස් මත ලැග හිඳ පියාසරන කෘමීන් දඩයම් කරයි. තඹලහිස් බිඟුහරයාගේ කැදලි පූජා නගරය ඇතුළු සමස්ත කලාපයේම දැකිය හැකි ය. උන් කැදලි තනනුයේ විවෘත තෘණ ගහන පොළොවේ ය. පොළොවේ හාරන බෙනයක් වන උන්ගේ කැදැල්ලේ කෙළවර බිත්තර තැන්පත් කරයි.

වතනිල් මල්කොහා (*Phaenicophaeus viridirostris*) (රූපය 349) කැලෑ හා ලඳු කැලෑ ආශ්‍රිතව බොහෝ දුරට සැඟවී ජීවත් වන කුරුල්ලෙකි. එළිමහන් ස්ථානවලට පැමිණෙනුයේ කලාතුරකිනි. පතන් මල්කොහා (*Phaenicophaeus leschenaultii*) හා ඇටිකුකුළා (*Centropus sinensis*) ද මෙහි වූ ලඳු කැලෑ ආශ්‍රිතව ජීවත් වේ. මොවුන්ගේ ප්‍රධානතම ආහාරය නම් ගස් මත හා පොළොව මත වසන අපෘෂ්ඨවංශීන් ය.

වී සහ බඩ ඉරිගු ඇතුළු බීජ හටගන්නා අනෙකුත් බව බෝග බහුලව වගා කරන බැවින් ඒවා ආහාරයට ගන්නා ගිරවුන් ද මේ කලාපයේ සුලබ වේ. රන ගිරවා (*Psittacula krameri*) (රූපය 350) විශාල රංචු ලෙස සැරිසරන අතර උන් පූජා නගරය තුළ වූ උසැති ගස්වල කඳන්වල කැදලි තනයි.



රූපය 350. රන ගිරවා (***Psittacula krameri***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 351. ලබු ගිරවා (***Psittacula eupatria***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)

ලබු ගිරවා (*Psittacula eupatria*) (රූපය 351), රන ගිරවා තරම් සුලබ නොවුවද කුඹුරු ආශ්‍රිතව නිතරම පාහේ ගැවසේ. මෝසම් වැසිවලින් අනතුරුව ගස් වැල්, මල්වලින් සහ ඵලවලින් බර වන කාලයේ ශ්‍රී ලංකා ගිරාමලිත්තන් (*Loriculus beryllinus*) දකිය හැකි නමුත් උන් මෙම වියළි පෙදෙස්හි බොහෝ දුර්ලභ වේ.

තල් ගස් බහුල මෙහි ආසියා තල්-තුරිතයන්ට (*Cypsiurus balasiensis*) විසීමට මනා වාසස්ථාන ඇත. උන්ට ලැගීම සඳහා සුදුසු නිකේතන බහුල බැවින් තල් මණ්ඩි අතර මෙම තුරිතයින් සුලබ ය. සිළු රුක්-තුරිතයා (*Hemiprocne coronata*) බොහෝ අවස්ථාවලදී විවෘත එළිමහන් ස්ථාන හා ලඳු කැලෑ අතර සැරිසරයි. නමුත් අන් තුරිතයන් තරම් උන් සුලබ නොවේ.



රූපය 352. ඉන්දු බිම්බස්සා (***Caprimulgus asiaticus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

දිගුපෙද බිම්බස්සා (*Caprimulgus atripennis*) හා ඉන්දු බිම්බස්සා (*Caprimulgus asiaticus*) (රූපය 352) අනුරාධපුර ආශ්‍රිතව ජීවත් වන නිශාචර කුරුල්ලන් ය. උන් රාත්‍රි කල වැලි සහිත පොළොවේ ලැග සතුන් දඩයම් කරයි. මෙම බිම් බස්සන්ගේ හඬ සවස් යාමයේ සිට හිමිදිරිය තෙක් ඇසිය හැකි ය. උන් වඩාත්ම සැරිසරනුයේ වනාන්තර ගහන එළිමහන් වාසස්ථානවල ය. කැදලි තනනුයේ බොරළු සහ ගල් කැට සහිත පොළොවේ ය. තුරු වදුලු ගහන බොහෝ තැන්වල මෙම නිශාචර කුරුල්ලන්ගේ හඬ රාත්‍රි කාලයේදී ඇසිය හැකි ය.

අළු-කොබෙයියා (*Stigmatopelia chinensis*) (රූපය 353), නීල-කොබෙයියා (*Chalcophaps indica*), ළයරන් බටගොයා (*Treron bicinctus*) (රූපය 354), පිටදම් බටගොයා (*Treron pompadora*) හා නිල් මහගෙ ායා (*Ducula aenea*) (රූපය 355) සමස්ත අනුරාධපුර කලාපයේම වසන බොහෝ සුලබ කුරුල්ලන් වේ. බෝ, අට්ටික්කා සහ නුග ගස්වල ඉදුණු ගෙඩි කෑමට මේ කොබෙයියන් වඩාත් ප්‍රියතාවක් දක්වන අතරම වීර හා පළු හටගන්නා සමයේ එම ඵල ද ආහාරයට ගනියි. මේ අතරින් අළු කොබෙයියන් බොහෝ



රූපය 353. අළු-කොබෙයියා (***Stigmatopelia chinensis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 354. ළයරන් බටගොයා (***Treron bicinctus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)




රූපය 355. නිල් මහගොයා (***Ducula aenea***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

විට පොළොවේ වැටී ඇති වී සහ අනෙකුත් ධාන්‍ය වර්ග ආහාරයට ගනියි. මෙම සියලුම කුරුල්ලන්ගේ පියෑඹීම ඉතා වේගවත් ය.

කෝරාවා (*Gallicrex cinerea*), දම් මැදි-කිතලා (*Porphyrio porphyrio*) (රූපය 356), පොදු ගැලිනුවා (*Gallinula chloropus*) (රූපය 357) සහ ළයසුදු කොරවක්කා (*Amaurornis phoenicurus*) (රූපය 358) නෙළුම්, ඕලු හා කුමුදු ආදි පාවෙන ජලජ ශාක බහුල වැව්, පොකුණු, කුඹුරු හා වගුරුවල වාසය කරන සුලබ කුරුල්ලන් ය. ඔවුන්ගේ දිගු පා ඇඟිලි ආධාරයෙන් ජලජ පැළෑටි මත හා




රූපය 356. දම් මැදි-කිතලා (***Porphyrio porphyrio***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 357. පොදු ගැලිනුවා (***Gallinula chloropus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

මඩ තලාවන් මත පහසුවෙන් ගමන් කළ හැකි ය. උන් උදය කාලයේ ඉතා ක්‍රියාශීලීව ආහාර සොයයි. බොහෝ විට රංචු වශයෙන් ජීවත් වන මෙම කුරුල්ලන් එම ශාක ප්‍රජාවේ වසන කුඩා අපෘෂ්ඨවංශීන් හා ශාක කොටස් මත යැපේ.



රූපය 358. ළයසුදු කොරවක්කා
(***Amaurornis phoenicurus***) (ජී.එම්. හෙන්රි විසින් 1971 දී රචිත ***A guide to the birds of Ceylon*** ග්‍රන්ථය ඇසුරෙන් සොනාලි රංගිකා ප්‍රේමරත්න විසින් අඳින ලදී)



රූපය 359. සැවුල්-දියසෑනා (***Hydrophasianus chirurgus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

සැවුල්-දියසෑනා *(Hydrophasianus chrirurgus)* (රූපය 359) ද මේ පරිසරයට අනුවර්තනයක් දක්වන සිත්ගන්නාසුලු වර්ණ රටාවකින් හෙබි දිගු පෙඳයක් දරන කුරුල්ලෙකි. දියසෑනා බිත්තර තැන්පත් කරනුයේ නෙළුම්, ඕලු මානෙල් ආදි පාවෙන ජලජ ශාක පත්‍ර මත ය. මෝසම් වැස්සෙන් පසුව කැදලි තනන දියසෑනාගේ හඬ නිරන්තරයෙන්ම වැව් හා පොකුණු ආශ්‍රිතව ඇසිය හැකි ය. කළුපිය ඉපල්පාවා (*Himantopus himantopus*) (රූපය 360) නොගැඹුරු මඩ සහිත ජලයට වඩාත් ප්‍රිය කරන උස් පාද හා දිගු හොටක් දරන විචිත්‍ර පෙනුමක් ගත් කුරුල්ලෙකි. විශේෂයෙන්ම දිය පිරි ලියදිවල කළුපිය ඉපල්පාවා දැකිය හැකි ය. උන් යුගළ වශයෙන් හෝ රංචු වශයෙන් ජීවත් වේ. අනුරාධපුර ප්‍රදේශයේ කහ යටිමල්



රූපය 360. කළුපිය ඉපල්පාවා (*Himantopus himantopus*)
(ජී.එම්. හෙන්රි විසින් 1971 දී රචිත *A guide to the birds of Ceylon* ග්‍රන්ථය ඇසුරෙන් සොනාලි රංගිකා ප්‍රේමරත්න විසින් අඳින ලදී)



රූපය 360. කළුපිය ඉපල්පාවා (*Himantopus himantopus*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

කිරළා (*Vanellus malarbaricus*) (රූපය 361) හා රත් යටිමල් කිරළා (*Vanellus indicus*) (රූපය 362) වාසය කළද වඩාත්ම සුලබ විශේෂය වනුයේ රත් යටිමල් කිරළා ය. උන් වැව් පිටිවල ද, නටබුන් ආශ්‍රයේ වූ එළිමහන් ස්ථානවල ද ඉතා සුලබ ය. අළු හා තද දුඹුරු පැහැය මිශ්‍ර බිත්තර වැව් පිටිවල වියළී ගිය මඩ අතර තැන්පත් කරයි (රූපය 363). කහ යටිමල්



රූපය 361. කහ යටිමල් කිරළා (*Vanellus malarbaricus*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 362. රත් යටිමල් කිරළා (*Vanellus indicus*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 363. රත් යටිමල් කිරළාගේ (*Vanellus indicus*) කැඳැල්ලක්. ගම්බිරිගස්වැව, අනුරාධපුරය.
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

කිරළා රත් යටිමල් කිරළාට වඩා ප්‍රමාණයෙන් කුඩා වන අතර වැඩි වශයෙන් නිහඬ කුරුල්ලෙකි.

අනුරාධපුර ආශ්‍රිත පෙදෙස බොහෝ සතුන්ගෙන් පරිපූර්ණ කලාපයකි. මසුන්, තණ බිම් ආශ්‍රිතව ජීවත්වන කෘන්තක මීයන්, ලඳු කැලෑ ආශ්‍රිතව වාසය කරන සර්පයන් මෙන්ම වඳුරන්, හාවුන් සහ කුඩා කුරුල්ලන් මෙහිදී විශේෂයෙන් සඳහන් කළ හැකි ය. ඊට අමතරව මෙම වියළි පෙදෙසේ අති විශාල කෘමි සතුන් ගහනයක් ඇත. එම නිසා මෙවැනි සතුන් මත යැපෙන විලෝපීයන්ගෙන් ද මෙම පරිසරය ඉතා පොහොසත් වේ. නිශාචර බස්සන් හා බකමූණන් හැරුණු විට මෙහි දිවා කල වසන මාංශ භක්ෂක කුරුල්ලන් බොහෝ ය. උන්

ජලයේ වසන මසුන්ගේ සිට වඳුරු පැටවුන් හා හාවුන් ආදි වූ විශාල පරාසයක සතුන් දඩයම් කරයි. මේ අතරින් උරිස්කළු පතනකුස්සා (*Elanus caeruleus*), බමුණු පියාකුස්සා (*Haliastur indus*) (රූපය 364), කුසඇැලි මුහුදුකුස්සා (*Haliaeetus leucogaster*), අළුහිස් මසුකුස්සා (*Ichthyophaga ichthyaetus*) (රූපය 365), සිළු සරපකුස්සා (*Spilornis cheela*) (රූපය 366), වගුරු හැරිකුස්සා (*Circus aeruginosus*), සුදුමැලි හැරිකුස්සා (*Circus macrourus*), ගෝමර හැරිකුස්සා (*Circus melanoleucos*), මොන්ටේගු හැරිකුස්සා (*Circus pygargus*), සිළු කුරුලුගොයා (*Accipiter trivirgatus*), කුරුලුගොයා (*Accipiter badius*), බෙස්රා කුරුලුගොයා (*Accipiter virgatus*), පෙරැළි කොණ්ඩකුස්සා (*Spizaetus cirrhatus*) (රූපය 367), පොදු උකුසුගොයා (*Falco tinnunculus*) ආදි මාංශ භක්ෂක කුරුල්ලන් මෙම කලාපයේ වාසය කරයි.



රූපය 364. බමුණු පියාකුස්සා (***Haliastur indus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 365. අළුහිස් මසුකුස්සා (***Ichthyophaga ichthyaetus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 366. සිළු සරපකුස්සා (***Spilornis cheela***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)




රූපය 367. පෙරැළි කොණ්ඩකුස්සා (***Spizaetus cirrhatus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)


අහිකාවා (*Anhinga melanogaster*) (රූපය 368), පුංචි දියකාවා (*Phalacrocorax niger*) (රූපය 369) හා ඉන්දු දියකාවා (*Phalacrocorax fuscicollis*) විවෘත ජලයේ කිමිදී මසුන් දඩයම් කරන්නන් ය. මෙම කිමිදුම්කරුවන් උදය කල ඉතා ගිජු ලෙස මසුන් දඩයම් කරන අතර ඉන් අනතුරුව වැව් අසල ගස්



රූපය 368. අහිකාවා (***Anhinga melanogaster***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 369. පුංචි දියකාවා (***Phalacrocorax niger***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 370. ගෙරි-කොකා (***Bubulcus ibis***) (ජී.එම්. හෙන්රි විසින් 1971 දී රචිත ***A guide to the birds of Ceylon*** ග්‍රන්ථය ඇසුරෙන් සොනාලි රංගිකා ප්‍රේමරත්න විසින් අඳින ලදී)

හෝ ගල් මත හිඳ තම තටු වියළා ගනියි. දියකාවුන් විශාල රංචු වශයෙන් ජීවත් වේ. බොහෝ විට එක් රංචුවක සියයට ආසන්න ප්‍රමාණයක් දැකිය හැකි ය. අහිකාවා තම දිගු හොටය ඉහළට ඔසවාගෙන වැව් මැද පිහිටි ගස් මත ලැග සිටියි.

පළඟැටියන්, පළා පෙත්තන්, කකුළුවන්, ඉස්සන්, කුඩා මසුන් මත යැපෙන දිය කඩිති ආශ්‍රිතව වාසය කරන කොකුන් විශාල සංඛ්‍යාවක් මේ ප්‍රදේශයේ වෙසේ. ජලචර දිවියට හැඩගැසුණු උස් පා හා දිගු හොටය මේ කුරුල්ලන්ගේ විශේෂ ශාරීරික ලක්ෂණ ලෙස දැක්විය හැකි ය. පූජා නගරය ආශ්‍රිතව සුලබව දැකිය හැකි කුරුල්ලෙකි ගෙරි-කොකා (*Bubulcus ibis*) (රූපය 370). මෙහි වූ ගවයින් සමඟ මොවුන් සමගියෙන් වාසය කරනු දැකිය හැකි ය. මේ විශාල ක්ෂීරපායීන් ගමන් කරන විට උන්ගේ පා ගැටීමෙන් ඉගිලී යන තණකොළ පෙත්තන් හා පළඟැටියන් ගව කොකාගේ ප්‍රධානතම ආහාරය වේ. එමෙන්ම පුංචි අනු-කොකා (*Egretta garzetta*) (රූපය 371), සුදු මහ-කොකා (*Casmerodius albus*) (රූපය 372), සුදු මැදි-කොකා (*Mesophoyx intermedia*) ජලයේ බැස ජීවත් වන අතර උන්ගේ ප්‍රධානතම ආහාරය වනුයේ කුඩා මසුන් ය. උන් බොහෝ විට හුදෙකලාව වාසය කල ද වැව් තාවලුවල නොගැඹුරු ජලයේ සමූහ වශයෙන් දැකිය හැකි ය. අළු කොකා (*Ardea cinerea*) (රූපය 373), කරවැල් කොකා (*Ardea purpurea*) (රූපය 374), කණ-කොකා (*Ardeola grayii*) (රූපය 375),



රූපය 370. ගෙරි-කොකා (***Bubulcus ibis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 371. පුංචි අනු-කොකා (***Egretta garzetta***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

රෑකණ-කොකා (*Nycticorax nycticorax*), කුරුඳු මැටි-කොකා (*Ixobrychus cinnamomeus*) හා කළු මැටි-කොකා (*Ixobrychus flavicollis*) මෙහි ජලජ පරිසරයේ සුලබ කුරුල්ලන් අතර වේ. හිසකළු දෑකැත්තා (*Threskiornis melanocephalus*) (රූපය 376) නොගැඹුරු ජලයේ වසන කකුළුවන් ආදි අපෘෂ්ඨවංශී සතුන් මත යැපේ. උන් ඉතා කඩිසර ලෙස වක් වූ තම දිගු හොටයෙන් ජලයේ නිමග්නව ඇති පැළෑටි අතර වූ සතුන් අල්ලා ගනියි. හැඳිඅලවා (*Platalea leucorodia*) (රූපය 377) ද තම පැතලි හොටය මගින් ජලයේ වසන කුඩා ප්‍රාණීන් දඩයම් කරන්නෙකි. විවරතුඩුවා (*Anastomus oscitans*) (රූපය 378) තම දිගු පා මඟින් ගමන් කරමින් මඩ අතර සැඟවී වසන බෙල්ලන් කා දමයි. තම ස්ථුල හොටය මැද පිහිටි විවරය ආධාරයෙන් බෙල්ලාගේ කවචය බිඳ දමා උගේ මස ගිල දමයි. විවර තුඩුවා ජලයේ වසන බෙල්ලන්ගේ ගහනය පාලනය කරන කුරුල්ලෙකු ලෙස හැඳින්විය හැකි ය.



රූපය 371. පුංචි අනු-කොකා (***Egretta garzetta***) (ජී.එම්. හෙන්රි විසින් 1971 දී රචිත ***A guide to the birds of Ceylon*** ග්‍රන්ථය ඇසුරෙන් සොනාලි රංගිකා ප්‍රේමරත්න විසින් අඳින ලදී)



රූපය 372. සුදු මහ-කොකා (***Casmerodius albus***) (ජී.එම්. හෙන්රි විසින් 1971 දී රචිත ***A guide to the birds of Ceylon*** ග්‍රන්ථය ඇසුරෙන් සොනාලි රංගිකා ප්‍රේමරත්න විසින් අඳින ලදී)

සිංහරාජය, හෝර්ටන් තැන්න ආදි වැසි වනාන්තර තුළ ජීවත් වන කුරුලු විශේෂ ගණනාවක් එකතු වී සාමූහිකත්වයෙන් ආහාර සොයා ගැනීම කුරුලු ලොව දැකිය හැකි අපූර්වතම හැසිරීම් රටාවකි. මෙම සංසිද්ධියට කුරුලු විද්‍යාවේදී 'මිශ්‍ර කුරුලු නඩ' යනුවෙන් හැඳින්වේ. සිංහරාජය තුළ කරන ලද පර්යේෂණවලට අනුව එහි වූ කුරුලු නඩයක විශේෂ 42 ක් තරම් විශාල ප්‍රමාණයක නියෝජනයක් දක්වන බව විද්‍යාඥයන් හඳුනාගෙන ඇත. මෙහිදී සිදුවනුයේ උන් එකිනෙකා සහයෝගයෙන් කවුඩා වැනි සටන්කාමී කුරුල්ලෙකුගෙන් ආරක්ෂාව ලබමින්, ගසින් ගසට ඉතා සෙමින් ගමන් කරමින් ආහාර සොයා ගැනීමයි. සිංහරාජය වැනි වැසි වනාන්තරවල වූ කුරුලු නඩ තරම් සංකීර්ණ හා විශාල නොවූවද වියළි කලාපයේ ද උස් වනාන්තර ඇති තැන්හි කුරුල්ලන් විශේෂ ගණනාවකින් සැදුම්ලත් නඩ දැකිය හැකි ය. අනුරාධපුරයේ මිරිසවැටිය පරිශ්‍රයේ වූ උස් තුරු කලාපයේත්, මිහින්තලය අවට වූ වනාන්තරවලත් මේ ආකාරයේ කුරුලු නඩ අප විසින් නිරීක්ෂණය කොට ඇත. පහත විස්තර කෙරෙනුයේ අනුරාධපුරය හා මිහින්තලය ආශ්‍රිතව නිරීක්ෂණය කළ කුරුලු නඩවලින් වාර්තා වූ කුරුල්ලන් ය.



රූපය 382. ජරදන් කොළරිසියා (***Chloropsis jerdoni***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 383. දිළිරත් මිණිවිත්තා (***Pericrocotus flammeus***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)

ජරදන් කොළරිසියා (*Chloropsis jerdoni*) (රූපය 382) සහ රන්නළල් කොළරිසියා (*Chloropsis aurifrons*) ගස් මත ශාක පත්‍ර අතර සැඟවී ජීවත් වන කෘමී සතුන් ආහාරයට ගන්නෝ වෙති. උන් නොකඩවා හඬ නගමින් යුගළ වශයෙන් හෝ කුඩා රංචු වශයෙන් ගැවසේ. ශරීර වර්ණයේ වූ කොළ පැහැය නිසා ගස් අතරේ සිටින විටදී දැකබලා ගැනීම අපහසු ය. බොර සබරිත්තා (*Lanius cristatus*) ලඳු කැලෑ ආශ්‍රිතව හා වන මායිම්වලට ප්‍රිය කරන්නෙකි. පර්යටන කුරුල්ලෙකු වන මෙම සබරිත්තා ප්‍රධාන වශයෙන් යැපෙනුයේ කෘමී සතුන් මත ය.

පුංචි මිණිවිත්තා (*Pericrocotus cinnamomeus*) හා දිළිරත් මිණිවිත්තා (*Pericrocotus flammeus*) (රූපය 383) වියළි කලාපීය කුරුලු නඩවල සුලබ කුරුල්ලන් වේ. උන් ප්‍රධාන වශයෙන් වසනුයේ උස් තුරු මුදුන්වල ය. මිණිවිත්තන් ජීවත් වනුයේ බොහෝ විට එක් කුරුල්ලෙක් සහ කිරිල්ලියන් කිහිපදෙනෙක් බැගින් වූ රංචු වශයෙනි. උන්ගේ ප්‍රධාන ආහාරය ශාක පත්‍ර අතර ජීවත් වන කෘමීන්



රූපය 384. විල්ලුද යටිකුරිත්තා (***Sitta frontalis***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 385. කොණ්ඩයා (***Pycnonotus cafer***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 386. බැමසුදු කොණ්ඩයා (***Pycnonotus luteolus***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 387. ළාතුඩු පිළිලිච්චා (***Dicaeum erythrorhynchos***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)

සහ පිළවුන් වේ. විල්ලුද යටිකුරිත්තා (*Sitta frontalis*) (රූපය 384) අපූර්වතම හැසිරීම් රටාවක් දක්වන ප්‍රමාණයෙන් ඉතා කුඩා කුරුල්ලෙකි. ගස් කඳන් අතර ජීවත් වන කෘමි සතුන් ආහාරයට ගන්නා මෙම කුරුල්ලාට ඇති සුවිශේෂී හැකියාවක් වන්නේ හිස පහළට සිටින ආකාරයට කඳ මත ගමන් කිරීමයි. අප සඳහන් කළ කුරුලු නඩවල නොවරදින විශේෂයකි, යටිකුරුත්තා. පොදු අයෝරාවා (*Aegithina tiphia*) යුගල වශයෙන් ජීවත් වන ප්‍රමාණයෙන් කුඩා කුරුල්ලෙකි. පිරිමි කුරුල්ලා විසින් නඟන උරුහන් බෑම දවස පුරාම පාහේ ලඳු කැලෑ හා මහ කැලෑ අතරින් ඇසිය හැකි ය.

මාදං, එරමිනියා, බෝවිටියා, හිඹුටු ආදි පඳුරු හා ගස්වලින් ගහන අනුරාධපුර පෙදෙසෙහි ඒ මත යැපෙන කුරුල්ලන් බොහෝ ය. මේ අතරින් විශාලතම ගහනය නියෝජනය කරනුයේ කොණ්ඩයා ය (*Pycnonotus cafer*) (රූපය 385). කොණ්ඩ කුරුල්ලන් මෙම වියළි පෙදෙසේ ඕනෑම පරිසර පද්ධතියක දවස මුළුල්ලේම දැකිය හැකි යුගල වශයෙන් ජීවත් වන කුරුල්ලෙකි. මීට අමතරව කළු ඉසැසි කොණ්ඩයා (*Pycnonotus melanicterus*), බැමසුදු කොණ්ඩයා (*Pycnonotus luteolus*) (රූපය 386) හා බැමකහ ගුලුගුඩුවා (*Iole indica*) ආදි කුරුල්ලන් ලඳු කැලෑ ආශ්‍රිතව බහුලව වාසය කරන අතර උන් ඉඳුණු ගෙඩි හා කෘමීන් මත යැපේ.

ගස් මත වැඩෙන පිළිල (*Loranthus* sp.) ශාකයන්හි හටගන්නා ගෙඩි ආහාරයට ගන්නා මාතුඩු පිළිලිච්චා (*Dicaeum agile*) හා ළාතුඩු පිළිලිච්චා (*Dicaeum erythrorhynchos*) (රූපය 387) මෙම වියළි පෙදෙස පුරාම කඩිසරව සැරිසරන ශ්‍රී ලංකාවෙන් වාර්තාවන කුඩාම කුරුල්ලන් වේ. පිළිලිච්චන් යුගල


වශයෙන් ජීවත් වන අතර පිළිලවලට අමතරව තවත් බොහෝ ඉඳුණු ඵල උන්ගේ ආහාරයට එක්කරගනු ලබයි. උන් ගසින් ගසටත්, පඳුරෙන් පඳුරටත් ඉතා කඩිසරව හඬ නගමින් පියාඹනු ඇත.

ඉඳුණු ඵලවල යුෂ හා මල් පැණි ආහාරයට ගන්නා නිතඹ දම් සූටික්කා (*Nectarinia zeylonica*), දම් සූටික්කා (*Nectarinia asiatica*) හා දික්තුඩු සූටික්කා (*Nectarinia lotenia*) මෙහි වූ ලඳු කැලෑ ආශ්‍රිතව බහුලව ගැවසේ. කුරුලු නඩයේ ද නොවරදින කුරුල්ලන් ලෙස මොවුන් හැඳින්විය හැකි ය. නිතරම පාහේ යුගල වශයෙන් සැරිසරයි.

තෘණ, වී, කුරක්කන් හා මෙනේරි ඇතුළු කුඩා බීජ මත යැපෙන විශාල රංචු වශයෙන් ජීවත් වන කුඩා කුරුල්ලන් විශේෂ ගණනාවක්ම මෙම කලාපයෙන් වාර්තා වේ. සරල වීකුරුල්ලා (*Lonchura malabarica*), ළය කායුරු වීකුරුල්ලා (*Lonchura punctulata*) (රූපය 388), නිතඹ සුදු වීකුරුල්ලා (*Lonchura striata*)



රූපය 388. ළය කායුරු වීකුරුල්ලා (***Lonchura punctulata***) (ඡායාරූපය: විමුක්ති විරතුංග)



රූපය 389. නිතඹ සුදු වීකුරුල්ලා (***Lonchura striata***) (ඡායාරූපය: විමුක්ති විරතුංග)



රූපය 390. තෘණ පඳුරු බහුල මෙවැනි බිම්වල වී කුරුල්ලන් සුලබව ගැවසේ (ඡායාරූපය: කැප්ටන් මනමේන්ද්‍ර-ආරච්චි)

(රූපය 389) හා තෙපැහැ වීකුරුල්ලා (*Lonchura malacca*) සුලබව දැකිය හැකි ධාන්‍ය හා කුඩා බීජ මත යැපෙන්නන් වේ. මෙම වී කුරුලු විශේෂ නතරම එකම රංචුවක වාසය කිරීම වැදගත් ලක්ෂණයකි. නමුත් එම රංචුවල සංඛ්‍යාත්මකව වැඩිවනුයේ සරල වී කුරුල්ලා ය. වී කුරුලු රංචු ගොයම් පැසෙන සමයේ කුඹුරු ආශ්‍රිතව ඉතාම සුලබ වේ (රූපය 390). ඊට අමතරව පොළොවේ වැටී ඇති තණ බීජ අහුලා කෑමට ද උන් වැඩි කාලයක් බිම ගත කරනු දැකිය හැකිය.

තෘණ පත්‍ර ආධාරයෙන් කැදලි තනන වඩු කුරුල්ලන් විශේෂ දෙකම මෙම කලාපයේ දැකිය හැකි ය. ඒ අතරින් රැක් වඩුකුරුල්ලා (*Ploceus philippinus*) (රූපය 391) කුඹුරු හා වගුරු අසල තල් ගස් මත කැදලි තනයි (රූපය 392). එක් තල් ගසක කුරුල්ලන් සමූහයක් එකතු වී සනාථාසයක් ලෙස කැදලි තනන අතර ඒවා තල් අතුවල එල්ලා තිබෙනු දැකිය හැකි ය. පන් වඩුකුරුල්ලා (*Ploceus manyar*) ගේ කැදලි උස් තණකොළ, මානා හා වී ගස් අතර තනයි.



රූපය 391. රැක් වඩුකුරුල්ලා (***Ploceus philippinus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 392. රැක් වඩුකුරුල්ලන් කුඹුරු හා වගුරු අසල වූ මෙවැනි තල් ගස් මණ්ඩිවල සුලබව කැදලි තනනු ඇත (ඡායාරූපය: කැමී මනමේන්ද්‍ර-ආරච්චි)



කවුඩා (*Dicrurus caerulescens*) හා කළු කවුඩා (*Dicrurus macrocercus*) (රූපය 393) ඉගිළෙන කෘමීන් මත යැපෙන සටන්කාමී කුරුල්ලන් වේ. පූජා නගරය හා ගෙවතු ආශ්‍රිතව කවුඩා සුලබ ය. ඉහත විස්තර කළ කුරුලු විශේෂ සමූහයකින් සැදුම්ලත් කුරුලු නඩයේ ද කවුඩා නොවරදින්නෙකි. මහ කවුඩා (*Dicrurus paradiseus*) මහා වනාන්තර ඇසුරේ ජීවත් වන අතර මල්වතු ඔය ආශ්‍රිත වන පෙදෙස, මිහින්තලය හා විල්පත්තුව ආශ්‍රිත කැලෑවල පහසුවෙන් දැකගත හැකි ය.

රූපය 393. කළු කවුඩා (***Dicrurus macrocercus***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 394. සිවුරු හොරා (***Terpsiphone paradisi ceylonensis***). කැදැල්ලක ලැග සිටින කුරුල්ලෙක් (ඉහළ දකුණු පස) (ඡායාරූපය: විමුක්ති වීරතුංග, නදීක හපුආරච්චි)





රූපය 395. බැමසුදු පවන්පෙන්දා (***Rhipidura aureola***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

ආසියා රැහැන්මාරාවන් හෙවත් සුදුරෙදි හොරා (*Terpsiphone paradisi paradisi*) හා සිවුරු හොරා (*Terpsiphone paradisi ceylonensis*) (රූපය 394) ශ්‍රී ලංකාව පුරාම වාසය කරන අතර අනුරාධපුරයේ දුලබ නොවේ. මේ අතුරින් සුදුරෙදි හොරා ජලය ආශ්‍රිතව ලැග හිඳ දියට පැන මදක් කිමිදී කුඩා මසුන් දඩයම් කරයි. සුදුරෙදි හොරා සංක්‍රමණිකයෙකු වුවද සිවුරු හොරා නිත්‍ය පදිංචි කුරුල්ලෙකි. මිහින්තලයේ කළුදිය පොකුණේ සවස් යාමයේ ජලයට යොමුව ඇති අතු මත ලැග හිඳ කුඩා සතුන් දඩයම් කරන සුදුරෙදි හොරෙකු නිරීක්ෂණය කිරීමට අපට හැකි විය. බැමසුදු පවන්පෙන්දා (*Rhipidura aurpola*) (රූපය 395) වනාන්තර, ලඳු කැලෑ හා ගෙවතු ආශ්‍රිතව ගැවසෙන කඩිසර හැසිරීම් රටාවක් පෙන්නුම් කරන කුරුල්ලෙකි. වල්ගා පිහාටු පුළුල් කිරීමත් එසවීමත් නිතරම කරන අතර නිරන්තරයෙන්ම පාහේ අත්තෙන් අත්තට පියඹා යයි. ජලය ආශ්‍රයේ ගැවසීමට ප්‍රිය කරන අතර කැදලි ද බොහෝමයක් එම පරිසරයේ හමුවේ.



රූපය 396. කළුකිච්චා (***Saxicoloides fulicatus***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

වන පොල්කිච්චා (*Copsychus malabaricus*) මහා වනාන්තර ආශ්‍රිතව වෙසෙන්නෙකි. උන් ශ්‍රී ලංකාවේ ප්‍රචලිතව ඇත්තේ ඉතා මිහිරි ලෙස උරුහන්බාන කුරුල්ලෙකු ලෙස ය. දිවා කල තුරු වඳුලේ සැඟවී හිඳ තම උරුහන්බෑම නොකඩවා කරනු ඇත. කළුකිච්චා (*Saxicoloides fulicatus*) (රූපය 396) ගෙවතු, ලඳු කැලෑ හා මහා කැලෑ




රූපය 397. ශ්‍රී ලංකා බොරග පිරි-දෙමලිච්චා (***Pellorneum fuscocapillus babaulti***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 398. පෙරදිගු අහස්රිටියා (***Alauda gulgula***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

ආශ්‍රිතව එක ලෙස පැතිර ජීවත් වේ. පූජා නගරය ආශ්‍රිත සුලබ කුරුල්ලෙකු වන අතර පිරිමි කුරුල්ලා ඉතා මිහිරි ලෙස හඬ නඟයි. උදේ කාලයේ සහ සවස් යාමයේ වඩාත් ක්‍රියාශීලය.

ශ්‍රී ලංකා බොරග පිරි-දෙමලිච්චා (*Pellorneum fuscocapillus babaulti*) (රූපය 397) මෙම වියළි බිම් අතර වසන මෙරටට ආවේණික කුරුල්ලෙකි. මහා වනාන්තරවල මෙන්ම වනයේ යටි වගාවේ හා ලඳු කැලෑ ආශ්‍රිතව ජීවත් වේ. මෙම දෙමලිච්චාගේ හඬ උදේ සහ සවස් යාමයේ ඉතා පැහැදිලිව ඇසිය හැකි ය. කුසකහ ලඳු-දෙමලිච්චා (*Dumetia hyperythra*) ද ලඳු කැලෑවල වසන්නෙකි. එමෙන්ම මානා පඳුරු අතර ද උන් කුඩා රංචු වශයෙන් ගැවසේ. ශරීරයේ වර්ණ රටාව වියළි තෘණ පඳුරුවලට වඩාත් සමාන වේ.



රිචඩ් වැරටිච්චා (*Anthus richardi*) සුලබ සංක්‍රමණික කුරුල්ලෙකි. මොවුන් කුඹුරු හා වැව්පිටිවල හොඹකව ගැවසේ. කලබල වූ විට ඉගිළී ගොස් මදක් දුරින් නැවතත් පොළොවේ වසනු ඇත. දිගු පා මඟින් ඇවිදිමින් කුඩා කෘමීන් ආහාරයට ගනියි.



රූපය 399. පොරෝළුවා (***Upupa epops***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)

රූපය 400. දුම්බොන්නා (***Coracias benghalensis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

කෙත් වැරටිච්චා (*Anthus rufulus*) ද විවෘත තෘණ පඳුරු ආශ්‍රිතව භෞමිකව ජීවත් වන්නෙකි. පෙරදිගු අහස්රිටියා (*Alauda gulgula*) (රූපය 398) අනුරාධපුර ප්‍රදේශයේ විවෘත තෘණබිම්, වගා බිම් සහ කුඹුරු ආශ්‍රිතව සැරිසරන්නෙකි. පොළොවේ වසා සිටීමින් කාලය ගතකරන අහස්රිටියා කලබල වූ විට පියඹා ගොස් ගසක ලැග නැවතත් සුපුරුදු ස්ථානයටම පැමිණේ. නිතරම පාහේ තම හඬ නඟන නිසා පහසුවෙන් දැකබලා ගැනීමට අවස්ථාව ඇත.

පොරෝළුවා (*Upupa epops*) පඳුරු සහිත විවෘත ලඳු කැලෑවල ජීවත් වන එතරම් සුලබ නොවන කුරුල්ලෙකි (රූපය 399). ආහාර සෙවීම සඳහා වැඩි කාලයක් බිම ගතකරයි. දිගු සහ සිහින් හොටය පොළොව තුළට යවා සුදුසු ආහාර සොයා ගනියි. දුවිලි පැහැති දුඹුරු වර්ණයත්, කළු හා සුදු වර්ණයන්ගෙන් සැදුම්ලත් විචිත්‍ර වර්ණ රටාවත්, හිස මුදුනේ පිහිටි පිහාටු රොදත් නිසා මෙම කුරුල්ලා පහසුවෙන් හඳුනාගත හැකි ය.

උස් විවෘත ස්ථානවල ලඟින දුම්බොන්නා (*Coracias benghalensis*) කෘමි සතුන් දඩයමට වඩාත් ප්‍රියතාවක් දක්වයි (රූපය 400). හුදෙකලාව මෙන්ම සාමාජිකයින් 6-7 බැගින් වූ රංචු වශයෙන් ද වාසය කරයි. මොවුන් වියළි කලාපයේ හේන් ගිනිතැබීමත් සමඟ ඔබ මොබ ඉගිල්ලෙන කෘමි සතුන් දඩයම් කිරීමට දුම්රොටු අතරින් පියාඹීම සුලබ දසුනකි. දුම්බොන්නා යන සිංහල නාමය පටබැඳීමට මේ හැසිරීම පාදක වන්නට ඇතැයි සිතිය හැකි ය.

කහකුරුල්ලා (*Oriolus xanthornus*) අනුරාධපුර ප්‍රදේශයේ වඩාත්ම සුලබ ය (රූපය 401). වනාන්තර, ගෙවතු, වගා බිම් හා ලඳු කැලෑවල යුගල වශයෙන් දැකිය හැකි ය. දිවා කල නිතරම හඬලන බැවිනුත්, වර්ණවත් කහ පැහැයත් නිසා පහසුවෙන් නිරීක්ෂණය කිරීමේ හැකියාව ඇත. තම කැදැල්ල එතරම් උස් නොවූ ගසක තනන අතර එම සමයේ කහ කුරුලු ජෝඩුව වඩාත් ක්‍රියාකාරී වේ.

ගල්-කිරළා (*Esacus recurvirostris*) අනුරාධපුරය ප්‍රදේශයේ වගුරු, වැව් හා කුඹුරු ආශ්‍රිතව ජීවත් වන සුලබ නොවන කුරුල්ලෙකි (රූපය 402). දිවා කල සෙවනැති පඳුරු යට අලසව ගත කරන අතර බාධා වූ විට ඇවිද ගොස් ආරක්ෂිත ස්ථානයක ලගියි. කිරුළුළු බිම්රිටියා (*Eremopterix griseus*) ලඳු කැලෑ, තෘණ බිම් හා වියළී ගිය කුඹුරු ලියැදි ආදි වියළි පරිසරයන්හි සුලබ ය (රූපය 403). ඔවුන් නිතරම පාහේ බිම ගැවසෙන අතර යුගල හෝ කුඩා රංචු වශයෙන් ජීවත් වේ. තෙත් ස්ථානයන්ට එතරම් ප්‍රියතාවක් නොදක්වන අතර දුවිල්ල සහිත වඩාත් වියළී ගිය ස්ථානයන්ට ඇලුම් කරයි.



රූපය 401. කහකුරුල්ලා (***Oriolus xanthornus***)
(ඡායාරූපය: විමුක්ති විරතුංග)



රූපය 402. ගල්-කිරළා (***Esacus recurvirostris***)
(ඡායාරූපය: විමුක්ති විරතුංග)



රූපය 403. කිරුළුව බිමරිටියා (*Eremopterix griseus*)
(ඡායාරූපය: විමුක්ති විරතුංග)



රූපය 404. බොර කෙවුල්බකමූණා (*Ketupa zeylonensis*)
(ඡායාරූපය: විමුක්ති විරතුංග)

බොර කෙවුල්බකමූණා (*Ketupa zeylonensis*) ගං කුකුළෙකු තරම් ප්‍රමාණයෙන් විශාල වේ (රූපය 404). සන වනාන්තරවලට වඩාත් ප්‍රියතාවක් දක්වන අතර වැඩිපුරම වාසය කරනුයේ ජලයට ආසන්නව ය. සවස් යාමයේ හිරු බැසයාමත් සමඟ මෙම බකමූණන් වනයේ විවෘත ස්ථානවල උස් ගස් මතට පැමිණ දඩයම් පිළිබඳ විපරමින් සිටියි. කෘන්තක මීයන් වැනි කුඩා ක්ෂීරපායීන් මෙන්ම කටුස්සන්, සර්පයන් ඇතුළු විශාල පරාසයක පෘෂ්ඨවංශී සතුන් තම ආහාරයට එක් කර ගනියි. වනයේ බිම ද ලඟින අවස්ථා අප විසින් නිරීක්ෂණය කොට ඇති අතර ඒ කුඩා සතුන් දඩයම් කිරීමට විය හැකි ය. කරපටි කන්බස්සා (*Otus bakkamoena*) මහා වනාන්තර හා ලඳු කැලෑවල මෙන්ම මානව වාසස්ථානවල ද එකලෙස සුලබ නිශාචර පක්ෂියෙකි (රූපය 405). හිරු බැසයාමත් සමඟ මෙම බස්සන් බොහෝ විට වියළී මැරී ගිය ගස් ඉපල් මතට පැමිණේ. මීයන් වැනි කුඩා ක්ෂීරපායීන් මෙන්ම විශාල පරාසයක වූ පෘෂ්ඨවංශීන් මත යැපෙන මෙම බස්සන් බොහෝ විට යුගල හෝ සමාජිකයන් 3-4 බැගින් සමීපව වාසය කරයි.

අපගේ නිරීක්ෂණයන්ට අනුව අනුරාධපුර ප්‍රදේශය ආශ්‍රිතව දැකගත හැකි වූ කුරුලු විශේෂ සංඛ්‍යාව 217 ක් වුවද එය මෙම සංඛ්‍යාව ඉක්මවන බව නොරහසකි. එම කුරුල්ලන් සමස්ත වියළි කලාපයටම පොදු වූවන් වේ. අප විසින් මෙම පරිච්ඡේදයේ විස්තර කරන ලද්දේ බොහෝ දුරට මෙහි වාසස්ථාන අතර සුලබව වසන කුරුල්ලන් පිළිබඳව පමණි. එමෙන්ම නිශාචර බස්සන් හා බකමූණන් ගැන විශේෂ අවධානයක් යොමු නොකරන ලද්දේ උන් පහසුවෙන් දැකබලා ගැනීමට නොහැකි නිසාවෙනි. කුරුල්ලන් පිළිබඳව ඉතා විශාල විස්තරයක් ඉදිරිපත් කළ හැකි වුවද මෙම ග්‍රන්ථයේ අරමුණත් සමඟ එය සීමා කිරීමට අපට සිදු විය. ඉහත කුරුල්ලන් පිළිබඳ විස්තරයේ සිංහල හා විද්‍යාත්මක නම් මහාචාර්ය සරත් කොටගම හා ගාමිණී රත්නවීර විසින් රචිත *An Illustrated Guide to the Birds of Sri Lanka* ග්‍රන්ථය ඇසුරෙන් සකස් කරන ලදී (Kotagama & Ratnavira, 2010). එමෙන්ම කුරුල්ලන් පිළිබඳ වූ මෙම විස්තර සකස් කිරීමේදී කොළඹ විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශයේ ක්ෂේත්‍ර පක්ෂී අධ්‍යයන කවයේ සාලින්ද කසුන් දයානන්ද දැක්වූ සහයෝගය අගය කළ යුතු ය.



රූපය 405. කරපටි කන්බස්සා (*Otus bakkamoena*)
(ඡායාරූපය: විමුක්ති විරතුංග)

ක්ෂීරපායීන්

අප මෙතෙක් සාකච්ඡා කළ සියලුම පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩවලට වඩා ක්ෂීරපායින් බොහෝ සේ වැදගත් වනුයේ උන් ජන ජීවිතයට වඩාත්ම සමීප නිසා ය. ඒ මක්නිසාදයත් දඩයම් කිරීමේදී මෙන්ම හිලෑ කිරීමේදී හෙවත් ගෘහස්ථකරණයේදී ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සිට නූතන සමාජය තෙක් වැඩි වශයෙන් අවධානය යොමු කොට ඇත්තේ ක්ෂීරපායින් කෙරෙහි වීම නිසා ය. තවද එදිනෙදා බර වැඩ සඳහා විශාල ක්ෂීරපායී සතුන් යොදාගත් අතර බල්ලා වැනි සතුන් දඩයම් ලුහුබැඳීමටත්, ආරක්ෂාව පිණිසත්, සුරතල් සතුන් ලෙස ඇතිකිරීමටත් පෙළඹී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා හෙවත් බලංගොඩ මානවයාගේ සිට ඔබ මේ පරිච්ඡේදය කියවන මොහොත දක්වා වූ දිගු ඉතිහාස ගමනේ අපගේ ප්‍රධාන ප්‍රෝටීන සැපයුම්කරුවෙකු වීම තුළින්ම මෙම සත්ත්ව කාණ්ඩය මානවයාගේ ආහාර රටාව කෙරෙහි කොතරම් සමීප ද යන්න අවබෝධ කරගත හැකිවනු ඇත. ඉදිරියේදී මේ පිළිබඳ තව දුරටත් සවිස්තරාත්මකව සාකච්ඡා කරන බැවින් පළමුව අපගේ අධ්‍යයන කලාපය තුළ වාර්තා වන ක්ෂීරපායී සත්ත්ව විශේෂ පිළිබඳ අවධානය යොමු කරමු. ශ්‍රී ලංකාවේ ක්ෂීරපායී සතුන් මෙන්ම වියළි කලාපයේ ජීවත්වන විශේෂ පිළිබඳ අධ්‍යයනවලට ද දිගු ඉතිහාසයක් ඇත (Phillips, 1924; Phillips,1928(a); Phillips, 1928(b); Phillips, 1928(c); Phillips, 1936; Phillips, 1937; Deraniyagala, 1953; Deraniyagala, 1955(c); Deraniyagala, 1955(d); Deraniyagala, 1956(a); Deraniyagala, 1956(b); Deraniyagala, 1958; Deraniyagala, 1965; Phillips, 1980(a); Phillips,1980(b); Phillips, 1984; Corbet & Hill, 1992; de Silva & Jayarartne, 1994; de Silva *et al*., 1994; de Silva *et al*., 1995; de Silva *et al*., 1995; de Silva *et al*., 1996; de Silva, 1996; de Silva *et al*., 1997; de Silva, 1997; Bates & Harrison, 1997; Groves, 2001; Groves & Meijaard, 2005; Weerakoon & Goonatilake, 2006; Meegaskumbura *et al*., 2007; Groves *et al*., 2009; Groves & Jayawardene, 2009; Pethiyagoda *et al*., 2012; Yapa & Ratnavira, 2013). දශක දෙකක කාලයක් තුළ උතුරුමැද ඇතුළු වියළි කලාපීය ප්‍රදේශයන්හි කරන ලද ගවේෂණ හා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වලදී ලබාගත් අත්දැකීම් හා ඉහත දක්වා ඇති මූලාශ්‍ර ඇසුරෙන් අනුරාධපුර ප්‍රදේශයේ ක්ෂීරපායීන් පිළිබඳව තොරතුරු පෙළගස්වන ලදී. මීට අමතරව බුලත්සිංහල ෆාහියන් ලෙන, කුරුවිට බටදොඹ ලෙන, කිතුල්ගල බෙලි ලෙන, අත්තනගොඩ අළු ලෙන, අලවල පොත්ගුල් ලෙන, උඩවලව ජාතික වනෝද්‍යානයේ පිහිටි බෙල්ලන්බැඳි පැලැස්ස,



රූපය 406. කබල්ලෑවා (***Manis crassicaudata***) (ඡායාරූපය: නදීක හපුආරච්චි)

සීගිරියේ පොතාන හා අලිගල ගල් පියැසි, අනුරාධපුරයේ ඇතුල් නුවර, හුංගම හා මිණිඇතිළියේ බෙලි නිධි, මාන්තොට පුරාණ වරාය ආදි ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික වාසස්ථාන කැණීම්වලින් ලද සත්ත්ව අවශේෂ හඳුනාගැනීම තුළින් ලැබුණු අත්දැකීම් ද මේ පරිච්ඡේදය සම්පාදනය කිරීමේදී දායක කරගත්තෙමු. එමෙන්ම වසර 2001 දී තණමල්විල පෙදෙසේ ගල් කෙමකින් හමුවූ අතිවිශාල සත්ත්ව ශේෂ අධ්‍යයනය තුළින් ලැබුණු පළපුරුද්ද වියළි කලාපීය ක්ෂීරපායී සතුන් පිළිබඳ ලියැවෙන මෙම පරිච්ඡේදය පෝෂණය කිරීමට තව දුරටත් ඉවහල් විය.

කබල්ලෑවා (*Manis crassicaudata*) වේයන් වැනි සනාවාසී කෘමීන් ආහාරයට ගනිමින් ජීවත්වන රළු කොරළුවලින් ශරීරය ආවරණය වී ඇති දිගටි සිරුරක් දරන ක්ෂීරපායී සතෙකි (රූපය 406). උන් ඉදිරි ගාත්‍රයේ වූ ශක්තිමත්, තියුණු ඇඟිලි හා නියවලින් වේ හුඹස් කඩා ඒ තුළ වසන වේයන් තම දිගු හා ඇලෙනසුලු දිව ආධාරයෙන් මුඛය තුළට යොමු කර ගනියි. අප රට ගොඩබිම වසන ක්ෂීරපායින් අතුරින් දත් නොදරන එකම විශේෂය කබල්ලෑවා ය. මෘදු සිරුරැති වේයන් වැනි කෘමීන් අනුභවයට දත් අවශ්‍ය නොවන බැවින් එසේ අනුවර්තනය වී ඇත. කබල්ලෑවන්ට ගස් නැගීමටත්, ගොඩබිම ගමන් කිරීමටත්, දියෙහි පිහිනීමටත් හැකිය. මෙම වියළි කලාපයේ වේ හුඹස් හා සනාවාසීව ජීවත් වන කෘමීන් බහුල බැවින් කබල්ලෑවන්ට ජීවත් වීමට ඉතා සුදුසු පාරිසරික තත්ත්වයක් මෙහි පවතී.

නිවෙස් හා ලඳු කැලෑ ආශ්‍රිතව භෞමිකව සැරිසරන කුඩා ක්ෂීරපායින් අතර හික්මීයන් විශේෂ දෙකක් අනුරාධපුරය ආශ්‍රිතව වාර්තා වේ. එනම් පොදු හික්-මීයා (*Suncus murinus*) හා පොඩි හික්-මීයා (*Suncus etruscus*) (රූපය 407) ය. උන් දිගු හොඹු හා ඉතා කුඩා ඇස් දරයි. නිශාචරයන් වූ මෙම



රූපය 407. පොඩි හික්-මීයා (***Suncus etruscus***) (ඡායාරූපය: සම්පත් ගුණතිලක)



රූපය 408. පොඩි හික්-මීයා (***Suncus etruscus***) වාසය කරන පරිසරය, අනුරාධපුරය පූජා නගරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

හික්මීයන්ගේ ප්‍රධානතම ආහාරය කෘමීන් හා පණුවන් ය. සවස් යාමයේ සිට කඩිසරව ඔබමොබ සැරිසරමින් කුඩා සතුන්ගෙන් කුස පුරවා ගනියි. උන්ගේ පරිවෘත්තීය සීඝ්‍රතාවය ඉතා ඉහළ නිසා දිනකට විශාල ආහාර ප්‍රමාණයක් අවශ්‍ය වේ. පොදු හික්මීයා මානව වාසස්ථාන අසල සුලබව ගැවසේ. උන් පුරුද්දක් වශයෙන් නිවෙස් තුළට පැමිණ කැරපොත්තන් ආදි අපෘෂ්ඨවංශී සතුන් දඩයමේ යෙදේ. පොඩි හික්-මීයා මෙහි වූ වියළි තෘණබිම් හා වඩාත් විවෘත ලඳු කැලෑවල ද ජීවත් වේ (රූපය 408). මෙරට වෙසෙන කුඩාම ක්ෂීරපායී සත්ත්වයා වන මෙම පොඩි හික් මීයා පළඟැටියන් ආදි ප්‍රමාණයෙන් කුඩා කෘමි සතුන් මත යැපේ.

අනුරාධපුරය පරිසරයේ වවුලන්ට ජීවත්වීම සඳහා ඇති තරම් වාසස්ථාන ඇත. තල් වැනි තාල වර්ගයේ ගස් මෙන්ම ගල් ගුහා හා ගල් ආවරණ ද, ගල් පැළුම් ද විශේෂයෙන්ම ඇතැම් ඵලභක්ෂක වවුලන්ට ද, බොහෝ කෘමි භක්ෂක වවුලන්ට ද දිවා කල ළැග සිටීමට කදිම වාසස්ථාන වේ. වෙස්සගිරියේ


හා ඉසුරුමුණියේ පිහිටි ගල් ආවරණ අතර ඵල භක්ෂක වවුලන්ගේ මෙන්ම කෘමි භක්ෂක වවුලන්ගේ ද විශාල ඝනාවාස දැකගත හැකි ය. මීට අමතරව මිහින්තලයේ පිහිටි ගල් ගුහා සහ ගල් ආවරණ ද වවුලන්ට ලැගීම සඳහා වූ අනගි වාසස්ථාන වේ. මෙම ප්‍රදේශය පියාඹන කෘමීන්ගෙන් බහුල කෘමි භක්ෂක වවුලන්ට ආහාර අතින් පරිපූර්ණ පෙදෙසකි. ඒ හේතුවෙන් විශාල වවුලන් ගහනයක් මෙම පෙදෙසේ වාසය කරයි. රාත්‍රී කාලයේ අනුරාධපුර පූජා නගරයේ ස්ථූප අසල දැල්වෙන විදුලි පහන්වලට පැමිණෙන ලක්ෂ සංඛ්‍යාත කෘමීන් අල්ලා ගැනීම සඳහා ඒ අවට කෘමි භක්ෂක වවුලන් විශාල වශයෙන් ගැවසෙනු දැකගත හැකි ය. කෘමි භක්ෂක වවුලන් ගැමි වහරේ හැඳින්වෙනුයේ 'කිරි වවුලන්' ලෙස ය. ශ්‍රී ලංකාවේ ඇතැම් පෙදෙස්වල කිරි වවුලන් ආහාරයට ගනු ලැබුව ද, අනුරාධපුර ප්‍රදේශය ආශ්‍රිතව එවැන්නක් වාර්තා නොවේ. මෙම කෘමී භක්ෂක වවුලන් සවස් යාමයේ සිට නොකඩවාම ගුවනේ ඔබමොබ සැරිසරමින් ඉගිළෙන කෘමීන් දඩයම් කරනු ඇත. මේ වායව කුඩා ක්ෂීරපායීන්ගේ ඇස් ඉතා කුඩා ය. කන් හිසට සාපේක්ෂව විශාල ය. එමෙන්ම සියලුම දත් තියුණු තුණ්ඩවලින් සමන්විත අතර ඒවා කෘමී භක්ෂණයට මනා ලෙස අනුවර්තනය වී ඇත. මෙම කලාපයේ වාර්තා වන කෘමි භක්ෂක වවුලන් අතර දික්බා කෙපුලුම්-වවුලා (*Taphozous longimanus*), රැවුල් කළු කෙපුලුම්-වවුලා (*Taphozous melanopogon*), මහ කෙපුලුම්-වවුලා (*Saccolaimus saccolaimus*), දෙපාට පත්නැහැ-වවුලා (*Hipposideros ater*), කෙස් දිග පත්නැහැ-වවුලා (*Hipposideros galeritus*), මහ පත්නැහැ-වවුලා (*Hipposideros lankadiva*), කෙස් කෙටි පත්නැහැ-වවුලා (*Hipposideros speoris*), බොරු ලේ-වවුලා (*Megaderma lyra*), කන් දිග බොරු ලේ-වවුලා (*Megaderma spasma*), මහ අශ්ලාඩන්-වවුලා (*Rhinolophus beddomei*) (රූපය 409), බොරත් අශ්ලාඩන්-වවුලා (*Rhinolophus rouxii*), අවර-වවුලා (*Hesperoptenus tickelli*), විසිතුරු කෙහෙල්-වවුලා (*Kerivoula picta*), දික්පිය-වවුලා (*Miniopterus fuliginosus*), බොර-වවුලා (*Myotis hasseltii*), රත්බොර කොස්ඇට-වවුලා (*Pipistrellus ceylonicus*), ඉන්දු කොස්ඇට-වවුලා (*Pipistrellus coromandra*), හීන් කොස්ඇට-වවුලා (*Pipistrellus tenuis*), මහ කහ-වවුලා (*Scotophilus heathii*), හීන් කහ-වවුලා (*Scotophilus kuhlii*) යනාදීන් සඳහන් කළ හැකි ය.



රූපය 409. මහ අශ්ලාඩන්-වවුලා (***Rhinolophus beddomei***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)


ඵලවලින් ගහන අනුරාධපුර කලාපය පුරාම ඵල භක්ෂක වවුලන් ද සුලබ ය. විශේෂයෙන්ම ඉදුණු බෝ සහ නුග ඵල කෑමට මා-වවුලන් (*Pteropus giganteus*) (රූපය 410) ප්‍රිය කරයි. මා-වවුලන් දිවා කල ඝනාවාසයක් ලෙස විශාල ගස් මත ළඟියි. මල්වතු ඔය දෙපස වූ උස් ගස් අතර මෙවැනි ඝනාවාස කිහිපයක් දිවා කල දැකිය හැකි ය. හීන් තල-වවුලා (*Cynopterus brachyotis*) තෙත් කලාපයේ සුලබ වුවද අනුරාධපුරය වැනි වියළි කලාපීය පෙදෙසේවල ඉතා දුර්ලභ වේ. එසේ වුවද පරිසර විද්‍යාත්මකව ඉතා සුවිශේෂී ස්ථානයක් වූ රිටිගල වැනි ප්‍රදේශයන්හි කලාතුරකින් හීන් තල-වවුලා වාර්තා වී ඇත (සම්පත් ගුණතිලක දක්වන අන්දමට හීන් තල-වවුලා එක් අවස්ථාවකදී පමණක් රිටිගල කඳුවැටිය ආශ්‍රිතව

වාර්තා වී ඇත). තල-වවුලා (*Cynopterus sphinx*) තල් ගස් මණ්ඩිවල දිවා කල ලැඟුම් ගනියි. උන් එහි ඇති වියළී ගිය තල් කොළ අතර දිවා කල සුරක්ෂිතව වාසය කරයි. රත් දුඹුරු ඵල වවුලා (*Rousettus leschenaulti*) මා වවුලන්ට වඩා ප්‍රමාණයෙන් කුඩා වේ. මෙම ඵල වවුලා දිවා කල ගල් ගුහා සහ ගල් පැළුම් අතර අනෙකුත් කෘමි භක්ෂක වවුලන් සමඟ වාසය කරයි. රත් දුඹුරු ඵල වවුලන් දිවා කල ලැගුම් ගන්නා ස්ථාන අතර ඉසුරුමුණියේ පිහිටි ගල් ආවරණ විශේෂයෙන් සඳහන් කළ යුතුය. මෙම ඵල භක්ෂක වවුලන්ගේ පොදු ශාරීරික ලක්ෂණ අතර විශාල ඇස් සහ කුඩා කන් දැක්විය හැකි ය. එමෙන්ම කෘමි භක්ෂක වවුලන්ට සාපේක්ෂව දිගු හොම්බක් ඇති මේ වවුලන්ගේ දත් මොට හා වටකුරු හැඩැති තුණ්ඩවලින් සමන්විත ය. දිගු හොම්බ කියාපානුයේ මෙම ඵල භක්ෂක වවුලන්ගේ ආඝ්‍රාණය සංවේදනය ඉතා දියුණු බව ය. මා වවුලන් මෙරට ඇතැම් ජන කොටස් ආහාරයට ගනු ලැබුව ද අනුරාධපුරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශවලින් එය සනාථ කරන සාධක හමුවී නැත. ඵල වවුලන් බීජ ව්‍යාප්තියට බෙහෙවින් දායක වන සතුන් බව පරිසර විද්‍යාඥයින්ගේ මතය වේ.



රූපය 410. මා වවුලන් (***Pteropus giganteus***)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)


අනුරාධපුරය ආශ්‍රිත කලාපයේ ජීවත් වන අග්‍රේෂයන් හෙවත් ප්‍රිමාටාවන් විශේෂ හතරකි. එනම්, ශ්‍රී ලංකා රිළවා (*Macaca sinica*) (රූපය 411), හැලි වඳුරා හෙවත් ඇළි වඳුරා (*Semnopithecus priam*) (රූපය 412), ශ්‍රී ලංකා කළු වඳුරා හෙවත් කොළ වඳුරා (*Semnopithecus vetulus*) (රූපය 413) හා අළු උණහපුළුවා (*Loris lydekkerianus*) වේ. මේ අතරින් රිළවා සහ කළු වඳුරා මෙරටට ආවේණික ප්‍රිමාටාවන් වේ. බලගතු නායකයෙකුගේ මූලිකත්වය යටතේ රංචු වශයෙන් ඉතාමත් සංවිධානාත්මකව රිළවුන් සහ වඳුරන් ජීවත්වේ. විශේෂයෙන්ම හැලි වඳුරන් සහ රිළවුන් අනුරාධපුරය හා ඒ ආශ්‍රිත මිනිසුන් වඩාත් ගැවසෙන තැන්වල බහුලව වෙසේ. මිනිසා විසින් වවනු ලබන බවබෝග ආහාරයට ගැනීමට උන් දැඩි කැමැත්තක් දක්වයි. එවැනි තැන්වල උන්ගේ බෝවීම ද ඉහළ තලයක පවතී. මානව වාසස්ථානවල උන්ට ඇති විලෝපියයන්ගේ හිඟකම නිසා පූජනීය නගරය තුළ ද, මිහින්තලය වැනි සංචාරකයින් බොහෝ ගැවසෙන තැන්වල ද රිළවුන් හා හැලි වඳුරන් වඩාත් සුලබ ය. රිළවුන්ගේ සහ හැලි වඳුරන්ගේ බෝවීම ඉතා ඉහළ අගයක පවතින බව කියාපාමින් එම රංචුවල වූ රිළවියන් හා වැදිරියන් වසර මුළුල්ලේම පාහේ පැටවුන් දරා සිටීම නිරීක්ෂණ කළ හැකිය. උන් රාත්‍රිය ගතකිරීම සඳහා පූජා නගරය තුළ වූ වඩාත් වදුල ඇති උස් ගස් තෝරා ගනියි. මොවුන්ගේ හැසිරීම් අතර ජලය ආශ්‍රිතව ගැවසීමටත්, දිය ක්‍රීඩාවල යෙදීමටත් වැඩි කැමැත්තක් ඇති බැව් මෙහිලා සඳහන් කළ යුතු ය. රිළවුන් හා වඳුරන්ගේ මාංශය ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සිට අද ජීවත්වන්නවුන්ගේ ද ප්‍රණීත ආහාරයක් වේ. ස්වාභාවික වන ආවරණය ඇති තැන්වලට වඩා මිනිසුන් ජීවත්වන පරිසරය තුළ උන්ගේ ගහනයේ පැහැදිලි වෙනසක් දැකිය හැකි ය. රිළවා හා හැලි වඳුරා මෙන් නොව ශ්‍රී ලංකා කළු වඳුරා අනුරාධපුර ප්‍රදේශය තුළ දුලබ ය. රිළවුන්ට හා හැලි වඳුරන්ට සාපේක්ෂව කළු වඳුරු රංචුවල වූ සාමාජික සංඛ්‍යාව ද සීමිත ය. අනුරාධපුරය ආශ්‍රිතව කළු වඳුරන් වාසය කරනුයේ මිහින්තලය රක්ෂිත කලාපයේ ය. මිහින්තලයේ කළුදිය පොකුණ අවට අභය භූමියේ සාමාජිකයින් දහයකින් පමණ යුත් කුඩා




රූපය 411. ශ්‍රී ලංකා රිළවා (*Macaca sinica*)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 412. හැලි වඳුරා (*Semnopithecus priam*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)





රූපය 413. ශ්‍රී ලංකා කළු වඳුරා (*Semnopithecus vetulus*). වම් පස පිරිමි සත්වයා සහ දකුණු පස ගැහැනු සත්ත්වයා
(ඡායාරූපය: විමුක්ති වීරතුංග, නදීක හපුආරච්චි)

රංචු කිහිපයක් වාර්තා වේ. රිළවුන් හා හැලි වඳුරන් මෙන් නොව කළු වඳුරන් බොහෝ කුලෑටි නිසා දැකබලා ගැනීම අසීරු ය. මේ සතුන් වර්තමානයේ තරම් නොවුවද ඓතිහාසික සමයේ සැලකිය යුතු ගහනයක් මෙම කලාපයේ ජීවත්වන්නට ඇත. හේන් වගාව ඇතුළු කෘෂිකර්මාන්තය අතින් පොහොසත් මෙවැනි කලාපයක උන්ට රිසි සේ බුදීමට හැකි තරම් දෑ තිබීම එයට ප්‍රධානතම හේතුව වේ.

අනුරාධපුර පූජා නගරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේත්, මිහින්තලයේත්, රිළවුන් හා හැලි වඳුරන් පිළිබඳව කරන ලද පර්යේෂණ ප්‍රතිඵල කිහිපයක් ඔබ හමුවේ තැබීමට කැමැත්තෙමු. අනුරාධපුර පෙදෙසේ ජනයා වඳුරන්ගෙන් හා රිලවුන්ගෙන් බොහෝ සේ පීඩා විඳියි. ඔවුන්ගේ බවබෝගවලට මෙන්ම නිවෙස්වල වහලවලට ද මේ සතුන් විශාල වශයෙන් හානි කරනු ඇත. එපමණක් නොව පලතුරු වෙළඳුන්ගේත්,

අනෙකුත් වෙළඳුන්ගේත් ආහාරයට ගත හැකි ද්‍රව්‍යයන් රිළවුන් විසින් ඉතා සූක්ෂම ලෙස පැහැර ගනියි. අනුරාධපුර පූජා නගරය තුළ ශ්‍රී මහා බෝධිය හා ප්‍රධාන ස්ථූප ආශ්‍රිත විශාල රිළා හා හැලි වඳුරු රංචු වාසය කරයි. රුවන්වැලි සෑය අසල පමණක් වාසය කරන රිළා රංචුවක සාමාජිකයින් 160 කට ආසන්න ප්‍රමාණයක් ද, හැලි වඳුරු රංචුවක සාමාජිකයින් 250 ක් පමණ ද ගණනය කිරීමට පර්යේෂකයින් සමත්ව ඇත. ඊට අමතරව ජේතවනාරාමය ස්ථූපය, අභයගිරිය හා මිරිසවැටිය යන ස්ථූප ආශ්‍රිතව ද තවත් විශාල රිළා හා හැලි වඳුරු රංචු හමුවේ. මෙතරම් විශාල රිළා හා හැලි වඳුරු රංචු වනාන්තර ආශ්‍රිතව ස්වාභාවික තත්ත්වයන් යටතේ වාසය නොකරන්නේ එහි වූ විලෝපිකයින්ට උන් ගොදුරු වීමත්, ආහාර සීමා වීමත් නිසා ය. එසේ වුවද පූජා නගරය තුළ සංචාරකයින් ඉවත දමන ආහාර හිඟ නොවන නිසා උන්ගේ බෝවීම ඉහළ අගයක පවතී. විශාල රිළා හා හැලි වඳුරු රංචු ඉහත දැක්වූ අන්දමට ගෙවතුවල වූ බවභෝගවලට මෙන්ම ගොවිපළවලටත්, අනෙකුත් වගාවන්ටත් බොහෝ හානි පමුණුවයි.

රිළවුන් හා හැලි වඳුරන් තම බෝගවලටත්, නිවෙස්වලටත් විශාල වශයෙන් හානි කළ ද ජනයා උන් හට හිරිහැර කිරීමට නොපෙළඹේ. පර්යේෂකයින් ගෙන් ගෙට ගොස් රිළවුන්ගෙන් හා හැලි වඳුරන්ගෙන් වන හානි හා ඒ වෙනුවෙන් ගත යුතු පියවර පිළිබඳ කරුණු එක්රැස් කොට ඇත. එහිදී අනුරාධපුරයේ පූජා නගරය හා ඒ ආශ්‍රිත ජනයාත්, මිහින්තලය පෙදෙසේ ජනයාත් එකහෙළාම පවසා ඇත්තේ මෙම සතුන්ට හිරිහැරයක් නොවන ලෙස ඔවුන්ගෙන් සිදුවන හානිවලට පිළියම් යෙදිය යුතු බව ය. ඔවුන්ට තම ගෙවතුවල මොනයම් හෝ බෝගයක් වැවිය නොහැකි වුවද රිළවුන්ටත්, හැලි වඳුරන්ටත් හානි කිරීමට අකමැති ය. මාලඹේ, අතුරුගිරිය, හෝමාගම, පිළියන්දල ආදි පෙදෙස්වල වාසය කරන කළු වඳුරන් එහි වූ ජනයාට බොහෝ හිරිහැරයක් වී ඇත. එසේ වුවද අනුරාධපුර ජනයා මෙන් නොව ඔවුන් වඳුරන් ඝාතනය කර හෝ එම අවහිරයන්ගෙන් මිදීමට කැමැත්ත පළකොට ඇත. අප මෙහිදී අවධාරණය කිරීමට යෙදුණේ අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව ජීවත්වන ජනයා මෙම සතුන් වෙත දක්වන්නා වූ කාරුණික ආකල්පය පැහැදිලි කිරීමට ය. අනුරාධපුර ඇතුල් නුවර හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ රිළවුන් සහ හැලි වඳුරන් පිළිබඳ මෙම පර්යේෂණ 2011 වසරේ සිට අඛණ්ඩව සිදුවනු ඇත (එම පර්යේෂණ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සොනාලි රංගිකා ප්‍රේමරත්න හා කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි විසින් කරනු ලබන අතර එම වසර සඳහා මූල්‍යමය දායකත්වය පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය විසින් දරන ලදී).



රූපය 414. නරියා (***Canis aureus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

ශ්‍රී ලංකාවේ වාසය කරන උණහපුළුවන් අතරින් මෙම වියළි තැනිතලා බිම්වල ව්‍යාප්තව ඇත්තේ අළු උණහපුළුවා ය. උන් නිශාචර ප්‍රිමාටාවන් වන අතර කෘමීන්, කුඩා උරඟුන් හා පක්ෂීන් මත යැපේ. බොහෝ වදුල ඇති ගස්වල අතු අතර දිවා කල සැඟවී ජීවත් වේ. ප්‍රමාණයෙන් කුඩා වීම හා රාත්‍රියේ සැරිසැරීම හේතුවෙන් දැකබලා ගැනීම අසීරු වුවද හඬ අනුව උන් වාසය කරන බව හඳුනාගත හැකි ය. රාත්‍රියේදී ඉතා තියුණු හඬක් නඟන අතර එය බොහෝ දුරට කෘමියෙකුගේ හඬට සමාන වේ. රාත්‍රි කාලයේ ගස් මත ලගින කුඩා පක්ෂීන්,

සර්පයින්, භූනන් හා කෘමී සතුන් තම ඇඟිලිවලට මනාව ග්‍රහණය කර ගැනීමේ හැකියාව උණහපුළුවන්ට ඇත. කුඩා කොටසක් පවා ඉතිරි නොවන අයුරින් තම තියුණු දත් මඟින් කලබලයකින් තොරව උන් තම ගොදුර කා දමයි.

ලඳු කැලෑ, මහා වනාන්තර මෙන්ම හේන් හා ග්‍රාමීය නිවෙස් ආශ්‍රිතව නරින් (*Canis aureus*) ජීවත් වේ (රූපය 414). පොළොව තුළ උන් විසින්ම හාරන ලද උමං වැනි ගුහාවල දිවා කල ගතකරති. සවස් යාමයේ ක්‍රියාකාරී වන නරින් පවුල් කණ්ඩායම් වශයෙන් හෝ යුගල වශයෙන් ගැවසේ. අභිජනන සමයේ 7-8 ක් පමණ වූ රංචු වශයෙන් දැකිය හැකි ය. අලියා, කුළු හරකා ආදි විශාල ක්ෂීරපායී සතුන්ගේ මළකුණු කා දැමීමට ද, භෞමික පක්ෂීන් දඩයම් කිරීමට ද වඩාත් ප්‍රියකරයි. එසේ වුවද තම පරිසරයේ ජීවත් වන කිනම් සත්ත්වයෙකු හෝ සත්ත්ව කොටසක් මෙන්ම ඇතැම් අවස්ථාවලදී බිම වැටී ඇති ඉදුණු ඵල කෑමට ද උන් පසුබට නොවේ.

කොටියා හෙවත් දිවියා (*Panthera pardus*) (රූපය 415), වල් බළලා (*Felis chaus*), හඳුන් දිවියා (*Prionailurus viverrinus*) හා කොළ දිවියා (*Prionailurus rubiginosus*) යන බළල් පවුලට අයත් සියලුම සාමාජිකයින් මෙම කලාපය ආශ්‍රිතව ජීවත් වේ. අනුරාධපුරයේ පිහිටි විල්පත්තු ජාතික වනෝද්‍යානය වැනි මහා වනාන්තරවල කොටියා ගැවසේ. මෙවැනි වියළි කලාපීය පෙදෙස්වල වසන කොටින්ගේ ප්‍රධානතම ගොදුර වනුයේ තිත් මුවන්, ඔලු මුවන් ආදි මුව පුවලේ සාමාජිකයින් ය. එසේ වුවද කොටින් රිළවුන් සහ වඳුරන්, මීමින්නන් ඇතුළු තවත් ක්ෂීරපායී සතුන් ද, ප්‍රමාණයෙන් විශාල වල් ඌරන් හා ගෝනුන් ද සුලබව දඩයම් කරනු ඇත. කොටින්ගේ වසුරු පිළිබඳ කළ අධ්‍යයනවලදී පැහැදිලි වනුයේ උන් ඉහත දැක්වූ ක්ෂීරපායීන්ට අමතරව ඉඳහිට මිරිදියේ වසන කකුළුවන් ආදි අපෘෂ්ඨවංශීන් ද ආහාරයට ගන්නා බව ය. උන් ඉඳ හිට කැලෑබද මිනිස් වාසස්ථාන කරා පැමිණ බල්ලන්, ගව පැටවුන් හා එළුවන් දඩයම් කරයි. කොටියා තෘණබිම් අතර සැඟවෙමින් බොහෝ ඈතින් වූ ගොදුරු කරා ගමන් කිරීමට තරම් සූක්ෂම සතෙකි. උන් මහා වනාන්තරවල මෙන්ම ලඳු කැලෑ අතර තාවකාලිකව පදිංචි වී කුඩා ක්ෂීරපායීන් දඩයමේ යෙදේ. වල් බළලා අනුරාධපුරයේ පැතිර ඇති උසින් වැඩුණු තෘණබිම් හා ලඳු කැලෑවල බහුලව වාසය කරන්නෙකි. කැලෑබද නිවෙස් ආශ්‍රිතව ද උන් දැකගත හැකි ය. කෘන්තක මීයන් හා භෞමිකව ජීවත්වන පක්ෂීන් වල් බළලාගේ ප්‍රධාන ආහාරය වේ. ගෘහාශ්‍රිත බළලාට වඩා උසින් වැඩි වන අතර ප්‍රධාන ශරීර වර්ණය දුඹුරු ය. හඳුන් දිවියා වගුරු, වැව් හා ඒ ආකාර ජලජ පරිසරය ආශ්‍රිත ජීවිතයට වඩාත් ප්‍රියකරයි. කෘන්තක මීයන්, මසුන් හා මිරිදිය කකුළුවන් ආදි සතුන් ආහාරයට ගනියි. සවස් යාමයේ ක්‍රියාශීලී වන හඳුන් දිවියන් යුගළ වශයෙන් ගැවසෙනු නිරීක්ෂණය කළ හැකි ය. බොහෝ අවස්ථාවලදී ලඳු කැලෑ හා තෘණබිම්වල සැරිසරයි. ඒ සුදුසු දඩයම් සොයා ගැනීම පිණිස ය. ශ්‍රී ලංකාවේ බළල් පවුලේ කුඩාම සාමාජිකයා වන කොළ දිවියා ලඳු කැලෑවල මෙන්ම මිනිස් වාසස්ථාන අසල ද ජීවත්වේ. නමුත් උන් ඉතා කුලෑටි වීමත්, ප්‍රමාණයෙන් කුඩා වීමත් නිසා මිනිසුන්ට



රූපය 415. කොටියා හෙවත් දිවියා (***Panthera pardus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

දැකගැනීමට ඇති අවස්ථා විරල ය. කෘන්තක මීයන් හා පැටවුන් ආදි කුඩා ක්ෂීරපායී සතුන් දඩයම් කිරීමට කොළ දිවියා දක්ෂයෙකි.

සර්පයින් ඇතුළු විශාල පරාසයක කුඩා පෘෂ්ඨවංශී සහ අපෘෂ්ඨවංශී සතුන් මත යැපෙන හෝතඹුවන් හා මුගටි විශේෂ හතරක් ශ්‍රී ලංකාවේ ජීවත්වේ. ඔවුන් නම්, බොර මුගටියා (*Herpestes fuscus*), අළු මුගටියා (*Herpestes edwardsii*) (රූපය 416), හෝතඹුවා (*Herpestes smithii*) (රූපය 417) හා මහ මුගටියා (*Herpestes vitticollis*) (රූපය 418) වේ. මෙම කුඩා ක්ෂීරපායීන් මාංශ භක්ෂක සතුන් ලෙස සත්ත්ව විද්‍යාවේදී වර්ගීකරණය කෙරේ. මුගටින් සහ හෝතඹුවන්ට තියුණු, දිග හොම්බක්, තියුණු තුණ්ඩ සහිත පුරශ්චාර්වක හා චාර්වක දත්, භෞමික ජීවිතයට හැඩගැසුණු දිගටි සිරුරක් හා දිගු වල්ගයක් ඇත.



රූපය 416. අළු මුගටියා (***Herpestes edwardsii***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 417. හෝතඹුවා (***Herpestes smithii***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 418. මහ මුගටියා (***Herpestes vitticollis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

මේ සතුන් රාත්‍රි කාලයේ වඩාත් ක්‍රියාශීලී වන අතර දිවා කල ද ඔබමොබ සැරිසරනු දැකිය හැකි ය. ගල් ගොඩවල් අතර, ගල් කුළු යට හා පොළොවේ හාරන ලද කුඩා උමං තුළ උන් ජීවත්වේ. අනුරාධපුර ආශ්‍රිත ලඳු කැලෑ, මහා වනාන්තරවල මෙන්ම නිවෙස් ආශ්‍රිත ජනාකීර්ණ තැන්වල ද මොවුන් දිවි ගෙවයි. මෙරට වාර්තා වන හෝතඹු හා මුගටි විශේෂ හතරම අනුරාධපුරය ආශ්‍රිත පරිසරයේ වේ.

නිමක් නොමැති මිරිදිය ජලාශවලින් පොහොසත් උතුරුමැද පළාතේ ඒ ආශ්‍රිත සෑම තැනකම පාහේ දිය බල්ලන් (*Lutra lutra*) ජීවත්වේ. උන් ජලයට ඉතා සමීප, බෙනයක් වැනි ස්ථානයක් තම ස්ථිර නිවහන ලෙස තෝරාගනියි. රාත්‍රියේ මෙන්ම උදෑසන ද උන් මසුන් දඩයමේ යෙදේ. නුදෙකලාව දඩයමේ යෙදුණ ද කුඩා රංචු වශයෙන් සංවිධානාත්මකව දඩයමේ යෙදෙන අවස්ථා ද ඇත. ජලයේ කිමිදී දඩයම් කරන මසුන් බොහෝ විට ගොඩට ගෙනවුත් ආහාරයට ගනියි. එම නිසාම උන් ජීවත්වන බෙනය අසල නිතරම පාහේ මත්ස්‍ය කොරළ ඇතුළු උන්ගේ අස්ථිමය සුන්බුන් පවතී. දිය බල්ලාගේ හොම්බ ප්‍රදේශය කෙටි හා පළල් වේ. පුරශ්චාර්වක හා චාර්වක දත් තියුණු තුණ්ඩ දරන අතර ඒවා පැතලි ස්වරූපයක් ගනියි. පාදවල යම්

පමණකට බැඳිපටල වර්ධනය වී ඇති අතර පිහිනීම සඳහා ශක්තිය ලබා ගැනීමට මාංශලමය ස්ථූල වල්ගයක් දරයි.

අනුරාධපුරය ප්‍රදේශයේ වලසුන් (*Melursus ursinus*) (රූපය 419) වාර්තා වන්නේ විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ ය. මහා වනාන්තරවලට පමණක් සීමා වී ඇති වලසා මිනිසුන්ට දැක බලාගැනීමට ඇති අවස්ථා විරල ය. උන් මියගිය සතුන්ගේ මාංශය මෙන්ම ඉදුණු ඵල හා මීපැණි ආදිය තම ආහාරයට එක් කර ගනිමින් සර්ව භක්ෂක ආහාර රටාවකට හුරුව ඇත. වලසුන් හුදෙකලාව, යුගළ වශයෙන් හෝ මව පැටවා සමඟ වාසය කරනු ඇත. වියළි කලාපයේ වනාන්තර ආශ්‍රිත ගල් ගුහාවල වලසුන් වාසය කරන බැවින් ඒ කරා ගමන් කිරීමේදී ඉතා ප්‍රවේසම්කාරී විය යුතු බැව් ගැමියන් අප සමග පවසා ඇත. වලසාට දිගු හොම්බක් ඇති අතර පුරශ්චාර්වක හා චාර්වක දත් මොට හා වටකුරු තුණ්ඩවලින් යුක්ත ය. භෞමිකව වාසය කළ ද ගස් නැඟීමට ද මනා හැකියාවක් ඇත. උන් පළු හා වීර ගස්වල ඵල හටගන්නා සමයේ තියුණු හා දිගු නිය දරන ශක්තිමත් ඉදිරි ගාත්‍රා ආධාරයෙන් එම ගස් මුදුන් තෙක් නැග ඒවා ආහාරයට ගනියි.



රූපය 419. වලසා (***Melursus ursinus***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

උගුඩුවා (*Paradoxurus hermaphoditus*), ශ්‍රී ලංකා රන් කළවැද්දා (*Paradoxurus* spp.) හා උරුලෑවා (*Viverricula indica*) මෙම කලාපය තුළ ජීවත්වන කුඩා මාංශ භක්ෂකයින් වේ. මේ සතුන් සත්ත්ව මාංශය සහ අඩු හෝ වැඩි වශයෙන් ඉදුණු ඵල හා ශාක කොටස් ද තම ආහාරයට එක් කරගනියි. උගුඩුවා මහා වනාන්තරවල මෙන්ම නිවෙස් ආශ්‍රිතව ද ජීවත්වේ. උන් මනුෂ්‍ය වාසස්ථානයට කෙතරම් ප්‍රියතාවක් දක්වන්නේ ද යත් දිවා කල ලැඟීම සඳහා බොහෝ විට තෝරා ගන්නේ නිවෙස්වල පියැසිවල වූ සැඟවිය හැකි තැන් ය. උන් නිවෙස්වල ඇති කරන කුකුළන් හා අනෙකුත් කුරුල්ලන් දඩයම් කොට ආහාරයට ගැනීමට ප්‍රිය කරයි. ඊට අමතරව ඉඳුණු කිතුල් ඇට ඇතුළු වනයේ වැවෙන ඵල කෑමට ගිජුකමක් දක්වයි. ශ්‍රී ලංකාවේ රන්වන් පැහැයෙන් හෝ දුඹුරු පැහැයෙන් ශරීර වර්ණ ඇති කළවැද්දන් විශේෂ තුනක් වාසය කරනු ඇත. එනම්, ශ්‍රී ලංකා තෙත්-කලාපීය රන් කලවැද්දා (*Paradoxurus aureus*), ශ්‍රී ලංකා දුඹුරු කලවැද්දා (*Paradoxurus montanus*) හා ශ්‍රී ලංකා වියළි-කලාපීය රන් කලවැද්දා (*Paradoxurus stenocephalus*) යන විශේෂ වේ. මෙම විශේෂ තුන අතුරින් කුමන විශේෂය අනුරාධපුර ප්‍රදේශයේ වාසය කරන්නේ ද යන්න ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කළ නොහැකි ය. එසේ වුවද විල්පත්තුව ඇතුළු මහා වනාන්තර සහිත කලාපවල රන් කළවැද්දන් ජීවත්වේ. උන් සර්ව භක්ෂකයින් ය. ශ්‍රී ලංකාවේ වසන සියලුම කළවැද්දන්ගේ පුරශ්චාර්වක හා චාර්වක දත් මොට තුණ්ඩවලින් සමන්විත ය. එය සර්ව භක්ෂක ආහාරයකට දක්වන මනා අනුවර්තනයකි. උරුලෑවා සුලබ සත්ත්වයෙකි. කළු, අළු සහ සුදු පැහැයෙන් යුත් වර්ණ රටාවක් දරන උන් ගස් උඩ සහ බිම වාසය කරයි. උරුලෑවුන් කුඩා පෘෂ්ඨවංශීන් සහ අපෘෂ්ඨවංශීන් මත යැපෙන නිශාචර සතුන් ය. දිවා කාලය බොහෝ විට ගස් බෙන හෝ ඊට සමාන සැඟවිය හැකි ස්ථානයක ගතකරයි.

අලින් සහ ඇතුන් (*Elephas maximus*) (රූපය 420) උතුරුමැද පළාතේ ඉතා සුලබ ය. විල්පත්තු ජාතික වනෝද්‍යානය, මහකනදරාව, මැදවච්චිය, තන්තිරිමලේ හා තිසා වැව ආශ්‍රිතව ඇතුළු විශාල

වපසරියක අලි ඇතුන් වාසය කරයි. මේ කලාපයේ වූ හේන්, කුඹුරු, පලතුරු වගා ඇතුළු අනෙකුත් බෝගවලට උන් දක්වන ගිජුකම හේතුවෙන් මිනිස් වාසස්ථාන කරා නිරන්තරයෙන්ම පැමිණේ. මේ උවදුර ඓතිහාසික සමයේ සිටම පැවැත එන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. වර්තමානයේ අලි ඇතුන් මහා වනාන්තරවල මෙන්ම මිනිස් වාසස්ථාන අසල ගැවසීමට වඩාත් ප්‍රිය කරනු ඇත. උන් මිනිසුන්



රූපය 420. අලින් (***Elephas maximus***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

විසින් වවනු ලබන උක්, ගස්ලබු, කෙසෙල්, වී ආදි දෑ අනුභවයට වඩාත් කැමති ය. එම නිසාම අද අලි ඇතුන් මහා වනාන්තර අවට වූ ගම්මානවලට වැද ගොවීන්ගේ වගාවන්ට විශාල ලෙස හානි පමුණුවයි. වර්තමානයේ අලි මිනිස් ගැටුමක් දක්වා මෙම තත්ත්වය දුර දිග ගොස් තිබේ. මේ හේතුවෙන් ගොවීන් අතින් මෙම සතුන්ට වඩාත් හිරිහැර සිදුවේ. එමෙන්ම අලි ඇතුන් ද මිනිසුන්ගේ ජීවිතවලට මෙන්ම ඔවුන්ගේ දේපලවලට ද බෙහෙවින් හානි සිදුකරයි. අලි ඇතුන් පිළිබඳ පර්යේෂණ කරන විද්වතුන්ගේ සොයාගැනීම් අනුව පැහැදිලි වී ඇත්තේ මිනිසුන් විසින් වවනු ලබන බවබෝග සුලබ බැවින් උන්ගේ ගහනය ද ඉහළ ගොස් ඇති බව ය. මේ අනුව පැහැදිලි වනුයේ ස්වාභාවික වන ආවරණය ශ්‍රී ලංකාවේ පැවැති සමයේ මෙතරම් අලි ගහනයක් මෙරට ජීවත් වන්නට නොමැති බව ය.

වියළි කලාපීය මහා වනාන්තර හා තෘණබිම් අතර, කුර සහිත සතුන් විශාල රංචු වශයෙන් ජීවත්වේ. ප්‍රාග් ඓතිහාසික මානවයා මෙන්ම ඓතිහාසික සමයේ මිනිසුන් ද මෙවැනි වියළි කලාපීය තැනිතලාවලට වඩාත් කැමැත්තක් දැක්වූ බව පුරාවිද්‍යාත්මක සාධක මඟින් සනාථ වී ඇත. එයට හේතු වූ කරුණු අතර එක් ප්‍රධාන හේතුවක් වී ඇත්තේ කුර සහිත සතුන් බහුලව වාසය කරන මෙවැනි වියළි තැනිතලා බිම්වල යැපීම් ධාරිතාවය ඉතා ඉහළ අගයක පැවතීමයි. ප්‍රාග් ඓතිහාසික මානවයාත්, මූල ඓතිහාසික සමයේ ජනයාත් විශාල වශයෙන් කුර සහිත සතුන් දඩයම් කොට ඇති බැව් බෙල්ලන්බැඳි පැළැස්ස, මිණිඇතිලිය හා අනුරාධපුර ඇතුල් නුවර කරන ලද කැණීම් මඟින් ලද සත්ත්ව අවශේෂ වලින් මනාව සනාථ වී ඇත (Deraniyagala, 1992; Perera, 2010).



රූපය 421. වල් මීමා (***Bubalus arnee***) විය හැකි සතුන් දෙදෙනෙක්. විල්පත්තු ජාතික වනෝද්‍යානය (ඡායාරූපය: විමුක්ති විරතුංග)



රූපය 422. වල් මීමා (***Bubalus arnee***). මොවුන් පිළිබඳ මෑතකදී කළ පර්යේෂණ අනුව උන්ගේ සුළු ගහනයක් යාල ජාතික වනෝද්‍යානයේ ජීවත් වන බව අනාවරණය විය. මෙහි දැක්වෙනුයේ එම වනෝද්‍යානයේ ජීවත්වන බොහෝ දුරට වල් මීමුන් විය හැකි සතුන් ය (ඡායාරූපය: නදීක හපුආරච්චි)

වල් මීමා (*Bubalus arnee*) (රූපය 421) වියළි කලාපයේ වෙසෙනමුත් අද එම ගහනය බොහෝ සේ හීන වී ඇත්තේ උන් ගෘහාශ්‍රිත මී හරකුන් සමග මිශ්‍ර වීමෙන් බව විද්‍යාඥයින් විසින් අනාවරණය කොටගෙන ඇත. අනුරාධපුරය ආශ්‍රිතව වල් මීමුන් වෙසෙන්නේ නම් ඒ බොහෝ විට විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ පමණි. නමුත් මේ පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීමට නම් වියළි කලාපය ආශ්‍රිතව කරන ලද කැණීම්වලින් ලද මී හරකුන්ගේ හා වල් මීමුන්ගේ අස්ථි ගැඹුරින් අධ්‍යයනය කළ යුතු වේ. යාල ජාතික වනෝද්‍යානයේ වල් මීමුන් සුලු ගහනයක් වාසය කරන බැව් මෑතකදී අනාවරණය කෙරිණි (රූපය 422) (Groves & Jayawardene, 2009). එසේ වුවද අපගේ මෙම සාකච්ඡාවට බඳුන්වන කලාපයේ වල් මීමුන් වර්තමානයේ ජීවත් වනවා ද නැත්ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි ය. ඉහත දැක්වූ



රූපය 423. මී හරකුන් (***Bubalus bubalis***), අනුරාධපුරය බසවක්කුලම වැව
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ලෙසින් එම වල්මීමුන් ජීවත් වන්නේ නම් උන් බොහෝ විට විල්පත්තුව වැනි විශාල වනාන්තරවලට පමණක් සීමාවී ඇති බැව් අපට අනුමාන කළ හැකි ය. වල් මීමුන් මී හරකුන්ට (*Bubalus bubalis*) (රූපය 423) වඩා ප්‍රමාණයෙන් විශාල වේ. උන්ගේ පිරිමි සතුන් පුළුල් හා වඩාත් දෙපසට විහිදුණු විශාල අං යුවළක් දරයි.

තිත් මුවන් (*Axis axis*) (රූපය 424) මහා වානාන්තර, ලඳු කැලෑ හා තෘණබිම්වල වාසය කරයි. දහදෙනෙකුගෙන් පමණ සමන්විත රංචුවල සිට පනස් දෙනෙකුගෙන් පමණ යුත් විශාල රංචු දක්වා සැරිසරයි. තිත් මුවන් දිවා කල සැරිසැරුව ද රාත්‍රියේ ද යම් පමණකට ක්‍රියාශීලි ය. අනුරාධපුරය ආශ්‍රිතව කැලෑ අද්දර ගම්මානවලට ද පැමිණේ. අප අධ්‍යයන කලාපය ආශ්‍රිතව තිත් මුවන් පහසුවෙන්ම දැකබලාගත හැක්කේ මිහින්තලය අවට වූ වනයේ ය. ගෝනා (*Rusa unicolor*) (රූපය 425) මෙරට වසන මුව පවුලේ විශාලම සාමාජිකයා වේ. උන් බොහෝ දුරට විල්පත්තුව ආදි විශාල වනාන්තරවලට පමණක් සීමා වී ඇත. එසේ වුවද මිනිසුන් වවන බවබෝග ආහාරයට ගැනීමට වනාන්තර හා ලඳු කැලෑ ආශ්‍රිතව පිහිටි ගෙවතුවලට හා වගාබිම්වලට පැමිණේ. මෙම ප්‍රදේශය ආශ්‍රිතව උන්ගේ ව්‍යාප්තිය මහා වනාන්තරවලට පමණක් සීමා වී ඇත්තේ නාගරීකරණය වීමේ හේතුවෙන් වාසස්ථාන අහිමි වීම නිසාත්, පසුගිය සියවස් දෙක තුළ උන් දඩයම් කිරීම හේතුවෙනි.



රූපය 424. තිත් මුවා (***Axis axis***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

වැලි මුවා (*Muntiacus muntjak*) (රූපය 426) යනු සුනඛයකු තරම් කුඩා මුව විශේෂයකි. පිරිමි සතුන්ට වක් හැඩැති අං යුවළක් හා මුඛයෙන් පිටතට නෙරා ආ උඩු ඇන්දේ වූ රදනක දත් යුවළක් ඇත. වැලි මුවන් මහා කැලෑ සහ ලඳු කැලෑවල බොහෝ විට ජීවත්වේ. නමුත් වනබද ගෙවතු හා වගාබිම්වල උන් දැකගැනීම අපහසු නැත. සවස් හා රාත්‍රි කාලවල බිරීමක් වැනි හඬක් නඟන නිසා උන්ගේ හැසිරීම පහසුවෙන් වටහාගත හැකි ය. වැලි මුවන් දිවා කල ලඳු කැලෑ හා මහා වනයේ පඳුරු අතර ලැග සිට රාත්‍රියේ ක්‍රියාශීලී වේ.

වල් ඌරා (*Sus scrofa*) (රූපය 427) මහා වනාන්තරවල මෙන්ම ලඳු කැලෑ හා වගාබිම් ආශ්‍රිතව ජීවත්වේ. රංචු වශයෙන් වෙසෙන උන් සවස් කල ක්‍රියාශීලී ය. රංචුවක මනාව වර්ධනය වූ දළ හෙවත් යටි ඇන්දේ රදනක දත් දරන වැඩුණු පිරිමි සතෙකු දැකිය හැකි ය. උන් බොහෝ විට මිනිසුන්ට පහරදීමට පෙළඹේ. මෙම කලාපයේ වූ වගුරු හා මඩ සහිත

දිය කඩිතිවල සවස් යාමයේ වල් ඌරන් ගැවසේ. රාත්‍රියේදී අනුරාධපුරය පූජා නගරය අවට මිනිස් වාසස්ථාන අසලදී නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වන්නේ උන්ට එම පරිසරයන්හි ද මනාව ජීවත්විය හැකි බව ය. උන් මිනිසුන් විසින් වගා කරනු ලබන බවබෝගවලට බරපතළ ලෙස හානි පමුණුවයි. ප්‍රාග්



රූපය 425. ගෝනා (***Rusa unicolor***)
(මෙය හෝර්ටන් තැන්නේ ගෝනෙකුගේ ඡායාරූපයකි)
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 426. වැලි මුවා (***Muntiacus muntjak***) පැටවෙක්
(ඡායාරූපය: නදීක හපුආරච්චි)



රූපය 427. වල් ඌරා (***Sus scrofa***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

ඓතිහාසික හා ඓතිහාසික සමයේ ද විශාල වශයෙන් වල් ඌරන් දඩයම් කොට ඇති බව කැණීම්වලින් ලද අවශේෂ අනුව පැහැදිලි වේ.

ශ්‍රී ලංකාවේ මී මින්නන් විශේෂ දෙකක් වාර්තා වේ. එනම්, ශ්‍රී ලංකා මීමින්නා (*Moschiola meminna*) (රූපය 428) සහ ශ්‍රී ලංකා කුරු මීමින්නා (*Moschiola kathygre*) වේ. මේ අතරින් මෙම වියළි තැනිතලා බිම්හි වාසය කරනුයේ ශ්‍රී ලංකා මීමින්නා ය. උන්ට විසීමට කුඩා ලඳු කැලෑවක් වුවද සෑහේ (රූපය 429). එමෙන්ම ගෙවතුවල වදුල ඇති තැන්වල ද උන් දිවා කල සැඟවී ජීවත් වන අතර සවස් හා රාත්‍රි කල ක්‍රියාශීලී වේ. සුනඛයින්ගෙන් ගොදුරු බවට පත්වීමෙන් මීමින්නන් අද එම පරිසරයෙන් ක්‍රමයෙන් වඳ වෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ විශාලතම කෘන්තකයා වනුයේ ඉත්තෑවා (*Hystrix indica*) (රූපය 430) ය. උන්ට බොහෝ පුළුල් පරිසර පරාසයක් තුළ ජීවත්විය හැකි ය. එම නිසා ඉත්තෑවුන් මානව වාසස්ථානවල ද තවමත් යහතින් වෙසේ. රාත්‍රි කල යුගල වශයෙන් හෝ පවුල් රංචු වශයෙන් සැරිසරයි. කෘෂි බිම් ආශ්‍රිතව වසන ඉත්තෑවුන් බවබෝගවලට බොහෝ හානි ගෙන දේ. තියුණු හා ශක්තිමත් කෘන්තක දත් මඟින් සත්ත්ව ද්‍රව්‍යයන් පවා ලෑටි ගා ආහාරයට ගනියි. එම කෘන්තක දත් කොතරම් ශක්තිමත් හා දැඩිද යත් එමඟින් ලෙලි සහිත පොල් ගෙඩි පවා ලෑටි ගා මදය ආහාරයට ගැනීමේ හැකියාව උන්ට ඇත. උන් දිවා කල වාසය කරනුයේ පොළොවේ හාරාගත් ගුල් හෝ විශාල ගල් යට වූ හිදැස් තුළ ය. ගැමියන් අටවන උගුල්වලට ඉත්තෑවුන් පහසුවෙන් හසුවේ. වර්තමානයේද ඉත්තෑ මස් ගැමියන් අතර ප්‍රචලිත ය.



රූපය 428. ශ්‍රී ලංකා මීමින්නා (*Moschiola meminna*)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)



රූපය 429. ශ්‍රී ලංකා මීමින්නා (*Moschiola meminna*) වාසය කරන පරිසරය,
අනුරාධපුරය පූජා නගරය, බෙල් කොටස
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 430. ඉන්නැවා (*Hystrix indica*) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

අනුරාධපුරය ඇතුළු සමස්ත උතුරුමැද පළාතත්, තෘණබිම් හා ලඳු කැලෑ ගහන වියළි කලාපීය පරිසරයත් කෘන්තක මීයන් සඳහා මනා වාසස්ථාන වනු ඇත. සහශ්‍ර කිහිපයක් වී, මෙනේරි, කුරක්කන් ඇතුළු ධාන්‍ය වගා කරන ලද අනුරාධපුර ප්‍රදේශයේ කෘන්තක මීයන් සඳහා දිගු ඉතිහාසයක් ඇති බැව් සිතිය හැකි ය. ජලය හා වගුරු ආශ්‍රිත පරිසරයත්, ලඳු කැලෑ, තෘණ බිම් හා මහා කැලෑ ද එක් එක් මී විශේෂයන්ට ජීවත්වීම සඳහා උචිත පරිසරයන් තනා ඇත. අනුරාධපුරය ආශ්‍රිත මෙම කලාපයේ වාසය කරන මීයන් අතර විශාලතමයන් ලෙස සැලකෙන මෙරට වාර්තාවන උගරු මී විශේෂ දෙකම මෙහි වසනු ඇත. එනම්, හීන් උගරු-මීයා (*Bandicota bengalensis*) හා උගරු-මීයා (*Bandicota indica*) වේ. ඊට අමතරව වගුරු, වැව් හා කුඹුරු ආශ්‍රිතව වෙසෙන පඳුරු-මීයා (*Golunda ellioti*) හා කෙස් මෘදු කෙත් මීයා (*Millardia meltada*) මෙහි සුලබ කෘන්තක මීයන් ය. උන් වගුරු ආශ්‍රිතව මඩෙහි තනන ගුල් තුළ දිවා කල ගතකරයි.

තවත් ගනයට අයත් ප්‍රමාණයෙන් කුඩා මීයන් තෘණ බිම් අතර මෙන්ම මිනිස් ජනාවාසවල ද බහුලව ජීවත්වේ. ධාන්‍ය ගබඩාවලට වැදී ඒවාට වඩාත්ම හානි කරනුයේ මෙම කුඩා මීයන් ය. ගැමියන් බටු මීයන් හෝ කොස්ඇට මීයන් ලෙස ව්‍යවහාර කරන්නේ ද මොවුන්ට ය. පසුගිය කාලපරිච්ඡේදයේ කරන ලද පර්යේෂණයන්ට අනුව මෙම කලාපයේ බහුලව වාසය කරනුයේ වෙල් හීන්-මීයා (*Mus booduga*), ශ්‍රී ලංකා කටු හීන්-මීයා (*Mus fernandoni*) හා කොස් ඇට-මීයා (*Mus musculus*) ය. *Rattus* ගනයට අයත් පොදු ගේ මීයා (*Rattus rattus*) ප්‍රධාන වශයෙන් නිවෙස් තුළ හා ගෙවතු ආශ්‍රිතව ජීවත්වේ. උන් බොහෝ දුරට මානව ජනාවාසවලට සීමා වී ඇත. එසේ වුවද මහා කැලෑවල ද ජීවත් වන බැව් පර්යේෂණවලදී සනාථ වී ඇත. ගස් මත ජීවත්වන කෘන්තක මීයෙකි, ගස්-මීයා (*Vandeleuria oleracea*) (රූපය 431). ගස්-මීයාට රුක් මත සංචරණයට අනුවර්තනය වූ දිගු වල්ගයක් ඇත. එසේ වුවද උන් නිවෙස් තුළ ද සුලබව හමුවේ. ගස්-මීයන් නිවෙස් තුළ මෙන්ම ගස් මත ද කැදලි තනා පැටවුන් ඇති දැඩි කරයි.




රූපය 431. ගස්-මීයා (***Vandeleuria oleracea***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)




රූපය 432. වැලි-මීයා (***Tatera indica***)
(ඡායාරූපය: සම්පත් ගුණතිලක)

විවෘත තෘණ බිම් හා ලඳු කැලෑ ආශ්‍රිතව ජීවත්වන්නෙකි, වැලි-මීයා (*Tatera indica*) (රූපය 432). කැන්ගරුවෙකු මෙන් පැන පැන යන වැලි මීයා මෙම වියළි තැනිතලා බිම්වල සුලබ ය. ඉහත විස්තර




රූපය 433. මා-හම්බාවා
(***Petaurista philippensis***)
(ඡායාරූපය: නදීක නපුආරච්චි)



රූපය 434. දඬු ලේනා (***Ratufa macroura***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

කළ සියලුම මීයන්ට වඩා රූපීයව වෙනස් ලක්ෂණ දරයි. ඇස් තරමක් විශාල ය. වල්ගයේ කෙළවර ලොම් රොදක් දරයි. වියළි ස්ථානයන්හි හාරන ලද ගුහා තුළ දිවා කල ගතකරයි.

ගස් මත වසන කෘන්තකයින් අතර මා-හම්බාවා (*Petaurista philippensis*) (රූපය 433) මහා වනාන්තර ආශ්‍රිතව වාසය කරයි. උන් වඩාත්ම ප්‍රියකරනුයේ උස් ගස් ඇති කලාපවල විසීමට ය. දිවා කල ගතකිරීමටත්, කැදලි තැනීමටත් ගස් බෙන තෝරා ගනියි. නිශාචර ක්ෂීරපායී සතෙකු නිසා මිනිස් ඇස ගැටෙනුයේ කලාතුරකිනි. ඉදිරි හා පසු ගාත්‍රා අතර වූ



රූපය 435. ලේනා (***Funambulus palmarum***)
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)

තුනී සම හේතුවෙන් උස් ගසක සිට පහත පිහිටි ගසකට පාවී ඒමේ හැකියාව මේ සතුන්ට ලැබී ඇත. අනුරාධපුරය ආශ්‍රිත වියළි කලාපයේ දිවා කල සැරිසරන විශාලතම කෘන්තකයා වන්නේ දඬු ලේනා (*Ratufa macroura*) (රූපය 434) ය. දිවා කල සැරිසරන මේ සතුන් මහා වනාන්තරවලට වඩා ගෙවතු ආශ්‍රිතව විශාල ගහනයක් වාසය කරයි. උන් මිනිසුන් වවන බවබෝගවලට වඩාත් ප්‍රිය කරයි. දඬු ලේනුන් හුදෙකලාව හෝ බොහෝ විට යුගළ වශයෙන් ජීවත්වේ. උන් කැදලි තැනීම සඳහා උස් ගස් අතු තෝරා ගනියි. කැදලි තනාගන්නේ අතු රිකිලි එක්රැස් කර ගැනීමෙනි. මෙහි ජීවත්වන ලේනුන් අතර ප්‍රමුඛස්ථානය ගන්නේ ලේනා (*Funambulus palmarum*) (රූපය 435) ය. උන් කැදලි තැනීමට නිවෙස්වල සුදුසු ස්ථාන මෙන්ම ගස් බෙන ආදිය ද තෝරා ගනියි. පිරිමි සතුන් බොහෝ විට තම බල ප්‍රදේශ වෙන් කොටගෙන ජීවත්වන අතර තවත් පිරිමි සතුන් එය ආක්‍රමණය කිරීමේදී අරගල ඇති වේ. ශ්‍රී ලංකා මූකලන් ලේනා (*Funambulus layardi*) තෙත් කලාපයේ ව්‍යාප්තව ඇති ලේන විශේෂයක් වුවද වියළි කලාපයේ වූ හොරොව්පොතාන පෙදෙසෙහි ජීවත්ව ඇති බවට සාධක ඇත (මෙය 1935 දී වාර්තා කරන ලද්දක් වන අතර මෙම ලේන් විශේෂය අනුරාධපුර පෙදෙසේ ජීවත් වන බවට මෑතකාලීන වාර්තා නොමැත. එසේ වුවද පරිසර අමාත්‍යාංශය විසින් 2008 දී ප්‍රකාශිත *Biodiversity Baseline Survey: Ritigala Strict Natural Reserve* වාර්තාවේ රිටිගල ප්‍රදේශයෙන් මෙම ලේන විශේෂය වාර්තා වූ බව දක්වා ඇත). සම්පත් ගුණතිලකගේ ක්ෂේත්‍ර අධ්‍යයන අනුව ශ්‍රී ලංකා මූකලන් ලේනා මෙරට තෙත් කලාපයටත්, අන්තර් කලාපයටත් සීමා වී ඇත.



රූපය 436. වල් හාවා (***Lepus nigricollis***) (ඡායාරූපය: විමුක්ති වීරතුංග)

වල් හාවුන් (*Lepus nigricollis*) (රූපය 436) මෙවැනි වියළි බිම්වල ඉතා සුලබ ය. ලඳු කැලෑ හා විවෘත තෘණ බිම්වල උන් වෙසේ. දිවා කල සෙවනැති, කොළ රොඩු ඇති තැන්හි වැතිර සිටින අතර සවස් යාමයේ ක්‍රියාකාරී වේ. මිනිස් වාසස්ථානවල වල් හාවුන් ජීවත්වුවද ගෘහාශ්‍රිත සුනඛයින්ට ගොදුරු වන නිසා උන් එවැනි පරිසරයන්ගෙන් තුරන්වෙමින් පවතී. මස් පිණිස වල් හාවුන් දඩයම් කිරීම ප්‍රාග් ඓතිහාසික සමයේ සිට වර්තමානය දක්වාම සිදුවේ. මෙම පරිච්ඡේදය සම්පාදනය කිරීමේදී ශ්‍රී ලංකාවේ ක්ෂීරපායීන් පිළිබඳ ප්‍රවීණයෙකු වූ සම්පත් ගුණතිලක තම බුද්ධිමය දායකත්වය තුළින් දැක්වූ සහයෝගය බෙහෙවින් අගය කරමු.

රිටිගල කඳුවැටිය හා එහි ජෛවවිවිධත්වය





රූපය 437. රිටිගල කඳුවැටිය (ඡායාරූපය: සම්පත් ගුණතිලක)

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වනාන්තර වර්ග කිරීමට අනුව රිටිගල, දැඩි ස්වාභාවික රක්ෂිතයක් ලෙස හෝ තහනම් කලාපයක් ලෙස ප්‍රකාශයට පත්කොට ඇත (රූපය 437). රිටිගලට එම නම ලැබී ඇත්තේ 'රිටි' (*Antiaris toxicaria*) යන ගස් විශේෂය පදනම් කොටගෙන බව සඳහන් ය (*Biodiversity baseline survey: Ritigala Strict Natural Reserve*, 2008). එසේ වුවද රිටිගලට එම නම ලැබීම පිළිබඳ අදහසට සම්පූර්ණයෙන්ම වෙනස් මතයක් ද වේ. එනම් 'තැනිතලා බිම් පෙදෙසක රිටක් මෙන් ඉහළට පිහිටන ගල' යන අර්ථය ගෙනදෙන 'රිටිගල' යන්නයි (ජනතාව අතර මෙවන් මතයක් ඇති බව අප සමඟ පවසන ලද්දේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුරාධපුර පුරාවිද්‍යා නිලධාරී ඒ.ඒ. විජයරත්න විසිනි, 2013). රිටිගල අනුරාධපුර දිස්ත්‍රික්කයේ හබරණ හා මරදන්කඩවල යන මාර්ග දෙක අතර ස්ථානගතව ඇත. බටහිර දෙසින් ගනේවල්පොල ග්‍රාමයෙන්ද, නොඑසේ නම් නැගෙනහිර දෙසින් ගලපිටගල ග්‍රාමයෙන්ද රිටිගලට ළඟා විය හැකිය. රිටිගල ද සීගිරිය හා දඹුලු පර්වත මෙන් වසර දසදහස් ගණනක භූ බාදනය වීමේ ප්‍රතිඵලයකින් නිර්මාණය වූවකි (රූප 438 සහ 439). භූ විද්‍යාත්මකව සලකා බැලූ කල රිටිගල සම්භවය වී ඇත්තේ ශ්‍රී ලංකාවේ සමුද්‍ර තැන්න හෙවත් ප්‍රථම තැන්නෙහි ය. මෙම කඳුවැටිය මුහුදු මට්ටමේ සිට උස මීටර් 180-768 දක්වා වූ වෙනස් වන පරාසයක් තුළ පිහිටා ඇති අතර දිගින් කිලෝමීටර් 6.5 ක් පමණ වේ.


රිටිගලින් ගලාබසින ස්වාභාවික ජල පද්ධතිය යොමු වන්නේ මල්වතු ඔයට ය. එම නිසා වියළි කලාපය තුළ පිහිටි ඉතා වැදගත් ජල පෝෂක කලාපයක් ලෙස රිටිගල හැඳින්විය හැකි ය. භූ විද්‍යාත්මකව සලකා බැලූ කල රිටිගල කඳු වැටිය පිහිටා ඇත්තේ උස්බිම්/කොන්ඩලයිට් ශ්‍රේණියත් (Highland/ Khondalite Series), විජයානු ශ්‍රේණියේ (Vijayan Series) වූ වන්නි සංකීර්ණයත් (Wanni Complex) අතර පිහිටි සංක්‍රාන්ති කලාපය තුළ ය. මෙම කඳුවැටිය නිර්මාණය වී ඇත්තේ ප්‍රාග්-කේම්බ්‍රීය (Pre-Cambrian) සම්භවයක් දරන පාෂාණවලිනි.






රූපය 438 (වම) සහ 439 (දකුණ). වසර දසදහස් ගණනක භූ බාදනය වීමේ ප්‍රතිඵලයකින් නිර්මාණය වූ රිටිගල කඳුවැටිය (ඡායාරූපය: මාධව බොතේජු)

ශ්‍රී ලංකාවේ සමස්ත වියළි කලාපයටම පොදු වූ නිවර්තන වියළි උණුසුම් දේශගුණයක පහස රිටිගල කඳුවැටියට ලැබෙනු ඇත. වසර මුළුල්ලේම පාහේ දැඩි උණුසුම් දේශගුණික තත්ත්වයක් පවතින අතර සෙන්ටිග්‍රේඩ් අංශක 27.3 ක් වූ සාමාන්‍ය අගයක් දරන උෂ්ණත්වයක් මේ කඳුවැටියට ලැබේ. ඔක්තෝබර් සිට ජනවාරි දක්වා ඇදහැලෙන ඊසානදිග මෝසමෙන් ලැබෙන ප්‍රධාන වර්ෂාපතනය හැරුණු විට මැයි සිට සැප්තැම්බර් දක්වා ඇදහැලෙන උණුසුම් නිරිතදිග මෝසමෙන් ලැබෙන සුළං ප්‍රවාහය මඟින් මෙම කඳුවැටියට වියළි තත්ත්වයක් ගෙන දේ. මෙම මෝසම් සමයේදී හමන සුළං ප්‍රවාහයේ බලපෑම නිසා රිටිගල වසා පැතිර ඇති වන වැස්ම තෙතමනය නොමැතිකමින් දැඩි පීඩාවට ලක් වේ. වර්ෂාපතනයේ උච්චතම කාලවකවානුව ලෙස අප්‍රේල් සිට මැයි අතර වූ කාලයත් සහ ඔක්තෝබර් සිට නොවැම්බර් අතර වූ කාලයත් සඳහන් කළ හැකි ය. වසරකට මිලිමීටර් 1470-1500 ක වර්ෂාපතනයක් මෙම කඳුවැටියට පතිත වන අතර එහි වාර්ෂික සාපේක්ෂ ආර්ද්‍රතාවය 60% හා 90% ක් වේ.



රිටිගල කඳුවැටිය ජෛවවිවිධත්වයෙන් අනූන වියළි කලාපය තුළ පිහිටි සුවිශේෂී පාරිසරික දූපතක් ලෙස ප්‍රචලිත වීමට බොහෝ කලකට පෙර මෙහි අනුරාධපුර යුගයේ සිටම බෞද්ධ භික්ෂූන් වැඩ හිඳ ඇත. ආරාම සංකීර්ණයන්ගෙන් අනූන රිටිගල වනවාසී භික්ෂූන්හට වැඩ වාසය කිරීමට අත්‍යාවශ්‍ය සක්මන් මළු, පොකුණු, පෙත් මං, පියගැටපෙළ ඇතුළු සියලුම අංගෝපාංගයන්ගෙන් සමන්විත වේ. (රූප 440, 441 සහ 442).

රූපය 440. රිටිගල කඳුවැටියේ වූ අනුරාධපුර යුගයට අයත් භික්ෂූන් වැඩසිටි ගොඩනැගිලිවල නටබුන්
(ඡායාරූපය: විමුක්ති වීරතුංග)






රූපය 441 සහ 442. භික්ෂූන් වෙනුවෙන් ගල් අතුරා සකස් කරන ලද පෙත් මං සහ පියගැට පෙළ (ඡායාරූප: මාධව බොතේජු)


රිටිගල දැඩි ස්වාභාවික රක්ෂිතය තුළ පිහිටි ස්වාභාවික ගහ කොළ වර්ග

මෙම කඳුවැටිය ආශ්‍රිතව පිහිටි ස්වාභාවික ගහ කොළ වර්ග 5 ක් හඳුනාගැනීමට මෙහි පර්යේෂණ සිදුකළ උද්භිද විද්‍යාඥයින් හා පරිසර විද්‍යාඥයින් සමත්ව ඇත. ඒවා පහත දැක්වෙන අයුරු වේ.

1. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර
2. මිනිස් පහස නිසා බාධාවට ලක් වූ (disturbed) වියළි-මිශ්‍ර සදාහරිත වනාන්තර
3. උසින් අඩු වනාන්තර (short-stature forest)
4. ගල් හා ගල් තලා සමඟ වූ ස්වාභාවික ගහ කොළ (vegetation associated with rock outcrops)
5. පඳුරු වනාන්තර (scrub)

1. **වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර** (රූපය 443): මනා වර්ධනයක් දැකිය හැකි මෙම වනාන්තරවල වූ ගස් කිසිවිටෙකත් මීටර් 30 ඉක්මවනු නොලැබේ. සමීපව ඇහිරුණු උස් ගස්වලින් සමන්විත මෙම වනාන්තරවල තුරු වියනක් නිර්මාණය වී ඇත (රූපය 444). මේ වනාන්තර බාධා නොවූ වනාන්තර ලෙස පිළිගැනෙන අතර මෙහි වියන ස්ථරයක් මෙන්ම නෙරු ස්ථරයක් ද පිහිටයි. සමස්ත රිටිගල වනයේ 64.9% ක් වසා පැතිර ඇත්තේ මෙම වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර වර්ගයෙනි. මෙම වනයේ නෙරු ස්ථරය නිර්මාණය කරනුයේ *Pterygota thwaitesii* හා නිගුණ






රූපය 444. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තරයේ වියන ස්ථරය (ඡායාරූපය: මාධව බොතේජු)

රූපය 443. වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර (ඡායාරූපය: මාධව බොතේජු)

(*Tetrameles nudiflora*) යන ගස් විශේෂයන් ය. වියන ස්ථරය නිර්මාණය වනුයේ පහත දැක්වෙන ගස් විශේෂයන්ගෙනි. එනම්, ගල් සියඹලා (*Dialium ovoideum*), මොර (*Dimocarpus longan*), කළු වැල්ල (*Diospyros affinis*), කළු කඩුම්බේරිය (*Diospyros oocarpa*), වීර (*Drypetes sepiaria*), ඇටඹ (*Mangifera zeylanica*), දිය නා (*Mesua ferrea*), තම්මැන්න (*Mischodon zeylanicus*), *Xylopia nigricans* සහ *Madhuka clavata* යන විශේෂයන්ගෙන් ය. මෙම වියළි මිශ්‍ර සදාහරිත වනයේ යටි වගාව නියෝජනය කරන ශාක අතර වැලිවැන්න (*Dimorphocalyx glabellus*), *Glycosmis mauritiana*, *Mallotus rhamnifolius*, *Mitrephora heyneana*, උල් කෙන්ද (*Polyalthia korinti*) සහ ගොං ගොටු (*Streblus taxoides*) යන විශේෂ දැක්විය හැකි ය.

2. බාධාවට ලක්වූ වියළි-මිශ්‍ර සදාහරිත වනාන්තර (රූප 445 සහ 446): මානව ක්‍රියාකාරකම් හේතුවෙන් බාධාවට ලක්වූ හෙවත්, හායනයට ලක්වූ ද්විතියික වනය මීට ඇතුළත් ය. එහි තුරු ලතා ඉහත විස්තර කළ වියළි මිශ්‍ර සදාහරිත වනාන්තරයට වඩා වෙනස් වේ. පහත දැක්වෙනුයේ බාධාවට ලක් වූ එම වනාන්තරයේ ඇති ගස් කොළන් විශේෂයන්ය. මේ අතරින් වියන ස්ථරය දක්වා වැඩෙන ගස් වනුයේ කොහොඹ (*Azadirachta indica*), වීර (*Drypetes sepiaria*), *Grewia helicterifolia*, කෙන්ද (*Macaranga peltata*) සහ වෙලං (*Pterospermum suberifolium*) ය. මෙහි යටි වගාවේ වූ ශාක විශේෂ වනුයේ *Mallotus rhamnifolius*, වැලි කහ (*Memecylon capitellatum*), කුරටිය (*Phyllanthus polyphyllus*), උල් කෙන්ද (*Polyalthia korinti*), භූ සේරු (*Premna tomentosa*), බූනෙළු (*Stenosiphonium cordifolium*), වැලිවැන්න (*Dimorphocalyx glabellus*) සහ *Glycosmis mauritiana* ය. මෙම බාධාවට ලක්වූ වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර සමස්ත රිටිගල වනාන්තරයෙන් 10.4% ක් පුරා පැතිර ඇත.



රූපය 445 (වම) සහ 446 (දකුණ). බාධාවට ලක් වූ වියළි-මිශ්‍ර සදාහරිත වනාන්තර (ඡායාරූප: මාධව බොත්ජු)


3. උසින් අඩු වනාන්තර හෙවත් කුරු වනාන්තර: මෙම වනාන්තර ඉතා විශේෂිත සහ අද්විතීය වන වර්ගයකි. රිටිගල කඳුවැටිය මුදුනේ වැටිය ඔස්සේ මේ වනාන්තර පිහිටා ඇති අතර එහි වූ ගස් උස් වන්නේ බිම සිට මීටර් 2-3 ක් දක්වා පමණි. කඳු මුදුන්වල නිතරම පාහේ වළාකුළු ගැටෙන බැවින් මෙම උසින් අඩු වනාන්තර ආශ්‍රිතව ඉහළ ආර්ද්‍රතාවයක් පවතී. මේ හේතුව නිසාම මෙහි වසරේ වැඩි කාලයක් ජල වාෂ්ප සනීභවනය වීම සිදුවේ. එමෙන්ම මෙම කඳුවැටියේ පහත් පෙදෙස්වල දැඩි වියළි කාලගුණයක් හෝ නියඟය පවතින සමයේදී පවා කුරු වනාන්තර ආශ්‍රිතව මනා ආර්ද්‍රතාවයක් පවතී. ඉහළ ආර්ද්‍රතාවය නිසා අඩු උෂ්ණත්වයක් ද පවතින බැවින් මෙම උසින් අඩු වනාන්තර ආශ්‍රිතව වඩාත් සුවිශේෂී ශාක ප්‍රජාවක් ස්ථාපිත වී ඇත. මේ සුවිශේෂී ක්ෂුද්‍ර දේශගුණික (microclimate) තත්ත්වයේ වූ වනාන්තරවල පැහැදිලි විශේෂත්වය වනුයේ උප කඳුකර (sub-montane) හා කඳුකර

ශාක විශේෂ පිහිටීමයි. රිටිගල කඳු මුදුනේ වැටිය ඔස්සේ පිහිටි මෙම වනාන්තරවල වූ ගස් දැඩි සුළඟට ඔරොත්තුදීමේ හැකියාව ඇති අතර ඒවා උසින් අඩු වීමට එම සාධකයම හේතු වී ඇත (රූපය 447). කඳු මුදුනේ වූ මෙම ශාක ප්‍රජාව රූපාකාරයෙන් ඊට වඩා බොහෝ ඈතින් පිහිටි මධ්‍යම කඳුකරයේ හා නකල්ස් හෙවත් දුම්බර කඳුවැටියේ මුදුනේ වූ කුරු වනාන්තරවලට වඩාත් සමාන වේ. ශ්‍රී ලංකාවේ කඳු මත පිහිටි වන ආවරණයන් පිළිබඳ අධ්‍යයන්හි යෙදුණු ඒ පිළිබඳ ප්‍රවීණයෙකු වූ ආචාර්ය සුරන්ජන් ප්‍රනාන්දු අප වෙත දැක්වූ අදහස් අනුව, රිටිගල කඳු මුදුනේ වූ මෙම උසින් අඩු ගස් මත වැවෙන උඩවැඩියා ආදි අපිශාක බොහෝ දුරට තෙත් කලාපයේ වූ විශේෂයන් වේ. මෙම උසින් අඩු වනයේ වූ ශාක විශේෂ වනුයේ අංකෙන්ද (*Acronychia pedunculata*), *Ardisia missionis*, *Cleistanthus patulus*, කුණුමැල්ල (*Diospyros ovalifolia*), දික්වැන්න (*Diplodiscus verucosus*), *Eugenia rotundata*, වල් කෝපි (*Lasianthus strigosus*), වැලි කහ (*Memecylon capitellatum*), *Mitrephora heyneana*, දවුල් කුරුඳු (*Neolitsea cassia*), උල් කෙන්ද (*Polyalthia korinti*), *Psychotria nigra*, වෙලං (*Pterospermum suberifolium*), *Suregarda lanceolata* සහ යකඩ මරං (*Syzygium zeylanicum*) ය. මෙම උසින් අඩු වනාන්තර හෙවත් කුරු වනාන්තර සමස්ත රිටිගල වනාන්තරයෙන් 6.3% ක ප්‍රදේශයක් පුරා පැතිර ඇත.



රූපය 447. රිටිගල කඳුවැටිය මුදුනේ උසින් අඩු වනාන්තර පිහිටයි (ඡායාරූපය: සම්පත් ගුණතිලක)

4. ගල් හා ගල් තලා සමඟ වූ ස්වාභාවික ගහ කොළ (රූපය 448): ගල් හා ගල් තලා සමඟ වූ ස්වාභාවික ශාක ප්‍රජාව සමස්ත අනුරාධපුර ප්‍රදේශයේ මෙන්ම රිටිගල කඳුවැටියේ ද සුලබ වේ. සමස්ත කඳුවැටියෙන් 12.6 % පුරා පැතිර ඇත්තේ මෙම ශාක ප්‍රජාව යි. මෙහි වූ ගස් අතර සිවිය ගස් (*Commiphora caudata*), *Ficus arnottiana* (ඇසටු විශේෂයකි), අරළු (*Ficus mollis*), *Givotia moluccana*, හික් (*Lannea coromandelica*), *Memecylon petiolatum*, දළුක් (*Euphorbia antiquorum*), *Bambusa bambos*, *Sapium insigne* සහ *Wrightia angustifolia* යන විශේෂ ප්‍රමුඛත්වයක් දරයි. මෙහි පඳුරු විශේෂ වනුයේ හීන් තඹල (*Carmona retusa*), *Croton laccifer*, *Mundulea sericea*, බෝ කැර (*Ochna lanceolata*), බෝවිටියා (*Osbeckia aspera*) සහ *Cassipourea ceylanica* ය.



රූපය 448. ගල් හා ගල් තලා සමඟ වූ ස්වාභාවික ගහ කොළ (ඡායාරූපය: මාධව බොතේජු)

5. පඳුරු වනාන්තර (රූපය 449): ශ්‍රී ලංකාවේ සමස්ත වියළි කලාපයේම ලඳු කැලෑ ඇතිවීමට මූලික වූයේ හේන් වගාවයි. ගැමියන් වනාන්තර කපා හෙළා පුළුස්සා හේන් වගාව සිදුකිරීමෙන් අනතුරුව එය අතහැර දැමීම එකල පැවති පුරුද්ද වේ. මෙසේ අතහැර දමන ලද හේන් ඉතා සුළු කාලයකදී ලඳු කැලෑවක් බවට පත්වන අතර මේවා සමස්ත අනුරාධපුර කලාපයේ ද බොහෝ ලෙස සුලබ ය. මෙහි ලඳු කැලෑවල වූ ශාක පඳුරු විශාල වශයෙන් සඳහන් කළ හැකි වුවද පහත දක්වා ඇත්තේ රිටිගල කඳුවැටිය ආශ්‍රිතව ඇති පඳුරු වනාන්තරවලින් වාර්තා වී ඇති ශාක විශේෂයන් ය. ඒවා නම්, කොහොඹ (*Azadirachta indica*), මයිල (*Bauhinia racemosa*), හීන් කරඹ (*Carissa spinarum*), කුකුරුමාන් (*Catunaregam spinosa*), අන්දර (*Dichrostachys cinerea*), හීන් කටුපිල (*Flueggea leucopyrus*), *Gmelina asiatica*, වැල් කෙලිය (*Grewia orientalis*), *Hugonia mystax*, *Ichnocarpus frutescens*, ගඳපාන (*Lantana camara*), දිවුල් (*Limonia acidissima*), කොරකහ (*Memecylon umbellatum*), කුරටිය (*Phyllanthus polyphyllus*), *Scutia myrtina*, මාදං (*Syzygium cumini*), *Toddalia asiatica* සහ හීන් එරමිණියා (*Ziziphus oenoplia*) ලෙස දැක්විය හැකි ය. කාලයාගේ ඇවෑමෙන් මෙම ලඳු කැලෑවල විශාල ගස් පැළවන අතර තවත් කාලයක් ගතවීමෙන් අනතුරුව ඒවා මහා කැලෑ බවට පත්වේ. රිටිගල කඳුවැටියේ පඳුරු ගහන ලඳු කැලෑ 5.8 % ක ප්‍රදේශයක් පුරා පැතිර ඇත.



රූපය **449.** පඳුරු වනාන්තර (ඡායාරූපය: මාධව බොතේජු)

සමස්ත වියළි කලාපයේ මෙන්ම රිටිගල කඳු වැටියේ ද තෘණබිම් (grasslands) පිහිටයි (රූපය 450). මෙම තෘණබිම් වියළි සමයේ හා නියං සමයේ දී මිනිසුන් විසින් ගිනිතබනු ලබන බැවින් ඒවා දීර්ඝ කාලයක් තිස්සේ තෘණ බිම් වශයෙන්ම පවතී. රිටිගල කඳුවැටියේ ඉහත දක්වන ලද ස්වාභාවික ගහ කොළ වර්ග සමඟ සම්මිශ්‍රව තෘණබිම් පිහිටන අතර එම කඳුවැටියේ පහත් පෙදෙස්වල ද, ඒ අසල වූ තලගුරු වෙහෙර කන්දේ ද ඒවා මනා ලෙස පැතිරී ඇත (රූපය 451). මෙම තෘණබිම් බොහෝ කුරුල්ලන්ටත්, කෘන්තක මීයන් ඇතුළු කුඩා ක්ෂීරපායීන්ටත්, කුර සහිත සතුන්ටත් පෝෂක බිම් මෙන්ම ඔවුන්ට ජීවත් වීමට සුදුසු වාසස්ථාන ද වනු ඇත.



රූපය 450. තෘණබිම් (ඡායාරූපය: මාධව බොතේජු)



රූපය 451. රිටිගල කන්ද අසල වූ තලගුරු වෙහෙර කන්දේ තෘණ බිම් (ඡායාරූපය: තිලංක සිරිවර්ධන)

රිටිගල කඳුවැටියේ ආවේණික ගස් වැල් සහ සතුන්


මෙම ග්‍රන්ථයේ ඉහත විස්තර කොට ඇති පරිච්ඡේදවල අනුරාධපුර ප්‍රදේශයේ වාර්තා වන ජීවීන් පිළිබඳ විස්තර ඉදිරිපත් කොට ඇත. එසේ වුවද මෙහිදී අප විසින් පාඨක ඔබට රිටිගල කඳුවැටියේ වාසය කරන ආවේණික සතුන් හා ගස් කොළන් කිහිපයක් පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු. පහත විස්තර කෙරෙන ශ්‍රී ලංකාවට ආවේණික ජීවීන්ගෙන් සමහරක් රිටිගල කඳු වැටියට පමණක් සීමා වී තිබීම ජීවීන්ගේ ව්‍යාප්තිය තුළ බොහෝ වැදගත් සාධකයක් වනු ඇත. වියළි කලාපයේ පිහිටි රිටිගල කඳුවැටිය වසර දහස් ගණනක් තෙත් කලාපය සමඟ හුදෙකලාව පැවතීමේ හේතුවක් ලෙස රිටිගලටම ආවේණික වූ ජීවීන් පරිණාමය වන්නට හේතුවී ඇති බැව් සරලව අර්ථ දැක්විය හැකි ය [ඉතා සුවිශේෂී කලාපයකට වෙන් වූ ආවේණික ජීවීන් (point endemic) සතුන් සහ ගහකොළ යනුවෙන් පරිසර විද්‍යාඥයන් විසින් විස්තර කෙරේ]. වන ජීවී සංරක්ෂණ ක්‍රියාවලිය තුළ මෙම සුළු පරිසරයකට පමණක් සීමා වූ ආවේණික ජීවීන් කෙරෙහි අපගේ අවධානය දැඩි ලෙස යොමු කළ යුතුව ඇත. එයට හේතු වනුයේ එම ජීවීන් ඔවුන් වාසය කරන නිකේතන විනාශ වූ කල ඉතා ඉක්මනින් වඳ වීමට භාජනය වන බැවිනි. රිටිගල වනයට සීමා වූ ආවේණික ගස් කොළන් අතර රිටිගල මී (*Madhuca clavata*), රිටිගල නෙළු (*Strobilanthes willisii*) සහ *Coleus elongates*, *Thunbergia fragyans* var. *parviflora* සඳහන් කළ හැකි ය.

තෙත් කලාපීය වැසිවනාන්තරවාසී *Acavus* ගනයට අයත් *Acavus phoenix castaneus* නම් ගොළුබෙලි උප විශේෂය (රූපය 192) රිටිගල කඳුවැටියෙන් වාර්තාවන අපෘෂ්ඨවංශී සතුන් අතරින් විශේෂයෙන් සඳහන් කළ හැකි ජීවියෙකි. තෙත් කලාපීය පරිසරයට දැඩි සංවේදීතාවයක් දක්වන මෙම ගස් ගොළුබෙල්ලන් වියළි කලාපය තුළ පිහිටි රිටිගල කන්දෙන් වාර්තාවීම ජීවීන්ගේ ව්‍යාප්තිය පිළිබඳ [විෂය රාමුව] තුළ දීර්ඝ ලෙස සාකච්ඡා කළ හැකි තේමාවක් වනු ඇත.

රිටිගලටම ආවේණික වූ පෘෂ්ඨවංශී සතුන් අතර රිටිගල දිවාසැරි හූනා (*Cnemaspis retigalensis*) විශේෂයෙන් සඳහන් කළ හැකි ය. මෙම කඳුවැටියේ වසන අනෙකුත් ආවේණික සතුන් අතර දම් කොළ පෙතියා (*Dawkinsia singhala*), තිත් පෙතියා (*Pethia melanomaculata*), රජරට පඳුරු මැඩියා (*Pseudophilautus regius*), වක රැලි දිය මැඩියා (*Lankanectes corrugatus*) (රූපය 452),

කුඩා දිවාසැරි හූනා (*Cnemaspis podihuna*), අල්විස්ගේ දිවාසැරි හූනා (*Cnemaspis alwisi*), මහ හාලි හූනා (*Cyrtodactylus fraenatus*), ලපවන් වක නිය හූනා (*Geckoella yakhuna*), වියළි පිනුම් කටුස්සා (*Otocryptis nigristigma*), සිවුරුහඬලන කටුස්සා (*Calotes liolepis*), තොල-විසිතුරු කටුස්සා (*Calotes ceylonensis*), ස්මිත්ගේ සර්පහීරළුවා (*Nessia bipes*), ඩෙයිග්නාන්ගේ ලක් හීරළුවා (*Lankascincus deignani*), සුලබ ලක් හීරළුවා (*Lankascincus fallax*), පොළොංතෙලිස්සා (*Hypnale nepa*), ශ්‍රී ලංකා කළු වඳුරා (*Semnopithecus vetulus*), ශ්‍රී ලංකා රිළවා (*Macaca sinica*), ශ්‍රී ලංකා මීමින්නා (*Moschiola meminna*), ශ්‍රී ලංකා මූකලං ලේනා (*Funambulus layardi*), ශ්‍රී ලංකා හබන්-කුකුළා (*Galloperdix bicalcarata*), ශ්‍රී ලංකා වළි කුකුළා (*Gallus lafayetii*) හා ශ්‍රී ලංකා අළු-කෑදැත්තා (*Ocyceros gingalensis*) යන සත්ත්ව විශේෂ සඳහන් කළ හැකි ය. ඉහත විශේෂ අතරින් වක රැලි දිය මැඩියා ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ මූලික වශයෙන් ව්‍යාප්තව ඇති විශේෂයකි. එසේ වුවද මෙම මැඩියා රිටිගලින් වාර්තාවීම ශ්‍රී ලංකාවේ සත්ත්ව ව්‍යාප්ති රටාවේ කැපී පෙනෙන සාධකයකි. මෙම මැඩියන් මනා ලෙස තුරු වියන දරන පරිසරයන්හි සෙමෙන් ගලන දිය කඩිතිවල වාසය කරයි. මෙවැනි දියකඩිතිවල වූ දිරා යන කොළරොඩු අතර සැඟවී ජල පෘෂ්ඨයට ආසන්නයේම හිඳ හඬ නගයි. මෙම ආවේණික සතුන්ට අමතරව ඉහත පරිච්ඡේදවල විස්තර කරන ලද සත්ත්ව කාණ්ඩයන්ට අයත් සත්ත්ව විශේෂ රිටිගල වනයෙන් ද වාර්තා වන බැව් සඳහන් කළ යුතුය.

රිටිගල කඳුවැටියේ ශාක ප්‍රජාව පැතිරීමේ රටාව තීරණය වී ඇත්තේ එහි උන්නතාංශය අනුව ය. ඉහත විස්තර කරන ලද ආවේණික ජීවීන්ගෙන් බහුතරය කඳු වැටියේ ඉහළ කලාපයටත්, කඳු මුදුනටත් සීමා වී ඇත. ඇතැම් විශේෂ ඒ ඒ උන්නතාංශවල පැතිරීමට බොහෝ සංවේදීතාවයක් ඇති බැව් පෙනේ. වියළි කලාපීයවාසී ජීවීන් බහුලවම ව්‍යාප්තව ඇත්තේ මෙම කඳුවැටියේ පහත් මට්ටමේ වූ ශාක ප්‍රජාවේ ය.



රූපය 452. වක රැලි දිය මැඩියා (***Lankanectes corrugatus***)
(ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

අනුරාධපුරයේ මුල් පදිංචිකරුවන්

නූතන මිනිසා ශ්‍රී ලංකාවට පැමිණීම

අනුරාධපුරයේ මුල් පදිංචිකරුවන් කවරහුද යන ගැටලුවට පිළිතුරු සෙවීම තරමක සංකීර්ණ කර්තව්‍යයක් විය හැකි ය. එසේ වුවද මෙරට මුල්ම පදිංචිකරුවන් කොහි සිට කවදා පැමිණියේද? කුමන ආකාරයේ ශාරීරික හැඩරුව දැරූවන්ද? හා ඔවුන් කුමන ආකාරයේ සංස්කෘතික ලක්ෂණ උරුම කරගෙන සිටියේද? යනාදී ගැටලුවලට පිළිතුරු ලෙස මේ වන විටද ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාඥයින් බොහෝ කරුණු ගොනු කොටගෙන ඇත. ඊට අමතරව නූතන මානවයා හෙවත් *Homo sapiens* නැගෙනහිර අප්‍රිකාවේදී පරිණාමය වී ඉන් අනතුරුව ලොව දසත පැතිරීමේ න්‍යාය හෙවත් 'අප්‍රිකාවෙන් නික්ම යාමේ න්‍යාය' (out-of-Africa theory) මඟින් ද ආසියාවට පැමිණි මුල්ම නූතන මානවයින් පිළිබඳ විස්තර ඉදිරිපත් කොට ඇත. මේ සමස්ත සිදුවීම් ජාලය සලකා බැලීම තුළින් පමණි අනුරාධපුරයට පැමිණි මුල්ම මිනිසුන් පිළිබඳ කරුණු ගොනු කළ හැක්කේ. අප මෙතැන් සිට උත්සාහ කරනුයේ යම් පමණකට අසම්පූර්ණ වුවද මේ වන තෙක් අනාවරණය කොටගත් ශ්‍රී ලංකාවේ මුල් මානවයින් පිළිබඳ තොරතුරු පෙළ ගෙනහැර දැක්වීමට ය.

වසර 2011 දී යාපනය අර්ධද්වීපයෙන් හමුවූ ප්‍රමාණයෙන් විශාල ශිලා මෙවලම් (මේ අතරින් ඇතැම් මෙවලම් සෙන්ටිමීටර් 20 ක් පමණ දිගැතිය) පිළිබඳ හෙළිවුණු තොරතුරු හේතුවෙන් ශ්‍රී ලංකාවේ ශිලා යුගයේ නව පිටුවක් පෙරළී ප්‍රාග් ඓතිහාසික යුගය තවත් වසර ලක්ෂ කිහිපයක් ඈත අතීතයට විහිදෙන ලකුණු පහළ විය. යාපනය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පුෂ්පරත්නම් හා මහාචාර්ය ක්‍රිෂ්ණරාජා යන විද්වතුන් මෙම මෙවලම් එකතු කොට ඇත. මේවා වැඩිදුරටත් පරීක්ෂා කළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වූ ආචාර්ය සිරාන් දැරණියගල හා එම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ ආචාර්ය නිමල් පෙරේරා යන ප්‍රාග් ඓතිහාසික විද්වතුන් මෙම මෙවලම්වල වූ තාක්ෂණික ලක්ෂණ ආධාර කරගනිමින් කාලනීර්ණය කළහ. ආචාර්ය සිරාන් දැරණියගලගේත්, ආචාර්ය නිමල් පෙරේරාගේත් මතය වූයේ මෙම මෙවලම් අදින් වසර ලක්ෂ 6 ක් තරම්වත් පැරණි විය හැකි බවත්, බොහෝ විට අදින් වසර ලක්ෂ 18 ක් පමණ තෙක්ද ඈත අතීතයට විහිදිය හැකි බවත් ය. මේ මෙවලම් ශිලා යුගයට අයත් පැරණිතම අවධිය හෙවත් පහළ පූර්ව ශිලා යුගයට (lower Paleolithic) අයත් වන බැව් එහි වූ රූපවිද්‍යාත්මක ලක්ෂණ අනුව නිගමනය කෙරිණි. එම මෙවලම්වල වූ මූලික හැඩයන් හා ප්‍රමාණයන් සලකා බැලූ කල ඒවා නිපදවා ඇත්තේ *Homo erectus* මානවයා විසින් බැව් අනුමාන කළ හැකි ය. යාපන අර්ධද්වීපයෙන් හමුවූ මේ ශිලා මෙවලම් පොළොව මතුපිට තිබී සොයා ගන්නා ලද නිසා විද්‍යාත්මක කාලනීර්ණ ක්‍රමවේදයකට අනුව කාලනීර්ණය සිදුකිරීම අපහසු ය. එමෙන්ම එම මානවයාට අයත් ෆොසිල හෝ වෙනයම් ජීවවිද්‍යාත්මක සාධක කිසිවක් මේ වන තෙක් දිවයිනෙන් හමුවී නොමැති නිසා ස්ථිර වශයෙන්ම *Homo erectus* ශ්‍රී ලංකාවේ වාසය කළ බව ප්‍රකාශ කිරීම තරමක් අපහසු ය (අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).

මෙතැන් සිට අප උත්සාහ දරනුයේ නූතන මානවයා ලෙස පිළිගැනෙන *Homo sapiens* මෙම දිවයිනට පැමිණීමේ කතාන්දරය සංක්ෂිප්තව ඉදිරිපත් කිරීමට ය. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අංශයේ පෝල් මෙලර්ස් (Paul Mellars) නූතන මිනිසා අප්‍රිකාවෙන් නික්මයාමේ න්‍යාය පිළිබඳ විශේෂඥයෙකි. වසර 2006 දී *Science* නම් ලොව ප්‍රචලිත විද්‍යා ප්‍රකාශනයට සපයන ලද ශාස්ත්‍රීය ලිපිය මෙම න්‍යාය පිළිබඳ ලියැවුණු අග්‍රගණ්‍ය වාර්තාවකි (Mellars, 2006). නූතන මානවයා ලොව පහළ වූයේ

මෑත ප්ලයිස්ටොසීන අවධියේ (late Pleistocene) අදින් වසර 1,50,000 කට පමණ පෙර නොහොත්, ඇතැම් මත අනුව අදින් වසර 2,00,000-2,60,000 අතර කාලයකදී නැගෙනහිර අප්‍රිකාවේදී ය (Cameron & Groves, 2004). අප්‍රිකානු මහාද්වීපය තුළම වසර ලක්ෂයකට ආසන්න කාලයක් ගතකළ මෙම මානවයා ඉන් අනතුරුව අදින් වසර 50,000 කට ඉහතදී අප්‍රිකාවේ ඊසාන පෙදෙසේ වූ රතු මුහුදු මුව දොරට උතුරින් අරාබියට සහ දකුණු ආසියාවට සංක්‍රමණය විය (Mellars, 2006; Bulbeck, 2007; මනමේන්ද්‍ර-ආරච්චි, 2012). මෙම න්‍යායට අනුව නූතන මානවයා ආසියාවටත්, ඉන් අනතුරුව ශ්‍රී ලංකාවටත් පැමිණ ඇත්තේ දළ වශයෙන් අදින් වසර 50,000 කට පෙරදී ය. එවකට ගෝලීය මුහුදු මට්ටම වර්තමානයට වඩා පහත් මට්ටමක පැවති බැවින් ඔවුන් වෙරළ තීරය දිගේ ඉන්දියානු ගොඩබිම මතින් මෙම දිවයිනට පැමිණ ඇත. මෙරටට පැමිණි මෙම මුල්ම මිනිසුන් රට මැද වූ වනාන්තර ජීවිතයට වඩා මනා ආරක්ෂාව ඇති, ආහාර බහුල වෙරළබඩ කලාපයේ මුලින්ම පදිංචි වන්නට ඇත. ඉහත මතයට පරිබාහිර අදහස් පළකරන ආචාර්ය සිරාන් දැරණියගලගේ මතය වනුයේ අදින් වසර 1,25,000 කට හෝ ඊට ප්‍රථම නූතන මානවයා මෙම දිවයිනට පැමිණි බවයි. ඔහු විසින් බුන්දල පතිරාජවෙල (රූපය 453) පෙදෙසේ වෙරළ අද්දර කළ ගවේෂණ හා කැණීම්වල ප්‍රතිඵල අනුව අදින් වසර 1,25,000 ක් පැරණි එම මෙවලම් නූතන මානවයාට අයත් බැව් ස්ථිර වශයෙන් ප්‍රකාශ කොට ඇත. එපමණක් ද නොව ශ්‍රී ලංකාවේ මෙතෙක් හමුවී ඇති කාලනීර්ණය නොකරන ලද මෙවලම්වල ඉතිහාසය අදින් වසර 5,00,000 තරම් ඈතට විහිදිය හැකි බැව් දැරණියගලගේ මතය වේ. ඉහත දක්වන ලද්දේ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ බොහෝ ඈත අතීතයට අයත් තොරතුරු ය. එසේ වුවද අනුරාධපුරයේ ඇතුල් නුවර පසුගිය දශක 4 ක කාලය තුළ කළ පුරාවිද්‍යාත්මක පර්යේෂණ කැණීම් අනුව සනාථ වී ඇත්තේ එහි පදිංචි වූ මුල්ම මිනිසුන් 'බලංගොඩ මානවයා' බව ය (Deraniyagala, 1992; Deraniyagala, 2007). මෙතැන් සිට අප සාකච්ඡා කරනුයේ පුරාවිද්‍යාත්මක සාධක හා කාලනීර්ණයන් මත අනාවරණය කරගත් අනුරාධපුර ප්‍රදේශයට අදාළ එම ඉතිහාසය පිළිබඳව ය.




රූපය 453. මධ්‍ය පූර්ව ශිලා යුගයට අයත් ශිලා මෙවලම් හමුවන බුන්දල පතිරාජවෙල (ඡායාරූපය: කැමී මනමේන්ද්‍ර-ආරච්චි)


ප්‍රාග් ඓතිහාසික යුගය


අනුරාධපුර ඇතුල් නුවර (ගෙඩිගේ AG-85) කරන ලද කැණීම් ප්‍රතිඵල අනුව පැහැදිලි වනුයේ අනුරාධපුර මුල්ම පදිංචිකරුවන් ක්ෂුද්‍ර ශිලා යුගයේ (Microlithic Period) (මධ්‍ය ශිලා යුගය [Mesolithic Period] ලෙස මෙතෙක් භාවිතා කළේ මෙම යුගයට ය. ආචාර්ය සිරාන් දැරණියගලගේ උපදෙස් මත වර්තමාන ලොව භාවිතවන යුග නාමකරණය මෙම ග්‍රන්ථයට ඇතුළත් කරන ලදී) මානවයා හෙවත් බලංගොඩ මානවයා බව ය (රූපය 454). කැණීම් මගින් කළ අංගාර කාලනීර්ණ පරීක්ෂණයන්ට අනුව මෙම පෙදෙසේ අදින් වසර 5850 කට පමණ පෙර එම මානවයින් පදිංචියට පැමිණ හෝ වාසය කොට ඇත. එය සනාථ කරමින් ඔවුන් විසින් නිපදවන ලද ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් ශිලා මෙවලම් එම සන්දර්භවලින් හමුවේ. එසේ වුවද ඔවුන්ගේ අස්ථී, දත් අවශේෂ හෝ සත්ත්ව දඩයමේ කිසිඳු සාක්ෂියක් එම සන්දර්භයේ ශේෂ නොවීම කනගාටුවට කරුණකි. කුර සහිත සතුන් වන වල් ඌරන්, තිත් මුවන්, ගෝනුන්, ඕලු මුවන් හා කුළු හරක් ආදි සතුන්ගේ ගහනයන් මෙම කලාපයේ ඉතා ඉහළ අගයක පවතින බැවින් මේ


පෙදෙසේ යැපීම් ධාරිතාවය (carrying capacity) ද ඒ අනුව බොහෝ ඉහළ තලයක පවතී. මේ නිසා ක්ෂුද්‍ර ශිලා යුගයේ විසූ මානවයාට මෙම පෙදෙසේ දඩයම් සුලබ වන්නට ඇත. ඔවුන් සතුන් දඩයම් කිරීමෙන්, එකතු කිරීමෙන් හා මසුන් බෑමෙන් ජීවත් වූ සංචාරක දිවියක් ගෙවූ ශිලා යුගයේ මානවයින් වේ. අනුරාධපුර ආශ්‍රිත ගල් ලෙන් හා ගල් ආවරණ බොහෝ ඇති බැවින් ඔවුන් එම ගුහා තම වාසස්ථාන කොට ගෙන ජීවත් වූවාට සැකයක් නැත. මේ අතරින් මිහින්තලයේ පිහිටි ගුහා (රූපය 455) මෙන්ම දීඝ පාෂාණය (රූපය 456), වෙස්සගිරිය (රූපය 457), තන්තිරිමලය (රූපය 458) හා බිල්ලෑව (රූපය 459) ආශ්‍රිත වූ ගල් ගුහා ද මීට මනා නිදසුන් ලෙස දැක්විය හැකි ය. මේ කලාපයේ වර්ෂාපතනය විරල බැවින් ඔවුන් බොහෝ දුරට එළිමහන් වාසස්ථානවල ද වාසය කරන්නට ඇත (රූපය 460). එසේ වුවද මෙම ගල් ගුහා ඓතිහාසික සමයේදී බෞද්ධ භික්ෂූන් වෙනුවෙන් පිළිසකර කොට පූජා කර ඇති බැවින් අද එම ප්‍රාග් ඓතිහාසික සාධක බෙහෝ දුරට විනාශ වී ඇත (Deraniyagala, 1992; Deraniyagala, 2007).



රූපය 454. කුරුවිට බටදොඹලෙන වාසය කරන බලංගොඩ මානවයින් (සිතුවම: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)











රූපය 455. රාජගිරි ලෙන, මිහින්තලය පරිශ්‍රය, ඉහළ වම

රූපය 456. දීඝ පාෂාණය, අභයගිරි පරිශ්‍රය, ඉහළ මැද වම

රූපය 457. වෙස්සගිරියේ පිහිටි ගල්ගුහා, ඉහළ මැද දකුණ

රූපය 458. තන්තිරිමලයේ ගල් ආවරණයක්, ඉහළ දකුණ

රූපය 459. බිල්ලෑවේ පිහිටි ගල් ගුහාවක්, පහළ වම (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මෙම ප්‍රාග් ඓතිහාසික සමයේදී වැසි ජලය එක්ව සෑදුණු පතස් හා වගුරු ද, මල්වතු ඔය හා යාන් ඔය ද නිසා ප්‍රාග් ඓතිහාසික මානවයාට ජලය යහමින් තිබෙන්නට ඇතැයි නිශ්චිතවම ප්‍රකාශ කළ හැකි ය. ක්ෂුද්‍ර ශිලා යුගයේ මෙහි වූ පරිසරය පිළිබඳ කරුණු දක්වතොත් එම කාලපරිච්ඡේදයේද සමස්ත කලාපයම වියළි මිශ්‍ර සදාහරිත වනාන්තරවලින් ආවරණය වී තිබුණු බව නොරහසකි. ඒ අනුව මුළු කලාපය පුරාම වනජීවය වර්තමානයට වඩා බොහෝ වෙනස් ස්වරූපයකින් පවතින්නට ඇත. අද දින පූජා නගරය හා මිහින්තලය ආශ්‍රිතව හැළි වඳුරන් හා රිළවුන්ගේ විශාල ගහනයක් දැකිය හැකි වුවද ප්‍රාග් ඓතිහාසික සමයේදී එසේ පැවතුණු බව උපකල්පනය කිරීම සාවද්‍ය වේ. මිහින්තලය හා අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව හැළි වඳුරන් හා රිළවුන්ගේ ගහනය වැඩි වී ඇත්තේ උන්ට ආහාර සුලබ හා විලෝපීයයන් දුලබ මිනිස් වාසස්ථානවල ජීවත් වන නිසා ය. උන් මහා වනාන්තර තුළ



රූපය 460. එළිමහන් වාසස්ථානයක වෙසෙන බලංගොඩ මානවයින්. ඉදිරියෙහි වූ මානවයා ගිලා මෙවලම් තනන අතර ඔහුගේ ආහාරයේ ඉවත ලූ කොටස් විසිරී ඇති අයුරු. දකුණුපස පැතලි ගලක සිදුරු විද තැනූ කිණිහිරයක් ද වටකුරු ගලක් විද තැනූ ගිනි මෙළවීමට භාවිත කළ මෙවලමක් ද වේ (සිතුවම: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ජීවත් වන්නේ නම් රංචුවක් තුළ බොහෝ විට දැකිය හැක්කේ සාමාජිකයින් 10-15 ත් අතර උපරිම සංඛ්‍යාවකි. එසේ වුවද අනුරාධපුර පූජා නගරය හා මිහින්තලය ආදි සංචාරකයින් බහුලව ගැවසෙන, ආහාර සුලබ, ආරක්ෂාව ඇති තැන්හී හැළි වඳුරු හා රිළා රංචුවල සාමාජික සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගනියි. මෙහි ජීවත් වන එක් විශේෂයකට අයත් රංචුවක සාමාජිකයින් 250 ක් ඉක්මවන අවස්ථා සුලභ ය. අප විසින් මෙම පරිච්ඡේදයට හැළි වඳුරන් හා රිළවුන් පිළිබඳ තොරතුරු දක්වන ලද්දේ වර්තමාන පරිසරය හා ප්‍රාග් ඓතිහාසික පරිසරය සැසඳීම සඳහා ය. ප්‍රාග් ඓතිහාසික සමයේ හේන් පැවති බවට සාධක නොමැති වීම නිසා ස්වාභාවික පරිසරය බොහෝ සමතුලිත තත්ත්වයක පවතින්නට ඇති බවට සැකයක් නැත.

අනුරාධපුරයේ මුල් පදිංචිකරුවන් බලංගොඩ මානවයා හෙවත් ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයා බව ඇතුල් නුවර කරන ලද පුරාවිද්‍යාත්මක පර්යේෂණ කැණීම් මඟින් සනාථ වී ඇති බව අපි ඉහත සාකච්ඡා කළෙමු. අප මෙතැන් සිට මූලික වශයෙන් සාකච්ඡා කරනුයේ ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයාගේ කෙටි හා සංක්ෂිප්ත විස්තරයකි. මෙම සාධක බොහෝමයක් අනාවරණය කොට ගෙන ඇත්තේ තෙත් කලාපයේත්, සුළු වශයෙන් අන්තර් හා වියළි කලාපයේත් කරනු ලැබූ පර්යේෂණ කැණීම්වලිනි. මෙහි දැක්වෙන 'බලංගොඩ සංස්කෘතියට' අයත් සමස්ත සාධක අනුරාධපුරයේ ඇතුල් නුවර කැණීමෙන් හමුනොවුවද එම මානවයා කවරෙක්ද යන්න ඔබ හමුවේ තැබීම මෙම පරිච්ඡේදයේ ප්‍රධාන අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සාධක හමුවන තැන්පතු ආකාර තුනකි. එනම්,

තෙත් කලාපයේ රත්නපුර පෙදෙස ආශ්‍රිතව දියළු තැන්පතු (Ratnapura Beds). මෙම තැන්පතුවලින් හමුවන ගිලා මෙවලම් මේ වන විටත් විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව කාලනීර්ණය කොට නොමැති

අතර මේ සමඟ හමුවන සත්ත්ව ෆොසිල නියෝජනය කරන සත්ත්ව විශේෂයන් ඇසුරෙන් එම ශිලා මෙවලම් පසු මධ්‍ය හා මුල් ඉහළ ප්ලයිස්ටොසීනයට අයත් විය හැකි බැව් අනුමාන කළ හැකි ය. 'පොරෝ' ලෙස භාවිත කළ මෙම රළු ශිලා මෙවලම් තිරුවානා හා කහඳ යන පාෂාණවලින් නිපදවා ඇත. මෙම සම්ප්‍රදාය 'රත්නපුර ශිලා කර්මාන්තය' (Ratnapura Indrusty) ලෙස හැඳින්වේ. මැණික් ඉල්ලම් තට්ටුවෙන් (බොරළු තට්ටුව) හමුවන මේ ශිලා මෙවලම් සමඟ වඳවී ගිය හිපොපොටේමස්ගේ (*Hexaprotodon sinhaleyus*) ෆොසිල ද හමුවේ. එම විශේෂය ඉන්දියානු අර්ධද්වීපයේ අදින් වසර 1,25,000 ක් පමණ කාලනීර්ණය වී ඇති සන්දර්භවලින් ද වාර්තා වේ. එමෙන්ම ඌව පළාතේ ලුණුගල අඩාවත්ත නම් ග්‍රාමයේ මැණික් පතලකින් හමුවූ කුඩා රයිනොසිරස් (*Rhinoceros sinhaleyus*) ගේ ෆොසිල තාපසංදීප්තතා ක්‍රමවේදයට අනුව අදින් වසර 80,000 කට (±20,000) කාලනීර්ණය වී ඇත (Deraniyagala, 1992; Deraniyagala, 2004; Manamendra-Arachchi *et al*., 2005; Deraniyagala, 2007). ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාඥයින්ගේ දළ මතයට අනුව රත්නපුර ශිලා කර්මාන්තයට අයත් මෙවලම් ද මෙම වඳවී ගිය සතුන්ගේ ෆොසිල තරම් පැරණි විය හැකි වුවද රත්නපුර දියළු තැන්පතු නැවත තැන්පත් වූ හෙවත් අක්‍රමවත් තැන්පතු ලෙස පිළිගත හැකි සාධක ද වේ. කෙසේ වුවද මෙම නිධි පිළිබඳ විස්තරාත්මක පාංශු විද්‍යාත්මක විශ්ලේෂණයන් කෙරෙන තුරු මේ තැන්පතු මත පදනම්ව කාලනීර්ණය පිළිබඳ නිගමනවලට එළඹීම සුදුසු නොවේ.

වෙරළබඩ ඇලූවියල් බොරැල්ල හා වියළි කලාපයේ අර්ධ ශුෂ්ක පෙදෙස්වල වූ ඉරණමඩු පාංශු සංයුතිය (Iranamadu Formation). බුන්දල පතිරාජවෙල ආශ්‍රිතව කළ කැණීම් මගින් ලද තාපසංදීප්තතා කාලනීර්ණයන් අනුව පතිරාජවෙල අදින් වසර 74,000-64,000 හා 28,000 ලෙස ද, බුන්දල අදින් වසර 28,000 ලෙස ද කාලනීර්ණය වී ඇත. භූ විද්‍යාත්මක සාධක අනුව පතිරාජවෙල හා බුන්දල පිහිටි පාදම් බොරළු ස්තරය අදින් වසර 1,25,000 හා 75,000 දක්වා ඈතට දිවෙන බැව් භූ විද්‍යාත්මක සාධක මත පදනම්ව දැරණියගල විසින් ප්‍රකාශයට පත් කොට ඇත. පුරාවිද්‍යා කාලනීර්ණයන් පිළිබඳ විශේෂඥයෙකු වන ආචාර්ය මොහාන් අබේරත්න 1996 දී මෙම කාලනීර්ණය ඔහුගේ පර්යේෂණ ප්‍රතිඵල අනුව තහවුරු කරන ලදී (Abeyratne, 1996; Deraniyagala, 1992; Deraniyagala, 2007). ආචාර්ය දැරණියගල දක්වන අයුරු නවතම අප්‍රකාශිත රසායනාගාර පර්යේෂණ වාර්තා අනුව එම 1,25,000 කාලනීර්ණය 1,50,000 තරම් ඈතට දින නීර්ණය වී ඇති බව ප්‍රකාශ කරයි (ආචාර්ය දැරණියගල සමඟ කළ සාකච්ඡා, 2014). ආදිතම ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන පිහිටා ඇති ඉරණමඩු පාංශු සංයුතිය නැමැති වෙරළබඩ පිහිටි ඉපැරණි වැලි නිධි සාපේක්ෂ වශයෙන් අදින් වසර 5,00,000 ක් පමණ කාලනීර්ණය කළ හැකි ය. යාල ජාතික වනෝද්‍යානයේ පිහිටි 'මිනිහාගල්කන්දේ' මෙවැනිම වැලි නිධිවල ආදිතම ජනාවාස සාධක හමුවන අතර ඒවා සාපේක්ෂ වශයෙන් අදින් වසර 2,50,000 ක කාලයට කාලනීර්ණය කොට ඇත (Deraniyagala, 1992). අප විසින් කරන ලද මතුපිට ගවේෂණවලදී අරුවක්කාලු හා විල්පත්තු ජාතික වනෝද්‍යානය තුළ තිරුවානා සහ කහඳවලින් නිර්මිත ශිලා මෙවලම් හමුව තිබේ. මේ අතරින් අරුවක්කාලු පෙදෙසින් හමුවන ශිලා මෙවලම් එහි වූ ස්වාභාවික බොරළු තැන්පතු මත තැන්පත් වී ඇත (රූපය 461). මෙම මෙවලම්වල කාලනීර්ණ නිශ්චිත වශයෙන්ම ප්‍රකාශ කිරීම අපහසු බැව් ආචාර්ය සිරාන් දැරණියගල සමඟ අප කළ සාකච්ඡාවලදී පැවසීය.




රූපය 461. කහඳවලින් නිර්මිත ශිලා මෙවලමක්. වයඹදිග ශ්‍රී ලංකාවේ අරුවක්කාලු පෙදෙසේ ස්වාභාවික බොරළු නිධි මතින් හමුව ඇත (ඡායාරූපය: නාලින් පෙරේරා)

පහතරට තෙත් කලාපීය ගුහා: මෙරට ශිලා යුගයේ සාධක බොහෝමයක් හමුවන්නේ මෙම තැන්පතුවලිනි (විවෘත ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථාන කිහිපයක් ද මීට අයත් වේ). විශේෂයෙන්ම තෙත් කලාපයේ සිදු කරන ලද ගුහා කැණීම් මඟින් දළ වශයෙන් අදින් වසර 50,000 ක පමණ ඉතිහාසයක් ගොඩනැගීමට පුරාවිද්‍යාඥයින් සමත්ව ඇත. බුලත්සිංහල ෆාහියන් ලෙන (අදින් වසර 48,000) (මෙතෙක් පැවති 38,000 ක කාලනීර්ණය වෙනුවට 2014 දී කරන ලද නවතම අංගාර කාලනීර්ණයන්ට අනුව එය අදින් වසර 48,000 ක් තරම් ඈතට දිවෙන බැව් ආචාර්ය නිමල් පෙරේරා සමඟ සිදු කළ සාකච්ඡා මඟින් හෙළිවිය), කුරුවිට බටදොඹ ලෙන (අදින් වසර 37,000), කිතුල්ගල බෙලි ලෙන (අදින් වසර 31,000), අත්තනගොඩ අලු ලෙන (අදින් වසර 10,350), අලවල පොත්ගුල් ලෙන (අදින් වසර 14,000), බෙලි ලෙන අතුල (අදින් වසර 8,230), කුරුවිට බටතොට දහයියා ලෙන (අදින් වසර 7,680) ආදි තෙත් කලාපීය ගුහා මෙන්ම අන්තර් කලාපයේ වූ සීගිරිය අසල පොතාන ගුහාව (අදින් වසර 5,800) හා අලිගල ගුහාවත් (අදින් වසර 5,500) එමෙන්ම වියළි කලාපයේ වූ බෙල්ලන්බැඳිපැළැස්ස විවෘත මානව වාසස්ථානයත් (අදින් වසර 12,000) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථාන අතරින් විශේෂයෙන් සඳහන් කළ යුතුව ඇත (Deraniyagala, 1992; Adikari; 1994(a); Adikari; 1994(b) Adikari, 1998; Deraniyagala, 2007; Kourampas *et al.*, 2009; Perera, 2010; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012). එමෙන්ම මේ වන විටත් පශ්චාත් විශ්ලේෂණ කටයුතු සිදු වෙමින් පවතින අන්තර් කලාපයේ බලංගොඩට ආසන්නයේ පිහිටි කුරගල ගුහාවේ ප්‍රාග් ඓතිහාසික තැන්පතු අදින් වසර 16,000කට කාලනීර්ණය වී ඇත (ආචාර්ය නිමල් පෙරේරා සමඟ කළ සාකච්ඡා ඇසුරෙන්, 2014). ක්ෂුද්‍රශිලා යුගයේ නිමාව සනිටුහන් වන කාලනීර්ණ ලැබී ඇත්තේ මාන්තොට පුරාණ වරායෙනි. ඒ අදින් වසර 3800 කි (Deraniyagala, 1992).

දශක හතරකට එපිට කාලයක සිට ඉහත දක්වන ප්‍රාග් ඓතිහාසික වාසස්ථානවල කෙරෙන කැණීම් මඟින් ඔවුන්ගේ ආහාරයේ ශේෂ වූ සත්ත්ව හා ශාක කොටස්, ශිලා මෙවලම්, අස්ථි මෙවලම්, උරච්චි කරන ලද ගුරුගල් (මෙම ගුරුගල් නොයෙක් අවශ්‍යතාවයන්වලදී ආලේප කිරීමට යොදාගෙන ඇත), පළඳනා, ද්විතියික හා ප්‍රාථමික වළදැමීම් හෙවත් අභිචාරී පුරුදුවලට අදාළ සාධක හමුවී ඇත (Deraniyagala, 1992; Deraniyagala, 2007).

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයා ආහාරයට ගෙන ශේෂ වූ සත්ත්ව සැකිලි කොටස් මිලියන 7 කටත් වඩා මේ වන විට සත්ත්වපුරාවිද්‍යාඥයින් තම පර්යේෂණයන්ට ලක් කොට ඇත. ඒ අනුව ගස් ගොළුබෙල්ලන්, දිය ගොළුබෙල්ලන්, කකුළුවන්, ලෙහෙල්ලන් (*Tor khudree*), මස් පෙතියන්, දම්කොළ පෙතියන්, අංකුට්ටන්, හුංඟන්, මඟුරන් ආදි මිරිදිය මසුන් ද, උභය ජීවීන් ද, කිරි ඉබ්බන්, ගල් ඉබ්බන්, තලගොයින්, කබරගොයින්, පිඹුරන් ඇතුළු තවත් සර්ප විශේෂයන් ඇතුළු උරගුන් ද, ශ්‍රී ලංකා වළි කුකුළන්, ශ්‍රී ලංකා හබන්-කුකුළන් ඇතුළු තවත් පක්ෂී විශේෂ ද, කිරි වවුලන් හා මා වවුලන්, කෘන්තක මීයන්, දඬු ලේනුන්, මා-හම්බාවන්, පුංචි හම්බාවන්, ලේනුන්, ඉත්තෑවන්, ඌරු මීයන්, හාවුන්, කබල්ලෑවන්, උරුලෑවන්, උගුඩුවන්, කළවැද්දන්, නෝතඹුවන් හා මුගටීන්, කොළ වඳුරන්, රිළවුන්, හැලි වඳුරන්, උණහපුළුවන්, මීමින්නන්, ඕලු මුවන් හෙවත් වැලි මුවන්, ගෝන මුවන් (*Axis porcinus*), තිත් මුවන්, ගෝනුන්, ගවයින්, කුළු හරක්, හඳුන් දිවියන්, කොළ දිවියන්, කොටින් හෙවත් දිවියන්, ව්‍යාඝ්‍රයින්, අලින් ආදි ඉතා විශාල පරාසයක වූ ක්ෂීරපායී සත්ත්ව අවශේෂ ද ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් සන්දර්භවලින් හමුවී ඇත (රූපය 462).


මෙම සත්ත්ව අවශේෂ අනුව පැහැදිලිවනුයේ ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයින් තම අවට පරිසරයේ ජීවත් වූ විශාල පරාසයක සතුන් ආහාරයට ගෙන ඇති බව ය (Manamendra-Arachchi *et al.*, 2009; ප්‍රේමරත්න ඇතුළු පිරිස, 2013). දඩයමින්, එකතු කිරීමෙන් හා මසුන් බෑමෙන් මේ සතුන් ගුහාව වෙත රැගෙන විත් උන් පුළුස්සා ආහාරයට ගෙන ඇත. මෙම සැකිලි අවශේෂ අතරින් පුළුස්සන ලද අස්ථි



රූපය 462. තෙත් කලාපීය ගුහාවාසී බලංගොඩ මානවයාගේ සත්ත්ව ආහාරයේ ප්‍රමුඛ සත්ත්ව විශේෂ.
ශ්‍රී ලංකා රිළවා, ශ්‍රී ලංකා කළු වඳුරා, මා හම්බාවා, දඬුලේනා (ඡායාරූප: අයි.එස්. මදනායක)

කොටස් මඟින් ඉහත කරුණ සනාථ වේ. මෙම අස්ථි ඉතා කුඩා කොටස්වලට කඩා බිඳ දමා ඇත. ඒවා බොහෝමයක් ප්‍රමාණාත්මකව මි.මී. 2 සිට සෙ.මී. 7ක් පමණ වේ. අස්ථි මෙතරම් කුඩා කොටස්වලට තලා බිඳ දමන්නට ඇත්තේ එහි වූ මිදුළු ආහාරයට ගැනීමට විය හැකි ය. අස්ථි විශ්ලේෂකයින්ගේ නිරීක්ෂණයන්ට අනුව මෙම ප්‍රාග් ඓතිහාසික සන්දර්භවලින් කිසිවිටෙකත් අංගසම්පූර්ණ සත්ත්ව හිස් කබළක් හමුවී නොමැත. ඔවුන් සත්ත්ව හිස්කබල් තලා මොළය ආහාරයට ගන්නට ඇතුවාට සැකයක් නැත.

තෙත් කලාපයේ ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා තම ආහාරයට එක් කර ගන්නා ලද අපෘෂ්ඨවංශී සත්ත්වයින් අතර විශේෂත්වය දරනුයේ ගස් ගොළුබෙල්ලන් (රූපය 463) හා දිය ගොළුබෙල්ලන් (රූපය 464) ය. පහතරට තෙත් කලාපයේ වැසි වනාන්තරවල බහුලව වාසය කරන ගස් ගොළුබෙල්ලන් වන *Acavus phoenix phoenix*, *Acavus superbus superbus*, *Acavus superbus roseolabiata* හා *Oligospira polei* යන විශේෂ මෙන්ම උප විශේෂවලට අයත් කවච කොටස් ද විශාල වශයෙන් බටදොඹලෙන, බෙලි ලෙන,



රූපය 463. පහතරට තෙත් කලාපයට සීමාවී ඇති ගස් ගොළුබෙල්ලන් (***Acavus*** **sp.**)
(ඡායාරූපය: අයි.එස්. මදනායක)



රූපය 464. මීරිඳියෙහි වසන දිය ගොළුබෙල්ලන් (***Paludomus*** **sp.**) (ඡායාරූපය: අයි.එස්. මදනායක)

අලු ලෙන හා පොත්ගුල් ලෙන කැණීම් මඟින් හමුව ඇත. මෙම විශේෂවලට අමතරව *Acavus haemastoma* ට අයත් කවච කිහිපයක් හුංගම මිණිඇතිලිය බෙලි නිධියේ වූ ප්‍රාග් ඓතිහාසික සන්දර්භවලින් හමුව ඇත. මිණිඇතිලියේ වූ මෙම ප්‍රාග් ඓතිහාසික සන්දර්භය අදින් වසර 4,000 ක් පමණ පැරණි බැව් අනාවරණය වී ඇත. මෙම කවච කොටස්වලින් බහුතරය පුළුස්සා ඇති අතර බොහෝමයක් කැබලිවලට බිඳ දමා ඇත. එමෙන්ම තෙත් කලාපයේ පිහිටි ඇළ දොළවල ගල් මත ඇලී සුලබව ජීවත් වන *Paludomus* ගනයට අයත් දිය ගොළුබෙල්ලන් ද මෙම ප්‍රාග් ඓතිහාසික ගුහා සන්දර්භ අතරින් සුලභව හමුවීමෙන් සනාථ වනුයේ එම අපෘෂ්ඨවංශීන් ද ඔවුන්ගේ ආහාරයට එක් වූ බවයි (Deraniyagala, 1992; Perera, 2010; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).

තෙත් කලාපීය ගුහාවලින් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ක්ෂීරපායීන්ගේ සැකිලි අවශේෂ බහුලව හමුවීම තුළින් පැහැදිලි වනුයේ ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයා එම සතුන්ට වැඩි රුචිකත්වයක් දක්වා ඇති බවයි. හම්බාවන්, දඬුලේනුන්, කළවැද්දන්, උගුඩුවන් හා උරුලෑවුන් වැනි කුඩා ක්ෂීරපායීන්ගේ අවශේෂ බහුලව හමුවුවද සමස්ත පෘෂ්ඨවංශී සත්ත්ව ආහාර අතරින් එම මානවයාගේ රුචිකත්වය රිළවුන්ට හා කොළ වඳුරන්ට යොමු ව ඇත. සමස්ත පෘෂ්ඨවංශීන් අතරින් රිළවුන්ගේ හා කොළ වඳුරන්ගේ නියෝජනය 25% ක් පමණ වන අතර එයින් 80% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නියෝජනය වන්නේ කොළ වඳුරු අවශේෂයන් ය. ඒ අනුව තෙත් කලාපයේ වැසි වනාන්තර ආශ්‍රිතව ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සත්ත්ව ආහාරයේ වැඩි රුචිකත්වය කොළ වඳුරන් බව සඳහන් කළ හැකි ය (ප්‍රේමරත්න ඇතුළු පිරිස, 2012; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).

තෙත් කලාපයේ ගුහා වාසස්ථානවලින් වාර්තා වන විශාල ක්ෂීරපායීන් වනුයේ වැලිමුවා, ගෝනා හා වල් ඌරා ය. බටදොඹලෙන හා පොත් ගුල් ලෙනෙන් වාර්තාවන කුර සහිත සතුන් අතර ගෝනමුවාට අයත් දත් කොටස් කිහිපයක් හමුවී ඇත. එමෙන්ම බටදොඹ ලෙනෙන් හමුවී ඇති මුව විශේෂ අතර තිත් මුවන්ට අයත් යැයි අනුමාන කළ හැකි කොටස් කිහිපයක් ද වේ. රත්නපුර දියළු තැන්පතු අතරින් ද තිත් මුවාගේ ෆොසිල හමුවන අතර ඒවා ප්ලයිස්ටොසීනයේ හා හොලෝසීනයේ ඇති වූ යම් වියළි අවධීන්වලදී තෙත් කලාපයට සංක්‍රමණය වූ තිත් මුවන්ගේ කොටස් විය හැකි ය. තිත් මුවා වියළි තැනිතලාවලට ප්‍රිය කරන තෘණ ආහාරයට ගන්නා ක්ෂීරපායියෙකු වේ (Deraniyagala, 1958; Deraniyagala, 1992; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012). ඉතා පුරාණ කාලයේ මෙරට වාසය කළ ගවරා (*Bibos sinhaleya*) ශ්‍රී ලංකාවෙන් වඳ වූයේ වසර 200 කට පමණ පෙරදී ය (Knox, 1681; Deraniyagala, 1958). ඒ අනුව ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයා ගවරුන් දඩයම් කොට තම ගුහා වාසස්ථාන වෙත රැගෙන ආවේ නම් එම සංස්කෘතික සන්දර්භ අතර උන්ගේ අවශේෂ තැන්පත් වී තිබිය යුතු ය. බටදොඹලෙන තැන්පතු අතර ඉතාමත් කලාතුරකින් ගව හෙවත් *Bos* ගණයට අයත් යැයි අනුමාන කළ හැකි චාර්වක දත් කොටස් හමු වුවද ඒවා ගවරුන්ට අයත් යැයි ස්ථිරව ප්‍රකාශ කළ නොහැක්කේ එහි වූ රූපවිද්‍යාත්මක ලක්ෂණ ප්‍රමාණවත් නොවන බැවිනි. ගවරා යනු බොහෝ විශාල ක්ෂීරපායියෙකු වන බැවින් ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයින් ගවරුන් දඩයම් කළ ද උන් ගුහාව වෙත රැගෙන ඒම අපහසු වන්නට ඇත. එම නිසා උන් දඩයම් කළ ස්ථානයේදීම ගවර මාංශය අනුභව කළේ නම් හෝ නොඑසේනම් ගවර මාංශය පමණක් කපා වෙන් කොට ගුහාව වෙත රැගෙන ආවේ නම් උන්ගේ අස්ථි කොටස් හෝ දත් ලෙනෙහි වූ සන්දර්භ අතර තැන්පත් විය නොහැකි ය. ගවරුන් එම සමයේ වාසය කළ ද උන්ට අයත් අවශේෂ ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථානවලින් වාර්තා නොවන්නේ ඉහත සාකච්ඡා කළ හේතුව නිසා විය හැකි ය.

ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථානවලින් හමුවන ශ්‍රී ලංකාවෙන් වඳවී ගිය විශාල ක්ෂීරායින් අතර ව්‍යාඝ්‍රයා හා කුඩා කඟවේනාට අයත් අවශේෂ තෙත් කලාපීය ගුහාවලින් හමුවී ඇත. බටදොඹ ලෙන 5 වන සංස්කෘතික ස්ථරයෙන් හමු වූ ව්‍යාඝ්‍රයෙකුට අයත් මැද ඇඟිලි පුරුක අදින් වසර 16,700-14,000 (5 වන ස්ථරය) ක් තරම් පැරණි බැව් අංගාර කාලනීර්ණයන් මඟින් සනාථ විය. එමෙන්ම එම ගුහාවේම 4 වන ස්ථරයෙන් හමුවූ ව්‍යාඝ්‍රයින්ට අයත් පූර්ව ඇඟිලි පුරුක් කොටස, අපර ඇඟිලි පුරුක් කොටස හා උඩ හනුවේ පුරශ්චාර්වක දත් කොටස අදින් වසර 16,300-11,600 (4 වන ස්ථරය) ක් පැරණි බැව් කාලනීර්ණය විය. මීට අමතරව තවත් ව්‍යාඝ්‍ර නිදර්ශක කිහිපයක්ම ෆාහියන් ලෙන අවුල් ස්ථරවලින් හා පොත්ගුල් ලෙනෙන් ද (අදින් වසර 14,000-8,000) හමුවී ඇත (Manamendra-Arachchi *et al.*, 2005; Deraniyagala, 2007; Manamendra-Arachchi, 2010; Perera, 2010). ප්ලයිස්ටොසීනයේ හිඳ වඳ වී ගිය

කුඩා කඟවේනාට අයත් චාර්වක දතක කොටසක් ෆාහියන් ලෙන කැණීමෙන් හමුවී තිබේ (ආචාර්ය දැරණියගල සමඟ කළ සාකච්ඡා, 2014). ඊට අමතරව පොතාන ගුහාවෙන් කුඩා කඟවේනෙකුට අයත් පහළ හනුවේ කෘන්තක දත් කොටසක් ද හමුවී ඇත.

තෙත් කලාපයේ වූ ගුහා වාසස්ථානවල වාසය කළ මානවයින් කුඩා ක්ෂීරපායීන්ට වඩාත් ප්‍රියක් දැක්වූ බව එම වාසස්ථානවලින් හමුවූ සැකිලි අවශේෂයන්ගෙන් අනාවරණය වූ බැව් ඉහතදී සාකච්ඡා කළෙමු. එසේ වුවද වියළි කලාපයේ බෙල්ලන්බැඳිපැළැස්ස විවෘත ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථානය කැණීමෙන් ලද සත්ත්ව අවශේෂ මඟින් පැහැදිලි වනුයේ එම මානවයින් විශාල ක්ෂීරපායීන් වෙත වැඩි අවධානයක් යොමු කොට ඇති බවයි. වියළි කලාපයේ කුර සහිත සතුන් වන ඕලු මුවන්, තිත් මුවන්, ගෝනුන්, වල් ඌරන් හා කුළු හරක් බහුලව වාසය කරන බැවින් එම මානවයින්ගේ අවධානය කුඩා ක්ෂීරපායීන්ට වඩා ප්‍රමාණයෙන් විශාල සතුන් කෙරෙහි යොමුවන්නට ඇත. කුඩා සතුන් වැඩි දෙනෙකු දඩයම් කරනවාට වඩා විශාල ක්ෂීරපායීයෙක් දඩයම් කිරීම ඔවුන්ට ආර්ථික වශයෙන් වඩා වාසිදායක වේ. බටදොඹ ලෙන, බෙලි ලෙන, අලු ලෙන, පොත්ගුල් ලෙන ආදි ලෙන්වලින් හමුවන කුඩා ක්ෂීරපායීන් වෙනුවට බෙල්ලන්බැඳි පැලැස්සෙන් ඉහත දක්වන ලද විශාල ක්ෂීරපායීන්ට අයත් සැකිලි අවශේෂ බහුලව හමුවන අතර අන්තර් කලාපයේ පිහිටි පොතාන ගුහා කැණීමෙන් කුඩා ක්ෂීරපායීන්ගේ මෙන්ම විශාල ක්ෂීරපායීන්ගේ අස්ථි අවශේෂ සම සමව හමුවේ. එහි දඬු ලේනා, මා-හම්බවා මෙන්ම රිළවා, හැළි වඳුරා, තිත් මුවා, වල් ඌරා හා ගව අස්ථි කොටස් ද හමු වී ඇත (අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012; ප්‍රේමරත්න ඇතුළු පිරිස, 2013).

ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන අතරින් සත්ත්ව විශේෂවල වූ විවිධත්වයේ ඉහළම අගය දරනුයේ බටදොඹලෙන සංස්කෘතික තැන්පතු ය. දෙවන ස්ථානය පොත්ගුල් ලෙනට හිමි වේ (Manamendra-Arachchi *et al.*, 2009; Perera, 2010; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012). ප්‍රාග් ඓතිහාසික මානවයා ප්‍රමාණයෙන් ඉතා කුඩා පෘෂ්ඨවංශී සතුන් ද ආහාරයට ගෙන ඇත. මේ අතරින් කටුස්සු කුලයට (Agamidae) අයත් මෙරටට ආවේණික කරමල් බෝදිලියාගේ (*Lyriocephalus scutatus*) අවශේෂ බටදොඹ ලෙන හා පොත්ගුල් ලෙනෙන් වාර්තා වේ. මෙම බෝදිලියා පහතරට තෙත් කලාපයේ වැසි වනාන්තරවල මෙන්ම අන්තර් කලාපයේ ගඟබඩ වනාන්තරවලින් ද වාර්තා වේ. මඟුරා, හුංඟා හා අංකුට්ටන් යන මිරිදිය මසුන් ආහාරයට ගෙන ඇති බැව් ස්ථීර වශයෙන්ම ප්‍රකාශ කළ හැක්කේ එම මසුන් දරන එකිනෙක විශේෂයට වෙනස් රූපවිද්‍යාත්මක ලක්ෂණ පෙන්නුම් කරන ළය වරලේ වූ කණ්ටකයන් ය. එම කණ්ටකවල දිග, ඒවා දරන දැතිවල ස්වභාවය හා සංඛ්‍යාව එක් එක් මත්ස්‍ය විශේෂය හඳුනාගැනීම සඳහා වඩාත් වැදගත් වේ. ලෙහෙල්ලා හෙවත් හොරපලයා මෙරට මිරිදියේ වසන විශාලතම මත්ස්‍යයන්ගෙන් කෙනෙකි. අප රට මිරිදිය මසුන්ගෙන් බහුතරයක් අයත් වන Cyprinidae කුලයේ මෙම මත්ස්‍යයා මීටරයකට ආසන්නව දිගින් වැඩේ. තෙත් කලාපයේ වූ සෑම මානව වාසස්ථානයකින්ම ලෙහෙල්ලන්ට අයත් ග්‍රසණික දත් ඇදි කොටස් හමුවේ. ලෙහෙල්ලන් වැනි ගැඹුරු ජලයේ වාසය කරනු ලබන මත්ස්‍යයෙකු දඩයම් කිරීම සඳහා කුමන ආකාරයේ ක්‍රමවේදයක් භාවිතා කරන්නට ඇතිදැයි අනුමාන කළ නොහැකි ය. එසේ වුවද උන් අභිජනනය සඳහා ගැඹුරු ජලයේ සිට නොගැඹුරු ඇල දොළවලට පැමිණෙන බැවින් පහසුවෙන් එහිදී දඩයම් කළ හැකි ය (Deraniyagala, 1952; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).

ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයාගේ පක්ෂී දඩයමේ වැඩි රුචිකත්වය ශ්‍රී ලංකා වළි කුකුළා බැව් එම සන්දර්භවලින් හමුවී ඇති අස්ථි අවශේෂ මඟින් පැහැදිලි වේ. තෙත් කලාපයේ ගුහා කැණීම්වලින් ලද අවශේෂවලින් බහුතරයක් එනම්, දළ වශයෙන් 95% ක් පමණ වළි කුකුළාට අයත් වේ. වළි කුකුළන් මෙරට ඕනෑම දේශගුණික කලාපයකම ජීවත් වන සුලභ භෞමික පක්ෂියෙකි. ගැමියන් උන් අල්ලා ගැනීම



රූපය 465. ජේතවනාරාම කැණීමකින් හමුවුණු ශ්‍රී ලංකා වළිකුකුළාට (***Gallus lafayetii***) අයත් පාදකුර්චෝපරිය අස්ථියක කොටසක්
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සඳහා ඊටම විශේෂ වූ උගුල් තනනු ඇත (Myrdal & Yasapala, 1994). මීට අමතරව ඉතාම සුළු වශයෙන් එනම් 1% ක් පමණ ශ්‍රී ලංකා හබන් කුකුළන්ගේ අවශේෂ ද හමුවේ. හබන් කුකුළන් ඉතා කුලැටි භෞමික පක්ෂියෙකු බැවින් උන් අල්ලා ගැනීම වඩාත් අපහසු වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. වළි කුකුළා හා හබන් කුකුළාගේ අස්ථි අවශේෂ මඟින් උන් වෙන් කොට හඳුනා ගැනීමේදී පාදයේ වූ පාදකුර්චෝපරිය (tarsometatarsus) අස්ථිය කදිම සාධකයක් වේ (රූපය 465). වළි කුකුළන්ගේ එම අස්ථිය ප්‍රමාණයෙන් විශාල අතර වැඩුණු කුකුළෙක් එක් පොරකටුවක් දරයි. වළි කිකිළිය පොරකටු නොදරයි. හබන් කුකුළාගේ එම අස්ථිය සාපේක්ෂව කුඩා අතර කුකුළාගේ එක් පාදයක පොරකටු යුවළක් දැකිය හැකි ය. හබන් කිකිළිය එක් පොර කටුවක් දරයි. මෙම මානවයින් තවත් බොහෝ පක්ෂීන් ආහාරයට ගෙන ඇති මුත් එම අවශේෂ හඳුනාගැනීම අනාගත පර්යේෂණවලදී සිදු කෙරෙනු ඇත (ප්‍රේමරත්න ඇතුළු පිරිස, 2010; ප්‍රේමරත්න ඇතුළු පිරිස, 2011; Premarathne *et al.*, 2011; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).

සත්ත්ව ආහාරයේ ශේෂ වූ සැකිලි කොටස් බටදොඹලෙන, බෙලි ලෙන, අලු ලෙන හා පොත් ගුල් ලෙන යන තෙත් කලාපීය ගුහා වාසස්ථානවලින් විශාල වශයෙන් හමුවූ බැව් අප ඉහතදී සාකච්ඡා කළෙමු. එසේ වුවද ප්‍රාග් ඓතිහාසික සන්දර්භ අතර සත්ත්ව අවශේෂ මෙන් උද්භිද විද්‍යාත්මක අවශේෂ මනාව සුරක්ෂිතව නොමැත. ඉහත වාසස්ථානවලින් ඉතාම කලාතුරකින් වල් දෙල් හෙවත් බැඳි දෙල් (*Artocarpus nobilis*) ඇටවල වූ පොතු හමුව ඇත. එමෙන්ම තෙල් කැකුණ (*Canarium zeylanicum*) ඇට කොටස් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සන්දර්භවලින් වඩාත් සුලබව හමුවේ. ඊට අමතරව ඉතා සුළු වශයෙන් ගල් වෙරළු (*Elaeocarpus* spp.) ඇට කොටස් ද මෙම සන්දර්භ අතර සුරක්ෂිතව ඇත. මෙම ශාක විශේෂ සියල්ලම පාහේ තෙත් කලාපයේ පහත රට පැතිර ඇති වැසි වනාන්තරවලට සීමා වූ ආවේණික විශේෂයන් වේ. උද්භිද විද්‍යාත්මක අවශේෂ අතරින් ප්‍රාග් ඓතිහාසික සන්දර්භවලින් සුලබවම හමු වන තෙල් කැකුණ ඇටවලින් බහුතරය පිළිස්සී ඇත. එමෙන්ම ඒවා කුඩා කොටස්වලට කැබලි වී ද ඇත. තෙල් කැකුණ මදය ආහාරයට ගැනීම සඳහා ඒවා තැලුවා ය යන මතය ද පුරාවිද්‍යාඥයින් අතර පවතී. එම කැකුණ අවශේෂවලින් බහුතරය පිළිස්සී තිබීම මෙහිදී අප සතු වැදගත් ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය. කැකුණ ඇට පුළුස්සන ලද්දේ කුමන හේතුවක් නිසාද යන්න අපට සෘජුවම ප්‍රකාශ කළ නොහැකි ය. කෙසේ වුවද සදාහරිත වනාන්තරවල ජීවත් වන මෙම මානවයින් අඛණ්ඩවම තම ගිනිමැලය පවත්වාගෙන යා යුතු ය. මක් නිසාද යත් එම වැසි වනාන්තර පරිසරයේ වාතයේ අධික ආර්ද්‍රතාවයක් පවතින බැවින් ගිනි මෙලවීම එතරම් පහසු නොවන්නට ඇත. එම නිසා මොලවාගත් ගිනිමැලය අඛණ්ඩව පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. මෙහිදී දර සමඟ බොහෝ වේලා හිමිහිට ඇවිලෙන තෙල් කැකුණ ඇට ද ගිනිමැලයට එක් කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ක්ෂුද්‍ර ශිලා යුගයේ විශාල මෙවලමක් ලෙස සැලකෙන කිණිහිරය මෙම කැකුණ ඇට තැලීම සඳහා යොදාගන්නට ඇතැයි පිළිගැනේ (Deraniyagala, 1992). ඉහත දක්වන ලද තෙත් කලාපීය ගුහා වාසස්ථානවලින් ශාක කොටස් හමු වුවද පොතාන හා බෙල්ලන්බැඳි පැළැස්ස ආදී අන්තර් කලාපීය හා වියළි කලාපීය වාසස්ථානවලින් මෙම ශාක කොටස් හෝ වෙනත් විශේෂවලට අයත් අවශේෂයන් හමුවී නොමැත.

ක්ෂුද්‍ර (හෙවත් අන්වීක්ෂීය) උද්භිද විද්‍යාත්මක අවශේෂ ලෙස ගැනෙන පරාග හා ෆයිටොලිත් (pollen and phytoliths) අනුසාරයෙන් කෙරෙන පර්යේෂණවලදී මීට වැඩි යමක් අනාවරණය කරගත හැකි වේ යැයි උපකල්පනය කළ හැකි ය. ඇසට පෙනෙන ප්‍රමාණයෙන් විශාල ශාක කොටස් මගින් ලැබී ඇති දත්ත මත අපට සැහීමකට පත් විය නොහැකි ය. වැසි වනාන්තර ආශ්‍රිතව ආහාරයට ගත හැකි ගෙඩි අතර ඇටඹ විශේෂයෙන් සඳහන් කළ හැකි ය. එහි වාසය කළ ප්‍රාග් ඓතිහාසික මානවයින් ඇටඹ තම ආහාරයට එක් කර ගත්තා යැයි උපකල්පනය කළ හැකි වුවද ඊට අදාල කිසිදු අවශේෂයක් එම සන්දර්භවල සුරක්ෂිත වී නොමැත. මීට අමතරව වියළි කලාපයේ ගල් සියඹලා, බුලු, පළු, වීර, මොර, මී, දිවුල් ආදි ආහාරයට ගත හැකි ඵල හෝ මල් හටගන්නා මෙරටට ආවේණික නොඑසේ නම් දේශීය ගස් විශේෂ ගණනාවක් ම වේ. ඒවා එහි වාසය කළ ප්‍රාග් ඓතිහාසික මානවයින් ආහාරයට ගත් බව සැකයකින් තොරව ප්‍රකාශ කළ හැකි වුවද ඊට අදාළ පියවි ඇසට පෙනෙන අවශේෂ එම සන්දර්භවල සුරක්ෂිතව නොමැත. කෙසේ වුවද මෙම ප්‍රාග් ඓතිහාසික මානවයින්ගේ ශාක ආහාරය අනුමාන කිරීම පිණිස ඇති කදිම අවස්ථාව වනුයේ මෙරට වනගත ජනයා හා වැද්දන් පිළිබඳ ගොනුකර ඇති මානව වංශ තොරතුරු ය. සෙලිග්මාන් යුවළ විසින් 1911 දී ප්‍රකාශිත හා රිචඩ් ලයනල් ස්පිට්ල් විසින් ගොනු කරන ලද වැද්දන් පිළිබඳ තොරතුරු මෙන්ම ආචාර්ය සිරාන් දැරණියගල විසින් ලැයිස්තුගත කළ මෙරට වූ ආහාරයට ගත හැකි ශාක විශේෂද, ප්‍රාග් ඓතිහාසික ශාක ආහාරය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා වූ සාධක ලෙස සඳහන් කළ හැකි ය. මෙහිදී විශේෂයෙන්ම වැද්දන් විසින් ආහාරයට ගනු ලබන දේශීය අල වර්ග පිළිබඳ සැලකිල්ල යොමු කොට ඇත (Seligmann and Seligmann, 1911; Spittle, 2001; Spittle, 2003; Daraniyagala, 1992).

ආචාර්ය සිරාන් දැරණියගල විසින් සිදුකළ කැණීම් මගින් අනාවරණය වූ කාලනීර්ණ හා ශාකමය ද්‍රව්‍ය සැසඳූ කල අදින් වසර 31,000 ක සිටම කැකුණ භාවිත කොට ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක ඇත. මීට අමතරව බෙලිලෙනෙහි අදින් වසර 16,000 සිට 12,000 දක්වාත්, අවිස්සාවේල්ල අසල මානියංගම බෙලිලෙන අතුල ගල් ලෙනෙහි අදින් වසර 7900 ක පමණ කාලයේදී කැකුණ භාවිතා කළ බවට සාධක හමුවේ. මීට අමතරව අදින් වසර 16,000 ක සිටම වල් දෙල් උණු අලු පල්ලේ දමා පුළුස්සා ආහාරයට ගත් බවට සාධකද මේ අතර වේ. මෙම ගල් ලෙන්වල අවුල් වූ සංස්කෘතික ස්ථර අතර තිබී ඇටි කෙසෙල් ඇට (*Musa paradisica*) හඳුනාගෙන ඇත (Deraniyagala, 1992; දැරණියගල, 2003). ආචාර්ය ඩබ්ලිව්. එච්. විජයපාල විසින් කෑගල්ල අසල දොරවක ලෙනෙහි අදින් වසර 7,300 ක් දක්වා කාලනීර්ණය කර ඇති සංස්කෘතික ස්ථර අතරින් මෙතෙක් හඳුනා නොගත් ධාන්‍ය විශේෂයක් හමුවී තිබේ. මෙම ධාන්‍ය සමඟ ජ්‍යාමිතික හැඩයෙන් යුත් ක්ෂුද්‍ර ශිලා මෙවලම් හා රළු රක්ත වර්ණ මැටි වළං කැබලි (crude red pottery) (අදින් වසර 7,300) සහ කාලරක්ත වර්ණ මැටි වළං කැබලි (Black and Red Ware) (අදින් වසර 5,100) හමුවී ඇත (W.H. Wijayapala in Deraniyagala, 2000).

ආචාර්ය ටී. රත්නසිරි ප්‍රේමතිලක හෝර්ටන් තැන්නේ පොළොව විද ලබාගත් පාංශු සාම්පලවල වූ පරාග හා එම පාංශු ස්ථර කාලනීර්ණය කොට ලබාගත් දත්ත මඟින් ශ්‍රී ලංකාවේ මුල්ම (ප්‍රාථමික) වගාවන් සිදුකළ බවට තොරතුරු හෙළිදරව් වේ. එම පරාග විද්‍යාත්මක (Palynological) සාධක අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයින් දළ වශයෙන් අදින් වසර 17,000 ක සිට ඕට්ස් *(Avena sativa*, Oats) හා බාර්ලි (*Hordeum vulgare*, Barley) වගා කළ බව සනාථ වී ඇත. එමෙන්ම හීලෑ හරකුන් ඇති කිරීමේ ආරම්භක අවස්ථාවක්ද මේ වකවානුවේ පැවති බැව් ඔහු ප්‍රකාශ කරයි. අදින් වසර 10,000 ක සිට 7,500 ක කාලය දක්වා සෑම අතින්ම දියුණු හා අංග සම්පූර්ණ ලෙස සතුන් ඇති කිරීමේ හා ධාන්‍ය වගාවේ දියුණු අවස්ථාවක් පැවත ඇත. එසේ වුවද අදින් වසර 7,500-3,000 අතර කාලපරිච්ඡේදය තුළදී සතුන් ඇති කිරීම හා ධාන්‍ය ගොවිතැන ක්‍රමයෙන් පරිහානියට පත්ව තිබේ (Dearaniyagala, 1992;

Premathilake, 2003; Deraniyagala, 2007). ප්‍රේමතිලකගේ මෙම අනාවරණ සඳහා ශිලා මෙවලම් හෝ සත්ත්ව ෆොසිල කිසිවිටෙකත් පාදක කොට ගෙන නොමැති අතර එම කරුණු මුළුමනින්ම පාහේ පරාග මත පමණක් ම පදනම් වීය.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා තම ආහාරය අමුවෙන් හෝ පුළුස්සා අනුභව කරන්නට ඇත. වැද්දන් පිළිබඳ කරන ලද මානව වංශ පර්යේෂණ අනුව දඩයම් කිරීම පිරිමින් විසින් ද, ශාකමය ආහාර රැස් කිරීම ගැහැනුන් හා ළමයින් විසින් සිදුකෙරේ. මේ අනුව සලකා බලන කල ප්‍රාග් ඓතිහාසික මානවයාගේ පිරිමින් සතුන් දඩයමේ යෙදෙන විට ගැහැනුන් හා ළමයින් කැකුණ, වල් දෙල්, අල වර්ග මෙන්ම ගොළුබෙල්ලන්, කටුස්සන් ආදි කුඩා සතුන් එකරැස් කොට තම වාසස්ථාන වෙත රැගෙන එන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය. විද්‍යාත්මක සාධක නොතිබුණද මෙම මානවයින් මී පැණි හා බඹර පැණි ආදිය තම ආහාර වේලට එක් කර ගන්නට ඇත. ඔවුන් සතුන් ඇල්ලීම සඳහා දුනු, ඊතල, හෙළි ආදි විවිධ මෙවලම් මෙන්ම උගුල් ද අටවන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. රට මධ්‍යයේ වූ ප්‍රාග් ඓතිහාසික වාසස්ථාන වන බෙල්ලන්බැඳිපැළැස්ස, කබරගල් ගේ, ෆාහියන් ලෙන, කිතුල්ගල බෙලි ලෙන, බටදොඹලෙන, පොත්ගුල් ලෙන, පොතාන ලෙන හා කුරගල ලෙනෙන් මුහුදු බෙල්ලන් හා මෝර මත්ස්‍ය දත් හමුව තිබේ. දැරණියගලගේ මතය වනුයේ ඒවා 'වෙළඳාමේ' හා 'ද්‍රව්‍ය හුවමාරුවේ' ශේෂ වූ සාධක බව ය. කුරුවිට බටදොඹ ලෙනෙහි අදින් වසර 19,500 ට කාලනීර්ණය කොට ඇති සංස්කෘතික සන්දර්භයකින් මුහුදේ ජීවත් වන මඩුවෙකුගේ වල්ගයට අයත් කණ්ඨකයක කොටසක් ද, අදින් වසර 16,500-14,000 ට කාලනීර්ණය වී ඇති සන්ධර්භයකින් මුහුදු බෙල්ලෙකුගේ කොටසක්ද හමුව තිබේ. කලපු, ලේවායන් හා කඩොලානවල බහුලව වසන *Cerithideopsilla singulata* බෙල්ලා මුහුදුබඩ පෙදෙස්වලින් ලුණු රැගෙන ඒමේදී ඒ සමඟ මුසු වී ගුහාව වෙත රැගෙන එන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ප්‍රාග් ඓතිහාසික මානවයින්ට ලුණු ඉතා වැදගත් මෙන්ම ඉහළ ඉල්ලුමක් ඇති භාණ්ඩයක් වූවා විය හැකි ය. ආදි කාලයේ ජීවත් වූ වැද්දන් ලුණු වෙනුවෙන් දඩමස් හා වෙනත් වටිනා ද්‍රව්‍ය හුවමාරු කරගන්නා ලද්දේ එය ඉහළ ඉල්ලුමක් ඇති ද්‍රව්‍යයක් නිසා ය. කිතුල්ගල බෙලි ලෙනේ අදින් වසර 30,000 කට පමණ කාලනීර්ණය වී ඇති සංස්කෘතික ස්ථරයෙන්ද මෙම බෙල්ලන් විශේෂය හමුවීමෙන් ඔවුන්ගේ ලුණු අවශ්‍යතාවය තවදුරටත් සනාථ වේ.



රූපය 466. සිදුරුවිද සකස් කරන ලද ජලධාරිත ගල්
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මෙම ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයින් ආහාරයට ගත් සත්ත්ව මාංශය සහ ශාක කොටස් පුළුස්සා ඇති බවට සාධක සුලබ ය. ඔවුන් වාසය කළ සෑම වාසස්ථානයකම පාහේ පුළුස්සන ලද අස්ථි කොටස් සහ කැලෑ ඇට හා ගෙඩි වර්ග බහුලව හමුවී ඇත. ආචාර්ය සිරාන් දැරණියගලගේ අදහසට අනුව ගං පත්ලෙන් සොයාගනු ලැබූ වටකුරු හැඩැති සිදුරු විදින ලද අත්ලක් පමණ වූ ගල් (pitted pebbles) ගිනි මෙලවීමට භාවිත කොට ඇත (රූපය 466). මෙවැනි සිදුරු සහිත ගල් ක්ෂුද්‍ර

ශිලා යුගයේ මානවයින් වාසය කළ සෑම ස්ථානයකින්ම පාහේ හමුවේ. අසූව දශකයේ අග භාගයේදී සමනලවැව ආශ්‍රිත කලාපයේ කරන ලද මතුපිට ගවේෂණ මඟින් මෙම සිදුරු විදින ලද වටකුරු ගල් ඉතා සුලභව හමුවිය. මීට අමතරව සමතල ගල් මත තැන තැන සිදුරු විද සකස් කරන ලද කිණිහිර (anvils) ද ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයා භාවිත කළ තවත් මෙවලමකි. මෙම කිණිහිරය තද කවච සහිත කැලෑ ඇට වර්ග තැලීම සඳහා භාවිත කරන්නට ඇතැයි දැරණියගල යෝජනා කරයි. ක්ෂුද්‍ර ශිලා යුගයේ ප්‍රධානතම ලක්ෂණ අතරින් ශිලා මෙවලම් තාක්ෂණය ඉතාමත්ම වැදගත් වේ. ජ්‍යාමිතික හැඩයෙන් යුත් ක්ෂුද්‍ර ශිලා මෙවලම් (geometric microliths) මෙම ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයාගේ සුවිශේෂී තාක්ෂණික හැකියාව හා සියුම්භාවය නිරූපණය කිරීමට කදිම උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. මෙම ක්ෂුද්‍ර මෙවලම් මූලික වශයෙන් නිපදවා ඇත්තේ තිරුවාණාවලිනි. ඒවා අඩසඳ (lunate) (රූපය 467), ත්‍රිකෝණාකාර (trangle), ට්‍රැපිසොයොඩ (trapezoidal) ආදි වශයෙන් ජ්‍යාමිතික හැඩතල ගණනාවකින් යුක්ත ය. මේ ශිලා තාක්ෂණය අදින් වසර 36,000 ක පමණ සිට මෙරට ස්ථාපිත වී ඇත. මෙවැනි ජ්‍යාමිතික ශිලා මෙවලම් හමුවන ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථාන අතර බටදොඹ ලෙන හා බෙලි ලෙන විශේෂයෙන් සඳහන් කළ හැකි ය. ක්ෂුද්‍ර ශිලා සම්ප්‍රදාය අදින් වසර 36,000-3,800 (බටදොඹලෙන සිට මාන්තොට දක්වා) තෙක් පැවතින (Deraniyagala, 1992; Deraniyagala, 2007; Perera, 2010). එසේ වුවද අදින් වසර 14,000-8,000 ට කාලනීර්ණය වී ඇති පොත්ගුල් ලෙනෙන් එක් ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලමක් හෝ හමුවී නොමැත (අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012). අදින් වසර 16,000 කට කාලනීර්ණය වී ඇති කුරගල ප්‍රාග් ඓතිහාසික ලෙනෙහි ක්ෂුද්‍ර ශිලා මෙවලම් ඊට සාපේක්ෂව බොහෝ හමුව ඇත (ආචාර්ය නිමල් පෙරේරා සමඟ කළ සාකච්ඡා ඇසුරෙන්, 2014).



රූපය 467. අඩසඳ හැඩැති තිරුවාණාවලින් නිර්මිත ක්ෂුද්‍ර ශිලා මෙවලමක් (ඡායාරූපය: සුදත් නානායක්කාර)


ක්ෂුද්‍ර ශිලා මෙවලම් නොවන 'බලංගොඩ තුඩ' (Balangoda Point) (රූපය 468) දෙපාර්ශ්වයේම සියුම්ව පතුරු ඉවත් කොට තනන ලද 'දිය බිඳුවක' (හෝ තුඩ සහිත ශාක පත්‍රයක) හැඩයක් ගන්නා අපූරු නිර්මාණයක් වේ. එය ප්‍රමාණයෙන් සෙ.මී. 3 ට වඩා කුඩා වේ. මෙම බලංගොඩ තුඩෙහි මුවහත් දාරයන් නැතුවා මෙන්ම අඩසඳ හැඩැති ශිලා මෙවලම් මෙන් එක් දාරයක පතුරු ඉවත් කොට මොට කර ද නොමැත. එය ඊ තල හිසක් සඳහා යොදා ගන්නට ඇතැයි ඇතැම් පුරාවිද්‍යාඥයින් ප්‍රකාශ කළද ඊ තල හිසක් ලෙස සවි කිරීම සඳහා එහි සුදුසු නිමැවුමක් නොමැත. 1980-1982 බටදොඹ ලෙන කැණීමෙන් බලංගොඩ තුඩු දෙකක් හමුව ඇත. අංගාර කාලනීර්ණයන්ට අනුව එම තුඩු අදින් වසර 28,000-23,000 (7b ස්ථරය) හා අදින් වසර 37,000-32,000 (7c ස්ථරය) දක්වා විය.



රූපය 468. තිරුවාණාවලින් නිර්මිත බලංගොඩ තුඩ. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ශිලා යුගයේ අතිශයින්ම දුර්ලභ නිර්මාණයකි. (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් අතර අඩසඳ හැඩයක් ගන්නා මෙවලම සෘජු කැපුම් දාරයකින් ද ඉතිරි වක්‍රය පතුරු ඉවත් කොට ද තනා ඇත. මෙම ක්ෂුද්‍ර මෙවලම් හෝර්ටන් තැන්න ආදී පෙදෙස්වල වූ එළිමහන් ප්‍රාග් මානව වාසස්ථානවලින් ද හමුවන බැව් ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු

(Deraniyagala, 1971; Deraniyagala, 1992). මේ ආකාර ක්‍ෂුද්‍ර ශිලා මෙවලම් තනි මෙවලමක් ලෙස භාවිත කළේද නොඑසේ නම් මෙවලම් කිහිපයක් එකදිගට සවි කොට දිගු කැපුම් දාරයක් සකස්කර ගත්තාද යන්න පිළිබඳ පුරාවිද්‍යාඥයින් අතර මත කිහිපයක් වේ. ආචාර්ය දැරණියගල හා ආචාර්ය පෙරේරා දක්වන මතයන් අතර ගෝන හෝ මුව අඟක නොඑසේනම් දිගු ලී දණ්ඩක කපන ලද කාණුවක් තුළ මෙම මෙවලම් ඔබ්බවා මැලියම් මගින් අලවා තනි හා දිගු කැපුම් දාරයක් සකස් කොට කපන ආයුධයක් තනා ගන්නට ඇතැයි මේ අතර වූ එක් මතයකි. මීට සමාන මෙවලම් ලොව අන් රටවල විශේෂයෙන්ම නවශිලා යුගයේදී (Neolithic period) ඔවුන් විසින් වවන ලද ධාන්‍ය නෙළීම සඳහා භාවිත කරන්නට ඇතැයි පිළිගැනේ. අඩසඳ ආකාර මෙවලම් ශ්‍රී ලංකාවේ මෙන්ම ක්‍ෂුද්‍ර ශිලා යුගයට අයත් සන්දර්භවලින් අප්‍රිකාව, ආසියාව හා ඕස්ට්‍රේලියාව යන කලාපවලින්ද වාර්තා වේ (Deraniyagala, 1992; Mulvaney & Kamminga, 1999; Mellars, 2006). ලී දණ්ඩක කෙළවර උල් ව තනා එහි දිගු අතට කැපූ ඇලි තුළ කැපුම් දාර පිටතට පිහිටන අයුරින් ක්‍ෂුද්‍ර ශිලා මෙවලම් මැලියම් ආධාරයෙන් සවිකොට තැනූ හාපූනය (harpoone) පිළිබඳ මතයක් මෙම මෙලම් භාවිතය සම්බන්ධයෙන් පුරාවිද්‍යාඥයින් අතර පවතී. මෙවැනි හාපූන විද සතුන් දඩයම් කළ බවටත්, එහිදී මාරාන්තික තුවාල සිදු කළ හැකි බවටත් තවත් මතයක් පවතී (Oakely, 1972).



රූපය 469. මුහුදු බෙලි කවච කොටසකින් නිර්මිත පබළුව. බටදොඹලෙන ගුහාවෙනි, වම
රූපය 470. මිරිදිය දෙපියන්බෙලි කවච කොටසකින් නිර්මිත පබළුව. බටදොඹලෙන, මැද වම
රූපය 471. මිරිදිය දෙපියන් බෙලි කවච කොටසකින් නිර්මිත පබළුව. බටදොඹලෙන, මැද දකුණ
රූපය 472. මුහුදු බෙලි කවච කොටසකින් නිර්මිත පබළුව. බටදොඹලෙන, දකුණ (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

බලංගොඩ මානවයන්ගේ පළඳනා, කලාව, සිරිත් හා මළවුන් සම්බන්ධ ශවෝපචාර විධි ක්‍රමයන් පිළිබඳව දැන හැඳිනගැනීම සඳහා පුරාවිද්‍යාඥයින් දරා ඇති උත්සාහයේ ප්‍රතිඵල මෙහි සඳහන් කරන්නට කැමැත්තෙමු. බටදොඹලෙනෙහි 7c සංස්කෘතික ස්ථරයෙන් හමුව ඇති මුහුදු බෙලි කොටසකින් නිම කළ පබළුව අප රට හමුව ඇති පැරණිම පළඳනාව ලෙස පිළිගැනේ. මුහුදේ වසන *Conus* ගණයට අයත් මුහුදු බෙල්ලෙකුගෙන් නිර්මිත මෙම පබළුව වටකුරු හැඩැති අතර එහි මධ්‍යයේ රවුම් සිදුරකි (ප්‍රමාණය: විශ්කම්භය මි.මී. 13.7-15.3). එය අදින් වසර 36,000 ක් පමණ පැරණි ය (රූපය 469). බටදොඹලෙන 6 වන සංස්කෘතික ස්ථරයෙන් හමුව ඇති මිරිදිය දෙපියන් බෙලි කවච කොටසකින් නිර්මිත පබළුව වඩාත් සිත්ගන්නා සුලුය. ඕවලාකාර හැඩැති මෙම පබළුව මධ්‍යයේ සිදුරකි (ප්‍රමාණය මී.මී. 8.2 x 6.3). පබළුව දාරය වටා දැති කපා ඇත. මෙම පබළුව අදින් වසර 20,000 ක් පමණ පැරණි ය (රූපය 470). තවත් මිරිදිය දෙපියන් බෙල්ලෙකුගෙන් නිම කළ පබළුවක් බටදොඹලෙන 5 වන ස්ථරයෙන් හමු වී ඇත. දළ වශයෙන් ත්‍රිකෝණාකාර මෙම පබළුවේ එක් කෙළවරක සිදුරකි (ප්‍රමාණය: මී.මී. 16.9 x 10.0). මෙය අදින් වසර 17,000 ක් පමණ පැරණි ය (රූපය 471). තවත් වටකුරු බෙලි පබළුවක් බටදොඹලෙන 6 වන සංස්කෘතික ස්ථරයෙන් හමුවේ. එයද මුහුදේ වසන *Conus* ගණයට අයත් බෙලි කවචයක මුදුන් කොටසින්

නිමවා ඇත (ප්‍රමාණය: මී.මී. 8.7 × 7.7) (රූපය 472). ෆාහියන් ලෙනෙහි අවුල් වූ ස්ථරවල තිබී *Conus* ගණයේ සම්පූර්ණ බෙල්ලෙක් හමුවී ඇති අතර එහි මුදුනේ සිදුරක් විද ඇත (ප්‍රමාණය: උස මී.මී. 30.7). පොත්ගුල් ලෙනෙන් හමු වූ මිරිදිය දෙපියන් බෙල්ලෙකුගෙන් නිර්මිත පබළුව හතරැස් හැඩැති අතර එය දිගින් මි.මී. 12.79 × 11.10 ක් වේ. මීට අමතරව පොත්ගුල් ලෙනෙන් හමුව ඇති බෙලි කටු පබළු අතරට මිරිදියේ වසන *Paludomus* ගණයට අයත් බෙල්ලෙකුගෙන් කරන ලද නිර්මාණයක් වේ. මෙම බෙල්ලාගේ උස මි.මී. 34.49 ක්ද පළල මි.මී. 23.45 ක්ද වේ. මීට අමතරව බටදොඹ ලෙන, පොත්ගුල් ලෙන හා කුරගල යන ප්‍රාග් ඓතිහාසික ගුහාවලින් වෙරළින් රැගෙන එන ලද ප්‍රමාණයෙන් කුඩා මුහුදු බෙල්ලන්ගෙන් තැනූ පබළු හමු වේ. ප්‍රමාණයෙන් කුඩා වුවද මේ සෑම බෙල්ලෙකුගේම ප්‍රධාන ශරීර කුටීරයේ සිදුරකි. ෆාහියන් ලෙන හා පොත්ගුල් ලෙන අවුල් වූ ස්ථරවලින් සිදුරු විද සකස් කර ඇති මෝර දත් දෙකක් හමුවී ඇත (රූපය 473). මෙම මෝර දත්වල ඉතා සියුම්ව හා මනා සංයමයකින් යුතුව තනන ලද සිදුරු වේ. පහතරට තෙත් කලාපයේ වැසි වනාන්තර ඇසුරේ වාසය කරන *Acavus* හා *Oligospira* බෙල්ලන්ගේ කවච ප්‍රාග් ඓතිහාසික වාසස්ථානවලින් විශාල වශයෙන් හමුවේ. ඒවා ඔවුන් ආහාරයට ගෙන ඇති බැව් මනාව පැහැදිලි වන අතර එහි විශේෂත්වය වනුයේ එම කවචවලින් බහුතරයක ප්‍රධාන ශරීර කුටීරයේ සිදුරක් පිහිටීමයි. ආචාර්ය සිරාන් දැරණියගලගේ මතය වනුයේ ඒවා පළඳනා වශයෙන් භාවිත කරන්නට ඇති බවයි. වැදි කාන්තාවන් ද බෙල්ලන්ගෙන් නිර්මිත මාල පළඳා ඇත. බෙලි ලෙනෙහි අවුල් ස්ථරවලින් දිගු සත්ත්ව අස්ථිවලින් නිර්මිත බැරල් හැඩැති (barrel-beads) පබළු හමුව ඇති බව දැරණියගල සඳහන් කොට ඇත (Deraniyagala, 1992; Deraniyagala, 2007; Adikari *et al*; 2009; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).



රූපය 473. මෝර දතකින් නිර්මිත පළඳනාව. අලවල පොත්ගුල් ලෙන (පරිමාණ රේඛාව මි.මී. 10 කි.)
(ඡායාරූපය: අයි.එස්. මදනායක)

ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයාගේ නිර්මාණ අතර අස්ථි පතුරුවලින් කරන ලද නිර්මාණයන් කුමන අවශ්‍යතාවයක් උදෙසා භාවිතා කළාද යන්න අපැහැදිලි ය. විශාල ක්ෂීරපායීන්ගේ ගාත්‍රා අස්ථි කැබලි උරච්චි කොට පැතලි කර දාරවල සියුම් දැති කපා තනා ඇති වස්තූන් බෙලි ලෙන අවුල් ස්ථර අතරින් හමුවී ඇත (රූප 474). අස්ථිවලින් නිර්මිත මෙවලම් අතරින් බහුතරය අස්ථි තුඩු (bone points) වේ (රූපය 475). ඒවා රූපීය ලක්ෂණ අතින් බොහෝ විවිධත්වයක් දරයි. ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයින් මෙම අස්ථි තුඩු ඊතල හිස්, සත්ත්ව සම් සිදුරු කිරීම, ගොළුබෙල්ලන්ගේ මාංශය ඉවතට ගැනීම, මසුන් බෑම ඇතුළු පුළුල් පරාසයක අවශ්‍යතාවයන් සඳහා භාවිත කරන්නට ඇති බව අනුමාන කළ හැකි ය. ආචාර්ය ඩබ්ලිව්. එච්.



රූපය 474. සත්ත්ව අස්ථි කොටස් පැතලි කොට නිර්මාණය කළ මෙවලම්, බෙලි ලෙන
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 475. අස්ථි තුඩු, බෙලි ලෙන
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

විජයපාල ඔහුගේ ආචාර්ය නිබන්ධයේ ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් අස්ථි මෙවලම්වල හැඩයන් පිළිබඳවත්, ඒවායේ වර්ගීකරණය පිළිබඳවත් සාකච්ඡා කොට ඇත (Deraniyagala, 1992; Wijayapala, 1997; මනමේන්ද්‍ර-ආරච්චි සහ අදිකාරි, 2012). ඊට අමතරව ගෝන, කුළු හරක් හෝ ගවර යන සතුන්ගේ පහළ ඇන්දේ කෑන්තක දත් රළු මතුපිටක අතුල්ලා උරච්චි කොට තනාගත් වස්තූන්ද කුමන අවශ්‍යතාවයක් සඳහා භාවිත කළාද යන්න සැක සහිත ය. ඒවාහි සියුම් කැපුම් දාර ඇති බැවින් බොහෝ විට කපන මෙවලම් ලෙස භාවිත කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය (Deraniyagala, 1992; Wijayapala, 2010; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012; Manamendra-Arachchi *et al*; 2013; Manamendra-Arachchi & de silva, 2014; මනමේන්ද්‍ර-ආරච්චි ඇතුළු පිරිස, 2013) .

විශේෂයෙන්ම වියළි කලාපයේ පහතරට පිහිටි ගල්ගුහාවල වූ 'ගුහා චිත්‍ර' ප්‍රාග් ඓතිහාසික යුගයේ අඳින ලද චිත්‍ර ද? (Nandadeva, 1986; Somadeva, 2012). මෙම ගුහාචිත්‍ර සමහර කර්තෘවරුන් විසින් ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ලෙස හැඳින්වීමට පෙළඹුණද ඒවා අදවන තෙක් විද්‍යානුකූල ක්‍රමවේදයකට කාලනීර්ණය කර නොමැත (Deraniyagala, 1992). එමෙන්ම මෙම ගුහා චිත්‍ර අලු කෙළ සමඟ මිශ්‍ර කොට වැඳි කාන්තාවන් තම කාලය ගත කිරීම සඳහා අඳින ලද ඒවා බැව් වාර්තාගත කොට ඇත (Seligmann & Seligmann, 1911). ඒ අනුව මේ ගුහා චිත්‍ර මෙරට විසූ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සිතුවම් බැව් හඳුන්වාදීමට තරම් අප සතු සාධක ප්‍රමාණවත් නොවේ. එසේ වුවද ගල් බිත්ති මතුපිට සූරා නිර්මාණය කරන ලද සමහර සංකේත හා අලි ඇතුන් ඇතුළු සත්ත්ව රූප දොරවක ලෙන ගල් ආවරණයේ දැකගත හැකිය. ඒවා ප්‍රාග් ඓතිහාසික හෝ පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් වීමට ඉඩකඩ ඇති බැව් ආචාර්ය ඩබ්.ඒච්. විජයපාල ප්‍රකාශ කොට ඇත (W.H. Wijayapala in Deraniyagala, 2000).

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ ශවෝපාචාර විධි පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට ලාංකීය පුරාවිද්‍යාඥයන් සමත්ව ඇත. රාවණා ඇල්ල ගල් ගුහාවේ ප්‍රාග් ඓතිහාසික සන්දර්භයකින් අනාවරණය කරගත් මානව ලලාට අස්ථිය ඇතුළත හා පිටත යන දෙපැත්තෙහිම සිදුරු දෙකකි. අර්ධ ලෙස විද ඇති මෙම සිදුරු එකිනෙක හා වී නොමැත. රතු ගුරුගල් අංශු මෙම ලලාට අස්ථියේ ඇතුළත ප්‍රදේශයේ තවරා ඇත. මෙය යම් ආදාහන චාරිත්‍රයක් ලෙස පුරාවිද්‍යාඥයින් විශ්වාස කරනු ඇත. මීට අමතරව බටදොඹලෙන අදින් වසර 37,000 ක සන්දර්භයකින් හමුවුණු කහ ගුරුගල් ආලේපිත මානව කශේරුකා හා ෆාහියන් ලෙනෙන් අදින් වසර 7,700 ක් පැරණි ගුරුගල් ආලේපිත මානව දත් සහ එම ගුහාවෙන්ම හමු වුණු අදින් වසර 5,500 ක් පැරණි රතු ගුරුගල් ආලේපිත මානව සැකිලි කොටස් මෙම මානවයින්ගේ මළවුන් හා බැඳි සිරිත් වන්නට ඇත. ප්‍රාග් ඓතිහාසික සන්දර්භ අතරින් හමුවන ඇඹරුම් ගල්වල ගුරු ගල් අංශු හමුවීමෙන් මානව සැකිලි කොටස්වල ගැල්වීම සඳහා ඒවා සම්පාදනය කර ගැනීමේදී ඇඹරුම්ගල් භාවිත කරන්නට ඇතැයි මේ අනුව සිතිය හැකිය. එමෙන්ම උරච්චි කරන ලද ගුරුගල් කැබලි ප්‍රාග්ඓතිහාසික සන්දර්භවල තිබී බටදොඹලෙන හා පොත්ගුල් ලෙනෙන් හමුව ඇත (රූපය 476). මීට අමතරව උරච්චි කරන ලද මිනිරන්, සුදු හුණු හා මයිකා ආදිය ඇඹරුම් ගල් ආශ්‍රිතව හමුවීමෙන් පැහැදිලි වන්නේ ඔවුන් එම අංශු ද භාවිත කළ බව ය (Deraniyagala, 1992; Saldin & Manamendra-Arachchi, 2010; අදිකාරි සහ මනමේන්ද්‍ර-ආරච්චි, 2012).




රූපය 476. රත්පැහැ ගුරුගල් ආලේපිත හිස් කබල් කොටසක්, පොත්ගුල් ලෙන (පරිමාණ රේඛාව මි.මී. 10 කි) (ඡායාරූපය: අයි.එස්. මදනායක)

ප්‍රාග් ඓතිහාසික සොහොන් පිළිබඳ තොරතුරු බෙල්ලන්බැඳිපැලැස්ස (පුද්ගල සංඛ්‍යාව 30 ක් පමණ, අදින් වසර 12,000 ක් පමණ පැරණි), බටදොඹලෙන (පුද්ගල සංඛ්‍යාව 24 ඉක්මවයි, අදින් වසර 36,000-18,500 ක් පමණ පැරණි), ෆාහියන් ලෙන (පුද්ගල සංඛ්‍යාව 9 ඉක්මවා ඇත, අදින් වසර 38,000, 37,000, 29,000, 8,000, 7,000, 5,500 ක් පමණ පැරණි), බෙලි ලෙන (පුද්ගල සංඛ්‍යාව 12 ඉක්මවයි, අදින් වසර 15,000 ක් පමණ පැරණි) යන වාසස්ථානවලින් හමුවී ඇත. මෙම සොහොන්වල පොදුවේ ගැහැනුන්ට හා පිරිමින්ට අයත් වයස අවුරුදු 23-25 ක් දක්වා වූ වයස් පරතරයක සැකිලි හමු වේ. ඒ අතර ළදරුවන් හා ළමයින්ද විය. මෙම සැකිලි ඔවුන් වාසය කළ වාසස්ථානවලම එහි වූ සත්ත්ව අස්ථි, බෙලි කවච කොටස් හා උද්භිද විද්‍යාත්මක අවශේෂ ආදිය සමඟ තැන්පත් කොට ඇත. මෘත ශරීර තැන්පත් කොට ඇත්තේ නොගැඹුරු වටකුරු වළවල් තුළ ය.


ෆාහියන් ලෙන, බටදොඹලෙන, පොත්ගුල් ලෙන, අලු ලෙන ආදි ප්‍රාග් ඓතිහාසික ගුහා කැණීම් මගින් තැන තැන විසිරී ඇති මානව සැකිලි කොටස් රාශියක් හමුවී ඇත. මෙම කොටස් අතරින් කැපුම් හා තැලුම් සලකුණු සහිත පිළිස්සුණු හිස්කබල් කොටස්, යටිහනු, ඇඟිලි පුරුක්, පර්ශු මෙන්ම ගාත්‍රා කොටස් ද විශේෂයෙන් හමුවේ. මේවා මෙම මානවයින්ගේ ආහාරයේ ශේෂ වූ අනෙකුත් සත්ත්ව අස්ථි කොටස් සමඟත්, අලු සහ අඟුරු සමඟ මිශ්‍රව හමුවීමත් සාකච්ඡාවට බඳුන් කළ යුතු වැදගත් කරුණු බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. 2012 දී කළ ෆාහියන් ලෙන කැණීමෙන් අළු තට්ටුවක් සමඟ සම්මිශ්‍රව දිගු අතට පළා, පුළුස්සා ඇති ගාත්‍රා සැකිලි කොටස් බොහෝමයක් හමු විය (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ජූඩ් පෙරේරා මහතා සමඟ කළ සාකච්ඡා ඇසුරෙනි, 2013). මෙම කරුණුවලින් සනාථවනුයේ 'බලංගොඩ මානවයින් මිණීමස් කෑ බව' ද? එය එසේ වීමට බොහෝ ඉඩකඩ ඇති වුවද ඒ බව සනාථ කිරීම සඳහා තවදුරටත් පර්යේෂණ සිදු කළ යුතු බැව් යෝජනා කරමු. වැද්දන් මියගිය පුද්ගලයින්ගේ වියළන ලද අක්මා කොටස් තම මඩිස්සලයේ තබාගෙන යම් යම් අවස්ථාවලදී දත්වලින් හපන බැව් සඳහන් ය (Seligmann & Seligmann, 1911).

මේ වන විට කරන ලද කැණීම් මගින් අනාවරණය කොට ගෙන ඇති බලංගොඩ මානව පුද්ගල (සැකිලි හා සැකිලි කොටස් මගින් ගණනය කොට ඇති) සංඛ්‍යාව අවම තරමින් 75 ක් පමණ වේ. එම මානව අවශේෂ අදින් වසර 38,000-5,500 අතර කාලපරිච්ඡේදයට අයත් ය (Deraniyagala, 2007).



රූපය 477. ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් මානවයෙකුගේ උඩු කය. කැණීම්වලින් ලද මානව අවශේෂ අනුව ප්‍රතිනිර්මාණය කොට ඇත. (රූපසටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


මෙරට ක්ෂුද්‍ර ශිලා යුගයේ මානවයාගේ භෞතික මානව විද්‍යාත්මක ලක්ෂණ ආචාර්ය පී.ඊ.පී. දැරණියගල හා කේ.ඒ.ආර්. කෙනඩි විසින් අධ්‍යයනය කොට ඇත (Deraniyagala, 1958; Deraniyagala, 1963; Deraniyagala, 1971; Kennedy, 1965; Kennedy, 2000; Kennedy *et al.*, 1986, Kennedy, 1987). ඇස්තමේන්තු කර ඇති පරිදි මෙම බලංගොඩ මානව පිරිමින් සෙ.මී. 174 ක්ද, ගැහැනුන් සෙ.මී. 166 ක් ද උසින් යුක්ත වේ. කපාල ධාරිතාවය පිරිමින්ගේ ඝන සෙන්ටිමීටර් 1,600 ක්ද, ගැහැනුන්ගේ ඝන සෙන්ටිමීටර් 920 ක් ද වේ. හිස්කබල ඝනකමින් වැඩිය. පුරුෂයින්ගේ ඇසට ඉහළ කලාපය (ඇහිබැම අයත් ලලාට අස්ථි පෙදෙස) ඉදිරියට නෙරා ඇත. පිරිමින් හා ගැහැනුන්ගේ නාසය හා තල්ල පළල් ය.



රූපය 478. බලංගොඩ මානවයෙකුගේ චාර්වක දතක්. අලවල පොත්ගුල් ලෙන (පරිමාණ රේඛාව මි.මී. 10 කි) (ඡායාරූපය: අයි.එස්. මදනායක)


පහළ හනුව ශක්තිමත් හා දැඩි වේ. නිකට පැහැදිලිව නෙරා ඇත (රූපය 477). විශේෂයෙන්ම චාර්වක දත් අසාමාන්‍ය ලෙස විශාල අතර අනෙකුත් දත් ද විශාල ය. චාර්වක දත්වල දන්ත මස්තක කලාපය වර්ග මි.මී. 713-700 ක් වන අතර එය ව්‍යුහවිද්‍යානුකූලව දකුණු ආසියානු නූතන ප්‍රාග් ඓතිහාසික මානවයාගේ විශාලතම දත් වේ (රූපය 478). පිරිමින් හා ගැහැනුන්ගේ ශ්‍රෝණි මේඛලාව ප්‍රමාණයෙන් කුඩා වේ. උරපතු ඇටය විශාල වන අතර ගාත්‍රා සැකිලි ස්ථූල වේ (Deraniyagala, 1992; Deraniyagala, 2007).

භෞතික මානව විද්‍යාඥවරියක් වූ ඩයනා හෝකි (D. Hawkey) විසින් 1998 දී කළ මානව දත් පිළිබඳ පර්යේෂණයන්හි විශ්ලේෂණ ප්‍රතිඵලවලින් තෝරාගත් බලංගොඩ මානවයාට අදාළවන තොරතුරු සමහරක් පහත විස්තර කෙරේ. අවම තරමින් හොලෝසීනයේ ඇරඹුමත් සමඟ වූ කාලපරිච්ඡේදයේදී දකුණු ආසියාවේ මානවයින්ගේ දත්වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් ලෙස පිටත කලාපවල මානව දත්වලට වඩා එම කලාපය තුළම වූ මානව කාණ්ඩවල දත් ඔවුනොවුන් අතරම සමානතා ලක්ෂණ දැරූ බව හෝකි අනාවරණය කොට ගෙන ඇත. එම ආසියානු දන්ත රටාවට ඇය 'ඉන්ඩොඩොන්ට්' (Indodont) යන වදන භාවිත කරයි. ඒ අනුව බලංගොඩ මානවයා බොහෝ විට නියෝජනය කරනුයේ දකුණු ආසියාවේ ව්‍යුහවිද්‍යාත්මකව නූතන මානවයාගේ (*Homo sapiens*) මුල්ම පූර්වජ දත් රටාවකි. මේ අනුව මෙම නූතන මානවයා සම්භවය ලැබූයේ බොහෝ විට දකුණු ගිනිකොනදිග ආසියාවේ බැව් ඇයගේ මතය යි. හෝකිගේ දන්ත පර්යේෂණ හා නිරීක්ෂණයන්ට අනුව ශ්‍රී ලංකාවේ බලංගොඩ මානවයාගේ මුල්ම දන්ත ලක්ෂණ 'අප්‍රිකාවෙන් නික්මයාමේ න්‍යාය' ට එරෙහි හා විවාදාත්මක වනු ඇත. බලංගොඩ මානවයාගේ දත් දකුණු ආසියාවේ සියලුම ජන කණ්ඩායම්වල දත්වලින් වෙනස් වේ. නමුත් බලංගොඩ මානව දත් සිංහල හා දමිළ ජනයාගේ දත්වලට වඩා වැදි (රූපය 479) දත්වලට වඩාත් සමාන වේ. මෙහිදී කතාබහට ලක්විය යුතු වැදගත්ම සංසිද්ධිය වනුයේ දකුණු ආසියානු අනෙකුත් සියලුම මානව කාණ්ඩවලට වඩා වැද්දන්ගේ දත් බලංගොඩ මානවයාගේ දත්වලට සමාන වීමයි. මෙමඟින් පෙන්නුම් කරනුයේ බලංගොඩ මානවයා හා වැද්දන් අතර වූ ජානමය අඛණ්ඩතාවයයි. වැද්දන්ගේ පුරශ්චාර්වක හා චාර්වක දත් බලංගොඩ මානවයාගේ එම දත්වලට වඩා ප්‍රමාණයෙන් කුඩා වේ. බොහෝ විට එයට හේතු වන්නට ඇත්තේ වැද්දන් තම යැපීම් රටාව විස්ථාපනය කිරීම විය හැකිය. කෙසේ වුවත් බලංගොඩ මානවයා කිසිවිටෙකත් වැද්දන්, සිංහල හා දමිළ මිනිසුන්ට රූපීයව සමානතා පෙන්නුම් නොකරනු ඇත. එමෙන්ම වැද්දන් අධික ලෙස සිංහල හා දමිළ ජනයා සමඟ මිශ්‍රව ඇත. දකුණු ඉන්දියාවේ ගෝත්‍රික ජනයාට සමස්ත දකුණු ආසියානු ජනයාගෙන් කිට්ටුම



රූපය 479. ශ්‍රී ලංකාවේ වැද්දන්. වම්පස පුරුෂයෙකු හා දකුණුපස ගැහැණියෙකු වේ.
(ඡායාරූප උපුටාගැනීම **Sarasin and Sarasin, 1892-93**)

ආචාර්ය සිරාන් උපේන්ද්‍ර දැරණියගල



ආචාර්ය සිරාන් දැරණියගල උපත ලැබුවේ **1942** මාර්තු මස **1** වන දින රත්නපුරයේදී ය. ඔහුගේ මව ප්‍රීති මොලමුරේ වූ අතර පියා ආචාර්ය පී.ඊ.පී. දැරණියගල විය. නැසීගිය පී.ඊ.පී. දැරණියගල යනු කොළඹ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික අධ්‍යක්ෂක ය. ඔහු සත්ත්ව විද්‍යාව, ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව ආදී ක්ෂේත්‍ර කිහිපයකම කෙළ පැමිණි විද්වතෙකු වූ අතර, දක්ෂ චිත්‍ර ශිල්පියෙකු මෙන්ම සටන් ක්‍රමෝපායයන් ප්‍රගුණ කළ සුවිශේෂී චරිතයකි. කුඩා සිරාන් පුතුට තම පියාගේ ආභාසය නොඅඩුව ලැබෙන්නට ඇතුවාට කිසිදු සැකයක් නැත.

ගල්කිස්ස සාන්ත තෝමස් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ ආචාර්ය සිරාන් දැරණියගල තම ශාස්ත්‍රවේදී උපාධිය හා විද්‍යාපති උපාධිය, ගෘහනිර්මාණ ශිල්පය (වාස්තු විද්‍යාව) හා සංස්කෘත භාෂාව යන විෂයයන් යටතේ **1963** හා **1966** යන වසරවලදී කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයෙන් ලබා ගන්නා ලදී. ඉන් අනතුරුව පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව **1965** දී ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් සම්පූර්ණ කරන ලදී. එම වසරේ දක්ෂතම පුරාවිද්‍යා ශිෂ්‍යයාට හිමි වන 'ගෝල්ඩන් චයිල්ඩ්' සම්මානය දිනා ගත්තේ සිරාන් දැරණියගල ය. ආචාර්ය දැරණියගල තම දර්ශනශූරි (ආචාර්ය) උපාධිය **1988** දී හාවර්ඩ් විශ්ව විද්‍යාලයෙන් ලබාගත් අතර එම නිබන්ධය ***'Prehistory of Sri Lanka: An Ecological Perspective'*** යන මැයෙන් සම්පාදිත විය. එම නිබන්ධය වෙළුම් දෙකක් ලෙස **1992** දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඇමරිකන් ඇන්ත්‍රොපොලොජිස්ට් නම් ප්‍රකාශනය මෙම නිබන්ධය පිළිබඳ විචාරයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශකර සිටියේ 'මෙම ග්‍රන්ථය ඉදිරි දශක කිහිපයටම දකුණු ආසියාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව පිළිබඳ වූ මව් පොත වන බව ය.

1964-1976 යන කාලපරිච්ඡේදයේ ආචාර්ය දැරණියගල එංගලන්තය, ප්‍රංශය, ඉන්දියාව ආදී රටවල අග්‍රගන්‍ය පුරාවිද්‍යාඥයින් යටතේ විශේෂයෙන්ම ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව සම්බන්ධයෙන් දැඩි න්‍යායාත්මක හා ප්‍රායෝගික ශික්ෂණයක් ලබා ගන්නා ලදී. මෙතුළින් ලද අත්දැකීම් ඔහු ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාවට දායාද කර දීමේ ප්‍රතිඵලයක් ලෙස මෙරට ඉතිහාසයේ සැඟවී හෝ අධ්‍යයනය නොකළ මංපෙත් එළිපෙහෙලි කිරීමට හැකි විය.

1968 දී එතුමා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූයේ සහකාර කොමසාරිස්වරයෙකු ලෙස ය. කැණීම් අංශයේ ප්‍රධානියා ලෙස ඔහු හමුවේ වූ ප්‍රධානතම අභියෝගය වූයේ පර්යේෂණ කැණීම් හා

ගවේෂණ සැලසුම් කිරීමත්, ඒවා දියත් කිරීමත් ය. ඒ අනුව එතුමා **1983-1992** කාලපරිච්ඡේදය තුළ එම දෙපාර්තමේන්තුවේ කැණීම් උපදේශක ලෙස කටයුතු කළ අතර **1992** දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස පත්වීම් ලැබ එම දෙපාර්තමේන්තුවේ ශාස්ත්‍රීය පසුබිම ඉතා ඉහළ මට්ටමකට ගෙන ඒමට සමත් විය. මෙහිදී දේශීය මෙන්ම විදේශීය ආයතනවල සහයෝගයෙන් හා ආභාසයෙන් 'ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය' සකස් කිරීම එතුමා විසින් සිදු කළ මාහැඟි කර්තව්‍යයන් අතරින් එකක් ලෙස සඳහන් කළ හැකි ය.

සිරාන් දැරණියගලගේ මූලිකත්වයෙන් අනුරාධපුර ඇතුල් නුවර ප්‍රධාන කැණීම් **13** ක් සිදු කරන ලදී. එහිදී අංගාර කාලනීර්ණ පිළිබඳව විශේෂ උනන්දුවක් දැක්වූ ඔහු එම කැණීම් මගින් හමුවූ මැටි බඳුන් ඇතුළු අනෙකුත් මැටි බඳුන්, උළු ආදි මැටියෙන් නිෂ්පාදිත පුරාවස්තූන් හඳුනාගැනීම හා වාර්තාකරණය පහසු කරවීම සඳහා 'දර්ශාවලියක්' (**pottery typology**) සකස් කිරීම මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සිදු කරන ලද ඉතා වැදගත් ශාස්ත්‍රීය කර්තව්‍යයකි. එමෙන්ම මහාවංශය ඇතුළු ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ලියැවුණු මුල් සාහිත්‍ය කෘතිවලට සමගාමීව අනුරාධපුර ඇතුල් නුවර සිදු කළ පර්යේෂණ කැණීම් මගින් ඉතිහාසයේ නව කාලවකවානු හා එතෙක් පැවති යම් මත පිළිබඳ විද්‍යාත්මක දත්ත හෙළිදරව් කරන ලදී.

දැරණියගලගේ පුරාවිද්‍යා දිවියේ වඩාත්ම කැපී පෙනුණ ක්ෂේත්‍රය වූයේ ප්‍රාග් ඓතිහාසික යුගය හා බැඳුණු පර්යේෂණයන් ය. බුන්දල පතිරාජවෙල හා වැල්ලෙගංගොඩ කැණීම්වල ප්‍රතිඵලයක් වශයෙන් මෙරට ප්‍රාග් ඓතිහාසික යුගය අදින් වසර **1,25,000** ක් හෝ ඊටත් එපිට එනම් අදින් වසර **5,00,000** ක් තරම් ඈතට දිවෙන බැව් ඔහු විසින් අනාවරණය කරන ලදී. ඊට අමතරව දැරණියගල විසින් මෙහෙයවූ හා උපදේශකත්වය ලබාදුන් කැණීම් අතරින් බුලන්සිංහල ෆාහියන් ලෙන, කුරුවිට බටදොඹ ලෙන, කිතුල්ගල බෙලි ලෙන, අත්තනගොඩ අලු ලෙන, කැගල්ල දොරවක ලෙන, රාවණා ඇල්ල ගුහාව, උඩවළව ජාතික වනෝද්‍යානයේ බෙල්ලන්බැඳිපැලැස්ස, මාන්තොට පුරාණ වරාය මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු ය. එමෙන්ම රත්නපුර දියලු තැන්පතුවලින් හමුවන වඳවී ගිය සතුන්ගේ ෆොසිල සමඟ තැන්පත්ව ඇති ශිලා මෙවලම් පිළිබඳවත්, ඉරණමඩු පාංශු සංයුතිය පිළිබඳවත් දැරණියගල ඉදිරිපත් කළ අදහස් හා න්‍යායන් මෙරට ප්‍රාග් ඓතිහාසික අධ්‍යයනවල අනාගත පර්යේෂණ සඳහා විවර කළ නව දොරටු ලෙස සඳහන් කළ හැකි ය. මෙම කැණීම් හා ගවේෂණ මගින් හඳුනාගත් ශිලා මෙවලම් සඳහාද දර්ශනාවලියක් (**stone tool typology**) සකස් කිරීම ද එතුමාගේ දර්ශනශූරී උපාධි පර්යේෂණවලට සමගාමීව සිදුවිය.

ආචාර්ය සිරාන් දැරණියගල දේශීය හා විදේශීය ආයතන කිහිපයක ගරු කටයුතු සාමාජිකත්වය (**fellow**) දරයි. ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය හා ඇමරිකානු මානව විද්‍යා සංගමය මෙහි ලා විශේෂ වේ. ඔහු ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති හා සභාපති ධුරය හොබවා ඇත. එමෙන්ම ජාත්‍යන්තර ප්‍රාග් සහ ප්‍රොටෝ ඓතිහාසික සංගමයේ කවුන්සිලයේ ස්ථිර සාමාජිකත්වය ද දරනු ඇත. වසර **34** ක සේවා කාලය තුළ ඔහු විසින් මධ්‍යපුරාශිලා යුගය, ක්ෂුද්‍රශිලා යුගය, ප්‍රොටෝ ඓතිහාසික යුගය, මුල් හා මධ්‍ය ඓතිහාසික යුගය යන යුග අළලා මෙහෙයවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව **20** කි. ඒ ඇසුරින් ඔහු තම පර්යේෂණ දිවිය තුළ ප්‍රකාශයට පත් කොට ඇති ශාස්ත්‍රීය ලිපි සංඛ්‍යාව **50** ඉක්මවනු ඇත. ආචාර්ය දැරණියගල පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සිදුකරන ලද මාහැඟි ජාතික මෙහෙවරට ගරු කිරීමක් වශයෙන් **1999** දී සබරගමුව විශ්ව විද්‍යාලය මඟින් 'විශ්ව විද්‍යාලීය විද්‍යාශූරී' උපාධිය (**D. Sc**) හා **2001** දී පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් 'ශාස්ත්‍රශූරී' උපාධියෙන් (**D. Litt.**) පිදුම ලැබීය. (**Deraniyagala, 1992; Deraniyagala, 2004**; අඹන්වල, **2005/2006**).

(ඡායාරූපය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)

සමානතා පෙන්වනුයේ මෙම වැද්දන්, සිංහල හා දමිළ ජනයන් ය. එසේ වුවද මෙම මානව කාණ්ඩ තුන මානව විද්‍යාත්මක මිනුම් හා රූපවිද්‍යාත්මක ලක්ෂණ (anthropometrically and morphologically) මත එකිනෙකට වෙනස් වේ (Hawkey, 2002; Deraniyagala, 2007).

මේ වන විට පුරාවිද්‍යාඥයින් අනාවරණය කොට ගෙන ඇති සාධක අනුව ශ්‍රී ලංකාවේ පූර්ව ශිලා යුගයේ සිට ක්ෂුද්‍ර ශිලා යුගයේ නිමාව ක්‍රි.පූ. 1,30,000 සිට 1,800 පමණ කාල පරාසයක දිවෙන බැව් අප ඉහතදී සවිස්තරාත්මකව සාකච්ඡා කළෙමු. ක්ෂුද්‍ර ශිලා යුගයේ විශේෂිත ලක්ෂණයක් වූ ජ්‍යාමිතික හැඩයෙන් යුත් ක්ෂුද්‍ර ශිලා මෙවලම් අවසාන වශයෙන් වාර්තා වනුයේ අදින් වසර 3,800 දී මාන්තොට පුරාණ වරායේ සංස්කෘතික සන්දර්භවලිනි. මේ අනුව බලංගොඩ මානව සංස්කෘතියේ නිමාව ක්‍රි.පූ. 1,800 දී සිදුවන බව සනිටුහන් වේ. අප මෙතැන් සිට සාකච්ඡා කරනුයේ ක්ෂුද්‍ර ශිලා යුගය නිම වී උදාවන මුල් කෘෂිකාර්මික හා පශු පාලනය අවධිය පිළිබඳව ය. ලොව ශිලා යුගයේ සම්මත පිළිවෙල අනුව පුරාණ ශිලා යුගය, ක්ෂුද්‍ර ශිලා යුගය හා නව ශිලා යුගය ලෙස ප්‍රධාන වශයෙන් වර්ගීකරණය සිදු කොට ඇත්තේ ශිලා මෙවලම් තාක්ෂණයේ හා එම මෙවලම් සමඟ හමුවන අනෙකුත් මානව ක්‍රියාකාරකම්ද සමඟිනි. ඉහත සාකච්ඡා කළ අයුරින් අදින් වසර 17,000 කට පමණ ප්‍රථම හෝර්ටන් තැන්නේ ඕට්ස් හා බාර්ලි වගාකිරීමත්, ගව පාලනයත් යන සාධක අනාවරණය කිරීම පරාග විද්‍යාව මත පමණක් පදනම් වුවද ඒ සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන නව ශිලා යුගයට අයත් අත් පොරොවල් ශ්‍රී ලංකාවේ වෙනයම් ස්ථානයක වූ අදාළ සන්දර්භ අතරින් හමුවී නොමැත. එමෙන්ම ගව පාලනය පිළිබඳ සනාථ කිරීම සඳහා පරාග ආදි ක්ෂුද්‍ර නොවන වෙනයම් ෆොසිල සාධකද මේ වන තෙක් හෝර්ටන් තැන්නෙන් හමුවී නොමැත (Premathilake, 2003). ඒ අනුව කෘෂිකර්මාන්තය හා පශු පාලනය මූලික කරගත් නව ශිලා යුගයක සුලභ සාධක මේ වන විටත් මෙරටින් හමුවී නොමැති බැව් සඳහන් කළ යුතුව ඇත (Deraniyagala, 1992; Deraniyagala, 2004; Deraniyagala, 2007).

දොරවක ලෙනෙන් හැරුණු විට ශිලා යුගයට අයත් කිසියම් හෝ සන්දර්භයකින් මැටි බඳුන් හමුවී නොමැත. එසේ වුවද බෙල්ලන්බැඳි පැලැස්ස හා වාරණ ලෙන් කැණීමෙන් ශිලා මෙවලම් හා මැටි බඳුන් කොටස් එකම ස්ථරයකින් හමුවී ඇති බැව් වාර්තා වී ඇත. නමුත් බෙල්ලන්බැඳිපැලැස්සේ වූ එම ශිලා මෙවලම් හා මැටි බඳුන් හමුවන ස්ථරය මිශ්‍ර ස්ථරයක් බව ආචාර්ය සිරාන් දැරණියගල සඳහන් කරයි (ආචාර්ය දැරණියගල සමඟ කළ සාකච්ඡා, 2014).

ප්‍රොටෝ ඓතිහාසික යකඩ යුගය හෙවත් පූර්ව ඓතිහාසික යකඩ යුගය පිළිබඳ විනිවිද භාවයකින් යුත් මුල්ම වාර්තා හා අංගාර දින වකවානු අනාවරණය වනුයේ අනුරාධපුර ඇතුල් නුවර කළ කැණීම් මගිනි. එය ක්‍රි.පූ. 1,000-900 දී ආරම්භ වන බැව් සනාථ වී ඇත. සීගිරිය අසල අලිගල ගල් පියැස්සේ කළ කැණීම් මඟින් ලැබෙන සාධකද ඊට සමාන වේ (Deraniyagala, 1992; Karunaratne & Adikari, 1994). ඊට අමතරව දැරණියගලගේ ආරාධනය මත අනුරාධපුර ඇතුල් නුවර මහාචාර්ය රොබින් කොනින්හැම් කළ කැණීම් මඟින් ඉහත පූර්ව ඓතිහාසික යකඩ යුගයේ කාලනීර්ණයන් තවදුරටත් සනාථ වී ඇත (Coningham, 1999; Coningham, 2006; Coningham & Gunawardhana, 2013). කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යකඩ යුගයේ කාලනීර්ණයන් හා දකුණු ඉන්දියාවේ කාලනීර්ණ සමපාත වේ (Deraniyagala, 2007).

පූර්ව ඓතිහාසික යකඩ යුගය හා මුල් ගොවියෝ

ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ මූලික ලක්ෂණ අතර යකඩ තාක්ෂණය, වී වගාව, ගෘහස්ත අශ්ව හා ගව පාලනය මෙන්ම කුඹල් කර්මාන්තය, ප්‍රාග් සාක්ෂරතා ලක්ෂණ ආදිය සඳහන් කළ



රූපය 480. අනුරාධපුර ඇතුල් නුවර කැණීම් මඟින් හමුව ඇති මැටි බඳුන් මත ඇඳ ඇති පූර්ව බ්‍රාහ්මීය අක්ෂර. ක්‍රිස්තු පූර්ව 600-500 අතර කාලයට අයත් වේ (පරිමාණ රේඛාව මි.මී. 50 කි).
(Deraniyagala, 1992 ඇසුරෙන් නැවත අඳින ලදී)

හැකි ය. අප මෙහිදී ප්‍රාග් සාක්ෂරතාවය පිළිබඳව සඳහන් කිරීමට යෙදුණේ එම සමයේ මැටි බඳුන් හා සොහොන් පියන්ගල්වල වූ සංකේත මත පදනම්ව ය (රූපය 480). අනුරාධපුර ඇතුල් නුවර පූර්ව ඓතිහාසික සන්දර්භ අතරින් කිසිවිටෙකත් ශිලා මෙවලම් හමුවී නොමැත. යකඩ තාක්ෂණය සඳහා වූ අමුද්‍රව්‍ය වන යපස් මෙරට ඇති බැවින් යකඩ තාක්ෂණය සීඝ්‍රයෙන් පැතිරිණි. ඒ අනුව මෙතෙක් භාවිතයේ පැවති ශිලා මෙවලම්වල පසුබැස්මක ලක්ෂණ මෙම පූර්ව ඓතිහාසික අවධියේ සන්දර්භ අතර මනාව දැකගත හැකි ය. යකඩ තාක්ෂණයේ දියුණුවත් සමඟම ඔවුන්ට 'පොළොව' සමඟ ගැටීමට ඇති අවස්ථාව උදා විය. ඒ අනුව විශේෂයෙන්ම ජලය හිඟ වියළි කලාපයේ ජලය එක්රැස් කිරීම සඳහා 'ජලාශ' තැනීමත්, 'ජලාපවාහන' කටයුතු සඳහා ඇළ වේලි සකස් කිරීමටත් හැකි වූයේ යකඩ තාක්ෂණය නිසා ය. මේ අනුව ජල කළමනාකරණය හා වගාවන් සමඟ ඇති වුණු ස්ථිර වාසස්ථාන අනුරාධපුරයේ බිහි වීම ආරම්භ විය. වගාවන් සඳහා මහ වනාන්තර කපා හෙළීමටත්, එහි පැතිර ඇති මැටි සහිත ලෝම් රතුවන් දුඹුරු පස අවශ්‍ය පරිදි මෙහෙයවීමට වඩාත් කාර්යක්ෂම වනුයේ ශිලා මෙවලම් නොව යකඩ මෙවලම් ය. මෙම සමස්ත ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස පූර්ව ඓතිහාසික යකඩ යුගයේදී කෘෂිකර්මාන්තය මත පදනම් වූ ආර්ථිකයක් බිහිවිය (Deraniyagala, 1992; Deraniyagala, 2007). හේන් වගාවට සමගාමීව වී වගාවද දියුණු වූ බැවින් අනුරාධපුරය ඇතුළු වියළි කලාපයේ යැපීම් ධාරිතාවය ඉහළ මට්ටමක පවතින්නට ඇත. ඒ අනුව සමාජ-ආර්ථික සංකීර්ණතාවය ඉහළ තලයක් කරා යාම සිදු විය. ඉන්දියාවේ උතුරේ හා දකුණේ මේ සමාජ තත්ත්වයන් එලෙසම ක්‍රි.පූ. 1,200 දී පැවතිණ.

ක්‍රි.පූ. 900 දී අනුරාධපුරයේ පැවති පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් ජනාවාසය හෙක්ටයාර 10 ඉක්මවන වපසරියක පැතිරී තිබුණු අතර ක්‍රි.පූ. 700-600 වන විට අවම තරමින් හෙක්ටයාර 50 ක් වත් වන්නට ඇති බවට ඇස්තමේන්තු කොට ඇති නිසා එය 'නගරයක්' ලෙස හැඳින්වීමට තරම් බිම් ප්‍රමාණයක් යැයි දැක්විය හැකි ය. අනුරාධපුර ඇතුල් නුවර (රූපය 481) හැරුණු විට පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් සංස්කෘතික තැන්පතු ශ්‍රී ලංකාවේ තරමක් විරල ය. ඉතා සුළු තැන්පතු ඇති අලිගල, තිස්සමහාරාමයේ සඳගිරිය ඇතුළු ස්ථාන යම් ආකාරයකට මීට සහාය කරගත හැකි ය. අනෙකුත් ස්ථාන වනුයේ කන්තරොඩෙයි හා මාන්තොට පුරාණ වරාය යි. ශ්‍රී ලංකාවේ පූර්ව



රූපය 481. අනුරාධපුර ඇතුල් නුවර ගෙඩිගේ අසල භූමි දර්ශනය.
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

නවශිලා යුගය/තාම්‍රශිලා යුගය (Neolithic/Chalcolithic period)

මෙරට ඉතිහාසය පිළිබඳ සිදුවීම් පෙළෙහි යුග බෙදීම් අනුපිළිවෙල මධ්‍ය පූර්ව ශිලා යුගය, ක්ෂුද්‍ර ශිලා යුගය, පූර්ව ඓතිහාසික යකඩ යුගය, මුල් ඓතිහාසික යුගය, මධ්‍ය ඓතිහාසික යුගය යනාදි වශයෙන් දැක්විය හැකි ය (යුග බෙදීම් පිළිබඳ විස්තරයක් මෙම පරිච්ඡේදයේ පශ්චාත් කොටසේ දක්වා ඇත). මෙම පරිච්ඡේදයේදී අප වැඩි අවධානය යොමු කොට ඇත්තේ ක්ෂුද්‍ර ශිලා යුගය හා පූර්ව ඓතිහාසික යකඩ යුගය පිළිබඳ වුවද ශ්‍රී ලංකාවේ ඉතිහාස සිදුවීම් පෙළෙහි නවශිලා යුගයක හා තාම්‍රශිලා යුගයක සාධක ඇත්දැයි සාකච්ඡා කිරීම වැදගත් යැයි සිතමු.

ඉහත ඡේදවල සාකච්ඡා කළ පරිදි ශ්‍රී ලංකාවේ ප්‍රාරම්භක වගාවන් පිළිබඳ සාධක හෝර්ටන් තැන්නෙන් අනාවරණය වී ඇත. හෝර්ටන් තැන්නෙන් හමුව ඇති බාර්ලි හා ඕට්ස් පරාග මේ සඳහා අප සතුව ඇති සාධකයන් ය. බාර්ලි හා ඕට්ස් වගාව (ක්‍රි.පූ. **15,000** දී පමණ) මෙන්ම, මෙම වගාව සමඟ සතුන් (? ගවයින්, ***Bos indicus***) ඇති කිරීම (ක්‍රි.පූ. **8,000** දී පමණ) සිදුකළ බවට සාධක හෝර්ටන් තැන්නෙන් වාර්තා වේ (**Premathilaka, 2003**). එමෙන්ම දොරවක ලෙනෙහි ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් සමඟ ධාන්‍ය හා රළු රක්තවර්ණ වළං හමුවීම (ක්‍රි.පූ. **5,300** දී පමණ) සහ කාලරක්ත වර්ණ මැටි බඳුන් හමුවීම (ක්‍රි.පූ. **3,100** දී පමණ) ශ්‍රී ලංකාවේ නවශිලා යුගයක සාධක ලෙස පිළිගැනීමට ඇතැම් උගතුන් පෙළැඹී ඇත (**W.H. Wijayapala in Deraniyagala, 2000**). ක්‍රිස්තු පූර්ව **1,800** ට කාලනීර්ණය වී ඇති මාන්තොට පුරාණ වරායේ ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් හමුවන ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් සංස්කෘතික ස්ථරයෙන් තඹ බොර කොටස් කිහිපයක් ද හමුවී ඇත. එමඟින් පුරාණ ශ්‍රී ලංකාවේ පැවති තඹ නිස්සාරණ ක්‍රමවේදය පිළිබඳ යම් අදහසක් ලබාගත හැකි ය. ඉන්දියාවේ තඹ නිස්සාරණ ඉතිහාසය ක්‍රි.පූ. **2,000** තරම් ඈතට දිවේ (එය ක්‍රි.පූ. **1,800-1,200** ලෙසද දක්වා ඇත). එමෙන්ම මාන්තොට ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් ස්ථරයෙන් එළුවන්ට (***Capra aegagrus hircus***) අයත් සාධක හමුවීම තුළින් සත්ත්ව ගෘහස්ථකරණය පිළිබඳ යම් ඉඟියක් ද අප සතුව ඇත.

ඉහත ස්ථාන තුනෙහිම වූ ජනාවාස ලක්ෂණ අනුව සතුන් ඇති කිරීම හා ගොවිපළ (**herding/farming**) පවත්වාගෙන යාම මූලික කරගත් යැපීම් ක්‍රමවේදයක් පැවති බවට සාධක නොමැත. 'පූර්ව ඓතිහාසික' යන වදනෙහි අර්ථයත් සමඟ ගත් කළ ඔවුන්ගේ ආහාර නිෂ්පාදනයෙන් (පෝෂකවලින්) අඩකට වඩා සතුන් ඇති කිරීමෙන් හා ගොවිපළවලින් සපයාගත යුතු යැයි උපකල්පනය කළ විට ඉහත ස්ථාන තුනෙහි දත්ත ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වේ. නමුත් එම අවධිය ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ප්‍රොටෝ ඓතිහාසික යුගය දක්වා වූ සංක්‍රාන්ති අවධියක් ලෙස සඳහන් කළ හැකි ය. ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ සිදුවීම් පෙළෙහි දළ වශයෙන් අවසාන වසර **13,000** ක දීර්ඝ කාලය මෙතෙක් පර්යේෂණ නොකෙරුණු ක්ෂේත්‍රයකි. අවම වශයෙන් ක්‍රි.පූ. **15,000** සිට ක්‍රි.පූ. **1,000** දක්වා කාලය තුළ මානවයා වාසය කළ පාරිසරික තත්ත්වයන් හා වාසස්ථාන යටතේ එකිනෙක වෙනස් යැපීම් ක්‍රමවේදයන් එකවර භාවිත කරන්නට ඇත. මෙම යැපීම් ක්‍රමවේදයන් අතරින් **100%** ක්ම පාහේ දඩයම් කිරීම හා එකතු කිරීම මත පදනම් වූ අතර එය එක්තරා ප්‍රමාණයකට සතුන් ඇති කිරීම හා වගාකිරීම මත යැපුණු ක්‍රමවේදයක් දක්වා වූ පරාසයක් තුළ විහිදුණි. නමුත් ඔවුන්ගේ යැපීම් ක්‍රමවේදයේ මූලික ස්ථානය ගනු ලැබුවේ සතුන් දඩයම් කිරීම හා එකතු කිරීමයි (**Deraniyagala, 2007**).

සේරුවිල (පුරාණයේ 'තම්බපිත්ත' යනුවෙන් හැඳින්වූ) තඹ නිධිය පිළිබඳ අප ඉතා කෙටියෙන් හෝ අදහස් ප්‍රකාශ කළ යුතුව ඇත. ශ්‍රී ලංකාවේ පුරාණ තඹ නිස්සාරණ ක්‍රියාවලිය පිළිබඳ පර්යේෂණ සිදු කරන කැලණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය අර්ජුන තන්තිලගේ දැක්වූ අදහස් සංක්ෂිප්ත කොට මෙම පරිච්ඡේදයට ඇතුළත් කිරීම වඩාත් යෝග්‍ය යැයි සිතමු. දකුණු ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ සිට දකුණට වන්නට පිහිටා ඇති එකම තඹ නිධිය ශ්‍රී ලංකාවේ සේරුවිල වූ තඹ නිධිය යි. පුරාණ සුසාන භූමි සංදර්භවල තඹ කොටස් හමු වන බැවින් ශ්‍රී ලංකාවේ තඹ යුගයක තොරතුරු ගවේෂණය කිරීම සඳහා මෙගලිතික සොහොන් පිළිබඳ අධ්‍යයනය කිරීම වඩාත් වැදගත් බැව් ආචාර්ය තන්තිලගේ ප්‍රකාශ කරයි. පොම්පරිප්පු බරණි සොහොන්, ක්ෂුද්‍ර ශිලා යුගයේ සිට පූර්ව ඓතිහාසික යකඩ යුගය දක්වා වූ සංස්කෘතික පරිවර්තනය අධ්‍යයනය කිරීම සඳහා වඩාත් වැදගත් බැව් ඔහුගේ මතය වේ. එමෙන්ම 'මෙගලිතික සොහොන් හා මෙගලිතික සංස්කෘතිය' පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න දක්වා ඇති අයුරු පොම්පරිප්පු හි පිහිටි බරණි සොහොන් ක්‍රි.පූ. **800-1,000** ට පමණ අයත් වේ. ඔහු එසේ ප්‍රකාශ කරනුයේ ඉන්දියානු සුසාන කාලනීර්ණයන් සමඟ සංසන්දනය කිරීමෙනි (**Seneviratne, 1984**). ආචාර්ය තන්තිලගේ **2008** දී ***Protohistoric copper metallurgy in Sri Lanka an overview*** යන ශාස්ත්‍රීය ලිපිය මඟින් ශ්‍රී ලංකාවේ පුරාණ තඹ භාවිතය, මෙගලිතික සොහොන් හා පූර්ව ඓතිහාසික යකඩ යුගය පිළිබඳ සාකච්ඡා කොට ඇත (**Thantilage, 2008**).

වර්තමානයේ ආචාර්ය තන්තිලගේ විසින් කරනු ලබන පර්යේෂණවලදී විශේෂ අවධානය යොමු කරනුයේ සේරුවිල තඹ බොර සමඟ ශිලා මෙවලම් හමුවීම, පොම්පරිප්පු බරණි සොහොන් තුළ තඹ නිර්මාණ හා ශිලා මෙවලම් හමුවීම, එමෙන්ම පූර්ව ඓතිහාසික යකඩ යුගයට පෙරාතුව තඹ භාවිතය පැවතියේද? යන්න පිළිබඳවයි. මේ අනුව ඔහුගේ පර්යේෂණවල මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තාම්‍රශිලා යුගයක් පැවතියේද සොයාබැලීමයි.

ආචාර්ය තන්තිලගේට අනුව බෙග්ලි ඇතුළු පිරිසගේ පොම්පරිප්පු කැණීමෙන් ලද ලෝහ වස්තූන් අතර බහුතරය තඹ වීම අතිශය වැදගත් වේ (**Begley *et al.*, 1981**). එමෙන්ම ගුරුගල්හින්න මෙගලිතික සොහොන් තුළින් යකඩ හමුනොවන බවත්, එහි හමුවන්නේ තඹ කොටස් පමණක් බවත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂවරයෙක් වූ රාජා ද සිල්වා මහතා **1970** දී ප්‍රකාශ කොට ඇති බව ඔහු අවධාරණය කරයි. මීට සමානම සාධක ඉබ්බන්කටුව සොහොන්වලින් ද හමුවන අතර එහි යකඩ කොටස්වලට වඩා තඹ කොටස් බහුල වේ. ගල්අතර සොහොන්වලින් තඹ හා යකඩ කොටස් හමුවී ඇත. ගුරුගල්හින්නෙන් හමුවන්නේ තඹ පමණි. එසේ වුවද අනිල්කොඩායි හි තඹවලට වඩා යකඩ කොටස් හමුවේ. අනුරාධපුර ඇතුල් නුවර කැණීමෙන් ලද තඹ හා යකඩ කොටස් අනුව එහි ක්‍රි.පූ. **5-6** යන සංස්කෘතික සන්ධර්භ අතරින් තඹ නිස්සාරණය පිළිබඳ සාධක අනාවරණය කෙරේ (**Deraniyagala, 1972**). එමෙන්ම අලිගල ගුහාවේ පහළ තැන්පතු ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් වුවද එහි යබොර ද හමුවේ (**Karunaratne & Adikari, 1994**). කෙසේ වුවද ආචාර්ය තන්තිලගේ ට අනුව යකඩ කර්මාන්තය මෙරටට පැමිණෙන්නට ඇත්තේ ඉන්දියාවෙන් ය (ආචාර්ය අර්ජුන තන්තිලගේ සමඟ කළ සාකච්ඡා ඇසුරෙන්, **2014**).

ඓතිහාසික යකඩ යුගයට අයත් 'මෙගලිතික' (Megalithic) සොහොන් සංකීර්ණ අර්ධද්වීපික ඉන්දියාව සමඟ නෑකම් කියනු ඇත. මෙම සොහොන් සම්ප්‍රදාය අංගාර කාලනීර්ණයන්ට අනුව ක්‍රි.පූ. 750-400 (මෙය ක්‍රි.පූ. 500-400 ට අයත් වන බැව්ද දැරණියගල විසින් 2007 දී ප්‍රකාශයට පත්කොට ඇත) ට අයත් බැව් ඉඛ්බන්කටුව මෙගලිතික සුසාන කැණීම මඟින් තහවුරු වී ඇත (Deraniyagala, 1992; Deraniyagala, 2007). පූර්ව ඓතිහාසික යුගයට අයත් මෙම සොහොන් සම්ප්‍රදාය අඛණ්ඩව මධ්‍ය-මූල ඓතිහාසික යුගය (Mid-Early Historic period) දක්වා පැවත එන බැව් ගල් සොහොන් කනත්ත (ක්‍රි.පූ. 112), කලඔටුවාව මැටි සොහොන් (ක්‍රි.පූ. 130) හා නිකවලමුල්ල මැටි සොහොන් (ක්‍රි.පූ. 400-200) (දිසානායක, 2011) යන සුසාන කැණීම් මඟින් තහවුරු වී ඇත. ශ්‍රී ලංකාවේ සමස්ත පූර්ව ඓතිහාසික යකඩ සංස්කෘතිය තුළ මෙම භූමදාන ලක්ෂණ හෙවත් ශවෝපචාර චාරිත්‍ර විධි (mortuary practices) තවමත් සැක සහිත ය (Deraniyagala, 2007). මෙම සුසාන පූර්ව ඓතිහාසික ජනාවාස සමග සබඳතා නොපැවත්වීම මෙහිදී සැලකිය යුතු කරුණක් බව ආචාර්ය දැරණියගලගේ මතය වේ. එක් උදාහරණයක් ලෙස ගතහොත් ඉඛ්බන්කටුව සුසාන එහි වූ ජනාවාසයට ශතවර්ෂ කිහිපයකට කලින් පැවතියකි. ඉන්දියාවේ බොහෝ ස්ථානයන්හි මෙම තත්ත්වය මීටත් වඩා අභිබවා යනු ඇත. මෙයට ප්‍රතිවිරුද්ධව අනුරාධපුර පූර්ව ඓතිහාසික යකඩ යුගයේ ජනාවාසවල මෙගලිතික සොහොන් නොමැති අතර ඒවා පිහිටා ඇත්තේ ඊට බොහෝ ඈතින් පිහිටි පෙදෙස්වල ය. මෙගලිතික සුසාන සංකීර්ණ තනන්නට ඇත්තේ බොහෝ විට අනුරාධපුරයට ඈතින් එම වටපිටාවේ ජීවත් වූ 'විශේෂිත' ජන කොට්ඨාශයක් විය හැකි බවත්, එමෙන්ම ඔවුන් එඬේරුන් බැව් අනුමාන කළ හැකි බවත් දැරණියගලගේ මතය වේ. මේ අනුව සලකා බලන කල හැඟෙනුයේ පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් මෙගලිතික සොහොන් හෙවත් මෙගලිතික ශවෝපචාර චාරිත්‍රවල කිසියම් සුවිශේෂී ගති ලක්ෂණයක් ඇති බවයි. පූර්ව ඓතිහාසික මුල් යකඩ සංස්කෘතිය ඉන්දියාවේ ගංගා නම් ගං මීටියාවතේ සිට දකුණු දෙසට ශ්‍රී ලංකාව දක්වාම පැතිර ඇත. එමෙන්ම එහි ප්‍රාදේශීය වෙනස්කම්ද දැකගත හැකිය. උගතුන් කිහිපදෙනෙකු විසින් අර්ධද්වීපික ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ මුල් යකඩ යුගයට 'මෙගලිතික සංස්කෘතිය' (Megalithic culture) යනුවෙන් වැරදි අදහසක් ලබාදී ඇති බවත්, මෙම ශවෝපචාර ගති ලක්ෂණ හා පූර්ව ඓතිහාසික යකඩ යුගය එකට සංසටක කිරීම කිසිසේත්ම අවශ්‍ය නොවන බවත් දැරණියගලගේ මතය වේ (Deraniyagala, 1992; Deraniyagala, 2004; Deraniyagala, 2007).

ඉහත ඡේදයේ දක්වන ලද ආචාර්ය දැරණියගලගේ මතයන්ට පරිබාහිර මතද, පුරාවිද්‍යාඥයින් අතර පවතින බැව් මෙහිදී අවධාරණය කිරීම යෝග්‍ය යැයි සිතමු. කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රංජිත් බණ්ඩාර දිසානායක මහතා මෙගලිතික සොහොන් පිළිබඳ පර්යේෂණවල නියැලෙන නවක පුරාවිද්‍යාඥයෙකි. ඔහු මෙතෙක් සිදු කොට ඇති ගවේෂණ හා පූර්ව ඓතිහාසික යුගයට අයත් සොහොන් කැණීම් මඟින් ලද ශාස්ත්‍රීය දැනුම මෙම ක්ෂේත්‍රයට බොහෝ වැදගත් බැව් සඳහන් කළ යුතුව ඇත. අනුරාධපුර ඇතුල් නුවර කැණීම් මඟින් මෙගලිතික සොහොන් හමු නොවූවද අභයගිරිය පරිශ්‍රයේ එම සොහොන් වාර්තා වන බැව් ඔහු ප්‍රකාශ කරයි. මෙම මෙගලිතික සොහොන් මහින්දාගමනයට පෙර සිටම එනම් ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වාදීමට පෙර ජීවත් වූ කෘෂිකර්මාන්තයට නැඹුරු ජනයාගේ සොහොන් සම්ප්‍රදායක් වේ. එවකට මෙම සොහොන් වර්මානයේ අප ඇතුල් නුවර හා පූජානගරය ලෙස හැඳින්වෙන කලාපයේත් සහ ඒ අවටත් තිබෙන්නට ඇතැයි ඔහු අනුමාන කරයි. එමෙන්ම බුදු දහම හඳුන්වාදීමෙන් අනතුරුව ඉදි වූ බෞද්ධ ඉදිකිරීම්වලදී මෙම සොහොන් ගලවා ඉවත් කරන්නට ඇතැයිද දිසානායක මහතාගේ අදහස වේ. මෙය සනාථ කරමින් ඉහත දැක්වූ ආකාරයට අභයගිරිය පරිශ්‍රයේ මෙගලිතික සොහොන් තවමත් දැකිය හැකි බැව්

අවධාරණය කරන අතරම මෙම සොහොන් හා බැඳි සංස්කෘතියට මෙගලිතික සංස්කෘතිය යනුවෙන් ප්‍රකාශ කිරීම අරුත් සහගත බැව් ද ඔහුගේ මතය වේ.

2010 දී මෙලාති සල්ඩින් 'මෙගලිතික සුසාන හා අනුරාධපුරය' (*Megalithic burials and Anuradhapura*) යන මැයෙන් ලිපියක් ලියමින් අනුරාධපුර නගරය සීඝ්‍ර විසරණය වීමත් සමඟ මෙගලිතික සොහොන්ද නගරයෙන් ඈත පර්යන්තයේ ස්ථානගත කරන්නට ඇතැයි අනුමාන කරයි. ඇය තවදුරටත් දක්වන අයුරින් මෙගලිතික 'සංස්කෘතිය' බෞද්ධ සම්ප්‍රදායන් විසින් අධිශෝෂණය කරගන්නට ඇත. එමෙන්ම අනුරාධපුරයේ මෙගලිතික සොහොන් බිම් අනතුරුව බෞද්ධ පරිශ්‍ර (ස්තූප සංකීර්ණ) බවට පරිවර්තනය වන්නට ඇති බවයි. අනුරාධපුරය ඇතුල් නුවර හා ඒ ආශ්‍රිත කලාපයේ මෙගලිතික සුසාන දුලබ වීමට හේතුව මෙය බැව් සල්ඩීන්ගේ මතය යි (Saldin, 2010).

ඉතිහාසය ගොඩනැගීමේ අරමුණින් කළ පුරාවිද්‍යාත්මක පර්යේෂණ අතරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ආචාර්ය සිරාන් දැරණියගලගේ මෙහෙයවීම යටතේ අනුරාධපුර ඇතුල් නුවර කරන ලද පර්යේෂණ කැණීම් මඟින් හෙළි වූ සාධක මත මෙරට ඉතිහාසයේ තවත් පසුගිය ශතවර්ෂ කිහිපයක තොරතුරු අනාවරණය කර ගැනීමට සමත් විය. මේ යටතේ ඇතුල් නුවර පර්යේෂණ කැණීම් වළ 13 ක් කැණීම් කළ අතර එහි ප්‍රධාන පරමාර්ථය වූයේ සංස්කෘතික ස්ථර කාලනීර්ණය කිරීමයි. එමෙන්ම එම පුරාවස්තූන් අධ්‍යයන තුළින් සංස්කෘතික පරිණාමය පිළිබඳ අදහසක් ලබා ගැනීමද තවත් අරමුණක් විය. මෙහි සිදු කළ කැණීම් වළ 13 මඟින් අංගාර කාලනීර්ණ 45 ක් ලබා ගත් අතර ඒ තුළින් සැලකිය යුතු සංස්කෘතික පරිණාමීය අදහසක් ලබා ගැනීමට පුරාවිද්‍යාඥයින්ට හැකි විය. තෙත් කලාපයේ පිහිටි ප්‍රාග් ඓතිහාසික ගල් ගුහා හා බෙල්ලන්බැඳිපැලැස්ස ආදි වියළි කලාපීය විවෘත ප්‍රාග් ඓතිහාසික මානව වාසස්ථාන කැණීම් මඟින් ක්ෂුද්‍ර ශිලා යුගය පිළිබඳව පැහැදිලි අදහසක් ලබා ගැනීමට හැකි වුවද එමඟින් ප්‍රාග් ඓතිහාසික-පූර්ව ඓතිහාසික සංක්‍රාන්ති සමය (Pre-proto transition period) පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක අනාවරණය කර ගැනීමට අපහසු ය. එයට වඩාත්ම හේතු වී ඇත්තේ එම ගුහාවල මතුපිට සංස්කෘතික ස්ථර අවුල් වීමය. තෙත් කලාපයේ ගුහාවල මතුපිට ස්ථර මත පතිතව ඇති වවුල් බෙට් හේතුවෙන් වගා කටයුතු සඳහා පොහොර ලෙස රැගෙන යාමත්, වියළි කලාපීය ගුහා තුළ සංස්කෘතික තැන්පතු පසු කලෙක භාවනානුයෝගී භික්ෂූන් වෙනුවෙන් පිළිසකර කර පූජා කිරීමත් නිසා එම සංස්කෘතික තැන්පතු ද විනාශ වී ඇත.

පූර්ව ඓතිහාසික යකඩ යුගයේ සොහොන්

අනුරාධපුරයේ මෙගලිතික සොහොන් පුළුල් වපසරියක පිහිටා ඇත. දිසානායක මහතාගේ පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස යාන් ඔය නිම්නයෙන් පමණක් මෙගලිතික සුසාන හමුවන ස්ථාන 40 කට ආසන්න ප්‍රමාණයක් සිතියම්ගත කොට ඇත. මේ අතරින් තම්මැන්නා ගොඩැල්ල, ගුරුගල්හින්න, කොක්ඇඹේ, වඩිගවැව හා ඕලු වැව විශේෂයෙන් සඳහන් කළ හැකි ය. අප විසින් ඉහත සාකච්ඡා කළ අයුරු ක්‍රි. පූ. 3 වන සියවසේදී බුදුදහම මෙරටට හඳුන්වාදීමත් සමඟ ඉදිවුණු පොකුණු, සංඝාරාම, ස්තූප හා ඊට අමතරව වැව් ඉදිවීම හා ජල ධාරිතාවය වැඩි කිරීම සඳහා වැව් පුළුල් කළ අවස්ථාවලදී එම ගල් සොහොන් බොහොමයක් විනාශ වන්නට ඇති බව දිසානායකගේ මතය වේ. ඔහු තවදුරටත් දක්වන අයුරු ධාතු වංශයට අනුව සේරුවිල ස්තූපය ඉදිකළ බැව් සඳහන් වනුයේ 'ටංකිත මඤ්ච' සුසාන භූමියක ය. ටංකිත යනු ශිලා හෙවත් ගල් ද, මඤ්ච යනු ඇඳ ලෙසද අර්ථකථනය කළ හැකිය. එයින් 'ශිලා ඇඳ' යන අරුත ගෙන දේ. ශිලා ඇඳ යනු ගල් සොහොන් ය. ඒ අනුව සේරුවිල ස්තූපය ගල් සොහොන් සුසානයක ඉඳිවූ බව කියැවේ. දිසානායක තවදුරටත් දක්වා සිටිනුයේ 'පුරාණ' මෙගලිතික

සොහොන් සම්ප්‍රදාය එවකට රාජ්‍ය අනුග්‍රහය ලැබූ 'නව' බෞද්ධ සංස්කෘතිය විසින් 'ගිල ගත්තා' විය හැකි බවයි. එය එසේ වූයේ නම් එම සොහොන් උවමනාවෙන්ම ගලවා ඉවත් කොට ඒ මත භික්ෂූන් හා බැතිමතුන් සඳහා වූ බෞද්ධ ආගමික ඉදිකිරීම් ගොඩ නගන්නට ඇත.

වඩිග වැව හා පොල්පිතිගම මෙගලිතික සුසාන හැරුණු විට ඉතිරි සියල්ලම වාගේ පිහිටා ඇත්තේ ගල් කඳු ආශ්‍රිතව ය (ගල් කඳු ලෙස හැඳින්වුවද මේවා උසින් අඩු ගිරි ශිඛර වේ). එයට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේ ගල් සොහොන් තැනීමට අවශ්‍ය වන අමුද්‍රව්‍ය හෙවත් විශාල් ගල් පතුරු සොයා ගැනීමට එය පහසුවක් වීමයි. දිසානායක මහතාගේ පර්යේෂණයන්ට අනුව මෙම මෙගලිතික සොහොන්වලින් 90% ක් පමණ පිහිටා ඇත්තේ වැව් තාවලු පෙදෙසේ ය. එම නිසා වැව් ජල මට්ටම ඉහළ යාමත් සමඟ එම සොහොන්ද ජලයෙන් යට වේ. එසේ වුවද අතීතයේදී එම සොහොන් ජලයෙන් තරමක් ඈත වියළි ස්ථානයක තනන්නට ඇතුවාට සැකයක් නැත. සොහොන් ඉදිකිරීමෙන් පසු සමයේ



රූපය 482. මෙගලිතික යුගයට අයත් ශිලා මංච සොහොන්. සොහොන් අතර වූ හිදැසෙහි මැටි බඳුන් තුළ මානව අස්ථි තැන්පත් කොට ඇත. යාන් ඔය නිම්නය (ඡායාරූපය: මධ්‍ය යාන් ඔය පුරාවිද්‍යා ගවේෂණ ව්‍යාපෘතිය)



රූපය 483. මෙගලිතික යුගයට අයත් ශිලා කේතුක සොහොන්. යාන් ඔය නිම්නය
(ඡායාරූපය: මධ්‍ය යාන් ඔය පුරාවිද්‍යා ගවේෂණ ව්‍යාපෘතිය)



රූපය 484. මෙගලිතික යුගයට අයත් ශිලා මණ්ඩල සොහොන්. යාන් ඔය නිම්නය
(ඡායාරූපය: මධ්‍ය යාන් ඔය පුරාවිද්‍යා ගවේෂණ ව්‍යාපෘතිය)



රූපය 485. මෙගලිතික යුගයට අයත් මැටි ඔරු සුසාන. නිකවලමුල්ල
(ඡායාරූපය: මධ්‍ය යාන් ඔය පුරාවිද්‍යා ගවේෂණ ව්‍යාපෘතිය)

කෘෂිකර්මාන්තය පුළුල් වීමත් සමඟ ජල අවශ්‍යතාවය මත වැව් පුළුල් කිරීමේදී වැව් තාවලුවලට ඈතින් වූ මෙම සොහොන් වඩාත්ම ජලයට සමීප වන්නට ඇතැයි ඔහු අනුමාන කරයි.

මෙම සොහොන් තනා ඇත්තේ සතර පැතිවල ඝනකම් හා පුළුල් ගල් පතුරු සතරක් රඳවා ඒ මත පියන් ගලක් රැඳවීමෙනි. මූලික වශයෙන් ගල් පතුරු 5 ක් එක් සොහොනක දැකිය හැකි වුවද සතර පැතිවල ගල් පතුරු හතරක් වෙනුවට ඊට වඩා වැඩි සංඛ්‍යාවක් පිහිටන අවස්ථාද වේ. අනුරාධපුරය ඇතුළු වියළි කලාපීය පෙදෙස් බොහෝමයක කළුගල් පර්වතවලින් ස්වාභාවිකවම ගල් පතුරු ඉවත් වේ. බොහෝ විට වියළි කලාපයේ අධික උෂ්ණත්වයත් හා ඊසානදිග මෝසමත් සමඟ දිවා කළ ඇඳ හැලෙන වර්ෂාවත් මඟින් ඒවා ක්ෂණිකව සිසිල් වීම ආදී හේතූන් මත මෙම ගල් පතුරු ගැලවීම ස්වභාවිකවම සිදු වන ක්‍රියාවලියකි. කෙසේ වුවද යකඩ තාක්ෂණයේ නියැළුණු මෙම ජනයා යකඩින් තැනූ මෙවලම් උපයෝගී කර ගනිමින් පර්වතවලින් ගල් පතුරු ඉවත් කළා ය යන්නද අනුමාන කළ හැකි ය. යාන් ඔය මධ්‍ය නිම්නයේ රඹෑව මෙගලිතික සුසාන බිමේ වූ ගල් පතුරුවල ලෝහ මෙවලම් භාවිතා කළ බවට පැහැදිලි සලකුණු පිහිටා ඇත. එසේ වුවද අනෙකුත් සුසානවල එම පතුරු ඉවත් කිරීමේදී ඇති වුණු සලකුණු දැකිය නොහැකි බැවින් දිසානායකගේ මතය වනුයේ මෙම පුරාණ මිනිසුන් ස්වාභාවික හේතූන් මඟින් වෙන්වුණු පතුරු වැඩි වශයෙන් භාවිත කරන්නට ඇති බවයි. මූලික වශයෙන් මෙම සොහොන් සෘජුකෝණාස්‍රාකාර (rectangular) හෝ ආයතාකාර (oblong) හැඩයක් දරයි (Karunaratne, 1994).


ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් වන සොහොන් ආකාර කිහිපයකි. ඉහත ඡේදයේ සාකච්ඡා කළ ගල් පතුරු 5 ක් සහිත මෙගලිතික සොහොන්වලට සිංහල බසින් ශිලා මංචෙ, ශිලා කුඩ හා ශිලා මංජුසා යනුවෙන් ව්‍යවහාර වන අතර ඉංග්‍රීසි බසින් cist burial යනුවෙන් හැඳින්වේ (රූපය 482). එමෙන්ම 'ගල් ගොඩක්' ලෙස පිහිටි සොහොන් ආකාරයක් ද වේ. ගල් ගොඩගසා තනන ලද මෙම සොහොන් ශිලා කේතුක ලෙස හැඳින්වෙන අතර ඉංග්‍රීසි බසින් ඊට cairn mounds හෝ cairn heap යනුවෙන් භාවිත වේ (රූපය 483). විශාල කරත්ත රෝදයකට වඩා පැතිරුණු වපසරියක වටකුරු හැඩයට ගල් අතුරා එහි මධ්‍යයේ ගලක් තබා තනන ලද සුසාන ශිලා මණ්ඩල සුසාන යනුවෙන් හැඳින්වෙන අතර ඉංග්‍රීසි බසින් stone circle හෝ cairn circle යනුවෙන් හැඳින්වේ (රූපය 484). වයඹදිග ශ්‍රී ලංකාවේ පොම්පරිප්පු (තවමත් විද්‍යානුකූල ක්‍රමවේදයකට කාලනීර්ණය කොට නොමැති) හි ඉඳි කොට ඇති පූර්ව ඓතිහාසික යුගයට අයත් යැයි අනුමාන කෙරෙන සොහොන් ආකාරය බරණි සොහොන් ලෙස හැඳින්වේ. එහි විශාල මැටි බරණි තුළ භෂ්මාවශේෂ තැන්පත් කොට ඇත. ඉංග්‍රීසි බසින් මෙම සොහොන්වලට urn burial යනුවෙන් හැඳින්වේ. පූර්ව ඓතිහාසික යුගයටම අයත් මෙගලිතික නොවන තවත් සොහොන් ආකාරයක් මෙරටින් හමුවේ. ගල් භාවිත නොකොට මැටියෙන් තනා ඇති මෙම සොහොන් මැටි ඔරු සුසාන ලෙස හැඳින්වේ. මේවාට ඉංග්‍රීසි බසින් ව්‍යාවහාර වනුයේ clay canoe burial ලෙස ය (රූපය 485). මැටි ඔරු සුසාන අනුරාධපුරය ඇතුළු වියළි කලාපයේ හමු නොවේ. ඒවා පිහිටා ඇත්තේ දේශගුණික වශයෙන් අන්තර් කලාපයේ හා තෙත් කලාපයේ ය. එම මැටි ඔරු සුසාන රංචමඩම, දුම්මලසූරිය, හල්දුම්මුල්ල, නිකවලමුල්ල හා කළඔටුවාව ආදී පෙදෙස්වලින් වාර්තා වේ. (රංජිත් බණ්ඩාර දිසානායක මහතා සමඟ කළ සාකච්ඡා ඇසුරෙන්, 2014) (Somadeva, 2010).

පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් මෙවැනි සොහොන් තුළ ඔවුන් තැන්පත් කළේ මොනවාද? අනුරාධපුරය හා ඉබ්බන්කටුව මෙතෙක් සිදු කොට ඇති මෙගලිතික සුසාන කැණීම්වලින් ශිලා මෙවලම් හමුවී නොමැත. මෙම සොහොන්වලින් ශිලා මෙවලම් හමුවීම පුරාවිද්‍යාඥයින් වැදගත් කොට සලකනුයේ එම මෙවලම් වෙනත් සංස්කෘතික හා තාක්ෂණික අවධීන්වලට අයත් වන බැවිනි. දිසානායක මහතා

යාන් ඔය මිටියාවතේ සිදු කොට ඇති සොහොන් කැණීම්වලින් හමුවී ඇති වස්තූන් අතරින් පබළු පිළිබඳ ප්‍රථමව සඳහන් කරන්නට කැමැත්තෙමු. මෙම පබළු රන්, ලෝහ, කානීලියන් (Carnelian), ඇගේට් (Agate), ඔනික්ස් (Onix), මැටි, බෙල්ලන් ආදි අමුද්‍රව්‍යවලින් නිර්මිත ය. එමෙන්ම යකඩින් නිර්මිත වළලු, කරාබු, දුනු හිස් හා කෘෂි උපකරණද මේ සොහොන් තුළින් හමුවී ඇත. තඹ නිර්මාණ අතර ඇස් අලංකරණය පිණිස භාවිත කරන අංජන කුරු හා වළලුද මේ අතර විය. රක්ත වර්ණ මැටි බඳුන් හා කාල රක්තවර්ණ මැටි බඳුන් යන දෙයාකාරයම සොහොන් තුළ තැන්පත් කොට තිබේ. මේ මැටි බඳුන් සමහරක් අතින් නිෂ්පාදනය කොට ඇති අතර සමහරක් සකපෝරුවේ නිමවා ඇත. මෙම කැණීම්වලින් මෙගලිතික සොහොන්වල වූ මැටි මුට්ටි තුළ තැන්පත් කොට තිබී මනුෂ්‍ය අස්ථි කොටස් සොයාගැනීමට හැකි. දැනටමත් එම මානව අවශේෂ පිළිබඳ පශ්චාත් විශ්ලේෂණ කටයුතු සිදු වෙමින් පවතී. එක් සොහොනක් තුළ පුද්ගලයින් කොපමණ දෙනෙකුගේ භෂ්මාවශේෂ තැන්පත් කොට ඇතිද යන්න හඳුනාගැනීමට මෙහිදී අපේක්ෂා කෙරේ.

බෙග්ලි ඇතුළු පිරිස පොම්පරිප්පු හි පිහිටි බරණි සොහොන් කැණීම් කර අනාවරණය කරගෙන ඇති පුරාවස්තූන් පිළිබඳ අපගේ අවධානය යොමු කිරීම වැදගත් ය. මෙම සොහොන් තුළින් හමු ව ඇති ශිලා වස්තූන් අතර කහඳ පතුරු, කහඳ තල, ක්ෂුද්‍ර ශිලා මෙවලම් හා තිරුවාණාවලින් නිර්මිත පතුරු මෙවලම් ද වේ. මෙම බරණි සොහොන් විධිමත් කාලනීර්ණ ක්‍රමවේදයකට අනුව කාලනීර්ණය කොට නොතිබුණද සංසන්දනාත්මක ව සිදු කළ සොයා බැලීම්වලට අනුව ඒවා ක්‍රි. පූ. දෙවන සියවසට අයත් විය හැකි බැව් පුරාවිද්‍යාඥයින් අනුමාන කරති. මෙහි හමු වී ඇති ශිලා වස්තූන් පිළිබඳ දැරණියගල දක්වන අදහස වනුයේ මෙම ශිලා වස්තූන් එම බරණි තැන්පත් කොට ඇති ඉරණමඩු පාංශු සංයුතියේ තිබී ද්විතියිකව සොහොන තුළ තැන්පත් වන්නට ඇති බවය. ඔහු 'ද්විතියික තැන්පතුවක්' ලෙස අදහස් කරනුයේ එම සොහොන් හා බැඳි ජන කොටසකගේ ක්‍රියාකාරකමකින් තොරව ඒ අවට තිබී පසු කලෙක එම ශිලා වස්තූන් බරණි සොහොන් තුළ තැන්පත් වන්නට ඇති බව ය. එම ශිලා මෙවලම් ඊට පෙර අවධියක ජීවත් වූ ශිලා යුගයට අයත් මානව කොටසකගේ නිර්මාණ වන්නට ඇති බව එහි අර්ථය යි. ඉරණමඩු පාංශු සංයුතියේ ශිලා යුගයේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස එහි ශිලා මෙවලම් සුලබව හමු වන බව දැරණියගලගේ මතය වේ (Deraniyagala, 1992; Deraniyagala, 2007). මෙම පොම්පරිප්පු බරණි සොහොන්වලින් හමුවී ඇති ලෝහ වස්තූන් අතර තඹ දණ්ඩක්, තඹ වළලු, තඹ අත් පළඳනාවක්, තඹ පබළු මාලයක්, තඹ කුරක් හා තවත් තඹ කොටස් ද, ඊට අමතරව යකඩ තලයක්ද හමුවී ඇත. මෙයින් හමුව ඇති අනෙකුත් වස්තූන් වනුයේ මැටි පබළු, සිඳුරක් විද සකසන ලද මැටි බඳුන් කොටසක් හා මැටි කොක්කකි. මෙම බරණිවලින් හමුවන ඉතා වැදගත් පුරාවස්තූන් අතර මානව අවශේෂ පිළිබඳ විශේෂයෙන්ම සඳහන් කළ යුතුව ඇත. වැඩිහිටි හා ළඳරු හිස් කබල්, දත්, උරපතු ඇට, දිගු අස්ථි (ගාත්‍රා අස්ථි කොටස්), පර්ශු, යටිහනු, කශේරුකා, ඡංඝාස්ථි, අනුඡංඝාස්ථි, ඌර්වස්ථි, ප්‍රගණ්ඩාස්ථි, අරාස්ථි, ඇඟිලි පුරුක් හා තවත් මානව අස්ථි කොටස් මෙන්ම වඳුරෙකුට අයත් යටි හනුවක් ද මෙම බරණි තුළ තිබී හමුව ඇත. මේ මානව අස්ථි පිළිබඳව ජේ.ආර්. ලූකස් (J.R. Lukacs) හා කේ.ඒ.ආර්. කෙනඩි (K.A.R. Kennedy) විසින් භෞතික මානව විද්‍යාත්මක තොරතුරු 1981 දී ප්‍රකාශයට පත් කොට ඇත. එමෙන්ම මෙම සොහොන් තුළින් රක්ත වර්ණ මැටි බඳුන් හා කාල රක්තවර්ණ මැටි බඳුන්ද හමුව ඇති බැව් සඳහන් කළ යුතුය (Begley *et al.*, 1981). පූර්ව ඓතිහාසික යකඩ යුගයටම අයත් වන මැටි ඔරු සුසානවල හමුව ඇති වස්තූන් ඉතා අල්පය. එහි තිබී ප්‍රධාන වශයෙන් හමුව ඇත්තේ පිළිස්සුණු දර අඟුරු හා රක්ත වර්ණ මැටි බඳුන් කොටස් පමණි. මෑත අවධියේ කැණීම් කළ නිකවලමුල්ල මැටි ඔරු සුසාන මීට කදිම උදාහරණයක් ලෙස සඳහන් කළ හැකි ය (දිසානායක, 2011).

රූපය 486. පසු පිටුවල පූර්ව ඓතිහාසික යකඩ යුගයේ ජනාවාසයක දර්ශනයක් (සිතුවම: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




MELUM 20XI2011
MAHAMENDRA ARACHCHI

අප නැවතත් අනුරාධපුර මෙගලිතික සුසාන හා බැඳි එම ජන කොට්ඨාශය පිළිබඳ සාකච්ඡාවට පිවිසෙමු. කෘෂිකර්මාන්තය හා සත්ත්ව පාලනය සිදු කළ මෙම පුරාණ මිනිසුන්ගේ නිවෙස් කුමන ආකාරයක් ගන්නට ඇතැයිද යන්න අප සිත් තුළ කුතුහලය උපදිනු ඇත. නමුත් එය අවබෝධ කර ගැනීම සඳහා අප සතු සාධක ඉතාමත් අල්ප ය. ආචාර්ය සිරාන් දැරණියගල අනුරාධපුර ඇතුල් නුවර කළ කැණීම් මඟින් වටකුරු හැඩයට පිහිටන ලෙස එකිනෙක පරතරයක් ඇතිව හාරා ඇති කණු වළවල් කිහිපයක් අනාවරණය කර ගැනීමට සමත් විය. මේ කණු වළවල් පූර්ව ඓතිහාසික යකඩ යුගයේ මිනිසුන්ගේ නිවෙස්වලට අදාළ වන්නට ඇතැයි ඔහු අනුමාන කරයි (ආචාර්ය සිරාන් දැරණියගල සමඟ කළ සාකච්ඡා ඇසුරෙන්, 2014). එම සාධක අනුව මෙම නිවෙස් වටකුරු හැඩැති අතර කටු මැටියෙන් ඉඳි කොට මාන, ඉලුක් ආදියෙන් වහලය හෙවිළලා තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය (රූපය 486). දිසානායක මහතා විසින් යාන් ඔය නිම්නයේ කරන ලද ගවේෂණවලදී මෙගලිතික සොහොන් ආශ්‍රිතව පිහිටන ගල් තලා මත හතරැස් හැඩයට අතුරන ලද ගල් හමුවිය (රූපය 487). මෙම ලක්ෂණය ඇල්ලෙපොතාන, මොරවැව, දික් වැව ආදී පෙදෙස් කිහිපයකින්ම වාර්තා වී ඇත. දිසානායකගේ අදහස හා අනුමානය වනුයේ මේවා පූර්ව ඓතිහාසික යකඩ යුගයේ නිවෙස්වල නටබුන් විය හැකි බවයි. ඒ අනුව එම අවධියේ නිවෙස් වටකුරු මෙන්ම හතරැස් හැඩයෙන්ද යුක්ත වන්නට ඇති බවට අනුමාන කළ හැකි සාධක පුරාවිද්‍යාඥයින් සතුව ඇත.

ඔවුන් හේන් වගාව, වී ගොවිතැන, සත්ත්ව පාලනය, වන සතුන් දඩයම් කිරීමෙන් මෙන්ම මසුන් බෑමෙන් තම ආහාර සපයා ගන්නට ඇත. අනුරාධපුර ඇතුල් නුවර සිදුකළ කැණීම් මඟින් ලද සත්ත්ව අවශේෂ මෙම අදහස සනාථ කරයි (Young *et al*., 2006). ඊට අදාළ සංදර්භ අතරින් කුළු හරකා, මී හරකා, ගෝනා, තිත් මුවා, වල් ඌරා ආදි විශාල ක්ෂීරපායීන්ගේ අස්ථි බොහෝමයක් අනාවරණය කර ගැනීමට පුරාවිද්‍යාඥයින් හා සත්ත්ව පුරාවිද්‍යාඥයින් සමත් විය. මෙම අස්ථිවල ඉතා පැහැදිලි ලෙස ලෝහ ආයුධවලින් කළ කැපුම් සලකුණු බහුලව දැකගත හැකිය. තියුණු ආයුධ මඟින් ඉහත සඳහන් කළ විශාල ක්ෂීරපායීන්ගෙන් දිගු අස්ථි හෙවත් ගාත්‍රා අස්ථි කැබලිවලට කපා ඇති අතරම කශේරුකා දෙපළු වන ලෙස කපා වෙන් කරන ලද අවස්ථාද සුලබ ය. ක්ෂුද්‍ර ශිලා යුගයට අයත් සංදර්භවලින් හමුවන ඔවුන් ආහාරයට ගෙන ශේෂ වූ සත්ත්ව අස්ථිවල කිසිවිටෙකත් මෙවැනි තියුණු කැපුම් සළකුණු දැකිය නොහැකි අතර ඒවා කැබලිවලට කඩා ඇත්තේ ශිලා මෙවලම් මඟින් තැළීමෙන් හා පහරදීමෙනි.



රූපය 487. මෙගලිතික යුගයට අයත් නිවෙස් පාදම් විය හැකියැයි අනුමාන කෙරෙන හතරැස් හැඩැති ගල් ඇතුරුම් (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අනුරාධපුර ඇතුල් නුවර පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් සංදර්භ අතරින් බහුලව හමු වන්නේ ඉහත සඳහන් කළ කුරචාරී සතුනට අයත් අස්ථි අවශේෂයන් ය. ඊට අමතරව වළි කුකුළන්, කිරි ඉබ්බන්,

ගල් ඉබ්බන් ආදි සතුන්ගේ සැකිලි කොටස් ද සුලභව හමුවේ. ඔවුන් මොනරුන් ආහාරයට ගත්තේද යන්න සැක සහිත ය. මොනර අස්ථි කිහිපයක් හමු වුවද එම සාධක මොනරුන් ආහාරයට ගත් බව සනාථ කිරීමට තරම් නොසෑහේ. මෙම පූර්ව ඓතිහාසික ජනයා හේන් වගාව හා වී ගොවිතැන සිදු කළද ඔවුන් කිසි විටෙකත් සත්ත්ව දඩයමෙන් මිදී නොමැත. නමුත් මෙහි විශේෂත්වය වනුයේ තෙත් කලාපයේ ගුහාවල වූ ප්‍රාග් ඓතිහාසික සංදර්භ අතරින් කළු වඳුරන්ගේ සැකිලි අවශේෂ බහුලව හමු වුවද වියළි කලාපයේ වූ අනුරාධපුර ඇතුල් නුවර පූර්ව ඓතිහාසික සංදර්භවලින් බහුලව හමු වන්නේ විශාල ක්ෂීරපායීන්ට අයත් සැකිලි කොටස් වීමය. මීට අමතරව ඔවුන් මිරිදිය මසුන් හා කරදිය මසුන්ද ආහාරයට ගෙන ඇති බවට අස්ථි සාධක බහුලව හමු වේ (Young *et al*., 2006).

අනුරාධපුර ඇතුල් නුවරින් හමුවන පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් සාධක අනුව ක්‍රි.පූ. 900-600 කාල සීමාව තුළ මෙරට ඉතිහාසයේ ප්‍රථම වතාවට අශ්වයින්ගේ (*Equus caballus*) සාධක හමු වේ (Deraniyagala, 1992). අශ්වයින් යනු විදේශීය රටකින් මෙරටට හඳුන්වාදුන් විශාල ක්ෂීරපායී සත්ත්ව විශේෂයක් වේ. ගමනාගමනයට මෙන්ම ගොවිපළවල බර වැඩ සඳහාද ඔවුන් අශ්වයින් යොදවා ගන්නට ඇත. අනුරාධපුර ඇතුල් නුවර කැණීම් මඟින් හමුව ඇති අශ්ව දත්වලට අමතරව ජේතවනාරාම පරිශ්‍රයේ කළ කැණීම් මඟින්ද අශ්ව දත් හා සැකිළි කොටස් 10 කට වැඩි සංඛ්‍යාවක් හමුව ඇත (රූපය 488). ජේතවනාරාම ස්ථූප පාදමේ යට මට්ටමෙන්ද අර්ධ ලෙස පිළිස්සී ඇති අශ්ව දතක් (රූපය 489) හමු වුවද එම පරිශ්‍රයේ හමුව ඇති සියලු වස්තූන් සඳහා විද්‍යාත්මක කාලනීර්ණයන් නොමැති වීම කනගාටුවට කරුණකි (මනමේන්ද්‍ර-ආරච්චි අප්‍රකාශිත වාර්තා, 2014). අශ්වයින්ට අමතරව විදේශීය රටවලින් හඳුන්වා දුන් ක්ෂීරපායින් අතර එළුවා හා බැටළුවාට අයත් අවශේෂද පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් සංස්කෘතික



රූපය 488. අශ්වයෙකුගේ (***Equus caballus***) පාදයට අයත් ප්‍රකුර්චය (***Astragalus***) අස්ථිය, ජේතවනාරාම පරිශ්‍රය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 489. ජේතවනාරාම ස්ථූප පාදමේ යට මට්ටමෙන් හමුවූ අර්ධ ලෙස පිළිස්සී ඇති අශ්ව (***Equus caballus***) දත (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සංදර්භ අතරින් හමුවී ඇත. මාන්තොට පුරාණ වරායේ ක්‍රි.පූ. 1,800 ට කාලනීර්ණය වී ඇති ක්ෂුද්‍ර ශිලා යුගයේ සංස්කෘතික සන්දර්භ අතරද එළුවන්ගේ දත් හා සැකිලි අවශේෂ කිහිපයක් සුරක්ෂිතව ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමු. පූර්ව ඓතිහාසික යකඩ යුගයේ හමුවන තවත් ක්ෂීරපායියෙකු ලෙස ගවයාද හඳුන්වාදිය හැකිය. ගවයින්ගේ අවශේෂ පොතාන ප්‍රාග් ඓතිහාසික සන්දර්භවලින් (අදින් වසර 5,850 ක් පමණ පැරණි) ද හමුව ඇති බව මෙහිලා සඳහන් කළ යුතු විශේෂ කරුණකි. අනුරාධපුර ඇතුල් නුවර පූර්ව ඓතිහාසික සංදර්භ අතර බැටළුවන්ගේ හෝ එළුවන්ගේ දත් හා අස්ථි හඳුනාගෙන ඇත. ගවයින්, එළුවන් හා බැටළුවන් (*Ovis aries*) කිරි සහ මස් පිණිස ඇති කළ බව දැක්වීම වඩාත් නිවැරදි බැව් අපගේ හැඟීමයි. හේන් වගාව, වී ගොවිතැන මෙන්ම සතුන් ඇති කිරීමෙන්ද, දඩයමේ යෙදීමෙන්ද

මහාචාර්ය රොබින් කොනිංග්හැම්

මහාචාර්ය කොනිංග්හැම් එංගලන්තයේ ඩරම් විශ්ව විද්‍යාලයේ සමාජවිද්‍යා හා සෞඛ්‍ය පීඨයේ නියෝජ්‍ය උප කුලපති හා අංශ ප්‍රධානී වේ. එමෙන්ම ඔහු එම විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්යවරයෙක් ද වේ.



කොනිංග්හැම් පුරාවිද්‍යාව හා මානව විද්‍යාව උගත්තේ කේම්බ්‍රිජ්හි කිංග්ස් කොලීජියෙනි. ඉන් අනතුරුව උපාධිධර ශිෂ්‍යත්වලාභියෙකු ලෙස පත්වීම් ලැබ නැගෙනහිර අප්‍රිකාවේ බ්‍රිටිෂ් ඉන්ස්ටිටියුට් ආයතනයට සම්බන්ධ විය. ඔහු දර්ශනශූරී උපාධිය හදාරන ලද්දේ දකුණු ආසියානු පුරාවිද්‍යාව පිළිබඳ ලෝ පතල පුරාවිද්‍යාඥයෙකු වූ නැසීගිය ෆ්‍රෑන්ක් රේමන්ඩ් ඕල්චින් යටතේ ය. කොනිංග්හැම් **1994** දී බ්‍රැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යාත්මක විද්‍යාවන් පිළිබඳ අංශයට සම්බන්ධ වී ඉන් අනතුරුව දකුණු ආසියානු පුරාවිද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙස පත් විය. එමෙන්ම ඔහු **2004** දී එම අංශයේ අංශ ප්‍රධානී බවටද පත් විය. **2005** දී ඔහු ඩරම් විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යාව පිළිබඳ ප්‍රධාන මහාචාර්යවරයා ලෙස පත් වූ අතර **2007** හා **2008** යන වසරවල පුරාවිද්‍යා අංශයේ අංශ ප්‍රධානී ලෙසද කටයුතු කරන ලදී.

මහාචාර්ය කොනිංග්හැම් ශ්‍රී ලංකාව, බංගලා දේශය, නේපාලය සහ පකිස්තානය යන රටවල පුරාවිද්‍යා කැණීම් හා ක්ෂේත්‍ර කටයුතුවල නිරත වුවෙකි. **1989** දී ආචාර්ය සිරාන් දැරණියගලගේ ආරාධනයෙන් කොනිංග්හැම්, අනුරාධපුර ඇතුල් නුවර පර්යේෂණ කැණීමක් ආරම්භ කෙරිණි. මෙම ග්‍රන්ථයේ කර්තෘවරුන් දෙපළද එම කැණීමට සහභාගී වූ අතර ඔවුන්ගේ බුද්ධිමය දායකත්වය ඒ වෙනුවෙන් ලබා දෙන ලදී. එම පර්යේෂණ කැණීම **1992** තෙක් සිදු කළ අතර එමඟින් ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ දැරණිගලගේ සොයා ගැනීම්වලට සමාන්තර අනාවරණයන් කොනිංග්හැම් විසින් ද සිදු කරන ලදී. බුදු දහමේ පුරාවිද්‍යාත්මක දෘෂ්‍යතාව, සුවිශේෂී සමාජ පන්ති සහ ශිල්පීය විශේෂඥතාවයේ සංවර්ධනය, ඉන්දියානු සාගරයේ හා අරාබි මුහුදේ වෙළෙඳාම, ජාත්‍යන්තර සංස්කෘතික සම්පත් කළමනාකරණය, දකුණු ආසියාවේ (ඉරානයේ සිට මියන්මාරය දක්වා) පශ්චාත් ප්‍රාග් ඓතිහාසක සහ මූල ඓතිහාසික පුරාවිද්‍යාව, දේශපාලනය-අනන්‍යතාවය-පුරාවිද්‍යාව මෙන්ම නාගරීකරණය යන විෂයන් එතුමාගේ පර්යේෂණ ක්ෂේත්‍රය වේ. ඔහු විසින් මෑතකදී නේපාලයේ ලුම්බිණියෙහි කළ කැණීම් කටයුතුවලදී සිදුහත් කුමරුගේ උපන් ස්ථානය පිළිබඳ අනාවරණය බෞද්ධ බැතිමතුන්ගේ භක්ත්‍යාදරයට බඳුන් විය.

1989 දී අනුරාධපුර ඇතුල් නුවර සල්ගහවත්තේ කළ පර්යේෂණ කැණීම විවෘත තක්සලාවක් ලෙස හැඳින්විය හැකිය. මෙම කැණීමට ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල කිහිපයකින් ම අංකුර පුරාවිද්‍යාඥයින් සහභාගී වූ අතර එම ව්‍යාපෘතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සිදු වූවකි. ඉන් අනතුරුව ඔහු

2005 දී කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශය හා එක්ව 2010 වසර දක්වාම අනුරාධපුර ඉහළ මල්වතු ඔය ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක ගවේෂණ හා සුලු පරිමාණ කැණීම් ගණනාවක්ම සිදු කරන ලදී. එවකට එම අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානී මහාචාර්ය ප්‍රියාන්ත ගුණවර්ධනගේ කැලණිය විශ්ව විද්‍යාලයීය පර්යේෂණ කණ්ඩායමත්, කොනිංහැමිගේ ඩරම් විශ්ව විද්‍යාලයීය කණ්ඩායමත් මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කරන ලදී.

1989 සිට මහාචාර්ය කොනිංග්හැම් විසින් අනුරාධපුරය හා ඒ ආශ්‍රිත කලාපයේ කළ පුරාවිද්‍යාත්මක පර්යේෂණ ප්‍රතිඵල ග්‍රන්ථ වෙළුම් කිහිපයක් මඟින් ප්‍රකාශයට පත් කරන ලද අතර ඊට අමතරව තවත් ශාස්ත්‍රීය ලිපි ගණනාවකින් අනුරාධපුරය පිළිබඳ ඉතිහාස තොරතුරු ඉදිරිපත් කරන ලදී. අනුරාධපුර ඉතිහාසය ගවේෂණය කිරීමේ අරමුණෙන් කොනිංග්හැම් විසින් කළ පර්යේෂණ අගය කරනු වස් ඔහු පිළිබඳ මෙම සංක්ෂිප්ත විස්තරය ඇතුළත් කරන ලදී.

(මෙහි සඳහන් ඇතැම් තොරතුරු උපුටා ගන්නා ලද්දේ ඩරම් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙනි, 2014; ඡායාරූපය, ජයම්පත් සේනානායක)

ජීවත් වූ මෙම ජන කොටස ප්‍රාග් ඓතිහාසික මානවයින්ට වඩා ආර්ථික වශයෙන් පොහොසත් වන්නට ඇතුවාට සැකයක් නැත. ඒ අනුව මෙම අවධියේ යැපීම් ධාරිතාවය සාපේක්ෂව ඉහළ තලයක පැවති බව උපකල්පනය කිරීම නිවැරදි ය.

පූර්ව ඓතිහාසික යකඩ යුගයේ ජනයා එක් තැන පදිංචි එඬේර ජීවිතයක් ගත කළ බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. සත්ත්ව පුරාවිද්‍යාඥයින් මෙතෙක් ගොනු කොට ගෙන ඇති තොරතුරුවලට අනුව මෙම පැරණි ජනයා තම අවට ස්වාභාවික පරිසරයේ වාසය කරන සතුන් මස් පිණිස ගාල් කොට ඇති කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. ඒ අනුව ශ්‍රී ලංකා වළි කුකුළා හා වල් ඌරන් ඔවුන්ගේ වාසස්ථාන අසල ගාල් කොට ඇති දැඩි කරන්නට ඇත. මෑතක් වන තුරුම සමහර ග්‍රාමීය මිනිසුන් වනයෙන් අල්ලා ගත් වල් ඌරු පැටවුන් හා වළි කුකුළු පැටවුන් තම නිවෙස්වල ඇති කරන ලදී. ඒ මස් පිණිසදැයි ස්ථිරවම ප්‍රකාශ කළ නොහැකි වුවද අපට මෙහිදී වැදගත් වනුයේ වනසතුන් තම නිවෙස්වල ඇති කිරීමේ ක්‍රියාවලිය යි. කැණීම් මඟින් අනාවරණය කොට ගෙන ඇති අස්ථි සාධක අනුව ඔවුන් බොහෝ මාංශ ප්‍රමාණයක් ආහාරයට ගන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. එම නිසා පහසුවෙන් බෝකළ හැකි වල් ඌරන් ආදී සතුන් ඔවුන් තම ගොවිපළවල ඇති කොට ආහාරයට ගන්නට ඇතැයි යෝජනා කළ හැකි ය.

ඉහත ඡේද ගණනාවකින්ම ඉතා සංක්ෂිප්තව පූර්ව ඓතිහාසික යකඩ යුගයේ ජනයා පිළිබඳ තොරතුරු කැණීම් මඟින් ලද සාධක අනුව ඉදිරිපත් කරන ලදී. ඔවුන් මෙරට මුල්ම ගොවියන් මෙන්ම යකඩ තාක්ෂණයේ නියැළුණු ජන කණ්ඩායමද වේ. ඔවුන් කුඹල් කර්මාන්තයද හොඳින් දැන සිටියෝ වෙති. මෙරට පුරාණ සාහිත්‍යයට අනුව 'යක්ෂ' හා 'නාග' යන ගෝත්‍ර දෙකක් පිළිබඳ සඳහන් වේ. මේ ගෝත්‍රික ජනයන් කවරහුද? පුරාණ සාහිත්‍යය හා වර්තමාන පුරාවිද්‍යාත්මක සාධක මුසු කොට සළකා බැලූ කළ යක්ෂ ගෝත්‍රය බලංගොඩ මානවයා ලෙසත්, නාග ගෝත්‍රය පූර්ව ඓතිහාසික යකඩ යුගයේ ජනයා ලෙසත් පිළිගත හැකිය. එම සාහිත්‍යයට අනුව ක්‍රි. පූ. 3 වන සියවසේදී මිහිඳු මහ රහතුන් විසින් මෙරටට රැගෙන එන ලද බුදු දහම ප්‍රථමයෙන් වැළඳ ගත්තෝද මෙම පූර්ව ඓතිහාසික යකඩ යුගයට අයත් මිනිසුන් ය. අනුරාධපුර ඇතුල් නුවර කැණීම්වල ශිලා යුගයට අයත් සංස්කෘතික ස්ථරයට වහාම ඉහළින් වූ ස්ථරය ක්‍රි.පූ. 900 ට දින වකවානුව තිබුණද ඉන්දියාවේ මෙම පූර්ව ඓතිහාසික යකඩ යුගය

ක්‍රි.පූ. 1,200 ක් පමණ ඈතට විහිදේ (Deraniyagala, 1992). ඒ අනුව මෙම ජනයා ඉන්දියාව හරහා මෙරටට සංක්‍රමණය වූ පිරිසක් වීමට බොහෝ ඉඩකඩ ඇත. මෙරට ඉතිහාසයට අනුව පූර්ව ඓතිහාසික යකඩ යුගය (ක්‍රි. පූ. 900-600) 'පූර්ව විජය අවධිය' ලෙස පිළිගැනේ.

ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේදී මිහිඳු මහ රහතන් වහන්සේ විසින් බුදු දහම මෙරටට හඳුන්වාදෙනු ලැබූ බව මෙම දිවයිනේ ප්‍රධානතම පුරාණ ඉතිහාස මූලාශ්‍රය ලෙස පිළිගැනෙන මහාවංශයේ සඳහන් වේ (සුමංගල සහ දෙවරක්ෂිත, 1996). අනුරාධපුරය මූලික කොට ගෙන ආරම්භ කළ බුදුදහම ස්ථාපිත කිරීමේ ක්‍රියාවළියේදී එය මුලින්ම හඳුන්වාදුන් පිරිස වන්නට ඇත්තේ පූර්ව ඓතිහාසික යකඩ යුගයේ ජනයාට බැව් කිසිදු සැකයකින් තොරව පිළිගත හැකි සත්‍යයකැයි සඳහන් කළ හැකිය. ක්‍රි.පූ. 3 වන සියවසේදී බුදුදහම මෙරටට හඳුන්වාදීමට පෙරාතුව මෙහි පැවති 'ආගම' කුමක් විය හැකිද? බුදුදහම හඳුන්වාදීමට ප්‍රථම මෙරට ජනයා 'ගස් ගල් ඇදහීම' ආදී 'ප්‍රාථමික' වත්පිළිවෙත්වල නිරත වන්නට ඇතැයි යන්න සමහර උගතුන් ප්‍රකාශ කළද එවකට ඉන්දියාවේ පැවති ආගමික පසුබිම මත එය එසේ උපකල්පනය කිරීම යුක්ති සහගත නොවන බැව් ආචාර්ය සිරාන් දැරණියගලගේ මතය වේ. ක්‍රි.පූ. 3 වන සියවස වන විට ඉන්දියාවේ හින්දු ආගම (හින්දු දර්ශනය) හා බ්‍රහ්මාගම (හින්දු ආගමේ ආදි ස්වභාවයක්) මුල් බැසගෙන තිබියදී ශ්‍රී ලංකාවේ එවකට ජීවත් වූ ජනයා ගස් ගල් ඇදහූ බව පිළිගැනීම නුසුදුසු බැව් දැරණියගලගේ අදහස වේ. රූත් යංග් හා රොබින් කොනිංග්හැම් විසින් 2010 දී ප්‍රකාශිත ශාස්ත්‍රීය ලිපියක දක්වා ඇත්තේ 'රාජකීය පවුල හින්දු ආගමේ සිට බුදුදහමට හරවාගත් බව' ය (Young & Coningham, 2010). එයින් අදහස් වනුයේ ක්‍රි.පූ. 3 වන සියවසේ බුදු දහම මෙරටට හඳුන්වාදීමට ප්‍රථම දේවානම්පියතිස්ස රජතුමා ඇතුළු විශේෂයෙන්ම අනුරාධපුර වැසියන් (බොහෝවිට බහුතරය) හින්දු භක්තිකයින් වන්නට ඇති බවයි. යංග් හා කොනිංග්හැම්ගේ මෙම මතයට එකහෙළා විරුද්ධ නොවූවද ආචාර්ය දැරණියගල දක්වනුයේ එම ආගම හින්දු ආගමද, නොඑසේනම් බ්‍රහ්මාගම දැයි අප තේරුම් ගත යුතුව ඇති බවයි (ආචාර්ය දැරණියගල සමඟ කළ සාකච්ඡා, 2014).

ඩයනා හෝකි ආසියාව ආශ්‍රිත කලාපයේ මානව දත් පිළිබඳ සිදු කළ පර්යේෂණ මෙරට විසූ පූර්ව ඓතිහාසික යුගයේ ජනයා පිළිබඳව නවක තොරතුරු අප වෙත සපයා ඇත. පොම්පරිප්පු බරණි සොහොන්වල වූ මානව දත් වඩාත් සමීප වනුයේ ශ්‍රී ලංකා දමිළ ජනයාට හෝ බලංගොඩ මානවයාටත් වඩා සිංහල ජනයාටත්, ඉන්දියානු ක්ෂුද්‍ර ශිලා යුගයේ ජනයාටත් බව ඇය තහවුරු කොට ඇත. එමෙන්ම ඇයගේ පර්යේෂණ මඟින් තහවුරු වූ තවත් කරුණක් වන්නේ හොලෝසීනයේ මුල් අවධියේ බලංගොඩ මානවයා හා ඉන්දියානු ක්ෂුද්‍රශිලා යුගයේ මානවයින් එකිනෙක වෙනස් මානව කාණ්ඩ දෙකක් වුවද යම් සමානතා අනුව ඔවුන් ඉතා ඈත අතීතයේ පොදු පූර්වජයෙකුගෙන් පැවත ආ බව ය (Hawkey, 2002).

වැව් ඉදිවීමත් සමඟ මෙම වියළි පෙදෙසේ එතෙක් පැවති පරිසරයට පුළුල් ජල පෘෂ්ඨයක් එක් විය. එහිදී ජලචර ජීවීන්ගේ පාරිසරික තත්ත්වයන් සැලකිය යුතු ලෙස වෙනස් වන්නට ඇත. එමෙන්ම වැව් අවට පරිසරයේ වාතයේ ආර්ද්‍රතාවය ඉහළ අගයක පැවතීම වැව් ඉදිවීම නිසා සිදු වූ තවත් පාරිසරික විපර්යාසයකි. වී ඇතුළු ධාන්‍ය වගාව පුළුල් වීමෙන් ධාන්‍ය මත යැපෙන කෘන්තක මීයන්ගේ ගහන ඝනත්වය වැඩි වීමද සිදුවේ. එහි අතුරු ප්‍රතිඵලයක් ලෙස එම කෘන්තක මීයන් ආහාරයට ගන්නා සර්පයින්ගේත්, රාජාලීන්, උකුස්සන්, බස්සන් හා බකමූණන්ගේත් ගහණයද වැඩිවන්නට ඇති බව අපට අනුමාන කළ හැකිය. වැව් ඉදිවීම නිසා අලුතින් ඇතිවූ ජලජ පරිසරය ජලචර පක්ෂීන්, මිරිදිය මසුන් ඇතුළු තවත් බොහෝ සත්ත්ව කාණ්ඩ කිහිපයකටම ජීවත් වීමට තිබූ වාසස්ථාන පුළුල් වූ බව නොරහසකි.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ශිලා යුගය හා පූර්ව ඓතිහාසික යකඩ යුගය අතර සංක්‍රාන්ති සමය පිළිබඳ පර්යේෂණවල නියැළී ඇති කැලණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්ය රාජ් සෝමදේව විසින් 2006 සිට මේ දක්වා කරනු ලබන මතුපිට ගවේෂණ හා පර්යේෂණ කැණීම් මඟින් අනාවරණය කරගත් සාධක පිළිබඳ මෙම පරිච්ඡේදයට ඇතුළත් කිරීම උචිත යැයි හැඟේ. ඉහත යුග දෙක අතර සංක්‍රාන්ති සමය අධ්‍යයනය කිරීම සඳහා ඔහු විසින් පාදක කරගත් ප්‍රදේශය වූයේ උඩවළව නිම්නයයි. මෙහිදී මහාචාර්ය සෝමදේව විසින් මේ සඳහා සාධක ගොනුකරන ලද්දේ පහත සඳහන් ගවේෂණ හා කැණීම් මඟිනි. එනම්, පල්ළෙබැද්ද ගල්පායේ වළංකටු යාය මතුපිට ගවේෂණය, කොළඹගේආර රංචමඩම පූර්ව ඓතිහාසික සොහොන් භූමියේ 2007 දී කළ කැණීම, ගල්පාය තෙළඹුගහඅතර නම් ස්ථානයේ 2008 දී කරන ලද කැණීම, උඩරංචමඩමේ පූර්ව ඓතිහාසික ජනාවාසයේ 2009 දී කළ කැණීම, හල්දුම්මුල්ල මැටි ඔරු සුසාන භූමියේ 2010 දී කළ කැණීම, බෙරගල කලුපහන වත්තේ මැටි ඔරු සුසාන භූමියේ 2011 දී කළ කැණීම යනාදි වේ.

ආචාර්ය සිරාන් දැරණියගල 1992 දී දක්වා ඇත්තේ ක්ෂුද්‍ර ශිලා යුගය හා පූර්ව ඓතිහාසික යකඩ යුගය අතර සංක්‍රාන්ති සමයේ පැහැදිලි සාධක තවමත් අනාවරණය වී නොමැති බවය. (Deraniyagala, 1992). මහාචාර්ය සෝමදේව 2006 දී ආරම්භ කළ මූලික පර්යේෂණවල අරමුණ වූයේ ඒ වන විට අනාවරණය කොට ගෙන නොතිබුණු එම සාධක මතුකර ගැනීමයි (Somadeva, 2010). අනුරාධපුර ඇතුල් නුවර කැණීමෙන් ලද දින වකවානු අනුව ක්‍රි.පූ. 3,850 දී ක්ෂුද්‍ර ශිලා යුගයේ සාධකවලින් අනතුරුව ක්‍රි.පූ. 900 දී හමුවනුයේ පූර්ව ඓතිහාසික යකඩ යුගයේ සාධකයන් ය. ඒ අනුව ක්ෂුද්‍ර ශිලා යුගය හා පූර්ව ඓතිහාසික යකඩ යුගය අතර වසර 2,950 ක කිසියම් හෝ සාධකයක් හමු නොවන අවධියක් ඇත. ආචාර්ය දැරණියගලගේ මතය වී ඇත්තේ එම සංස්කෘතික සංදර්භ මොනයම් හෝ හේතුවක් මඟින් සෝදාපාලුවට ලක් වන්නට ඇති බවය (Deraniyagala, 1992; Deraniyagala, 2007). ප්‍රාග් ඓතිහාසික ගුහා කැණීම් මඟින්ද, බෙල්ලන්බැඳිපැලැස්ස වැනි එළිමහන් වාසස්ථානවල කරන ලද කැණීම් මඟින්ද, ප්‍රාග්-පූර්ව ඓතිහාසික සංක්‍රාන්ති සමයක සාධක හමුනොවන්නේ එහි වූ මතුපිට ස්ථර මානව ක්‍රියාකාරකම් නිසා අවුල් වී ඇති බැවින් බව අප ඉහතදී සාකච්ඡා කරන ලදී.

රංචාමඩම කැණීමෙන් ඔහු මැටි ඔරු සුසාන හයක් හා වළ සුසාන දෙකක් අනාවරණය කර ගන්නා ලදී. එමෙන්ම එම සුසාන කේන්ද්‍ර කොට ගෙන කිලෝමීටර් දෙකක අරයක් ආවරණය වන වපසරියක් තුළ පුරාණ කාලයේ ධාන්‍ය සකස් කළ ස්ථානයක් හා පුරාණ ග්‍රාමීය ජනාවාස පැවති ස්ථානයක් සොයාගෙන ඇත. රංචාමඩම සොහොන් පත්ලක වූ අඟුරු සාම්පලයක් අංගාර 14 ක්‍රමවේදයට අනුව ක්‍රි.පූ. 1,359 කට ද, උඩ රංචාමඩමේ පුරාණ නිවෙස් පාදමක් කැණීමට ලක්කොට එහි මුළුතැන් ගෙය යනුවෙන් හඳුනාගත් ස්ථානයේ අඟුරු සාම්පලය ක්‍රි.පූ. 1,129 ට ද කාලනීර්ණය වී ඇත. මෙම ස්ථාන දෙකෙහිම ශිලා මෙවලම්, යකඩ හා කාල රක්තවර්ණ වළං සමඟ සමාන්තරව භාවිත කළ හොඳින් වැඩුණු සංස්කෘතික ලක්ෂණ පිළිබිඹු වන බව සෝමදේව ප්‍රකාශ කරයි (Somadeva *et al.*, 2008; Somadeva, 2010).

ගල්පායේ සිට කිලෝමීටර් 8 ක් පමණ උතුරින් පිහිටි කල්තොට මොහොර කලාපයේ ස්ථානගතව ඇති උඩුපියන් ගල් ගේ ආචාර්ය පී.ඊ.පී. දැරණියගල විසින් සොයාගෙන කැණීම් කොට තිබේ. එහිදී ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ශිලා මෙවලම්, වළං කැබලි මෙන්ම සත්ත්ව හා උද්භිද විද්‍යාත්මක අවශේෂද හමුව ඇත. මැටි වළං කැබලි හා ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් අතර තිබෙන සබඳතාවය සොයා බැලීම සඳහා ඇති කදිම ස්ථානයක් ලෙස උඩුපියන් ගල් ගේ හඳුන්වාදිය හැකි බැව් මහාචාර්ය සෝමදේවගේ අදහස වේ. පී.ඊ.පී. දැරණියගල විසින් නිරීක්ෂණය කළ සාධකත්, එමෙන්ම ඒවායේ

ලක්ෂපති විදානලාගේ ඇල්ෆ්‍රඩ් ද මෙල්



1951 දෙසැම්බර් මස 14 වන දින අනුරාධපුරයේදී උපත ලද ඇල්ෆ්‍රඩ් ද මෙල් මහතා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණේ 1971 අගෝස්තු මස 23 වන දින ය. 1978 දී ප්‍රාග් ඓතිහාසික කිතුල්ගල බෙලි ලෙන පර්යේෂණ කැණීම ආචාර්ය සිරාන් දැරණියගල විසින් ආරම්භ කරන ලදුව 1979 දී මැල් එම ව්‍යාපෘතියට සම්බන්ධ විය. ඔහුට ආචාර්ය දැරණියගල හමුවීමෙන් අනතුරුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරන ලද පර්යේෂණ කැණීම් රාශියකට සම්බන්ධ වූ අතර 2006 දෙසැම්බර් 14 වන දින දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම යන විට ඔහු සහභාගී වූ කැණීම් සංඛ්‍යාව අතිමහත් ය.

මෙම පොතෙහි ඇල්ෆ්‍රඩ් ද මෙල් පිළිබඳ අප විසින් කෙටි විස්තරයක් ඉදිරිපත් කිරීමට පෙළඹුණේ ඔහු විසින් අනුරාධපුර ඇතුල් නුවර කැණීම් මගින් ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැංවීම සඳහා දැක්වූ දායකත්වයට උපහාරයක් ලෙස ය. මෙල් යනු මෙරට පර්යේෂණ කැණීම්වල පාංශු ස්ථර හෙවත් සංස්කෘතික ස්ථර වින්‍යාසය හඳුනාගැනීම පිළිබඳ විශේෂඥයෙකි. දශක හතරකට වැඩි කාලයක් කැණීම් කොට ලබා ගත් තම අත්දැකීම් මත ඔහු අද වන විට මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ස්ථර වින්‍යාසය හඳුනා ගැනීමේ වූ දක්ෂතමයා ලෙස හැඳින්වීම අතිශයෝක්තියක් නොවනු ඇත. ඔහුට සංස්කෘතික ස්ථර හඳුනාගැනීම සඳහා මුල්ම ප්‍රායෝගික පුහුණුව 1979 බෙලි ලෙන කැණීමේදී ලබා දෙන ලද්දේ ආචාර්ය සිරාන් දැරණියගල බැව් මෙල් පැවසී ය. පුරාවිද්‍යා කැණීම්වලට අමතරව ඔහු මතුපිට ගවේෂණ රාශියකට සහභාගී වී ඇත. මේ අතරින් 1983-1984 මාන්තොට සිට සංගුපිටිය දක්වා ගවේෂණයත්, 1978 හෝර්ටන් තැන්න ජාතික වනෝද්‍යානයේ සිදු කළ ගවේෂණයත්, 1987-88 සමනල වැව ගවේෂණයත් හා 1987 දී පමණ කළ මිනිහාගල්කන්ද ගවේෂණයත් සඳහන් කළ හැකි ය.

මෙල් මහතා පුරාවිද්‍යා කැණීම් මගින් ක්ෂේත්‍රයට සිදු කරන ලද යහපත අගයනු වස් ආචාර්ය සිරාන් දැරණියගල සිය ශාස්ත්‍රීය ප්‍රකාශනවල ඔහුට විශේෂ ස්තුතියක් පුද කිරීමට අමතක කොට නොමැත. විශ්‍රාම යාමෙන් අනතුරුව ද මෙල් තම ක්ෂේත්‍ර දැනුම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවටත්, මධ්‍යම සංස්කෘතික අරමුදලටත් ලබා දෙන අතර කැණීම්වලට සහභාගී වෙමින් විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීමේ කර්තව්‍යයේ නිරතව සිටියි.

(ඡායාරූපය, සොනාලි රංගිකා ප්‍රේමරත්න)

දක්නට තිබුණු සමාන තාක්ෂණික ප්‍රවණතා තම පර්යේෂණ ස්ථානවලින්, එනම් වළංකටු යාය, රංචාමඩම සුසාන සහ තෙලඹුගහඅතර ආදි ස්ථානවලින්ද නිරීක්ෂණය කරන ලදැයි සෝමදේව සඳහන් කොට ඇත (Somadeva, 2010).

ශිලා මෙවලම් හා වළං කැබලි එකට හමුවන ස්ථර පිහිටි ස්ථාන අතරට බෙල්ලන්බැඳිපැළැස්ස හා සීගිරිය අසල පොතාන ගුහාවද සඳහන් කළ හැකිය (Deraniyagala, 1958; Adikari, 1998). 2007 දී ගම්පහ වාරණ ගුහාව කැණීමෙන් අනතුරුව කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්ය ගාමිණි අදිකාරි හා ආචාර්ය අර්ජුන තන්තිලගේ විසින් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ශිලා මෙවලම් හා මැටි කැබලි එකම සංස්කෘතික ස්ථරයක හමුවීමේ වැදගත්කම පිළිබඳ ප්‍රකාශ කරන ලදී. මෙරට ප්‍රථම වතාවට ඔවුන් විසින් එම අවධියට 'පශ්චාත් මෙසොලිතික අවධිය' (Post Mesolithic Period) යනුවෙන් යෝජනා කෙරිණි (Adikari & Thantilage, 2007). ක්‍රිස්තු පූර්ව දෙවන සහශ්‍රක වර්ෂයේ යම් කාලවකවානුවකදී ශිලා මෙවලම් භාවිතා කළවුන් හා වළං නිපදවූ ජන කොටස් දෙක අතර අන්තර් ක්‍රියා හටගන්නට ඇතැයි සෝමදේව යෝජනා කරයි. වළංකටුයායෙන් සොයාගත් මානව කෘති එම අදහස පෙන්වා දෙන බවත්, රංචමඩම සුසාන භූමිය (ක්‍රි.පූ. 1,359) සහ උඩරංචමඩම (ක්‍රි.පූ. 1,129) අංගාර කාලනීර්ණයන් එම අන්තර් ක්‍රියා හට ගන්නට ඇතැයි යෝජනා කළ හැකි කාල වකවානු ලෙස ඔහු සඳහන් කරයි (Somadeva *et al*; 2008; Somadeva, 2010).

2010 දී හල්දුම්මුල්ල මැටි ඔරු සුසාන කැණීමෙන් ලද අංගාර 14 කාලනීර්ණයන්ට අනුව එම සොහොන් ක්‍රි.පූ. 1,750 හා ක්‍රි.පූ. 1,700 තරම් පැරණි බැව් ඔහු අනාවරණය කරන ලදී. එම මැටි ඔරු සොහොන් තුළ තිබී බලංගොඩ තුඩු, යකඩ කැබලි හා කාල රක්ත වර්ණ මැටි බඳුන් කොටස් ද හමුවී ඇත. මීට අමතරව 2011 දී බෙරගල කළුපහන වත්තේ මැටි ඔරු සුසාන කැණීමෙන් ලද අංගාර දින වකවානු මෙරට මැටි ඔරු සුසාන සඳහා ලැබී ඇති පැරණිතම කාලනීර්ණයන් බව මහාචාර්ය සෝමදේව පවසයි. එයින් ක්‍රි.පූ. 2,300 හා 2,400 වශයෙන් දින වකවානු දෙකක් ලැබී ඇති අතර එම සොහොන් තුළ තිබී යකඩ කොටස් හා කාල රක්ත වර්ණ මැටි බඳුන් කැබලි හමුවී ඇත. ප්‍රාග්-පූර්ව ඓතිහාසික යුගයන් අතර සංක්‍රාන්ති සමය පිළිබඳ අතිශයින්ම වැදගත් දින වකවානු ලැබී ඇති බැව් මහාචාර්ය සෝමදේව තවදුරටත් පැවසීය. ඔහුගේ අදහස වනුයේ පූර්ව ඓතිහාසික යකඩ යුගයේ සාධක ගවේෂණය කිරීමට ඇති අනගිතම කලාපයක් ලෙස වළවේ නිම්නය හඳුන්වාදිය හැකි බවයි. කැණීම්වලින් ලද භෞතික සාධක පමණක් නොව අභිලේඛන හා වාග් විද්‍යාත්මක තොරතුරු ආදිය මෙම පර්යේෂණ සාර්ථක කර ගැනීම සඳහා පාදක කරගත යුතු බව මහාචාර්ය රාජ් සෝමදේවගේ මතය වේ (මහාචාර්ය රාජ් සෝමදේව සමඟ කළ සාකච්ඡා ඇසුරෙන්, 2014).

අනුරාධපුරයෙන් පරිබාහිර පෙදෙස්වල කරන ලද ගවේෂණ හා කැණීම් මඟින් ලද පූර්ව ඓතිහාසික යකඩ යුගය පිළිබඳ තොරතුරු මෙහි ඉදිරිපත් කරන ලද්දේ එම සංස්කෘතියේ පැතිරීම හා නවතම පර්යේෂණ තොරතුරු පිළිබඳව පාඨකයින් දැනුවත් කිරීම සඳහා ය. ඉහත පූර්ව ඓතිහාසික යකඩ යුගය පිළිබඳ තොරතුරු පෙළ ගැසීමේදී ශාස්ත්‍රීය දායකත්වය ලබාදුන් රංජිත් බණ්ඩාර දිසානායක මහතාට අපගේ ගෞරවය පිරිනැමිය යුතුය. එමෙන්ම මෙතෙක් ප්‍රකාශයට පත් නොකරන ලද මැටි ඔරු සුසාන දිනවකවානු අප වෙත ලබාදීමෙන් සහ පූර්ව ඓතිහාසික යකඩ යුගය පිළිබඳ අදහස් සාකච්ඡා කරමින් ලබා දුන් සහයෝගය වෙනුවෙන් මහාචාර්ය රාජ් සෝමදේවටද ස්තුතිය පිරිනැමේ.

සත්ත්ව ගෘහස්තකරණය හා විදේශීය සතුන්

ශ්‍රී ලංකාවේ සත්ත්ව ගෘහස්තකරණය පිළිබඳ පුරාණතම සාධක හමුවන්නේ බෙල්ලන්බැඳිපැළැස්ස ප්‍රාග් ඓතිහාසික සන්දර්භවලිනි. අංගාර කාලනීර්ණයන්ට අනුව අදින් වසර 12,000 ක් පමණ පැරණි සුනඛ දත්

(පහළ හනුවේ ප්‍රථම චාර්වක) කොටසක් එම සන්දර්භ අතරින් හමුව ඇත (Perera, 2010) (රූපය 490). මෙය සුනඛ ගෘහස්ථකරණය පිළිබඳ දකුණු ආසියාවෙන් වාර්තාවන පුරාණතම සාධකය යැයි සඳහන් කළ හැකි ය. ප්‍රාග් ඓතිහාසික මානවයින් දඩයම් හඹා යාමටත්, ආරක්ෂාව පිණිසත් සුනඛයින් ඇතිදැඩි කොට ඇති බව සනාථ කිරීමට මෙය කදිම අවස්ථාවක් වේ. ආචාර්ය නිමල් පෙරේරා විසින් 2005 වසරේදී බෙල්ලන්බැඳිපැළැස්ස කැණීමෙන් ලද අනෙකුත් සත්ත්ව අවශේෂ සමඟ මෙම සුනඛ දත් කොටස හමුවිය.

ප්ලයිස්ටොසීන අවධියේ මෙරට *Gonasinhaleya* යනුවෙන් විද්‍යාත්මකව නම් කොට ඇති ගව විශේෂයක් වාසය කළ බවට ෆොසිල සාධක හිඟුරක්ගොඩ අසල මැදිරිගිරියෙන් හමුවී ඇත (Deraniyagala, 1958). ප්ලයිස්ටොසීනයේ මෙම දිවයිනේ වල් ගවයින් ජීවත් වූ බවට මෙය කදිම සාධකයකි. ලැබී ඇති ෆොසිල සාධක අනුව මෙම ගවයා අඩි 3 ½ - 4 ක් පමණ උසැති, ප්‍රමාණයෙන් කුඩා සත්ත්වයෙකි. අනුරාධපුරය ඇතුළු වියළි කලාපීය පෙදෙස් කිහිපයකම ගැමියන්ගේ ගව පට්ටි අතර ප්‍රමාණයෙන් ඉතා කුඩා ගවයින් දැකිය හැකි ය. ගැමියන් උන් හඳුන්වන්නේ 'බටු හරකා' හෙවත් 'සිංහල එළහරකා' යනුවෙනි (රූපය 491). ශ්‍රී ලංකාවේ ජීවත්ව හිඳ වඳවී ගිය *Gona sinhaleya*, බටු හරකාගේ පූර්වජයා වීමට ඉඩකඩ ඇතැයි අනුමාන කළ හැකිය. එමෙන්ම පූර්ව ඓතිහාසික යකඩ යුගයෙන් පසු අවධියේ විදේශීය රටවලින් කිරි සහ මස් පිණිස නවත් ගව විශේෂ මෙරටට හඳුන්වාදීමේ හේතුවෙන් එම වල් ගවයින් ඔවුන් හා මිශ්‍ර වන්නට ඇතැයිද අනුමාන කළ හැකිය.

පූර්ව ඓතිහාසික යකඩ යුගයේදී අශ්වයා මෙරටට හඳුන්වාදුන් බව ඇතුල් නුවර කැණීම්වලින් ලද අශ්ව සැකිලි අවශේෂ මඟින් සනාථ වී ඇත (Dereniyagala, 1992). එසේම ගොවිපළ වැඩකටයුතු හා බර රැගෙන යාම සඳහා බූරුවන් (*Equus asinus*) ආදි සතුන් ද මෙරටට රැගෙන එන්නට ඇතියි උපකල්පනය කිරීම සාවද්‍ය නොවේ. කාලනීර්ණ නොමැති වුවද ජේතවනාරාමයෙන් ලද අශ්වයන්ට හා බූරුවන්ට සමාන දත් මේ බව යම් පමණකට තහවුරු කරයි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න 2007 වසරේදී ඉංග්‍රිසි බසින් Mule යනුවෙන් හැඳින්වෙන බූරුවෙකුට සමාන (*Equus heminous*) සත්ත්වයෙකුගේ අවශේෂ ජේතවනාරාම කැණීමෙන් වාර්තා වන බව ප්‍රකාශකොට ඇත (Chandraratne, 2007).



රූපය 490. බෙල්ලන්බැඳිපැලැස්සෙන් හමුවූ ගෘහාශ්‍රිත බල්ලෙකුගේ (***Canis familiaris***) පහළ හනුවේ චාර්වක දත් කොටසක් (ඡායාරූපය: කැපී මනමේන්ද්‍ර-ආරච්චි)

අනුරාධපුර ඇතුල් නුවර හා ජේතවනාරාම පරිශ්‍රයේ කළ කැණීම් මඟින් අනාවරණය කරගත් සත්ත්ව අවශේෂ අතර ශ්‍රී ලංකාවට විදේශ රටවලින් හඳුන්වාදුන් සතුන් කිහිප දෙනෙක් වේ. ඉහත විස්තර කරන ලද සත්ත්ව විශේෂයන්ට අමතරව ගෘහශ්‍රිත බළලා (*Felis catus*), බටු හරකා (*Bos indicus*), රට එළහරකා (*Bos taurus*), මී හරකා (*Bubalus bubalis*), එළුවා, බැටළුවා, ගං ඌරා (*Sus domesticus*), ගෘහාශ්‍රිත කුකුළා (*Gallus gallus*) ආදි සතුන් සඳහන් කළ හැකි ය.

සමාලෝචනය

ආචාර්ය සිරාන් දැරණියගල විසින් ක්ෂුද්‍ර ශිලා යුගයේ නිමාවත් සහ ක්‍රි.ව. 1,250 ත් අතර වූ ලාංකේය ඉතිහාසයීය තොරතුරු 1992 දී සාරාංශගත කොට ඇත. ඔහුගේ එම කාලපරිච්ඡේද වැදගත් කොට



රූපය 491. බටු හරකා (*Bos indicus*), අනුරාධපුරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සලකනුයේ කෘෂිකර්මාන්තය, මැටි වළං නිෂ්පාදය, ලෝහ භාවිතය, ආභරණ නිර්මාණය, බුදු දහම හඳුන්වාදීම, සංඝාරාම ඇතුළු යෝධ වෙහෙර විහාර ඉදිකිරීම, වැව් ඉදිකිරීම, වැව් ජලය කළමණාකරනය කිරීම ආදි සිදුවීම් සියල්ලම පාහේ මෙම කාලවකවානුවලට අයත් වන බැවිනි. මූලික වශයෙන් කැණීම්, ගවේෂණ හා කාලනීර්ණයන් මඟින් දැරණියගල විසින් ගොඩනගන ලද මෙම ඉතිහාසය අතිශයින්ම පුරාවිද්‍යාත්මක විනයක් මත සිදුකෙරුණකි. ප්‍රාග් ඓතිහාසික සමයෙන් පසු මැටි බඳුන් හා ලෝහ භාවිතය මෙන්ම කෘෂි කර්මාන්තය දක්වා වූ මෙම සංක්‍රාන්ති සමය, දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් කළ හැකි ඉතා වැදගත් කාල පරිච්ඡේදයකි. එමෙන්ම අප මෙහිදී අවධාරණය කළ යුතු වනුයේ යුගයක් හෝ සංස්කෘතික අවධියක් එක් දිනකින් හෝ ක්ෂණයකින් නිමා නොවන බවයි. එය තවත් එයට පසු යුගයක්, සංස්කෘතික අවධියක් හෝ තාක්ෂණයක් සමඟ අවගෝෂණය වීමක් හෝ මුසුවීමක් සිදුවේ. එමනිසා එකිනෙක අවධීන්වල වූ මූලික ගුණාංග අතිච්ඡාදනය වීමේ ලක්ෂණ ස්වභාවයෙන්ම පෙන්නුම් කෙරේ. කාලනීර්ණ අනුපිළිවෙළ අනුව පහත දක්වා ඇත්තේ දැරණියගල විසින් පෙළගස්වන ලද මෙරට ඉතිහාසයේ පැතිකඩකි (Deraniyagala, 1992).

1. **ක්ෂුද්‍රශිලා යුගය (Microlithic period)**: මෙම යුගයේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් හමුවීම සඳහන් කළ හැකිය. අනුරාධපුර ඇතුල් නුවර කළ කැණීම් අනුව එහි අදින් වසර 5,850 කට ප්‍රථම ක්ෂුද්‍ර ශිලා යුගයේ සාධක හමුවේ. මෙරට ක්ෂුද්‍ර ශිලා යුගයේ අවසාන කාලවකවානුව ලෙස සලකනුයේ මාන්තොට පුරාණ වරායේ අදින් වසර 3,800 කට කාලනීර්ණය වූ සන්දර්භයයි.

2. **ක්ෂුද්‍රශිලා/යකඩ යුගය සංක්‍රාන්තිය (Microlithic/Iron Age transition)**: දැරණියගලගේ පර්යේෂණයන්ට අනුව මෙම අවධියේ පැහැදිලි සාධක තවමත් අනාවරණය වී නොමැත. පොම්පරිප්පු සොහොන්වලින් යකඩ සමඟ හමුවන ශිලා මෙවලම් ද්විතියික ස්ථරානුගත වීමක් බැව් අනුමාන කෙරේ.


3. **පූර්ව ඓතිහාසික යකඩ යුගය (මුල් යකඩ යුගය) (Protohistoric Iron Age [Early Iron Age])**: ක්‍රිස්තු පූර්ව 900-600 අතර කාලපරිච්ඡේදය මීට අයත් වේ. මෙම යුගයේ ප්‍රධාන සංස්කෘතික ලක්ෂණ අතර යකඩ හා මැටි වළං තාක්ෂණය, අශ්වයින් භාවිතය, ගෘහස්ත ගවයින් හා වී වගාව ආදිය සඳහන් කළ හැකිය. කාල රක්ත වර්ණ මැටි බඳුන් හා යබොර හමුවීම මෙම යුගයේ වැදගත් තාක්ෂණික ලක්ෂණ විදහා පෑමකි.

   ශ්‍රී ලංකාවේ යකඩ තාක්ෂණය මෙරට සම්භවය වූවක් නොවන බවත්, එය ක්‍රි.පූ. දෙවන සහශ්‍රයේ අග භාගයේදී මෙරටට සංක්‍රමණය වන්නට ඇති බවත් විශ්වාස කෙරේ. ක්‍රිස්තු පූර්ව 1,000 දී ඉන්දියාවේ පුළුල් පෙදෙසක යකඩ තාක්ෂණය කැපී පෙනෙන කර්මාන්තයක්ව පැවතිණ. එමෙන්ම මේ සමයේ සුවිශේෂී ලක්ෂණයක් ලෙස ශවෝපචාරී සම්ප්‍රදායක් වූ මෙගලිතික සොහොන් ද සඳහන් කළ හැකිය.

4. **පාදස්ථ මුල් ඓතිහාසික යුගය (Basal Early Historic)**: ක්‍රිස්තු පූර්ව 600-500 ට අයත් සියක් වසක කාලය මීට අයත් වේ. ප්‍රාග් සාක්ෂරතාවය පිළිබඳ සාධක (සංකේත) (රූපය 492) සහ බ්‍රහ්මී අක්ෂර හමුවීම මේ අවධියේ විශේෂ ලක්ෂණයකි (රූපය 480). ඒවා මැටි බඳුන්වල සටහන්ව ඇත. එක් මැටි බඳුන් කොටසක 'අනුරාධ' යන නාමය සඳහන් වේ. මෙම බ්‍රහ්මී අක්ෂර ඊට වසර 200 කට පසුව ඉන්දියාවේ අසෝක සමයට අයත් බ්‍රහ්මී අක්ෂරවලට අතිශයින්ම සමාන වේ (Deraniyagala, 2007).

5. **පහළ මුල් ඓතිහාසික යුගය (Lower Early Historic)**: ක්‍රිස්තු පූර්ව 500-250 ත් අතර කාලපරිච්ඡේදය යි. මෙම යුගයේ ගංගා නම් ගං මිටියාවත හා සබඳතා පැවැත්වූ බවට සාධක ලෙස ගැනෙන ඔපවත් උත්තර කාලවර්ණ මැටි බඳුන් ද (Northern Black Polished Ware [NBPW]), මුල් බ්‍රහ්මී අක්ෂර සහිත මැටි බඳුන්ද හමුවේ. රූලේටඩ් බඳුන් (RLW) ලෙස ගැනෙන තවත් මැටි බඳුන් සම්ප්‍රදායකට අයත් සාධක මෙහිදී හඳුනාගෙන ඇත.

6. **මධ්‍ය මුල් ඓතිහාසික යුගය (Mid Early Historic)**: ක්‍රිස්තු පූර්ව 250 සිට ක්‍රි. ව. 100 දක්වා කාලපරිච්ඡේදය මීට අයත් වේ. මේ අවධියේ මූලික සංස්කෘතික ලක්ෂණ අතර මැටි බඳුන්, මුද්‍රා (seals), ලක්ෂ්මී ඵලක, ගල්වල කෙටූ බ්‍රහ්මී අක්ෂර, හස් එබූ (punch-marked) කාසි මෙන්ම 'හස්ති හා ස්වස්ථික' (Elephant and Swastika) කාසි, 'ගස සහ ස්වස්ථික' (Tree and Swastika) කාසි, පාණ්ඩ්‍ය කාසි, එකිනෙකට විරුද්ධ දිශාවලට පිහිටන මත්ස්‍ය රූප සහිත කාසි, අනන්‍ය වටකුරු හැඩැති ඇවිදින ගවයෙකුගේ රූපයකින් හෙබි කාසි, චතුරස්‍රාකාර හැඩ 'හස්ති හා මත්ස්‍ය' (Elephant and Fish) කාසි මෙන්ම රෝම කාසි ද සඳහන් කළ හැකිය. මෙම යුගයේ හමුවන මුද්‍රාවල බ්‍රහ්මී අක්ෂරද වේ. එමෙන්ම මේ අවධියේ තවත් ලක්ෂණයක් ලෙස පබළු ආකාරවල සීඝ්‍ර වර්ධනයක් දැකගත හැකි වේ. රූලේටඩ් මැටි බඳුන් මෙන්ම විශාල බරැති ගබඩා කිරීමේ බඳුන්ද, බෆ් වර්ගයේ වළං (buff ware) ද මේ අවධියේ හමු වේ.



රූපය 492. මැටිබඳුන්වල වූ බ්‍රහ්මී නොවන සංකේත. (Deraniyagala, 1992 අනුව නැවත අඳින ලදී) (පරිමාණ රේඛාව මි.මී. 30 කි)

7. **ඉහළ මුල් ඓතිහාසික යුගය (Upper Early Historic):**


ක්‍රිස්තු වර්ෂ 100-300 දක්වා කාල පරිච්ඡේදය මීට අයත් වේ. ඒකාකාරී ප්‍රමාණයට නිපදවා ඇති විශාල ගඩොල් හමුවේ. ඔපවත් රක්ත වර්ණ මැටි බඳුන් (Red Polished Were [RPW]) හමුවන අතර එහි විවිධත්වය බහුලය. කාසි සුලබව හමුවේ. 'ගස් හා ස්වස්ථික' කාසිද මේ අතර වේ.

8. **මධ්‍ය ඓතිහාසික යුගය (Middle Historic):**

ක්‍රිස්තු වර්ෂ 300-1,250 කාලයයි. අනුරාධපුරය හා පොළොන්නරුව යන වියළි කලාපීය යුගවල අවසාන අදියර මේ අවධියේ අවසානයත් සමඟ සනිටුහන් වේ.

අනුරාධපුරයේ ගල් කැටයම්වල වූ සත්ත්ව රූප

අනුරාධපුර යුගයේ විසූවන් තමන් නිර්මාණය කළ ගල් කැටයම් හා චිත්‍රවලට බොහෝ දුරට පාදක කොට ගෙන ඇත්තේ ස්වාභාවික පරිසරයේදී සිදුකළ නිරීක්ෂණයන් ය. ඔවුන් විසින් නිර්මාණය කරන ලද සත්ත්ව රූප, ජලජ පැළෑටි සහ ලියවැල් මඟින් පුරාණයේ පැවති ජෛවවිවිධත්වය සහ ඒ සම්බන්ධයෙන් පැවති ආකල්ප පිළිබඳ යම් අදහසක් ලබාගත හැකි ය. එම කැටයම් අතර වූ සිංහයා හා නයි පෙණ කිහිපයක් සහිත නාග රුව හැරුණු විට ඉතිරි සත්ත්ව විශේෂ සියල්ලම පාහේ නිර්මාණය කර ඇත්තේ ස්වාභාවික ලක්ෂණයන් ඉස්මතු වන ආකාරයට ය. පැරැන්නන් තම අදහස් ප්‍රකාශ කිරීමේදී බොහෝ දුරට සත්ත්ව රූප යොදාගෙන ඇති බැව් හැඟේ. මේ අතරින් ශෛලීගත සිංහයාට ප්‍රමුඛත්වය දී ඇත. එමෙන්ම නාග රූපය ගෘහ, ඡත්‍ර හා පාදම් අතර පිහිටුවා ගරු කටයුතු සංකේතයක් ලෙස හැඳින්වීමට එම ජන සමාජය වගබලාගෙන ඇත. බෞද්ධ භික්ෂූන් වාසය කළ හා පරිහරණය කළ සෑම ගොඩනැගිල්ලකම පාහේ කැටයම් අතරට සත්ත්ව රූප ඇතුළත් කිරීම තුළින් ඔවුන් ගැඹුරු අර්ථයන් සංකේතවත් කළා විය හැකි ය (රූපය 493). වැව්, සොරොව් හා පොකුණු අසල පෙණ කිහිපයක් සහිත නාගයින් නිර්මාණය කළේ කුමන හේතුවක් නිසාද? ලෝකඩින් නිම කරන ලද සංඛ, කකුළු, මැඩි, සර්ප හා ඉදිබු ආදි කුඩා පිළිම කුට්ටම් පොකුණේ හා ජේතවනාරාම පොකුණේ තැන්පත් කළේ ජලයට දක්වන ලද ගරු කිරීමක් හෝ යාග හෝම ආදි විශ්වාසයන් නිසාද? මේ අනුව සලකා බලන කළ පැරැන්නන්ගේ මෙම සත්ත්ව නිර්මාණ ප්‍රකාශ කරන අර්ථය තේරුම් ගැනීම ඉතා වැදගත් වේ.



මෙම පරිච්ඡේදය පුරාවටම අප විසින් සාකච්ඡා කරනුයේ අනුරාධපුර යුගයට අයත් නටබුන් අතර ගල් කැටයම්වල වූ සත්ත්ව රූප, කැණීම් කොට අනාවරණය කරගත් නොයෙක් අමුද්‍රව්‍යයන්ගෙන් නිර්මිත සත්ත්ව පිළිම හා සිතුවම්වල වූ සත්ත්ව රූප පිළිබඳව ය. ඊට අමතරව සත්ත්ව අවශේෂවලින් නිමවන ලද මානව කෘති ද මෙහිදී සාකච්ඡාවට ලක්කෙරේ. සමස්ත පරිච්ඡේදය පුරාවටම එම නිර්මාණ ඉදිරිපත් කොට ඇත්තේ විවෘත සංවාදයක් කරා පාඨක ඔබ යොමු කිරීම සඳහා ය.

රූපය 493. සත්ත්ව කැටයම්.
කණ්ඨක චෛත්‍යය, මිහින්තලේ
(ඡායාරූපය: කැප්ම් මනමේන්ද්‍ර-ආරච්චි)

රන්මසු උයනේ ශිලාමය රූප සටහන

රන්මසු උයනේ (රූපය 494) තිසා වැවට මුහුණලා පොළොවට යම් ආනතියකට පිහිටි ගල් තලයක නොගැඹුරු ලෙස නෙළා ඇති ශිලාමය රූප සටහන (lithic diagram) දේශීය හා විදේශීය විද්වතුන්ගේ අවධානයටත්, සාකච්ඡාවටත් භාජනය වී ඇත (රූපය 495). නමුත් එහි කාලවකවානුව ස්ථීර ලෙසම ප්‍රකාශ කළ නොහැකි වුවද බොහෝ විට එම නිර්මාණය ක්‍රි.පූ. 3 සිට ක්‍රි.පූ. 1 වන සියවසට අයත් යැයි සිතිය හැකි ය. එසේ ප්‍රකාශ කළ හැක්කේ අනුරාධපුර පැරණි ශිලා ලේඛන ක්‍රි.පූ. 3 වන සියවසේ සිට පැවත එන බැවිනි. එසේ වුවද තවත් අයුරකින් දක්වතොත් එම නිර්මාණය ක්‍රි.පූ. 7 හෝ 8 සියවස්වල සිට ක්‍රි.ව. 13 හෝ 14 අතර කාලපරිච්ඡේදයට අයත් විය හැකි බැව් ද සඳහන් කිරීමට පුළුවන. මෙම කැටයමින් සිතියමක්, ලෝකය, විශ්වය යන ආකාර අදහසක් නිරූපණය වන බැව් අදහස් වේ. 2007 වසරේ පළ වූ ශ්‍රී ලංකාවේ ජාතික සිතියම් පොතට මෙරට පුරාණ සිතියම් පිළිබඳ විස්තරයක් ලියන සුප්‍රසිද්ධ පුරාවිද්‍යාඥයෙකු හා කලා ඉතිහාසඥයෙකු වූ මහාචාර්ය සේනක බණ්ඩාරනායක මෙම කැටයම පිළිබඳ විස්තර කොට ඇත. එසේ වුවද එතුමා එහි අන්තර්ගතය පිළිබඳ නිශ්චිත නිගමනයකට පැමිණි බැව් නොහැඟේ (The National Atlas of Sri Lanka, 2007).




රූපය 494. රන්මසු උයන (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

මෙම ග්‍රන්ථය සඳහා උක්ත ශිලාමය රූප සටහන ඉවහල් කර ගැනීමට අප පෙළඹවූයේ එහි නිරූපණය වන සත්ත්ව රූප හේතුවෙනි. එම කැටයමේ වූ පිටත කවය මුළුමනින්ම පාහේ ජලජ ප්‍රාණීන්ගෙන් සමන්විත ය. කැටයමේ මධ්‍ය පෙදෙස සිරස් හා තිරස් බෙදීම්වලින් ද ඒ තුළ වූ කව, මධ්‍යයේ කතිර සහිත කව, හතරැස් කොටු, සිලින්ඩරාකාර හැඩ හා තවත් විස්තර කළ නොහැකි ව්‍යාකූල හැඩ ආදියෙන් එය සමන්විත ය (රූපය 496). සමස්ත කැටයමේ මධ්‍යයේ කොටුවක් තුළ වූ කව හතකින් යුත් රූපයකි.

මෙහි පිටත කවයේ වූ සත්ත්ව රූප වෙත අපගේ අවධානය යොමු කිරීම වැදගත් වේ. පළලින් අඩු පිටත කවය තුළ ජලජවාසී සතුන් මනා ලෙස කැටයමට නඟා ඇත. එම ජලජ සතුන් වනුයේ එකිනෙකට වෙනස් හැඩයන්ගෙන් යුත් මසුන්, හක් බෙල්ලන් හෙවත් සංඛ (රූපය 497), ඉබ්බන් හෝ කැස්බෑවුන් (රූපය 498)



රූපය 495. ශිලාමය රූප සටහන
(ඡායාරූපය: මාධව මීගස්කුඹුර)




රූපය 496. ගිලාමය රූප සටහනේ හඳුනා නොගත් රූප (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


හා කකුළුවන් (රූපය 499) ආදි සතුන් වේ. කැස්බෑවුන්ගේ ඉදිරි ගාත්‍රා යුගළ හෙවත් අවල්පත් ඉතා විශාල වේ. එසේ වුවද මෙහි වූ කැටයම් දෙකෙහි ඉදිරි අවල්පත් ප්‍රමාණයෙන් කුඩා බැවින් එම කැටයම් කැස්බෑවුන් නොව ඉබ්බන් බව දැක්වීම වඩාත් නිවැරදි වේ. කැටයමේ නිර්මාණකරු අස්ථික මසුන් ආකාර කිහිපයක් නෙළා ඇත (රූපය 500). එහි වූ රූප අතර මුහුදේ වසන කාටිලේජීය සැකිල්ලක් දරන මත්ස්‍යයෙකු වන මඩුවෙකුට සමාන කැටයමක් ද වේ (රූපය 501). ශ්‍රී ලංකාව අවට මුහුදේ වසන උදලු මෝරාට දළ වශයෙන් සමාන හොම්බ කෙළවර 'T' අකුරේ හැඩය දරන කැටයම අනෙකුත් මත්ස්‍ය කැටයම් අතර විශේෂ හැඩයක් දරනු ඇත (රූපය 502). මෙහි මෝර මත්ස්‍යයෙකුට සමාන හැඩයක් දරන කැටයමක් ද (රූපය 503) වන අතර එහි ශරීරයේ පූර්ව භාගය ක්‍රමයෙන් පටු වන අයුරින් නෙළා ඇත. තවත් රූපයක් මුහුදේ වසන මුහුදු අශ්වයෙකුට සමාන ය (රූපය 504). එහි වූ සත්ත්ව රූප අතර අපෘෂ්ඨවංශී සතුන් ද වේ. හක් බෙල්ලා හෙවත් සංඛය එක් සත්ත්වයෙකි. සංඛය මනා ලෙස සියලුම ලක්ෂණ විදහා දැක්වෙන අයුරින් නිර්මිත ය. ඊට අමතරව

කකුළුවෙකුගේ රූවක් ද වේ. මෙම කැටයමෙහි දකුණු පාර්ශ්වය හායනයට ලක්ව ඇත. එහි පාද හතරක සලකුණු සහ පිටත කවචයේ කොටසක් ශේෂ වී ඇත.

මෙම සමස්ත කැටයමේ අර්ථය කුමක්ද යන්න තේරුම් ගැනීම ඉතාමත් වැදගත් ය. ඇතැම් විට මුහුදින් වටවී ඇති භූමියක් හෙවත් දූපතක් එයින් නිරූපණය වනවා විය හැකි ය. මේ කැටයම පිළිබඳ වර්තමානයේ ඉදිරිපත්ව ඇති අදහස් හා කථිකාවන් බොහෝ ය. විද්‍යාත්මක පදනමක් මත හිඳ නොවුවද මෙය විශ්වය හරහා ගමන් කළ හැකි දොරටුවක් (gate way to the stars) ලෙස හැඳින්වීමට ඇතැම්හු පෙළඹී සිටිති. මෙම කැටයම ඉදිරියේ හිඳ නැරඹීම සඳහා බිම වූ ගල් තලාවේ අවතල හැඩයට සකස් කරන ලද ස්ථාන කිහිපයක් ඇති නිසා පැරැන්නන් ඒ දෙස එක එල්ලේ බලා සිටින්නට ඇතැයි අනුමාන කළ හැකි ය. නොඑසේ නම් ඒ දෙස නෙත් යොමා භාවනා කරන්නට ඇත. එසේ වුවද ඒ කුමන අරමුණක් උදෙසා ද යන්න පැවසීමට අප සතු දැනුම අල්ප ය.




රූපය 497. ශිලාමය රූප සටහනේ දැක්වෙන හක් බෙල්ලන් හෙවත් සංඛ රූප. ඡායාරූපය (වම), රූප සටහන (දකුණ) රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි (ඡායාරූපය සහ රූප සටහන්: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)







රූපය 498. ඉබ්බන් හෝ කැස්බෑවුන් දැක්වෙන රූප.
ඡායාරූපය (වම), රූප සටහන (දකුණ) රූප සටහනේ
පරිමාණ රේඛාව මි.මී. 10 කි
(ඡායාරූප සහ රූප සටහන්: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)





රූපය 499. කකුළුවාගේ රූපය. රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි.
(රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

























රූපය 500. අස්ථික මසුන්ගේ රූප. ඡායාරූප (වම), රූප සටහන් (දකුණ) රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි. (ඡායාරූප සහ රූප සටහන්: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)






රූපය 501. මඩුවෙකුට සමාන කැටයම. ඡායාරූප (වම), රූප සටහන (දකුණ)
(ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)






රූපය 502. උදැලු මෝරාට දළ වශයෙන් සමාන මත්ස්‍යයාගේ රූපය. ඡායාරූප (වම), රූප සටහන (දකුණ) රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි (ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)





රූපය 503. මෝර මත්ස්‍යයෙකුට සමාන හැඩයක් දරන මත්ස්‍යයාගේ රූපය. ඡායාරූප (වම), රූප සටහන (දකුණ) රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි (ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)





රූපය 504. මුහුදු අශ්වයෙකුට සමාන හැඩයක් දරන රූපය. ඡායාරූපය (වම), රූප සටහන (දකුණ) රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි
(ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


මහා විහාර පරිශ්‍රයේ වූ කොරවක් ගල් කැටයම

රුවන්වැලිසෑයේ උතුරු දොරටුවේ සිට ථූපාරාමය දක්වා දිවෙන මංපෙතේ ගමන් කරන කල්හි වම්පස මැදට වන්නට පුරාණ ගොඩනැගිලිවලට අයත් නටබුන් සමූහයක් පිහිටා ඇත (රූපය 505). එහි වූ එක් ගොඩනැගිල්ලක කොරවක් ගල් දෙකක පිටත මුහුණතේ සුවිශේෂී කැටයමක් තෙළා ඇත. මෙහි විශේෂත්වය වනුයේ අනුරාධපුර පෙදෙසේ හෝ ශ්‍රී ලංකාවේ වෙනත් පෙදෙස්වල වූ කොරවක් ගල්වලට වඩා වෙනස් ඉදිරිපත් කිරීමක් මෙහි ඇති බැවිනි. මහාචාර්ය ටී.ජී. කුලතුංග විසින් 2001 දී රචිත, *'අනුරපුර මහා විහාරය'* නම් පොතේ මෙම කැටයම පිළිබඳ විස්තර කොට ඇත. මේ ගොඩනැගිල්ල භික්ෂු අධිකරණ විනිශ්චය ශාලාවක්, පොහොය ගෙයක් ආදි වශයෙන් ඇතැමුන් සලකන බව මහාචාර්ය කුලතුංග එම පොතේ දක්වයි. ශ්‍රී ලංකාවේ කතාවස්තු චිත්‍රයට නැගීම සුලබ වුවද ඒවා කැටයමට නැගීමක් දක්නට ලැබෙනුයේ කලාතුරකිනි (කුලතුංග, 2001).



රූපය 505. කොරවක්ගල පිහිටි පුරාණ ගොඩනැගිල්ල (ඡායාරූපය: කැමිම් මනමේන්ද්‍ර-ආරච්චි)


මෙම ගොඩනැගිල්ලේ පියගැට පෙළට නගින කල දකුණුපස පිහිටි කොරවක් ගල් කැටයම වඩාත්ම හායනයට ලක්ව ඇති බැවින් එහි රූප අද වන විට විස්තර කිරීමට අපහසු තරම් අපැහැදිලි වී ඇත. මෙම පරිච්ඡේදයේ අපගේ මූලික අවධානය යොමු කරනුයේ පියගැට පෙළට නගින කල වම්පස පිහිටි කොරවක් ගල් කැටයම පිළිබඳව ය. එම කැටයම ද සුළු වශයෙන් හායනයට ලක්ව ඇතත් යම් පමණකට ඉතිරිව ඇති ලක්ෂණ පදනම් කර ගනිමින් පහත දැක්වෙන සාකච්ඡාව ගොඩනඟා ඇත. වම් හා දකුණුපස පිහිටි කොරවක් ගල් දෙකෙහි ඇත්තේ එකම කැටයම නොවන බව දකුණුපස කැටයමෙහි ශේෂ වී ඇති රූපවලින් පෙනේ (රූපය 506).



රූපය 506. අවම වශයෙන් භායනයට ලක්ව ඇති වම්පස කොරවක් ගල (ඉහළ) සහ වඩාත්ම භායනයට ලක්ව ඇති දකුණුපස කොරවක්ගල (පහළ) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

2012 දී අප මෙම කැටයම ඡායාරූපයට නඟන විට එහි වූ ලක්ෂණ මෙහි විස්තර කෙරේ. මෙහි අර්ධ කවාකාර හැඩැති වහල සහිත කුටි හතකි. එසේ වුවද වම් හා දකුණු පස මුදුනේ වැල් හෝ ගස් අතු ආකාර පත්‍ර සහිත අර්ධ කවාකාර කැටයම්වලින් යුක්තව තවත් කුටි දෙකක් දක්වා ඇත. මෙම කැටයමේ පහත මැද පිහිටනුයේ විශාලතම කුටියයි. එහි සිංහයින් දෙදෙනෙකු දැකිය හැකි අතර ඉහත දැක්වූ පරිදි පැහැදිලි වහලයක් නොමැත. එසේ වුවද එය ගල් ගුහාවක හැඩයක් ගන්නා අයුරින් නෙළා ඇත. මේ පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන මහාචාර්ය කුලතුංග දක්වා ඇත්තේ එය 'කුඩා කැටයම් ඵලක' එකොළහකින් යුක්ත වන බව ය.

මෙම කැටයමෙහි අන්තර්ගත මානව රූප, සත්ත්ව රූප හා ගස් හෝ වැල් පිළිබඳ අපගේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට පෙරාතුව මෙතෙක් මේ ගැන ලියවී ඇති තොරතුරු සලකා බලමු. මාර්ටින් වික්‍රමසිංහ සූරීන් විසින් රචිත 'මානව හිතවාදය හා එතෙර වියත්හු' (දෙවන මුද්‍රණය-2005) යන කෘතියේ පිටකවරය සරසා ඇත්තේ මෙම කැටයමේ චිත්‍රයකිනි. කවරයේ සිත්තම පිළිබඳ විස්තර කරන වික්‍රමසිංහයන් මෙසේ කියයි. ''නූගත් ගැමියන්ගේ ජීවභක්තිය ඈත අතීතයේ සිට නොනැසී පැවත එන්නකි. එසේ සිතන්ට අනුබල දෙන ගල් කැටයමක් අනුරපුරේ ථූපාරාමය අසල නටබුන් විහාරයක කොරවක් ගලක දක්නා ලැබේ. ඇකී මැකී ගිය මේ ගල් කැටයම ඉතාම පුරාණ කර්මාන්තයක් විය යුතු ය. මේ සිත්තමේ වම් පැත්තෙහි පහළ කොටුවෙහි තුවාල ලත් දරුවෙකුට හෝ වඳුරකුගේ සාත්තු කරන ගැහැනියක් හා පිරිමියෙක් වෙති. ඊට උඩින් මොණරා ඉදිරියෙහි වන සිත්තමෙහි වැදිරියකට පලවැල කවන වඳුරෙකි. උඩ මැද කොටුවෙහි පිටින් පැටියෙකු ගත් වැලහින්නකි. වැලහින්නට පාතින් වන කොටුවෙහි ඇතෙක් ඇතින්න හා හාදකම් කරයි. උන් දෙදෙනාට වම් පසින් දක්නට ලැබෙන්නේ මුවකු හා කොටියෙකු හාදකම් කරනු දැක්වෙන කැටයමකි. ඒ එක්කම මුගටියෙකු හා නයෙකු හාදකම් කරනු දැක්වෙන කැටයමකි. ඊට පහළින් කැටයමෙහි සත්තු දෙදෙනෙක් උනුන්ගේ මුහුණු ලෙවකති. පහළම කොටුවේ හාන්සි වී විඩා හරින ගොවියෙකි. ඔහුගේ එක කකුලක් ඉස්සී දණහිසින් නැමී සිටියි. දණ හිස මතුයෙහි රැඳී සිටින ඔහුගේ අත ද විඩා හරින බව අඟවයි. ඒ අතට උඩින් ගවයෙකුගේ හිස දක්නා ලැබේ. ගැමි ශිල්පියා අදහස් කළේ ගවයා ගොවියාගේ අත ලෙවකනු දැක්වීමට යැයි අනුමාන කළ හැකි ය. ගල් කැටයම මුදුන දෙපැත්තේ දක්නා ලැබෙන්නේ තවුසන් දෙදෙනෙකු සහිත අසපු දෙකකි. තවුසෝ මිනිසුන් දෙදෙනා පුදන දේ පිළිගනිති; නොඑසේ නම් මිනිසුන් දෙදෙනාට බණ කියති" (වික්‍රමසිංහ, 2005).



රූපය 507. සත්ත්ව හිසක් හා හිඳගෙන සිටින මිනිස් රූව
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 508. ඉසුරුමුණියේ වූ මිනිසා හා අශ්ව හිස කැටයම
(ඡායාරූපය: මාධව මීගස්කුඹුර)




රූපය 509. කැටයමේ දකුණුපස පහළ සිට ඉහළට දෙවන රූපයේ කාන්තා රූප සහ සත්ත්ව රූප (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මෙම කැටයම සහිත වම් කොරවක් ගල මැදින් පුපුරා ගොස් ඇති බැවින් කැටයමට ද හානි සිදු වී ඇත. කැටයමේ පහත මධ්‍යයේ වූ විශාල සිංහ රූප දෙකෙන් ඉදිරියේ වූ සිංහයා දකුණු අත ඔසවාගෙන මඳක් පසුපසට හැරී බලා සිටියි. පසුපසින් වූ සිංහයා තම ඉදිරි බාහුවක් ඉදිරියෙන් වූ සිංහයාගේ තුනටිය පෙදෙස මත රඳවා ඇත. කැටයමෙහි දකුණුපස පහළින් ඇත්තේ සත්ත්ව හිසක් හා හිඳගෙන සිටින මිනිස් රුවකි (රූපය 507). වික්‍රමසිංහ මහතා දක්වනුයේ මෙහි ඇත්තේ හාන්සි වී විඩා හරින ගොවියෙකු බවයි. ගොවියාගේ අත ලෙව කන ගවයෙක් එහි වන බව වික්‍රමසිංහ අනුමාන කරයි. එසේ වුවද මහාචාර්ය කුලතුංග දක්වනුයේ එහි දක්නට ලැබෙනුයේ ඉසුරුමුණියේ වූ සුප්‍රසිද්ධ මිනිසා හා අශ්ව හිස කැටයමට සමාන කැටයමක් බවයි (රූපය 508). ඉසුරුමුණියේ මිනිසා හා අශ්ව හිස කැටයමට වඩා මෙම කැටයමේ මිනිසාගේ ශරීර ඉරියව් යම් පමණකට වෙනස් වුවද එය ඉසුරුමුණියේ කැටයමට බොහෝ සෙයින් සමාන වේ. ඒ අනුව එය ගොවියා හා ගවයා යන වික්‍රමසිංහ සූරීන්ගේ හැඳින්වීමට වඩා ඉසුරුමුණි කැටයමට වඩාත් සමාන බැව් ප්‍රකාශ කිරීම සාධාරණ වේ. කැටයමේ දකුණුපස පහළ සිට ඉහළට දෙවන රූපයේ කාන්තා රූප තුනක් දැකිය හැකි ය. එහි පයෝධර පෙදෙස් හා ඉහළට බැඳි වටකුරු කොණ්ඩ නිසා කාන්තා රූප බැව් නිගමනය කළ හැකි ය. එම කාන්තා රූපවලට ඉදිරියෙන් ක්ෂීරපායීන් දෙදෙනෙකුගේ රූප දෙකකි. මේ සතුන් අතරින් වම්පස සත්ත්වයාගේ ස්ථූල ගෙල, ශක්තිමත් බාහු හා දිගු වල්ගය අනුව ඒ කොටියෙකු විය හැකි බව අනුමාන කළ හැකි ය. දකුණුපස සත්ත්වයාගේ සිහින් දිගු ගෙල, දිගු ඉදිරි ගාත්‍රා හා දිගු හිස අනුව ඒ බොහෝ විට මුවෙකු විය හැකි ය. මෙහි කොටියා හිස ඔසවාගෙන සිටින අතර මුවා තම හොම්බෙන් කොටි හිස ස්පර්ෂ කරනු පෙනේ (රූපය 509). මහාචාර්ය කුලතුංග දක්වන අන්දමට මෙම ඵලකයේ ඇත්තේ ස්ත්‍රී පුරුෂ යුවළ දෙකක් හා මුවෙකු සමග සිටිනා නරියෙකු විය හැකි රූප දෙකකි.

ඉහත ඵලකයට ඉහළින් පිහිටි ඵලකයේ හිඳ සිටින මුවෙකු ද, මුවාට පිටුපසින් ඉදිරිය බලා සිටින කොටියෙකුගේ උඩු කයක් ද වේ (රූපය 510). දිගටි පාදත්, දිගු හිසත්, ශරීරයේ හැඩයත් නිසා මෙහි ඇත්තේ මුවෙකු බව ද, ඊට පසුපසින් ඇති රූපය මූලික ශරීර ලක්ෂණ මත කොටියෙකුට සමාන බව ද හඳුනාගත හැකි ය. මේ ඵලකයේ දෙපස ගස් දෙකකි. මහාචාර්ය කුලතුංග දක්වනුයේ මෙහි ඇත්තේ මුවෙකු හා ව්‍යාඝ්‍රයෙකු බවයි. අප රට කැටයම් අතර ව්‍යාඝ්‍රයින් දැකිය නොහැකි බැවින් ද, සිංහයෙකුගේ නම් කේසර තිබිය යුතු වීම නිසා ද, මෙහි ඇත්තේ කොටියෙකු බව දැක්වීම නිවැරදි ය.



රූපය 510. හිඳ සිටින මුවෙකු ද, මුවාට පිටුපසින් ඉදිරිය බලා සිටින කොටියෙකුගේ උඩු කයක් ද දැක්වෙන කැටයම (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 511. දිගු හොම්බක් දරන (මුගටියෙකුට හෝ උගුඩුවෙකුට සමාන) සතුන් දෙදෙනෙකු දැක්වෙන කැටයම (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 512. ශාක පත්‍ර සහිත අතු බෙදී ගිය ගස හා සතුන් තිදෙනෙකු දැක්වෙන කැටයම (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

වික්‍රමසිංහ මහතා දක්වා ඇත්තේ මුවෙකු හා කොටියෙකු හාදකම් කරනු දැක්වෙන කැටයමක් මෙහි ඇති බව ය. මේ ඵලකයට වම් පසින් වූ පටු පෙදෙසේ දිගු හොම්බක් දරන (මුගටියෙකුට හෝ උගුඩුවෙකුට සමාන) සතුන් දෙදෙනෙකු නෙළා ඇත (රූපය 511). එක් සත්ත්වයෙකු හිඳගෙන ඉහළ බලා සිටින අතර අනෙක් සත්ත්වයා ඉහළට ගමන් කරමින් සිටියි.

කොටි-මුව ඵලකයට දකුණු පසින් වූ කලාපයේ සත්ත්ව රූප තුනකි. ඊට අමතරව ශාක පත්‍ර සහිත අතු බෙදී ගිය ගසකි. ගසෙහි පහත දිගු හොම්බක්, දිගු සිරුරක්, දිගු පුළුල් වල්ගයක් හා කෙටි පාද දරන සත්ත්ව රූපය මුගටියෙකුගේ හෝ හෝතඹුවෙකුගේ විය හැකි ය. මුගටියාගේ පිටුපසින් ගස දෙසට යොමු වී සිටින සර්ප රූපයකි. එහි හිස පුළුල්ව දක්වා ඇතත් පෙණ ගොබයක් පෙන්වා නොමැත. ගසෙහි අතු දෙබලේ වටකුරු හිසක්, දිගටි නොවූ කෙටි සිරුරක් හා ගස් අතු අතර සැඟවී ඇති සිහින් වල්ගයක් සහිත සතෙකි. උගේ උදරයේ එම හැඩැති පැටවෙකු එල්ලී සිටින අයුරු දිස්වේ. මෙහි නෙළා ඇත්තේ මුගටියෙකු, නයෙකු සහ පැටවෙකු උදරයේ රඳවා ගත් රිළවෙකු හෝ වඳුරෙකුයැයි ද, උන් අරගලයකින් තොරව සතුටින් වාසය කරන බැව් ද සිතිය හැකි ය. නාගයාගේ පෙණ ගොබය දක්වා නොමැත්තේ මෙහිදී නාගයා කලහකාරී නොවන බැව් දැක්වීමට විය හැකි ය. මෙහිදී නාගයාත්, මුගටියාත් සමගියෙන් ජීවත් වන බැව් දැක්වීමට උත්සාහ දරා ඇත (රූපය 512). මහාචාර්ය කුලතුංග ද මෙහි නාගයකු, මුගටියෙකු හා පැටවෙකු ද සහිත රිළවෙකු වෙතැයි දක්වා ඇත. වික්‍රමසිංහ මහතාගේ ද අදහස වී ඇත්තේ මුගටියෙකු හා නාගයෙකු හාදකම් කරන අවස්ථාවක් මෙයින් නිරූපණය කරන අන්දම දක්වන බව ය.

සමස්ත කැටයමේ වම් හා දකුණු පස ඉහළ මුදුනේ එක සමාන මිනිස් රූප සහිත කැටයම් නෙළා ඇත. එහි පුරුෂ යුගළ දෙකකි. ඔවුන්ගේ හිසකෙස් මුදුනට කොට බැඳ ඇත. ඉහළින් විහිදී ගිය රුක් සෙවනක හිඳ අදහස් ප්‍රකාශ කරන බවක් පෙන්වන ඔවුන් තවුසන් විය හැකි ය. තවුසන් ඉදිරියේ හිඳි මිනිසුන් දෑතින් යමක් ප්‍රදානය කරන බැව් පෙනේ (රූපය 513). මහාචාර්ය කුලතුංගට අනුව එහි හිඳිනුයේ මිනිසුන් හා තවුසන් ය. වික්‍රමසිංහ මහතාට අනුව ඒවා තවුසන් දෙදෙනෙකු සහිත අසපු දෙකකි. තවුසෝ මිනිසුන් දෙදෙනා පුදන දේ පිළිගනිති. නොඑසේ නම් මිනිසුන් දෙදෙනාට බණ කියති. මෙම කැටයමේ වම් පස පහතම ඵලකයේ ස්ත්‍රී හා පුරුෂ යුවළකි. එක් රූපයක පයෝධර පැහැදිලිව නෙළා ඇත. ඔවුන් දෙදෙනා අතර තවත් මිනිස් රුවකට සමාන රුවක් තිබුණ ද විස්තරයක් ඉදිරිපත් කිරීමට තරම් එය පැහැදිලි නැත (රූපය 514). මහාචාර්ය කුලතුංගට අනුව එම යුවළ කුඩා දරුවෙකු



රූපය 513. එක සමාන පුරුෂ යුගළ දෙකක් සහිත කැටයම (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

දරා සිටිනවා විය හැකි ය. වික්‍රමසිංහ මහතාට අනුව එහි ඇත්තේ තුවාල ලත් දරුවෙකුට හෝ වඳුරෙකුට සාත්තු කරන ගැහැනියක් හා පිරිමියෙකි.

ඉහත දක්වන ලද ඵලකයට ඉදිරියෙන් ඇත්තේ වඳුරු හෝ රිළා යුවළක් පෙන්නුම් කරන කැටයමකි (රූපය 515). උන්ගේ සිහින් හා දිගු ගාත්‍රා අනුව වඳුරන් හෝ රිළවුන් බැව් පැහැදිලිව දැක්විය හැකි ය. මෙහි වූ ප්‍රමාණයෙන් කුඩා සත්ත්වයා යම් ඵලයක් ආහාරයට ගන්නා බැව් පෙනේ. මෙම ඵලකයට වම්පසින් බොහෝ දුරට මොනරෙකුට සමාන රූපයක් ඇත (රූපය 516). මොනරා පසුබිමේ මඳක් ඉහළට හිස යොමා සිටින මිනිස් රූ දෙකකි. ඒ බොහෝ විට ගැහැනියෙකු හා පිරිමියෙකු විය හැකි ය. සමස්ත කැටයමේ සිංහ රූප දෙකකට ඉහළින් වූ ඵලකයේ ඇති රූප දෙක පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීමට අසීරු ය. මහාචාර්ය කුලතුංග හා වික්‍රමසිංහ මහතා පවසා ඇත්තේ එහි ඇත්තේ ඇතෙක් හා ඇතින්නක් බව ය. එසේ වුවද අද වන විට එහි එවැනි ආකාර ලක්ෂණ කිසිවක් ඉතිරි වී නොමැත. ඊට ඉහළින් වූ ඵලකයේ තත්ත්වය ද එසේම ය. එහි සතර පයින් සිටින, ස්ථූල සිරුරක් ඇති, වටකුරු හිසක් ඇති රූපයකි. උගේ පිට මත වන තවත් රූපයක් තිබුණ ද එය කවරක් ද යන්න පැහැදිලිව පැවසීම අසීරු ය. නමුත් ඉහත විද්වතුන් දෙපළ දක්වා සිටිනුයේ එහි සිටිනුයේ පැටවකු පිට මත තබාගෙන යන වැලහින්නක් බව ය. කෙසේ වුවද අද වන විට ඉතිරිව ඇති ලක්ෂණ අනුව එසේ ප්‍රකාශ කිරීම අපහසු ය (රූපය 517). එම සත්ත්ව රූපවලට අමතරව එහි පැහැදිලි ලෙස ගසක් දැකිය හැකි ය. සමස්ත කැටයමේ ඉහළින්ම වටකුරු හැඩැති රූප තුනක් නෙළා ඇති අතර ඒවා ද එතරම් පැහැදිලි නැති වුවද බොහෝ දුරට පුෂ්ප සංකේත විය හැකි ය.



රූපය 514. ස්ත්‍රී හා පුරුෂ යුවළක් හා හඳුනානොගත් රුවක් දැක්වෙන කැටයම
(ඡායාරූපය කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 515. වඳුරු හෝ රිළා යුවළක් පෙන්නුම් කරන කැටයම (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 516. බොහෝ දුරට මොනරෙකුට සමාන රූපයක් සහ මිනිස් රූප දැක්වෙන කැටයම (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 517. සතර පයින් සිටින, ස්ථූල සිරුරක් ඇති, වටකුරු හිසක් ඇති රූපයක් දැක්වෙන කැටයම (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මෙම සමස්ත කැටයම මනාව අධ්‍යයනය කර බලන කල එහි බොහෝ සාමකාමීව හැසිරෙන මිනිසුන් හා සතුන් නිරූපණය කරන බැව් පෙනේ. කොටියා-මුවා හා නාගයා-මුගටියා වැනි සතුරු ආකල්ප දරන සතුන් හා එහි වූ අනෙකුත් මිනිසුන් ද ඉතා සුහදව එකිනෙකා හා හැසිරේ. එසේ නම් මේ කැටයමින් මෛත්‍රිය හා සමගිය වැනි අදහසක් පිළිබිඹු වන බව හැඟේ. මහාචාර්ය කුලතුංග ඔහුගේ ග්‍රන්ථයේ විස්තර කරන අන්දමට මෙම කැටයමින් බල ජාතකය, කපිල මුනිගේ උපත ආදී කතා වස්තූන් නිරූපණය වන බවට අදහස් දක්වා තිබුණ ද ඒවා ස්ථිර වශයෙන් දැක්වීම අපහසු බැව් ඔහු තවදුරටත් සඳහන් කොට ඇත (කුලතුංග, 2001). ඒ කෙසේ වුවද මේ කැටයම අප රට කලා ඉතිහාසයේ ඉතා වැදගත් නිර්මාණයක් බව පැවසිය හැකි ය. මෙම දුර්ලභ නිර්මාණය ඉතිහාසය, කලාව ආදි විෂයන් තුළින් අර්ථකථනය කිරීම ඔවුන්ට භාර කරමින් මේ සාකච්ඡාවට අපි නැවතීමේ තිත තබමු. එසේ වුවද පුරාණ ජනයා තම අදහස් ප්‍රකාශ කිරීමේදී සතුන් හා මිනිසුන් තම කලා කෘතිවලට යොදාගැනීම පිළිබඳ මෙම කැටයම කදිම නිදසුනක් වනු ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රථම අධ්‍යක්ෂ එච්.සී.පී. බෙල් මහතා (H.C.P. Bell) මෙම කොරවක් ගල පිළිබඳ ව 1987 දී තම පුරාවිද්‍යා වාර්තා වල සඳහන් කොට ඇත (Bell, 1897).

ජේතවනාරාම පොකුණෙන් ලද සත්ත්ව රූප

මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් කළ කැණීමකදී ජේතවන ස්ථූපය අසල වූ පොකුණකින් හමුවූ ජලජ සතුන්ගේ රූප පිළිබඳ මෙහිදී අපගේ අවධානය යොමු වේ (රූපය 518). පොකුණ පත්ලේ තැන්පත් කොට තිබුණු ගිලාමය මංජුසාවක් තුළ තිබී මෙම ලෝකඩින් නිර්මිත සත්ත්ව රූප හමුවී ඇත. මේ සත්ත්ව රූප සමඟ ශ්‍රී ලක්ෂ්මී දේවියගේ මූර්තියක් ද වී ඇත. තවද ඉබ්බෙක්, මිරිදිය කකුළුවෙක්, පෙණ පහක නාගයෙක්, දිය නයෙක් හෙවත් දිය බරියෙක්, මැඩියෙක් සහ මත්ස්‍ය යුගළයක් ද වූ අතර පිළිම සියල්ල පාහේ ත්‍රිමාණ හැඩයකට අනුව නිම කොට ඇත. එම පිළිම සංරක්ෂණයෙන් අනතුරුව වර්තමානයේ ජේතවනාරාම කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. මේ හා සමාන පිළිම කිහිපයක් කුට්ටම් පොකුණ කැණීමෙන්ද හමුවී ඇති අතර ඒවා අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ (රූපය 519). කුට්ටම් පොකුණෙන් හමුවූ එම පිළිම ද ගිලාමය මංජුසාවක බහා තිබිණි. මෙම පොකුණු දෙකෙහිම එකම ආකාරයේ වත් පිළිවෙතක් සිදු වී ඇති බැව් මේ අනුව අනුමාන කළ හැකි ය.



රූපය 518. ලෝකඩ සත්ත්ව රූප හමුවූ ජේතවනාරාම පරිශ්‍රයේ වූ පොකුණ. මෙම පොකුණ පිහිටා ඇත්තේ ජේතවනාරාම කෞතුකාගාරයට ඇතුළු වීමේදී ඊට දකුණු පසින්ය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 519. කුට්ටම් පොකුණ, අනුරාධපුරය (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

ජේතවනාරාම පරිශ්‍රයේ වූ පොකුණේ බටහිර හා දකුණු බිත්ති සම්බන්ධ වන කෙළවර මෙම ගිලාමය මංජුසාව තිබී ඇත. එම සත්ත්ව රූප ජලය සංකේතවත් කිරීමට හෝ ජලයට කළ පුද පූජාවන් සඳහා හෝ ජලයට ගෞරවයක් පිණිස තැන්පත් කළ ඒවා බැව් අනුමාන කළ හැකි ය. පුරාවිද්‍යාත්මක සාධකවලට අනුව ද, වර්තමානයේ ගැමියන් අතර ද ජලයට ගෞරව කිරීම් හා ජලය වෙනුවෙන් පුද පූජා පැවැත්වීම් සිදුකෙරේ. අනුරාධපුර රාජධානියේ වූ සශ්‍රීකත්වයත්, සෞභාග්‍යයත් වැව්වලට අමතරව ඉදිකොට ඇති පොකුණුවලින් ද පෙනේ. මේ පොකුණු ඉදිකෙරුණේ පරමාර්ථ කිහිපයක් මුල් කරගෙන ය. ස්නානය, උද්‍යාන අලංකරණය, පානීය ජලය ලබා ගැනීම හා රජ පවුලේ අභිෂේක මංගල්‍යය ආදි සුවිශේෂී අවස්ථාවන්වලදී පිරිසිදු ජලය ලබා ගැනීම වැනි කරුණු ඒ අතර විය.

මෙම නිර්මාණ අතර මිරිදිය කකුළුවා (රූප 520, 521) පිළිබඳ අප ප්‍රථමයෙන් සලකා බලමු (ජේතවනාරාම කෞතුකාගාරයේ ලියාපදිංචි අංකය R.N.13401A). මෙම කකුළුවා ඉතා සියුම් නිර්මාණයක් යැයි සඳහන් කළ හැකි ය. බාහිර ලක්ෂණ අනුව මෙම කකුළුවා කරදියේ වසන



රූපය 520. මිරිදිය කකුළුවා. ජේතවනාරාම කෞතුකාගාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 521. මිරිදිය කකුළුවා. පෘෂ්ඨීය පෙනුම (ඉහළ) සහ උදරීය පෙනුම (පහළ). පහළ රූපයෙහි කකුළුවාගේ උදරාවරණය පැහැදිලි ලෙස දක්වා ඇත. රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි. (රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

විශේෂයක් නොව වියළි කලාපීය වගුරු හා ජලය ආශ්‍රිතව වසන කකුළුවෙකු බව හඳුනාගැනීම අපහසු නොවේ. වියළි කලාපයේ හා තෙත් කලාපයේ දිය කඩිතිවල මිරිදිය කකුළු විශේෂ 50 කට වැඩි සංඛ්‍යාවක් පමණ වාසය කරයි. අනුරාධපුර ප්‍රදේශය ආශ්‍රිතව මිරිදිය කකුළු විශේෂ පහක් එනම්, *Ceylonthelphusa rugosa*, *Oziothelphusa ceylonensis*, *Oziothelphusa hippocastnum*, *Oziothelphusa ritigala* හා *Oziothelphusa minneriyaensis* වාර්තා වේ. ඉහත විශේෂ පහ රූපීය වශයෙන් බොහෝ දුරට එක හා සමාන ය. මෙම ලෝකඩ කකුළු නිර්මාණයේ බාහිර ලක්ෂණ අනුව ඉහත විශේෂ පහෙහිම රූපීය ලක්ෂණයන්ගේ නියෝජනයක් නිරූපිත ය. කකුළුවාගේ උඩු කබලේ ඕවලාකාර හැඩය මනා ලෙස ඒ ආකාරයෙන්ම නිර්මාණය කර ඇත. එමෙන්ම යමක් ග්‍රහණය කිරීමට අනුවර්තනය වී ඇති ප්‍රථම ගාත්‍රා යුගලේ සන්දංශිකාව මනා ලෙස ඉස්මතු වන ආකාරයෙන් නිර්මිත ය. උන් සංචරණය සඳහා භාවිත කරන පා යුගළ හතර ද නියමාකාරයෙන්ම නිර්මාණය කිරීමට නිර්මාණකරු වෙහෙස වී ඇත. මෙම කකුළුවාගේ උදරීය ප්‍රදේශය පරීක්ෂා කිරීමේදී එහි වූ සියුම් ලක්ෂණ අනුව මින් නිරූපණය වනුයේ ගැහැනු සත්ත්වයෙකි. සිතාමතාම ගැහැනු කකුළුවෙකුගේ රූවක් නිර්මාණය කළේ ද යන්න පැහැදිලිවම කිව නොහැකි ය. පා යුගළ හතර සිහින් හා දිගටි ය. එම නිසා ඒවා කැඩී බිඳී යාවීදෝ යන සැකයෙන් එම පා යුගළ සතර එකට සවිවන සේ යටි පැත්තේ ලෝහමය ආධාර දෙකක් යෙදීමට නිර්මාණකරු වග බලා ගෙන ඇත. කකුළු නිර්මාණයේ වම් ඇස ඉතා පැහැදිලි අතර දකුණු ඇස ද පිහිටා ඇත. පිළිමයෙහි වූ මූලික ලක්ෂණ අනුව පෙනී යන්නේ පරිසරයෙන් අල්ලා ගන්නා ලද කකුළුවෙකු ආධාරයෙන් තනා ගැනුණු අච්චුවක් මගින් මෙම නිර්මාණය සිදු කරන්නට ඇති බව ය.

ශිලාමය මංජුසාව තුළ මත්ස්‍ය රූප (රූප 522, 523) යුගළක් ද විය (ජේතවනාරාම කෞතුකාගාරයේ ලියාපදිංචි අංකය R.N.13401F). මෙමගින් නිරූපණය වන්නේ ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්ගෙන් බහුතරයක් අයත් වන සිප්‍රිනිඩේ කුලයේ (family - Cyprinidae) මත්ස්‍යයෙකි. තිත්තයින්, ඉපිල්ලන්, දණ්ඩීන්, ලෙහෙල්ලන්, හිරිකණයින් ආදි කොරපොතු පැහැදිලිව ඇති මසුන් මේ කුලයට අයත් වේ. මෙම මත්ස්‍ය රූප දෙකෙහි වූ ලක්ෂණ අනුව පැහැදිලි වනුයේ මොවුන් පෙතියන් හා තිත්තයින් අයත් වන විද්‍යාත්මකව *Puntius* නම් ගනයේ ශාරීරික ලක්ෂණ දරන බවයි. නිර්මාණකරු එම ශාරීරික ලක්ෂණ ඉතා



රූපය 522. මිරිදිය මත්ස්‍යයා. ජේතවනාරාම කෞතුකාගාරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 523. මිරිදිය මත්ස්‍යයා. මෙහි මුඛය, ඇස්, පෘෂ්ඨීය වරල, උදරීය වරල, ශ්‍රෝණි වරල හා පෞච්ඡ වරල මනාව නිරූපිත ය. එමෙන්ම ශරීර පාර්ශ්වයේ වූ කොරළ ද නියම ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමට වෑයම් කොට ඇත.
රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි
(රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

පැහැදිලි ලෙස මෙම නිර්මාණවලට ඇතුළත් කොට ඇත. එම ලක්ෂණ අතර ද්වීපාර්ශ්විකව පැතලි ශරීරය, කැපී පෙනෙන කරමල් ආවරණය හෙවත් පිධානය, විශාල කොරළ, මුඛයේ හා ඇස්වල පිහිටීම ඇතුළු ශරීරයේ වූ අනෙකුත් මූලික හැඩ නිර්මාණකරු මෙම නිර්මාණයන්ට මනාව ආදේශ කොට ඇත. ළය වරල් හා ශ්‍රෝණි වරල්වල පහිටීම ඉතා නිවැරදිය. වල්ග වරල හෙවත් පෞච්ඡ වරල මනා ලෙස බණ්ඩ දෙකකට බෙදා ඇති අතර ඉතා පැහැදිලි වරලක් වන ගුද වරල මුළුමනින්ම පාහේ අමතක කොට ඇත. සියලුම වරල්වල කිරණ නිර්මාණය කිරීමට තරම් නිර්මාණකරු සියුම් වී නැති බව ද මෙහිදී සඳහන් කළ යුතුය. එසේ වුවද මෙම ගනයට අයත් මසුන්ගේ පැහැදිලි ශාරීරික ලක්ෂණයක් වන විශාල කොරළ කදිමට දක්වා ඇත. මෙම මත්ස්‍ය රූප දෙකෙන් නියෝජනය වන්නේ අනුරාධපුර ආශ්‍රිත ජලජ පරිසරයේ ඉතා සුලබ කොට පෙතියෙකි (රූපය 230). විද්‍යාත්මකව *Puntius thermalis* යනුවෙන් හඳුන්වනු ලබන මෙම මත්ස්‍යයා ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේත්, වියළි කලාපයේත් එක ලෙස පැතිර ඇත (තෙත් කලාපයේ ජීවත් වන මෙවැනි හැඩැති මත්ස්‍යයාට *Puntius kamalika* යනුවෙන්ද සිංහල බසින් කාමලිකාගේ පෙතියා යනුවෙන්ද ව්‍යවහාර වේ). මිලිමීටර් 80 ක් පමණ දිගින් යුක්තව වැඩෙන මෙම මත්ස්‍යයාගේ ප්‍රධානතම ආහාරය වන්නේ ජලයේ වැවෙන පෙඳ පාසි ආදියයි.

ජලජ සත්ත්ව රූප අතර මැඩියා ද (රූප 524, 525) ඉතා සිත්ගන්නාසුලු නිර්මාණයකි (ජේතවනාරාම කෞතුකාගාරයේ ලියාපදිංචි අංකය R.N.13401C). ගෙම්බෙකුගේ දැකිය හැකි බිබිළි නොදරන බැවින් ද, ශරීරයේ සහ ගාත්‍රා මතුපිට මෘදු බැවින් ද, මෙම නිර්මාණය මැඩියෙකු නියෝජනය කරන බව සඳහන් කළ හැකිය. මැඩියන් ගස් මත හෝ ජලයේ නිමග්නව හෝ ජලයට ඉතා සමීපව වෙසේ. උන්ගේ චර්මය නිතරම පාහේ තෙත්ව පවතී. මෙම මැඩි රූපයේ වූ ශාරීරික ලක්ෂණ වන සිනිඳු සම, හිසේ ඉහළින් පිහිටා ඇති ඇස් යුගළ, පළල් මුඛය හා ස්ථූල ශරීරය විද්‍යාත්මක පදනමක සිට නිර්මාණය කර ඇති බව කියාපෑමට හැකි මාහැඟි සාධක වේ. මෙම රූපයේ ඉහත ලක්ෂණ අනුව මෙයින් නියෝජනය වන්නේ සයැඟිලි පළා මැඩියෙකු බව නිගමනය කළ හැකි ය. සයැඟිලි පළා මැඩියා විද්‍යාත්මකව *Euphlyctis hexadactylus* ලෙසින් හැඳින්වෙන අතර රානිඩේ කුලයට (family - Ranidae) අයත් වේ. මෙම මැඩි විශේෂය මෙරට පහතරට සහ මධ්‍යම කඳු අතර වියළි හා තෙත් යන කලාප දෙකෙහිම ජීවත් වේ. අනුරාධපුරය ආදී පොකුණු, වැව්, ළිං, කුඹුරු බහුල වියළි කලාපීය පෙදෙස්වල ද සුලබව ජීවත් වේ. දුඹුරු, කොළ හෝ කහ පැහැ මිශ්‍ර කොළ පැහැති සිරුරක් දරන අතර මිලිමීටර් 120 ක් පමණ දික්ව වැඩේ. මුළුමනින්ම ජලජ ජීවිතයක් ගතකරන මෙම මැඩියා ගොඩබිමට පැමිණෙන්නේ රාත්‍රී කාලයේ පමණි. අනුරාධපුර පෙදෙසේ කුමුදු, ඕලු, නෙළුම් සහ මානෙල් ආදී ජලජ ශාක බහුල නොගැඹුරු ජලයේ සුලබව ජීවත් වේ. නිර්මාණකරු තම නිර්මාණය සඳහා තෝරාගෙන ඇත්තේ පූර්ණ ජලජ ජීවිතයක් ගතකරන මෙම සයැඟිලි පළා මැඩියා ය. සයැඟිලි පළා මැඩියාගේ ප්‍රධාන ශාරීරික ලක්ෂණ සියල්ලම පාහේ රූපයේ දක්වා ඇත. දකුණුපස



රූපය 524. මැඩියා. ජේතවනාරාම කෞතුකාගාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 525. මැඩියා. සිනිඳු සම, හිසේ ඉහළින් පිහිටා ඇති ඇස් යුගළ, පළල් මුඛය හා ස්ථූල සිරුර ආදී ලක්ෂණ අනුව සයැඟිලි පළා මැඩියෙකු (*Euphlyctis hexadactylus*) මෙමගින් නිරූපිත බව පැහැදිලි ය. රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි (රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ඇසට පිටුපසින් කන හෙවත් කර්ණපටහ පටලය පැහැදිලි ය. නමුත් වම්පස එය එතරම් පැහැදිලි නැත. ඉදිරි ගාත්‍රා යුගළේ වෙන් වෙන් ව පිහිටන ඇඟිලි රූපයේ දැක ගැනීම අසීරු ය. නිර්මාණයේ එසේ තිබුණ ද පසු කලෙක ඒවා කැපී බිඳී ගියා යැයි සිතිය හැකි ය. එසේ වුවද පසු ගාත්‍රාවල පා ඇඟිලි අතර බැඳි පටල ඇති බවක් පෙනේ. දකුණුපස පසු පාදයේ සිහින් හා දිගටි පා ඇඟිලි පැහැදිලි ය. එහි ද ඇඟිලි අතර වූ බැඳි පටලය නිර්මාණය කොට ඇතැයි රූපය දෙස සුපරීක්ෂාකාරීව බැලීමේදී පෙනේ. සයැඟිලි පළා මැඩියා ජලජ වාසියෙකු බැවින් පසු පාදයේ වූ දිගු ඇඟිලි අතර පිහිටන බැඳි පටලය පිහිනීමටත්, කිමිදීමටත් උපකාරී වේ.

ශිලාමය මංජුසාවේ තිබී හමුවූ සත්ත්ව රූප අතර දිය නයා හෙවත් දිය බරියා (රූප 526, 527) ඉතා සරල අයුරින් නිර්මාණය කොට ඇත (ජේතවනාරාම කෞතුකාගාරයේ ලියාපදිංචි අංකය R.N.13401G). මූලික වශයෙන්ම සර්පයෙකුගේ හැඩය පිළිබිඹු කිරීමට පමණක් නිර්මාණකරු උත්සාහ ගෙන ඇති බව පෙනේ. මත්ස්‍ය රූපයේ කොරළ හැඩයන් දක්වා තිබුණ ද සර්පයාගේ ශරීරය ආවරණය කරන කොරළ නුවාදැක්වීමට තරම් නිර්මාණකරු සූක්ෂම වී නැත. මෙම මංජුසාවේ වූ සියලුම සත්ත්ව පිළිම ජලජ ප්‍රාණීන් නියෝජනය කරන බැවින් මෙම සර්ප රූව දිය නයෙකු බව නිගමනය කිරීම වඩාත් තර්කානුකූල වේ. එසේ වුවද සර්ප පිළිමයේ කිසියම් හෝ ලක්ෂණයක් එය දිය නයෙකුගේ හෝ දියබරියෙකුගේ යැයි තීරණය කිරීමට නොහැකි තරම් නිර්මාණය සරල වේ. හිසේ ඉහළ හා පැති පෙනුම අනුව මෙය නිර්විෂ දිය නයෙකු හෙවත් දිය බරියෙක් බව සරලව නිගමනය කළ හැකි ය. ශ්‍රී ලංකාවේ පහත් තැනිවල සුලබව ජීවත් වන මිරිදිය සර්පයින් අතර පහත දැක්වෙන විශේෂ තුන ප්‍රධාන වේ.



රූපය 526. දිය බරියා හෙවත් දිය නයා. ජේතවනාරාම කෞතුකාගාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 527. දිය බරියා හෝ දිය නයා. බොහෝ සරල අයුරින් නෙළා ඇත. සර්පයෙකුගේ මූලික හැඩතල පමණක් දැක්වීමට නිර්මාණකරු උත්සාහ කොට ඇති අතර ශරීරය ආවරණය කරන කොරපොතු පවා නෙළා නොමැත. රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි (රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

පොදු වහරේ මෙම සර්පයින්ට දියබරියා හෝ දිය නයා යන නම් ව්‍යවහාර වේ. විද්‍යාත්මකව එම විශේෂ තුන *Xenochrophis piscator, Xenochrophis asperrimus* හා *Atretium schistosum* යනුවෙන් සඳහන් කළ හැකි ය. මොවුන් තිදෙනාම නිර්විෂැති හා සුළුවිෂැති සර්පයින් බහුතරයකගේ නියෝජනයෙන් යුත් මෙරට විශාලතම සර්ප කුලය වන කොලුබ්‍රිඩේ කුලයට (family- Colubridae) අයත් ය. මෙම ජලජ සර්පයින් අනුරාධපුර වගුරු, වැව් හා ජලජ ශාක ප්‍රජාවන්ගෙන් අනූන ජලයේ සුලබව ගැවසේ. සර්ප රූපයේ ඉහත විස්තර කරන සියලුම සර්පයින්ට අදාළ ශාරීරික ලක්ෂණ නියෝජනය වන බවක් පෙනේ.

කිරි ඉබ්බාගේ රූපය (රූප 528, 529) ජලජ සත්ත්ව නියෝජනයේ වැදගත් ස්ථානයක් ගනියි (ජේතවනාරාම කෞතුකාගාරයේ ලියාපදිංචි අංකය R.N.13401E). ශ්‍රී ලංකාවේ ඉබි හෙවත් ඉදිඹු විශේෂ තුනක් වාසය කරයි. මේ අතරින් ජලජ සත්ත්ව රූප නියෝජනය සඳහා නිර්මාණකරු යොදාගෙන ඇත්තේ කිරි ඉබ්බා හෙවත් විද්‍යාත්මකව *Lissemys ceylonensis* නම් දිය ඉදිඹු විශේෂයයි. මෙම කිරි ඉබ්බා ට්‍රයොනිච්ඩේ කුලයට (family - Trionychidae) අයත් වේ. ඉදිඹු රූපයේ පිටත ඵලකයේ මූලික හැඩය නිවැරදි ලෙස නෙළීමට නිර්මාණකරු උත්සාහ දරා ඇත. උඩු පැත්තේ ඵලකයේ මධ්‍යයේ දික් අතට ඇති අපැහැදිලි නෙරීම මෙම නිර්මාණයෙන් දැකගත හැකි ය. කිරි ඉබ්බාගේ ළාබාල අවධියේ මෙම මධ්‍ය නෙරීම දැකිය හැකි වුවත් වැඩිහිටියන්ගේ එය නොමැත. නිර්මාණකරු මෙය නෙළීම සඳහා පාදක කරගන්නට ඇත්තේ ළාබාල කිරි ඉබ්බෙකු විය හැකි ය. හිසේ හැඩය බොහෝ දුරට ස්වාභාවික ලෙස නෙළා තිබුණ ද එය යම් පමණකට ගල් ඉබ්බෙකුට සමාන වේ. කිරි ඉබ්බෙකුගේ හිසෙහි හොම්බ පෙදෙස ඉදිරියට නෙරා ඇති අතර එහි කෙළවර සොඬයක් බඳු ය. නමුත් මෙම නිර්මාණයේ එම ලක්ෂණ ඒ ආකාරයෙන්ම නෙළා නොමැති බැව් පෙනේ. මුලුමනින්ම පාහේ ජලජ ජීවිතයකට අනුවර්තනයක් දක්වන කිරි ඉබ්බාගේ ඉදිරි හා පසු ගාත්‍රාවල ඇඟිලි අතර පිහිනීමේ හා කිමිදීමේ පහසුව ඇති කිරීම සඳහා බැඳි පටල පිහිටයි. නිර්මාණකරු මෙම ලක්ෂණය මනාව නිරීක්ෂණය කොට රූපයේ ද එය ඒ ආකාරයෙන්ම නෙළා ඇත. එමෙන්ම සත්ත්වයාගේ ගාත්‍රාවල පිහිටීම ද ඉතා නිවැරදිව ඒ ඒ ස්ථානවල පිහිටුවා ඇත. කිරි ඉබ්බෙකුගේ උඩු හා යටි ඵලකවල බොහෝ දුරට සුමට බවක් පෙන්නුම්



රූපය 528. කිරි ඉබ්බා. ජේතවනාරාම කෞතුකාගාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 529. කිරි ඉබ්බා. උදරීය පෙනුම (වම් පස) සහ පෘෂ්ඨීය පෙනුම (දකුණු පස). මෘදු පිට කටුවේ වූ ලක්ෂණ අනුව මෙම රූපය කිරි ඉබ්බෙකුගේ (***Lissemys ceylonensis***) බව සඳහන් කළ හැකි ය.
රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි
(රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


කරන අතර රූපයේ ද එය එසේම දක්වා ඇත. මේ සියලුම කරුණු කාරණා එක්කොට සැලකූ කල මෙම රූපය කිරි ඉබ්බෙකුගේ බව නිවැරදිව කිවහැකි තරමට ඉතා පැහැදිලි සාධක අන්තර්ගතව ඇත. ශ්‍රී ලංකාවේ පහතරට ජීවත්වන කිරි ඉබ්බා අනුරාධපුරයේ වැව් හා පොකුණු ආශ්‍රිතව සුලබ ය. කිරි ඉබ්බා ගල් ඉබ්බාටත්, තාරුකා ඉබ්බාටත් වඩා පිරිසිදු සත්ත්වයෙකු බවට ගැමියන් අතර මතයක් පවතී. කිරි ඉබ්බන් ප්‍රධාන වශයෙන් සත්ත්ව හා ශාක කොටස් මත යැපේ (de Silva, 2007).

ඉහත සඳහන් කළ අන්දමට ජේතවනාරාම පරිශ්‍රයේ වූ පොකුණ පත්ලේ ශිලාමය මංජුසාව තුළ තැන්පත් කොට ඇති මෙම ජලජ සතුන්ගේ රූප ජලය සඳහා සිදුකරන ලද පූජාවක හෝ ඒ හා සමාන ඇදහිල්ලක ප්‍රතිඵලයක'යි යැයි අප අනුමාන කළහොත් මෙම සත්ත්ව රූප පිළිබඳ ගෙනහැර දැක්විය හැකි කරුණු කාරණා බොහෝ ය. අප ඉහතින් විස්තර කළ ලෙසින් මෙම රූපවලින් නිරූපණය වන සියලුම සතුන් ජලජවාසීන් වේ. මේවායේ නිර්මාණකරු සිතාමතාම පොකුණේ තැන්පත් කිරීම සඳහා තෝරා බේරාගෙන ඇත්තේ ජලයේම වසන සතුන් බව පැහැදිලි වේ. මංජුසාව තුළ තැන්පත් කොට තිබී හමුවූ පෙණ පහකින් යුත් නාගයා හැරුණු විට අනෙක් සත්ත්ව විශේෂ සියල්ලම පාහේ අනුරාධපුරය ආශ්‍රිත වියළි පෙදෙස්වල ජලජ පරිසරයේ ඉතා සුලබ වේ. නිර්මාණකරුගේ නිරීක්ෂණයන් ඉතා නිවැරදි බැව් එම සත්ත්ව පිළිමවල අන්තර්ගත ලක්ෂණ අනුව පැහැදිලි වේ. ඉහත දැක්වූ අයුරින් ශ්‍රී ලංකාවේ ඉඳිඹු විශේෂ තුනක් වාර්තා වේ. එනම් කිරි ඉබ්බා, ගල් ඉබ්බා (*Melanochelys trijuga*) හා තාරුකා ඉබ්බා (*Geochelone elegans*) වේ. මෙම ඉඳිඹු විශේෂ තුනම අනුරාධපුර ආශ්‍රිතව සුලබ ය. තාරුකා ඉබ්බා පූර්ණකාලීන භෞමික සත්ත්වයෙකු වන අතර ගල් ඉබ්බා ජලයේ වාසය කළ ද අවස්ථාව ලද විටෙක ගොඩබිමට පැමිණේ. නමුත් කිරි ඉබ්බා පූර්ණකාලීන ජලජ සත්ත්වයෙකි [මෙම නිර්මාණකරු පොකුණ පත්ලේ තැන්පත් කිරීම සඳහා තෝරාගෙන ඇත්තේ පූර්ණ ජලජවාසියෙකු වූ කිරි ඉබ්බා ය]. සයැඟිලි පළා මැඩියා ද පූර්ණ කාලීන ජලජවාසියෙකි. ශ්‍රී ලංකාවේ කොතෙකුත් මැඩියන් හා ගෙම්බන් ජීවත් වුවද නිර්මාණකරු තෝරාගෙන ඇත්තේ වඩාත් ජලජවාසී මැඩි විශේෂයකි. දිය නයා හෙවත් දිය බරියා ජලය නියෝජනය කරන සර්පයන්හට මනා නිදසුනකි.

මිරිදිය කකුළුවා මංජුසාව තුළ තැනපත් කර ඇති සතුන් අතර හමුවන එකම අපෘෂ්ඨවංශියා හෙවත් පිටකොන්දක් නැති සත්ත්වයා ලෙස සඳහන් කළ හැකිය. කකුළුවා ජලයේ පූර්ණ නිමග්නව හෝ අර්ධ නිමග්නව ජීවත් වේ. නිර්මාණය කිරීමට අපහසු, සංකීර්ණ හැඩයක් දැරුව ද නිර්මාණකරු එම අභියෝගය ජයගෙන කකුළු රූපය සාර්ථකව නිමවා ඇත. ජලය නියෝජනය කරන සත්ත්වයෙකු ලෙස කකුළු රුව මේ සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන්නට ඇතැයි අපට අනුමාන කළ හැකි ය. අනුරාධපුරය



රූපය 530. පෙණ පහකින් යුත් නාගයා. ජේතවනාරාම කෞතුකාගාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 531. පෙණ පහකින් යුත් නාගයා. නාගයාගේ ගෙලෙහි මධ්‍යයේ යම් පළඳනාවක් ඇති බව පෙනේ. මෙහි කොරළ දක්වා නොමැති අතර හිස හැරුණු විට බඳ පෙදෙස බොහෝ සරලව නිමවා ඇත. රූප සටහනේ පරිමාණ රේඛාව මි.මී. 10 කි (රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ආශ්‍රිත වියළි කලාපයේ ප්‍රමාණයෙන් විශාල ලූලන්, මගුරන්, ආඳන් වාසය කළ ද මෙම කර්තව්‍යය සඳහා නිර්මාණකරු තෝරගෙන ඇත්තේ එතරම් ප්‍රකට නොවන මඩ ඉපිල්ලෙකි. බොහෝ විට ප්‍රමාණයෙන් කුඩා සරල රූපීය හැඩයක් දරන පහසුවෙන් නෙළිය හැකි ශරීරයක් දැරීම නිසා මඩ ඉපිල්ලා තෝරා ගත්තා විය හැකි ය.

මෙම මංජුසාවේ තිබී හමුවූ පෙණ පහේ නාගයා (රූප 530, 531) සැබෑ සත්ත්ව ලොවේ හමුවන උරගයෙකු නොවේ (ජේතවනාරාම කෞතුකාගාරයේ ලියාපදිංචි අංකය R.N.13401D). හිස් කිහිපයක් සහිත සර්පයින් ලොව බිහිවුවද උන් ජීවත් වනුයේ ඉතා සුළු කාලයක් පමණි. අනුරාධපුර යුගයේ කැටයම් අතර වූ නාග රූප ජලය සංකේතවත් කිරීම සඳහා නිර්මාණය වූ බැව් කියැවේ. පෙණ ගණනාවකින් යුත් නාග රූප අතිශයෝක්තියෙන් නිර්මාණය කළ ඒවා ය. මංජුසාවේ වූ සත්ත්ව රූප අතර ස්වාභාවික හැඩයෙන් වෙනස් වන එකම සත්ත්ව රූපය මෙම පෙණ පහේ නාග ප්‍රතිමාවයි. ජේතවනාරාම පොකුණු පත්ලේ ශිලාමය මංජුසාවේ තැන්පත් කොට තිබුණු මෙම සත්ත්ව රූප පිළිබඳ සාකච්ඡාව තුළින් අප අවධාරණය කිරීමට බලාපොරොත්තු වූයේ එම සත්ත්ව රූප හා ජලය අතර ඇති සම්බන්ධතාවයයි. එසේ වුවද මෙම රූප පිළිබඳ තවත් විෂය ක්ෂේත්‍රයන් තුළින් අදහස් හා මත ඉදිරිපත් කිරීමට පූර්ණ අවකාශය ඇත. අප මෙම පරිච්ඡේදයේ ඔබගේ අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වූයේ පැරැන්නන් තම පරිසරයේ ජීවත්වන සත්ත්ව රූප නිර්මාණය කොට ඒවා එදිනෙදා ජීවිතයේ පුද පූජා, යාග හෝම, ඇදහිලි ආදියට යොදාගත් අයුරු ප්‍රකාශ කිරීමට ය. මෙම සියල්ල බහා තිබුණු ශිලාමය මංජුසාව ද ජේතවනාරාම කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරන බැවින් එය දැක බලා ගැනීමට ඔබට අවස්ථාව ඇත.

කුට්ටම් පොකුණේ සංරක්ෂණ කටයුතුවලදී ද ඉහත ජේතවනාරාම පොකුණෙන් මෙන් එම අයුරින්ම නිම වූ ශිලා මංජුසාවක බහා පොකුණු පතුලේ තැන්පත් කරන ලද ජලජ සතුන්ගේ රූප හමුවී ඇත. මේ අතර සංඛයක්, කකුළුවෙකු, මත්ස්‍ය යුගළක් හා ඉබ්බෙකු හමුවී ඇත. මෙම පුරාවස්තූන් සියල්ලම පාහේ අනුරාධපුරයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ. කුට්ටම් පොකුණෙන් හමුවූ ජලජ සතුන්ගේ පිළිම ජේතවනාරාම පොකුණෙන් හමුවූ රූප මෙන් සියුම්ව නිර්මාණය කොට නොමැත. කකුළුවා යම් පමණකට ස්වාභාවික හැඩය ඉස්මතු වන ලෙසින් නිර්මාණය කොට තිබුණද අනෙකුත් සතුන් සියල්ලම පාහේ සංකේතාත්මකව දැක්වීමට නිර්මාණකරු වගබලාගෙන ඇත (රූපය 532). අනුරාධපුරයේ වූ මේ ආකාර පොකුණු දෙකෙන්ම ශිලාමය මංජුසාවක බහා ජලජ ප්‍රාණීන්ගේ රූප තැන්පත් කිරීමේ පුරුද්ද තවදුරටත් අධ්‍යයනය කිරීම යෝග්‍ය බැව් යෝජනා කිරීමට කැමැත්තෙමු (මනමේන්ද්‍ර-ආරච්චි, 2005).



රූපය 532. කුට්ටම් පොකුණෙන් හමුවූ කකුළු රූපය. පුරාවිද්‍යා කෞතුකාගාරය, අනුරාධපුරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


ගල් කැටයම්වලින් නිරූපිත ක්ෂීරපායී සත්ත්ව රූප

මෙම පරිච්ඡේදයේ ප්‍රධාන අරමුණ වන්නේ අනුරාධපුර යුගයට අයත් සත්ත්ව කැටයම් අතර වූ ක්ෂීරපායීන් පිළිබඳ ගවේෂණාත්මකව හා විශ්ලේෂණාත්මකව අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීම ය. මෙම ශිලා කැටයම් අතර දක්නට ලැබෙන ක්ෂීරපායී සතුන් අතර ප්‍රධාන තැන උසුලනුයේ සිංහ, අශ්ව, ගව හා ඇත් යන සතුන් ය. මේ සත්ත්ව විශේෂ ක්‍රි.පූ. 3 වන සියවසට අයත් අශෝක ස්ථම්භවල හා ඒ ආශ්‍රිත කැටයම් අතර ද දැකිය හැකි ය. මූලික වශයෙන් අනුරාධපුර යුගයේ ගල් කැටයම් පිළිබඳ සාකච්ඡා කිරීමේදී අප නිරන්තරයෙන්ම ඉන්දියාවේ අශෝක යුගයට අයත් ඒ හා සමාන නිර්මාණයන් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. මක්නිසාදයත්, ඒ එකිනෙක සංස්කෘතීන් අතර නොබිඳිය හැකි සම්බන්ධතාවයක් පවතින හෙයිනි. සිංහ, අශ්ව, ගව හා ඇත් යන සතුන් මේ සංස්කෘතීන් දෙකේ වූ කෘති අතර පොදු ලක්ෂණ ලෙස හැඳින්විය හැකි ය.

මෙම ක්ෂීරපායීන් සිව් දෙනාගෙන් සිව් දිසා නියෝජනය වන බව පුරාවිද්‍යාඥයින්ගේ මතය වේ. මිහින්තලයේ කණ්ඨක චේතියේ වාහල්කඩ (හෙවත් අයක හෝ ආයක) මුදුන්වල ඇති සිංහයාගෙන් උතුර ද, අශ්වයාගෙන් බටහිර ද, ගවයාගෙන් දකුණ ද ඇතාගෙන් නැගෙනහිර ද, යන දිසා නියෝජනය කරනු ඇත (වික්‍රමගමගේ, 1990). මේ සතුන් සිව්දෙනා දැක්වෙන කැටයම් දෙස සුපරික්ෂාකාරීව බැලීමේදී අවබෝධ වනුයේ කැටයම්කරු සිතාමතාම පිරිමි සතුන් පමණක් නෙළා ඇති බවත්, උන්ගේ ලිංගික අවයව මනාව හුවාදක්වා ඇති බවත් ය. මෙය අනුරාධපුරයේ ගල් කැටයම්වල විශේෂිත ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය. බොහෝ විට මෙයින් පුරුෂයින් මූලිකත්වය හා ප්‍රමුඛත්වය දරන සමාජයක් නිරූපණය කරන්නේ ද යන්න අනුමාන කළ හැකි ය. නොඑසේනම් එයින් පෞරුෂත්වය හා සෞභාග්‍යය නිරූපණය කළා විය හැකි ය. සඳකඩ පහණේ වූ සිංහ, අශ්ව, ගව හා ඇත් රූපවල ද, හුදෙකලාව නෙළා ඇති සිංහ රූපවල ද ලිංගය කැපී පෙනෙන ලෙස නෙළීමට කැටයම්කරුවා සැමවිටම වගබලාගෙන ඇත.

සිංහයා


ඉහත විස්තර කළ ක්ෂීරපායී සතුන් සිව්දෙනා අතරින් සිංහයා පමණක් ශෛලිගතව නෙළා ඇත. මෙලෙස ශ්‍රී ලංකාවේ පමණක් නොව සමස්ත ඉන්දියාවේ ද සිංහ රූපවල ඇත්තේ ශෛලිගත ස්වරූපයකි. 6 හා 8 වන සියවස්වලට අයත් තමිල්නාඩු ප්‍රාන්තයේ වූ මමලපුරම් හෙවත් මහාබලිපුරම් හි පිහිටි ගලින් නෙළා ඇති සිංහ රූප සියල්ලම පාහේ ශ්‍රී ලංකාවේ මෙන් ශෛලිගත ය (රූප 533, 534). එසේ වුවද මමලපුරම්හි පිහිටි ශිලාමය ගොඩනැගිලිවල කුලුනු පාදමේ වූ සිංහයින්ගේ දිගු දළ හා හිසෙහි ඉහළට නෙරා ඇති අං ආකාර අවයව ශ්‍රී ලංකාවේ සිංහ කැටයම් අතර කිසිසේත්ම දැකිය නොහැකි ය (රූපය 535). ශ්‍රී ලංකාවේ හා ඉන්දියාවේ මෙන්ම ආසියාවේ නැගෙනහිරට වන්නට පිහිටි චීනය දක්වාම වූ රටවල ද සිංහ රූපය ශෛලිගත වේ.



රූපය 533. අනුරාධපුර ගල් කැටයම් කලාවට සමකාලීන වූ දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ මමලපුරම්හි නෙළා ඇති සත්ත්ව හා මානව රූප (මෙම රූපයෙහි දකණුපස යටි කෙළවරෙහි රිළවෙකු දැකිය හැකි අතර ඒ අනුව මෙම කැටයම්වල පරිමාණය අවබෝධ කරගත හැකිවනු ඇත) (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)




රූපය 534. මමලපුරම් ගල් කැටයම්. මෙහි තැන තැන වූ සිංහ රූප ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයට අයත් සිංහ රූපවලට බොහෝ සෙයින් සමාන වේ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූපය 535. මමලපුරම් ශිලාමය ගොඩනැගිලි කුලුනු පාදමේ වූ සිංහයින්. මෙම සිංහයින්ගේ දැකිය හැකි දිගු දළ හා හිස මුදුනේ වූ නෙරීම් තුන ශ්‍රී ලංකාවේ සිංහයින්ගේ නිරූපණය නොවේ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

අනුරාධපුර යුගයේ ගල් කැටයම්වල වූ සිංහයින්ගේ කේශර කෙළවර බොහෝ දුරට වක්‍ර වූ ස්වරූපයක් දරයි. එම කේශර මුහුණ වටාම නෙළා ඇත. මිහින්තලයේ සිංහ පොකුණේ වූ සිංහ කැටයමක කේශර නෙළා ඇත්තේ පුරුෂයෙකුගේ හොඳින් වැවුණු යටි රැවුලක ආකාරයට ය (රූපය 536). සජීවී සිංහයින්ගේ ගෙල වටාම කේශර පිහිටීම ස්වාභාවික ලක්ෂණයක් වුවද ඒවා කැටයම්වල දැක්වෙන ආකාරයට කෙළවර කැරලි ලෙස නොමැත. එමෙන්ම ගල් කැටයම්වල වූ සිංහ රැවේ නිකටේ වූ කේශර අනෙක් කේශරවලට වඩා වෙනස් ආකාරයට හැඩගන්වා නෙළා ඇත. අභයගිරිය පරිශ්‍රයේ වූ සඳකඩ පහණ් කැටයමක නෙළා ඇති සිංහ රැවේ කේශර පහළට සිටින සේ ඉතා දිගුව දැක්වීම ඒ අතරින් විශේෂ කොට දැක්විය හැකි ය (රූපය 537).





රූපය 536. සිංහ කැටයම. මිහින්තලයේ සිංහ පොකුණ. මෙහි සිංහයාගේ කේශර නෙළා ඇත්තේ පුරුෂයෙකුගේ මනාව වැඩුණු යටි රැවුලක ආකාරයට ය (ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සිංහ පිළිමවල මුවේ රදනක දත් බොහෝ විට නෙළා ඇත්තේ උඩු හනුවේ පමණි. එසේ වුවද ඇතැම් පිළිමවල පහළ හනුවේ පමණක් කුඩා රදනක දත් නෙළා ඇත. නමුත් සැබවින්ම සිංහයින්ගේ උඩු හනුවේ රදනක දත් යුගළයක් ද, යටි හනුවේ රදනක දත් යුගළක් ද වශයෙන් පිහිටයි. ප්‍රමාණාත්මකව එම දත් එක සමාන වේ. බොහෝ ගල් කැටයම්වල වූ සිංහයින්ගේ උඩු හනුවේ රදනක දත් යුගළ කිහිපයක් නෙළා තිබීම ශෛලිගතභාවයේ වැදගත් ලක්ෂණයකි (රූප 538, 539). මෙය අනුරාධපුර යුගයේ මෙන්ම පොළොන්නරු යුගයේ සිංහ කැටයම්වල ද පොදු ලක්ෂණයකි.




රූපය 537. සිංහ කැටයම. අභයගිරි පරිශ්‍රයේ සඳකඩ පහණක නෙළා ඇති මෙම සිංහ රැවෙහි කේශර සෘජුව නෙළා තිබීම විශේෂ ලක්ෂණයක් ලෙස සඳහන් කළ හැකි ය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ඉදිරිය බලා සිටින ඉරියව්වෙන් නෙළා ඇති සිංහ කැටයම්වල නාසය සත්‍ය සිංහයෙකුට වඩා මිනිස් නාසයකට සමානව නෙළා තිබීම ශෛලිගත බවේ තවත් ලක්ෂණයකි. මේ හේතුවෙන් කැටයම්වල වූ සිංහ රැවට මුලුමනින්ම පාහේ මනුෂ්‍ය පෙනුමක් ලැබී ඇත (රූප 536, 538, 539, 540).

සිංහ සිරුරේ පරිමාණයන් බොහෝ දුරට නිවැරදිව නෙළා ඇත. අනුරාධපුරයේ සඳකඩ පහණ්වල වූ සිංහ රූප නෙළා ඇත්තේ පාර්ශ්විකව දර්ශනය වන ලෙසිනි. එම රූපවල ශරීර පරිමාණයන් ඉතා නිවැරදි බැව් සඳහන් කළ යුතුව ඇත. එසේ වුවද ඉදිරි හා පසු ගාත්‍රා ස්වාභාවික ප්‍රමාණයට වඩා වඩාත් ස්ථූල පෙනුමක් ඇති අයුරින් නිමවා ඇත (රූපය 541). කැටයම්වල වූ සිංහ රූපවල නිය මනාව බාහිරට විවෘතව ඇති සේ නෙළා ඇත.



රූපය 538. සිංහ කැටයම. අභයගිරි පරිශ්‍රය. මෙහි උඩු හනුවේ රදනක දත් යුගළ දෙකක් නෙළා ඇති අතර පහළ හනුවේ රදනක දත් නෙළා නොමැත
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 539. සිංහ රූපය. කොරවක් ගලක පිටත පැත්තේ වූ මෙම කැටයමෙහි උඩු හනුවේ රදනක දත් යුගළ තුනක් නෙළා ඇති අතර පහළ හනුව රදනක දත් නොදරයි. මෙම කොරවක් ගල අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කොතුකාගාරයේ තැන්පත් කොට ඇත
(රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 540. ඉදිරියට යොමුව පිහිටි සිංහ රූවක්. අභයගිරිය පරිශ්‍රයේ වූ දළදා මාලිගාව. මෙම කැටයමේ නාසය ස්වාභාවික සිංහ නාසයකට වඩා මනුෂ්‍ය නාසයක හැඩරුවට සමාන ය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


දඩයමේ යෙදෙන විටදී හැරුණු විට සිංහ නිය බාහිරට විවෘත නොවුවද අනුරාධපුර ගල් කැටයම්වල නිය මනාව ප්‍රදර්ශනය කොට ඇත (රූපය 539). මෙය ද ස්වාභාවිකත්වයෙන් මිදී ඉදිරිපත් කර ඇති



රූපය 541. අනුරාධපුර සඳකඩ පහණ්වල වූ සිංහ රූප. ඉහළ පෙළ අභයගිරි පරිශ්‍රය, මැද හා පහළ පෙළ මහා විහාර පරිශ්‍රය
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

තවත් ශෛලීගත ලක්ෂණක් ලෙස හැඳින්විය හැකි ය. වල්ගය ප්‍රමාණයට වඩා ඉතා දික්ව හුවා දක්වා ඇත. වල්ගය කෙළවර වූ දිගු ලොම් රොද මනාව නෙළා ඇති අතර එය බහුතරයක් කැටයම්වල දක්නට ලැබේ. සිහින් හා දිගු වල්ගය ස්වාභාවික ලක්ෂණයක් නොවුවද වල්ගය කෙළවර වූ දිගු ලොම් රොද සාමාන්‍ය සිංහයින්ගේ ද දැකිය හැකි ය. එසේ වුවද කැටයම්වල වූ එම ලොම් රොද අසාමාන්‍ය ලෙස දිගු කොට දක්වා ඇත (රූප 538, 539, 541). මෙය ශ්‍රී ලංකාවේ බොහෝ සිංහ කැටයම්වලට පොදු වූ ශෛලිගත ලක්ෂණයකි. ඉදිරි දෙසට මුහුණලා අසුන් ගෙන සිටින සිංහයින්ගේ ලිංගේන්ද්‍රිය මනාව දක්වා තිබීම අනුරාධපුර යුගයේ ද, ඊට පසු කාලයේ ද නිර්මාණය කරන ලද සිංහ රූපවල කැපී පෙනෙන ලක්ෂණයකි (රූපය 542).

එසේ වුවද ඉතා කලාතුරකින් ලිංගේන්ද්‍රිය නෙළා නොමැති අවස්ථා ද වේ. මිහින්තලයේ සිංහ පොකුණේ වූ කැටයම එයට මනා නිදසුනකි (රූපය 536). බොහෝ සිංහ රූපවල ලිංගික අවයවයට සිංහ ස්වරූපයකට වඩා මිනිස් ස්වරූපයක් ලබාදීමට නිර්මාණකරු උත්සාහ දරා ඇත.




රූපය 542. ඉදිරි දෙසට යොමුව ඇති සිංහ කැටයම්. මෙහි ලිංගේන්ද්‍රිය මනාව දක්වා ඇත. එයට පුරුෂ ලිඟුවක හැඩය ලබා දී ඇත. රුවන්වැලිසෑ පරිශ්‍රය (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සිංහයාගේ ශාරීරික ලක්ෂණ ශෛලිගතව නෙළීම මෙන්ම සිංහයා තවත් සත්ත්ව විශේෂ සමඟ සම්මිශ්‍රණය කොට ඉදිරිපත් කිරීම අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා වූ බොහෝ නිර්මාණවල දැකිය හැකි ය. සිංහ සිරුරකට ඇත් හිසක් බද්ධ කිරීම තුළින් 'ගජ සිංහ' රූපය නිමවා ඇත. මිහින්තලයේ සිංහ පොකුණේ වූ මෙම කැටයම අනුරාධපුර යුගයට අයත් ගජසිංහ කැටයම් අතර සුවිශේෂී නිර්මාණයක් වේ (රූපය 543). මෙහි සිංහ රුවකට අලි මුහුණක් බද්ධ කොට ඇත. මෙහි දළ නෙළා නොතිබීම විශේෂ ලක්ෂණයකි. එම කැටයමේ කේශර ද ඉතා පැහැදිලිව නෙළා ඇති අතර කන් සිංහ කන්වලට සමාන ය. 'ගජ සිංහ' මෙන්ම සිංහ, ඇත් හා මිනිස් රුවක් බද්ධ කොට නිමවා ඇති 'ගජ නර සිංහ' රූප ද මෙරට කෘතීන් අතර දක්නට ලැබුණ ද අනුරාධපුරයේ කැටයම් අතර දක්නට ලැබෙනුයේ 'ගජ සිංහ' රූප පමණි.

මිහින්තලයේ කණ්ඨක චෛත්‍යයෙහි වාහල්කඩෙහි සුදු බදාම මත ඇඳ ඇති සිංහ සිතුවම් ද මෙහිදී විශේෂයෙන් සඳහන් කළයුතු වේ. අනුරාධපුර යුගයට අයත් දැනට ශේෂ වී ඇති සිතුවම් අතර සිංහ රූප දැක ගැනීමට ඇති එකම අවස්ථාව මෙය විය හැකි ය (රූපය 544).

අනුරාධපුරයේ බටහිරාරාමවල වැසිකිළි ගල්හි ද සිංහ රූප නෙළා තිබීම සැලකිය යුත්තකි. මෙහි වූ සිංහ රූපය ද අනෙකුත් ඇතැම් සිංහ රූප මෙන්ම යම් ගෘහයක් තුළ හිඳුවා ඉදිරිපත් කොට තිබේ (රූප 545, 546).






රූපය 543. ගජසිංහ කැටයම, මිහින්තලේ සිංහ පොකුණ (ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මිහින්තලේ සිංහ පොකුණේ පසු ගාත්‍රා යුගළයෙන් හිඳ ඉදිරි ගාත්‍රා ඉදිරියට යොමා සිටින ඉරියව්වෙන් වූ ත්‍රිමාණ සිංහ කැටයම සියලුම කැටයම් අතර වෙනස් වූ ලක්ෂණ දරයි. වර්තමානයේ එහි හිස මුලුමනින්ම පාහේ විනාශ වී තිබුණ ද ගෙලේ වූ කේශර හා අනෙකුත් ශාරීරික ලක්ෂණ මනාව දැකබලා ගත හැකි ය. අනුරාධපුර යුගයට අයත් කැටයම් අතර මෙම ඉරියව්වෙන් හමුවන එකම සිංහ කැටයම ලෙස මෙය දැක්විය හැකි ය (රූපය 547).



රූපය 544. සිංහ සිතුවම්. මිහින්තලය කණ්ඨක චෛත්‍ය වාහල්කඩෙහි හුණු බදාම මත ඇඳ ඇත
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 545. සිංහ කැටයම් සහිත වැසිකිළි ගලක්. අනුරාධපුර බටහිරාරාමය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 546. වැසිකිළි ගලෙහි වූ සිංහ කැටයමක්. අනුරාධපුර බටහිරාරාමය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 547. සිංහ පොකුණේ වූ සිංහයා. මිහින්තලය (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූප 548. විවිධ ඉරියව් සහ විවිධ හැඩයන්ගෙන් යුත් සිංහ කැටයම්. දළදා මාළිගාව, අභයගිරිය පරිශ්‍රය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 549. රුවන්වැලිසෑයේ පැරණි මල් ආසනයක වූ සිංහ රූපය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 550. අනුරාධපුර සිංහ කැටයම්වලට සමාන නිල්ලක්කගම බෝධිඝරයේ සිංහ කැටයමක රූප සටහනක්
(රූපසටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සිංහ කැටයම් දරන සුවිශේෂී ස්ථාන අතර සඳකඩ පහණ්වල වූ කැටයම් ප්‍රමුඛ වේ. ඊට අමතරව අභයගිරි පරිශ්‍රයට අයත් දළදා මාළිගාවේ වූ සිංහ කැටයම් ඉතා විචිත්‍ර ය (රූප 548). එකිනෙකට වෙනස් ඉරියව්වලින් නෙළා ඇති එම රූප අතර ලියවැල් ද වේ. රුවන්වැලි සෑයේ පැරණි මල් ආසනයක වූ සිංහ කැටයම් ද ඉහත දැක්වූ දළදා මාළිගාවේ කැටයම් වලට සමාන ය (රූප 542, 549). අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයේ තැන්පත් කොට ඇති කොරවක් ගලක පිට පැත්තේ වූ සිංහ කැටයම එය අනුරාධපුර සිංහ කැටයම් අතරින් හමුවන වඩාත්ම සියුම් නිර්මාණය ලෙස සැලකිය හැකිය. එහි සිංහයාගේ උඩු හනුවේ රදනක දත් යුගළ තුනකි. මෙම කොරවක් ගල හමුවී ඇත්තේ අභය වැව ආසන්නයෙනි (රූපය 539). ඉහත අභයගිරි පරිශ්‍රයේ වූ දළදා මාළිගාවේ ද, රුවන්වැලිසෑයේ මල් ආසනයේ ද වූ කැටයම්වලට බොහෝ සෙයින් සමාන කැටයම් නිල්ලක්කගම බෝධිඝරයේ ද වේ (රූපය 550).



තන්තිරිමලේ රජ මහා විහාර පරිශ්‍රයේ පර්වතයක නෙළා ඇති අනුරාධපුර යුගයට අයත් හිදි පිළිමය පසුබිමේ වූ කැටයම් අතර ද සිංහ රූ දෙකක් වේ. එහි විශේෂත්වය වනුයේ එම සිංහයින් පසු ගාත්‍රා දෙකෙන් හිඳ පූර්ව ගාත්‍රා ඉදිරියට යොමා සිරස් ඉරියව්වෙන් හිඳීම ය. මෙම ඉරියව්වේ වූ සිංහ කැටයම් අනුරාධපුර යුගයේ සුලබ නොවේ (රූපය 551).


රූපය 551. හිදි පිළිමය දෙපස සිරස් ඉරියව්වෙන් එකිනෙකාට ප්‍රතිවිරුද්ධව නෙළා ඇති සිංහ රූප.
තන්තිරිමලේ රාජ මහා විහාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අශ්වයා

අනුරාධපුරයේ සඳකඩ පහණ්වල වූ අශ්වයින් ස්ථූල හැඩයක් දරන අතර දුවන ඉරියව්වෙන් නෙළා ඇත. උන්ගේ හිස විශාල ය. ගෙල කෙටි හා මහත් ය. සමස්ත ශරීරය හා පාද ශරීර උසට සාපේක්ෂව ස්ථූල ය. දෙකන් මැදින් ආරම්භව උරහිස දක්වා දිවෙන දිගු ලොම් තීරය පැහැදිලිව නෙළා ඇත. නාසය, ඇස් හා මුඛය මනාව ස්වාභාවික අයුරින් කැටයම් කොට ඇත. කන්වල හැඩය, වල්ගයේ හැඩය හා එහි වූ දිගු ලොම් තාත්වික ය. අශ්වයෙකු (පිරිමි සතෙකු) ලෙස දැක්වීම සඳහා ලිංගේන්ද්‍රිය ඉතා නිවැරදි ලෙස නුවාදක්වා ඇත. නිර්මාණකරු කැටයම් කොට ඇත්තේ දුවන ඉරියව්වේ වූ අශ්වයෙකු බැවින් දිවීමේදී පා පිහිටන ආකාරයත්, ගාත්‍රා වැලමිටින්, දණහිසින් හා කුරවලින් නැවෙන ආකාරයත් බෙහෙවින් ස්වාභාවික ය. කුරයේ හැඩය නිවැරදිව නිමවා ඇත. ඉහත දැක්වූ අන්දමට විශාල හිස, ස්ථූල පාද ඇතුළු ලක්ෂණ සියල්ල කැටයමට නංවා ඇත්තේ උසින් අඩු පටු අවකාශයක් තුළ අශ්වයෙකු නෙළීමේදී සිහින් හා දිගටි ගෙල, දිගු පාද ආදිය නෙළීම අපහසු බැවින් විය හැකි ය. එසේ වුවහොත් අශ්ව රුව අනෙක් සතුන්ට වඩා ප්‍රමාණයෙන් කුඩා වන බැවින් ලැබී ඇති සීමිත ඉඩ ප්‍රමාණය තුළ උසින් අඩු, ස්ථූල සිරුරක් ඇති අශ්වයෙකු නෙළන්නට ඇත. නිර්මාණකරුවා ජීවමාන අශ්වයෙකුගේ රුව නිවැරදිව මනසේ තබාගනිමින් මෙම අශ්ව කැටයම් නෙළන්නට ඇති බව අනුමාන කළ හැකි ය (රූප 552).



රූපය 552. අනුරාධපුර සඳකඩ පහණ්වල වූ අශ්ව කැටයම්. මෙම රූපවලින් අශ්වයෙකුගේ ලක්ෂණ බොහෝ දුරට නිරූපණය වනු ඇත. ඉහළ වම් පස අභයගිරි පරිශ්‍රයෙනි, ඉතිරි රූප සියල්ල මහා විහාර පරිශ්‍රයෙනි (ඡායාරූප: කැමී මනමේන්ද්‍ර-ආරච්චි)









රූපය 553. සඳකඩ පහණ් කිහිපයක වූ අශ්ව කැටයම්. මෙහි නිරූපණය වන සියලුම අශ්වයින්ගේ හිස සිරුරට සාපේක්ෂව විශාල වේ. සිරුර හා පාද වඩාත් ස්ථූල වේ. 552 රූපයේ වූ කැටයම්වලට සාපේක්ෂව මෙහි අශ්වයින්ගේ නියම හැඩය ඉස්මතු නොවේ. ඉහළ රූප හතර, මහා විහාර පරිශ්‍රයෙනි. පහළ රූප අභයගිරිය පරිශ්‍රයෙනි (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

කැටයම්කරු සජීවී අශ්වයෙකුගේ ලක්ෂණ අධ්‍යයනය කොට කැටයම් නෙළන්නට ඇති බැව් අනුමාන කළ හැක්කේ එම රූපවල වූ සියලුම දේහ ලක්ෂණ හා ඉරියව් ඉතා නිවැරදිව දක්වා ඇති බැවිනි. එසේ වුවද අනුරාධපුර සඳකඩ පහණ්වල වූ අශ්ව රූප අනුව පැහැදිලි වන්නේ උන් එතරම් උස් නොවූ ප්‍රභේදයක් බව ය. කෙටි ගෙල, විශාල හිස, ස්ථූල සිරුර හා ගාත්‍රා අනුව එය මනාව පැහැදිලි වේ. මේ අශ්වයින් බූරුවෙකුගේ ලක්ෂණ දරන බැව් පෙනේ. බොහෝ විට එකල්හි ප්‍රචලිත වන්නට ඇත්තේ කෙටි හා ස්ථූල සිරුරු දැරූ අශ්වයින් විය හැකි ය. එවැනි අශ්වයින් පිට මත ගමන් කිරීමට වඩා බර ඇදීම ආදි වැඩ කටයුතු සඳහා බහුලවම යොදාගනියි. අශ්ව රුවෙහි හැකි පමණින් ස්වාභාවික ශාරීරික ලක්ෂණ ඉස්මතු කර ඇති අතර කිසිදු අයුරකින් ශෛලීගත ස්වරූපයක් නිරූපණය නොවේ (රූපය 553).

අනුරාධපුර අභයගිරි පරිශ්‍රයේ ඇත් පොකුණට දකුණුපසින් පංචාවාසයක් වේ (රූපය 554). එහි මධ්‍යයේ පිහිටි ගොඩනැගිල්ලෙහි සඳකඩ පහණකි. එය අනුරාධපුර පූජා නගරයේ හමුවන අනෙකුත් සියලුම සඳකඩ පහණ්වලින් වෙනස් කොට වර්ගීකරණය කළ හැකි ලක්ෂණ විදහාපායි (රූපය 555). එම සඳකඩ පහණෙහි නෙළා ඇත්තේ ක්ෂීරපායී රූප 3ක් පමණි. එමෙන්ම අන් සඳකඩ පහණ්වල මෙන් පක්ෂී රූපය නෙළා නැති අතර එහි ඇත්තේ ඇත්, අශ්ව සහ ගව යන සත්ත්ව විශේෂ 3 පමණි. සිංහයා මුලුමනින්ම පාහේ කැටයමින් ඉවත් කොට ඇත. මෙහි සඳහන් කළයුතු අනෙකුත් කරුණ වන්නේ සතුන් තිදෙනාගේම කැටයම් බොහෝ සරල අයුරින් නෙළා තිබීම ය. අශ්වයා සහ ගවයා යන සතුන් දෙදෙනාම ඉදිරි ගාත්‍රා ඔසවාගෙන සිටින බවක් නිරූපිත ය. ගවයා තම හිස හරවා ඉදිරිය බලා සිටින අයුරින් නෙළා ඇත. මේ සියලුම රූපවල සතුන්ගේ ශාරීරික ලක්ෂණ අනෙකුත් සඳකඩ පහණ්හි අශ්ව රූපවලට සාපේක්ෂව ස්වාභාවිකත්වයෙන් ඈත්ව ඇති අතර ඒවා මනා සංකලනයකින්ද විදහා නොදැක්වේ (රූපය 556).



රූපය 554. අභයගිරි පරිශ්‍රයේ ඇත් පොකුණට දකුණුපසින් වූ පංචාවාස ගොඩනැගිල්ල
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 555. පංචාවාසයේ වූ සඳකඩ පහණ
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 556. මෙම සඳකඩ පහණේ වූ අශ්වයාගේ සියලුම ලක්ෂණ ප්‍රාථමික වන අතර ඉදිරි ගාත්‍රා ඔසවාගෙන සිටින අයුරින් වේ.
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ගවයා

අනුරාධපුර යුගයේ ක්ෂීරපායී සතුන් අතර ගව රුව ද ස්වාභාවික ලක්ෂණ ඉස්මතු වන අයුරින් මනාව කැටයම් කර ඇත. ශරීරයට සාපේක්ෂව හිස මඳක් විශාල වන අතර ගෙල කෙටි හා ස්ථූල වේ. කෙටි අං යුවළක්, කන්, ඇස්, නාසා හා මුඛය ඉතා තාත්වික ලෙස නෙළා ඇත. ශරීරය හා ගාත්‍රා ස්ථූල වුවද වල්ගය දිගු වේ. උරහිස මත වූ මොල්ලිය මනාව දක්වා ඇත. හොඳින් වර්ධනය වූ මොල්ලිය අනුව හැඟෙනුයේ එම සතුන් කරත්ත ඇදීම ආදි බර වැඩ සඳහා යොදා ගැනීමට සුදුසු ගවයින් වන බව ය. අශ්වයින් මෙන් ගවයින් ද එකල විදේශයන්ගෙන් මෙරටට ගෙන්වා ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක අනුරාධපුර ඇතුල් නුවර කළ කැණීම් මඟින් හමුව ඇත.

ප්ලයිස්ටොසීන සමයේ මෙරට වල් ගවයින් විසූ බවට සාධක මැණික් පතල් ආශ්‍රිතව හමුව ඇති ෆොසිල මඟින් සනාථ වී ඇති බැව් අප ඉහත සාකච්ඡා කරන ලදී. උන්ගේ මොල්ලිය ප්‍රමුඛව දැරූ බවට සාධක නොමැත (Deraniyagala, 1958; මනමේන්ද්‍ර-ආරච්චි, 2012). එසේ වුවද අනුරාධපුරයේ වූ සඳකඩ පහණ්වල නෙළා ඇති ගවයා මොල්ලිය මනාව දැරූ සත්ත්වයෙකු වන නිසා එහි දක්වා ඇත්තේ එකල්හි විදේශයකින් රැගෙන එන ලද ගවයෙකු බැව් කිව හැකි ය. සඳකඩ පහණ්වල වූ සියලුම රූපවල දක්වා ඇත්තේ කෙටි අං දරන ගවයින් ය. එම අං කෙටි මෙන්ම ස්ථූල ද වේ. දිගු අං දරන ගව ප්‍රභේද මේ සමයේදී ලොව ප්‍රචලිත වුවද සඳකඩ පහණ නිරූපණය කිරීමේදී කෙටි අං දරන ගවයින් තෝරා ගැනීමට නිර්මාණකරු පෙළඹී ඇත. ක්‍රි.පූ. 5,500 සිට පැවත එන ඉතිහාසයක් ඇති මොහෙන්ජොදාරෝ හරප්පා හී කළ කැණීම් මඟින් අනාවරණය කොට ගෙන ඇති මුද්‍රාවල දිගු අං දරන ගවයින් දැකිය හැකි ය. මෙම ගවයින් පොදුවේ Zebu යනුවෙන්ද, විද්‍යාත්මකව *Bos primigenius* හෝ *Bos indicus* (ඉංග්‍රීසි බසින් Humped cattle [මොල්ලි ගවයින්] හෝ Brahmini cattle [බ්‍රාහ්මණ ගවයින්] යනුවෙන් ද ව්‍යවහාර වේ) යනුවෙන් ද හැඳින්වෙන දිගු අං දරන ගවයින් වේ. එසේ වුවද මේ දිගු අං දරන Zebu ගවයින් අතර කෙටි අං දරන සතුන් ද සිටියි.

සඳකඩ පහණ නෙළූ නිර්මාණකරුවා මේ අතරින් කෙටි අං දරන ගවයින් තෝරාගෙන ඇත. එහි දැක්වෙනුයේ කෙටි අං දරන Zebu ගවයින් ද යන්න නිශ්චිතවම ප්‍රකාශ කළ නොහැකි වුවද සියලුම සඳකඩ පහණ්වල වූ ගව රූපවල ඇත්තේ කෙටි අං දරන්නන් ය. ඊට අමතරව ගවයින්ගේ ගෙලේ සිට ඉදිරි ගාත් තෙක් වැඩී ඇති, පහතට එල්ලී වැඩෙන දිගු තැල්ලක් ආකාර නෙරීම ද කලාකරුවා ඉතා නිවැරදිව දැක්වීමට වගබලාගෙන ඇත. ඊට අමතරව ඇතැම් රූපවල ගෙලේ උඩු පැත්තේ වළලු ආකාර නෙරීම් මාලාවක් ද නෙළා තිබීම තුළින් කැටයම්කරු උත්සාහ දරා ඇත්තේ හිස ඉහළට එසවීමේදී ඇතිවන නැමි නිරූපණය කිරීමට ය. ගවයින්ගේ ලිංගික අවයව ද මනා ලෙස කැටයමට ඇතුළත් කිරීම තුළින් ඉතා තාත්විකව තම නිර්මාණය ඉදිරිපත් කිරීමට උත්සාහ දරා ඇත. දිගු වල්ගය කෙළවර පිහිටන දිගු



ලොම් රොද ද දැක්වීමට කැටයම්කරු උත්සුක වී ඇති බැවින් සමස්ත සත්තවයාට වඩාත් ස්වාභාවික පෙනුමක් උරුම වී ඇත. සඳකඩ පහණේ වූ සියලුම ක්ෂීරපායීන් මෙන්ම මෙම ගවයා ද නෙළා ඇත්තේ ගමන් කරන ඉරියව්වකිනි. අනුරාධපුර පෙදෙසේ වූ ශිලා කැටයම් අතර ගවයා සුලබවම දැකිය හැකි වන්නේ සඳකඩ පහණෙහි ය (රූප 557).










රූපය 557. අනුරාධපුර පූජා නගරයේ සඳකඩ පහණ්වල වූ විවිධ හැඩ හා ඉරියව්වලින් යුත් ගව කැටයම්. පළමුවැනි පෙළ හා දෙවැනි පෙළ වම් පස රූප අභයගිරි පරිශ්‍රයෙනි. ඉතිරි කැටයම් සියල්ල මහා විහාර පරිශ්‍රයට අයත් සඳකඩ පහණ්වලට අයත් ය
(265 පිටුවේ ගව කැටයමද මීට ඇතුලත් වේ)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අලි ඇතුන්

අනුරාධපුරයේ ගල් කැටයම් අතර සිංහයා මෙන්ම ඉතා සුලබ සත්ත්වයෙකු ලෙස ඇතා හඳුන්වාදිය හැකි ය. මෙම තේමාව අලින් හා ඇතුන් ලෙස නම් කළද මේ කැටයම් අතර අලින් නෙළා නොතිබීම මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. අලියා යනු දළ රහිත පිරිමි සතාය. ඇතා යනු දළ ඇති පිරිමි සතා වන අතර ඇතින්න යනුවෙන් හැඳින්වෙනුයේ ගැහැනු සතාට ය. ශ්‍රී ලංකාවේ දළ දරනුයේ පිරිමි සතුන් පමණි. එය දළ වශයෙන් 5-7 % ත් අතර ප්‍රමාණයක් වේ. ගැහැනු සතුන් කිසිවිටෙකත් දළ නොදරනු ඇත. අනුරාධපුරයේ වූ සියලුම ගල් කැටයම් අතර දක්නට ලැබෙනුයේ දළ ඇතුන් ය. උන් සියලු දෙනාම පාහේ ස්ථූල දළ දරයි.

රුවන්වැලිසෑයේ වැලිමළුවේ සිට බලන කල සලපතළ මළුව වටා වූ ඇත් පවුර අනුරාධපුර නටබුන් අතර වූ ඇත් රූප සඳහා ප්‍රචලිත නිදසුනකි. එහි ඇතුන් ඉදිරිය බලා සිටින ඉරියව්වෙන් පිහිටුවා ඇත (රූපය 558). අනුරාධපුරයේ ස්ථූපවල වූ 'හස්තිවේදිය' ඇත් රූප පිළිබඳ සාකච්ඡාවේ විශේෂයෙන් සඳහන් කළ යුතු අංගයකි. පහළ සිට ඉහළට තෙවැනි පේසාව තුළට කාවද්දා ඇති ඇත් රූප හස්තිවේදිය ලෙස හැඳින්වේ. එහි වූ ඇත් රූප මගින් නියෝජනය වනුයේ ඇතාගේ පූර්ව භාගය පමණි. හිස හා දණ නමා සිටින ඉරියව්වෙන් වූ ඉදිරි ගාත්‍රා හා වටකුරු හොඬය එහි නිරූපිත ය. ඊට අමතරව ස්ථූල



රූපය 558. රුවන්වැලිසෑය ඇත් පවුර. වැලි මළුවේ සිට ස්ථූපය දෙස බලන කල සලපතළ මළුව වටා මෙම ඇත් පවුර පිහිටුවා ඇත. එහි ඇතුන්ගේ ඉදිරි ගාත්‍රා යුවළ ඇතුළු ශරීරයේ පූර්ව පෙදෙස දැක්වේ. මෙම ඡායාරූපයේ වම්පස කෙළවරෙහි වහළයකින් ආවරණය කොට ඇත්තේ පුරාණ ඇත් පවුරේ කොටසකි. (ඡායාරූපය: කැමී මනමේන්ද්‍ර-ආරච්චි)

හැඩැති දළ යුවළකි. අභයගිරිය දාගැබේ හා ජේතවනාරාම දාගැබේ හස්තිවේදිය මනාව දක්වා ඇත (රූපය 559). රුවන්වැලිසෑයේ හස්තිවේදියට අයත් ඇත් රූප තිබුණ ද එම ස්ථූපයේ සංරක්ෂණ

ක්‍රියාවලියේදී ඒවා සවිකොට නොමැති අතර එම රූප දැනට එහි සලපතළ මළුවේ තැන්පත් කොට ඇත (රූපය 560).



රූපය 559. ජේතවනාරාම ස්ථූපයේ හස්තිවේදිය. මෙහි තෙවැනි පේසාවේ දැකිය හැක්කේ හස්තිවේදියට අයත් ඇත් රූප ය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 560. රුවන්වැලිසෑයේ සලපතළ මළුවේ තැන්පත් කොට ඇති එම ස්ථූපයට අයත් හස්තිවේදියේ වූ ඇත් රූප (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ස්ථූපයේ සතර දිසාවේ පිහිටි වාහල්කඩවල වූ සත්ත්ව කැටයම් අතර ප්‍රධාන නියෝජනය දරනුයේ ඇත් රූප ය. අභයගිරිය ස්ථූපයේත්, ජේතවනාරාම ස්ථූපයේත් (රූපය 561), මිරිසවැටිය ස්ථූපයේත්, රුවන්වැලි සෑයේ (රූපය 562) හා කණ්ඨක චෛත්‍යයේත් (රූපය 563) වාහල්කඩවල පුරාණ ඇත් රූප ඔබ්බවා ඇත. මෙම රූප ද බොහෝ දුරට හස්තිවේදියේ වූ ඇත් රූපවලට සමාන ය. රුවන්වැලිසෑය සංරක්ෂණ කටයුතුවලදී වාහල්කඩ තුනක මෙම කැටයම් නැවත නිර්මාණය කළ ද එක් වාහල්කඩක පුරාණ ඇත් රූප යොදා සංරක්ෂණය කොට ඇත.

රන්මසු උයනේ හා ඉසුරුමුණියේ ගල් තලාවල නෙළා ඇති ඇත් රූප ප්‍රමාණයෙන් ඉතා විශාල ය. මේ අතරින් ඉසුරුමුණියේ පොකුණට මුහුණලා සිරස් ගල් තලාවේ ස්වාභාවික ප්‍රමාණයට බොහෝ සේ සමාන විශාල ඇත් රූප නෙළා ඇත. පොකුණේ වම් පස ඉදිරියට මුහුණලා සිටින ඇතුන් දෙදෙනෙකු හා ඇත් පැටවෙකු වේ. ඒ අසලින්ම දකුණු පස නෙළුම් විලක බැස දිය කෙළියේ යෙදෙන තවත් ඇතෙකි (රූපය 564). රන්මසු උයනේ වූ පොකුණක දෙපස ගල් තලාවේ නෙළා ඇති ඇත් රූප වඩාත් සිත්ගන්නාසුලු ය (රූපය 565). එහි නෙළුම් විලක



රූපය 561. ජේතවනාරාම වාහල්කඩ (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 562. පුරාණ ඇත් කැටයම් සහිත රුවන්වැලිසෑයේ පැරණි වාහල්කඩ (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 563. වාහල්කඩ. මිහින්තලේ කණ්ඨක චේතිය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

රිසි සේ දිය කෙළියේ යෙදෙන ඇත් රංචුවකි. ඉතා ක්‍රියාශීලී ඉරියව්වලින් පසුවන ඇතුන් එහි නෙළා ඇත (රූපය 566).

කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩක වූ කුලුනක ඇත් රූපයක් වේ. එහි පසු ගාත්‍රා යුවළ දණහිසින් නවා සිටිය ද ඉදිරි ගාත්‍රාවලින් ගමන් කරන ඉරියව්වක් නිරූපණය කරයි. එම නිසා මෙම ඇත් රූපයේ පශ්චාත් පෙදෙස පහතට යොමුව ඇත (රූපය 567). මිහින්තලයේ සිංහ පොකුණේ වූ කැටයම් අතර ඇතෙකු සහ මිනිසෙකු දැක්වෙන කැටයම දුර්ලභ ගණයෙහි ලා සැලකිය හැකි ය. දිගු කෙස් කලඹක් හා රැවුලක් සහිත මිනිසෙකු ඔහුගේ වම් අතින් කෙණ්ඩියක් දරා සිටින අතර

දකුණු අත ඇතාගේ හිස මත වේ. ඇතාගේ ගෙලෙහි හා බඳ මධ්‍යයේ ගැටගසන ලද කඹ හෝ ඒ හා සමාන යමක් කැටයම් කොට ඇත. ඇතා ඇවිදින ඉරියව්වෙන් ද, මිනිසා සිටගෙන සිටින ඉරියව්වෙන් ද දැක්වේ. රූපය අර්ථකථනය කිරීම තරමක් ගැටලු සහගත ය (රූපය 568).

අනුරාධපුරයේ වූ සඳකඩ පහණ් සියල්ලෙහිම පාහේ වූ ඇතුන් හුවාදක්වා ඇත්තේ එකම ආකාරයකට බැව් සඳහන් කිරීම නිවැරදි වේ. සඳකඩ පහණේ අනෙකුත් ක්ෂීරපායීන් මෙන් ඇතා ද ඇවිදින හෝ දිවයන ආකාරයෙන් නිරූපණය කොට ඇත. කැටයම්කරුගේ නිරීක්ෂණ කොතරම් නිවැරදිදැයි දක්වතොත් ගමන් කරන හෝ දිවයන අලියෙකුගේ පාද පිහිටන ආකාරය ඉතාමත් ස්වාභාවික ය. ඇතුන් දිවීමේදී



රූපය 564. දිය කෙළියෙහි යෙදෙන ඇත් රංචුව. ඉසුරුමුණිය (ඡායාරූපය: කැප්ම මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 565. රන්මසු උයනේ පොකුණ දෙපස ගල් තලාවේ වූ ඇත් රංචුවක් (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)



රූපය 566. නෙළුම් විලක ක්‍රියාශීලී ඉරියව්වෙන් දිය කෙළියේ යෙදෙන ඇත් රංචුවක්. 565 රූපයෙහි දකුණුපස කොටස මෙයින් නිරූපණය වේ (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

බොහෝ විට වල්ගය එසවීමත්, හොඬය ඉදිරියට යොමු කිරීමත් සිදුවන අතර මෙහි වූ කැටයම්වල ද එය මනාව දක්වා ඇත. ඇතුන්ගේ කනෙහි ඉහළ වාටිය නිතරම පාහේ ඉදිරියට කඩාහැලෙන ලක්ෂණය කැටයමේ ද මනාව නිරූපිත ය. හොඬය ඉහළට එසවීමේදී එහි ඉහළ පැත්තේ හටගන්නා නැමී සහ බෙල්ලෙහි වූ නැමී ද මනාව දැක්වීමට තරම් කැටයම්කරු සූක්ෂම වී ඇත. හොඬයේ කෙළවර වූ

ලක්ෂණ, යටි තොල, දළය, ඇස, නළල් තලය ඇතුළු සමස්ත හස්තියෙකුගේ ලක්ෂණ කැටයමෙහි වේ. වල්ගය කෙළවරෙහි වූ දිගු කෙඳි රොද, පාදයේ නියපොතු ස්වාභාවිකව නෙලා ඇත. ලිංගික ප්‍රදේශය වඩාත් ස්වාභාවික අයුරින් දැක්වීමට උනන්දු වීම තුළින් ඇත් රූපයට කිනම් හෝ ශෛලිගත ස්වරූපයක් ලබා දීමට කලාකරුවා පෙළඹී නොමැත. මේ අනුව අනුරාධපුරයේ ඇත් රූප ස්වාභාවික සතුන්ගේ ප්‍රතිමූර්තියක් ලෙස සඳහන් කළ හැකි ය (රූපය 569).




රූපය 567. කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ කුලුනක වූ ඇත් රූපයක් (ඡායාරූපය: කැළුම් මනමෙන්ද්‍ර-ආරච්චි)



රූපය 568. මිනිසා සහ ඇතා. සිංහ පොකුණ, මිහින්තලය (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

ජේතවනාරාම ස්ථූප වාහල්කඩක එක් සිරස් ඵලකයක මානව රූපයක් වේ. එහි පහළ දකුණු පස ඇතෙකුගේ හිසක් ද, ඊට ඉදිරියෙන් අශ්වයෙකුගේ හිස හා ඉදිරි ගාත්‍රා ද නිරූපණය වේ. මෙම ඇතා සහ අශ්වයා ඵලකය තුළ කුමක් නියෝජනය කරනවාදැයි ප්‍රකාශ කළ නොහැකි වුවද අනුරාධපුර පූජා නගරය තුළ පිහිටි ගල් කැටයම් අතර මෙය විශේෂයෙන් සඳහන් කළ හැකි අවස්ථාවකි. (රූපය 570).

බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන අයුරින් මහාමායා දේවියගේ කුසෙහි සිදුහත් කුමරු පිළිසිඳ ගැනීම හා බැඳුණු සුදු ඇත් පැටවකු සිහිනයෙන් දැකීම ඇතුන්ගේ රූප බෞද්ධාරාම තුළ ප්‍රචලිත වීමට හේතු වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. බෞද්ධයන්හට ඇතා පූජනීය සතෙකු වීමේ ඉතිහාසය වසර 2, 500 ක් තරම් ඈතට දිවේ. අනුරාධපුර යුගයේ කැටයම් අතර සිංහයා තරමටම ඇතා ද ප්‍රමුඛ වේ.



රූපය 569. අනුරාධපුර පූජා නගරයේ සඳකඩ පහණ්වල නෙළා ඇති නොයෙක් ඉරියව් විදහා දැක්වෙන ඇත් රූප. ඉහළ පෙළ හා දෙවැනි පෙළ වම් පස රූප, අභයගිරිය පරිශ්‍රය. ඉතිරි රූප මහා විහාර පරිශ්‍රයෙනි
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 570. ජේතවනාරාම ස්ථූපයේ වාහල්කඩක වූ ඵලකය. එහි පහළ දකුණුපස කෙළවරෙහි ඇත් රුවක් සහ අශ්ව රුවක් වේ
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

සුනඛයා

සුනඛයා යනු පැරණි ජන සමාජය විසින් අවමන් සහ පිළිකුල් සහගත ලෙස පිළිගැනුණු සත්ත්වයෙකි (Coomaraswamy, 1979). තමන්ට ලැබෙන ඕනෑම දෙයක් ආහාරයට ගනිමින් ජීවත් වන සතුන් නිසා පැරණි සමාජය උන් පිළිකුල් කළා විය හැකි ය. දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ 'පරියා'



රූපය 571. අන්නාණි කුලුනුවල වූ සුනඛ රූප. මෙහි වූ සියලුම සුනඛ රූපවල වූ පොදු ලක්ෂණ ලෙස කෙටි හොඹ හා ස්ථූල සිරුරත්, ඉහළට වක්වූ වලිගයත් සඳහන් කළ හැකි ය. අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 572. පසුපසට හිස යොමා ඉදිරියට දුවන ඉරියව්වෙන් යුත් සුනඛ කැටයම. අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 573. සුනඛ කැටයම. අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

යන කුලයට අයත් වූවන් ඉහළ කුලවන්තයින් විසින් සුනඛයන් තත්ත්වයෙහිලා අවමානයට ලක් කෙරිණි. පරියා නම් කුල නාමය පසු කලෙක ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු එය දඩාවතේ යන සුනඛයින්ට යෙදෙන පොදු නාමයක් ලෙස භාවිතා විය. 'පර බල්ලා' ලෙස අප අද භාවිත කරනුයේ දකුණු ඉන්දියාවෙන් සම්භවය වූ වදනකිනි.

අනුරාධපුරයේ අත්තාණි කුලුනුවල සුනඛ රූපය යෙදීමෙන් එකල ජන සමාජය විසින් සංකේතවත් කරන ලද්දේ සංඝයාට පූජා කරන ලද දෑ පරිහරණය කළ හොත් ඔවුන් මතු ආත්මයක සුනඛයන් වී ඉපදෙන බව ය. මෙම කුලුනුවල වූ සුනඛ රූපවල පොදු ලක්ෂණ කිහිපයකි. එනම් කෙටි හා උස් සිරුර, දිගු පාද, ඉහළට පිහිටා වක ගැසුණු වල්ගය, කෙටි කන් සහ කෙටි හොම්බ ආදි වශයෙන් ඒවා දැක්විය හැකි ය. වර්තමානයේ ද ග්‍රාමීය පළාත්වල මෙම හැඩය දරන සුනඛයින් වේ. පුරාණ කැටයම්කරුවන්ගේ මෙම සුනඛ කැටයම මඟින් එකල්හි මෙරට විසූ සුනඛයින්ගේ හැඩය පිළිබඳ යම් අවබෝධයක් ලබාගත හැකි ය (රූපය 571).

අනුරාධපුරයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයේ ගල් පුවරුවක දුවන ඉරියව්වෙන් යුත් සුනඛයෙකුගේ රුවක් නෙළා ඇත. එහි ද කෙටි හොම්බ හා ස්ථූල සිරුරත්, ඉහළට වක්වූ වලිගයත් වේ. මෙම කැටයමෙන් නිරූපණය වනුයේ හිස පසුපසට හරවා ඉදිරියට දුවන සුනඛයෙකි. එමෙන්ම අනෙක් සුනඛ කැටයම්වල දැකිය නොහැකි ලිංගික අවයව මෙහි මනා ලෙස හුවා දක්වා ඇත (රූපයට 572). එම කෞතුකාගාරයේ වූ තවත් ගල් පුවරුවක නෙළා ඇති සුනඛ රුවෙහි මූලික හැඩයන් නිර්මාණය කොට තිබුණ ද එහි ඇස්, කන් හෝ මුඛය පැහැදිලිව දක්වා නොමැත. මෙම කැටයම සම්පූර්ණ නොකරන ලද්දක් බැව් හැඟේ (රූපය 573).

නාගයා

'නාගයෝ වූ කලී සැබැවින්ම ප්‍රබලයෝ ය. ඇතැම් විටෙක ඔවුන් ප්‍රබලයන් මෙන් ම, ශ්‍රේෂ්ඨයෝ ද වූහ. බුදුරජාණන් වහන්සේ වැනි උතුමන්ට පවා නාග නාමය භාවිතා කළේ එහෙයිනි. ලක්දිව නාග ගෝත්‍රිකයින්ගේ භූමිකාව ද එවැන්නකි. කාලයාගේ වැලි තලාවෙන් ඔවුන් පිළිබඳව වූ ඉතිහාසය වැළලී ගියත් එය හාරා ඇවිස්සීම ද අතිශය වැදගත් ය' .

මහාචාර්ය මාලිංග අමරසිංහ

'නාග සංකල්පය හා සිංහල සංස්කෘතිය' යන ග්‍රන්ථයෙන් ඉහත ඡේදය උපුටා ගන්නා ලදී. එහි කර්තෘ කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධානී මහාචාර්ය මාලිංග අමරසිංහ වන අතර එම ග්‍රන්ථයෙන් නාගයන් පිළිබඳ මනා විස්තරයක් ඉදිරිපත් කොට ඇත. ශ්‍රී ලංකාවේ නාග සංකල්පය පිළිබඳ උනන්දුවක් දක්වන පාඨකයින් සඳහා ලක්දිව නාග ගෝත්‍රිකයින් බුදු දහම හා බැඳුණු නාග සංකල්ප, නාග කෘති තුළින් මතුවන නාග රූපය හා නාගයින් සම්බන්ධ ජන ඇදහිලි විශ්වාස සහ ජන කතා යන මාතෘකා යටතේ පරිපූර්ණ විස්තරයක් එම ග්‍රන්ථයේ වේ (අමරසිංහ, 2005).

බුද්ධ චරිතය හා සම්බන්ධ 'මුචලින්ද නාගයා' පිළිබඳ සංකල්පය අනුව පැරණි විහාරාමවල නාගයා කැටයම්වලට ඇතුළත් වන්නට ඇත. එසේ වුවද නාගයා ජලය සංකේතවත් කිරීමට ද යොදා ගත් බැව් අනුමාන කළ හැක්කේ අනුරාධපුර තිසා වැව් සොරොව්ව අසල, කුට්ටම් පොකුණ (රූපය 574), මාන්නන්කට්ටිය වැව් සොරොව්ව අසල ආදී පුරාණ වාරි කර්මාන්ත ආශ්‍රිතව නාග රූප හමුවීමෙනි. නාගයා යනු පුරාණ ජන සමාජයේ දේවත්වයෙහිලා සැලකූ සත්ත්වයෙකි. ශ්‍රී ලංකාවේ සර්පයින් කොතෙකුත් සිටිය ද පැරණි ජනයා පූජනීයත්වයෙන් පුදනු ලබන්නේ නාගයා පමණි (de Silva, 1973).



රූපය 574. කුට්ටම් පොකුණේ වූ නාග රූව. නාගයා හිඳිනුයේ දෙපස කුලුනු දෙකක් හා ඉහළින් ආරුක්කු හැඩයට වූ මකර තොරණ්වලින් සමන්විත ගෘහයක් තුළ ය (ඡායාරූපය: මාධව මීගස්කුඹුර)

අනුරාධපුර යුගයේ නාග කැටයම් සියල්ලම පාහේ ශෛලිගත ය. එහි පෙණ පහක්, හතක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් දක්වා ඇත. මීට අමතරව නාගයින්ගේ ගෙලෙහි පළඳනාවක් දැකිය හැකි අතර එහි මධ්‍යයේ මාණික්‍යයක් යැයි අනුමාන කළ හැකි වටකුරු වස්තුවක් ද වේ. බොහෝ නාගයින් ඉතා විචිත්‍රවත් කුලුනු සහිත ගෘහයක් තුළ නෙළීමට තරම් නාගයින් උතුම් කොට සලකා ඇත. කුට්ටම් පොකුණේ වූ නාග රූව මෙයට කදිම නිදසුනකි. එහි නාගයා වසන ගෘහයෙහි උඩු ආරුක්කුවේ මකර තොරණක් ද දැකිය හැකි ය (රූපය 574). ඊට අමතරව නාගයා කොතරම් වන්දනීය සත්ත්වයෙකු ද යන්න දක්වමින් පෙණ ගොබවලට ඉහළින් ඡත්‍රයක් යෙදීමට තරම් පුරාණ ජනයා වගබලාගෙන ඇත. මේ තුළින් පෙන්නුම් කරන්නට ඇත්තේ නාගයා කෙරෙහි දැක්වූ අප්‍රමාණ ගෞරවය බැව් අනුමාන කළ හැකි ය. බොහෝ නාග රූප නෙළීමේදී නාගයාගේ සිරුරේ කුඩා කොරළ පවා නෙළීමට තරම් කැටයම්කරු උනන්දු වී ඇත. ජේතවනාරාම ස්ථූපයෙහි වාහල්කඩ කුලුනුවල නෙළා ඇති නාග රූප මෙයට කදිම නිදසුන් වේ. ඉහත විස්තර කරන ලද ලක්ෂණයන්ට පරිබාහිරව ඡත්‍රයක් හෝ කුලුනු හා මකර තොරණ සහිත ගෘහයක්

තුළ හෝ නොසිටින නාග රූප ද කලාතුරකින් දැකිය හැකි ය. එවැනි නාග රුවක් ජේතවනාරාම සලපතළ මළුවේ පිහිටුවා ඇත. නාග රූප බෞද්ධ සිද්ධස්ථානවල ස්ථානගත කිරීමේදී දෙපා ගැටෙන ස්ථානයන්හි යොදා නොමැතිවීම තවත් වැදගත් කරුණකි (රූප 575, 576).

රුවන්වැලිසෑයේ වාහල්කඩක් අසල සිරස් ගල් පුවරුවක වූ පෙණ ගොබ හතක් සහිත නාග රුව දරනුයේ ගරාදි වැටක් සංකේතවත් කරන පාදමක් මත ය. එමෙන්ම පෙණ ගොබයට ඉහළින් ඡත්‍රය ද මෙම කැටයමෙහි දැකිය හැකි ය (රූපය 577). කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩ අසල වූ කුලුනු මත



රූපය 575. අනුරාධපුර ජේතවනාරාමයේ වාහල්කඩ අසල වූ නාගරූප. මෙහි වූ සෑම නාග රුවකම පෙණ ගොබයට ඉහළින් ඡත්‍රයක් පිහිටුවා ඇත (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 576. ඡත්‍රයක් නොමැති නාග රූපය. ජේතවනාරාම සලපතළ මළුව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 577. ගරාදි වැටක ආකාර පාදමක් මත වූ නාගයා. රුවන්වැලිසෑය වාහල්කඩක (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

නෙළා ඇති පෙණ කිහිපයකින් යුත් නාග රූප දෙකක් කෙරෙහි අපගේ විශේෂ අවධානය යොමු විය. එහි වූ නාග කැටයම් දෙකෙහිම අපූර්වත්වය වනුයේ ඉහත විස්තර කළ නාග රූප මෙන් දරණ ගසා නොසිට සිරස් ආකාරයෙන් නෙළා තිබීම ය. නොඑසේ නම් එම නාගයින් සිටගෙන සිටින ඉරියව්වක් දැරීම ය. එහි පෙණ ගොබයට පහළින් වටකුරු හැඩැති පළඳනාවක් ද, පෙණ ගොබයට ඉහළින් ඡත්‍ර ද වේ (රූපය 578).




රූපය 578. සිරස් ඉරියව්වෙන් වූ නාග කැටයම්. කණ්ඨක චේතිය චෛත්‍ය වාහල්කඩවල (ඡායාරූප: මාධව මීගස්කුඹුර, කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

නාග රූප පිළිබඳව වන මෙම සාකච්ඡාවේදී මිහින්තලයේ නාග පොකුණට වැදගත් ස්ථානයක් හිමි වේ. සංඝයාගේ පරිහරණය සඳහා ඉදිකරන ලද මෙම පොකුණේ වූ ගල් තලාවේ ජලයෙන් මතුවී ඉදිරි දෙස බලා සිටින පෙණ පහකින් යුත් නාගයා අනුරාධපුර යුගයේ නාග කැටයම් අතර ප්‍රමාණයෙන් විශාලතම නිර්මාණය ලෙස සඳහන් කළ හැකි ය (රූපය 579).

අභයගිරිය පරිශ්‍රයේත්, ජේතවනාරාම ස්ථූපයේත්, කණ්ඨක චෛත්‍යයේත් නා රජුන් දැක්වෙන රූප නෙළා ඇත. මෙම රූප අතරින් වඩාත්ම සංකීර්ණ කැටයම වනුයේ අභයගිරි පරිශ්‍රයේ රත්නප්‍රාසාදයේ වූ කැටයම වේ. එහි රජුගේ හිස පිටුපසින් පෙණ හතකින් යුත් නාගයෙකු සහ ඉහළ ආරුක්කුව මකර රූප හා වාමන රූපවලින් සරසා ඇත. එම සමස්ත කැටයම අනුරාධපුරයේ වූ ශිලා කැටයම් අතර වඩාත් සියුම් නිර්මාණය ලෙස සඳහන් කිරීම යෝග්‍ය ය (රූපය 580).


පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් මිහින්තලය කෞතුකාගාරයෙහි තැන්පත් කර ඇති ලෝකඩින් නිර්මිත නාග රූප 4 කි. එහි එක් රුවක් හිස් 19 කින්ද, තවත් රුවක් හිස් 31 කින්ද යුක්ත ය. මෙම



රූපය 579. මිහින්තලයේ නාග පොකුණ (වම) සහ එහි වූ විශාල නාග කැටයම (දකුණ) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 580. නා රජුන්. අභයගිරිය රත්නප්‍රාසාදය (වම) ජේතවනාරාමය සලපතළ මළුව (මැද) සහ මිහින්තලය කණ්ඨක චෛත්‍යය (දකුණ) (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 581. පෙන ගොබ සමූහයකින් යුත් ලෝකඩින් නිර්මිත නාග පිළිම. මිහින්තලය කෞතුකාගාරය (රූප සටහන්: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අප කළ ගවේෂණවලදී අනුරාධපුරයට නුදුරු තඹබෝව වැව අසල ගලින් කළ නාග කැටයමක් හමුවිය. මෙම නාග රුව අනුරාධපුර යුගයේ නාග කැටයම්වලට වඩා බොහෝ ශෛලිගත ස්වරූපයක් පෙන්නුම් කරයි. තඹබෝව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැවසූ පරිදි වැව ප්‍රතිසංස්කරණ කටයුතුවලදී මෙම නාග කැටයම් කුමන කාල වකවානුවට අයත් දැයි නිශ්චිතවම ප්‍රකාශ කළ නොහැකි වුවද මේ පරිච්ඡේදයේ ඒ පිළිබඳ කෙටියෙන් හෝ සඳහන් කිරීම වැදගත් ය. මෙම බහු හිස් නාග පිළිම දෙක සෙ.මී. 7 ක් පමණ උස්වන අතර අනෙක් පිළිම දෙක සෙ.මී. 4 ක් සහ 6 ක් පමණ උස් වේ. මෙතරම් නාග හිස් ප්‍රමාණයක් දරන නාග පිළිරූ හමුවූ ප්‍රථම අවස්ථාව මෙය ය (රූප 581).



රූපය 582. ශෛලිගත නාග කැටයම. තඹබෝව වැව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



කැටයම හමුව ඇති අතර එය දැනට තඹබෝව වැව පිටවාන් දොරටුව අසල වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වැඩ බිමෙහි තැන්පත් කොට ඇත (රූපය 582). නාග රුව සහිත මැටි බඳුන් (රූපය 582 a) කිහිපයක් පදවිය දාගැබේ ධාතු ගර්භයේ තැන්පත් කොට තිබියදී කැණීම් මඟින් හමුවිය. පෙණය දරා සිටින නාගයාගේ සිරුර බඳුනෙහි උඩු පැත්තේ කවාකාර ඉරියව්වෙන් නෙළා ඇත. නිර්මාණකරු නාග පෙණය නිවැරදි ඉරියව්වෙන් නෙළා ඇති බැව් නාග හිසෙනුත්, පෙණය මැද වූ උගුරු පෙදෙසෙනුත් මනාව පැහැදිලි වේ. උසින් සෙ.මී. 19 ක්ද, පත්ලේ විශ්කම්භය සෙ.මී. 11 ක්ද වන මෙම මැටි බඳුන මඳ වශයෙන් පුළුස්සා ඇත. කුමන කාලයට අයත් ද යන්න නිර්ණය කොට නොමැති

රූපය 582a. නාග රුව සහිත මැටි බඳුනක්. පදවිය දාගැබේ ධාතු ගර්භයෙනි (මෙම රේඛා චිත්‍රය De Silva & Dissanayake, 2008 අනුව අඳින ලදී) (රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


මෙම බඳුන් පැහැයෙන් රක්ත වර්ණයක දරයි. සකපෝරුවේ තනා ඇති මේවාහි උපයෝගිතාවය අවිනිශ්චිත වුවද දාගැබ් ධාතු ගර්භයේ තැන්පත් කොට තිබීමෙන් පැහැදිලි වන්නේ යම් වත් පිළිවෙත් සඳහා එසේ තැන්පත් කරන්නට ඇති බවයි. මෙම බඳුන් අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ. නාග රූපය සහිත තවත් මැටි බඳුන් පඬුවස් නුවර කරන ලද කැණීම්වලින් හමුවී ඇති අතර ඒවා පඬුවස් නුවර පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ (De Silva & Dissanayake, 2008).

අනුරාධපුර යුගයේ කැටයම් අතර වූ පක්ෂීන්

අනුරාධපුර සත්ත්ව කැටයම් අතර පක්ෂී රූප ප්‍රධාන වශයෙන්ම නෙළා ඇත්තේ සඳකඩ පහණෙහිය. පුරා විද්‍යාඥයින් හා ඉතිහාසඥයින් දක්වන අන්දමට එයින් නිරූපණය වන්නේ හංසයෙකි. ඊට අමතරව ස්ථූපවල ආයක අසල පිහිටි කුලුනුවල මොනරුන් නෙළා ඇත. අත්තාණි කුලුනුවල ශාප පාඨවලට අමතරව වූ සත්ත්ව රූප අතර කපුටන් ඉතා සරල ලෙස නෙළා තිබීමද මෙහිදී සඳහන් කළ හැකිය. එමෙන්ම ජේතවනාරාම සළපතල මළුවේ අතුරා ඇති ගල් පුවරුවල විශාල ප්‍රමාණයක් වූ රූප අතර පක්ෂී රූප කිහිපයක්ද වේ.

හංසයා

හංසයා යනු ක්ෂීරය හා ජලය වෙන් කර ගත හැකි පක්ෂියෙකු ලෙස ජන වහරේ හැඳින්වේ. ආනන්ද කුමාරස්වාමි හංසයා පිළිබඳ දක්වනුයේ මෙසේය. එනම්, " The *hamsa* is the well-known 'sacred goose' of Hinduism ....." යනුවෙනි (Coomaraswamy, 1979). අනුරාධපුරයේ සියලුම සඳකඩ පහණ්වල වූ හංසයින්ගේ ශරීර හැඩයන් බොහෝ දුරට ඒකාකාරී වේ. එනම්, කෙටි හොටය, ස්ථූල හිස සහ



රූපය 583. අනුරාධපුර පූජා නගරයේ සඳකඩ පහණ්වල වූ විවිධ හැඩයන්ගෙන් හා ඉරියව්වලින් යුත් හංස රූප. මෙහි ස්ථූල සිරුරත්, කෙටි ගෙල, කෙටි හොටය හා කෙටි පාද හංසයෙකුට වඩා පාත්තයෙකුගේ පෙනුම දරයි. ඉහළ පෙළ අභයගිරි පරිශ්‍රය සහ ඉතිරි රූප සියල්ල මහා විහාර පරිශ්‍රය (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

බෙල්ල, ඕවලාකාර සිරුර, කෙටි පෙඳය, කෙටි පියාපත් හා ස්ථූල පාද මූලික ලක්ෂණ වේ. ඇතැම් කැටයම්වල හොටයේ ඉහළ නාස් විවරය පවා මනාව දක්වා ඇත. ඇස්, පියාපත් සහ කෙටි වල්ගයේ වූ පිහාටු ද මනා ලෙස නිරූපිතය. පාද කෙටි හා ශක්තිමත් ස්වරූපයක් උසුලයි. සඳකඩ පහණේ වූ සියලුම හංස රූප ඇවිදින ඉරියව්වක් දක්වා ඇත. සෑම රූපයකම නොවුවද නෙළුම් පොහොට්ටු, නෙළුම් මල් හා නෙළුම් කොළ ආදි එකතුවක් හොටින් රැගෙන යන අවස්ථා ඇතැම් කැටයම්වල දක්වා ඇත.




රූපය 584. හංස පූට්ටුව. අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මෙම විස්තර කරන ලද ශාරීරික ලක්ෂණ සලකා බැලූ කල මෙයින් නිරූපණය වනුයේ හංසයෙකුට වඩා පාත්තයෙකු (goose) යැයි දැක්වීම වඩාත් සාධාරණ වේ. මක් නිසාද යත්, හංසයෙකුගේ හොටය සහ ගෙල සිහින් හා දිගු වේ. සඳකඩ පහණෙහි වූ ස්ථූල පෙනුමක් දරන මෙම පක්ෂියා සත්‍ය වශයෙන්ම හංසයෙකුද නැතිනම් පාත්තයෙකු දැයි සොයා බැලීම වටී (රූපය 583).

අනුරාධපුරයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයේ ශිලාමය ඵලකයක වූ හංස කැටයමක් වෙත අපගේ අවධානය යොමු විය යුතුය. අනුරාධපුර කැටයම් අතර හංස පූට්ටුව එතරම් සුලබ නොවේ. එසේ වුවද කෞතුකාගාරයේ වූ මෙම කැටයම ශ්‍රී ලංකාවේ ඊට පසුකාලීන කෘති අතර වූ හංස පූට්ටුවට අතිශයින්ම සමාන ය. මෙහි වූ ගෙලින් වෙළී ඇති හංස යුවළ ද්වීපාර්ශ්වික සමමිතියක් ගෙන දෙන අයුරින් නිමවා, පෙඳය මනා ලෙස විහිදා කැපී පෙනෙන අයුරින් දක්වා ඇත. බොහෝ හංස පූට්ටුවල හංසයින් හොට එකතුකොට එකිනෙකා දෙස බලා සිටින ඉරියව්වෙන් දක්වා තිබුණද මෙම කැටයමෙහි හංස හිස් ප්‍රතිවිරුද්ධ දිශාවන්ට යොමු කොට ගෙන ඇත (රූපය 584).

මොනරා





රූපය 585. මොනරෙකු සහ සෙබඩුන් දෙදෙනෙකු නිරූපිතය (වම් පස). කණ්ඨක චෛත්‍යය, මිහින්තලය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

රූපය 586. මොනරුන් (ඉහළ දකුණු පස). කණ්ඨක චෛත්‍යය, මිහින්තලය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)




රූපය 587. ඉගිළෙන මොනර රුව. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය. අනුරාධපුරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අනුරාධපුර යුගයේ කැටයම් අතර මොනරුන් සුලබ නොවේ. කණ්ඨක චෛත්‍යයේ වාහල්කඩවල වූ උස් සිරස් කුලුනුවල මොනරුන්ගේ කැටයම් කිහිපයක් දැකිය හැකිය. මෙහි එක් ඵලකයක මොනර රූප තුනකි. එහි මැද වූ විශාල මොනරාගේ හිසෙහි වූ දිගු පිහාටු දක්වා ඇති අතර හකුලාගත් දිගු පිල් කළඹ ද වේ. මෙහි නිරූපණය වන්නේ මොනරෙකු (පිරිමි සතෙකු) බව පැහැදිලි ය. දෙපසින් තවත් ඊට ප්‍රමාණයෙන් කුඩා මොනරුන් දෙදෙනෙකි. උන්ගේ හිස මත පිහාටු රොද හා දිගු පිල් කළඹ දක්වා නැති බැවින් සෙබඩුන් හෝ පැටවුන් විය හැකිය. නිතරම පාහේ මොනරුන් ස්වාභාවික පරිසරයේ ගැවසෙනුයේ එක් පිරිමි සතෙක් හා ගැහැනු සතුන් කිහිපදෙනෙකු වශයෙනි. මේ අතර ඇතැම් විට පැටවුන්ද වේ. ඒ අනුව මෙම කැටයමින් නිරූපණය වන්නේද එක් පිරිමි සතෙකු හා ගැහැනු සතුන් දෙදෙනෙකු යැයි සඳහන් කිරීම සාධාරණ විය හැකිය (රූපය 585).

ඉහත කැටයම දැක්වෙන ගල් කුලුනෙහිම මුදුනේ වූ පුන් කළස මත දැක්වෙන පක්ෂී රූප දෙක මොනරුන් බව හඳුනාගත හැකිය. එහි වම් පස පිහිටි පක්ෂියාගේ දිගු පිල් කළඹ දක්වා ඇති අතර දකුණු පස පක්ෂියාගේ දක්වා ඇත්තේ වක් වූ පිල් කළඹකි. කෙසේ වුවද මෙහි වූ මූලික ලක්ෂණ අනුව මෙම පක්ෂීන් දෙදෙනා ද මොනරුන් ලෙස හඳුනාගත හැකිය (රූපය 586).

අනුරාධපුර පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරයේ ගල් පුවරුවක නෙළා ඇති ඉගිළෙන මොනර රූපය ද අපූරු නිර්මාණයක් ලෙස හඳුන්වාදිය හැකිය. අත්තටු විහිදා, හිස පසුපසට යොමා පියාඹන මොනරාගේ පිල් කළඹ ගුවනේ පාවෙන ලෙසින් නිමවා ඇත. අනුරාධපුර සත්ත්ව කැටයම් අතරින් මෙතෙක් හමුවී ඇති ඉගිළෙන මොනරෙකුගේ එකම රුව මෙය ලෙස සඳහන් කළ හැකි ය (රූපය 587).

කපුටා




රූපය 588. අත්තාණි කණුවල වූ කපුටු රූප. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය. අනුරාධපුරය
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

ශ්‍රී ලංකාවේ අත්තාණි කණුවල සඳහන් සත්ත්ව රූප අතුරින් කපුටා නිත්‍ය නියෝජනයක් දරයි. රජෙකු හෝ රජයේ උසස් නිලධාරියෙකු විසින් රාජ සභාවේ අනුමැතිය ඇතිව පුද්ගලයෙකුට හෝ ආයතනයකට ලබාදෙන ලද විශේෂ නිදහස් කිරීම් හා වරප්‍රසාද ප්‍රදානය කෙරෙන ව්‍යවස්ථා ඇතුළත් ලේඛන 'අත්තාණි පරිහාර' යනුවෙන් හැඳින්වේ (කුමාර, 1998 සහ කුලතුංග, 2005). මෙසේ දෙනු ලබන දීමනාවන්ට විරුද්ධ වන්නන්ට ශාප කිරීම සඳහා බලු, කපුටු රූප යොදාගෙන ඇති අතර ශාප කොට ඇත්තේ 'බලු කපුටු වෙත්වා.....' යනුවෙනි.

මෙහි වූ කපුටු රූපය ඉතා සරලව සංකේතාත්මකව පමණක් නිර්මිත ය. ස්ථූල හොටය, උස් පාද හා දිගු වල්ග පිහාටු දැක්වීම තුළින් කපුටෙකුගේ මූලික හැඩය පමණක් පෙන්වා ඇත (රූපය 588).

අනෙකුත් පක්ෂී රූප



රූපය 589. ජේතවනාරාම සළුපතල මළුවේ වූ පක්ෂී රූප. මෙම පක්ෂී රූපවල මූලික හැඩතල අනුව නිවැරදි පක්ෂී විශේෂය කුමක්ද යන්න හඳුනා ගැනීම තරමක් අපහසුය
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


ජේතවනාරාම සළුපතල මළුවේ බිම අතුරා තිබෙන ගල් පුවරු මත නෙළා ඇති සරල රූප බොහෝමයකි. එහි චතුරස්‍ර, ස්ථූප හැඩ, සමාන්තරව විහිදෙන සරල රේඛා ආදි සංකේතාත්මක හැඩයන්


රූසක් දැකිය හැකි ය. මෙම රූප පිළිබඳ හබරකඩ වජිර හිමි විසින් 2005/2006 වසරේ වැලිපිළ සඟරාවේ 07 වන කලාපයේ සවිස්තරාත්මක ලිපියක් පළ කොට ඇත. මෙහිදී අප පෙන්වාදීමට බලාපොරොත්තු වනුයේ එම රූප අතර වූ හඳුනා නොගත් පක්ෂී සටහන් කිහිපයකි. එකිනෙකට වෙනස් හැඩයන් නිරූපණය කරන පක්ෂී රූප කිහිපයක් හඳුනාගත්ත ද කුමන පක්ෂී විශේෂය ද යන්න හඳුනා ගැනීමට තරම් ශාරීරික ලක්ෂණ හුවා දක්වා නොමැත (රූප 589).

රුවන්වැලිසෑය හා ථූපාරාමය අතර පිහිටි නටබුන් වූ ගොඩනැගිලි පරිශ්‍රයේ සඳකඩ පහණක් වේ (එම ස්ථානය පිළිබඳ විස්තරයක් 'මහා විහාර පරිශ්‍රයේ වූ කොරවක්ගල කැටයම' පරිච්ඡේදයේ විස්තර



රූපය 590. පැටවාට ආහාර කවන පක්ෂියෙක්. මහා විහාර පරිශ්‍රය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)






රූපය 591. පියාපත් විහිදා සිටින ඉරියව්වෙන් යුත් පක්ෂී රූප දෙකක්. මහා විහාර පරිශ්‍රය (ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


කොටඇත). එම සඳකඩ පහණෙහි ලියවැල් අතර සඟවා නෙළන ලද පක්ෂී රූප කිහිපයකි. නිර්මාණකරුවා ලියවැල් අතර මෙම පක්ෂී රූප කුමන අරමුණක් අරභයා නෙළුවාද යන්න පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම අපහසු ය. මක්නිසාද යත් මෙම පක්ෂී රූප සියල්ලම පාහේ ලියවැල් කැටයම් අතර බොහෝ දුරට සඟවා තිබීමය. තීක්ෂණව නිරීක්ෂණය නොකළේ නම් මේවා දැක බලා ගැනීම අපහසු වේ. මෙහි වූ එක් කැටයමකින් නිරූපණය වනුයේ පුෂ්පයක් මත හිඳ පැටවෙකුට තම හොටින් ආහාර කවන කුරුල්ලෙකි (රූපය 590). තවත් කැටයමක අත්තටු විහිදා පසු පසට හිස හරවා සිටින කුරුල්ලෙකි. තවත් රූපයක හොට පුෂ්ප මත සඟවා සිටින අයුරින් දක්වා ඇත (රූපය 591). අනුරාධපුර පූජා නගරයේ වූ අනෙකුත් සඳකඩ පහණ් ලියවැල්වල මෙවැනි පක්ෂී රූප නිරීක්ෂණය කොට නොමැත.

මත්ස්‍ය රූප



රූපය 592. මැටියෙන් නිමවා ඇති මත්ස්‍ය රුව. අභයගිරිය කෞතුකාගාරය, අනුරාධපුරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)






රූපය 593. ගල් පුවරුවක අෂ්ට මංගල රූප සමඟ වූ මත්ස්‍ය රූපය (පරිමාණය මි.මී. 10 කි). පුරාවිද්‍යා කෞතුකාගාරය, අනුරාධපුරය (ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අනුරාධපුරයෙන් හමුව ඇති පුරාවස්තූන් අතර මත්ස්‍ය රූප ද කිහිපයකි. මේ අතරින් ඉහත විස්තර කරන ලද ජේතවනාරාම පරිශ්‍රයේ වූ පොකුණකින් හා කුට්ටම් පොකුණෙන් හමුව ඇති ලෝකඩ මත්ස්‍ය ප්‍රතිමා ද, රන්මසු උයනේ ශිලාමය රූපසටහනේ වූ මත්ස්‍ය රූප ද විශේෂිත නිර්මාණයන් ලෙස සඳහන් කළ හැකි ය (ඒ පිළිබඳ විස්තර 'රන්මසු උයනේ ශිලාමය රූප සටහන' හා 'ජේතවනාරාම පොකුණෙන් ලද සත්ත්ව රූප' යන පරිච්ඡේදයන්හි විස්තර කොට ඇත). මීට අමතරව ජේතවනාරාම පරිශ්‍රයේ කළ



රූපය 594. අෂ්ට මංගල රූපවලට අයත් මත්ස්‍ය රූපය (ඉහළ වම් කෙළවර). තන්තිරිමලේ කෞතුකාගාරය, තන්තිරිමලය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)





රූපය 595. වරල් මගින් බද්ධ වී ඇති මත්ස්‍ය යුවළ (පරිමාණය මි.මී. 10කි) (ඡායාරූපය සහ රූප සටහන : කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

කැණීම් මඟින් අනාවරණය කොටගෙන ඇති පාෂාණ හා බෙලි කවච කොටස් මගින් නිර්මිත මත්ස්‍ය පබළු ද මත්ස්‍ය නිර්මාණ අතරට ගැනිය හැකි ය. මෙම පබළු සිත් ඇදගන්නාසුලු හැඩයන්ගෙන් නිර්මිත ය. පබළු එකතුවේ මත්ස්‍ය හැඩැති පබළු මෙන්ම ඉදිබුවන්ගේ හැඩයට නෙළා ඇති පබළු ද වේ. එම නිර්මාණ ජේතවනාරාම කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.

මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් අභයගිරිය කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරෙන පුරාවස්තූන් අතර මැටියෙන් නිමවා ඇති කුඩා මත්ස්‍ය රුවකි. එහි වල්ග කොටස පළුදු වී ඇත. මත්ස්‍යයා යනු අෂ්ඨ මංගල සලකුණු අතරින් එකකි (රූපය 592). අනුරාධපුර පුරාවිද්‍යා දෙපර්තමේන්තුවට අයත් කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනය කෙරෙන ගල් පුවරු දෙකක ද මත්ස්‍ය රූප දැකගත හැකි ය. ඒ අතරින් එක් හතරැස් ගල් පුවරුවක නෙළා ඇති අෂ්ට මංගල සලකුණු අතර වූ මත්ස්‍ය රූපය ඉතා සරල හැඩයෙන් යුක්ත ය. එහි මත්ස්‍යයාගේ හිස, බඳ හා වල්ගය දක්වා ඇතත් අනෙකුත් ලක්ෂණ පිළිබඳ කැටයම්කරු උනන්දු වී නොමැත (රූපය 593).


ඉහත ආකාරයේම අෂ්ට මංගල සලකුණු සහිත හතරැස් ගල් පුවරුවක් තන්තිරිමලේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයේ ද ප්‍රදර්ශනය කෙරේ. එහි වූ මත්ස්‍ය කැටයමේ වරල් පැහැදිලිව දක්වා තිබුණ ද එය ඉතාම සරල හැඩයෙන් යුක්තව නෙළා ඇත. පුවරුවේ දකුණුපස මැද පෙදෙසෙහි සංඛයක්ද වේ (රූපය 594). අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ වූ අනෙක් ඵලකයේ මත්ස්‍ය යුගළක් දැක්වේ. එහි මූලික හැඩතලයන් ද ඇතුළුව වරල් නිර්මාණය කොට ඇත. වරල් මගින් උන් ඒකාබද්ධ වී ඇති බව කැටයමෙහි දැක්වේ (රූපය 595).





රූපය 596. ගං කොරළියෙකුගේ හැඩයට සමාන මත්ස්‍ය රූපය (පරිමාණය මි.මී. 10 කි). අභයගිරිය සළුපතල මළුව, අනුරාධපුරය (ඡායාරූපය සහ රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

අභයගිරිය ස්ථූපයේ නැගෙනහිර වාහල්කඩ ඉදිරියේ සළුපතල මළුවේ අතුරා ඇති ගල්පුවරුවල මත්ස්‍ය රූප එකතුවක් නෙළා ඇත. එම රූප බොහෝ සේ සිත් ඇදගන්නාසුලුය. එහි මසුන්ගේ මූලික හැඩතල ඉතා සරල ලෙස නිර්මාණකරුවා මනාව ඉදිරිපත් කොට ඇත. ඊට අමතරව වරල්, ඇස් හා මුඛය එම කෘතීන්හි නිසි තැන පිහිටුවීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ (රූපය 597). එක් මත්ස්‍ය රුවක් නෙළා ඇත්තේ අනෙක් ඒවාට සාපේක්ෂව සංකීර්ණ



රූපය 597. අභයගිරි සළුපතල මළුවේ වූ මත්ස්‍ය රූප (පරිමාණය මි.මී. 10 කි)
(ඡායාරූප සහ රූප සටහන්: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

හැඩයක් ගෙන දෙන ආකාරයට ය. එහි වරල් නාරටි හා කොරළ නිරූපණය වන අයුරින් වක් වූ සිරස් හැඩතල නෙළා ඇත. මේ මත්ස්‍ය රූපය අනුරාධපුරයෙහි වසන මිරිදිය මසුන් අතුරින් ගං කොරළියාට බෙහෙවින් සමාන විය හැකිය (රූපය 596).

ඉතිරි මත්ස්‍ය රූප සියල්ලම පාහේ අනුරාධපුර පෙදෙසේ මිරිදියේ වසන පෙතියන්ගේ හැඩයට සමාන වේ. එනමුත් මෙම එකදු මත්ස්‍ය කැටයමක හෝ මසුන්ගේ ශරීරය වසා ඇති කොරළ හෝ ඒ ආකාර සියුම් ලක්ෂණ මතුකිරීමට නිර්මාණකරු උත්සාහ දරා ඇති බවක් නොපෙනේ. මෙම රූපවල වල්ග වරල මනාව දක්වා ඇතත් පෘෂ්ඨීය සහ උදරීය වරල් සෑම රූපයකම දැකිය නොහැකිය. එසේ වුවද මත්ස්‍යයාගේ හිසේ වූ කරමල ආවරණය කරන පිධානය සහ ඇස් නිරූපිත ය.

සංඛය

සංඛය යනු අෂ්ඨ මංගල සලකුණු අතරින් එකකි. සංඛය ලෙස පිළිගැනෙන්නේ මුහුදේ වාසය කරන තනි කටුවක් දරන (ගැස්ට්‍රොපෝඩා කාණ්ඩයට අයත්) බෙල්ලන් ය. හක් බෙල්ලන් පූජනීය සත්ත්වයෙකු ලෙස පැරණි ජනයා සලකා ඇත. බෞද්ධ හා හින්දු සංස්කෘතීන් අතර මුහුදේ වසන හක් බෙල්ලන් හෙවත් වාලම්පුරි (ඉංග්‍රීසි බසින් Conch shell හෝ chank යනුවෙන් ද, විද්‍යාත්මකව *Turbinella pyrum* යනුවෙන් ද ව්‍යවහාර වේ) ආගමික කටයුතු සඳහා යොදාගනු ලැබේ.

කුට්ටම් පොකුණ පත්ලේ තිබී හමුවූ ජලජ ප්‍රාණීන්ගේ ලෝකඩ රූප අතර සංඛයක් ද වේ. අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරෙන එය ඉතා සරල සංකේතාත්මක නිර්මාණයකි. අභයගිරිය කෞතුකාගාරයෙහි ද මැටියෙන් නෙළන ලද සංඛ රූප ප්‍රදර්ශනය කෙරෙන අතර එම වස්තූන් අභයගිරිය

පරිශ්‍රයේ කැණීම්වලින් හමුව ඇත. ඒවා ද බොහෝ සරල නිර්මාණයන් ලෙස සඳහන් කළ හැකි ය (රූපය 598).



රූපය 598. අභයගිරි පරිශ්‍රයේ කැණීම්වලින් හමුවූ මැටියෙන් නිමවන කරන ලද සංඛයක් (වම) සහ මැටි බඳුනක වූ සංකේතාත්මක සංඛ රූපය (දකුණ). අභයගිරිය කෞතුකාගාරය. අනුරාධපුරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍රන්-ආරච්චි)

ජේතවනාරාම ස්ථූපයේ වාහල්කඩවල වූ ගල් කැටයම් අතර ලියවැල් මධ්‍යයේ සංඛ රූපයක් වේ (රූපය 599). එය බොහෝ දුරට හක් බෙල්ලෙකුගේ ස්වාභාවික ලක්ෂණ ඉස්මතු වන අයුරින් නිර්මාණය කිරීමට උත්සාහ දරා ඇත. සංකේතාත්මකව නෙළා ඇති සංඛයන් දෙකක් අනුරාධපුර පුරාවස්තූන් අතර වේ. මේ අතරින් අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ගල් පුවරුවක නෙළා ඇති අෂ්ට මංගල සලකුණු එකතුවෙහි සංකේතාත්මකව නෙළා ඇති සංඛය අපූරු නිර්මාණයකි. එහි යටි නාරටිය බොහෝ දිගු වන බැවින් එම නිර්මාණයට අපූරු පෙනුමක් ලැබී ඇත (රූපය 600).



රූපය 599. ජේතවනාරාම චෛත්‍යයේ වාහල්කඩක වූ සංඛ රූපය. ජේතවනාරාමය, අනුරාධපුරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 600. සංකේතාත්මක සංඛය. අනුරාධපුරය පුරාවිද්‍යා කෞතුකාගාරය (ඡායාරූපය සහ රූපසටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

බෙල්ලෙකුගේ ලාංඡනය හෙවත් සංඛය පැරණි ජනයා විසින් තම ජීවිතයට ඈඳාගත් බව මේ අනුව සනාථ වේ. අනුරාධපුරයෙහි වූ ඇතැම් ශ්‍රී පතුල් කැටයම්වල ද සංඛය වේ (රූපය 601). ජනප්‍රවාදයේ පැවත එන ධනයට අධිපති වූ කුවේරගේ ප්‍රධාන අතවැසියන් වූයේ සංඛ හා පද්ම යන දෙදෙනා ය. සංඛ සංකේතවත් වනුයේ ඔහුගේ ශීර්ෂයේ වූ සංඛයක සලකුණෙනි. සංඛ රූප අනුරාධපුරයේ පූජා නගරයේ ස්ථාන කිහිපයකදීම දැකිය හැකි ය. ඒ අතර අභයගිරි ස්තූපයට ඇතුළුවන ප්‍රධාන දොරටුව දෙපස ද, ඇතුල් නුවර පිහිටි විජයබා





රූපය 601. අෂ්ට මංගල සලකුණු සහිත ශ්‍රී පතුලක් (වම) සහ එහි ඇතුළත් සංඛය (දකුණ). ඉසුරුමුණි පර්වතය, අනුරාධපුරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 602. සංඛ රූපය, අනුරාධපුරය පූජා නගරය (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

මාළිගයේ දොරටුව දෙපස ද, ඊට අමතරව අභයගිරි පරිශ්‍රයේ තවත් ස්ථාන කිහිපයක ද සංඛ හා පද්ම රූප දැකිය හැකි ය (රූපය 602). අප මෙහිදී අවධානය යොමු කිරීමට උත්සාහ දැරුවේ පැරණි ජනයා පුද පූජා හා තම ජීවිතයේ විශේෂ අවස්ථාවලදී සත්ත්ව සංකේත යොදා ගැනීමේ පුරුද්ද අනුරාධපුර පුරාණ රාජධානි යුගයෙන් මනාව දැකගත හැකි බවය.

මකර රූප

මකර රූපයෙහි දක්වා ඇත්තේ හුදෙක්ම මනඃකල්පිත නිර්මාණයකි. එය සතුන් සමූහයකගේ ලක්ෂණ සංකලනයෙන් නිමවා ඇති බැව් ආනන්ද කුමාරස්වාමි විස්තර කොට ඇත (Coomaraswamy, 1979).



රූපය 603. මකර රූපය, අභයගිරි පරිශ්‍රය, අනුරාධපුරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 604. මකර රූපය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කෞතුකාගාරය, අනුරාධපුරය
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

හොම්බ අලියෙකුගේ හොඬවැලක් මෙන් කෙළවර වේ. නමුත් එය කෙටි ය. ශරීරය හා වල්ගය පක්ෂියෙකු වැනි ය. කුමාරස්වාමි දක්වන ආකාරයට රූපාවලියේ මකරා මෙසේ විස්තර කරයි. 'මකරා අලි හොඬයකින් ද, සිංහ පාදවලින් ද, ඌරු කන්වලින් හා මත්ස්‍යයාකාර ශරීරයකින් ද හෙබි ජලයේ ජීවත් වන සත්ත්වයෙකි. දත් ඉහළට නෙරා ඇත'---- ආදි ලක්ෂණ එහි විස්තර කෙරේ.

අභයගිරි පරිශ්‍රයට අයත් කොරවක් ගලෙහි වූ මකර රූපය අනුරාධපුරයේ වූ මකර රූප අතර බොහෝ සියුම් නිර්මාණයක් ලෙස හඳුන්වාදිය හැකි ය. එහි යටි ඇන්දේ දත් වකුව ඉහළට ද, උඩු ඇන්දේ දත් වක්‍ර ලෙස පහත දෙසට ද පිහිටයි. උඩු ඇන්දෙහි වූ දළ ඉහළට හා පසුපසට වක්‍ර ව නෙළා ඇත. උඩු ඇහිබැම රැළි සහිත ය. හොඬය හොම්බ මත වකුටු වී ඇත. එක් පා යුගළක් දරයි. එහි පාදය බොහෝ දුරට සිංහයෙකුගේ පාදයට සමාන ය. සමස්ත ශරීරයෙහි සියුම් කැටයම් ගණනාවකි. වල්ගය වකුටු වී ඇත. මුඛයෙන් විහිදෙන කැටයම් රාශියකි (රූපය 603).

අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයෙහි තැන්පත් කොට ඇති අභය වැව අසලින් හමුවූ කොරවක් ගලෙහි ද සියුම් හා විස්තරාත්මක මකර රූපයක් නෙළා ඇත. එය ඉහත විස්තර කළ මකර රුවට අතිශයින්ම සමාන වේ. මෙහි වූ වල්ගය ඉතා කෙටි වන අතර එය පක්ෂියෙකුගේ මෙන් විහිදී ඇත. මෙම මකර රුවෙහි ඇස අභයගිරිය පරිශ්‍රයේ වූ මකර රූපයේ මෙන් පැහැදිලි නැති අතර ඇසෙහි

මධ්‍යයේ වූ වටකුරු කොටස දක්වා නොමැත (රූපය 604). මකර රුව අනුරාධපුරයෙහි කොරවක් ගල් අතර මෙන්ම මුරගල්වල ද නෙළා ඇත. සත්ත්ව සමූහයකගේ ලක්ෂණවලින් සංකලනය වුණු මෙය පුරාණ ජනයාගේ අපූර්වතම නිර්මාණයක් ලෙස සඳහන් කරන්නට කැමැත්තෙමු.

ජේතවනාරාමයෙන් හමුවූ පුරුෂ ලිංගය


ජේතවනාරාම පරිශ්‍රයේ පැරණි සංඝාරාම ගොඩනැගිලි සංකීර්ණයෙහි දොරටුවක් අසල සිදුකළ කැණීමකින් හමුවූ සත්ත්ව අස්ථියකින් කැටයම් කරන ලද පුරුෂ ලිංගය විචාරශීලී නිර්මාණයකි. එය මෙම කෘතියේ ප්‍රථම කර්තෘ විසින් වසර 2008 දී ජේතවනාරාම පරිශ්‍රයෙන් ලද සත්ත්ව අස්ථි හඳුනාගැනීමේ මූලික පර්යේෂණ කටයුතුවලදී හඳුනා ගන්නා ලද්දකි. අනෙකුත් සත්ත්ව අස්ථි අවශේෂ අතර තිබී හමුවූ මෙය වර්ණයෙන් තද දුඹුරු හෝ කළු පැහැයට හුරු අඳුරු පැහැයක් ගනියි. සමුද්‍රයේ වසන මුහුදු ඌරාගේ (*Dugon dugong*) පර්ශු අස්ථියකින් නිර්මාණය කොට ඇති මෙම පුරුෂ ලිඟුව, සත්ත්ව අවශේෂයක් උපයෝගී කොට ගෙන සකස් කරන ලද ශ්‍රී ලංකාවෙන් හමුවූ ප්‍රථම ලිංග කැටයම වේ (රූපය 605).



රූපය 605. ජේතවනාරාම පරිශ්‍රයේ කැණීම් මඟින් හමුවූ මුහුදු ඌරෙකුගේ පර්ශුවකින් කැටයම් කළ පුරුෂ ලිඟුව (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

හින්දූන් වැඳුම් පිදුම් කරන ශිව ලිංගය මෙන් සංකේතාත්මකව පමණක් නොව එය බොහෝ දුරට ස්වාභාවික ලිඟුවක් ආකාරයට නෙළා තිබීම මෙහිලා විශේෂයෙන්ම සඳහන් කළ යුතු කරුණකි. හමුවූ කොටස මිලිමීටර් 104.4 ක් දිගින් යුක්ත ය. එසේම එය කෙළවරින් කැඩී ගොස් ඇති බව පැහැදිලි ය. එහි ශිෂ්ණ මුණ්ඩය පෘෂ්ඨීයව මිලිමීටර් 26.2 ක් දිගින් ද, මිලිමීටර් 21.9 ක් පළලින් ද යුක්ත ය. ශිෂ්ණයේ බඳ පෙදෙස පෘෂ්ඨීයව මිලිමීටර් 15.4 ක් පළලින් ද, මිලිමීටර් 16.5 ක් උසින් ද වේ. ශිෂ්ණ මුණ්ඩය ඕවලාකාර වන අතර එහි මුත්‍ර විවරය දක්වා නොමැත. තවද මුණ්ඩය ආවරණය කරන චර්මය ද දක්වා නොමැත. සමස්ත ලිඟුව පෘෂ්ඨීයවත් පාර්ශ්විකවත් බොහෝ දුරට සෘජු ස්වභාවයක් දරයි. ලිඟුවේ බඳ පෙදෙස සුපරීක්ෂාකාරීව බැලූ කල එහි හරස් අතට සියුම් ආයුධයකින් කරන ලද නිර්මාණ සලකුණු දැකිය හැකි ය. සමස්ත නිර්මාණයම ස්වාභාවික තත්ත්වයන්ට බොහෝ දුරට සමීප කිරීම සඳහා නිර්මාණකරු බෙහෙවින් දක්ෂ වී ඇත (රූපය 606).

මෙහි ඇති ශාරීරික ලක්ෂණ සියුම් ලෙස නෙළා තිබීමෙන් එය වන්දනාමාන කිරීම සඳහා පමණක් යොදාගත් වස්තුවක් ද යන්න සැක සහිත ය. එසේම එය කාන්තාවන් විසින් ස්වයං වින්දනය ලැබීම සඳහා භාවිත කරන කෘත්‍රිම පුරුෂ ලිඟුවකට (Phallus) අතිශයින්ම සමාන ය. කෙසේ වුවද මෙවැනි වස්තුවක් ජේතවනාරාමය වැනි බෞද්ධ භික්ෂූන් වැඩසිටි පරිශ්‍රයේ තිබී හමුවීම පුරාවිද්‍යාඥයින්ගේ විශේෂ අවධානයට යොමුවිය යුතු කරුණකි. මෙය කාලනීර්ණය කිරීමත්, නිවැරදි ලෙස ඒ හා බැඳි සන්දර්භය




රූපය 606. පුරුෂ ලිඟුව (ඉහළ පාර්ශ්වික පෙනුම, මැද පෘෂ්ඨීය පෙනුම හා පහළ උදරීය පෙනුම) (පරිමාණය මි.මී. 10 කි) (රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

පිළිබඳ සොයාබැලීමත් තුළින් එම පැරණි ජන සමාජය මේ ආකාර ලිංගික වස්තුවක් කෙරෙහි දැක්වූ සබඳතාවය කුමක්ද? යන්න සාකච්ඡා කිරීම බොහෝ සිත්ගන්නාසුලු පර්යේෂණයක් විය හැකි ය.


ජේතවනාරාම ස්ථූපයෙන් ලද සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා

ශ්‍රී ලංකාවේ පැරැන්නන් විසින් පළඳනා ලෙස හෝ පූජා වස්තූන් ලෙස සත්ත්ව දත්, මත්ස්‍ය කශේරුකා, මුහුදු බෙල්ලන් හෝ මිරිදිය බෙල්ලන්ගෙන් නිර්මාණය කරන ලද පබළු හෝ පළඳනා අනුරාධපුර පුරාජෛවවිවිධත්වය අලෙළා සම්පාදිත මෙම ග්‍රන්ථයට ඇතුළත් කිරීම බොහෝ අගනේ යැයි සිතමු. ප්‍රාග් ඓතිහාසික සංදර්භවලින් නොවුවද ජේතවනාරාම ස්ථූපයේ සලපතළ මළුවේ ආයක අසල කළ කැණීම් මඟින් ලද සත්ත්ව දත් හා කශේරුකාවලින් නිර්මිත පළඳනා හෝ පබළු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මේ පරිච්ඡේදයෙන් ඉදිරිපත් කළ යුතුව ඇත්තේ ඒවා ඒ තරමටම විශේෂිත නිර්මාණ වන නිසා ය. මෙම පරිච්ඡේදයෙන් ජේතවනාරාම ස්ථූප කැණීමෙන් ලද සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා හා සමාන කළ හැකි බෙල්ලන්ගෙන් නිර්මිත පබළු අභයගිරි පරිශ්‍රයේ සිදුකරන ලද කැණීම්වලින් ද හමුවී ඇත. එහි සංක්ෂිප්ත විස්තරයක් මෙම පරිච්ඡේදයේ අවසාන කොටසින් විස්තර කෙරේ. මෙහි ප්‍රථම කර්තෘට වසර 2008 සිට 2010 දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ජේතවනාරාම ව්‍යාපෘතිය මඟින් කළ කැණීම් වලින් ලද සත්ත්ව අවශේෂ පරීක්ෂා කිරීමට අවස්ථාව ලැබුණි (මනමේන්ද්‍ර-ආරච්චි, 2009). මෙහිදී දන්ත මූලයේ සිදුරක් විද සකස් කරන ලද පළඳනා මෙන්ම දන්ත මූලය සියුම්ව කපා සකස් කරන ලද කොටි හෙවත් දිවි (*Panthera pardus*) දතක් ද හමුවිය (රූපය 607). මේ දත් මෙන්ම මධ්‍යයේ සිදුරු විද සකස් කරගත් මෝර කශේරුකා ද හමුවූ අතර ඒවා බොහෝ විට පළඳනා ලෙස භාවිත කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය (රූපය 608). මෙලෙස සකස් කරන ලද මෝර කශේරුකා හා දත් සංඛ්‍යාව 51 කි. එම දත් සංඛ්‍යාවේ සත්ත්ව විශේෂවල නියෝජනය පහත අයුරු වේ. එනම් කිඹුල් (*Crocodilus sp.*) දත් 10, මුහුදු ක්ෂීරපායී (ඩොල්ෆින් හෝ තල්මස්) දත් 01, මුගටි හෝ හෝතඹු (*Herpestes spp.*) දත් 6, සුනඛ (*Canis familiaris*) දත් 10, හඳුන් දිවි (*Prionailurus viverrinus*) දත් 2, වලස් (*Melursus ursinus*)



රූපය 607. දන්ත මූලය කපා සකස් කරන ලද කොටි හෙවත් දිවි (*Panthera pardus*) දත. ජේතවනාරාම පරිශ්‍රය, අනුරාධපුරය (පරිමාණය මි.මී. 10 කි)
(රූප සටහන: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

රූපය 608. මධ්‍යයේ සිදුරු විද සකස් කරගත් මෝර කශේරුකාවක්, ජේතවනාරාම පරිශ්‍රය, අනුරාධපුරය (පරිමාණය මි.මී. 10 කි)
(ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 609. සිදුරු විද සකස් කරන ලද සුනඛ දත්. අවසාන රූපය හැරුණු විට ඉතිරි දත් සියල්ලෙහිම සිදුර විද ඇත්තේ දන්ත මූලයේ ය. අවසාන දතෙහි සිදුර දන්ත මස්තකයෙහි විද ඇත. ජේතවනාරාම පරිශ්‍රය, අනුරාධපුරය (පරිමාණය මි.මී. 10 කි, රූපසටහන්හි මැද දක්වා ඇත්තේ හරස්කඩ රූප වේ) (ඡායාරූපය සහ රූප සටහන්: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)



රූපය 610. සිදුරු විද සකස් කරන ලද කිඹුල් (*Crocodilus* sp.) දත්. (දන්වල පිටත පෙනුම, පැති පෙනුම හා ඇතුළත පෙනුම දක්වා ඇත) ජේතවනාරාම පරිශ්‍රය, අනුරාධපුරය (පරිමාණය මි.මී. 10 කි, (ඡායාරූපය සහ රූප සටහන්: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

දත් 1, කොටි දත් 3, ඉත්තෑ (*Hystrix indica*) දත් 1, මෝර කශේරුකා 10 හා සිදුරු විදින ලද, එනමුත් හඳුනාගැනීමට අපහසු දත් කැබලි 7 ක් ලෙස දැක්විය හැකි ය. සුනඛයා පැරණි ජන සමාජය විසින් අවමන් හා පිළිකුල් සහගත සතෙකු ලෙස සැලකුව ද (Coomaraswamy, 1979) සුනඛ දත් ද මේ සඳහා භාවිතා කිරීම තුළ මෙම නිර්මාණයන් විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් කළ යුතු සමාජ විද්‍යාත්මක කරුණු කාරණා ඇතිවාට සැකයක් නැත (රූපය 609). මුගටියා හෝ හෝතඹුවා, සුනඛයා, හඳුන් දිවියා, වලහා හා කොටියා සත්ත්ව වර්ගීකරණය තුළ මස් බුදින්නන් ය (carnivora). ඉහත සත්ත්ව විශේෂ අතරින් කිඹුල් දත් සිදුරු කර සකස් කරන ලද පළඳනා හමු වූ ප්‍රථම අවස්ථාව මෙය වේ (Manamendra-Arachchi *et al.*, 2013) (රූපය 610). මෙහි වූ විශේෂත්වය වනුයේ මේ සත්ත්ව අවශේෂවලින් තැනූ නිර්මාණ ජේතවනාරාම ස්ථූප සලපතළ මළුවේ ආයක අසලින් හමුවීම ය. මේ නිර්මාණ 51 අතරින් නැගෙනහිර ආයකය අසලින් හමුවූ මෝර කශේරුකා 7 හැරුණු විට ඉතිරි සියල්ල හමුවී ඇත්තේ උතුරු ආයකය අසලිනි. මෙය තවදුරටත් අධ්‍යයනය කළ යුතුව ඇති ඉතා වැදගත් සංසිද්ධියක් වන අතර මේවා එම ආයක අසල තැන්පත් කරන්නට (හෝ තැන්පත් වන්නට) පුරාණ චාරිත්‍රයක්, ඇදහිල්ලක්, යම් විශ්වාසයක් හෝ ඒ හා සමාන පූජා විධියක ප්‍රතිඵලයක් හේතුවන්නට බොහෝ සේ ඉඩ ඇත. මෙම නිර්මාණයන්ගේ කාල වකවානු පිළිබඳව අපට අදහසක් නොවූවද මේ පිළිබඳ යම් අර්ථකථනයක් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදුකොට ඇති ප්‍රාග් ඓතිහාසික කැණීම් මගින් මේ ආකාරයට සිදුරු විද සකස් කරන ලද ක්ෂීරපායී දත් මෙතෙක් හමුවී නොමැත (පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න විසින් 1998 දී සම්පාදිත තම දර්ශනශූරී නිබන්ධයෙහි අනුරාධපුර ඇතුල් නුවර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් කළ කැණීම්වලින් ලද සිදුරු විද සකස් කොට ඇති ක්ෂීරපායී සත්ත්වයෙකුගේ දතක ඡායාරූපයක් අන්තර්ගත කොට ඇත [Chandrarathne, 1998]).

ප්‍රංශයේ Combe Sauniere හි කැණීම් මගින් ඉහත ආකාරයේ සිදුරු විදින ලද සත්ත්ව දත් හමුවී ඇති අතර ඒවා මධ්‍ය පැලියොලිතික (middle Paleolithic) යුගය දක්වා දිවේ. ඒවා අදින් වසර 1,00,000 - 60,000 දක්වා කාලනිර්ණය වී ඇත (Castel *et al.*, 2002). හංගේරියාවේ කළ කැණීම් මඟින් ලද ප්‍රතිඵල අපගේ මෙම දත් පිළිබඳ සාකච්ඡාව තවත් දෙසකට යොමු කෙරේ. එහිදී ක්‍රි.පූ. 5,000 ට අයත් නව ශිලා (Neolithic) යුගයේ සුසාන 120 කින් සමන්විත භූමියක පිහිටි සුසාන 9 ක් කැණීමට ලක් කරන ලදුව එහි තිබී මුවන්ගේ

උඩු හනුවේ රදනක දත්වලින් නිර්මිත පළඳනා හමුවී ඇත. රතු මුවාට (*Cervus elaphus*) අයත් මෙම දත් නව ශිලා යුගයේ අවමංගල්‍ය චාරිත්‍ර වෙනුවෙන් භාවිත කළ බව පැහැදිලි ය (Chilardi *et al*., 2002). ජේතවනාරාම ස්ථූපයේ ආයක අසලින් හමුවූ දත් ද මේ ආකාරයේ යම් පූජා විධියක් වෙනුවෙන් යොදා ගන්නට ඇතැයි අනුමාන කිරීම බොහෝ සාධාරණ ය. මේ දත්වල වූ සිදුරු පරීක්ෂා කිරීමේදී ඒවා ඉතා සූක්ෂමව විද ඇති බව නිරීක්ෂණය කළ හැකි ය. බොහෝ දත්වල සිදුරු විද ඇත්තේ දන්ත මූලයේ වන අතර දන්ත මස්තකයට වඩා දන්ත මූලයේ සිදුරු විදීම පහසු නිසා එසේ කරන්නට ඇත. නමුත් දන්ත මස්තකයේ සිදුරු විදින ලද අවස්ථාද කිහිපයක් වේ. සිදුර විදීමේදී දතේ සනකමින් අඩුම ස්ථානය තෝරා ගැනීමට විදුම්කරු උත්සුක වී ඇත. නමුත් කිඹුල් දත් සිදුරුකොට ඇත්තේ දන්ත මූලයේ වඩාත්ම පුළුල් ස්ථානයෙනි. මේ දත්වල සිදුර අන්වීක්ෂීයව පරීක්ෂා කළ විට ඒවා ප්‍රාග් ඓතිහාසික බෙලිකටු, පබළු හා මෝර දත් පළඳනාවලට බොහෝ සේ සමාන බැව් සඳහන් කළ යුතුව ඇත. නමුත් ජේතවනාරාම ස්ථූපයෙන් ලද දත්වල පුරාවිද්‍යාත්මක කාලනීර්ණයන් නොමැති බැවින් එම දත්වල සිදුරු විදීම සඳහා කුමන ආකාරයක ක්‍රමවේදයක් භාවිත කරන්නට ඇත්දැයි අනුමාන කළ නොහැකි ය. මෙම දත් ප්‍රොටෝඓතිහාසික හෝ මූලඓතිහාසික යුගයේ නිර්මාණයන් නම් බොහෝ විට ලෝහ තුඩු භාවිත කොට එම සිදුරු විදින්නට ඇත.

ඉහත ඡේදයක දැක්වූ ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පළඳනාවක වූ සිදුර අන්වීක්ෂීයව නිරීක්ෂණය කිරීමේදී පෙනී යන්නේ එය එක් පසකින් අර්ධයක් ද, ඉතිරි අර්ධය ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් ද විද ඇති බවයි. එම නිසා සිදුර දෙපස වූ විවර විශ්කම්භයෙන් වැඩි අතර සිදුරෙහි මැද වූ විශ්කම්භය කුඩා වේ. ජේතවනාරාමයෙන් හමු වූ රදනක දත්වල සිදුර ද ඉහත ප්‍රාග් ඓතිහාසික විදුම්වලට බොහෝ සෙයින් සමාන වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සංදර්භ අතර සිදුරු විද සකස් කරන ලද ක්ෂීරපායී දත් මෙතෙක් හමුවී නැත. නමුත් ලොව අන් කලාපවල සංස්කෘතික සංදර්භ (විශේෂයෙන් නව ශිලා යුගයේ) අතරින් හමුවන දත්වලින් කළ පළඳනාවලට සමාන නිර්මාණ ජේතවනාරාම ආයක අසලින් හමුවන්නේ කෙසේද යන්න සෙවීමට අපගේ පර්යේෂණ තවදුරටත් පුළුල්කළ යුතුව ඇත. නිර්මාණකරුවා කුමන කරුණක් උදෙසා මේ ආභරණ සකස් කළේද යන්න සොයා බැලීම අතිශයින්ම වැදගත් වේ. කොටි, සමුද්‍ර ක්ෂීරපායී හා කිඹුල් දත් හැරුණු විට ඉතිරි සත්ත්ව විශේෂ සියල්ලම පාහේ පරිසරයේ ඉතා සුලබ ක්ෂීරපායීන් වේ. මේ ආකාරයේ සුලභ සතුන්ගේ රදනක දත්වලින් නිර්මිත පළඳනා සකස් කළේ කුමන හේතුවකටද?



රූපය 611. මුහුදු බෙල්ලන්ගෙන් නිර්මිත පබළු, අභයගිරි පරිශ්‍රය, අනුරාධපුරය (පරිමාණය මි.මී. 10 කි)
(ඡායාරූප: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)

එමෙන්ම බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස සැලකෙන ජේතවනාරාමය වෙනුවෙන් සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා උපයෝගී කරගනිමින් සිදුකළ පුදපූජාව කුමක්ද? මෙම කාරණා ගවේෂණය කිරීමේ අවශ්‍යතාවය මේ සමඟම මතුවන බව සඳහන් කිරීමට කැමැත්තෙමු (මනමේන්ද්‍ර-ආරච්චි, 2009; මනමේන්ද්‍ර-ආරච්චි සහ අදිකාරි, 2012; Manamendra-Arachchi *et al*., 2013; Manamendra-Arachchi *et al*., 2013).



රූපය 612. මිරිදිය දෙපියන් බෙල්ලන්ගෙන් නිර්මිත පබළු, අභයගිරි පරිශ්‍රය, අනුරාධපුරය (පරිමාණය මි.මී. 10 කි) (ඡායාරූපය: කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි)


අභයගිරිය පරිශ්‍රයේ කරන ලද කැණීම් මඟින් ලැබුණු සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා පිළිබඳ විස්තරයක් මෙහි පළ නොකිරීම අඩු පාඩුවක් සේ හැඟේ. එම කැණීම්වලින් ලද පළඳනා අප විසින් පරීක්ෂා කරන ලදුව මුහුදු බෙල්ලන්ගෙන් නිර්මිත පබළු (රූපය 611) හා මිරිදිය දෙපියන් බෙල්ලන්ගෙන් (රූපය 612) නිර්මිත පබළු හඳුනා ගැනීමට හැකි විය. මුහුදේ වසන හක් බෙල්ලන් සහ ප්‍රමාණයෙන් ඉතා විශාල දෙපියන් බෙල්ලන් මෙම පබළු තැනීම සඳහා භාවිත කරන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. මක් නිසාද යත් ඒවා බොහෝ ගණකමින් යුක්ත බැවිනි. මිරිදිය දෙපියන් බෙල්ලන් මඟින් නිර්මාණය කළ පබළුවල, සිදුර විදීමේදී ඉතාමත් සියුම් තාක්ෂණයක් භාවිත කොට ඇත. තවද එම නිර්මාණ අභයගිරි කෞතුකාගාරයේ ප්‍රදර්ශණය කෙරේ.

ජේතවනාරාම පරිශ්‍රයේ හා අභයගිරි පරිශ්‍රයේ කැණීම්වලින් ලද සත්ත්ව අවශේෂවලින් නිර්මිත පළඳනා අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව සලසා දුන් මහාචාර්ය සුදර්ශන් සෙනෙවිරත්න, මහාචාර්ය ටී.ජී. කුලතුංග, ජේතවනාරාම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ ආචාර්ය පියතිස්ස සේනානායක සහ ආචාර්ය තුසිත මෙන්දිස් ට බෙහෙවින් ස්තුතිවන්ත වෙමු.

අනුරාධපුරයේ ගුහා චිත්‍ර


ගුහා චිත්‍ර (rock art) සහිත ගල් ගුහා හා ගල් පියැසි කිහිපයක් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇත. කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය බී.ඩී. නන්දදේව විසින් 1986 දී ශ්‍රී ලංකාවේ ගුහා චිත්‍ර ඇති ස්ථාන ඇතුළත් ශාස්ත්‍රීය ලිපියක් ප්‍රකාශයට පත් කරමින් එහි අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පහත දැක්වෙන ගුහාවල චිත්‍ර ඇති බව දක්වයි. එනම් ආඬියාගල, බිල්ලෑව (රූපය 459) නමින් වූ ස්ථාන දෙකත්, කෝමාරිකා ගුහාව හා තන්තිරිමලේ ගල් ගුහාව (රූපය 458) යි. මෙම ගුහා චිත්‍ර පිළිබඳ ජෝන් ස්ටිල් (John Still), එච්.සී.පී. බෙල්, ජී.එෆ්.ආර්. බ්‍රවුනිං (G.F.R. Browning), සී.ජී. සෙලිග්මාන් හා බී.ඉසෙඩ්. සෙලිග්මාන්, ෆ්‍රෙඩ්රික් ලුයිස් (Frederick Lewis), පී.ඊ.පී. දැරණියගල, එල්.ඒ. ආදිත්‍යය, ඩබ්.එස්. කරුණාරත්න, ධර්මසිරි ස්ථවිර, ඒ.ටී. රඹුක්වෙල, එස්.ජේ.කදිරගාමර්, සී.ඊ. ගොඩකුඹුර, ජී. ගාමිණී පුංචිහේවා යන පුරාවිද්‍යාඥයින්, සිවිල් නිලධාරීන් හා ගවේෂකයින් විසින් වරින් වර නොයෙක් ලිපි හා වාර්තා පළ කොට ඇත (Nandadeva, 1986). මීට අමතරව 2012 දී මහාචාර්ය රාජ් සෝමදේව විසින් ශ්‍රී ලංකාවේ ගුහා චිත්‍ර සහ සූරා අදින ලද රූප පිළිබඳ ග්‍රන්ථයක් සම්පාදනය කරන ලදී (Somadeva, 2012).

මෙම ගුහා චිත්‍රවල කාලනීර්ණයන් පිළිබඳ ඇත්තේ බොහෝ අවිනිශ්චිත තොරතුරු ය. එසේ වුවද මේ චිත්‍ර බොහෝ ප්‍රමාණයක් පිහිටා ඇත්තේ කටාරම් කොටන ලද ගල් ගුහාවල නිසා ඒවා ඓතිහාසික යුගයට අයත් විය හැකි බැව් අනුමාන කෙරේ. වියළි කලාපීය ගුහා බොහෝමයක් කටාරම් කොටා පිළිසකර කර සංඝයාට පූජා කොට ඇති නිසා මෙම චිත්‍ර ඊට පසු කාලයට අයත් යැයි විශ්වාස කරනු ලැබේ. අම්පාර දිස්ත්‍රික්කයේ, සීතල වන්නි පෙදෙසේ පිහිල්ලගොඩ ගල්ගේ චිත්‍ර පිළිබඳ අදහස් ඉදිරිපත් කොට ඇති සෙලිග්මාන් යුවළ දක්වනුයේ එම චිත්‍ර වැදි කාන්තාවන් විසින් අඳින ලද බවයි. තමුන්ගේ ස්වාමිපුරුෂයින් දඩයමේ ගොස් නැවත පැමිණෙන තුරු පාළුව මකා ගැනීම සඳහා මෙම චිත්‍ර අඳින ලද බැව් වැදි කාන්තාවන් සෙලිග්මාන් යුවළට ප්‍රකාශ කොට ඇත. එමෙන්ම මෙම චිත්‍ර අළු සහ කෙළ මිශ්‍ර කොට දබරැගිල්ලෙන් අඳින බැව් ඔවුන් නිරීක්ෂණය කොට ඇත (Seligman & Seligman, 1911). තන්තිරිමලේ වැද්දන් ජෝන් ස්ටීල්ට පවසා ඇත්තේ එම චිත්‍ර තමුන්ගේ මුතුන්මිත්තන් විසින් අඳින ලද බවයි (Still, 1910). ආචාර්ය සිරාන් දැරණියගල 1992 දී ප්‍රකාශ කොට ඇත්තේ මෙම ගුහා චිත්‍රවල කාලනීර්ණය නිසියාකාර ලෙස ප්‍රකාශ කළ නොහැකි අතර ඇතැම් විට ඒවා පශ්චාත් අනුරාධපුර යුගයට අයත් වන්නට ඉඩ ඇති බවයි (Deraniyagala, 1992).




රූපය 613. ආඬියාගල ගුහා චිත්‍ර
(Still, 1910 සහ Nandadeva, 1986 ඇසුරෙන් අඳින ලදී)

මෙම චිත්‍ර ඇඳීම සඳහා වර්ණාංශු තනාගැනීමට භාවිත කළ ද්‍රව්‍යයන් අතර අළු, කෙයොලින්, කහඳ සහ හුණු යොදාගෙන ඇති බැව් හඳුනාගෙන ඇත (Nandadeva, 1986). මෙම චිත්‍රවල වූ මානව හා සත්ත්ව රූප හඳුනාගැනීමට කිහිප පලක්ම උත්සාහ දරා ඇති අතර විශේෂයෙන්ම සත්ත්ව රූප හඳුනාගැනීමට දරා ඇති උත්සාහය පිළිබඳ සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. 'දළ ඇතුන්, අලින්, අලි පැටවුන්, ඇතින්නන්, දිවියන්, සිංහයින්, ගවයින්, කිඹුලන්, පත්තෑයින්, මුවන්, ගෝනුන්, වඳුරන් හා මොනරුන්' මෙම රූපවල ඇති බව සඳහන් ය (Still, 1910; Nandadeva, 1986;



රූපය 614. බිල්ලෑව ගුහා චිත්‍ර
(Still, 1910 සහ Nandadeva, 1986 ඇසුරෙන් අඳින ලදී)

Somadeva, 2010). මෙම ග්‍රන්ථයේ ප්‍රථම කර්තෘ විසින් මේ ගුහා චිත්‍රවල වූ 'හඳුනාගෙන ඇති සත්ත්ව විශේෂ' නැවත පරීක්ෂා කරන ලදුව ඒ ඇතැම් රූප මඟින් නිරූපණය වන්නේ එම සත්ත්ව විශේෂයමද යන්න සැක සහිත ය. ආඬියාගල චිත්‍ර අතර වූ දිගු සිරස් රේඛාවක් හා කෙටි තිරස් රේඛා දෙකක් මඟින් දක්වා ඇති රූපය තලගොයෙකුගේ ('Iguana'?) ලෙස හඳුනාගෙන ඇතත් එය තලගොයෙකුගේ යැයි අනුමාන වශයෙන් හෝ සඳහන් කිරීමට තරම් රූපීය ලක්ෂණ හඳුනාගැනීම අපහසුය (රූපය 613).



රූපය 615 තන්තිරිමලේ ගුහා චිත්‍ර (Still, 1910 සහ Nandadeva, 1986 ඇසුරෙන් අඳින ලදී)

එමෙන්ම බිල්ලෑවේ චිත්‍ර අතර වූ මොල්ලියක් හා කෙටි ගාත්‍ර ඇති සත්තව රූපය (රූපය 614) ගෝනෙකුගේ ලෙස හඳුනාගෙන තිබුණද එය ගවයෙකුගේ යැයි සඳහන් කිරීම වඩාත් උචිත යැයි හැඟේ (Nandadeva, 1986).

තන්තිරිමලේ ගුහා චිත්‍ර ඇති ගල් ගුහාව පිහිටා ඇත්තේ අනුරාධපුර යුගයට අයත් තවත් නටබුන් රැසක් ආශ්‍රිතව ය (රූපය 615). 2004 වසරේ සිට මෙම ස්ථානයේ ගුහා චිත්‍ර පිළිබඳ අප විසින් අධ්‍යයනය කරනු ලබන අතර 2012 වන විට බොහෝ චිත්‍ර මැකී ගොස් ඇත.

පරිශීලනය කළ ශාස්ත්‍රීය ලිපි හා ග්‍රන්ථ නාමාවලිය

Abeyratne, M. 1996. *Multi-dating studies of archaeological sites*. Canberra: Australian National University. Unpublished Ph.D. Thesis.

Adikari, G. 1998. *Aspect of the Prehistory of the Sigiriya-Dambulla region*. Unpub. thesis submitted for the degree of Master of Philosophy (M. Phil.) PGIAR, University of Kelaniya: 443.

Adikari, G. 1994(a). Approaches to the Prehistory of the Sigiriya-Dambulla region. *Further studies in the settlement archaeology of the Sigiriya-Dambulla region* (eds: Bandaranayake, S. and M. Morgen), 45-51.

Adikari, G. 1994(b). Excavations at the Sigiriya-Potana cave complex: a preliminary account. *Further studies in the settlement archaeology of the Sigiriya-Dambulla region* (eds: Bandaranayake, S. and M. Morgen), 65-67.

Adikari, G. & A. Thantilage. 2007. The new chronology for Sri Lanka: the identification of new culturalphase "Postmesolithic". *Archaeologia*, 3: 23-30.

Adikari, G., N. De Silva, A. Thantilage, P. Vidanapathirana & W.S. Weliange. 2009. Fashions, jewelleries and rituals of Alavala prehistoric man. *Hunting for hunter-gatherers at Alavala cave, Symposium on new discoveries from the excavation at Alavala, 3 rd Nov. 2009, abstracts* (editor in-chief De Silva, N), Postgraduate institute of archaeology, university of Kelaniya, 25.

අදිකාරි. ජී. සහ කේ. මනමේන්ද්‍ර-ආරච්චි. 2012. ප්‍රාග් ඓතිහාසික අලවල පොත්ගුල් ලෙන. *ආචාර්ය සී.ඊ.සී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වූ පුරාප්‍රෙවව්විධත්ව සමුළුව. 2012. පර්යේෂණ ලිපි සහ තොරතුරු පත්‍රිකා එකතුව.* ප්‍රෙවව්විධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුලද, සංස්කෘතික අමාත්‍යාංශය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය: 140-213.

අමරසිංහ, මා. 2005. *නාග සංකල්පය හා සිංහල සංස්කෘතිය*. සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා-ඇල. 152.

අඹන්වල, සී.බී. 2005/2006. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ හා සිරාන් දැරණියගල. *වැලිපිළ පුරාවිද්‍යා සඟරාව*, හත්වැනි කලාපය (සංස්කරණය: මැන්දිස්. ඩී.ටී. සහ සී.බී. අඹන්වල), මධ්‍යම සංස්කෘතික අරමුදල, 11-27.

Amarasinghe, A.A.T., D.M.S.S. Karunarathna, J. Hallermann, J. Fujinuma, H. Grillitsch & P.D. Campbell. 2014(a). A new species of the genus Calotes (Squamata: Agamidae) from high elevations of the Knuckles Massif of Sri Lanka. *Zootaxa*, 3785(1): 59–78.

Amarasinghe, A.A.T., D.M.S.S. Karunarathna & J. Fujinuma. 2014(b). A new Calotes species from Sri Lanka with a redescription of Calotes liolepis Boulenger, 1885. *Herpetologica*, 70(3): 323–338.

Ashton, M.S., S. Gunatilleke, N. De Zoysa, M.D. Dassanayake, N. Gunatilleke, and S. Wijesundera. 1997. *A field guide to the common trees and shrubs of Sri Lanka*. Wildlife Heritage Trust Publication (Pvt.) Limited, Sri Lanka, 430.

Bahir, M.M. & A. Silva. 2005. Otocryptis nigristigma, a new species of agamid lizard from Sri Lanka. In: Yeo, D.C.J., K.L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. 12: 235-241.

Bahir, M.M. & K.P. Maduwage. 2005. Calotes desilvai, a new agamid lizard from Morningside Forest, Sri Lanka. In: Yeo, D.C.J., K.L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. 12: 381-392.

Batuwita, S. & M.M. Bahir. 2005. Description of five new species of Cyrtodactylus (Reptilia: Gekkonidae) from Sri Lanka. In: Yeo, D. C. J., K. L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. 12: 351-380.

Bates, P.J.J. & D.L. Harrison. 1997. Bats of the Indian Subcontinent. Harrison Zoological Museum, London, 258.

Begley, V., J.R. Lukacs & K.A.R. Kennedy. 1981. Excavations of iron age burials at Pomparippu, 1970. *Ancient Ceylon*, Journal of the Archaeological Survey Department of Sri Lanka, no 4: 49-132 (with 5 plates).

Bell, H.C.P. 1897. Archaeological Survey of Ceylon, North-Central, Central, and Eastern Provinces. *Annual Report*, XLII (1904): 1-15 (plates VI-VII).

Biodiversity baseline survey: Ritigala Strict Nature Reserve, 2008.

Bossuyt, F., M. Meegaskumbura, N. Baenerts, D.J. Gower, R, Pethiyagoda, K. Roelants, A. Mannaert, M. Wilkinson, M.M. Bahir, K. Manamendra-Arachchi, P.K.L. Ng, C.J. Schneider, O. van Oomen & M.C. Milinkovitch. 2004. Local endemism within the Western Ghats-Sri Lanka Biodiversity Hotspot. *Science*, 306: 479-481.

Brohier, R.L. 1979 (reprint). *Ancient irrigation works in Ceylon (part I, II and III)*. Printed at the Ceylon Government Press, Colombo: viii+37 pp., pls. 7; iv+43 pp., pls. 15; viii+77 pp., pls. 20.

Bulbeck, D. 2007. A parsimonious model for Homo sapiens colonization of the Indian ocean rim and Sahul. *Current Anthropology*, 48(2): 315-322.

Cameron, D.W. and C.P. Groves. 2004. *Bones, stones and molecules "out of Africa" and Human origins*. Elsevier academic press, xii–402.

Carroll, R.T. 1988. *Vertebrate Paleontology and Evolution*. W.H. Freeman and Company, New York, xiv+698.

Chandraratne, R.M.M. 1997. *Some reptiles bones from the Gedige excavation in 1985, the citadel of Anuradhapura. Sri Lanka.* Lyriocephalus, Amphibia and reptiles research organization of Sri Lanka, 3(2): 7-15.

Chandraratne, R.M.M. 1998. *A study of subsistence pattern based on faunal remains from the Citadel of Anuradhapura. Sri Lanka (circa 900BC- 700AD).* A Thesis for degree of Doctor of Philosophy in Archaeology, Unaversity of Poona.

Chandraratne, R.M.M. 2007. Identification of Mule (Equus hemionus) as Asvataraya in Ancient Sri Lanka by unearthed bones and literature. *Proceedings: Peradeniya University Research Sessions purse,* 12(5), 370-371.

Chilardi, S., L. Guzzardi, M.R. Iovino and A. Rivoli. 2002. The evidence of Spondylus ornamental objects in the central Mediterranean Sea. Two case studies: Sicily and Malta. *9th ICAZ conference, Durham 2002, Archaeomalacology: Molluscs in former environments of human behaviour* (ed. Daniella Bar-Yosef Mayer): 82-90.

Coningham, R. 1999. *Anuradhapura: the British-Sri Lankan Excavations at Anuradhapura Salgah Watta 2. vol I: the site.* BAR International Series: 824, xxx+ 209.

Coningham, R.A.E. 2006. *Anuradhapura: the British-Sri Lankan Excavations at Anuradhapura Salgah Watta 2. vol II: the artefacts.* BAR International Series: 1508.

Coningham, R. & P. Gunawardhana. 2013. *Anuradhapura, vol III: the Hinterland.* BAR International Series: 2568, xxvi+ 625.

Coomaraswamy, A.K. 1979. *Mediaeval Sinhalese Art.* Reprinted at state Printing Corporation, Sri Lanka, 334 (with 53 plates).

Cooray, P.G. 1984. *An introduction to the geology of Sri Lanka (Ceylon).* National Museum of Sri Lanka, 340.

Corbet, G.B. & J.E. Hill. 1992. *The mammals of the Indomalayan region: a systematic review.* Oxford Uni. Press, Oxford. viii+488.

d' Abrera, B. 1998. *The Butterflies of Ceylon.* Wildlife Heritage Trust Publications (Private) Limited, Sri Lanka, 224.

Das, I. & A. de Silva. 2005. *Snakes and other reptiles of Sri Lanka.* New Holland Publications, 144.

Davy, J. 1821(reprint 1983). *An Account of the Interior of Ceylon and of its Inhabitants with Travels in that Island.* Tisara Prakasakayo Ltd, Sri Lanka, xxiv+399.

Deraniyagala, P.E.P. 1935. Some fossil animals from Ceylon. *Journal of Royal Asiatic Society (Ceylon Branch),* 33(88): 165-168.

Deraniyagala, P.E.P. 1937(a). Some Miocene and Upper Siwalik vertebrates from Ceylon. *Ceylon Journal of Science* (B), 20(2): 191-198 (with 2 plates).

Deraniyagala, P.E.P. 1937(b). Some Miocene fishes from Ceylon. *Ceylon Journal of Science* (B), 20(3): 355-367.

Deraniyagala, P.E.P. 1939(a). A carbonaceous Jurassic shale from Ceylon. *Spolia Zeylanica,* Bulletin of the National Museums of Sri Lanka, 21(3): 193-194.

Deraniyagala, P.E.P. 1939(b). *The tetrapod reptiles of Ceylon: Testudinates and Crocodilians, Vol. I.* Colombo Museum Natural History Series, xxxii+412.

Deraniyagala, P.E.P. 1940(a). The Gondwana deposits of Ceylon. *Proc. Ind. Sci. Congress 27th Meeting* (4): 77.

Deraniyagala, P.E.P. 1940(b). Some botanical fossils from Ceylon. *Journal of Royal Asiatic Society* (Ceylon Branch), 35(93): 57-61 (with 1 plate).

Deraniyagala, P.E.P. 1952. *A coloured atlas of some vertebrates from Ceylon. (1): fishes.* National Mus. Ceylon, Colombo,150 (with 34 plates).

Deraniyagala, P.E.P. 1953(a). *A coloured atlas of some vertebrates from Ceylon. (2): tetrapod reptiles.* National Mus. Ceylon., Colombo, xi+101 (with 35 piates).

Deraniyagala, P.E.P. 1953(b). The wild buffalo of Ceylon, a new subspecies. *Spolia Zeylanica,* Bulletin of the National Museums of Sri Lanka, 27(1): 103-105.

Deraniyagala, P.E.P. 1955(a). Ginkgophyte and other plant fossils from the coarse Jurassic grit of Tabbova. *Spolia Zeylanica,* Bulletin of the National Museums of Sri Lanka, 27(2): 213 (with 1 plate).

Deraniyagala, P.E.P. 1955(b). A new race of estuarine crocodile from Ceylon. *Spolia Zeylanica,* Bulletin of the National Museums of Sri Lanka, 27(2): 277-279.

Deraniyagala, P.E.P. 1955(c). A new race of leaf monkey from Ceylon. *Spolia Zeylanica,* Bulletin of the National Museums of Sri Lanka, 27(2): 293-294.

Deraniyagala, P.E.P. 1955(d). *Some extinct elephants, their relatives and the two living species,* National Museums, Sri Lanka, 161 (with 48 plates).

Deraniyagala, P.E.P. 1955(e). *A coloured atlas of some vertebrates from Ceylon. (3): serpentoid reptiles.* National Mus. Ceylon., Colombo. vii+107 (with 21 plates).

Deraniyagala, P.E.P. 1956(a). A new subspecies of rusty-spotted cat from Ceylon. *Spolia Zeylanica,* Bulletin of the National Museums of Sri Lanka, 28: 113-114.

Deraniyagala, P.E.P. 1956(b). The Ceylon leopard, a distinct subspecies. *Spolia Zeylanica,* Bulletin of the National Museums of Sri Lanka, 28(1): 115-116.

Deraniyagala, P.E.P. 1958. *The Pleistocene of Ceylon*. Ceylon National Museum, 164 (with 58 plates).

Deraniyagala, P.E.P. 1960. The fossil record of the life phases of Ceylon. *Sri Lanka Vidyodaya University Historical Journal*, 1(1): 2-11 (in Sinhala).

Deraniyagala, P.E.P. 1963. An open air habitation site of *Homo sapiens balangodensis* (Part III). *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, 30(1): 87-110 (with 11 plates).

Deraniyagala, P.E.P. 1965. A new subspecies of Macaque, *Macaca sinica longicaudata* from Ceylon. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, 30(2): 261-262 (with 2 plate).

Deraniyagala, P.E.P. 1967. Some new Miocene vertebrates from Ceylon. *Proc. 33dr Annual Sess. Ceylon Assn. Science, Abstracts*, 50.

Deraniyagala, P.E.P. 1968. Some aspects of the Tertiary period in Ceylon. *Journal of Royal Asiatic Society (Ceylon Branch)*, 12: 86-108.

Deraniyagala, P.E.P. 1969. A Miocene vertebrate faunule from the Malu member of Ceylon. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, 31(2): 551-570.

Deraniyagala, S. 1971. Archaeological explorations in Ceylon, Part 1. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, 32(1): 13-23 (with 1 plate).

Deraniyagala, S. 1972. The citadel of Anuradhapura in 1969: Excavations in the Gedige area. *Ancient Ceylon*, 2: 48-169.

Deraniyagala, S.U. 1992. The Prehistory of Sri Lanka: an ecological perspective. *Memoir 8, 2nd ed. Archaeological Department*, Colombo, 831.

Deraniyagala, S.U. 2000. *Administration report of the Director-General of Archaeology for the year 1992*. Colombo: Archaeological Department.

දැරණියගල, සි. 2003. ප්‍රාග් ඓතිහාසික සබරගමුව (බලංගොඩ සංස්කෘතිය). *සබරගමුව වංශ කතාව* (විධායක සංස්කාරක: ඇඳගම, ප.), සබරගමුව පළාත් සභාව, 193-221.

Deraniyagala, S.U. 2004. *Pre-historic basis for the rise of Civilization in Sri Lanka and Southern India*. Second Vesak Commemoration Lecture, Museum Theatre, Chennai, Tamil Nadu: 28.

Deraniyagala, S.U. 2007 (offprint). The prehistory and protohistory of Sri Lanka. *The Art and Archaeology of Sri Lanka I.* (eds. L. Prematilleke, S. Bandaranayake, S.U. Deraniyagala and R. Silva), Central Cultural Found, Sri Lanka: v+96.

De Silva, A. 1973. The cobra concept in Sinhala art and sculpture. *Tourists Ceylon*, 1(1): 32-38.

de Silva, A. 1981. Snakebite in Anuradapura District. *The Snake*, 13(2): 117-130.

de Silva, A. 2007. Turtles in the Archaeology and History of Sri Lanka. *Radiata*, 16(1): 1-15.

de Silva, M. and B.V.R. Jayaratne. 1994. Aspects of population ecology of the Leopard (Panthera pardus) in Ruhuna National Park, Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 1(1): 3-15.

de Silva, M., S. Dissanayake and C. Santiapillai. 1994. Aspects of the population dynamics of the wild Asiatic water buffalo (Bubalus bubalis) in Ruhuna National Park, Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 1(1): 65-76.

de Silva, M., B.V.R. Jayaratne and P.K. de Silva. 1995. The status and other ecological aspects of the elephant population in Ruhuna National Park, Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 1(2): 185-202.

de Silva, M., B.V.R. Jayaratne and P.K. de Silva. 1997. A study of elephant movements in Ruhuna National Park, Sri Lanka. Journal of *South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 2(2): 183-198.

De Silva, N. and R.B. Dissanayake. 2008. *A catalogue of ancient pottery from Sri Lanka*. Postgraduate Institute of Archaeology (University of Kelaniya), Colombo, 351.

De Silva, P.H.D.H. 1980. *Snake fauna of Sri Lanka*. National Museums of Sri Lanka, Colombo, xii+472.

de Silva, P.K., C. Santiapillai and S. Dissanayake. 1995. A population study of the wild pig (Sus scrofa) in Ruhuna National Park, Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 1(2): 225-234.

de Silva, P.K., B.V.R. Jayaratne and M. de Silva. 1996. An ecological study of the sloth bear, Melursus ursinus, in Ruhuna National Park, Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 2(1): 49-60.

de Silva, P.K. 1996. Food and feeding habits of the Eurasian otter Lutra lutra L. (Carnivora: Mustelidae) in Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 2(1): 81-90.

de Silva, P.K., C. Santiapillai and S. Dissanayake. 1996. Some aspects of the population ecology of the blue peafowl, Pavo cristatus, in Ruhuna National Park, Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 2(1): 113-126.

de Silva, P.K. 1997. Seasonal variation of the food and feeding habits of the Eurasian otter Lutra lutra (Carnivora: Mustelidae) in Sri Lanka. *Journal of South Asian Natural History*, Wildlife Heritage Trust of Sri Lanka, 2(2): 205-216.

දිසානායක, ර.බ. 2011. පුරාණ ශවෝපචාර විධීන්හි පාරිසරික නිර්ණායක. *පුරාජෛවවිවිධත්ව පුවත්. දෙසැම්බර් වෙළුම, 4 කලාපය*, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, 1-2.

Dutta, S.K. & K. Manamendra-Arachchi. 1996. *The Amphibian fauna of Sri Lanka.* Wildlife Heritage Trust of Sri Lanka, Colombo, 232.

Epa, R., N. Perera, K. Manamendra-Arachchi & M. Meegaskumbura. 2011. Sri Lanka's Aruwakkalu fossil deposit dates to the Burdigalian age. *Ceylon Journal of Science, (Bio. Sci.)* 40 (2): 163-174.

Erdelen, W. 1978. Distribution patterns of the genus *Calotes* (Sauria: Agamidae) of Sri Lanka. *Loris*. 14(6): 350-353.

Erdelen, W. 1984. The genus *Calotes* (Sauria: Agamidae) in Sri Lanka: Distribution patterns. *Journal of Biogeography*, 11: 515-525.

Erdelen, W. 1998. The genus *Otocryptis* and *Sitana* (Sauria, Agamidae): geographic distribution, microhabitat use, and morphometric relations. *Biology and conservation of the amphibians, retiles and their habitats in South Asia* (*Proceedings of the international conference on the biology and conservation of the amphibians and reptile of South Asia, Sri Lanka, August 1-5, 1996*): 232-246.

Fernando, C.H. and S.R. Weerawardena. 2002. *A Guid to the Freshwater Fauna of Ceylon (Sri Lanka)*, Colombo.

Fernando, M., S. Wijesundara & S. Fernando. 2003. *Orchids of Sri Lanka, A Conservationist's companion.* IUCN-The World Conservation Union, Sri Lanka, vol 1, x+147.

Goonatilake, W.L.D.P.T.S. de A. 2001. Miocene vertebrates of Sri Lanka described by P.E.P. Deraniyagala. *Loris*, Journal of the Wildlife and Nature Protection Society of Sri Lanka, 22(6): 12-18.

ගුණතිලක, ස. ද අල්විස්, 2007. *ශ්‍රී ලංකාවේ මිරිදිය මසුන්.* ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය, xii + 134.

Groves, C. 2001. *Primate taxonomy*. Smithsonian Institution Press, Washington and London: 350.

Groves, C. and J. Jayawardene. 2009. The wild buffalo of Sri Lanka. *Taprobanica*, Taprobanica Nature Conservation Society, Sri Lanka, 1(1): 55-62 (with 8 plates).

Groves, C.P. and E. Meijaard. 2005. Interspecific variation in Moschiola, the Indian chevrotain. In: Yeo, D. C. J., K. L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. 12: 413-421.

Groves, C.P., C. Rajapaksha & K. Manamendra-Arachchi. 2009. The taxonomy of the endemic golden palm civet of Sri Lanka. Zoological *Journal of the Linnean Society*, 155: 238-251.

Hadl, G. 1974. Part XVII: The freshwater Freshwater Mussels Bivalvia. *Bull. Fish. Res. Stn., Sri Lanka (Ceylon)*, 25 (nos. 1 & 2): 183-188 (with 1 plate).

Hawkey, D. 2002. Out of Asia: dental evidence for affinities and microevolution of early populations from India / Sri Lanka, 2nd ed. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, 39(1): 300.

Henry, G.M. 1971 (2nd ed.). *A guide to the birds of Ceylon.* Oxford University Press. London, xl+457 (with 30 plates).

අයිවර්ස්, ආර්. ඩබ්ලිව්. 1899. *එදා වැව් බැඳි රාජ්‍යේ හෙවත් ලංකා සිවිල් සේවයේ ආර්. ඩබ්ලිව්. අයිවර්ස්ගේ උතුරුමැද පළාතේ අත්පොත 1899.* (පරිවර්තනය; එම්.යූ.ජී. තෙන්නකෝන් සහ වර්ෂා තෙන්නකෝන්, 2004), ප්‍රකාශනය ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 520.

Karunarathna, D.M.S.S., K. Kumarasinghe, M.B. Madawala, M.A.J. Navaratne & D.E. Gabadage. 2012. Diversity and richness of butterfly fauna in a home garden habitat, and its vicinity, Puttalam district in Sri Lanka. *NeBIO*. **3**(3): 93-101.

Karunaratne, P. 1994. A brief report on the excavation at Ibbankatuva, a Proto-and Early Historic settlement site. *Further studies in the settlement archaeology of the Sigiriya-Dambulla region* (editors: Bandaranayake, S. and M. Morgen), 105-110.

Karunaratne, P. and G. Adikari. 1994. Excavations at Aligala Prehistoric site. *Further studies in the settlement archaeology of the Sigiriya-Dambulla region* (eds: Bandaranayake, S. and M. Morgen), 55-62.

Kennedy, K.A.R. 1965. Human skeletal material from Ceylon, with an analysis of the Island's prehistoric and contemporary populations. *Bulletin of the British museum (natural history), geology*, **11**(4): 135-213.

Kennedy, K.A.R., T. Disotell, W.J. Roertgen, J. Chiment & J. Sherry. 1986. Biological anthropology of upper Pleistocene hominids from Sri Lanka: Batadomba Lena and Beli Lena caves. *Ancient Ceylon,* Journal of the Archaeological Survey Department of Ceylon, No **6**, 67-168.

Kennedy, K.A.R., S.U. Deraniyagala, W.J. Roertgen, J. Chiment & T. Disotell. 1987. Upper Pleistocene fossil hominids from Sri Lanka. *American Journal of Physical Anthropology*, **72**: 441-461.

Kennedy, K.A.R. 2000. *Goad-apes and fossil men, Paleoanthropology in South Asia.* The University of Michigan Press, xviii+480.

Kularatne, S.A.M. & Y. de Silva. 1996. Abstract: Common krait bite in Anuradhapura, Sri Lanka. *International Conference on the Biology & Conservation of the Amphibians & Reptiles of South Asia* (ed. by de Silva, A.), Amphibia and reptiles research organization of Sri Lanka, 38-39.

කුලතුංග, ටී.ජී. 2001. *අනුරපුර මහා විහාරය.* කර්තෘ ප්‍රකාශනයකි, iv + 69.

කුලතුංග, ටී.ජී. 2005. *අභිලේඛන ශාපපාඨ.* කර්තෘ ප්‍රකාශනයකි, x + 102.

කුමාර, ජී.ටී. 1998. *අත්තාණි පරිහාර ප්‍රදාන, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,* vi+55.

Kotagama, S., & G. Ratnavira. 2010. *An illustrated guied to the birds of Sri Lanka.* Field Ornithology group of Sri Lanka, University of Colombo, xx+356.

Kourampas, N., I.A. Simpson, N. Perera, S.U. Deraniyagala & W.H. Wijeyapala. 2009. Rockshelter sedimentation in a dynamic tropical landscape: late Pleistocene-early Holocene archaeological deposits in Kitulgala Beli-lena, southwestern Sri Lanka. *Geoarchaeology*. an international journal (eds, Huckleberry, G. & J. Woodward), **24**(6): 677-714.

Knox, R. 1681(2nd ed., 1989, J.H.O. Paulusz, ed). *An historical relation of the island Ceylon.* Tissara Prakashakayo, Dehiwala, lii+688.

Madduma Bandara, C.M. 1989. Recent natural disasters – wrath of Gods or responsibility of men, *Econ. Rev.*, **2**: 1-5.

Maduwage, K., A. Silva, K. Manamendra-Arachchi & R. Pethiyagoda. 2009. A taxonomic revision of the South Asian hump-nosed pit vipers (Squamata: Viperidae: *Hypnale*). *Zootaxa*, **2232**: 1-28.

Manamendra-Arachchi, K. & S. Liyanage. 1994. Conservation and distribution of the agamid lizards of Sri Lanka with illustration of the extant species. *Journal of South Asian Natural History*, **1**(1): 77-96.

Manamendra-Arachchi, K. 1997. Gecko. *Sri Lanka Nature*, Wildlife Heritage Trust of Sri Lanka, Colombo, **1**(1): 45-55.

Manamendra-Arachchi, K. 1998. Garden Lizard. *Sri Lanka Nature*, Wildlife Heritage Trust of Sri Lanka, Colombo, **2**(1): 48-62.

Manamendra-Arachchi, K. & R. Pethiyagoda. 1998. A synopsis of the Sri Lankan Bufonidae (Amphibia: Anura), with description of new species. *Journal of South Asian Natural History*, **3**(1): 213-246.

Manamendra-Arachchi, K. & R. Pethiyagoda. 2005. The Sri Lankan shrub-frogs of the genus *Philautus* Gistel, 1848 (Ranidae: Rhacophorinae), with description of 27 new species. In: Yeo, D. C. J., K. L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. **12**: 163-303.

Manamendra-Arachchi, K., R. Pethiyagoda, R. Dissanayake & M. Meegaskumbura. 2005. A second extinct big cat from the late Quaternary of Sri Lanka. In: Yeo, D. C. J., K. L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. **12**: 423-434.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ.එන්. 2005. ජේතවන කැණීමෙන් ලද සත්ත්ව රූප පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයක්. *පුරාවිද්‍යා ලිපි: මහාචාර්ය එච්.ටී. බස්නායක උපහාර ග්‍රන්ථය*, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, 181-195.

Manamendra-Arachchi, K., S. Batuwita & R. Pethiyagoda. 2007. A taxonomic revision of the Sri Lankan day-geckos (Reptilia: Gekkonidae: *Cnemaspis*), with description of new species from Sri Lanka and southern India. *Zeylanica*, **7**(1): 9-122. (incl., 6 tabs., 46 figs. and 12 plts.).

Manamendra-Arachchi, K. & R. Pethiyagoda, 2007. *Boiga ranawanei*, a junior synonym of *Boiga beddomei*. *Zeylanica*, **7**(1): 123-124.

Manamendra-Arachchi, K.N., J. Perera, W.S. Weliange, A. Thantilage, W. Karunaratne, G. Adikari & N. De Silva. 2009 Checklist of fauna in the excavation of prehistoric Alavala Potgul-lena cave. *Hunting for hunter-gatherers at Alavala cave, Symposium on new discoveries from the excavation at Alavala, 3 rd Nov. 2009, abstracts* (editor in- chief De Silva, N), Postgraduate instituite of Archaeology, University of Kelaniya: 47-51.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. 2009. ජේතවනාරාම කැණීම්වලින් ලද සත්ත්ව ශේෂ තුළින් මතුවන ඉතිහාසය. *ජේතවන ස්තූප පුරාණය*, මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික අරමුදල හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය,114-159.

Manamendra-Arachchi, K. 2010. The extinct big cats (felidae) of Sri Lanka. *Sirinimal Lakdusinghe felicitation volume*, (eds. Gunawardhana, P., G. Adikari & R.A.E. Coningham), Neptune Publication, 137-143.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. 2012. ශ්‍රී ලංකාවේ පුරාසික ෆොසිල. *ආචාර්ය ජී.ඒ.ජී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වූ පුරාජෛවවිවිධත්ව සමුළුව, 2012, පර්යේෂණ ලිපි සහ නොරතුරු පත්‍රිකා එකතුව.* ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුලද, සංස්කෘතික අමාත්‍යංශය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය: 49-57.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ. 2012. අවසාන ග්ලැසියර සමයේ ශ්‍රී ලංකාවේ ජීවත් වූ සතුන්. *ආචාර්ය ජී.ඒ.ජී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වූ පුරාජෛවවිවිධත්ව සමුළුව, 2012, පර්යේෂණ ලිපි සහ නොරතුරු පත්‍රිකා එකතුව.* ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුලද, සංස්කෘතික අමාත්‍යංශය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, 58-97.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ.එන්., ජී. අදිකාරි. 2012. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සත්ත්ව අවශේෂයන්ගෙන් නිර්මිත සුවශේෂී නිර්මාණයන්. *ආචාර්ය ජී.ඒ.ජී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වූ පුරාජෛවවිවිධත්ව සමුළුව, 2012, පර්යේෂණ ලිපි සහ නොරතුරු පත්‍රිකා එකතුව.* ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුලද, සංස්කෘතික අමාත්‍යංශය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, 299-323.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ.එන්. 2012. නූතන මානවයා 'අප්‍රිකාවෙන් නික්ම යාමේ න්‍යාය' සහ බුන්දල පතිරාජවෙල. *වැලිපිළ*. මධ්‍යම සංස්කෘතික අරමුදල, සංස්කෘතික අරමුදල හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, 23-36.

Manamendra-Arachchi K., T. Mendis, K.H.S.R. Premarathne & A. de Silva. 2013. Discovery of a 4th century AD perforated crocodile tooth ornaments from Sri Lanka. *World crocodile conference, proceedings of the 22nd working meeting of the crocodile specialist group, Sri Lanka, 21-23 May, 2013, 243-245.*

මනමේන්ද්‍ර-ආරච්චි, කේ., රොහාන් පෙතියාගොඩ. 2006. *ශ්‍රී ලංකාවේ උභය ජීවීන්, වනජීවී උරුම භාරය*, කොළඹ, 440 (වර්ණ රූප පිටු 88).

Manamendra-Arachchi, K.N., K.H. Sonali Rangika Premarathne & G. Adikari. 2013. Unique Mesolithic creations from animal remains in Sri Lanka. *International Conference on Asian Art, Culture and Heritage abstract volume* (eds: Manatunga, A., R. Bandara & A. Wijesuriya), 98.

මනමේන්ද්‍ර-ආරච්චි, කේ.එන්., කේ.එච්.එස්.ආර්. ප්‍රේමරත්න, සහ ජී. අදිකාරී. 2013. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් බෙල්ලන්ගෙන් නිර්මිත පබළු හා පළඳනා. *The journal of Archaeology and Heritage studies*, Department of Archaeology and Heritage management, Faculty of social sciences and Humanities, Rajarata University of Sri Lanka. **1**(1): 1-10.

Manamendra-Arachchi, K. & M.A.T. De Silva. 2014. Forest archaeology and traditions. *Sri Lanka's Forests-Nature at your service, Sri Lanka Association for the Advancement of Science* (compiled and edited by De Silva, M.A.T.), 130-138.

Meegaskumbura, M., F. Bossuyt, R. Pethiyagoda, K. Manamendra-Arachchi, M. M. Bahir, M. C. Milinkovitch, C. J. Schneider. 2002. Sri Lanka: an amphibian hot spot. *Science*, **298**: 379.

Meegaskumbura, M. & K. Manamendra-Arachchi. 2005. Description of eight new species of shrub frogs (Ranidae: Rhacophorinae: *Philautus*) from Sri Lanka. In: Yeo, D. C. J., K. L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. **12**: 305-338.

Meegaskumbura, M., K. Manamendra-Arachchi, C. J. Schneider & R. Pethiyagoda. 2007. New species amongst Sri Lanka's extinct shrub frogs (Amphibia: Rhacophoridae: *Philautus*). *Zootaxa*, **1397**: 1-15.

Meegaskumbura, M., K. Manamendra-Arachchi & R. Pethiyagoda. 2009. Two new species of shrub frogs (Rhacophoridae: *Philautus*) from the lowlands of Sri Lanka. *Zootaxa*, **2122**: 51-68.

Meegaskumbura, M., S. Meegaskumbura, G. Bowatte, K. Manamendra-Arachchi, R. Pethiyagoda, J. Hanken & C. J. Schneider. 2010. *Taruga* (Anura: Rhacophoridae), a new genus of foam-nesting tree frogs endemic to Sri Lanka. *Ceylon Journal of Science, (Bio. Sci.)* **39** (2): 75-94.

Meegaskumbura, S., M. Meegaskumbura, R. Pethiyagoda, K. Manamendra-Arachchi & C. Schneider. 2007. *Crocidura hikmiya*, a new shrew (Mammalia: Soricomorpha: Soricidae) from Sri Lanka. *Zootaxa*, **1665**: 19-30.

Mellars, P. 2006. A new radiocarbon revolution and the dispersal of modern humans in Eurasia. *Nature*, **439**: 931-935.

Mulvaney, J. & J. Kamminga. 1999. *Prehistory of Australia.* Allen & Unwin Pty Lid, xxi+480.

Myrdal, E. & A. Yasapala. 1994. Hunting, trapping, catching and fishing. *Further studies in the settlement archaeology of the Sigiriya-Dambulla* (eds. Bandaranayake, S. and M. Mogren). The Postgraduate Institute of Archaeology, University of Kelaniya, 264-286.

Naggs, F., D. Raheem, K. Ranawana & Y. Mapatuna. 2005. The Darwin initiative project on Sri Lankan land snails: patterns of diversity in Sri Lankan forests. In: Yeo, D. C. J., K. L. Ng & R. Pethiyagoda (eds.), Contributions to biodiversity exploration and research in Sri Lanka. *The Raffles Bulletin of Zoology*, Supplement No. **12**: 23-29.

Nandadeva, B.D. 1986. Rock art sites of Sri Lanka, a catalogue. *Ancient Ceylon,* Journal of the Archaeological Survey Department of Ceylon, No **6**, 173-207.

Oakley, K.P. 1972. *Man the tool-maker*. Trustees of the British Museum (Natural History) London (6th edition), viii+101.

Perera, H.N. 2010. *Prehistoric Sri Lanka, late Pleistocene rockshelters and an open-air site*. BAR International Series, **2142**, xvi+268.

Pethiyagoda, R. 1991. *Freshwater fishes of Sri Lanka.* Wildlife Heritage Trust of Sri Lanka, Colombo, 362.

Pethiyagoda, R., K. Manamendra-Arachchi, M. M. Bahir & M. Meegaskumbura. 2006. Sri Lankan Amphibians: diversity, uniqueness and conservation. In: C. N. B. Bambaradeniya (ed.), *The fauna of Sri Lanka, status of taxonomy, research and conservation*. IUCN-The Conservation Union: 125-133.

Pethiyagoda, R., M. Kottelat, A. Silva, K. Maduwage & M. Meegaskumbura. 2008(a). A review of the genus *Laubuca* in Sri Lanka, with description of three new species (Teleostei: Cyprinidae) *Ichthyol. Explor. Freshwaters*, **19**(1): 7-26.

Pethiyagoda, R., A. Silva, K. Maduwage & M. Meegaskumbura. 2008(b). *Puntius kelumi*, a new species of cyprinid fish from Sri Lanka. (Teleostei: Cyprinidae) *Ichthyol. Explor. Freshwaters*, **19**(3): 201-214.

Pethiyagoda, R., A. Silva & K. Maduwage. 2008(c). *Mystus ankutta*, a new catfish from Sri Lanka (Teleostei: Bagridae) *Ichthyol. Explor. Freshwaters*, **20**(1): 233-242.

Pethiyagoda, R., M. De Silva and N. Hapuarachchi. 2012. *Sri Lankan Primates, an enthusiasts' guide*. Wildlife Conservation Society-Galle, Sri Lanka: 126.

ප්‍රේමරත්න, එස්.ආර්., කැ.න. මනමේන්ද්‍ර-ආරච්චි, ගා. අදිකාරී, ජූ. පෙරේරා, අ. තන්හිලගේ සහ ජී. විදානපතිරන. 2010. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික කැණීම් මඟින් අනාවරණය කොටගෙන ඇති පක්ෂි අස්ථීන් පිළිබඳ විමර්ශනයක්. *වසර 2010 ජාතික පුරාවිද්‍යා සමුළුවට ඉදිරිපත් කළ ශාස්ත්‍රීය ලිපි එකතුව* (*ජූලි 7, 8 සහ 9*), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ, 2 වන වෙළුම: 47-56.

ප්‍රේමරත්නල කේ.එච්.එස්.ආර්., කේ. මනමේන්ද්‍ර-ආරච්චි සහ ජී. අදිකාරී. 2011. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික වාසස්ථානවලින් හමුවන පක්ෂී අර්ථ ෆොසිල. *ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමය, 2011 වසරේ පර්යේෂණ සමුළුව සඳහා ඉදිරිපත් කළ ශාස්ත්‍රීය ලිපි සාරාංශ එකතුව*. 182-183.

Premarathne, S.R., K. Manamendra-Arachchi & G. Adikari. 2011. Bird remains from Alavala Potgul-lena and other prehistoric cave sites. *International Association for Asian Heritage International Conference (07th & 8th April, 2011, Colombo) abstract volume* (eds: Manatunga, A., R. Bandara & A. Wijesuriya), 110.

ප්‍රේමරත්න, කේ.එච්.එස්.ආර්. 2011(b). අදින් වසර 6000 ක් පැරණි මොණරුන්ට (*Pavo cristatus*) අයත් අස්ථි අවශේෂ සීගිරිය අසල පොතාන ප්‍රාග් ඓතිහාසික ගුහාවෙන් හමුවේ. *පුරාජෛවවිවිධත්ව පුවත්. දෙසැම්බර් වෙළුම, 4 කලාපය*, ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, 3.

ප්‍රේමරත්න, කේ.එච්.එස්.ආර්., කේ.එන්. මනමේන්ද්‍ර-ආරච්චි, ජී. අදිකාරි. 2012(a). සීගිරිය ආශ්‍රිත පොතාන ප්‍රාග්ඓතිහාසික ගුහාවෙන් හමුවූ (අදින් වසර 6000 ක් පැරණි) මොණර (*Pavo cristatus*) අස්ථි අවශේෂ. *ආචාර්ය සී.ඊ.සී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වූ පුරාජෛවවිවිධත්ව සමුළුව, 2012, පර්යේෂණ ලිපි සහ තොරතුරු පත්‍රිකා එකතුව*. ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුලද, සංස්කෘතික අමාත්‍යාංශය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය: 261-269.

ප්‍රේමරත්න, කේ.එච්.එස්.ආර්., කේ.එන්. මනමේන්ද්‍ර-ආරච්චි, ජී. අදිකාරි. 2012(b). ශ්‍රී ලංකා වළිකුකුළාගේ (කුලය- Phasianidae, *Gallus lafayetii*) වසර 37,000 ක පරිණාමීය ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්. *ආචාර්ය සී.ඊ.සී. දැරණියගල 39 වන ගුණානුස්මරණය වෙනුවෙන් පැවැත්වූ පුරාජෛවවිවිධත්ව සමුළුව, 2012, පර්යේෂණ ලිපි සහ තොරතුරු පත්‍රිකා එකතුව*. ජෛවවිවිධත්ව ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුලද, සංස්කෘතික අමාත්‍යාංශය සහ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය: 270-281.

ප්‍රේමරත්න, කේ.එච්.එස්.ආර්., කේ. මනමේන්ද්‍ර-ආරච්චි සහ ජී. අදිකාරි. 2012. පුරාසත්ත්ව විද්‍යාත්මක අධ්‍යයන සඳහා ප්‍රිමාටා අවශේෂ හඳුනාගැනීම. *වසර 2012 ජාතික පුරාවිද්‍යා සමුළුවට ඉදිරිපත් කළ ශාස්ත්‍රීය ලිපි එකතුව (පූර්ලි 7 සහ 8)*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

ප්‍රේමරත්න, කේ.එච්.එස්.ආර්., කේ.එන්. මනමේන්ද්‍ර-ආරච්චි සහ ගාමිණී අදිකාරි. 2013. පොත්ගුල් ලෙන සහ පොතාන ප්‍රාග් ඓතිහාසික මානවයාගේ සත්ත්ව වරණය. *The proceeding of annual research symposium, extended abstract-2013*, Department of Archaeology and Heritage management, Faculty of social sciences and Humanities, Rajarata University of Sri Lanka. 154-156.

Premathilake, R. 2003. *Late Quaternary palaeoecologycal event stratigraphy in the Horton Plains, central Sri Lanka: with contribution to the recent pollen flora*. Department of Physical Geography and Quaternary Geology, Stockholm University, thesis in Quaternary Geology, no 2.

Phillips, W.W.A.1924. A guide to the mammals of Ceylon. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, **13**(1):1-63.

Phillips, W.W.A.1928(a). Guide to the mammals of Ceylon, part 8, Rodentia. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, **14**(2):209-293. (with 2 plate).

Phillips, W.W.A.1928(b). Ceylon Shrews. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, **14**(2):295-331. (with 2 plate).

Phillips, W.W.A.1928(c). A note on the habits of the Indian Pangolin (*Manis crassicaudata*). *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, **14**(2):333-334.

Phillips, W.W.A. 1936. Survey of the distribution of mammals of Ceylon. *Ceylon Journal of Science* (B), **19**(3): 315-329.

Phillips, W.W.A. 1937. Survey of the distribution of mammals of Ceylon. *Ceylon Journal of Science* (B), **20**(2): 199-206.

Phillips, W.W.A. 1980(a). *Manual of the Mammals of Sri Lanka, Part I*. Wildlife and Nature Protection Society of Sri Lanka, 2nd revised edition, xxx+116.

Phillips, W.W.A. 1980(b). *Manual of the Mammals of Sri Lanka, Part II*. Wildlife and Nature Protection Society of Sri Lanka, 2nd revised edition, xii+217-267.

Phillips, W.W.A. 1984. *Manual of the Mammals of Sri Lanka, Part III*. Wildlife and Nature Protection Society of Sri Lanka, 2nd revised edition, xiv+269-390+xv-xxxv.

Raheem, D. and F. Naggs. 2006. *An Illustrated Guide to the Land Snails of Sri Lankan Natural Forests and Cultivated Habitats*. Leaflet, Natural History Museum, London.

Ranawana, K.B. and T.G.M. Priyadarshana. 2012. The taxonomy and conservation status of the land snails in Sri Lanka. *The National Red List 2012 of Sri Lanka, Conservation status of the fauna and flora*, Biodiversity secretariat of the Ministry of Environment and National Herbarium, Department of National Botanic Gardens, 65-76.

Saldin, M. 2010. Megalithic burials and Anuradhapura. *Sirinimal Lakdusinghe felicitation volume*, (eds: Gunawardhana, P., G. Adikari & R.A.E. Coningham), Neptune Publication, 117-130.

Saldin, M., Manamendra-Arachchi. K. 2010. *Mortuary practices of Sri Lanka's Mesolithic man with special reference to the Kitulgala Beli-lena skull fragment*. Festschrift for Professor S.B. Hettiaratchi, Sarasavi Publishes, 229-238.

Samarasinghe, D.J.S. 2014. *The human-crocodile conflict in Nilwala river, Matara (phase 1)*. Young Zoologists' Association Publications: viii + 118.

Sarasin, P.B. & K.F. Sarasin. 1887-1908. *Ergebnisse naturwissenschaftlichter Forschungen auf Ceylon* .... 1884-86. Wiesbaden. 4 vols.+atlas, 84 pls

Seligmann, C.G. & B.Z. Seligmann. 1911. *The Vaddas*. Cambridge University Press, xx+463.

Senanayake, F.R. 1993. The evolution of the major landscape categories in Sri Lanka and distribution patterns of some selected taxa: ecological implications. *Proceedings of the international and interdisciplinary symposium, Ecology and Landscape Management in Sri Lanka* (eds: Erdelen, W., C. Preu, N. Ishwaran, C.M. Madduma Bandara), 201-219.

Seneviratne, S. 1984. The archaeology of the Megalithic Black and Red ware Complex in Sri Lanka. *Ancient Ceylon*, **5**: 237-307.

Sitholey, R.V. 1944. Jurassic plants from the Tabbowa series in Ceylon. *Spolia Zeylanica*, Bulletin of the National Museums of Sri Lanka, **24**(1): 3-17. (with 4 plates).

Somadeva, R., R. Dissanayake and R. Fernando. 2008. The Galpaya Survey, report of the first field season 2006. *Occasional paper No. 1* (edited by De Silva, N. & R. Somadeva), Postgraduate Institute of Archaeology (University of Kelaniya), Colombo, 155.

Somadeva, R. 2010. Archaeology of the Uda Walava basin. *Occasional papers No. 2* (Series editor Jagath Weerasinghe), Postgraduate Institute of Archaeology (University of Kelaniya), Colombo, 211.

Somadeva, R. 2012. *Rock painting and engraving sites in Sri Lanka.* Postgraduate Institute of Archaeology (University of Kelaniya), Colombo, 236.

සෝමවීර, රූ. 2006. *ශ්‍රී ලංකාවේ සර්පයින්.* වනජීවී උරුමහාර පුද්ගලික සමාගම, කොළඹ, x+297.

සුමංගල, ශ්‍රී සහ බ. දෙවරක්ඛිත. 1996. *මහාවංශය සිංහල (ප්‍රථම භාගය).* එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, xxxii + 180.

Smith, E. N., K. Manamendra-Arachchi & R. Somaweera. 2008. A new species of coral snake of the genus *Calliophis* (Squamata: Elapidae) from the Central Province of Sri Lanka. *Zootaxa*, **1847**: 19-33.

Spittle, R.L. 2001. *Vanished trails, the last of the Veddas.* Sooriya edition, Colombo, 277.

Spittle, R.L. 2003. *Wild Ceylon, describing in particular the lives of the present-day Veddas.* Sooriya edition, Colombo, 215.

Starmuhlner, F. 1974. Part XVII: The freshwater Gastropods of Ceylon. *Bull. Fish. Res. Stn.*, Sri Lanka (Ceylon), 25 (nos. 1 & 2): 97-181 (with 15 plates).

Still, J. 1910. Tantrimalai, some Archaeological observations and deductions. *Journal of the Royal Asiatic Society (Ceylon)*, 22 (63): 87-88.

Thantilage, A. 2008. Protohistoric copper metallurgy in Sri Lanka: an overview. *Roland Silva felicitation volume* (editor-in-chief, N. Chutiwongs and N. De Silva), Postgraduate Institute of Archaeology (University of Kelaniya), Colombo, 200-212.

The National Atlas of Sri Lanka, 2nd edition. 2007. Survey Department, Sri Lanka, x+243.

Van der Poorten, G. 2012. The taxonomy and conservation status of the butterflies of Sri Lanka. *The National Red List 2012 of Sri Lanka*, Conservation status of the fauna and flora, Biodiversity secretariat of the Ministry of Environment and National Herbarium, Department of National Botanic Gardens, 26-41.

Vidanapatirana, P. 2012. *Settlement patterns of the Malvatu Oya and Kala Oya basin, a study in the historical geography of Sri Lanka.* Postgraduate Institute of Archaeology, University of Kelaniya, Sri Lanka: 224.

වජිර, හ. 2005/2006. ස්තූප සළපතල මළුවලින් හමුවන ලිංග, යෝනි හා ගර්භ සංකේත. *වැලිසිළු පුරාවිද්‍යා සඟරාව*, හත්වැනි කලාපය (සංස්කරණය: මැන්දිස්, ඩී.ටී. සහ සී.බී. අඹන්වල), මධ්‍යම සංස්කෘතික අරමුදල, 93-102.

Wayland, E.J. 1925. The Jurassic rocks of Tabbowa. *Ceylon Journal of Science*, 13: 195-208.

Weerakoon, D.K. & W.L.D.P.T.S. de A. Goonatileke. 2006. Taxonomic status of the mammals of Sri Lanka. In: C. N. B. Bambaradeniya (ed.), *The fauna of Sri Lanka, status of taxonomy, research and conservation.* IUCN-The Conservation Union: 216-231.

Wickramasinghe, L.J.M., N. Wickramasinghe & L. Kariyawasam. 2011. Taxonomic status of the arborial skink lizard Dasia halianus (Haly & Nevill, 1887) in Sri Lanka and the redescription of Dasia subcaeruleum (Boulenger, 1891) from India. *Journal of Threatened Taxa*, 3(8): 1961-1974.

Wickramasinghe, L.J.M. & D.A.I. Munindradasa. 2007. Review of the genus Cnemaspis Strauch, 1887 (Sauria: Gekkonidae) in Sri Lanka with the description of five new species. *Zootaxa*, 1490: 1-63.

වික්‍රමගමගේ, සී. 1990. *ස්තූප.* ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය, පොල්ගස්ඕවිට, 183 (රූප පිට 16).

වික්‍රමසිංහ, මා. 2005. *මානව හිතවාදය හා එතෙර වියන්හු.* සීමාසහිත සරස (පෞද්ගලික) සමාගම, රාජගිරිය, x + 162

Wijayapala, W.H. 1997. *New light on the prehistory of Sri Lanka in the context of recent excavations at cave sites.* University of Peradeniya; Ph.D dissertation.

Wijayapala, W.H. 2010. Pre-historic bone artifacts from Sri Lanka. *Sirimal Lakdusinghe felicitation volume* (eds: Gunawardhana, P. G., Adikari and R.A.E. Coningham), Neptune Publication, 131-136.

Yapa, A. and G. Ratnavira. 2013. *The mammals of Sri Lanka.* Field Ornithology Group of Sri Lanka, University of Colombo: 1009.

Young, R., R. Coningham, K. Nalinda, J. Perera and H. Khan. 2006. "Faunal Remains" In: R. Coningham (ed.) *Anuradhapura. The British-Sri Lanakan Excavations at Anuradhapura Salgaha Watta 2. Volume II: The Artefacts.* Oxford : Archaeopress: 501-618.

Young, R. and R.A.E. Coningham. 2010. From village to state: modeling food consumption and ideological change at Anuradhapura, Sri Lanka. *Sirimal Lakdusinghe felicitation volume* (eds. P. Gunawardhana, G. Adikari and R.A.E. Coningham), Neptune Publication, 81-92.

ස්වර්ණමාලී රාජ්‍ය ආරක්ෂක හමුදා මූලස්ථානය

සාරථි සඟරාව / ගාමිණී සේනාරත්